බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 24

සූත්‍රාන්තපිටකයෙහි

14 වන ග්‍රන්ථය

# අඞ්ගුත්තරනිකාය

## තෘතීයභාගය

## පඤ්චකනිපාතය

---

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්
ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවෙහි

අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලය

විසින් කරණ ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

---

බු: ව: 2557
ක්‍රි: ව: 2013

Buddha Jayanti Tripitaka Series, Volume 24

The Fourteenth Book in the

**Suttanta-Pitaka**

**14**

# ANGUTTARANIKĀYA (III)

With the Sinhala Translation by

**The Anguttaranikāya Editorial Board**
**of**
**The Tripitaka Translation Committee**

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

B.E. 2557
C.E. 2013

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතෙ කරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංශ කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමග කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

තෙරුවන් සරණයි.

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විද්‍යාගම,
බණ්ඩාරගම.

– 2557 / 2013 –

බුද්ධ ජයන්ති ත්‍රිපිඨක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ

බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක
වි. ජ. මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි
තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි
## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මගින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදී.

මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.

- පූජ්‍ය අත්තුඩාවේ සද්ධානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහළල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලිනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

තතියො භාගො

සූත්‍රාන්තපිටකයෙහි

# අඞ්ගුත්තරනිකාය

තෘතීය භාගය

“තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො”

“මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො බබලයි.”

(අඞ්ගුත්තරනිකාය - තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

# පටුන

## CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... | IX |
| සඞ්කේත නිරූපණය — ABBREVIATIONS ... ... | XI |
| පාළිහෝඩිය — P̄ALI ALPHABET ... ... ... | XIII |
| විෂයසූචි ... ... ... ... ... | XV |
| පෙළ හා පරිවර්තනය .. ... ... ... | 2-469 |
| ගාථාදිපාදානුක්කමණිකා ... ... ... ... | 471 |
| සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... ... | 473 |
| පදානුක්කමණිකා ... ... ... ... | 475 |
| ශුද්ධිපත්‍රය ... ... ... ... | 480 |

# සංස්කාරක නිවේදනය

අඞ්ගුත්තරනිකායෙහි පඤ්චකනිපාතය අවසන් කොට ඇති මේ තෘතීය භාගය සූත්‍රාන්තපිටක ග්‍රන්ථ සඞ්ඛ්‍යායෙන් තුදුස් වැනි, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා සඞ්ඛ්‍යායෙන් විසිවැනි ග්‍රන්ථය වේ.

**ලඞ්කා බෞද්ධ මණ්ඩලය** විසින් ආරාධිත වූ ගම්පහ **විද්‍යාරවින්ද පරිවෙණාධිපති, ශ්‍රී කල්‍යාණීසාමග්‍රීධර්ම සඞ්ඝසභායෙහි අනුනායක, හල්ගස්තොට දේවානන්ද** ස්ථවිරයන් වහන්සේ විසින් අඞ්ගුත්තරනිකායෙහි පඤ්චක, ඡක්ක, සත්තකනිපාතයෝ සිංහලට පරිවර්තනය කරණ ලදහ. උන්වහන්සේ විසින් ඉදිරිපත් කරණ ලද ඒ නිපාතයන්ගේ සිංහල පරිවර්තනය සාධු වෑද ලැබීමට යොග්‍ය වේ. එහෙත් එය එලෙසින් ම මුද්‍රණයට පත් කිරීම පර්‍යාප්ත නොවනු සැලකූ **අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලයෙහි** අධිකාරී කෝදාගොඩ පණ්ඩිත ඤාණාලෝක නායක ස්ථවිරයන් වහන්සේ හා පරවාහැර පණ්ඩිත පඤ්ඤානන්ද, තලල්ලේ පණ්ඩිත ධම්මානන්ද යන ස්ථවිරවරයන් විසින් කොහුවල විජයමඞ්ගලාරාමාධිපති ආචාර්ය මකුළ්දූවේ පියරතන නායක ස්ථවිරයන් වහන්සේගේ සහායකත්වය ඇති ව අඞ්ගුත්තර පඤ්චකනිපාතය සකස් කොට සිංහලට පරිවර්තනය කරණ ලදී. ධර්මාර්ථ නො පිරිහෙලා පෙළද ශුද්ධ කරමින් සිංහල සාහිත්‍ය පොෂණයට ද හිත වන සේ පරිවර්තිත පඤ්චකනිපාතය අඞ්ගුත්තරනිකායේ තෘතීය භාගය වශයෙන් මුද්‍රණයට පිළියෙල කිරීමේ දී ත්‍රිපිටකපරිවර්තන සංශෝධක මණ්ඩලයෙහි සාමාජිකයන් වන ලබුගම පණ්ඩිත ලඞ්කානන්ද නායක ස්ථවිරයන් වහන්සේ හා කරගම්පිටිගොඩ පණ්ඩිත සුමනසාර ස්ථවිරයන් වහන්සේ විසින් දරණලද ආයාසය පැසසිය යුතු වේ. ශුද්ධිපත්‍ර බැලීමෙහි දී පරවාහැර පණ්ඩිත පඤ්ඤානන්ද ස්ථවිරයෝ ද උපකාරී වූහ.

අඞ්ගුත්තර පඤ්චකනිපාතයෙහි සූත්‍ර දහයක් බැගින් ඇති වර්ග විසිපහකි. වර්ග පහ පහ යෙදෙන පණ්ණාසක (සූත්‍ර පනහක් ඇති කොටස්) පහකි. එහෙත් **"ඡට්ඨො පණ්ණාසකො"** යි පෙළෙහි දක්වෙන හෙයින් එහි පණ්ණාසක සයක් ඇති බව පෙණේ. එ හෙයින් අප විසින් "ඡට්ඨ පණ්ණාසකං" යි පණ්ණාසක පිළිවෙළ අනුව ශීර්ෂ පාඨය යොදන ලදී. එහි ඇත්තේ 'උපසම්පදාවග්ගො" නමින් එක් වර්ගයෙකි. එය පණ්ණාසකයන්හි එන වර්ග සඞ්ඛ්‍යා පරිපාටිය අනුව "උපසම්පදාවග්ගො පඨමො" යි යොදන ලදී. එයට ස්වරූපයෙන් හා පෙය්‍යාලමුඛයෙන් සංක්ෂිප්ත ව දක්වෙන සූත්‍ර විසිඑකක් ඇතුළත් ය. පෙළෙහි වර්ග නාමයක් නැති අධික සඞ්ඛ්‍යාවක් පෙය්‍යාලයෙන් අන්තරහිත වූ සූත්‍ර තිස්නවයක් "වග්ගාතිරෙක-සුත්තානි" යි අප විසින් යොදන ලදහ. ඉක්බිති එන සූත්‍ර අටසියපනහක් "රාගාදිපෙය්‍යාලං" නමින් දක්වෙයි. මෙසෙයින් පඤ්ච පණ්ණාසයන්හි දක්වෙන සූත්‍ර දෙසියපනහ සමග අඞ්ගුත්තර පඤ්චකනිපාතයෙහි සූත්‍ර එක්දහස් එකසිය සැටක් වේ. එහෙත් පාළියෙහි නිපාතාවසානයෙහි "උප-සම්පදවග්ගො ඡට්ඨො" යි ද "ඡට්ඨො පණ්ණාසකො" යි ද දක්වමින් උපසම්පදා වර්ගයට සූත්‍ර නවසියදහයක් ඇතුළත් වන සේ අගවා තිබේ බුරුම අකුරෙන් ද සියම් අකුරෙන් ද මුද්‍රිත පොත්හි ද 'උපසම්පදා වග්ගො ඡට්ඨො' යි දක් වේ. පඤ්චම පණ්ණාසකයේ අවසන "වග්ගො පංචමො" යි දක්වූ පස්වන වග හා සම්බන්ධ කොට පෙළෙහි "උපසම්පදා වග්ගො ඡට්ඨො" යි දක්වා ඇති බව සිතිය හැකි වෙයි

මෙහි පාඨකයන්ගේ පහසුව සඳහා පෙළෙහි ඌන වූ ද අස්ථානපතිත වූ ද පෙය්‍යාලයන් [ ]-මේ ලකුණු අතර යොදා, එක ම පද්ධතියක් වශයෙන් යෙදී ඇති පදවාක්‍යයන් ද, ඒ ඒ සූත්‍රයන්හි එන පස්වැදෑරුම් ධර්මස්කන්ධයා ද වෙන් කොට දැක්වීමෙහි ලා අප විසින් දැරූ ආයාසය අනල්ප බව සැලකිය යුතු.

මේ ග්‍රන්ථය ද බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවෙහි 20 වැනි ග්‍රන්ථය වශයෙන් මෙසේ මුද්‍රණය කරවීමෙන් සිද්ධවන ධර්මදානමය පුණ්‍යමහිමයෙන් ලංකාණ්ඩුව ද, සාංස්කෘතික කාර්‍ය්‍යාංශයේ අධිකාරීහු ද, සිංහලජාතිය (ස්වදේශීය) මුද්‍රණාලයෙහි අධිකාරීන් හා මුද්‍රණ ශිල්පීහු ද, ග්‍රන්ථපරිවර්තක හා සංශෝධක ස්ථවිරවරු ද සුදුසු පරිදි ස්වර්ගාපවර්ග සම්පත් ලාභයෙන් සුවපත් වෙත්වා !

පරවාහැර වජිරඤාණ ස්ථවිර.
ත්‍රිපිටක පරිවර්තන කාරකසභාවෙහි ද
සංස්කාරක මණ්ඩලයෙහි ද සම්පාදක.

ශ්‍රී බුද්ධවර්ෂ 2512.
ත්‍රිපිටක කාර්‍ය්‍යාලය,
ධර්මදූත ආශ්‍රම විද්‍යාලය,
174, සිරිවජිරඤාණ මාවත,
කොළඹ 9.

# සඞ්කේතනිරූපනය

## ABBREVIATIONS

| | | |
|---|---|---|
| සි. 1. | — | 'පැල්මඩුල්ල' පුරාණ මහාවිහාර - සිහල තාලපණ්ණ පොත්ථකං |
| සි. 2. | — | 'ගාල්ල' පරමානන්‍දවිහාර - සිහල තාලපණ්ණ පොත්ථකං |
| සිමු. 1. | — | බෝරුග්ගමුවෙ සිරිරේවතථෙර සංසොධිත-සීහලක්ඛර මුද්දිත පොත්ථක. |
| සහා. | — | සහාමක්ඛර - මුද්දිත පොත්ථකං |
| මජසං. | — | මරම්මඡට්ඨසඞ්ගීති පිටක පොත්ථකං |
| PTS. | — | Pali Text Society - Aṅguttara Nikaya |

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS.

## VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අa | ආā | ඉi | ඊī | උu | ඌū | එē | ඔō |

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| කka | ඛkha | ගga | ඝgha | ඞna |
| චca | ඡcha | ජja | ඣjha | ඤṅa |
| ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa |
| තta | ථtha | දda | ධdha | නna |
| පpa | ඵpha | බba | භbha | මma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යya | රra | ලla | වva | සsa | හha | ළḷa | අංṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කka | කාkā | කිki | කීkī | කුku | කූkū | කෙkē | කොkō |
| ඛkha | ඛාkhā | ඛිkhi | ඛීkhī | ඛුkhu | ඛූkhū | ඛෙkhē | ඛොkhō |
| ගga | ගාgā | ගිgi | ගීgī | ගුgu | ගූgū | ගෙge | ගොgō |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්කkka | ඤ්ඤn̄n̄a | ත්‍රtra | ම්ඵmpha |
| ක්ඛkkha | ණ්හṇha | ද්දdda | ම්බ,ඹmba |
| ක්‍යkya | ඤ්චn̄ca | ද්ධddha | ම්භmbha |
| ක්‍රිkri | ඤ්ඡ,ඦn̄cha | ද්‍රdra | ම්මmma |
| ක්වkva | ඤ්ජ,ජn̄ja | ද්ව,ච්dva | ම්හmha |
| ඛ්‍යkhya | ඤ්ඣn̄jha | ධ්වdhva | ය්‍ය,ය්යyya |
| ඛ්වkhva | ට්ටṭṭa | න්තnta | ය්හyha |
| ග්ගgga | ට්ඨ,ඪṭṭha | න්ථntha | ල්ලlla |
| ග්ඝggha | ඩ්ඩḍḍa | න්දnda | ල්‍යlya |
| ඞ්කṅka | ඩ්ඪḍḍha | න්ධndha | ල්හlha |
| ග්‍රgra | ණ්ණṇṇa | න්නnna | ව්හwha |
| ඞ්ඛṅkha | ණ්ටṇṭa | න්හnha | ස්සssa |
| ඞ්ගṅga | ණ්ඨṇṭha | ප්පppa | ස්මsma |
| ඞ්ඝṅgha | ණ්ඩ,ඬṇḍa | ප්ඵppha | ස්වsva |
| ච්චcca | ණ්හṇha | බ්බbba | හ්මhma |
| ච්ඡccha | ත්තtta | බ්භbbha | හ්වhva |
| ජ්ජjja | ත්ථttha | බ්‍රbra | ළ්හḷha |
| ජ්ඣjjha | ත්වtva | ම්පmpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු ු u | ූ ූ ū | ෙ e | ො ō |

# අඞ්ගුත්තරනිකායො

## තතියභාග – විසයසූචි

## පඤ්චකනිපාතො


| විසයා | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| | **පඨම පණ්ණාසකං** | | | **2– 98** |
| | **1. සෙඛබලවග්ගො** | | | **2– 14** |
| 1. | සෙඛබල සඞ්ඛිත්ත | සුත්තං | ... ... | 2– |
| 2. | සෙඛබල විත්ථත | ,, | ... ... | 2– 4 |
| 3. | දුක්ඛ | ,, | ... .. | 4– 6 |
| 4. | තථාගත | ,, | ... ... | 6– |
| 5 | සික්ඛාපච්චක්ඛාන | ,, | ... ... | 6– 8 |
| 6. | අකුසලසමාපත්ති | ,, | ... ... | 8– |
| 7. | කාමෙසුපලාළිත | ,, | ... ... | 8– 10 |
| 8. | චවන | ,, | ... ... | 10– 12 |
| 9 | පඨමඅගාරව | ,, | ... ... | 12– 14 |
| 10. | දුතියඅගාරව | ,, | ... ... | 14– |
| | **සෙඛබලවග්ගො පඨමො.** | | | |
| | **2. බලවග්ගො** | | | **16– 24** |
| 1. | තථාගතබල | සුත්තං | ... ... | 16– |
| 2. | සෙඛබලඅඞ්ග | ,, | ... ... | 16– |
| 3. | බලසඞ්ඛිත්ත | ,, | ... ... | 18– |
| 4. | බලවිත්ථත | ,, | ... ... | 18– |
| 5. | බලදට්ඨබ්බ | ,, | ... ... | 18– 20 |
| 6. | බලඅඞ්ග | ,, | ... ... | 20– |
| 7. | අත්තහිත | ,, | ... ... | 20– |
| 8. | පරහිත | ,, | ... ... | 22– |
| 9 | නෙවඅත්තහිත–නො පරහිත | ,, | ... ... | 22– |
| 10. | අත්තහිත–පරහිත | ,, | ... ... | 24– |
| | **බලවග්ගො දුතියො.** | | | |
| | **3. පඤ්චඞ්ගිකවග්ගො** | | | **26– 48** |
| 1. | පඨමඅගාරව | සුත්තං | ... ... | 26– |
| 2 | දුතියඅගාරව | ,, | ... ... | 26– |
| 3. | උපක්කිලෙස | ,, | ... ... | 28– 30 |
| 4. | දුස්සීල | ,, | ... ... | 30– |
| 5. | අනුග්ගහිත | ,, | ... ... | 32– |
| 6. | විමුත්තායතන | ,, | ... ... | 32– 36 |
| 7. | සමාධි | ,, | ... ... | 36– |
| 8. | පඤ්චඞ්ගිකසමාධි | ,, | ... ... | 36– 42 |
| 9. | චඞ්කමානිසංස | ,, | ... ... | 44– |
| 10. | නාගිත | ,, | ... ... | 44– 48 |
| | **පඤ්චඞ්ගිකවග්ගො තතියො.** | | | |

| විසයා | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| **4. සුමනාවග්ගො** | | | | **50– 68** |
| 1. සුමනා | සුත්තං | ... | ... | 50– 52 |
| 2. චුන්දී | ,, | ... | ... | 54– 56 |
| 3. උග්ගහ | ,, | ... | ... | 56– 58 |
| 4. සීහසෙනාපති | ,, | ... | ... | 60– 62 |
| 5. දානානිසංස | ,, | ... | ... | 62– |
| 6. කාලදාන | ,, | ... | ... | 62– 64 |
| 7. භොජන | ,, | ... | ... | 64– |
| 8. සද්ධා | ,, | ... | ... | 64– 66 |
| 9. පුත්ත | ,, | ... | ... | 66– |
| 10. මහාසාල | ,, | ... | ... | 68– |
| **සුමනාවග්ගො චතුත්ථො.** | | | | |
| **5. මුණ්ඩරාජවග්ගො** | | | | **70– 98** |
| 1. පඤ්චභොගආදිය | සුත්තං | ... | ... | 70– 72 |
| 2. සප්පුරිස | ,, | ... | ... | 72– |
| 3. පඤ්චඉට්ඨධම්ම | ,, | ... | ... | 74– 76 |
| 4. මනාපදායී | ,, | ... | ... | 76– 80 |
| 5. පුඤ්ඤාභිසන්ද | ,, | ... | .. | 80– 82 |
| 6. පඤ්චසම්පදා | ,, | ... | ... | 82– |
| 7. පඤ්චධන | ,, | ... | ... | 82– 84 |
| 8. අලබ්භනීයට්ඨාන | ,, | ... | ... | 84– 88 |
| 9. කොසල | ,, | ... | ... | 88– |
| 10. සොකසල්ලහරණ | ,, | ... | ... | 90– 98 |
| **මුණ්ඩරාජවග්ගො පඤ්චමො.** | | | | |
| **පඨමො පණ්ණාසකො** | | | | |
| **2. දුතිය පණ්ණාසකං** | | | | **100-200** |
| **1. නීවරණවග්ගො** | | | | **100-124** |
| 1. නීවරණ | සුත්තං | ... | ... | 100-102 |
| 2. අකුසලරාසි | ,, | ... | ... | 102- |
| 3. පධානියඞ්ග | ,, | ... | ... | 104- |
| 4. අසමය-සමය | ,, | ... | ... | 104-106 |
| 5. මාතාපුත්ත | ,, | .. | ... | 106-108 |
| 6. උපජ්ඣාය | ,, | ... | ... | 110-112 |
| 7. ඨාන | ,, | ... | ... | 112-118 |
| 8. ලිච්ඡවිකුමාර | ,, | ... | ... | 120-124 |
| 9 පඨමබුඩ්ඪපබ්බජිත | ,, | ... | ... | 124- |
| 10. දුතියබුඩ්ඪපබ්බජිත | ,, | ... | ... | 124- |
| **නීවරණවග්ගො පඨමො** | | | | |

| විසයං | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| **2. සඤ්ඤාවග්ගො** | | | | **126-132** |
| 1. පඨම සඤ්ඤා | සුත්තං | ... | ... | 126- |
| 2. දුතිය සඤ්ඤා | ” | ... | ... | 126- |
| 3. පඨම වඩ්ඪි | ” | ... | ... | 126- |
| 4. දුතිය වඩ්ඪි | ” | ... | ... | 128- |
| 5. අලංසාකච්ඡ | ” | ... | ... | 128- |
| 6. අලංසාජීව | ” | ... | ... | 128- |
| 7. පඨම ඉද්ධිපාද | ” | ... | ... | 130- |
| 8. දුතිය ඉද්ධිපාද | ” | ... | ... | 130- |
| 9. නිබ්බිදා | ” | ... | ... | 132- |
| 10. ආසවක්ඛය | ” | ... | ... | 132- |

**සඤ්ඤාවග්ගො දුතියො.**

| | | | | |
|---|---|---|---|---|
| **3. අනාගතභයවග්ගො** | | | | **134-174** |
| 1 පඨම චෙතොවිමුත්තිඵල | සුත්තං | ... | ... | 134-136 |
| 2 දුතිය චෙතොවිමුත්තිඵල | ” | ... | ... | 136-138 |
| 3 පඨම ධම්මවිහාරී | ” | ... | ... | 138-140 |
| 4. දුතිය ධම්මවිහාරී | ” | ... | ... | 140-142 |
| 5 පඨම යොධාජීවූපම | ” | ... | ... | 142-148 |
| 6. දුතිය යොධාජීවූපම | ” | ... | ... | 150-160 |
| 7. පඨම අනාගතභය | ” | ... | ... | 162-164 |
| 8. දුතිය අනාගතභය | ” | ... | ... | 164-168 |
| 9. තතිය අනාගතභය | ” | ... | ... | 170-172 |
| 10. චතුත්ථ අනාගතභය | ” | ... | ... | 172-174 |

**අනාගතභයවග්ගො තතියො.**

| | | | | |
|---|---|---|---|---|
| **4. ථෙරවග්ගො** | | | | **176-188** |
| 1. රජනීය | සුත්තං | ... | ... | 176- |
| 2. වීතරාග | ” | ... | ... | 176- |
| 3. කුහක | ” | ... | ... | 178- |
| 4. අස්සද්ධ | ” | ... | ... | 178- |
| 5 අක්ඛම | ” | ... | ... | 180- |
| 6. පටිසම්භිදා | ” | ... | ... | 180- |
| 7. සීල | ” | ... | ... | 182- |
| 8. ථෙර | ” | ... | ... | 182-184 |
| 9. පඨම සෙඛ | ” | ... | ... | 184- |
| 10. දුතිය සෙඛ | ” | ... | ... | 186-188 |

**ථෙරවග්ගො චතුත්ථො.**

විසයා — පිට්ඨඞ්කානි

5. කකුධවග්ගො — 190-200

1. පඨම සම්පදා සුත්තං ... ... 190-
2. දුතිය සම්පදා " ... ... 190-
3. අඤ්ඤබ්‍යාකරණ " ... ... 190-
4. ඵාසුවිහාර " ... ... 190-
5. අකුප්ප " ... ... 192-
6. දුතිය අකුප්ප " ... ... 192-
7. තතිය අකුප්ප " ... ... 192-
8. චතුත්ථ අකුප්ප " ... .. 194-
9. සීහ " ... ... 194-
10. කකුධ " ... ... 196-200

කකුධවග්ගො පඤ්චමො.

දුතිය පණ්ණාසකං.

3. තතිය පණ්ණාසකං

1. ඵාසුවිහාරවග්ගො — 202-218

1. සෙඛවෙසාරජ්ජ සුත්තං ... ... 202-
2. සඞ්කිත " ... ... 202-
3. මහාචොර " ... ... 204-206
4. සමණසුඛුමාල " ... ... 208-210
5. ඵාසුවිහාර " ... ... 210-
6. ආනන්ද " ... ... 212-214
7. සීලසම්පන්න " ... ... 214-
8. අසෙඛ " ... ... 214-
9. චාතුද්දිස " ... ... 216-
10. අරඤ්ඤ " ... ... 216-218

ඵාසුවිහාරවග්ගො පඨමො.

2. අන්ධකවින්දවග්ගො — 220-230

1. කුලූපග සුත්තං ... ... 220-
2. පච්ඡාසමණ " ... ... 220-
3. සම්මාසමාධි " ... ... 222-
4. අන්ධකවින්ද " ... ... 222-224
5. මච්ඡරී " ... ... 224-
6. වණ්ණ " ... ... 224-226
7. ඉස්සුකී " ... ... 226-
8. මිච්ඡාදිට්ඨික " ... ... 226-228
9. මිච්ඡාවාචා " ... ... 228-
10. මිච්ඡාවායාම " ... ... 228-230

අන්ධකවින්දවග්ගො දුතියො.

| විසයා | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| **3. ගිලානවග්ගො** | | | | **232-240** |
| 1. ගිලාන | සුත්තං | ... | ... | 232- |
| 2. සතිසූපට්ඨිත | ” | ... | ... | 232- |
| 3 දූපට්ඨාකගිලාන | ” | ... | ... | 234- |
| 4. ගිලානුපට්ඨාක | ” | ... | ... | 234-236 |
| 5. පඨමආයුස්ස | ” | ... | ... | 236- |
| 6. දුතිය ආයුස්ස | ” | ... | ... | 236- |
| 7. වපකාස | ” | ... | ... | 238- |
| 8. සමණදුක්ඛ-සුඛ | ” | ... | ... | 238- |
| 9. පරිකුප්ප | ” | ... | ... | 240- |
| 10. සම්පදා | ” | ... | ... | 240- |

**ගිලානවග්ගො තතියො.**

| | | | | |
|---|---|---|---|---|
| **4. රාජවග්ගො** | | | | **242-266** |
| 1. පඨම චක්කානුවත්තන | සුත්තං | ... | ... | 242- |
| 2. දුතියචක්කානුවත්තන | ” | ... | ... | 242-244 |
| 3. ධම්මරාජ | ” | ... | ... | 244-246 |
| 4. ඛත්තියරාජ | ” | ... | ... | 246-248 |
| 5. පඨම පත්ථනා | ” | ... | ... | 248-250 |
| 6. දුතියපත්ථනා | ” | ... | ... | 252-254 |
| 7. අප්පංසුපති | ” | ... | ... | 254- |
| 8. භත්තාදක | ” | ... | ... | 254-256 |
| 9. අක්ඛම | ” | ... | ... | 256-268 |
| 10. සොතාර | ” | ... | ... | 262-266 |

**රාජවග්ගො චතුත්ථො.**

| | | | | |
|---|---|---|---|---|
| **5. තිකණ්ඩකීවග්ගො** | | | | **268-282** |
| 1. අවජානාති | සුත්තං | ... | ... | 268- |
| 2. ආරභති | ” | ... | ... | 268-272 |
| 3. සාරන්දද | ” | ... | ... | 272-274 |
| 4. තිකණ්ඩකී | ” | ... | ... | 274 276 |
| 5. නිරය | ” | ... | ... | 276-278 |
| 6 භික්ඛුමිත්ත | ” | ... | ... | 278- |
| 7. අසප්පුරිසදාන | ” | ... | ... | 278-280 |
| 8. සප්පුරිසදාන | ” | ... | ... | 280- |
| 9. පඨම සමයවිමුත්ත | ” | ... | ... | 280-282 |
| 10. දුතිය සමයවිමුත්ත | ” | ... | ... | 282- |


**තිකණ්ඩකීවග්ගො පඤ්චමො.**

**තතිය පණ්ණාසකං.**

## 4. චතුත්ථ පණ්ණාසකං


| විසයා | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| **1. සද්ධම්මවග්ගො** | | | | **284-300** |
| 1. පඨම සම්මත්තනියාම | සුත්තං | ... | ... | 284- |
| 2. දුතිය සම්මත්තනියාම | ” | ... | ... | 284- |
| 3. තතිය සම්මත්තනියාම | ” | ... | ... | 286- |
| 4. පඨම සද්ධම්මසම්මොස | ” | ... | ... | 286-288 |
| 5. දුතිය සද්ධම්මසම්මොස | ” | ... | ... | 288-290 |
| 6. තතිය සද්ධම්මසම්මොස | ” | ... | ... | 290-294 |
| 7. දුක්කථා | ” | ... | ... | 294-298 |
| 8. සාරජ්ජ | ” | ... | ... | 298- |
| 9. උදායි | ” | ... | ... | 300- |
| 10. දුප්පටිවිනොදය | ” | ... | ... | 300- |

සද්ධම්මවග්ගො පඨමො.

| | | | | |
|---|---|---|---|---|
| **2. ආඝාතවග්ගො** | | | | **302-328** |
| 1. පඨම ආඝාතපටිවිනය | සුත්තං | ... | ... | 302- |
| 2. දුතිය ආඝාතපටිවිනය | ” | ... | ... | 302-308 |
| 3. සාකච්ඡා | ” | ... | ... | 308- |
| 4. සාජීව | ” | ... | ... | 310- |
| 5. පඤ්හපුච්ඡා | ” | ... | ... | 310- |
| 6. නිරොධ | ” | ... | ... | 312-316 |
| 7. චොදන | ” | ... | ... | 318-322 |
| 8. සීල | ” | ... | ... | 324- |
| 9. ඛිප්පනිසන්ති | ” | ... | ... | 324-326 |
| 10. භද්දජි | ” | ... | ... | 326-328 |

ආඝාතවග්ගො දුතියො.

| | | | | |
|---|---|---|---|---|
| **3. උපාසකවග්ගො** | | | | **330-354** |
| 1. සාරජ්ජ | සුත්තං | ... | ... | 330- |
| 2. විසාරද | ” | ... | .. | 330- |
| 3. නිරය | ” | ... | ... | 332- |
| 4. වෙර | ’ | ... | ... | 332-334 |
| 5. උපාසකචණ්ඩාල | ” | ... | ... | 334-33 |
| 6. පීති | ” | ... | ... | 336-338 |
| 7. වණිජ්ජා | ” | ... | ... | 338- |
| 8. රාජ | ” | ... | ... | 338-342 |
| 9. ගිහි | ” | ... | ... | 342-348 |
| 10. ගවෙසී | ” | ... | ... | 348 354 |

උපාසකවග්ගො තතියො.

| විසයං | | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|---|
| | **4. ආරඤ්ඤකවග්ගො** | | | | **356-360** |
| 1. | ආරඤ්ඤක | සුත්තං | ... | ... | 356- |
| 2. | පංසුකූලික | " | ... | | 356- |
| 3. | පිණ්ඩපාතික | " | ... | | 356- |
| 6. | රුක්ඛමූලික | " | ... | | 356- |
| 5. | සොසානික | " | ... | ... | 358- |
| 6. | අබ්භොකාසික | " | ... | .... | 358- |
| 7. | නෙසජ්ජික | " | ... | ... | 358- |
| 8. | යථාසන්ථතික | " | ... | ... | 358- |
| 9. | එකාසනික | " | ... | ... | 358- |
| 10. | ඛලුපච්ඡාභත්තික | " | ... | ... | 358- |
| 11. | පත්තපිණ්ඩික | " | ... | ... | 360- |

**ආරඤ්ඤකවග්ගො චතුත්ථො.**

| | | | | | |
|---|---|---|---|---|---|
| | **5. සොණවග්ගො** | | | | **362-396** |
| 1. | සොණ | සුත්තං | ... | ... | 362- |
| 2. | දොණ | " | ... | ... | 364-372 |
| 3. | සඞ්ගාරව | " | ... | ... | 374-380 |
| 4. | කාරණපාලි | " | ... | ... | 382-384 |
| 5. | පිඞ්ගියානි | " | ... | ... | 384-386 |
| 6. | මහාසුපින | " | ... | ... | 386-390 |
| 7. | වස්සන්තරාය | " | ... | ... | 390- |
| 8. | සුභාසිතවාචා | " | ... | ... | 392- |
| 9. | කුල | " | ... | ... | 392- |
| 10. | නිස්සාරණීය | " | ... | ... | 394-396 |

**සොණවග්ගො පඤ්චමො.**

**චතුත්ථො පණ්ණාසකො සමත්තො.**

**5. පඤ්චම පණ්ණාසකං**

| | | | | | |
|---|---|---|---|---|---|
| | **1. කිම්බිලවග්ගො** | | | | **398-404** |
| 1. | කිම්බිල | සුත්තං | ... | ... | 398- |
| 2. | ධම්මසවණ | " | ... | ... | 398- |
| 3. | ආජානීය | " | ... | ... | 400- |
| 6. | බල | " | ... | ... | 400- |
| 5. | චෙතොඛිල | " | ... | ... | 400- |
| 6. | විනිබන්ධ | " | ... | ... | 402- |
| 7. | යාගු | " | ... | ... | 402- |
| 8. | දන්තකට්ඨ | " | ... | ... | 402-404 |
| 9 | ගීතස්සර | " | ... | ... | 404- |
| 10. | මුට්ඨස්සති | " | ... | ... | 404- |

**කිම්බිලවග්ගො පඨමො.**

**විසයා** **පිට්ඨඞ්කානි**

| | | | | | |
|---|---|---|---|---|---|
| | **2. අක්කොසකවග්ගො** | | | | **406-414** |
| 1. | අක්කොසක | සුත්තං | ... | ... | 406- |
| 2. | භණ්ඩනකාරක | ,, | ... | ... | 406- |
| 3. | සීල | ,, | ... | ... | 406-408 |
| 4. | බහුභාණී | ,, | ... | ... | 408-410 |
| 5. | පඨම අක්ඛන්ති | ,, | ... | ... | 410- |
| 6. | දුතිය අක්ඛන්ති | ,, | ... | ... | 410- |
| 7. | පඨම අපාසාදික | ,, | ... | ... | 412- |
| 8. | දුතිය අපාසාදික | ,, | ... | ... | 412- |
| 9. | අග්ගි | ,, | ... | ... | 414- |
| 10. | මධුරා | ,, | ... | ... | 414- |

**අක්කොසවග්ගො දුතියො.**

| | | | | | |
|---|---|---|---|---|---|
| | **3. දීඝචාරිකවග්ගො** | | | | **416-422** |
| 1. | පඨම දීඝචාරික | සුත්තං | ... | ... | 416- |
| 2. | දුතිය දීඝචාරික | ,, | ... | ... | 416- |
| 3 | පඨම අතිනිවාස | ,, | ... | ... | 418- |
| 4. | දුතිය අතිනිවාස | ,, | ... | ... | 418- |
| 5. | පඨම කුලූපග | ,, | ... | ... | 420- |
| 6. | දුතිය කුලූපග | ,, | ... | ... | 420- |
| 7. | භොග | ,, | ... | ... | 420- |
| 8. | උස්සූරභත්ත | ,, | ... | ... | 422- |
| 9. | පඨම කණ්හසප්ප | ,, | ... | ... | 422- |
| 10. | දුතිය කණ්හසප්ප | ,, | ... | ... | 424- |

**දීඝචාරිකවග්ගො තතියො.**

| | | | | | |
|---|---|---|---|---|---|
| | **3. ආවාසිකවග්ගො** | | | | **426-434** |
| 1. | අභාවනීය | සුත්තං | ... | ... | 426- |
| 2. | පිය | ,, | ... | ... | 426- |
| 3. | සොභන | ,, | ... | ... | 428- |
| 4. | බහූපකාර | ,, | ... | ... | 428- |
| 5. | අනුකම්පක | ,, | ... | ... | 428- |
| 6. | පඨම අවණ්ණාරහ | ,, | ... | ... | 430- |
| 7. | දුතිය අවණ්ණාරහ | ,, | ... | ... | 430-432 |
| 8. | තතිය අවණ්ණාරහ | ,, | ... | ... | 432- |
| 9. | පඨම මච්ඡරිය | ,, | ... | ... | 432-434 |
| 10. | දුතිය මච්ඡරිය | ,, | ... | ... | 434- |

**ආවාසිකවග්ගො චතුත්ථො.**

**විසයං** | **පිට්ඨඞ්කානි**


| | | | | | |
|---|---|---|---|---|---|
| | **5. දුච්චරිත වග්ගො** | | | | **436-442** |
| 1. | දුච්චරිත | සුත්තං | ... | ... | 436- |
| 2. | කායදුච්චරිත | ,, | ... | ... | 436- |
| 3. | වචීදුච්චරිත | ,, | ... | ... | 436- |
| 4. | මනොදුච්චරිත | ,, | ... | ... | 436- |
| 5. | අපරදුච්චරිත | ,, | ... | ... | 438- |
| 6. | අපරකායදුච්චරිත | ,, | ... | ... | 438- |
| 7. | අපරවචීදුච්චරිත | ,, | ... | ... | 438- |
| 8. | අපරමනොදුච්චරිත | ,, | ... | ... | 438- |
| 9. | සීවථිකා | ,, | ... | ... | 440- |
| 10. | පුග්ගලප්පසාද | ,, | ... | ... | 442- |


**දුච්චරිත වග්ගො පඤ්චමො.**

**ඡට්ඨපණ්ණාසකං***


| | | | | | |
|---|---|---|---|---|---|
| | **1. උපසම්පදා වග්ගො** | | | | **444 452** |
| 1. | උපසම්පාදෙතබ්බ | සුත්තං | ... | ... | 444- |
| 2 | නිස්සය | ,, | ... | ... | 444- |
| 3. | සාමණෙර | ,, | ... | ... | 444- |
| 4. | මච්ඡරිය | ,, | ... | ... | 446- |
| 5. | මච්ඡරියපහාන | ,, | ... | ... | 446- |
| 6. | පඨමජ්ඣාන | ,, | ... | ... | 446- |
| 7-9. | දුතියජ්ඣානාදිසුත්තානි | ,, | ... | ... | 448- |
| 10. | අපරපඨමජ්ඣාන | සුත්තං | ... | ... | 448- |
| 11-13. | අපරදුතියජ්ඣානාදි | සුත්තානි | ... | ... | 450- |
| 14-17. | සොතාපත්තිඵලාදිසච්ඡිකිරිය | ,, | ... | ... | 450- |
| 18-21. | අපරසොතාපත්තිඵලාදිසච්ඡිකිරිය සුත්තානි | | | ... | 452- |


**උපසම්පදා වග්ගො පඨමො.**


| | | | | | |
|---|---|---|---|---|---|
| | **වග්ගාතිරෙක සුත්තානි** | | | | **454-461** |
| 1. | භත්තුද්දෙසක | සුත්තං | ... | ... | 454- |
| 2-5. | දුතියභත්තුද්දෙසකාදි | සුත්තානි | ... | ... | 454-456 |
| 6-22. | සෙනාසනපඤ්ඤාපකාදි | ,, | ... | ... | 456-460 |
| 1. | භික්ඛු | සුත්තං | ... | ... | 460-462 |
| 2-7. | භික්ඛුනී | සුත්තාදීනි | ... | ... | 462- |
| 8. | ආජීවක | සුත්තං | ... | ... | 462- |
| 9-17. | නිගණ්ඨ | සුත්තාදීනි | ... | ... | 464- |
| | **රාගාදිපෙය්‍යාලං** | | | | **466-468** |
| 1-5. | රාගාදිපෙය්‍යාල | සුත්තානි | ... | ... | 466- |
| 6-850. | රාගාදිපෙය්‍යාල | ,, | ... | ... | 468- |


**රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං**

**පඤ්චකනිපාතො සමත්තො.**

* සංස්කාරක නිවේදනය බලනු.

සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

තතියො භාගො

# සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

## තතියො භාගො

---

## පඤ්චකනිපාතො

### 1. පඨමො පණ්ණාසකො

### 1. සෙඛබලවග්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

**5. 1. 1 1**

[ **සෙඛබලසංඛිත්තසුත්තං** ]

1. ඒවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

පඤ්චිමානි භික්ඛවෙ සෙඛබලානි. කතමානි පඤ්ච: සද්ධාබලං හිරිබලං[1] ඔත්තප්පබලං විරියබලං[2] පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සෙඛබලානි.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: "සද්ධාබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙන, හිරිබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙන, ඔත්තප්පබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙන, විරියබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙන, පඤ්ඤාබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙනා"ති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.*

**5. 1. 1. 2**

[ **සෙඛබලවිත්ථතසුත්තං** ]

[ **සාවත්ථිනිදානං:** ]

2. පඤ්චිමානි භික්ඛවෙ සෙඛබලානි. කතමානි පඤ්ච: සද්ධාබලං හිරිබලං ඔත්තප්පබලං විරියබලං පඤ්ඤාබලං.

---

1. හිරීබලං - ඉජසං, සයා 2. වීරියබලං - මජසං

* ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති - මජසං.

# සූත්‍රාන්තපිටකයෙහි

# අඞ්ගුත්තරනිකාය

### තෘතීයභාගය

---

## පඤ්චකනිපාතය

### 1. ප්‍රථම පණ්ණාසකය

### 1. සෙඛබලවර්ගය

**ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

**5. 1. 1. 1**

**[ සෙඛබලසඞ්ඛිත්ත සූත්‍රය ]**

1. **මා** විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් බැණවූ සේක. ඒ භික්ෂූහු 'වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

මහණෙනි, මේ ශෛක්ෂ (සෝවාන් ආදි හික්මෙන සත්දෙනාගේ) බලයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්: සද්ධාබලය, හිරිබලය, ඔත්තප්පබලය, විරියබලය, පඤ්ඤාබල යි. මහණෙනි, මොහු පඤ්චශෛක්ෂබලයෝ යි.

මහණෙනි, එහෙයින් මෙසේ හික්මෙන්නේ ය. ශෛක්ෂබලය වූ සද්ධාබලයෙන් සමන්වාගත වම්හ. ශෛක්ෂබලය වූ හිරිබලයෙන් සමන්වාගත වම්හ. ශෛක්ෂබලය වූ ඔත්තප්පබලයෙන් සමන්වාගත වම්හ. ශෛක්ෂබලය වූ විරියබලයෙන් සමන්වාගත වම්හ. ශෛක්ෂබලය වූ පඤ්ඤාබලයෙන් සමන්වාගත වම්හ'' යි. මහණෙනි, තොප මෙසේ ම හික්මෙන්නේ ය.

**5. 1. 1. 2**

**[ සෙඛබලවිත්ථත සූත්‍රය ]**

**[සැවැත්නිදාන යි:]**

2. මහණෙනි, මේ ශෛක්ෂබල පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්: සද්ධාබලය හිරිබලය ඔත්තප්පබලය විරියබලය පඤ්ඤාබල යි.

කතමඤ්ච භික්ඛවෙ සද්ධාබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො සද්ධො හොති. සද්දහති තථාගතස්ස බොධිං: "ඉතිපි සො භගවා අරහං සම්මා-සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම-සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ඉදං වුච්චති භික්ඛවෙ සද්ධාබලං.

කතමඤ්ච භික්ඛවෙ හිරිබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො හිරිමා[1] හොති. හිරීයති කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඉදං වුච්චති භික්ඛවෙ හිරිබලං.

කතමඤ්ච භික්ඛවෙ ඔත්තප්පබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො ඔත්තප්පී හොති. ඔත්තප්පති කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන. ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඉදං වුච්චති භික්ඛවෙ ඔත්තප්පබලං.

කතමඤ්ච භික්ඛවෙ විරියබලං:[2] ඉධ භික්ඛවෙ අරියසාවකො ආරද්ධ-විරියො විහරති අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. ඉදං වුච්චති භික්ඛවෙ විරියබලං.

කතමඤ්ච භික්ඛවෙ පඤ්ඤාබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො පඤ්ඤවා හොති. උදයත්ථගාමිනියා[3] පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. ඉදං වුච්චති භික්ඛවෙ පඤ්ඤාබලං.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්චසෙඛබලානි.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: සද්ධාබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙන. හිරිබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙන. ඔත්තප්පබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙන. විරියබලෙන සමන්නා-ගතා භවිස්සාම සෙඛබලෙන. පඤ්ඤාබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙනාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 5. 1. 1. 3

## [ දුක්ඛසුත්තං ]

3. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සවුපායාසං[4] සපරිළාහං, කායස්ස ච භෙදා[5] පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී[6] හොති, කුසීතො හොති, දුප්පඤ්ඤො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සවුපායාසං සපරිළාහං, කායස්ස ච භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා.

1. හිරීමා - මජ්ඣං 2. වීරියබලං - මජ්ඣං 3. උදයබ්බයගාමිනියා - සීමු
4. ස උපායාසං - සයා, මජ්ඣං 5. කායස්සභෙදා - සයා 6 අනොත්තාපී - සීමු.

මහණෙනි, සද්ධාබල කවරේ ය: මහණෙනි, මේ සස්නෙහි අරිසවු සැදැහැති වෙයි. "මෙකරුණෙනුදු ඒ භගවත්හු අර්හත්හ. සම්‍යක්සම්බුද්ධයහ. විජ්ජාචරණසම්පන්නයහ. සුගතයහ. ලොකවිද්හ. අනුත්තරපුරුෂදම්‍යසාරථී-යහ. දෙව්මිනිස්නට ශාස්තෘයහ. බුද්ධයහ. භගවත්හ"යි තථාගතයන්ගේ බොධිය (බුද්ධගුණ) හදහන්නේ ය. මහණෙනි, මෙ ශ්‍රද්ධාබල ය යි කියනු ලැබේ.

මහණෙනි, හිරිබල කවරේ ය: මහණෙනි, මෙ සස්නෙහි අරිසවු හිරි ඇති වෙයි. කායදුශ්චරිතය, වාග්දුශ්චරිතය, මනොදුශ්චරිතය ගරහයි. ලමි අකුසල්දහමුන්ගේ සමාපත්තිය (ආගමනය) ගරහයි. මහණෙනි, මේ හ්‍රී බලයැ" යි කියනු ලැබේ.

මහණෙනි, ඔත්තප්පබල කවරේ ය: මහණෙනි, මෙ සස්නෙහි අරිසවු අපත්‍රපා ඇති වෙයි. කායදුශ්චරිතහෙතුයෙන් වාග්දුශ්චරිතහෙතුයෙන් මනොදුශ්චරිතහෙතුයෙන් බානේ යැ ලාමකඅකුශලධර්මයන්ගේ සමාපත්ති හෙතුයෙන් බානේ ය. මහණෙනි, මේ අපත්‍රපාබල යැ යි කියනු ලැබේ.

මහණෙනි, විරියබල කවරේ ය: මහණෙනි, මෙ සස්නෙහි අරිසවු අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ උපසම්පත් (ප්‍රතිලාභ) පිණිස රුකුළුවැර ඇතියේ, ශක්ති ඇතියේ, දළපැරකුම් ඇතියේ, කුශල-ධර්මයෙහි නොබහාලූ ප්‍රධන්කිස ඇතියේ වාස කරන්නේ ය. මහණෙනි, මේ විරියබල යි කියනු ලැබේ.

මහණෙනි, පඤ්ඤාබල කවරේ ය: මහණෙනි, මෙ සස්නෙහි අරිසවු (සත්ත්වයන්ගේ) උදවිය පිළිවිදුනට සමත් ආර්‍ය්‍ය (කෙලෙසුන් කෙරෙන් වෙන් ව සිටුනා හෙයින් පරිශුද්ධ) වූ නිර්වේධිකා වූ (කෙලෙස් බිඳුනට සමත්) සම්‍යග්හෙතුනය විසින් වටකෙලෙස්දුක් ගෙවමින් යන (විදර්ශනාමාර්ග) ප්‍රඥායෙන් සමන්‍වාගත වූයේ ප්‍රඥාවත් වෙයි. මහණෙනි, මේ ප්‍රඥාබල යි කියනු ලැබේ.

මහණෙනි, මොහු පඤ්චශෛක්ෂබලයෝ යි.

මහණෙනි, එහෙයින් මෙසේ හික්මෙන්නේ ය: "ශෛක්ෂබලය වූ ශ්‍රද්ධා-බලයෙන් සමන්‍වාගත වම්හ. ශෛක්ෂබලය වූ හ්‍රීබලයෙන් සමන්‍වාගත වම්හ. ශෛක්ෂබලය වූ අපත්‍රපාබලයෙන් සමන්‍වාගත වම්හ. ශෛක්ෂබලය වූ වීර්‍ය්‍ය-බලයෙන් සමන්‍වාගත වම්හ. ශෛක්ෂබලය වූ ප්‍රඥාබලයෙන් සමන්‍වාගත වම්හ" යි. මහණෙනි, තොප මෙසේ ම හික්මෙන්නේ ය.

## 5. 1. 1. 3

## [ දුක්ඛ සූත්‍රය ]

3. මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ ඉහාත්මයෙහි ම විඝාත (දුක්) සහිත උපායාස (දැඩි දුකින් උපන් ප්‍රතිඝ) සහිත පරිඩාහ සහිත දුඃඛවිහරණ කෙරෙයි. කාබුන් මරණින් මතුදු දුර්ගති කැමැති විය යුතු. කවර පඤ්චධර්මයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රද්ධා නැති වෙයි. හ්‍රී නැති වෙයි. අපත්‍රපා නැති වෙයි. කුසීත වෙයි. දුෂ්ප්‍රාඥ වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ ඉහාත්මයෙහි ම විඝාත සහිත උපායාස සහිත පරිඩාහ සහිත දුඃඛවිහරණ කරයි. කාබුන් මරණින් මතුදු දුර්ගති කැමැති විය යුතු යි.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං. කායස්ස ච භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛා. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති ආරද්ධවිරියො හොති, පඤ්ඤවා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං. කායස්ස ච භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛාති.

## 5. 1. 1. 4

## [ යථාභතසුත්තං ]

4. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, කුසීතො හොති, දුප්පඤ්ඤො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, ආරද්ධවිරියො හොති, පඤ්ඤවා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 5. 1. 1. 5

## [ සික්ඛාපච්චක්ඛානසුත්තං ]

5. යො හි කොචි භික්ඛවෙ භික්ඛු වා භික්ඛුනී වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති, තස්ස දිට්ඨෙ වෙව ධම්මෙ[1] පඤ්ච සහධම්මිකා වාදානුපාතා ගාරය්හා ඨානා[2] ආගච්ඡන්ති. කතමෙ පඤ්ච:

"සද්ධාපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. හිරීපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. ඔත්තප්පම්පි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. විරියම්පි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. පඤ්ඤාපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු."

යො හි කොචි භික්ඛවෙ භික්ඛු වා භික්ඛුනී වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති, තස්ස දිට්ඨෙ වෙව ධම්මෙ ඉමෙ පඤ්ච සහධම්මිකා වාදානුපාතා ගාරය්හා ඨානා[2] ආගච්ඡන්ති.

යො හි කොචි භික්ඛවෙ භික්ඛු වා භික්ඛුනී වා සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අස්සුමුඛො රුදමානො පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, තස්ස දිට්ඨෙ වෙව ධම්මෙ පඤ්ච සහධම්මිකා පාසංසා ඨානා[3] ආගච්ඡන්ති. කතමෙ පඤ්ච:

---

1. දිට්ඨෙව ධම්මෙ - මජ්ඣං. 2 ගාරය්හං ඨානං ආගච්ඡති - සීමු
3. පාසංසං ඨානං - සීමු.

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ ඉහාත්මයෙහි ම විඝාත නැති උපායාස රහිත පරිදාහ රහිත සුඛවිහරණ කෙරෙයි. කාබුත් මරණින් මතුදු සුගති කැමැති විය යුතු. කවර පඤ්චධර්මයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සැදැහැති වෙයි. හිරි ඇති වෙයි. ඔතප් ඇති වෙයි. ඇරඹූ වැර ඇති වෙයි. ප්‍රඥ ඇති වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ විඝාත රහිත උපායාස රහිත පරිදාහ රහිත සුඛවිහරණ කෙරෙයි. කාබුත් මරණින් මතුදු සුගති කැමැති විය යුතු යි.

## 5. 1. 1. 4

## [ යථාභත සූත්‍රය ]

4. මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ ගෙණවුත් බහාතබන ලදුයේ යම් සේ වේ නම් එසේ නිරයෙහි තැබුනේ වේ. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අශ්‍රද්ධ වෙයි, හිරි නැති වෙයි. ඔතප් නැති වෙයි. කුසීත වෙයි. දුෂ්ප්‍රාඥ වෙයි. මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ ගෙණවුත් බහාතබන ලදුයේ යම් සේ වේ නම්, එසේ නිරයෙහි තැබුනේ වේ.

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ ගෙණවුත් බහාතබන ලදුයේ යම් සේ වේ නම් එසේ ස්වර්ගයෙහි තැබුනේ වේ. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සැදැහැති වෙයි. හිරි ඇති වෙයි. ඔතප් ඇති වෙයි. ඇරඹූ වැර ඇති වෙයි. පැණැති වෙයි. මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ ගෙණවුත් බහාතබන ලද්දේ යම් සේ වේ නම් එසේ ස්වර්ගයෙහි තැබුනේ වේ ය යි.

## 5. 1 1. 5.

## [ සික්ඛාපච්චක්ඛාන සූත්‍රය ]

3. මහණෙනි, යම් මහණෙක් වේ ව යි, මෙහෙණක් වේ ව යි, ශික්‍ෂා-ප්‍රත්‍යාඛ්‍යාන කොට හුනු බවට (ගිහිබවට) වැටේ නම්, ඔහට දිටුදැහැමියෙහි ම ගැරහිය යුතු කරුණු වූ සහෙතුක වාදප්‍රවෘත්ති (මෙරමා නගන කතා) පසෙක් එළඹේ. කවර පසෙක යත්:

“තට කුසල්දහම්හි සැදැහැ ද නො වී. තට කුසල්දහම්හි හිරි ද නො වී. තට කුසල්දහම්හි ඔතප් ද නො වී. තට කුසල්දහම්හි වැර ද නො වී. තට කුසල්දහම්හි පැණ ද නො වී” ය යි

මහණෙනි, යම් කිසි මහණෙක් වේ ව යි, මෙහෙණක් වේ ව යි, ශික්‍ෂා-ප්‍රත්‍යාඛ්‍යාන කොට හුනු බවට වැටේ නම් ඔහුට දිටුදැමියෙහි ම ගැරහිය යුතු කරුණු වූ මේ පඤ්චසහධාර්මිකවාද ප්‍රවෘත්තිහු එළඹෙත්.

මහණෙනි, කිසියම් මහණෙක් වේ ව යි, මෙහෙණක් වේ ව යි, දුක් සහිතව ද දෞර්මනස් සහිතව ද කඳුළුවැකි මුහුණු ඇතියේ ද වලප්නේ ද පිරිපුන් පිරිසිදු බඹසර සෙරේ නම්, ඔහට දිටුදැහැමියෙහි ම පඤ්චසහධාර්මික ප්‍රසංසාස්ථාන කෙනෙක් එත්. කවර පස්දෙනෙක යත්:

සද්ධාපි නාම තෙ අහොසි කුසලෙසු ධම්මෙසු. හිරීපි නාම තෙ අහොසි කුසලෙසු ධම්මෙසු. ඔත්තප්පම්පි නාම තෙ අහොසි කුසලෙසු ධම්මෙසු. විරියම්පි නාම තෙ අහොසි කුසලෙසු ධම්මෙසු. පඤ්ඤාපි නාම තෙ අහොසි කුසලෙසු ධම්මෙසු.”

යො හි කොචි භික්ඛවෙ භික්ඛු වා භික්ඛුනී වා සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අස්සුමුඛො රුදමානො පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති තස්ස දිට්ඨෙ චෙව ධම්මෙ ඉමෙ පඤ්ච සහධම්මිකා. පාසංසා ඨානා ආගච්ඡන්තීති.

## 5. 1. 1. 6

## [ අකුසලසමාපත්තිසුත්තං ]

6. න තාව භික්ඛවෙ අකුසලස්ස සමාපත්ති හොති. යාව සද්ධා පච්චුපට්ඨිතා හොති කුසලෙසු ධම්මෙසු. යතො ච ඛො භික්ඛවෙ සද්ධා අන්තරහිතා හොති, අස්සද්ධියං පරියුට්ඨාය තිට්ඨති, අථ අකුසලස්ස සමාපත්ති හොති.

න තාව භික්ඛවෙ අකුසලස්ස සමාපත්ති හොති, යාව හිරි පච්චුපට්ඨිතා හොති කුසලෙසු ධම්මෙසු. යතො ච ඛො භික්ඛවෙ හිරි අන්තරහිතා හොති, අහිරිකං පරියුට්ඨාය තිට්ඨති, අථ අකුසලස්ස සමාපත්ති හොති.

න තාව භික්ඛවෙ අකුසලස්ස සමාපත්ති හොති යාව ඔත්තප්පං පච්චුපට්ඨිතං හොති කුසලෙසු ධම්මෙසු. යතො ච ඛො භික්ඛවෙ ඔත්තප්පං අන්තරහිතං හොති, අනොත්තප්පං පරියුට්ඨාය තිට්ඨති, අථ අකුසලස්ස සමාපත්ති හොති.

න තාව භික්ඛවෙ අකුසලස්ස සමාපත්ති හොති යාව විරියං පච්චුපට්ඨිතං හොති කුසලෙසු ධම්මෙසු. යතො ච ඛො භික්ඛවෙ විරියං අන්තරහිතං හොති, කොසජ්ජං පරියුට්ඨාය තිට්ඨති, අථ අකුසලස්ස සමාපත්ති හොති.

න තාව භික්ඛවෙ අකුසලස්ස සමාපත්ති හොති යාව පඤ්ඤා පච්චුපට්ඨිතා හොති කුසලෙසු ධම්මෙසු යතො ච ඛො භික්ඛවෙ පඤ්ඤා අන්තරහිතා හොති, දුප්පඤ්ඤා පරියුට්ඨාය තිට්ඨති, අථ අකුසලස්ස සමාපත්ති හොතීති.

## 5. 1. 1. 7.

## [ කාමෙසුපලාළිතසුත්තං ]

7. යෙභුය්‍යෙන භික්ඛවෙ සත්තා කාමෙසු පලාළිතා.[1] අසිතව්‍යාභඞ්ගිං[2] භික්ඛවෙ කුලපුත්තො ඔහාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, ‘සද්ධාපබ්බජිතො[4] කුලපුත්තො’ති අලං වචනාය. තං කිස්ස හෙතු:

ලබ්භා[4] භික්ඛවෙ යොබ්බනෙන කාමා. තෙ ච ඛො යාදිසා වා තාදිසා වා යෙ ච භික්ඛවෙ හීනා කාමා, යෙ ච මජ්ඣිමා කාමා, යෙ ච පණීතා කාමා සබ්බෙ කාමා ‘කාමා’ත්වෙව සඞ්ඛං ගච්ඡන්ති.

1. ලළිතා - මජසං, ලසිතා - සයා   2. අසිතබ්‍යාභඞ්ගිං - මජසං
3. සද්ධා - සයා.   4. ලබ්භා හි - සයා:

"තට කුශලධර්මයෙහි ශ්‍රද්ධා නමුදු වී. තට කුශලධර්මයෙහි හිරි නමුදු වී. තට කුශලධර්මයෙහි ඔතප් නමුදු වී. තට කුශලධර්මයෙහි වීර්‍ය්‍යී නමුදු වී. තට කුශලධර්මයෙහි ප්‍රඥා නමුදු වී" ය යි.

මහණෙනි, කිසියම් මහණෙක් වේ වයි, මෙහෙණක් වේ ව යි, දුක් සහිතව ද දෞර්මනස් සහිතව ද කඳුළුවැකි මුහුණු ඇතියේ ද වලප්නේ ද පිරිපුන් පිරිසිදු බඹසර සෙරේ නම් ඔහට වන්මනු බෙවෙහි ම පැසසිය යුතු කරුණු වූ මේ පඤ්චසහධාර්මිකයෝ පැමිණෙති.

## 5. 1. 1. 6.

### [ අකුසලසමාපතති සූත්‍රය ]

6. මහණෙනි, කුශලධර්මයෙහි යම් තාක් ශ්‍රද්ධා එළඹ සිටියා වේ ද, ඒ තාක් අකුශලයාගේ සමාපත්තියෙක් (වැදගැන්මෙක්) නො වේ. මහණෙනි, යම් හෙයෙකින් ශ්‍රද්ධා අතුරුදන් වේ ද, අශ්‍රද්ධාභාවය මතුව නැඟගෙණ සිටුනේ වේ ද, එකල්හි අකුශලයාගේ සමාපත්තිය වෙයි.

මහණෙනි, යම් තාක් කුශලධර්මයෙහි හිරි එළඹ සිටියා වේ ද, ඒ තාක් අකුශලසමාපත්තියෙක් නො වේ. මහණෙනි, යම් හෙයෙකින් හිරි අතුරුදන් වේ ද, අහිරික භාවය නැඟගෙණ සිටුණේ වේ ද, එකල්හි අකුශලසමාපත්තිය වෙයි.

මහණෙනි, යම් තාක් කුශලධර්මයෙහි ඔතප් එළඹ සිටියේ වේ ද, ඒ තාක් අකුශලසමාපත්තිය නො වේ, මහණෙනි, යම් හෙයෙකින් ඔතප් අතුරුදන් වේ ද, අපත්‍රපා නැඟගෙණ සිටුනී වේ ද, එකල්හි අකුශලසමාපත්තිය වෙයි.

මහණෙනි, යම් තාක් කුශලධර්මයෙහි වීර්‍ය්‍යීය එළඹ සිටියේ වේ ද, ඒ තාක් අකුශලසමාපත්තිය නො වේ. මහණෙනි, යම් හෙයෙකින් වීර්‍ය්‍යීය අතුරුදන් වේ ද, කුසීතභාවය නැඟගෙණ සිටුනේ ද, එකල්හි අකුශල සමාපත්තිය වේ.

මහණෙනි, යම් තාක් කුශලධර්මයෙහි ප්‍රඥා එළඹ සිටියා වේ ද, ඒ තාක් අකුශලසමාපත්තිය නො වේ. මහණෙනි, යම් හෙයෙකින් ප්‍රඥා අතුරුදන්-වේ ද, දුෂ්ප්‍රඥා නැඟගෙණ සිටුනී ද, එකල්හි අකුශල සමාපත්තිය වේ ය යි.

## 5. 1. 1. 7.

### [ කාමෙසුපලාළිත සූත්‍රය ]

7. මහණෙනි, බෙහෙවින් ම සත්ත්වයෝ වස්තුකාමක්ලේශකාමයෙහි ප්‍රකෘතියෙන් ඇලුනාහ. මහණෙනි, කුලපුත් (තණකපන) දෑකැත්ත හා තණ කද තබාපියා ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වේ ද, 'සැදැහැ-යෙන් සසුන් වන් කුලපුත්හ'යි කියන්නට නිසි වෙයි. එ කවර හෙයින යත්:

මහණෙනි, යොවුනෙන් කාමයෝ ලැබිය හෙති. ඔහුදු යම් යම් බඳු වෙති. මහණෙනි, යම් බඳු (පඤ්චහීනකුලයන්ගේ) හීනකාමයෝ වෙත් ද, යම් බඳු (මධ්‍යමසත්ත්වයන්ගේ) මධ්‍යමකාමයෝ වෙත් ද, යම් බඳු (රාජාදීන්ගේ) ප්‍රණීත කාමයෝ වෙත් ද, එ හැම කාමයෝ (කාමන විසින්) 'කාමිය හ' යි ම සඞ්ඛ්‍යාවට යෙත්.

සෙය්‍යථාපි භික්ඛවෙ දහරො කුමාරො මන්දො උත්තානසෙය්‍යකො ධාතියා පමාදමන්වාය කට්ඨං වා කඨලං වා මුඛෙ ආහරෙය්‍ය, තමෙනං ධාති සීඝසීඝං[1] මනසි කරෙය්‍ය, සීඝසීඝං මනසි කරිත්වා සීඝසීඝං ආහරෙය්‍ය, නො චෙ සක්කුණෙය්‍ය සීඝසීඝං ආහරිතුං වාමෙන හත්ථෙන සීසං පරිග්ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන වඞ්කඞ්ගුලිං[2] කරිත්වා සලොහිතම්පි ආහරෙය්‍ය. තං කිස්ස හෙතු: අත්ථෙසා භික්ඛවෙ කුමාරස්ස විහෙසා, නෙසා නත්ථීති වදාමි. කරණීයඤ්ච[3] ඛො එතං භික්ඛවෙ ධාතියා අත්ථකාමාය හිතෙසිනියා අනුකම්පිකාය අනුකම්පං උපාදාය.

යතො ච ඛො සො භික්ඛවෙ කුමාරො වුද්ධො හොති අලංපඤ්ඤො අනපෙක්ඛා පන[4] භික්ඛවෙ ධාති තස්මිං කුමාරෙ හොති 'අත්තගුත්තො දානි කුමාරො නාලං පමාදායා'ති.

එවමෙව ඛො භික්ඛවෙ යාවකීවඤ්ච භික්ඛුනො සද්ධාය අකතං හොති කුසලෙසු ධම්මෙසු, හිරියා අකතං හොති කුසලෙසු ධම්මෙසු, ඔත්තප්පෙන අකතං හොති කුසලෙසු ධම්මෙසු, විරියෙන අකතං හොති කුසලෙසු ධම්මෙසු, පඤ්ඤාය අකතං හොති කුසලෙසු ධම්මෙසු, අනුරක්ඛිතබ්බො තාව මෙ සො භික්ඛවෙ භික්ඛු හොති.

යතො ච ඛො භික්ඛවෙ භික්ඛුනො[5] සද්ධාය කතං හොති කුසලෙසු ධම්මෙසු, හිරියා කතං හොති කුසලෙසු ධම්මෙසු, ඔත්තප්පෙන කතං හොති කුසලෙසු ධම්මෙසු, වීරියෙන කතං හොති කුසලෙසු ධම්මෙසු, පඤ්ඤාය කතං හොති කුසලෙසු ධම්මෙසු, අනපෙක්ඛො දානාහං භික්ඛවෙ තස්මිං භික්ඛුස්මිං හොමි 'අත්තගුත්තො දානි භික්ඛු[6] නාලං පමාදායා'ති.

## 5. 1. 1. 8.

## [ චවනසුත්තං ]

8. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ. කතමෙහි පඤ්චහි:

අස්සද්ධො භික්ඛවෙ භික්ඛු චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ. අහිරිකො භික්ඛවෙ භික්ඛු චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ. අනොත්තප්පී භික්ඛවෙ භික්ඛු චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ. කුසීතො භික්ඛවෙ භික්ඛු චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ. දුප්පඤ්ඤො භික්ඛවෙ භික්ඛු චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ.

---

1. සීඝං සීඝං - මජසං 2. වඞ්කඞ්ගුලං - සයා 3. කරණීයඤ්ච - කත්ථචි
4. දානි - මජසං 5 භික්ඛු - සයා 6 භික්ඛවෙ භික්ඛු - සයා.

මහණෙනි, යම් පරිද්දෙකින් බොළඳ වූ, උඩුකුරුව හෝනා ළදරු කුමරෙක් කිරිමවගේ පමාදෙස නිසා ලීකඩක් හෝ කැබිලිත්තක් හෝ මුවෙහි බහාගන්නේ වේ නම් ධාතිතොමෝ වහවහා තෙල කරුණ මෙණෙහි කරයි. වහ වහා මෙනෙහි කොට වහ වහා එය බැහැර කරන්නී වෙයි. ඉදින් වහ වහා බැහැර කරන්නට නොහැකි වූ නම්, වමතින් හිස හම්බාගෙණ දකුණතින් වකැඟිලි කොට ලේ සහිත කොට ද බැහැර කරන්නී ය. එ කවර හෙයින යත්: මහණෙනි, කුමරහට තෙල වෙහෙස ඇත් මය, තෙල නැතැයි නො කියමි. මහණෙනි, (එහෙත්) අභි කැමැති හිතෙෂිණී අනුකමපා ඇති ධාතිය විසින් අනුකමපා පිණිස තෙල කටයුතු ම වෙයි.

මහණෙනි, යම් කලෙක පටන් ගෙණ එ කුමර යුතු පමණ පැණෙති වෘද්ධියෙක් වේ ද, මහණෙනි, එ සඳ ධාතිය ඒ කුමර කෙරෙහි "දැන් කුමරු ආත්මගුප්ත වෙයි, (තෙමේ ම රැකෙයි.) ප්‍රමාදයට නො නිසි වෙති"යි අපෙක්ෂාරහිත වෙයි.

මහණෙනි, එපරිද්දෙන් ම මහණහු විසින් යම් පමණ කල් කුශල ධර්මයෙහි ශ්‍රද්ධායෙන් කටයුතු දය නො කරණ ලද්දේ වේ ද, කුශලධර්මයෙහි හිරියෙන් කටයුතු දය නො කරණ ලද්දේ වේ ද, කුශලධර්මයෙහි අපත්‍රපායෙන් කටයුතු දය නො කරණ ලද්දේ වේ ද, වීර්‍ය්‍යයෙන් කුශලධර්මයෙහි කටයුතු දය නො කරණ ලද්දේ වේ ද, ප්‍රඥයෙන් කුශලධර්මයෙහි කටයුතු දය නො කරණ ලද්දේ වේ ද, මහණෙනි, මා විසින් එ මහණ එතෙක් රැකිය යුතු වෙයි.

මහණෙනි, යම් කලෙක පටන් ගෙණ මහණහු විසින් කුශලධර්මයෙහි ශ්‍රද්ධායෙන් කටයුතු දෑ කරණ ලද්දේ වේ ද, හිරියෙන් කුශලධර්මයෙහි කටයුතු දෑ කරණ ලද්දේ වේ ද, අපත්‍රපායෙන් කුශලධර්මයෙහි කටයුතු දෑ කරණ ලද්දේ වේ ද, වීර්‍ය්‍යයෙන් කුශලධර්මයෙහි කටයුතු දෑ කරණ ලද්දේ වේ ද, ප්‍රඥයෙන් කුශලධර්මයෙහි කටයුතු දෑ කරණ ලද්දේ වේ ද, මහණෙනි, (සොවන්පෙළෙහි සිටුනා) එ මහණහු කෙරෙහි "දැන් මහණ ආත්මගුප්ත වෙයි. පමාවට නො නිසි වෙති"යි. අපෙක්ෂා නැතියෙම් වෙමි යි.

## 5. 1. 1. 8.

## [ චවන සූත්‍රය ]

මහණෙනි, පඤ්ච ධර්මයෙකින් සමන්වාගත මහණ ච්‍යුත වෙයි. ශාසන සද්ධර්මයෙහි නොපිහිටුනෝ වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, සැදැහැ නැති මහණ (ගුණදහමින්) ච්‍යුත වෙයි. ශාසන සද්ධර්මයෙහි නො පිහිටුනෝ වෙයි. මහණෙනි, විළිනැති මහණ ච්‍යුත වෙයි, සද්ධර්මයෙහි නො පිහිටුනෝ වෙයි. මහණෙනි, ඔතප් නැති මහණ ච්‍යුත වෙයි. සද්ධර්මයෙහි නො පිහිටුනෝ වෙයි. මහණෙනි, මැළි මහණ ච්‍යුත වෙයි. සද්ධර්මයෙහි නො පිහිටුනෝ වෙයි. මහණෙනි, දුෂ්ප්‍රාඥ මහණ ච්‍යුත වෙයි. සද්ධර්මයෙහි නො පිහිටුනෝ වෙයි.

මහණෙනි, මෙ පඤ්චධර්මයෙන් සමන්වාගත මහණ (ගුණෙන්) ච්‍යුත වෙයි. ශාසනසද්ධර්මයෙහි නො පිහිටුනෝ වෙයි.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චවති, පතිට්ඨාති සද්ධම්මෙ. කතමෙහි පඤ්චහි:

සද්ධො භික්ඛවෙ භික්ඛු න චවති, පතිට්ඨාති සද්ධම්මෙ. හිරිමා භික්ඛවෙ භික්ඛු න චවති, පතිට්ඨාති සද්ධම්මෙ. ඔත්තප්පී භික්ඛවෙ භික්ඛු න චවති, පතිට්ඨාති සද්ධම්මෙ. ආරද්ධවිරියො භික්ඛවෙ භික්ඛු න චවති, පතිට්ඨාති සද්ධම්මෙ. පඤ්ඤවා භික්ඛවෙ භික්ඛු න චවති, පතිට්ඨාති සද්ධම්මෙ.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චවති පතිට්ඨාති සද්ධම්මෙති.

## 5. 1. 1. 9.

### [පඨමඅගාරවසුත්තං]

9. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අගාරවො අප්පතිස්සො චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ. කතමෙහි පඤ්චහි:

අස්සද්ධො භික්ඛවෙ භික්ඛු අගාරවො අප්පතිස්සො චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ. අහිරිකො භික්ඛවෙ භික්ඛු -පෙ- අනොත්තප්පී භික්ඛවෙ භික්ඛු -පෙ- කුසීතො භික්ඛවෙ භික්ඛු -පෙ- දුප්පඤ්ඤො භික්ඛවෙ භික්ඛු අගාරවො අප්පතිස්සො චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අගාරවො අප්පතිස්සො චවති, නප්පතිට්ඨාති සද්ධම්මෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු සගාරවො සප්පතිස්සො න චවති, පතිට්ඨාති සද්ධම්මෙ. කතමෙහි පඤ්චහි:

සද්ධො භික්ඛවෙ භික්ඛු සගාරවො සප්පතිස්සො න චවති පතිට්ඨාති සද්ධම්මෙ. හිරිමා භික්ඛවෙ භික්ඛු -පෙ- ඔත්තප්පී භික්ඛවෙ භික්ඛු -පෙ- ආරද්ධවිරියො භික්ඛවෙ භික්ඛු -පෙ- සප්පඤ්ඤො භික්ඛවෙ භික්ඛු සගාරවො සප්පතිස්සො න චවති, පතිට්ඨාති සද්ධම්මෙ.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සගාරවො සප්පතිස්සො න චවති, පතිට්ඨාති සද්ධම්මෙති.

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ ච්‍යුත නො වෙයි. ශාසනසද්ධර්මයෙහි පිහිටුයේ වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, සැදැහැති මහණ ච්‍යුත නො වෙයි. සද්ධර්මයෙහි පිහිටුනේ වෙයි. මහණෙනි, විළි ඇති මහණ ච්‍යුත නො වෙයි. සද්ධර්මයෙහි පිහිටුනේ වෙයි. මහණෙනි, ඔතප් ඇති මහණ ච්‍යුත නො වෙයි. සද්ධර්මයෙහි පිහිටුනේ වෙයි. මහණෙනි, රුකුළු වැර ඇති මහණ ච්‍යුත නො වෙයි. සද්ධර්මයෙහි පිහිටුනේ වෙයි. මහණෙනි, ප්‍රඥ ඇති මහණ ච්‍යුත නො වෙයි. සද්ධර්මයෙහි පිහිටුනේ වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ (ගුණෙන්) ච්‍යුත නො වේ. සද්ධර්මයෙහි පිහිටුනේ වේ.

## 5. 1. 1. 9

## [පඨමඅගාරව සුත්‍රය]

9. මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ ගෞරව නැතියේ, ප්‍රතිශ්‍රය (බුද්ධාදීන් කෙරෙහි යටත්වැටුම්) නැතියේ, ච්‍යුත වෙයි. සද්ධර්මයෙහි නො පිහිටුනේ වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, ශ්‍රද්ධා නැති මහණ ගෞරව නැතියේ ප්‍රතිශ්‍රය (දෙටුවකු) නැතියේ, ච්‍යුත වෙයි. සද්ධර්මයෙහි නොපිහිටුනේ වෙයි. මහණෙනි, විළි නැති මහණ ... මහණෙනි, ඔතප් නැති මහණ ... මහණෙනි, කුසීත මහණ ... මහණෙනි, දුෂ්ප්‍රාඥ මහණ ගෞරව නැතියේ ප්‍රතිශ්‍රය නැතියේ ච්‍යුත වේ. සද්ධර්මයෙහි නොපිහිටුනේ වේ.

මහණෙනි, මෙ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ ගෞරව නැතියේ, ප්‍රතිශ්‍රය නැතියේ, (ගුණෙන්) ච්‍යුත වෙයි. සද්ධර්මයෙහි නොපිහිටුනේ වෙ යි.

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ ගෞරව ඇතියේ, ප්‍රතිශ්‍රය ඇතියේ, ච්‍යුත නො වේ, සද්ධර්මයෙහි පිහිටුනේ වේ. කවර පසෙකින යත්:

මහණෙනි, සැදැහැති මහණ ගෞරව ඇතියේ, ප්‍රතිශ්‍රය ඇතියේ, ච්‍යුත නො වේ. සද්ධර්මයෙහි පිහිටුනේ වේ. මහණෙනි, හිරි ඇති මහණ ... මහණෙනි, ඔතප් ඇති මහණ .. මහණෙනි, ඇරඹු වැර ඇති මහණ ... මහණෙනි, ප්‍රඥ ඇති මහණ ගෞරව ඇතියේ, ප්‍රතිශ්‍රය ඇතියේ, (ගුණෙන්) ච්‍යුත නො වෙයි. සද්ධර්මයෙහි පිහිටුනේ වෙයි.

## 5. 1. 1. 10.

### [දුතියඅගාරවසුත්තං]

10. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අගාරවො අප්පතිස්සො අභබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං කතමෙහි පඤ්චහි:

අස්සද්ධො භික්ඛවෙ භික්ඛු අගාරවො අප්පතිස්සො අභබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං. අහිරිකො භික්ඛවෙ භික්ඛු -පෙ- අනොත්තප්පී භික්ඛවෙ භික්ඛු -පෙ- කුසීතො භික්ඛවෙ භික්ඛු -පෙ- දුප්පඤ්ඤො භික්ඛවෙ භික්ඛු අගාරවො අප්පතිස්සො අභබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අගාරවො අප්පතිස්සො අභබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු සගාරවො සප්පතිස්සො භබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං කතමෙහි පඤ්චහි:

සද්ධො භික්ඛවෙ භික්ඛු සගාරවො සප්පතිස්සො භබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං. හිරිමා භික්ඛවෙ භික්ඛු -පෙ- ඔත්තප්පී භික්ඛවෙ භික්ඛු -පෙ- ආරද්ධවිරියො භික්ඛවෙ භික්ඛු -පෙ- පඤ්ඤවා භික්ඛවෙ භික්ඛු සගාරවො සප්පතිස්සො භබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං අපජ්ජිතුං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සගාරවො සප්පතිස්සො භබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුන්ති.

සෙඛබලවග්ගො පඨමො.

**තස්සුද්දානං:**

සඞ්ඛිත්තං විත්ථතං දුක්ඛං[1] භතං සික්ඛාය පඤ්චමං,
සමාපත්ති ච කාමෙසු චවනා ද්වෙ අගාරවාති.

---

1. දුක්ඛා - මජසං

## 5. 1. 1. 10

## [දුතියඅගාරව සූත්‍රය]

10. මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්වාගත මහණ ගෞරව නැතියේ, ප්‍රතිශ්‍රය නැතියේ, මෙ ධර්මවිනයෙහි වෘද්ධියට විරූඪියට (නිශ්චල භාවයට) වෛපුල්‍යයට (මහත්බවට) පැමිණෙනුවට අභව්‍ය (අභාජන) වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, ශ්‍රද්ධා නැති මහණ ගෞරව නැතියේ, ප්‍රතිශ්‍රය නැතියේ මෙ දහම්විනයෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙනුවට අභව්‍ය වෙයි. මහණෙනි, හිරි නැති මහණ ... මහණෙනි, ඔතප් නැති මහණ ... මහණෙනි, කුසීත මහණ .. මහණෙනි, දුෂ්ප්‍රාඥ මහණ ගෞරව නැතියේ, ප්‍රතිශ්‍රය නැතියේ, මේ ධර්මවිනයෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙනුවට අභව්‍ය වෙයි

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්වාගත මහණ ගෞරව ඇතියේ ප්‍රතිශ්‍රය ඇතියේ, මෙ ධර්මවිනයෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙනුවට භව්‍ය වෙයි කවර පසෙකින යත්:

මහණෙනි, ශ්‍රද්ධා ඇති මහණ ගෞරව ඇතියේ, ප්‍රතිශ්‍රය ඇතියේ, මෙ ධර්මවිනයෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙනුවට භව්‍ය වෙයි. මහණෙනි, හිරි ඇති මහණ ... මහණෙනි, ඔතප් ඇති මහණ ... මහණෙනි, රැකුළු වැර ඇති මහණ ... මහණෙනි, ප්‍රඥ ඇති මහණ ගෞරව ඇතියේ, ප්‍රතිශ්‍රය ඇතියේ, මෙ ධර්ම විනයෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙනුවට භව්‍ය වේ.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්වාගත මහණ ගෞරව ඇතියේ, ප්‍රතිශ්‍රය ඇතියේ, මේ ධර්මවිනයෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙනුවට භව්‍ය වේ.

**සෙඛබලවග්ගය ප්‍රථම සි.**

**එහි උද්දානය:**

සඞ්ඛිත්තය, විත්ථතය, දුක්ඛය, ආහතය, සික්ඛාය, සමාපත්තිය, කාමය, චවනය, අගාරව සූත්‍ර දෙක දැයි දශයෙකි.

## 2. බලවග්ගො

### 5. 1. 2. 1.

### [තථාගතබලසුත්තං]*

[ සාවත්ථිනිදානං: ]

11. පුබ්බාහං භික්ඛවෙ අනනුස්සුතෙසු ධම්මෙසු අභිඤ්ඤාවොසාන-පාරමිප්පත්තො පටිජානාමි.

පඤ්චිමානි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලානි යෙහි බලෙහි සමන්නා-ගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

කතමානි පඤ්ච: සද්ධාබලං, හිරිබලං, ඔත්තප්පබලං, විරියබලං, පඤ්ඤාබලං.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච තථාගතස්ස තථාගතබලානි යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙතීති.

### 5. 1. 2. 2.

### [ සෙඛබලඅඞ්ගසුත්තං ]*

12. පඤ්චිමානි භික්ඛවෙ සෙඛබලානි. කතමානි පඤ්ච: සද්ධාබලං, හිරිබලං, ඔත්තප්පබලං, විරියබලං, පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සෙඛබලානි.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං සෙඛබලානං එතං අග්ගං, එතං සඞ්ගාහිකං, එතං සඞ්ඝාතනියං යදිදං පඤ්ඤාබලං.

සෙය්‍යථාපි භික්ඛවෙ කූටාගාරස්ස එතං අග්ගං, එතං සඞ්ගාහිකං, එතං සඞ්ඝාතනියං යදිදං කූටං, එවමෙව ඛො භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං සෙඛබලානං එතං අග්ගං, එතං සඞ්ගාහිකං, එතං සඞ්ඝාතනියං යදිදං පඤ්ඤාබලං.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: සද්ධාබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙන, හිරිබලෙන -පෙ- ඔත්තප්පබලෙන -පෙ- විරිය-බලෙන -පෙ- පඤ්ඤාබලෙන සමන්නාගතා භවිස්සාම සෙඛබලෙනාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

---

* අනනුස්සුත - උද්දාන. * කූට - උද්දාන.

# 2. බලවග්ගය

## 5. 1. 2. 1.

### [ තථාගතබල සූත්‍රය ]

11. මහණෙනි, මම පෙර නො ඇසූ සියුසස් දහම්හි (සොලොස් කරණී විසින්) වෙසෙසින් දන (කෘතකෘත්‍ය වන බැවින්) පයඝීවසානභාවසඞ්ඛ්‍යාත පරතෙර පැමිණියෙමි යි පිළිණ කරමි.

මහණෙනි, යම් බලයකින් සමන්‍වාගත තථාගතයන් වහන්සේ ශ්‍රෙෂ්ඨ ස්ථානය පිළිණ කරණ සේක් ද, පිරිස්හි සිංහනාද කරණ සේක්ද, ශ්‍රෙෂ්ඨ ධම්චක්‍රය පවත්වන සේක් ද, තථාගතයන් වහන්සේගේ මේ තථාගතබලයෝ (ඥනබලයෝ) පස්දෙනෙකි.

කවර පස්දෙනෙක යත්: ශ්‍රද්ධාබලය, හිරිබලය, අපත්‍රපාබලය, වියඝීබලය, ප්‍රඥබල යි.

මහණෙනි, යම් බලයෙකින් සමන්‍වාගත තථාගතයන් වහන්සේ ශ්‍රෙෂ්ඨස්ථානය පිළිණ කරණ සේක් ද, පිරිස්හි අභීතනාද කරණ සේක් ද, බ්‍රහමචක්‍රය පවත්වන සේක් ද, තථාගතයන්වහන්සේගේ එ තථාගතබලයෝ මොහු පස්දෙන වෙති.

## 5. 1. 2. 2.

### [ සෙඛබලඅඟග සූත්‍රය ]

12· මහණෙනි, තෙල සෙඛබලයෝ පස්දෙනෙක. කවර පස්දෙනෙක, යත්: ශ්‍රද්ධාබලය, හිරිබලය, අපත්‍රපාබලය, වියඝීබලය, ප්‍රඥබලයි. මහණෙනි තුලුහු පඤ්චශෛක්‍ෂබලයෝ යි.

මහණෙනි, මේ පඤ්ච ශෛක්‍ෂබලයන් අතුරින් තෙල අග්‍රය තෙල (ගෝනැස් ගන්නා කූටය සෙයින්) සාඞ්ග්‍රාහිකය (සඟන්) වේ. තෙල සඞ්ඝ (මුළුලූ) කරන්නේ වේ. හෙ කවරේ ය යත්: ප්‍රඥබල යි.

මහණෙනි, යම් සේ කුළුගෙයි තෙල අග්‍රය වේ ද, තෙල සාඞ්ග්‍රාහිකය වේ ද, තෙල සඞ්ඝාතන්‍ය වේ ද, එ කිමෙක යත්: කූටය (මුදුන-කැණිම්ඩල) යි.

මහණෙනි, එ පරිදි ම මෙ පස්වැදෑරුම් සෙඛබලයන් අතුරින් තෙල අග්‍ර වෙයි, තෙල සාඞ්ග්‍රාහිකය වෙයි, තෙල මුළුලූ කරන්නේ වෙයි. හෙ කවරේ ය යත්: ප්‍රඥබල යි.

මහණෙනි, එහෙයින් මෙසේ හික්මෙන්නේ ය. ශෛක්‍ෂබල වූ ශ්‍රද්ධා බලයෙන් සමන්‍වාගත වම්හ.... හිරිබලයෙන් . අපත්‍රපාබලයෙන් .. වියඝීබල යෙන්... ශෛක්‍ෂබල වූ ප්‍රඥබලයෙන් සමන්‍වාගත වම්හ යි මහණෙනි, මෙසේම තොප හික්මෙන්නේ ය.

## 5. 1. 2. 3.

### [ බලසඞ්ඛිත්තසුත්තං ]

13. පඤ්චිමානි භික්ඛවෙ බලානි. කතමානි පඤ්ච:

සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්චබලානීති.

## 5. 1. 2. 4.

### [ බලවිත්ථතසුත්තං ]

14. පඤ්චිමානි භික්ඛවෙ බලානි. කතමානි පඤ්ච: සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං.

කතමඤ්ච භික්ඛවෙ සද්ධාබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො සද්ධො හොති. සද්දහති තථාගතස්ස බොධිං: ඉතිපි සො භගවා අරහං -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ඉදං වුච්චති භික්ඛවෙ සද්ධාබලං.

කතමඤ්ච භික්ඛවෙ විරියබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො ආරද්ධ විරියො විහරති අකුසලානං ධම්මානං පහාණාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. ඉදං වුච්චති භික්ඛවෙ විරියබලං.

කතමඤ්ච භික්ඛවෙ සතිබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො සතිමා හොති: පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. ඉදං වුච්චති භික්ඛවෙ සතිබලං.

කතමඤ්ච භික්ඛවෙ සමාධිබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො විවිච්චෙව කාමෙහි -පෙ- [පඨමං ඣානං - පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ-] චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චති භික්ඛවෙ සමාධිබලං.

කතමඤ්ච භික්ඛවෙ පඤ්ඤාබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. ඉදං වුච්චති භික්ඛවෙ පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච බලානීති.

## 5. 1. 2. 5.

### [ බලදට්ඨබ්බසුත්තං ]

15. පඤ්චිමානි භික්ඛවෙ බලානි. කතමානි පඤ්ච: සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං.

කත්ථ ච භික්ඛවෙ සද්ධාබලං දට්ඨබ්බං: චතූසු සොතාපත්තියඞ්ගෙසු එත්ථ සද්ධාබලං දට්ඨබ්බං.

කත්ථ ච භික්ඛවෙ විරියබලං දට්ඨබ්බං: චතූසු සම්මප්පධානෙසු. එත්ථ විරියබලං දට්ඨබ්බං.

## 5. 1. 2. 3

### [ බලසඞ්ඛිත්ත සූත්‍රය ]

13. මහණෙනි, මේ බලයෝ පස්දෙනෙක. කවර පස්දෙනෙක යත්:

ශ්‍රද්ධාබලය, වීර්‍ය්‍යබලය, ස්මෘතිබලය, සමාධිබලය, ප්‍රඥබල යි. මහණෙනි, මොහු පඤ්චබලයෝ යි.

## 5. 1. 2. 4

### [ බලවිත්ථත සූත්‍රය ]

14 මහණෙනි, මේ බලයෝ පස්දෙනෙක. කවර පස්දෙනෙක යත්: ශ්‍රද්ධාබලය, වීර්‍ය්‍යබලය, ස්මෘතිබලය, සමාධිබලය, ප්‍රඥබල යි.

මහණෙනි, ශ්‍රද්ධාබල කවරේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි අරිසවු සැදැහැති වෙයි. තථාගතයන් වහන්සේගේ සම්‍යක්සම්බොධිය හදහයි. ''ඒ භාග්‍යවත්හු මෙ කරුණෙනුදු රහත්හ ... දෙව්මිනිස්නට ශාස්තෘයහ බුද්ධයහ. භගවත්හ''යි. මහණෙනි, මේ ශ්‍රද්ධාබල යි කියනු ලැබේ.

මහණෙනි, වීර්‍ය්‍යබල කවරේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි අරිසවු අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ උපසමපත් පිණිස රුකුළුවැර ඇතිව වෙසෙයි. ස්ථාමවත් වූයේ, දළපැරකුම් ඇතියේ, කුසල්-දහම්හි නො හළ ධුර ඇතියේ වෙයි. මහණෙනි, මේ වීර්‍ය්‍යබල යි කියනු ලැබේ.

මහණෙනි, ස්මෘතිබල කවරේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි අරිසවු ස්මෘතිමත් වෙයි: පරම වූ ස්මෘතිසමප්‍රඥනයෙන් සමන්‍වාගත වූයේ, චිර-කෘතය ද චිරභාෂිතය ද සිහි කරණුයේ වෙයි. මහණෙනි, මේ ස්මෘතිබල යි කියනු ලැබේ

මහණෙනි, සමාධිබල කවරේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි අරිසවු කාමයෙන් වෙන් ව ම .. ප්‍රථමධ්‍යානයට ... ද්විතීයධ්‍යානයට ... තෘතීය-ධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. මහණෙනි, මේ සමාධිබල යි කියනු ලැබේ.

මහණෙනි, ප්‍රඥබල කවරේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි අරිසවු ප්‍රඥවත් වෙයි. උදය - වය කරා යන ආර්‍ය්‍ය වූ නිබ්බෙධික වූ මොනොවට දුඃඛක්‍ෂය කරමින් යන ප්‍රඥයෙන් සමන්‍වාගත වෙයි. මහණෙනි, මේ ප්‍රඥ-බලය යි කියනු ලැබේ.

## 5. 1. 2. 5

### [ බලදට්ඨබ්බ සූත්‍රය ]

15. මහණෙනි, මේ බලයෝ පස්දෙනෙක. කවර පස්දෙනෙක යත්: ශ්‍රද්ධාබලය, වීර්‍ය්‍යබලය, ස්මෘතිබලය, සමාධිබලය, ප්‍රඥබල යි.

මහණෙනි, ශ්‍රද්ධාබලය කොහන්හි දක්ක යුතු ද? සතර සෝතා-පත්‍ය්‍යඞ්ගයෙහි ය. (අධිමොක්‍ෂලක්‍ෂණ) ශ්‍රද්ධාබල එහි දක්ක යුතු යි.

මහණෙනි, වීර්‍ය්‍යබල කොහන්හි දක්ක යුතු ද? සතර සම්‍යක්-ප්‍රධානයෙහි ය. (ප්‍රග්‍රහලක්‍ෂණ) වීර්‍ය්‍යබල එහි දක්ක යුතු යි.

කතමඤ්ච භික්ඛවෙ සතිබලං දට්ඨබ්බං: චතූසු සතිපට්ඨානෙසු. එත්ථ සතිබලං දට්ඨබ්බං.

කතමඤ්ච භික්ඛවෙ සමාධිබලං දට්ඨබ්බං: චතූසු ඣානෙසු. එත්ථ සමාධි-බලං දට්ඨබ්බං.

කතමඤ්ච භික්ඛවෙ පඤ්ඤාබලං දට්ඨබ්බං: චතූසු අරියසච්චෙසු. එත්ථ පඤ්ඤාබලං දට්ඨබ්බං.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්චබලානීති.

### 5. 1. 2. 6

### [ බලඅග්ගසුත්තං ]*

16. පඤ්චිමානි භික්ඛවෙ බලානි. කතමානි පඤ්ච:

සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්චබලානි.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං බලානං එතං අග්ගං, එතං සඞ්ගාහිකං, එතං සඞ්ඝාතනියං යදිදං පඤ්ඤාබලං.

සෙය්‍යථාපි භික්ඛවෙ කූටාගාරස්ස එතං අග්ගං, එතං සඞ්ගාහිකං, එතං සඞ්ඝාතනියං යදිදං කූටං.

එවමෙව ඛො භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං බලානං එතං අග්ගං, එතං සඞ්ගාහිකං, එතං සඞ්ඝාතනියං යදිදං පඤ්ඤාබලන්ති.

### 5. 1. 2. 7

### [ අත්තහිතසුත්තං ]

17. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතාය. කතමෙහි පඤ්චහි?

ඉධ භික්ඛවෙ භික්ඛු අත්තනා සීලසම්පන්නො හොති, නො පරං සීල සම්පදාය සමාදපෙති. අත්තනා සමාධිසම්පන්නො හොති, නො පරං සමාධි-සම්පදාය සමාදපෙති. අත්තනා පඤ්ඤාසම්පන්නො හොති, නො පරං පඤ්ඤා-සම්පදාය සමාදපෙති. අත්තනා විමුත්තිසම්පන්නො හොති, නො පරං විමුත්තිසම්පදාය සමාදපෙති. අත්තනා විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති, නො පරං විමුත්තිඤාණදස්සනසම්පදාය සමාදපෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අත්ත හිතාය පටිපන්නො හොති, නො පරහිතායාති.

---

* පුත්තකූට - උද්දාන

මහණෙනි, සමෘතිබල කොතන්හි දක්ක යුතු ද? සතර සිවටනෙහි ය. (උපස්ථාන ලක්‍ෂණ) සමෘතිබල එහි දක්ක යුතුයි.

මහණෙනි, සමාධිබල කොහි දක්ක යුතු ද? සියුදුහැනෙහි ය. (අවික්‍ෂෙප ලක්‍ෂණ) සමාධිබල එහි දක්ක යුතු යි.

මහණෙනි, ප්‍රඥබල කොහි දැක්ක යුතු ද? සතර ආයඊසත්‍යයෙහි ය. (ප්‍රජානනලක්‍ෂණ) ප්‍රඥබල එහි දක්ක යුතු යි.

මහණෙනි, මේ පඤ්චබලයෝ යි.

## 5. 1. 2. 6.

## [ බලඅඟග සූත්‍රය ]

මහණෙනි, මේ බලයෝ පස්දෙනෙක. කවර පස්දෙනෙක යත්: ශ්‍රද්ධා-බලය, වීයඊබලය, සමෘතිබලය, සමාධිබලය, ප්‍රඥබල යි.

මහණෙනි, මේ පඤ්චබලයෝ වෙත්. මහණෙනි, මේ පස්බල අතුරින් තෙල අග්‍ර වෙයි, තෙල සාඞ්ග්‍රාහික වෙයි, තෙල මුළුලු කරන්නේ වෙයි. හෙ කිමෙක යත්: ප්‍රඥබල යි.

මහණෙනි, යම්සේ කූටාගාරයාගේ තෙල අග්‍රය වේ ද, තෙල සාඞ්ග්‍රාහික වේ ද, තෙල සඞ්ඝාතනිය වේ ද, එනම් කූටය යි.

මහණෙනි, එපරිදි ම මේ පඤ්චබලයන් අතුරින් තෙල අග්‍රය වෙයි, තෙල සාඞ්ග්‍රාහිකය වෙයි, තෙල සඞ්ඝාතනිය වෙයි. එනම්, ප්‍රඥබල යි.

## 5. 1. 2. 7.

## [ අත්තහිත සූත්‍රය ]

17. මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ ආත්මහිත පිණිස පිළිපන්නේ වෙයි, පරහිතපිණිස පිළිපන්නේ නො වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ සිල්සපන් වෙයි, මෙරමා සීලසම්පදයෙහි සමාදන් නො කරවයි. තෙමේ සමාධිසම්පන්න වෙයි. මෙරමා සමාධිසම්පදයෙහි සමාදන් නො කරවයි. තෙමේ ප්‍රඥසම්පන්න වෙයි, මෙරමා ප්‍රඥසම්පදයෙහි සමාදන් නො කරවයි තෙමේ විමුක්ති සම්පන්න වෙයි, මෙරමා විමුක්ති සම්පදයෙහි සමාදන් නො කරවයි. තෙමේ විමුක්තිඥනදර්ශනසම්පන්න (ප්‍රත්‍යවෙක්‍ෂණඥනසම්පන්න) වෙයි, මෙරමා විමුක්තිඥනදර්ශනසම්පදයෙහි සමාදන් නො කරවයි.

මහණෙනි, මෙ පස් දහමින් සමන්‍වාගත මහණ ආත්මහිත පිණිස පිළිපන්නේ වෙයි, මෙරමා හිත පිණිස පිළිපන්නේ නො වෙයි.

## 5. 1. 2. 8.

### [ පරහිතසුත්තං ]

18. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු පරහිතාය පටිපන්නො හොති, නො අත්තහිතාය. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අත්තනා න සීලසම්පන්නො හොති, පරං සීල සම්පදාය සමාදපෙති. අත්තනා න සමාධිසම්පන්නො හොති, පරං සමාධි-සම්පදාය සමාදපෙති. අත්තනා න පඤ්ඤා සම්පන්නො හොති, පරං පඤ්ඤා සම්පදාය සමාදපෙති. අත්තනා න විමුත්තිසම්පන්නො හොති, පරං විමුත්තිසම්පදාය සමාදපෙති. අත්තනා න විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති, පරං විමුත්තිඤාණ දස්සන සම්පදාය සමාදපෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු පරහිතාය පටිපන්නො හොති, නො අත්තහිතායාති.

## 5. 1. 2. 9.

### [ නෙව අත්තහිත-නො පරහිතසුත්තං ]

19. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු නෙව අත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතාය. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අත්තනා න සීලසම්පන්නො හොති, නො පරං සීල සම්පදාය සමාදපෙති. අත්තනා න සමාධිසම්පන්නො හොති, නො පරං සමාධිසම්පදාය සමාදපෙති. අත්තනා න පඤ්ඤාසම්පන්නො හොති, නො පරං පඤ්ඤා සම්පදාය සමාදපෙති. අත්තනා න විමුත්තිසම්පන්නො හොති, නො පරං විමුත්තිසම්පදාය සමාදපෙති. අත්තනා න විමුත්තිඤාණදස්සන-සම්පන්නො හොති, නො පරං විමුත්තිඤාණදස්සනසම්පදාය සමාදපෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු නෙව අත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතායාති.

5. 1. 2. 8.

[ පරහිත සූත්‍රය ]

18 මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ මෙරමා හිත පිණිස පිළිපන්නේ වෙයි, ආත්මහිත පිණිස පිළිපන්නේ නො වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙමේ සීලසම්පන්‍න නො වෙයි. මෙරමා සීලසම්පදයෙහි සමාදන් කරවයි. තෙමේ සමාධිසම්පන්‍න නොවෙයි, මෙරමා සමාධිසම්පදයෙහි සමාදන් කරවයි. තෙමේ ප්‍රඥසම්පන්‍න නො වෙයි, මෙරමා ප්‍රඥසම්පදයෙහි සමාදන් කරවයි. තෙමේ විමුක්ති සම්පන්‍න නො වෙයි, මෙරමා විමුක්තිසම්පදයෙහි සමාදන් කරවයි. තෙමේ විමුක්තිඥනදර්ශනසම්පන්‍න නො වෙයි, මෙරමා විමුක්තිඥනදර්ශනසම්පදයෙහි සමාදන් කරවයි.

මහණෙනි, මෙ පස්දහමින් සමන්‍වාගත (දුශ්ශීල බහුශ්‍රැත) මහණ මෙරමා හිත පිණිස පිළිපන්නේ වෙයි. ආත්මහිත පිණිස පිළිපන්නේ නො වෙයි.

5. 1. 2. 9.

[ නෙව අත්තහිත - නො පරහිත සූත්‍රය ]

19. මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ ආත්මහිත පිණිස පිළිපන්නේත් නො වෙයි, මෙරමා හිත පිණිස පිළිපන්නේත් නො වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙමේ සීලසම්පන්‍න නො වෙයි, මෙරමා සීලසම්පදයෙහි සමාදන් නො කරවයි. තෙමේ සමාධිසම්පන්‍න නො වෙයි. මෙරමා සමාධිසම්පදයෙහි සමාදන් නො කරවයි. තෙමේ ප්‍රඥසම්පන්‍න නො වෙයි, මෙරමා ප්‍රඥසම්පදයෙහි සමාදන් නො කරවයි. තෙමේ විමුක්ති සම්පන්‍න නො වෙයි, මෙරමා විමුක්තිසම්පදයෙහි සමාදන් නො කරවයි. තෙමේ විමුක්තිඥනදර්ශනසම්පන්‍න නො වෙයි. මෙරමා විමුක්තිඥනදර්ශනසම්පදයෙහි සමාදන් නො කරවයි.

මහණෙනි, මෙ පස් දහමින් සමන්‍වාගත (අල්පශ්‍රැත දුශ්ශීල) මහණ ආත්මහිත පිණිස පිළිපන්නේත් නො වෙයි. පරහිත පිණිස පිළිපන්නේත් නො වෙයි.

## 5. 1. 2. 10.

### [ අත්තහිත-පරහිතසුත්තං ]

20. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය ච. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අත්තනා ච සීලසම්පන්නො හොති, පරඤ්ච සීලසම්පදාය සමාදපෙති. අත්තනා ච සමාධිසම්පන්නො හොති, පරඤ්ච සමාධිසම්පදාය සමාදපෙති. අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති, පරඤ්ච පඤ්ඤාසම්පදාය සමාදපෙති. අත්තනා ච විමුත්තිසම්පන්නො හොති, පරඤ්ච විමුත්තිසම්පදාය සමාදපෙති. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති, පරඤ්ච විමුත්තිඤාණදස්සනසම්පදාය සමාදපෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අත්ත-හිතාය ච පටිපන්නො හොති පරහිතාය චාති.

**බලවග්ගො දුතියො.**

**තස්සුද්දානං:**

අනනුස්සුතකූටඤ්ච සඞ්ඛිත්තං විත්ථතෙන ච,
දට්ඨබ්බඤ්ච පුන කූටං චත්තාරොපි හිතෙන චාති.

## 5. 1. 2 10

### [ අත්තහිත-පරහිත සූත්‍රය ]

20. මහණෙනි, පස් දහමෙකින් සමන්‍වාගත මහණ ආත්මහිත පිණිස පිළිපන්නේත් වෙයි. පරහිත පිණිස පිළිපන්නේත් වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙමේත් සීලසම්පන්න වෙයි. මෙරමාත් සීලසම්පදායෙහි සමාදන් කරවයි. තෙමේත් සමාධිසම්පන්න වෙයි, මෙරමාත් සමාධිසම්පදායෙහි සමාදන් කරවයි. තෙමේත් ප්‍රඥසම්පන්න වෙයි, මෙරමාත් ප්‍රඥසම්පදායෙහි සමාදන් කරවයි. තෙමේත් විමුක්ති සම්පන්න වෙයි, මෙරමාත් විමුක්තිසම්පදායෙහි සමාදන් කරවයි. තෙමේත් විමුක්තිඥනදර්ශනසම්පන්න වෙයි. මෙරමාත් විමුක්තිඥනදර්ශනසම්පදායෙහි සමාදන් කරවයි.

මහණෙනි, මේ පස් දහමින් සමන්‍වාගත (බහුශ්‍රැත ක්ෂීණාස්‍රව) මහණ ආත්මහිත පිණිස පිළිපන්නේත් වෙයි, මෙරමා හිත පිණිස පිළිපන්නේත් වෙයි.

බලවග්ගය දෙවැනි යි.

එහි උද්දානය:

අනනුස්සුත සූත්‍රය, කූට සූත්‍රය, සඞ්ඛිත්ත සූත්‍රය, විත්ථත සූත්‍රය, දට්ඨබ්බ සූත්‍රය, පුනකූට සූත්‍රය, හිත සූත්‍ර සතර දැ යි දසයෙක.

# 3. පඤ්චඞ්ගිකවග්ගො

## 5. 1. 3. 1

## [ පඨමඅගාරව සුත්තං ]

[සාවත්ථිනිදානං]

21. සො වත භික්ඛවෙ භික්ඛු අගාරවො අප්පතිස්සො අසභාගවුත්තිකො සබ්‍රහ්මචාරීසු ආභිසමාචාරිකං ධම්මං පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති. ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා සෙඛං[1] ධම්මං පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති. සෙඛං ධම්මං අපරිපූරෙත්වා සීලානි පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති. සීලානි අපරිපූරෙත්වා සම්මාදිට්ඨිං පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති. සම්මාදිට්ඨිං අපරිපූරෙත්වා සම්මාසමාධිං පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු සගාරවො සප්පතිස්සො සභාගවුත්තිකො සබ්‍රහ්මචාරීසු ආභිසමාචාරිකං ධම්මං පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජති, ආභිසමාචාරිකං ධම්මං පරිපූරෙත්වා සෙඛං ධම්මං පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජති. සෙඛං ධම්මං පරිපූරෙත්වා සීලානි පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජති. සීලානි පරිපූරෙත්වා සම්මාදිට්ඨිං පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජති. සම්මාදිට්ඨිං පරිපූරෙත්වා සම්මාසමාධිං පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජති.

## 5. 1. 3. 2

## [ දුතියඅගාරවසුත්තං ]

22. සො වත භික්ඛවෙ භික්ඛු අගාරවො අප්පතිස්සො අසභාගවුත්තිකො සබ්‍රහ්මචාරීසු ආභිසමාචාරිකං ධම්මං පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති. ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා සෙඛං ධම්මං පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති. සෙඛං ධම්මං අපරිපූරෙත්වා සීලක්ඛන්ධං පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති. සීලක්ඛන්ධං අපරිපූරෙත්වා සමාධික්ඛන්ධං පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති. සමාධික්ඛන්ධං අපරිපූරෙත්වා පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙස්සතී’ති නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු සගාරවො සප්පතිස්සො සභාගවුත්තිකො සබ්‍රහ්මචාරීසු ආභිසමාචාරිකං ධම්මං පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජති. ආභිසමාචාරිකං ධම්මං පරිපූරෙත්වා සෙඛං ධම්මං පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජති. සෙඛං ධම්මං පරිපූරෙත්වා සීලක්ඛන්ධං පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජති. සීලක්ඛන්ධං පරිපූරෙත්වා සමාධික්ඛන්ධං පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජති. සමාධික්ඛන්ධං පරිපූරෙත්වා පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙස්සතී’ති ඨානමෙතං විජ්ජතී’ති.

---

1 සෙක්ඛං - සයා

# 3. පඤ්චාඞ්ගිකවර්ගය

## 5. 1. 3. 1

### [ පඨමඅගාරව සූත්‍රය ]

[සැවැත්නිදානයි.]

21. මහණෙනි, සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරව නැති යටත් පැවතුම් නැති විසදෘශජීවිතවෘත්ති ඇති, එ මහණ එකැතියෙන් (වත් පිළිත් ප්‍රඥප්ත-ශීලය වූ) ආභිසමාචාරික (උත්තමාචාර) ධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ (උත්තමසමාචාර සඞ්ඛ්‍යාත) ආභිසමාචාරික ධර්මය නො පුරා (ශෛක්ෂප්‍රඥප්ති ශීලසඞ්ඛ්‍යාත) ශෛක්ෂධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. ශෛක්ෂධර්මය නො පුරා (සතරමහ) සිල් පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. සිල් නො පුරා (විදර්ශනා) සම්‍යග්දෘෂ්ටිය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. සම්‍යග්දෘෂ්ටිය නො පුරා (මාර්ග-ඵල) සම්‍යක්සමාධිය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

මහණෙනි, සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරව ඇති, ප්‍රතිශ්‍රය (=යටත් පැවැතුම්) ඇති, සභාගවෘත්ති ඇති, එ මහණ එකැතින් ආභිසමාචාරික-ධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. ආභිසමාචාරික ධර්මය පුරා ශෛක්ෂධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. ශෛක්ෂධර්මය පුරා සතර මහසිල් පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. සිල් පුරා සම්‍යග්දෘෂ්ටිය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. සම්‍යග්දෘෂ්ටිය පුරා සම්‍යක්සමාධිය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ ය යි.

## 5. 1. 3. 2

### [දුතිය අගාරව සූත්‍රය ]

මහණෙනි, සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරව නැති, ප්‍රතිශ්‍රය නැති, විසභාග වෘත්ති ඇති, එ මහණ එකැතින් ආභිසමාචාරිකධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නොවේ. ආභිසමාචාරිකධර්මය නො පුරා ශෛක්ෂධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. ශෛක්ෂධර්මය නො පුරා ශීලස්කන්ධය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. ශීලස්කන්ධය නො පුරා සමාධිස්කන්ධය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. සමාධිස්කන්ධය නො පුරා ප්‍රඥාස්කන්ධය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

මහණෙනි, සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරව ඇති, ප්‍රතිශ්‍රය ඇති, සභාග වෘත්ති ඇති, එ මහණ එකැතින් ආභිසමාචාරිකධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. ආභිසමාචාරිකධර්මය පුරා ශෛක්ෂධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. ශෛක්ෂධර්මය පුරා ශීලස්කන්ධය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. ශීලස්කන්ධය පුරා සමාධිස්කන්ධය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. සමාධිස්කන්ධය පුරා ප්‍රඥාස්කන්ධය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ.

## 5. 1. 3. 3

## [ උපක්කිලෙසසුත්තං ]

23. පඤ්චිමෙ භික්ඛවෙ ජාතරූපස්ස උපක්කිලෙසා, යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං ජාතරූපං න චෙව මුදු හොති, න ච කම්මනියං, න ච පභස්සරං, පභඞ්ගු ච,[1] න ච සම්මා උපෙති කම්මාය.

කතමෙ පඤ්ච? අයො ලොහං තිපු සීසං සජ්ඣු.[2]

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ජාතරූපස්ස උපක්කිලෙසා, යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං ජාතරූපං න චෙව මුදු හොති, න ච කම්මනියං න ච පභස්සරං, පභඞ්ගු ච, න ච සම්මා උපෙති කම්මාය.

යතො ච ඛො භික්ඛවෙ ජාතරූපං ඉමෙහි පඤ්චහි උපක්කිලෙසෙහි විප්පමුත්තං[3] හොති, තං හොති ජාතරූපං මුදු ච කම්මනියඤ්ච පභස්සරං ච, න ච පභඞ්ගු, සම්මා උපෙති කම්මාය යස්සා යස්සා[4] ච පිළන්ධනවිකතියා ආකඞ්ඛති: යදි මුද්දිකාය යදි කුණ්ඩලාය යදි ගීවෙය්‍යකාය[5] යදි සුවණ්ණමාලාය. තඤ්චස්ස අත්ථං අනුභොති.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චිමෙ චිත්තස්ස උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං චිත්තං නචෙව මුදු හොති, න ච කම්මනියං. න ච පභස්සරං, පභඞ්ගු ච, න ච සම්මාසමාධියති ආසවානං ඛයාය.

කතමෙ පඤ්ච? කාමච්ඡන්දො, ව්‍යාපාදො, ථීනමිද්ධං[6] උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡා.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච චිත්තස්ස උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං චිත්තං න චෙව මුදු හොති, න ච කම්මනියං, න ච පභස්සරං. පභඞ්ගු ච, න ච සම්මාසමාධියති ආසවානං ඛයාය.

යතො ච ඛො භික්ඛවෙ චිත්තං ඉමෙහි පඤ්චහි උපක්කිලෙසෙහි විප්පමුත්තං හොති, තං හොති චිත්තං මුදු ච කම්මනියඤ්ච පභස්සරඤ්ච, න ච පභඞ්ගු, සම්මාසමාධියති ආසවානං ඛයාය. යස්ස යස්ස ච අභිඤ්ඤාසච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡිකිරියාය, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති: "අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවෙය්‍යං, එකොපි හුත්වා බහුධා අස්සං -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙය්‍යන්ති" තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති: "දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණෙය්‍යං දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ යෙ සන්තිකෙ චා"ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

---

1. පභඞ්ගු - සීමු 2. සජ්ඣුං - මජ්සං, සජ්ඣා - ස්‍යා.
3. විමුත්තං - මජ්සං 4. යස්සකස්සචි පිළන්ධනවිකතියා - ස්‍යා
5. ගීවෙය්‍යකෙන - කත්ථචි 6. ථිනමිද්ධං - මජ්සං.

## 5. 1. 3. 3

### [ උපක්කිලෙස සූත්‍රය ]

23. මහණෙනි, යම් උපකෙලශයෙකින් කිලිටි වූ සවර්ණය මෘදු නො වේ නම්, කර්මණ්‍ය ද නො වේ නම්, ප්‍රභාස්වර ද නො වේ නම්, බිඳෙන-සුලු වේ නම්, මොනොවට කර්මයට නො පැමිණේ නම්, සවර්ණයාගේ මේ ඒ උපකෙලශයෝ පස් දෙනෙකි.

කවර පස් දෙනෙක යත්: අයස් (කළුලොහො) ය, ලොහොය, තුඹු (ඊයම්) ය, සීස (සුදුඊයම්) ය, රජත යි.

මහණෙනි, යම් උපකෙලශයෙකින් කිලිටි වූ සවර්ණය මෘදුත් නො වේ නම්, කර්මණ්‍යත් නො වේ නම්, ප්‍රභාස්වරත් නො වේ නම්, බිඳෙනසුලුත් වේ නම්, මැනැවින් කර්මයට නො පැමිණේ නම්, මේ සවර්ණයාගේ ඒ පඤ්ච උපකෙලශයෝ යි.

මහණෙනි, යම් හෙයෙකින් සවර්ණය මේ පඤ්චඋපකෙලශයෙන් මිදුනේ වේ නම්, ඒ සවර්ණය මෘදු ද කර්මණ්‍ය ද ප්‍රභාස්වර ද නො බිඳෙන සුලු ද වෙයි. (යමෙක්) මුදුවකට වේ වයි, කොඩොලකට වේ වයි, ගෙලපළඳනකට වේ වයි, රත්මාලාවකට වේ වයි, යම් යම් පළඳනා වෙසෙසක් සඳහා කැමැති වේ නම්, ඒ කර්මයට මැනැවින් පැමිණෙයි. එ අර්ථය ද (හෙ) වළඳනේ ය.

මහණෙනි, එ පරිද්දෙ ම යම් උපකෙලශයෙකින් කිලිටි වූ සිත මෘදුත් නො වේ නම්, කර්මණ්‍යත් නො වේ නම්, ප්‍රභාස්වරත් නො වේ නම්, බිඳෙනසුලුත් වේ නම්, මොනොවට ආස්‍රවක්‍ෂය පිණිස සමාහිතත් නො වේ නම්, මේ (චාතුර්භූමක) කුශලචිත්තය පිළිබඳ එබඳු උපකෙලශයෝ පස්දෙනෙක.

කවර පස්දෙනෙක යත්: කාමච්ඡන්ද ය, ව්‍යාපාද ය, ථිනමිද්ධ ය, උද්ධච්චකුක්කුච්ච ය, විචිකිච්ඡා යි.

මහණෙනි, යම් උපකෙලශයෙකින් කිලිටි වූ සිත මෘදුත් නො වේ නම් කර්මණ්‍යත් නො වේ නම්, ප්‍රභාස්වරත් නො වේ නම්, (අරමුණෙහි) බිඳෙන සැහැවිත් වේ නම්, මොනොවට ආස්‍රවක්‍ෂය පිණිස සමාහිතත් නො වේ නම්, චිත්තය පිළිබඳ මේ එබඳු උපකෙලශයෝ පස්දෙන යි.

මහණෙනි, යම් හෙයෙකින් සිත මේ පඤ්ච උපකෙලශයෙන් විමුක්ත වේ නම්, එ සිත මෘදුත් වෙයි, කර්මණ්‍යත් වෙයි, නො බිඳෙන සැහැවිත් වෙයි. ආස්‍රවක්‍ෂය පිණිස මොනොවට සමාහිත ද වෙයි. අභිඥයෙන් සාක්‍ෂාත් කටයුතු වූ යම් ම දහම්වෙසෙසක් සඳහා විශිෂ්ටඥනයෙන් දන සාක්‍ෂාත්-කරණයට සිත නැඹුරු වේ නම්, ඒ විශෙෂයෙහි ම ප්‍රත්‍යය ඇති වත් ම ප්‍රත්‍යක්‍ෂ (කිරීමෙහි භව්‍ය) භාවයට පැමිණෙයි.

හේ ඉදින් 'අනෙකවිධ ඍද්ධිවිධඥනය අනුභව කරන්නෙමි'යි එකක්ව ම බහුප්‍රකාරයෙන් වන්නෙමි යි ... බඹලොව්දු තෙක් කයින් වසය පවත්-වන්නෙමි''යි කැමැති වේ නම්, ඒ ඒ කරුණෙහි ම ප්‍රත්‍යය ඇතිවත් ම ප්‍රත්‍යක්‍ෂභාවයට පැමිණේ.

හේ ඉදින් මිනිස්කන ඉක්ම සිටි පිරිසිදු දිවසෝතයින් දිව්‍ය වූ ද මානුෂක වූ ද දුරුතන්හි වූ ද සමීපයෙහි වූ ද උභයශබ්දයන් අසන්නෙම්'යි කැමැති වේ නම්, ඒ ඒ කරුණෙහි ම ප්‍රත්‍යය ඇති වත් ම ප්‍රත්‍යක්‍ෂභාවයට පැමිණේ.

සො සචෙ ආකඞ්ඛති ''පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානෙය්‍යං සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානෙය්‍යන්ති -පෙ- විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානෙය්‍යං, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානෙය්‍ය''න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති ''අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යං- සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං ස උද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍ය''න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති ''දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍ය''න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති ''ආසවානං ඛයා [අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං] -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය''න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙති.

## 5. 1. 3 4

## [ දුස්සීලසුත්තං ]

24. දුස්සීලස්ස භික්ඛවෙ සීලවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ අසති නිබ්බිදාවිරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ රුක්ඛො සාඛාපලාසවිපන්නො, තස්ස පපටිකා'පි න පාරිපූරිං ගච්ඡති. තචො'පි -පෙ- ඵෙග්ගු'පි -පෙ- සාරො'පි න පාරිපූරිං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ දුස්සීලස්ස සීලවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි -පෙ- විමුත්තිඤාණදස්සනං.

සීලවතො භික්ඛවෙ සීලසම්පන්නස්ස උපනිස්සයසම්පන්නො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිස්සයසම්පන්නං[1] හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිස්සයසම්පන්නො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ සති නිබ්බිදාවිරාගසම්පන්නස්ස උපනිස්සයසම්පන්නං[2] හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථා'පි භික්ඛවෙ රුක්ඛො සාඛාපලාසසම්පන්නො, තස්ස පපටිකා'පි[3] පාරිපූරිං ගච්ඡති. තචොපි පාරිපූරිං ගච්ඡති. ඵෙග්ගුපි පාරිපූරිං ගච්ඡති. සාරො'පි පාරිපූරිං ගච්ඡති.[4]

එවමෙව ඛො භික්ඛවෙ සීලවතො සීලසම්පන්නස්ස උපනිස්සයසම්පන්නො හොති සම්මාසමාධි -පෙ- විමුත්තිඤාණදස්සනන්ති.

---

1. උපනිස්සයසම්පන්නො - සී 2. උපනිසසම්පන්නං - මජ්ඣං 3 පපටිකා - ස්‍යා
4. තචොපි ඵෙග්ගුපි සාරොපි පාරිපූරිං ගච්ඡති - සී.

හේ ඉදින් "පරසත්ත්ව පරපුද්ගලයන්ගේ සිත චේතොපරියායඥානයෙන් සරාගචිත්තය සරාගචිත්තය විසින් දන්නෙමි යි ... විමුක්ත වූ හෝ සිත විමුක්ත චිත්තය යි දන්නෙමැයි, අවිමුක්ත වූ හෝ සිත අවිමුක්ත සිත ය යි දන්නෙ මැ යි" කැමැති වේ නම්, ඒ ඒ කරුණෙහි ප්‍රත්‍යය ඇති වත් ම ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

හේ ඉදින් "අනෙකවිධපූර්වේනිවාසය සිහි කෙරෙමැයි එනම්; එක්-ජාතියක් ද ජාති දෙකක් ද ... (කියා) මෙසේ අනෙකවිධපූර්වේනිවාසය සිහි කෙරෙමැ"යි කැමැති වේ නම්, ඒ ඒ කරුණෙහි හෙතු ඇති වත් ම ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

හේ ඉදින් "මිනිසැස ඉක්ම පවත්නා විශුද්ධ දිවැසින්...කම් වූ පරිද්දෙන් මිය යන සත්ත්වයන් දැනගන්නෙමි"යි කැමැති වේ නම් ඒ ඒ කරුණෙහි හෙතු ඇති වත් ම ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

හේ ඉදින් "ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් ආස්‍රවරහිත චිත්තවිමුක්තිය, ප්‍රඥා-විමුක්තිය ... ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරමි"යි කැමැති වේ නම් ඒ ඒ කරුණෙහි හෙතු ඇති වත් ම ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ ය යි.

## 5. 1. 3. 4

## [ දුස්සීල සූත්‍රය ]

24. මහණෙනි, නට සිල් ඇති දුසිල්හුගේ සම්‍යක්සමාධිය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. සම්‍යක්සමාධිය නැති වත් ම නට සම්‍යක්සමාධිය ඇතියහුගේ යථාභූතඥානදර්‍ශනය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. යථාභූත ඥානදර්‍ශනය නැති වත් ම යථාභූතඥානදර්‍ශනවිපන්නයාගේ නිබ්බිදාව හා විරාගය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. නිබ්බිදාවිරාගය නැති වත් ම නට නිබ්බිදාවිරාග ඇතියහුගේ විමුක්තිඥානදර්‍ශනය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි.

මහණෙනි, අතු හා කොළින් විපන්න වූ රුකෙක් යම් පරිදි වේ නම්, එහි පොතුදු පරිපූර්තියට (වැඩීමට) නො යෙයි. සිවිදු, බොරුදු (එළය ද) හරය ද පරිපූර්තියට නො යෙයි.

මහණෙනි, එපරිද්දෙන් ම නට සිල් ඇති දුසිල්හුගේ සම්‍යක්සමාධිය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි ... විමුක්තිඥානදර්‍ශනය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි.

මහණෙනි, සිල්සපත් සිල්වත්හුගේ සම්‍යක්සමාධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සම්‍යක්සමාධිය ඇති වත් ම සම්‍යක් සමාධිසම්පන්නයාගේ යථාභූත ඥානදර්‍ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. යථාභූතඥානදර්‍ශනය ඇති වත් ම යථාභූතඥානදර්‍ශන සම්පන්නයාගේ නිබ්බිදා හා විරාගය උපනිඃශ්‍රය සම්පන්න වෙයි. නිබ්බිදා හා විරාගය ඇති වත් ම නිබ්බිදාවිරාගසම්පන්නයාගේ විමුක්තිඥානදර්‍ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි.

මහණෙනි, අතුකොළ සපත් රුකෙක් යම් බඳු වේ නම්, එහි පොතුදු පරිපූර්තියට යෙයි. සිවිදු පරිපූර්තියට යෙයි. බොරුදු පරිපූර්තියට යෙයි. හරය ද පරිපූර්තියට යෙයි.

මහණෙනි, එපරිද්දෙන් සිල්සපත් සිල්වත්හුගේ සම්‍යක්සමාධිය උපනිඃ-ශ්‍රය සම්පන්න වෙයි ... විමුක්තිඥානදර්‍ශනය (උපනිඃශ්‍රයසම්පන්න) වෙයි.

## 5. 1. 3. 5

### [ අනුග්ගහිතසුත්තං ]

25. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි අනුග්ගහිතා සම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති, චෙතොවිමුත්තිඵලානිසංසා ච, පඤ්ඤාවිමුත්තිඵලා ච හොති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා ච. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ සම්මාදිට්ඨි සීලානුග්ගහිතා ච හොති. සුතානුග්ගහිතා ච[1] හොති. සාකච්ඡානුග්ගහිතා ච හොති. සමථානුග්ගහිතා ච හොති. විපස්සනානුග්ගහිතා ච හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි අනුග්ගහිතා සම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති. චෙතොවිමුත්තිඵලානිසංසා ච, පඤ්ඤාවිමුත්තිඵලා ච හොති, පඤ්ඤාවිමුත්තිඵලානිසංසා චාති.

## 5. 1 3. 6

### [ විමුත්තායතන සුත්තං ]

26. පඤ්චිමානි භික්ඛවෙ විමුත්තායතනානි, යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා[2] ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා[3] අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති. කතමානි පඤ්ච?

(1) ඉධ භික්ඛවෙ භික්ඛුනො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො[4] සබ්‍රහ්මචාරී. යථා යථා භික්ඛවෙ තස්ස භික්ඛුනො සත්ථා ධම්මං දෙසෙති, අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති, ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමොජ්ජං[5] ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. ඉදං භික්ඛවෙ පඨමං විමුත්තායතනං, යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

(2) පුනචපරං භික්ඛවෙ භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති, අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී. අපිච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති. යථා යථා භික්ඛවෙ භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති. ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමොජ්ජං ජායති පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති

---

1. සුත්තානුග්ගහිතා ච - ස්‍යා 2. අපරික්ඛිණා - ස්‍යා 3 අනනුප්පත්තං වා - සීමු
4. ගරුට්ඨානිකො - සීමු 5, පාමුජ්ජං - සීමු, ස්‍යා

5. 1. 3. 5.

## අනුග්ගහිත සූත්‍රය

25 මහණෙනි, කරුණු පසෙකින් අනුගෘහිත වූ (විදර්ශනා) සම්‍යග්-දෘෂ්ටිය මාර්ගඵල සමාධිය ඵල කොට ඇත්තී ද මාර්ගඵලසමාධිය අනුසස් කොට ඇත්තී ද වෙයි. ප්‍රඥාවිමුක්තිසඞ්ඛ්‍යාත ඵලඥානය ඵල කොට ඇත්තී ද ප්‍රඥාවිමුක්තිඵලය අනුසස් කොට ඇත්තී ද වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි සම්‍යග්දෘෂ්ටිය ශීලයෙන් අනුගෘහිත ද වෙයි. ශ්‍රුතයෙන් අනුගෘහිත ද වෙයි. ධර්මසාකච්ඡායෙන් අනුගෘහිත ද වෙයි. (චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත) ශමථයෙන් අනුගෘහිත ද වෙයි. විදර්ශනායෙන් අනුගෘහිත ද වෙයි.

මහණෙනි, මේ පසගින් අනුගෘහිත වූ සම්‍යග්දෘෂ්ටිය චිත්තවිමුක්තිය ඵලය කොට ඇත්තීත් චිත්තවිමුක්තිඵලය අනුසස් කොට ඇත්තීත් වෙයි. ප්‍රඥාවිමුක්තිය ඵල කොට ඇත්තීත් ප්‍රඥාවිමුක්තිඵලය අනුසස් කොට ඇත්තීත් වේ ය යි.

5. 1. 3. 6.

## [ විමුත්තායතන සූත්‍රය ]

26. මහණෙනි, යම් විමුත්තිකාරණයක්හි අප්‍රමත්තව, කෙලෙස් තවන වැර ඇතිව, නිවන් කරා ගිය සිත් ඇතිව වාස කරණ මහණහුගේ අවිමුක්ත හෝ සිත විමුක්ත වේ නම්, අපරික්ෂීණ වූ හෝ ආස්‍රවයෝ පරික්‍ෂයට යෙත් නම්, අනුත්පන්න හෝ අනුත්තරයොගක්‍ෂෙමයට අනුප්‍රාප්ත වේ නම් (එබඳුවූ) විමුත්තායතනයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

(1) මහණෙනි, මෙ සස්නෙහි මහණක්හට ශාස්තෘ වේ ව යි අන්‍යතර ගුරුස්ථානික සබ්‍රම්සරෙක් වේ ව යි චතුස්සත්‍යධර්මය දෙශනා කෙරේ නම්, හේ ඒ ඒ පරිදි එ දහම්හි පෙල අරුත් පිළිවිදුනේ ද වෙයි. පෙළදම් පිළිවිදුනේ ද වෙයි. අර්ථය පිළිවිදුනා ධර්මය පිළිවිදුනා ඔහට ප්‍රමොද්‍ය (තරුණප්‍රීතිය) උපදනේ ය. ප්‍රමුදිතයා හට බලවත් ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතියුත් සිත් ඇත්තහුගේ නාමකය සන්හිඳෙයි. සන්හුන් කය අතියේ සුව විඳිනේ ය. සුව ඇතියහුගේ සිත (අර්හත් ඵල සමාධියෙහි) සමාහිත වෙයි. මහණෙනි, යම් විමුක්තායතනයෙක්හි අප්‍රමත්ත වූ, කෙලෙස් තවන වැර ඇතිව නිවන් කරා ගිය සිත් ඇතිව වාස කරණ මහණහුගේ අවිමුක්ත වූ චිත්තය හෝ විමුක්ත නම්, අපරික්ෂීණ වූ ආස්‍රවයෝ හෝ පරික්‍ෂයට යෙත් නම්, අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තරයොගක්‍ෂෙමයට (අර්හත්වයට) අනුප්‍රාප්ත වේ නම්, මේ ඒ ප්‍රථම විමුක්තායතන යි.

(2) තවද මහණෙනි, භික්‍ෂුහට ශාස්තෘ හෝ අන්‍යතර ගුරුස්ථානික සබ්‍රම්සරෙක් හෝ ධර්මය නො ම දෙසන්නේය. එතෙකුදු වුව ඇසූ පරිදි පිරිවැහූ පරිදි ධර්මය විතර විසින් පරහට දෙසන්නේ ය. මහණෙනි, යම් යම් පරිද්දෙකින් ඇසූ පරිදි පිරිවැහූ පරිදි ධර්මය විතරවිසින් පරහට දෙසා නම්, ඒ ඒ පරිදි හෙ ඒ ධර්මයෙහි අර්ථය පිළිවිදුනේ ද, ධර්මය පිළිවිදුනේ ද වෙයි. අර්ථය පිළිවිදුනා ධර්මය පිළිවිදුනා ඔහට ප්‍රමොද්‍ය උපදනේ ය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතියුත් සිතැතියාගේ කය සන්හිඳේ. සන්හුන් කය ඇතියේ සුව විඳිනේය. සුව ඇතියහුගේ සිත සමාහිත වෙයි.

ඉදං භික්ඛවෙ දුතියං විමුත්තායතනං යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

(3) පුනචපරං භික්ඛවෙ භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති, අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී. නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති. අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති යථා යථා භික්ඛවෙ භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති. තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති, ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති.[1] සුඛිනො චිත්තං සමාධියති. ඉදං භික්ඛවෙ තතියං විමුත්තායතනං යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

(4) පුනචපරං භික්ඛවෙ භික්ඛුනො නහෙව ඛො සත්ථා ධම්මං දෙසෙති, අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී. නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති, අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති. යථා යථා භික්ඛවෙ භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථ-පටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. ඉදං භික්ඛවෙ චතුත්ථං විමුත්තායතනං යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

(5) පුනචපරං භික්ඛවෙ භික්ඛුනො නහෙව ඛො සත්ථා ධම්මං දෙසෙති, අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී. නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති. අපි ච ඛ්වස්ස අඤ්ඤතරං සමාධිනිමිත්තං සුග්ගහිතං හොති, සුමනසිකතං සූපධාරිතං සුප්පටිවිද්ධං පඤ්ඤාය.

---

1 සුග්ගහිතං සුගාහී වෙදියති - සීමු.

මහණෙනි, යම් විමුක්තායතනයෙක්හි අප්‍රමත්තව වැර ඇතිව ප්‍රහිතාත්ම ව වාසය කරණ භික්ෂුහුගේ අවිමුක්ත හෝ චිත්තය මිදේ නම්, අපරික්ෂීණ වූ හෝ ආස්‍රවයෝ පරික්ෂයට යෙත් නම්, අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තර යොගක්ෂෙමය අනුප්‍රාප්ත වේ නම්, මේ එ ද්විතීය විමුක්තායතන යි.

(3) තවද මහණෙනි, මහණකුහට ශාස්තෘ හෝ අන්‍යතර ගුරුස්ථානික සබ්‍රම්සරෙක් හෝ දහම් නො ම දෙසන්නේ ය. ඇසූ පරිදි පිරිවැහු පරිදි ධර්මය විතර විසින් පරහට නො ද දෙසන්නේ ය. වැලිදු ඇසූ පරිදි පිරිවැහු පරිදි ධර්මය විතර විසින් සජ්ඣායනා කෙරෙයි මහණෙනි, යම් යම් පරිදි මහණකු ඇසූ පරිදි පිරිවැහු පරිදි ධර්මය විතර විසින් සජ්ඣායනා කෙරේ නම්, එ එ පරිදි හේ එ දහම්හි ඇරුත් පිළිවිදුනේත් දහම් පිළිවිදුනේත් වෙයි. අරුත් පිළිවිදුනා දහම් පිළිවිදුනා ඔහට ප්‍රමොදය උපදනේ ය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතිමනස්කයාගේ කය සන්හිදේ. සන්හුන් කය ඇතියේ සුව ලබන්නේ ය. සුව ඇතියහුගේ සිත සමාහිත වෙයි. මහණෙනි, යම් විමුක්තායතනයෙක්හි අප්‍රමත්තව අතාපී ව ප්‍රහිතාත්ම ව වෙසෙන භික්ෂුහුගේ අවිමුක්ත වූ හෝ චිත්තය මිදෙ නම්, අපරික්ෂණ වූ හෝ ආස්‍රවයෝ පරික්ෂයට යෙත් නම්, අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තරයොගක්ෂෙමයට අනුප්‍රාප්ත වේ නම්, මේ ඒ තෘතීය විමුක්තායතනය යි.

(4) තවද මහණෙනි, භික්ෂුහට ශාස්තෘ හෝ අන්‍යතර ගුරුස්ථානික සබ්‍රම්සරෙක් හෝ නො ම දහම් දෙසන්නේ ය. යථාශ්‍රැත යථාපර්‍ය්‍යාප්ත ධර්මය විස්තරයෙන් පරහට නො ද දෙසන්නේ ය. යථාශ්‍රැත යථාපර්‍ය්‍යාප්ත ධර්මය විස්තරයෙන් නො ද සජ්ඣායනා කරන්නේ ය. වැලිත් යථාශ්‍රැත යථාපර්‍ය්‍යාප්ත ධර්මය සිතින් අනුවිතර්ක කෙරේ. අනුවිචාර කෙරේ. සිතින් අනුප්‍රෙක්ෂා කෙරේ. මහණෙනි, මහණ යම් යම් පරිදි යථාශ්‍රැත යථාපර්‍ය්‍යාප්ත ධර්මය සිතින් අනුවිතර්කන කෙරේ නම්, අනුවිචරණ කෙරේ නම්, සිතින් අනුප්‍රෙක්ෂා කෙරේ නම්, ඒ ඒ පරිදි හෙ එ දහම්හි අරුත් පිළිවිදුනේත් පෙළදම් පිළිවිදුනේත් වෙයි. අරුත් පිළිවිදුනා පෙළදම් පිළිවිදුනා ඔහට ප්‍රමොදය උපදනේය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේය. ප්‍රීතිමනස්කයාගේ කය සන්හිදෙයි. සන්හුන් කය ඇතියේ සුව විඳිනේය. සුව ඇතියහුගේ සිත සමාහිත වේ. මහණෙනි, යම් විමුක්තායතනයෙක්හි අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාස කරණ මහණහුගේ අවිමුක්ත වූ හෝ චිත්තය මිදේ නම්, අපරික්ෂීණ වූ හෝ ආස්‍රවයෝ පරික්ෂයට යෙත් නම්, අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තරයොගක්ෂමයට අනුප්‍රාප්ත වේ නම්, මේ ඒ සතරවන විමුක්තාය-තනයයි.

(5) තවද මහණෙනි, භික්ෂුහට ශාස්තෘ වේවයි; අන්‍යතර ගුරුස්ථානික සබ්‍රම්සරෙක් වේවයි, ධර්මය නො ම දෙසන්නේය. යථාශ්‍රැත යථාපර්‍ය්‍යාප්ත ධර්මය විතරවිසින් පරහට නො ද දෙසන්නේ ය. යථාශ්‍රැත යථාපර්‍ය්‍යාප්ත ධර්මය විතරවිසින් සජ්ඣායනා නො ද කරන්නේය. යථාශ්‍රැත යථාපර්‍ය්‍යාප්තව ධර්මය සිතින් නො ද අනුවිතර්කන කරන්නේය. අනුවිචරණය නො කරන්-නේය. සිතින් අනුප්‍රෙක්ෂා නො කරන්නේය. එතෙකුදු වුව, ඔහු විසින් අන්‍යතර සමාධි නිමිත්තක් (කමටහනක්) මොනොවට උගත්නා ලද්දේ වෙයි. මොනොවට මෙනෙහි කරණ ලද වෙයි. මොනොවට උපධාරිත වෙයි. ප්‍රඥයෙන් මොනොවට පිළිවිදුනා ලද වෙයි.-

යථා යථා භික්ඛවෙ භික්ඛුනො අඤ්ඤතරං සමාධිනිමිත්තං සුග්ගහිතං හොති සුමනසිකතං සූපධාරිතං සුප්පටිවිද්ධං පඤ්ඤාය, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. ඉදං භික්ඛවෙ පඤ්චමං විමුත්තායතනං යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච විමුත්තායතනානි යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාතී'ති.

## 5. 1. 3. 7.

## [ සමාධිසුත්තං ]

27. සමාධිං භික්ඛවෙ භාවෙථ අප්පමාණං නිපකා පතිස්සතා. සමාධිං භික්ඛවෙ භාවයතං අප්පමාණං නිපකානං පතිස්සතානං පඤ්ච ඤාණානි පච්චත්තං යෙව උප්පජ්ජන්ති. කතමානි පඤ්ච:

අයං සමාධි පච්චුප්පන්නසුඛො චෙව ආයතිං ච සුඛවිපාකොති පච්චත්තං යෙව ඤාණං උප්පජ්ජති. අයං සමාධි අරියො නිරාමිසොති පච්චත්තං යෙව ඤාණං උප්පජ්ජති. අයං සමාධි අකාපුරිසසෙවිතො'ති පච්චත්තං යෙව ඤාණං උප්පජ්ජති. අයං සමාධි සන්තො පණීතො පටිප්පස්සද්ධලද්ධො[1] එකොදිභාවාධිගතො න ච සසංඛාරනිග්ගය්හවාරිතවතො'ති[2] පච්චත්තං යෙව ඤාණං උප්පජ්ජති. සො ඛො පනාහං ඉමං සමාධිං සතො ච සමාපජ්ජාමි සතො ච උට්ඨහාමී'ති[3] පච්චත්තං යෙව ඤාණං උප්පජ්ජති.

සමාධිං භික්ඛවෙ භාවෙථ අප්පමාණං නිපකා පතිස්සතා. සමාධිං භික්ඛවෙ භාවයතං අප්පමාණං නිපකානං පතිස්සතානං ඉමානි පඤ්ච ඤාණානි පච්චත්තං යෙව උප්පජ්ජන්තී'ති,

## 5. 1. 3. 8.

## [ පඤ්චඞ්ගිකසමාධිසුත්තං ]

28. අරියස්ස භික්ඛවෙ පඤ්චඞ්ගිකස්ස සම්මා සමාධිස්ස භාවනං දෙසිස්සාමි.[4] තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමී'ති. එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

---

1. පටිප්පස්සද්ධිලද්ධො, - සයා.
2. න ච සසංඛාරනිග්ගය්හ වාතපත්තොති - සයා. න සසංඛාර නිග්ගය්හ වාරියාධිගතොති - මජ්ඣං (?) න ච සසංඛාර නිග්ගය්හ වාරිතපත්තොති - සීමු
3. සතො ඛො පනාහං ඉමං සමාපජ්ජාමි, සතො උට්ඨහාමීති - මජ්ඣං. සතොව සමාපජ්ජාමි සතො උට්ඨහාමීති - සයා 4 දෙසිස්සාමි - සයා - මජ්ඣං

මහණෙනි, යම් යම් පරිදි භික්ෂූහු විසින් අන්‍යතර සමාධිනිමිත්තක් සුගෘහීත ද, මැනැවින් මෙනෙහි කරණ ලද ද, මැනැවින් උපධාරිත ද ප්‍රඥයෙන් සුප්‍රතිවිද්ධ ද වේ නම්, හෙ ඒ ඒ පරිදි ඒ ධර්මයෙහි අර්ථප්‍රතිසංවෙදී හා ධර්මප්‍රතිසංවෙදී හා වෙයි. අර්ථසංප්‍රතිවෙදී වූ ධර්මප්‍රතිසංවෙදී වූ ඔහට ප්‍රමොදය උපදනේය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතිමනස්කයාගේ කය සන්හිඳෙයි. සන්සුන් කය ඇතියේ සුව විඳිනේ ය. සුව ඇතියහුගේ සිත සමාහිත වෙයි. මහණෙනි, යම් විමුක්තායතනයෙක්හි අප්‍රමත්තව ආතාපීව ප්‍රහිතාත්ම ව වසන භික්ෂූහුගේ අවිමුක්ත වූ හෝ චිත්තය විමුක්ත වේ නම්, අපරික්ෂීණ වූ හෝ ආස්‍රවයෝ පරික්ෂයට යෙත් නම්, අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තරයොගක්ෂෙමයට අනුප්‍රාප්ත වේ නම්, මේ ඒ පස්වන විමුක්තායතනයි.

මහණෙනි, යම් විමුක්තායතනයෙක්හි අප්‍රමත්තව ආතාපීව ප්‍රහිතාත්ම ව වසන භික්ෂූහුගේ අවිමුක්ත වූ හෝ සිත විමුක්ත වේ නම්, අපරික්ෂීණ වූ හෝ ආස්‍රවයෝ පරික්ෂයට යෙත් නම්, අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තරයොගක්ෂෙමය අනුප්‍රාප්ත වේ නම්, මේ ඒ පඤ්චවිමුක්තායතනයි.

## 5. 1. 3. 7.

## [ සමාධිසූත්‍රය ]

27. මහණෙනි, අප්‍රමාණ (ලොකුත්තර) වූ සමාධිය නුවණැති ව සමෘතිසම්ඣාගතව වඩවු. මහණෙනි, සම්ප්‍රඥන ඇති ව සමෘතියෙන් යුක්තව අප්‍රමාණ සමාධිය වඩනවුනට තමා කෙරෙහි ම ප්‍රත්‍යවෙක්ෂාඥන පස් දෙනෙක් උපදනාහ. කවර පස්දෙනෙක යත්:

"මේ (අර්හත්ඵල) සමාධිය ප්‍රත්‍යුත්පන්න (අධිගත ක්ෂණයෙහිත්) සුඛ ඇතියේ ය'යි ද මතුයෙහිත් සුඛවිපාක ඇතියේ ය"යි ද තමා කෙරෙහි ම ඥණය උපදනේ ය. "මේ සමාධිය කෙලෙසුන්ගෙන් තොරය, ලොකාමිස-යෙන් තොරය"යි ද තමා තුළම ඥණය උපදනේය. මේ සමාධිය මහා පුරුෂයන් විසින් සෙවුනා ලද ය"යී තමා තුළම ඥණය උපදනේය. "මේ සමාධිය ශාන්තය, ප්‍රණීතය, කෙලෙස් සන්සිඳවූවහු විසින් ලබන ලදය, එකාග්‍රතායෙන් ලබන ලදය, සප්‍රයොගචිත්තයෙන් ප්‍රත්‍යනීක ධර්මයන් නිගෙණ (සාසවසමාධි මෙන්) උත්සාහයෙන් කෙලෙස් වළහා ලද්දේ නො වේ ය"යි තමා තුල ම ඥණය උපදනේ ය. "එ මම සිහි ඇතියෙම් ම මෙ සමාධියට සම්වදිමි. සිහි ඇතියෙම් ම ඉන් නැගෙමි"යි තමා තුළම ඥණය උපදනේය.

මහණෙනි, නුවණැති ව එළඹ සිටි සිහි ඇති ව අප්‍රමාණසමාධිය වඩවු. මහණෙනි, සම්ප්‍රඥන ඇති එළඹ සිටි සිහි ඇති අප්‍රමාණසමාධිය වඩනවුනට මේ පඤ්චඥණයෝ තමා තුළ ම උපදනාහයි.

## 5. 1. 3. 8.

## [ පඤ්චඞ්ගිකසමාධි සූත්‍රය ]

28. මහණෙනි, පසඟින් යුත් ආර්‍ය්‍ය වූ සම්‍යක්සමාධිහුගේ භාවනාව දෙසන්නෙමි. එ අසව, මොනොවට මෙනෙහි කරව. කියන්නෙමි යි. 'එසේය, වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

කතමා ච භික්ඛවෙ අරියස්ස පඤ්චඞ්ගිකස්ස සම්මාසමාධිස්ස භාවනා?

(1) ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි [සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං] පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො නහාපකො[1] වා නහාපකන්තෙවාසී[2] වා කංසථාලෙ නහානියචුණ්ණානි[3] ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං සන්නෙය්‍ය, සායං[4] නහානියපිණ්ඩි ස්නෙහානුගතා[5] ස්නෙහපරෙතා[6] සන්තරබාහිරා ඵුටා ස්නෙහෙන න ච පග්ඝරති.[7] එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පතිසුඛෙන අප්ඵුටං හොති අරියස්ස භික්ඛවෙ පඤ්චඞ්ගිකස්ස සම්මා සමාධිස්ස අයං පඨමා භාවනා.

(2) පුනචපරං භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- (සමාධිජං පීතිසුඛං) දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ උදකරහදො උබ්භිදොදකො,[8] තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, දෙවො ච කාලෙන කාලං සම්මා ධාරං නානුප්පවෙච්ඡෙය්‍ය, අථඛො තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. අරියස්ස භික්ඛවෙ පඤ්චඞ්ගිකස්ස සම්මාසමාධිස්ස අයං දුතියා භාවනා.

(3) පුනචපරං භික්ඛවෙ භික්ඛු පීතියා ච විරාගා -පෙ- [සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති -පෙ-] තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන අප්ඵුටං හොති.-

1. නහාපකො වා - මජසං. 2 නහාපකන්තෙවාසී වා - මජසං.
3. නහානිය චුණ්ණානි - මජසං. සයා. 4. යංසා - සීමු 5. සිනෙහානුගතා - සයා
6. සිනෙහපරෙතා - සයා. 7 පග්ඝරිනී - මජසං
8. උබ්භිතොදකො - සයා; ගම්භීරො - මජසං

මහණෙනි, ආර්‍ය්‍ය වූ පඤ්චාඞ්ග සමන්‍වාගත සම්‍යක් සමාධිහුගේ භාවනා කවර යත්:

(1) මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් ව ම අකුශල-ධර්මයෙන් වෙන්ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. හෙ මෙ කරජකය ම ප්‍රථමධ්‍යාන විවෙකයෙන් හටගත් ප්‍රීතිසුඛයෙන් තෙත් ගන්වයි. හාත්පස තෙමයි. හාත්පසින් පුරවයි. වටා පතුරුවයි. ඔහුගේ හැම ප්‍රත්‍යඞ්ගයෙන් යුත් කායයාගේ කිසිවක් විවෙකජ ප්‍රීතිසුඛයෙන් නො පහස්නා ලද නො වෙයි. මහණෙනි, දක්‍ෂ වූ නැවැම්යෙක් වේවයි නැවැම් අතවැස්සෙක් වේවයි කස්තලියෙහි නහනසුණු හෙලා දියෙන් ඉස ඉස යම් සේ හනා ද, ඔහුගේ ස්නානීයපිණ්ඩය උදකසෙනහය අනුව ගියේ සෙනහ පරිගත වූයේ ඇතුළත – පිටත දියෙන් පහස්නා ලද්දේ නො ද වැගිරෙයි. මහණෙනි, එ පරිදි ම මහණ මේ කරජකය විවෙකජ ප්‍රීතිසුඛයෙන් තෙමා ලයි. වටා තෙමා ලයි. හාත්පසින් පුරවයි. වටා පහසයි. සර්‍වාඞ්ගයෙන් යුතු ඔහුගේ කායයාගේ කිසිත් විවෙකජප්‍රීතිසුඛයෙන් නො පහස්නා ලද නො වෙයි. මහණෙනි, පඤ්චාඞ්ග සමන්‍වාගත ආර්‍ය්‍ය සම්‍යක්සමාධිහුගේ මේ ප්‍රථම භාවනාවයි.

(2) තවද මහණෙනි, මහණ විතර්ක – විචාරයන්ගේ ව්‍යුපශමයෙන් ... සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මෙ කරජකය ම සමාධිජ ප්‍රීතිසුඛයෙන් මැනැවින් තෙමයි. හාත්පසින් තෙමයි. හාත්පසින් පුරවයි. වටා පහසයි. ඔහුගේ සියලු ප්‍රත්‍යඞ්ගයෙන් යුත් කිසිදු ශරීරාඞ්ගයෙක් සමාධිජ ප්‍රීතිසුඛයෙන් නො පහළේ නො වේ. මහණෙනි, ඇතුළත උනන දිය ඇති දිය විලෙක් යම් බඳු වේ නම්, එයට පැදුම් දිගින් උදකයාගේ ආගමනමුඛයෙක් නො වන්නේ ය. පැලදිගින් උදකයාගේ ආගමනමුඛයෙක් නො වන්නේය. උතුරුදිගින් උදකයාගේ ආගමනමුඛයෙක් නො වන්නේය. දකුණු දිගින් උදකයාගේ ආගමන-මුඛයෙක් නො වන්නේ ය. මේඝය ද කලින් කල සම්‍යක් වර්‍ෂාධාරාව නො වස්වන්නේ ය. වැලිත්, එ දියවිලින් සීතවාරිධාරායෙක් බිඳ නැගී එ දියවිල ම සිහිල් දියෙන් තෙමන්නේය. හාත්පස තෙමන්නේ ය. පුරවන්නේ ය. වටා පතුරුවන්නේ ය. එ සියලු දියවිල්හි කිසිවක් සිහිල්-දියෙන් නො පහළේ නො වේ. මහණෙනි, එ පරිදි ම මහණ මෙ කය ම සමාධිජප්‍රීතිසුඛයෙන් තෙමන්නේ ය. හාත්පස තෙමන්නේ ය. පුරවන්නේය. පතුරන්නේ ය. ඔහුගේ සියලු සිරිරි පිළිබඳ කිසිදු තැනක් සමාධිජප්‍රීති-සුඛයෙන් නො පහළේ නො වේ. මහණෙනි, ආර්‍ය්‍ය පඤ්චාඞ්ගික සම්‍යක්-සමාධිහුගේ මේ ද්විතීය භාවනා යි.

(3) තවද මහණෙනි, මහණ ප්‍රීතිහුගේත් විරාගයෙන් ... සුඛයද කයින් විඳී ... ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. හෙ මෙ ම කය නිෂ්ප්‍රීතික-සුඛයෙන් තෙමයි. හාත්පස තෙමයි. පුරවයි. පතුරුවයි. ඔහුගේ සියලු ශරීරයාගේ කිසිවක් නිෂ්ප්‍රීතික සුඛයෙන් නො පහළේ නො වේ.-

සෙය්‍යථාපි භික්ඛවෙ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තො නිමූග්ගපොසීනි,[1] තානි යාවග්ගා[2] යාව මූලා[3] සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි පරිප්ඵුටානි. නාස්ස කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[4] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති. අරියස්ස භික්ඛවෙ පඤ්චඞ්ගිකස්ස සම්මාසමාධිස්ස අයං තතියා භාවනා.

(4) පුනචපරං භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පාහාණා–පෙ–[උපෙක්ඛාසති-පාරිසුද්ධිං] චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං අස්ස. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති. අරියස්ස භික්ඛවෙ පඤ්චඞ්ගිකස්ස සම්මාසමාධිස්ස අයං චතුත්ථා භාවනා.

(5) පුනචපරං භික්ඛවෙ භික්ඛුනො පච්චවෙක්ඛණානිමිත්තං සුග්ගහීතං හොති සුමනසිකතං සූපධාරිතං, සුප්පටිවිද්ධං පඤ්ඤාය. සෙය්‍යථාපි භික්ඛවෙ අඤ්ඤො වා අඤ්ඤං[5] පච්චවෙක්ඛෙය්‍ය, ඨිතො වා නිසින්නං පච්චවෙක්ඛෙය්‍ය, නිසින්නො වා නිපන්නං පච්චවෙක්ඛෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො පච්චවෙක්ඛණානිමිත්තං සුග්ගහීතං හොති සුමනසිකතං සූපධාරිතං, සුප්පටිවිද්ධං පඤ්ඤායා'ති. අරියස්ස භික්ඛවෙ පඤ්චඞ්ගිකස්ස සම්මාසමාධිස්ස අයං පඤ්චමී භාවනා

එවං භාවිතෙ ඛො භික්ඛවෙ භික්ඛු අරියෙ පඤ්චඞ්ගිකෙ සම්මාසමාධිම්හි එවං බහුලීකතෙ යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡිකිරියාය, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සෙය්‍යථාපි භික්ඛවෙ උදකමණිකො ආධාරෙ ඨපිතො පූරො උදකස්ස සමතිත්තිකො කාකපෙය්‍යො, තමෙනං බලවා පුරිසො යතො යතො ආවජ්ජෙය්‍ය, ආගච්ඡෙය්‍ය උදකන්ති? 'එවං භන්තෙ'.–

1. නිමුග්ගපොසිනි - සීමු. 2. තානි යාවච්චග්ගා - ස්‍යා. මජසං
3. යා ව ච මූලා - ස්‍යා. මජසං. තානි යාව ච නිම්මූලා - සීමු. 4. සබ්බාවතං - සීමු.
5 අඤ්ඤො වා අඤ්ඤං වා - සීමු.

මහණෙනි, නිලුපුල් විලෙක වේවයි, පියුම්ගරෙක වේවයි, පඬෙරවිලෙක වේවයි, ඇතැම් උත්පලයෝ හෝ පද්මයෝ හෝ පුණ්ඩරීකයෝ හෝ දියෙහි උපන්නාහු දියෙහි වැඩුනාහු දියෙන් නො නැගුනාහු ජලතල ඇතුළත ම නිමග්නව වඩනා හ. ඔහු අග පටන් මුල දක්වා සිහිල් දියෙන් තෙමුනාහු හාත්පසින් තෙමුනාහු පිරිපුන් වූවාහු හාත්පසින් පහළාහු වෙත්. එ විල්හුගේ සියලු උපුලන්ගේ වේවයි පද්මයන්ගේ වේවයි පුණ්ඩරීකයන්ගේ වේවයි සිහිල් දියෙන් හාත්පස නො පහළ කිසිදු නො වේ. මහණෙනි, එ පරිදි ම මහණ මෙ ම කය නිෂ්ප්‍රීතික සුඛයෙන් තෙමන්නේ ය. හාත්පස තෙමන්නේ ය. පුරවන්නේ ය. පතුරුවන්නේ ය. ඔහුගේ සියලු කායයාගේ කිසිවක් ම නිෂ්ප්‍රීතිකසුඛයෙන් නො පහළේ නො වේ. මහණෙනි, ආය්‍යී වූ පඤ්චාඞ්ගික සම්‍යක්සමාධිහුගේ මෙ තෘතීයභාවනා යි.

(4) තවද මහණෙනි, මහණ සුඛයාගේද ප්‍රහාණයෙන් ... උපෙක්‍ෂාවෙන් උපන් සමෘතිපාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානයට සමවැද වෙසෙයි. හෙ මෙකය ම පරිශුද්ධ පය්‍යීවදාත චතුර්ථධ්‍යාන සිතින් පතුරුවා ගෙණ හුන්නේ වෙයි. ඔහුගේ සියලු කායයාගේ කිසිදු දෑයෙක් පරිශුද්ධ පය්‍යීවදාත චිත්තයෙන් නො පහළේ නො වෙයි. මහණෙනි, යම්පරිදි පුරුෂයෙක් සුදුවතින් හිසින් වටා පෙරව ගෙණ හුන්නේ වේද, ඔහුගේ සියලු ශරීරයාගේ කිසිදු දෑයෙක් අවදාතවස්ත්‍රයෙන් නො පහළේ නො වන්නේ ය. මහණෙනි, එ පරිදි ම මහණ මෙ කය ම පරිශුද්ධ පය්‍යීවදාත චිත්තයෙන් පතුරුවා ගෙණ හුන්නේ වෙයි. ඔහුගේ සියලු ශරීරයාගේ කිසිදු දෑයෙක් පරිශුද්ධ පය්‍යීවදාත චිත්තයෙන් නො පහළේ නො වෙයි. මහණෙනි, ආය්‍යී වූ පඤ්චාඞ්ගික සම්‍යක් සමාධිහුගේ මේ චතුර්ථභාවනා යි.

(5) තවද මහණෙනි, මහණහු විසින් ප්‍රත්‍යවෙක්‍ෂා නිමිත්ත (ඥානය) මොනොවට ගන්නා ලද්දේ, මොනොවට මෙනෙහි කරණ ලද්දේ, මොනොවට බලන ලද්දේ, ප්‍රඥයෙන් මොනොවට පිළිවිදුනා ලද්දේ වෙයි. මහණෙනි, යම්සේ අනෙකෙක් හෝ අනෙකකු ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ ද, සිටගත්තෙක් හෝ හුන්නක්හු ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ ද, හුන්නෙක් හෝ හෝනක්හු ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ ද, මහණෙනි, එ පරිදි ම මහණහු විසින් ප්‍රත්‍යවෙක්‍ෂා නිමිත්ත මොනොවට උගන්නා ලදුයේ, මොනොවට මෙනෙහි කරණ ලදුයේ, මොනොවට බලන ලදුයේ, ප්‍රඥයෙන් මොනොවට පිළිවිදුනා ලදුයේ වෙයි. මහණෙනි, ආය්‍යී පඤ්චාඞ්ගික සම්‍යක් සමාධිහුගේ මේ පඤ්චම භාවනා යි.

මහණෙනි, මහණ මෙසේ ආය්‍යී පඤ්චාඞ්ගික සම්‍යක් සමාධිය භාවිත කල්හි මෙසේ බහුලීකෘත කල්හි අභිඥයෙන් පසක් කටයුතු යම් ම ධර්‍මයකට විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස චිත්තය නැඹුරු කරන්නේ ය. කාරණ (අභිඥ) ඇති වත් ම ඒ ඒ විෂයෙහි ම ප්‍රත්‍යක්‍ෂභාවයට පැමිණෙන්නේ ය.

මහණෙනි, යම් සේ දියසැළෙක් ආධාරයෙහි තබන ලදුයේ දිය පිරුණේ, සමභෘත වූයේ (මුව හා සමව පුරවන ලදුයේ), කාකපෙය වූයේ (කවුඩන් විසින් ගෙල නොනමා පිය හැකි වූයේ) වේ ද, බලවත් පුරුෂයෙක් තෙල දියසැළ යම් යම් පසෙක සිසාරන්නේ වේ නම්, (ඒ ඒ පසෙහි ඒකාන්තයෙන්) දියනැගේ ද? 'එසේ ය වහන්ස'.-

එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු එවං භාවිතෙ අරියෙ පඤ්චඞ්ගිකෙ සම්මා සමාධිම්හි එවං බහුලීකතෙ යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡිකිරියාය, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සෙය්‍යථාපි භික්ඛවෙ සමෙ භූමිභාගෙ පොක්ඛරණී චතුරස්සා[1] ආළිබද්ධා පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා, තමෙනං බලවා පුරිසො යතො යතො ආළිං මුඤ්චෙය්‍ය, ආගච්ඡෙය්‍ය උදකන්ති?. 'එවං භන්තෙ'. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු එවං භාවිතෙ අරියෙ පඤ්චඞ්ගිකෙ සම්මාසමාධිම්හි එවං බහුලීකතෙ යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡිකිරියාය, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සෙය්‍යථාපි භික්ඛවෙ සුභූමියං චාතුම්මහාපථෙ[2] ආජඤ්ඤරථො යුත්තො අස්ස ඨිතො ඔධස්තපතොදො, තමෙනං දක්ඛො යොග්ගාචරියො අස්සදම්මසාරථි අභිරුහිත්වා වාමෙන හත්ථෙන රස්මියො ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන පතොදං ගහෙත්වා යෙනිච්ඡකං යදිච්ඡකං සාරෙය්‍යපි පච්චාසාරෙය්‍යපි. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු එවං භාවිතෙ අරියෙ පඤ්චඞ්ගිකෙ සම්මා සමාධිම්හි එවං බහුලීකතෙ යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡිකිරියාය, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති: "අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවෙය්‍යං: එකොපි හුත්වා බහුධා අස්සං -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙය්‍ය"න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති: "දිබ්බාය සොතධාතුයා විසුද්ධාය -පෙ- අතික්කන්ත මානුසිකාය උභො සද්දෙ සුණෙය්‍යං දිබ්බෙ ච මානුසකෙ ච යෙ දූරෙ සන්තිකෙ චා"ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති: "පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානෙය්‍යං. සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානෙය්‍යං -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානෙය්‍ය"න්ති තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති: "අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යං- සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍ය"න්ති තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති: "දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථා කම්මූපගෙ සත්තෙ පජානෙය්‍ය"න්ති තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති: "ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය[2]"න්ති තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙති.

---

1. චතුරංසා - මජසං  2 චතුම්මහාපථෙ - මජසං

මහණෙනි, එ පරිදි ම මහණ ආර්‍ය්‍ය පඤ්චාඞ්ගික සම්‍යක්සමාධිය මෙසේ භාවිතවත් ම මෙසේ බහුලීකෘතවත් ම අභිඥයෙන් සාක්ෂාත් කටයුතු වූ යම් ම ධර්මයකට විශිෂ්ටඥනයෙන් පසක් කිරීම පිණිස සිත නැඹුරු කෙරේ නම්, අභිඥ ප්‍රත්‍යය ඇතිවත් ම ඒ ඒ විෂයෙහි ප්‍රත්‍යක්ෂභාවයට පැමිණෙයි.

මහණෙනි, යම්පරිදි සමභූමිභාගයෙක්හි සිවුරැස් වූ, මියර බැඳි, දිය පිරි, මුවතෙක් පිරි, කවුඩනට (ගෙල නොනමා) පිය හැකි පොකුණෙක් වේ ද, බලවත් පුරුෂයෙක් තෙල මියර බිඳුතේ නම් (එකැතින්) දිය නැගේ ද? 'එසේය, වහන්ස.' මහණෙනි, එ පරිදි ම මහණ ආර්‍ය්‍ය පඤ්චාඞ්ගික සම්‍යක් සමාධිය මෙසේ භාවිතවත් ම මෙසේ බහුලීකෘතවත් ම, අභිඥයෙන් සාක්ෂාත් කටයුතු වූ යම් ම ධර්මයකට විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සිත නැඹුරු කෙරේ නම්, අභිඥ ප්‍රත්‍යය ඇතිවත් ම ඒ ඒ විෂයෙහි ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

මහණෙනි, යම් පරිදි සමබිමෙක්හි සිවුමංසන්ධියෙක විනීත අශ්වයන් යෙදූ රථයෙක් (ගමනට) යුතු කොට තැබූ (වහා ගන්නට නිසිසේ සරස්හි) බහාතැබූ කැහිටි ඇතියේ වේ නම්, තෙල රථය දක්ෂ වූ අස්දම් සැරි අසැදුරෙක් නැග වමතින් රැහැන් ගෙණ දකුණතින් කැහැටි ගෙණ කැමැති මඟකින් කැමැති වෙගයකින් යවන්නේත් නවත්වන්නේත් වෙයි. මහණෙනි, එසේ ම මහණ ආර්‍ය්‍ය පඤ්චාඞ්ගික සම්‍යක් සමාධිය මෙසේ භාවිතවත් ම, මෙසේ බහුලීකෘතවත් ම, අභිඥයෙන් සාක්ෂාත් කටයුතු වූ යම් යම් ධර්මයකට විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා සිත නැඹුරු කෙරේ නම්, අභිඥ ප්‍රත්‍යය ඇතිවත් ම ඒ ඒ ධර්මයෙහි ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

ඉදින් හෙ "අනෙකවිධ ඍද්ධිවිධඥනය වළඳම් වයි - එකක්ව ම බහුප්‍රකාර වෙම් වයි ... බඹලොව දක්වා කයින් වසය වටම්ව"යි කැමැති වේ නම්, ඒ ඒ ඍද්ධිවිධයෙහි ම අභිඥයතන ඇතිවත් ම ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

හෙ ඉදින් "විශිෂ්ට වූ ... දිවසෝත්ධයින් දුර වූ ද ළඟ වූ ද, දිව්‍ය වූ ද මනුෂ්‍ය වූ ද, උභයශබ්දයන් අසම්ව"යි කැමැති වේ නම්, ඒ ඒ ශ්‍රවණයෙහි දිවසෝත්ධා ඇතිවත් ම ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

හෙ ඉදින් "පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිත සිය සිතින් පිරිසිඳ දන්නෙම් වයි- සරාග වූ හෝ චිත්තය සරාග චිත්තය යි දන්නෙම් වයි ... අවිමුක්ත වූ හෝ චිත්තය අවිමුක්ත චිත්තය යි දන්නෙම්ව"යි ... කැමැති වේ නම්, පරචිත්තඥනය ඇතිවත් ම ඒ ඒ චිත්ත ඥනයෙහි ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

හෙ ඉදින් "අනෙකවිධ පූර්වේනිවාසය සිහි කෙරෙම්ව යි- එනම්: එක් දූයකුදු දෙදූයකුදු .. මෙසේ ආකාර සහිත උද්දෙස සහිත අනෙකවිධ පූර්වේනිවාසය සිහි කෙරෙම්ව"යි කැමැති වේ නම්, පූර්වේනිවාසඥනය ඇතිවත් ම ඒ ඒ නිවාසයෙහි ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

හෙ ඉදින් "මිනිසැස ඉක්ම සිටි පිරිසිදු දිවැසින් ... කම් වූ පරිදි මිය යන සත්ත්වයන් දනිම්ව"යි කැමැති වේ නම්, දිව්‍යචක්ෂුර්ඥනය ඇතිවත් ම ඒ ඒ ඥනාඞ්ගයෙහි ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

හෙ ඉදින් "ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය (අර්හත්ඵල සම්ප්‍රයුක්තසමාධිය) ප්‍රඥවිමුක්තිය (අර්හත්ඵල සම්ප්‍රයුක්තප්‍රඥව) ඉහාත්මයෙහි ම තමා විසින් විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට සමවැදී වෙසෙම්ව"යි කැමැති වේ නම්, ප්‍රත්‍යය ඇතිවත් ම ඒ ඒ විමුක්තියෙහි ප්‍රත්‍යක්ෂභාවයට පැමිණේ.

## 5. 1. 3. 9.

### [ චඞ්කමානිසංසසුත්තං ]

29. පඤ්චිමෙ භික්ඛවෙ චඞ්කමෙ ආනිසංසා. කතමෙ පඤ්ච?

අද්ධානක්ඛමො හොති. පධානක්ඛමො හොති. අප්පාබාධො හොති. අසිතපීතඛායිතසායිතං සම්මා පරිනාමං ගච්ඡති. චඞ්කමාධිගතො සමාධි චිරට්ඨිතිකො හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච චඞ්කමෙ ආනිසංසාති.

## 5. 1. 3. 10.

### [ නාගිතසුත්තං ]

30. එවං මෙ සුත්තං: එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන ඉච්ඡානඞ්ගලං නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. තත්‍ර සුදං භගවා ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ.

අස්සොසුං ඛො ඉච්ඡානඞ්ගලකා[2] බ්‍රාහ්මණගහපතිකා "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො ඉච්ඡානඞ්ගලං අනුප්පත්තො ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ.-

"තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති."-

"සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති.

අථ ඛො ඉච්ඡානඞ්ගලකා බ්‍රාහ්මණගහපතිකා තස්සා රත්තියා අච්චයෙන පහූතං ඛාදනීයං භොජනීයං ආදාය යෙන ඉච්ඡානඞ්ගලවනසණ්ඩො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා බහිද්වාරකොට්ඨකෙ අට්ඨංසු උච්චාසද්දා මහාසද්දා.

---

1. අසිතං පීතං ඛායිතං සායිතං - මජසං, සයා' 2. ඉච්ඡානඞ්ගලිකා - සීමු.
3. සයාමපොත්ථකෙ න දිස්සති.

## 5. 1. 3. 9.

### [ චඞ්කමානිසංස සූත්‍රය ]

මහණෙනි, චංක්‍රමයෙහි මේ අනුසස්හු පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

අධ්වන්ගමන් සැහිය හැකි වෙයි. ප්‍රධන්වීර්යයට ක්‍ෂම වෙයි. අල්පාබාධ වෙයි. අසිතය, පීතය. ඛාදිතය හා සායිතය සම්‍යක්පරිණාමයට යෙයි. චංක්‍රමාධිෂ්ඨානයෙන් අධිගත සමාධිය චිරස්ථිතික වෙයි.

මහණෙනි, මොහු චංක්‍රමයෙහි පඤ්චානිසංස වෙතියි.

## 5. 1. 3. 10.

### [ නාගිත සූත්‍රය ]

30. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොශල ජනපදයෙහි චාරිකා කරණ සේක් මහත් භික්සඟුන් හා ඉච්ඡානඞ්ගල නම් කොශලයන්ගේ බ්‍රාහමණ ග්‍රාමයට වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ එ ඉච්ඡානඞ්ගලයෙහි වූ ඉච්ඡානඞ්ගල වන ලැහැබ්හි වැඩ වසන සේක.

ඉච්ඡානඞ්ගලයෙහි වාසය කරණ බ්‍රාහමණ ගෘහපතිහු "ශාක්‍යපුත්‍ර ශ්‍රමණ භවත් ගෞතමයෝ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූවාහු ඉච්ඡානඞ්ගලයට ක්‍රමයෙන් ප්‍රාප්තවූවාහු ඉච්ඡානඞ්ගලයෙහි ඉච්ඡානඞ්ගල වන ලැහැබ්හි විහරණ කෙරෙති"යි-

"ඒ භාග්‍යවත්හු මෙ කරුණෙනුදු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තර පුරුෂදම්‍යසාරථිහ, දෙවමනුෂ්‍යයනට ශාස්තෘයහ, බුද්ධයහ, භගවත්හ" යි ඒ භගවත් ගෞතමයන්ගේ මෙබඳු කල්‍යාණකීර්තිඝොෂයෙක් උස්ව නැංගේය. ඔහු දෙවියන් සහිත මරුන් සහිත බ්‍රහ්මයන් සහිත ලොකය, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව තමන් විසින් විශිෂ්ටඥානයෙන් දැන සාක්‍ෂාත් කොට දෙසන්නාහ.-

"ඔහු ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්‍යවසානකල්‍යාණ කොට සාර්ථ කොට සව්‍යඤ්ජන කොට කෙවල පරිපූර්ණ කොට පරිශුද්ධ කොට දහම් දෙසති. (එසේ දෙසමින් ශාසනමාර්ග) බ්‍රහ්මචර්‍යය ප්‍රකට කෙරෙති. එබඳු අරහතුන්ගේ දර්ශනය මනා වේ යයි" ඇසූහ.

ඉක්බිති ඉච්ඡානඞ්ගලවැසි බ්‍රාහමණගෘහපතිහු එ රැය ඇවෑමෙන් බොහෝ ඛාද්‍ය භොජ්‍යයන් රැගෙණ ඉච්ඡානඞ්ගලවනෂණ්ඩයට එළඹියහ. එළඹ බිහිදෙර කොට්ඨයෙහි උස්හඬ මහහඬ ඇත්තාහු සිටගත්හ.

තෙන ඛො පන සමයෙන ආයස්මා **නාගිතො** භගවතො උපට්ඨාකො හොති. අථ ඛො භගවා ආයස්මන්තං නාගිතං ආමන්තෙසි: කෙ පනෙතෙ[1] නාගිත උච්චාසද්දා මහාසද්දා කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙති?[2] "එතෙ භන්තෙ ඉච්ඡානඞ්ගලිකා බ්‍රාහ්මණගහපතිකා පහුතං ඛාදනීයං භොජනීයං ආදාය බහිද්වාරකොට්ඨකෙ ඨිතා භගවන්තං යෙව උද්දිස්ස භික්ඛුසඞ්ඝඤ්චා"ති.

මාහං නාගිත යසෙන සමාගමො,[3] මා ච මයා යසො. යො ඛො නාගිත නයිමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්ස අකිච්ඡලාභී අකසිරලාභී, යස්සාහං නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අකිච්ඡලාභී අකරසිරලාභි, සො තං මීළ්හසුඛං[4] මිද්ධසුඛං ලාභසක්කාරසිලොකසුඛං සාදියෙය්‍යාති.

"අධිවාසෙතු'දානි භන්තෙ භගවා, අධිවාසෙතු සුගතො. අධිවාසනකාලො'දානි භන්තෙ භගවතො. යෙන යෙනෙව'දානි භන්තෙ භගවා ගමිස්සති, තන්නින්නාව භවිස්සන්ති බ්‍රාහ්මණ ගහපතිකා නෙගමා චෙව ජානපදා ච.

සෙය්‍යථාපි භන්තෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ යථානින්නං උදකානි පවත්තන්ති, එවමෙව ඛො භන්තෙ යෙන යෙනෙව'දානි භගවා ගමිස්සති, තන්නින්නාව භවිස්සන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමා චෙව ජානපදා ච තං කිස්ස හෙතු? තථා හි භන්තෙ භගවතො සීලපඤ්ඤාණ''න්ති.

මාහං නාගිත යසෙන සමාගමො,[3] මා ච මයා යසො. යො ඛො නාගිත නයිමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්ස අකිච්ඡලාභී අකසිරලාභී, යස්සාහං නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභි, සො තං[4] මීළ්හසුඛං මිද්ධසුඛං ලාභසක්කාරසිලොකසුඛං සාදියෙය්‍ය. අසිතපීතඛායිතසායිතස්ස ඛො නාගිත උච්චාරපස්සාවො. එසො තස්ස නිස්සන්දො.

1. කො පන තෙ - ස්‍යා, කෙ පන ඛො - මජ්සං.
2 විලොපන්තීති - ස්‍යා, සීමු.
3. සමාගමං, සීමු. මජ්සං.
4. යො තං මීළ්හසුඛං - මජ්සං. ස්‍යා.

එ සමයෙහි ආයුෂ්මත් නාගිත තෙරණුවෝ භාග්‍යවත්හුගේ උපස්ථායක වෙත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂමත් නාගිත තෙරුන් ඇමතූසේක: ''නාගිතයෙනි, මත්ස්‍ය විලොපයෙහි (විකුණන තැන) කෙවට්ටියන් බඳු උස් හඬ ඇති මහ හඬ ඇති ඔහු කවරහ?''යි. ''වහන්ස, තෙල ඉච්ඡානඞ්ගල වාසී බ්‍රාහමණ ගෘහපතිහු බොහෝ ඛාද්‍යභොජ්‍ය රැගෙණවුත් භාග්‍යවතුන් වහන්සේ ද භික්ෂුසඞ්ඝයා ද උදෙසා බිහිදොර කොටුයෙහි සිටියාහු ය''යි.

නාගිතයෙනි, මම යශස් හා සමාගත නො වෙම්වා. යශස් ද මා හා සමාගත නොවේවා. නාගිතයෙනි, මම යම් නෙක්ඛම්මසුඛයක් පවිවෙක සුඛයක් උපසමසුඛයක් සම්බොධසුඛයක් කැමැති සේ ලබන සුලු වෙම් නම්, නිදුක් සේ ලබන සුලු වෙම් නම්, විපුල කොට ලබන සුලු වෙම් නම්, (එසේ මා ලබන) මේ නෙක්ඛම්මසුඛය පවිවෙකසුඛය උපසමසුඛය සම්බොධසුඛය යමෙක් කැමැති සේ ලබන සුලු නොවී නම්, නිදුක්සේ ලබන සුලු නොවී නම්, විපුල කොට ලබන සුලු නොවී නම්, හෙතෙම එ අශුචිසුඛය, නිද්‍රාසුඛය, ලාභසත්කාරයෙන් හා වර්ණභණනයෙන් උපන් සුඛය ඉවසන්නේය.

''වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ ඉවසන සේක්වා, සුගතයන් වහන්සේ ඉවසන සේක්වා. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේට ඉවසන කාලයයි. වහන්ස, යම් ම දිගෙක භාග්‍යවතුන් වහන්සේ වඩනා සේක් නම්, බමුණන් හා ගැහැවිහුදු නියම්ගම් වැස්සන් හා දනවුවැසියෝ ද එදිගට නැඹුරු වූවාහු ම වෙති.

වහන්ස, යම් පරිදි මහ පොද ඇති වට වස්නා කල්හි නිම්නභූමිය අනුව ම උදකයෝ වටනාහු ද, වහන්ස, එපරිදි ම යම් ම දිගෙක්හි භාග්‍යවතුන් වහන්සේ වඩනා සේක් නම්, බමුණුගෙහෙවියෝ ද නියම්ගම්දනවුවැස්සෝ ද එදිගට නැඹුරුවන්නාහ. එ කවර හෙයින යත්: වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ශිලය හා ඥානය එබඳු ම (ජනප්‍රිය වනු ම) බැවිනි.

නාගිතයෙනි, මම් යශස හා නහමක් සමාගත යෙම්වා, යශස් ද මා හා නහමක් සමාගත වේවා. නාගිතයෙනි, මම් යම් ම නෛෂ්ක්‍රම්‍ය සුඛයක් ප්‍රවිවෙක සුඛයක් ව්‍යුපශම සුඛයක් සම්බොධසුඛයක් කැමැති සේ ලබන සුල්ලෙම්, නිදුකින් ලබන සුල්ලෙම්, විපුලසේ ලබන සුල්ලෙම් වෙම් ද, යමෙක් මේ නෛෂ්ක්‍රම්‍ය සුඛය, ප්‍රවිවෙක සුඛය, ව්‍යුපශමසුඛය, සම්බොධසුඛය කැමැතිසේ නොලබන සුලුයේ, නිදුකින් නොලබන සුලුයේ විපුලසේ නොලබන සුලුයේ වේ නම්, හෙ ඒ අපවිත්‍ර සුඛය, නිද්‍රාසුඛය, ලාභ සත්කාරයෙන් හා වර්ණභණයෙන් උපදනා සුඛය ඉවසන්නේය. නාගිතයෙනි, අසිත, පීත, ඛායිත සායිතයාගේ වනාහි මහවටත් සුලුවටත් මලමූ) ම වෙයි. තෙල උහුගේ නිෂ්‍යන්ද (ඵලය) යි.

පියානං ඛො නාගිත විපරිනාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. එසො තස්ස නිස්සන්දො.

අසුභනිමිත්තානුයොගං අනුයුත්තස්ස ඛො නාගිත සුභනිමිත්තෙ[1] පාටික්කූල්‍යතා[2] සණ්ඨාති. එසො තස්ස නිස්සන්දො.

ඡසු[3] ඛො නාගිත ඵස්සායතනෙසු අනිච්චානුපස්සිනො විහරතො ඵස්සෙ පාටික්කූල්‍යතා සණ්ඨාති. එසො තස්ස නිස්සන්දො.

පඤ්චසු ඛො නාගිත උපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සිනො විහරතො උපාදානෙ පාටික්කූල්‍යතා සණ්ඨාති. එසො තස්ස නිස්සන්දොති.

**පඤ්චඞ්ගිකවග්ගො තතියො.**

**තස්සුද්දානං:**

ද්වෙගාරවූපක්කිලෙසො දුස්සීලානුග්ගහෙන ච
විමුත්තිසමාධිපඤ්චඞ්ගිකා චඞ්කමො නාගිතෙන චාති

---

1. සුභනිමිත්තෙන - සීමු.
2. පාටිකූල්‍යතා - මජසං. පටිකූල්‍යතා - සීමු.
3. ඡසු - මජසං.

නාගිතයෙනි, ප්‍රියජනයන්ගේ විපරිණාම අන්‍යථාභාවයෙන් ශොක, පරිදෙව, දුඃඛ, දෞර්මනස්‍ය, දුඃඛඋපායාසයෝ උපදනාහ. තෙල ඒ ප්‍රියභාවයාගේ නිෂ්‍යන්දය වේ.

නාගිතයෙනි, අශුභනිමිත්තානුයෝගයෙහි අනුයුක්තයාහට (ඉෂ්ටාලම්බන සඞ්ඛ්‍යාත) ශුභ නිමිත්තයෙහි පිළිකුල්බව පිහිටනේ ය. තෙල ඒ අශුභනිමිත්තානුයෝගයාගේ නිෂ්පත්තිය වෙයි.

නාගිතයෙනි, සවැදෑරුම් ස්පර්ශායතනයෙහි අනිත්‍යානුදර්ශීව වසනුවහට ස්පර්ශයෙහි පිළිකුල්බව පිහිටනේය. තෙල ඒ අනිත්‍යදර්ශනයාගේ නිෂ්පත්තියි.

නාගිතයෙනි, පඤ්චොපාදානස්කන්ධයෙහි උදුවිය නුවණින් බලමින් වසනුවහට උපාදානයෙහි පිළිකුල්බව සිටුනේය. තෙල උදයව්‍යයානුදර්ශන-යාගේ නිෂ්පත්ති යි.

**පඤ්චාඞ්ගික වර්ගය තුන්වැනියි.**

**එහි උද්දානය:**

අගාරව සූත්‍ර දෙකෙක, උපක්ක්ලෙස සූත්‍රය, දුස්සීල සූත්‍රය, අනුග්ගහ සූත්‍රය, විමුත්ති සූත්‍රය, සමාධි සූත්‍රය, පඤ්චඞ්ගික සූත්‍රය, චඞ්කම සූත්‍රය, නාගිත සූත්‍රය දැයි දශයෙක.

# 4. සුමනාවග්ගො

## 5. 1. 4. 1.

### [ සුමනාසුත්තං ]

31. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථ-පිණ්ඩිකස්ස ආරාමෙ.* අථ ඛො සුමනා රාජකුමාරී පඤ්චහි රථසතෙහි පඤ්චහි[1] රාජකුමාරිසතෙහි පරිවුතා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො සුමනා රාජකුමාරී භගවන්තං එතදවොච:

ඉධස්සු භන්තෙ භගවතො ද්වෙ සාවකා සමසද්ධා සමසීලා සමපඤ්ඤා, එකො දායකො එකො අදායකො, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යුං, දෙවභූතානම්පන තෙසං භන්තෙ සියා විසෙසො සියා නානාකරණන්ති? සියා සුමනෙ'ති භගවා අවොච.

යො සො සුමනෙ දායකො, සො අමුං අදායකං දෙවභූතො සමානො පඤ්චහි ඨානෙහි අධිගණ්හාති: දිබ්බෙන ආයුනා, දිබ්බෙන වණ්ණෙන, දිබ්බෙන සුඛෙන, දිබ්බෙන යසෙන, දිබ්බෙන ආධිපතෙය්‍යෙන.[2] යො සො සුමනෙ දායකො, සො අමුං අදායකං දෙවභූතො සමානො ඉමෙහි පඤ්චහි ඨානෙහි අධිගණ්හාති.[3]

සචෙ පන තෙ භන්තෙ තතො චුතා ඉත්ථත්තං ආගච්ඡන්ති, මනුස්ස-භූතානං පන තෙසං භන්තෙ සියා විසෙසො, සියා නානාකරණන්ති? සියා සුමනෙති භගවා අවොච.

යො සො සුමනෙ දායකො, සො අමුං අදායකං මනුස්සභූතො සමානො පඤ්චහි ඨානෙහි අධිගණ්හාති: මානුසකෙන[4] ආයුනා, මානුසකෙන වණ්ණෙන, මානුසකෙන සුඛෙන, මානුසකෙන යසෙන, මානුසකෙන ආධිපතෙය්‍යෙන. යො සො සුමනෙ දායකො, සො අමුං අදායකං මනුස්සභූතො සමානො ඉමෙහි පඤ්චහි ඨානෙහි අධිගණ්හාති.

සචෙ පන තෙ භන්තෙ උභො අගාරස්මා අනගාරියං පබ්බජන්ති, පබ්බ-ජිතානං පන තෙසං[5] භන්තෙ සියා විසෙසො සියා නානාකරණන්ති? සියා සුමනෙති භගවා අවොච.

යො සො සුමනෙ දායකො, සො අමුං අදායකං පබ්බජිතො සමානො පඤ්චහි ඨානෙහි අධිගණ්හාති: යාචිතො'ව බහුලං චීවරං පරිභුඤ්ජති අප්පං අයාචිතො. යාචිතොව බහුලං පිණ්ඩපාතං පරිභුඤ්ජති, අප්පං අයාචිතො. යාචිතො'ව බහුලං සෙනාසනං පරිභුඤ්ජති, අප්පං අයාචිතො යාචිතො'ව බහුලං ගිලාන පච්චය භෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජති, අප්පං අයාචිතො.-

---

* ස්‍යාම පොත්හි අයං පාඨො නත්ථි; එකං සමයං -පෙ- මජ්ඣං.

1. පඤ්චහිච - ස්‍යා. 2. අධිපතෙය්‍යෙන - ස්‍යා 3 අධිගණ්හාතීති - ස්‍යා.
4. මානුස්සකෙන - සීමු 5. තෙසං - සීමු.

# 4. සුමනාවර්ගය

## 5. 1. 4. 1

## [සුමනාසූත්‍රය]

31. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහි අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි සුමනා රජ කුමරි පන්සියක් රියපිරිවරින් පන්සියක් රජකුමරි පිරිවරින් පරිවෘතව භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියා. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුනු. එකත් පසෙක හුන් සමන් කුමරි භාග්‍යවතුන් වහන්සේට මෙසේ කරුණු සැලකළා:

වහන්ස, මෙ සස්නෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ දෙදෙනෙක් ශ්‍රද්ධායෙන් සමයහ. ශීලයෙන් සමයහ. ප්‍රඥයෙන් සමයහ. එකෙක් දායකය. එකෙක් අදායකය. ඔහු කාබුත්මරණින් මතු මනා ගති ඇති ස්වර්ගලොකයට පැමිණෙති. වහන්ස, දෙව් වූ (දායක අදායක වන) ඔවුන්ගේ විශෙෂයෙක් වන්නේ ද වෙනස් කරුණෙක් ඇත් ද හෝ?යි. “ඇත, සුමනාවෙනි”යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

සුමනාවෙනි, යම් දායකයෙක් වේ නම්, හේ දෙව්වූයේම අසෝ අදායකයා(දන් නො දෙන්නා) දිව්‍ය ආයුෂයෙන, දිව්‍යවර්ණයෙන, දිව්‍යසුඛයෙන දිව්‍යයශසින, දිව්‍ය ආධිපත්‍ය (අධිපතිභාව) යෙනැයි කරුණු පසෙකින් අභිභවන්නේ (යටපත් කරන්නේ)ය. සුමනාවෙනි, යම් දායකයෙක් (දන් දෙන්නෙක්) වේ නම්, හේ දෙව් වූයේ ම මෙසේ දන් නො දෙනහු මෙ කරුණු පසින් අභිභවන්නේය යි.

වහන්ස, ඉදින් ඔහු එයින් සැව මේ මනුෂ්‍යත්වයට එත් නම්, මනුෂ්‍යවූ උන්ගේ විශෙෂයෙක් වන්නේ යැ හෝ වෙනස් කරුණෙක් වන්නේය හෝ?යි. “වන්නේය, සුමනාවෙනි”යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

සුමනාවෙනි, යම් දායකයෙක් වේ නම්, හේ මනුෂ්‍ය වූයේ ම මානුෂක ආයුෂයෙන, මානුෂකවූ වර්ණයෙන, මානුෂකවූ සුඛයෙන, මානුෂකවූ යශසින, මානුෂකවූ ආධිපත්‍යයෙනැයි කරුණු පසෙකින් මෙසේ අදායකයා මැඩගෙණ සිටුනේය. සුමනාවෙනි, යම් දායකයෙක් වේ නම්, හේ මනුෂ්‍ය වූයේ ම මේ කරුණු පසින් මෙසේ අදායකයා මැඩගෙණ සිටුනේය.

වහන්ස, ඉදින් ඒ දෙදෙන ගිහිගෙන් නික්ම ශාසනයට වදිත් නම් වහන්ස, පැවිදි වූ ඔවුන්ගේ විශෙෂයෙක් වන්නේය, වෙනස් කරුණෙක් වන්නේය හෝ?යි. “වන්නේ ය, සුමනාවෙනි”යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

සුමනාවෙනි, යම් දායකයෙක් වේ නම්, හේ පැවිදි වූයේ ම මෙසේ අදායකයා කරුණු පසෙකින් මැඩගෙණ සිටුනේය. යදනා ලදුයේම (අනුන්ගේ පැවරීමෙන් ම) බහුල වශයෙන් චීවර පරිභොග කරන්නේය, නොයදනා ලදුයේ අල්ප කොට පරිභොග කරන්නේ ය. යදනා ලදුයේ ම බහුල වශයෙන් පිඬුවා වළඳන්නේය, නොයදනා ලදුයේ අල්පවශයෙනි. යදනා ලදුයේ ම බහුල විසින් ශයනාසන වළඳ කෙරෙයි, නො යදනා ලදුයේ අල්ප විසිනි වළඳනේ ය. යදනා ලදුයේ ම බෙහෙවින් ගිලන්පස බෙහෙසත් පිරිකර වළඳන්නේය, නොයදනා ලදුයේ අල්ප විසිනි.

යෙහි ඛො පන සබ්‍රහ්මචාරීහි සද්ධිං විහරති, ත්‍යාස්ස[1] මනාපෙනෙව බහුලං කායකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන, මනාපෙනෙව බහුලං වචීකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපෙනෙව[2] බහුලං මනොකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපං යෙව[3] උපහාරං උපහරන්ති, අප්පං අමනාපං. යො සො සුමනෙ දායකො, සො අමුං අදායකං පබ්බජිතො සමානො ඉමෙහි පඤ්චහි ඨානෙහි අධිගණ්හාති.[4]

සචෙ පන තෙ භන්තෙ උභො අරහත්තං පාපුණන්ති, අරහත්තප්පත්තානං පන තෙසං භන්තෙ සියා විසෙසො සියා නානාකරණන්ති?

එත්ථ ඛො පනෙසාහං සුමනෙ න කිඤ්චි නානාකරණං වදාමි යදිදං විමුත්තියා විමුත්තින්ති.[5]

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ. යාවඤ්චිදං භන්තෙ අලමෙව දානානි දාතුං, අලං පුඤ්ඤානි කාතුං, යත්‍ර හි නාම දෙවභූතස්සපි උපකාරානි පුඤ්ඤානි, මනුස්සභූතස්සපි උපකාරානි පුඤ්ඤානි, පබ්බජිතස්සපි උපකාරානි පුඤ්ඤානීති.

එව මෙතං සුමනෙ, එවමෙතං සුමනෙ. අලං හි සුමනෙ දානානි දාතුං, අලං පුඤ්ඤානි කාතුං. දෙවභූතස්සපි උපකාරානි පුඤ්ඤානි. මනුස්සභූතස්සපි උපකාරානි පුඤ්ඤානි, පබ්බජිතස්සපි උපකාරානි පුඤ්ඤානීති. ඉදමවොච භගවා. ඉදං වත්වා[6] සුගතො අථාපරං එතදවොච සත්ථා:

1. යථාපි චන්දො විමලො ගච්ඡං ආකාසධාතුයා
සබ්බෙ තාරා ගණෙ ලොකෙ ආභාය අතිරොචති,

2. තථෙව සීලසම්පන්නො සද්ධො පුරිසපුග්ගලො
සබ්බෙ මච්ඡරිනො ලොකෙ චාගෙන අතිරොචති.

3. යථාපි මෙඝො ථනයං විජ්ජුමාලී සතක්කකු
ථලං නින්නං ච පූරෙති අභිවස්සං වසුන්ධරං,

4. එවං දස්සන සම්පන්නො සම්මා සම්බුද්ධසාවකො
මච්ඡරිං අධිගණ්හාති පඤ්චඨානෙහි පණ්ඩිතො:

5. ආයුනා යසසා චෙව වණ්ණෙන ච සුඛෙන ච
සවෙ භොග පරිබ්බූළ්හො[7] පෙච්ච සග්ගෙ පමොදතීති.[8]

---

1. තස්ස - සයා, මජසං. 2. මනාපෙන - සයා, 3. මනාපඤ්ඤෙව - සයා,
4. අධිගණ්හාතීති - මජසං, සයා, 5. විමුත්තන්ති - සයා
6. වත්වාන - මජසං, සයා, 7. පරිබ්‍රූළ්හො - මජසං. 8. සග්ගෙ ච මොදති - සීමු.

යම් සබ්‍රහ්මචාරීන් හා වෙසේ නම්, ඔහු (ඒ දායක පැවිද්දාට) මනාප වූ ම කායකර්මයෙන් බෙහෙවින් හැසිරෙත්. අමනාප කායකර්මයෙන් අල්ප විසිනි. මනාප වූ ම වාක්කර්මයෙන් බහුල විසින් හැසිරෙත්. අමනාපයෙන් අල්ප විසිනි. මනාප වූ ම මනඃ කර්මයෙන් බහුල කොට හැසිරෙත්. අමනාපයෙන් අල්ප විසිනි. මනාප වූ ම උපහාර එළවත්. අමනාප උපහාර අල්පවශයෙනි. සුමනාවෙනි, යම් දායකයෙක් වේ නම්, හේ පැවිදි වූයේ ම මේ පස්කරුණින් තෙල අදායක මහණ මැඩ සිටුනේ ය.

වහන්ස, ඉදින් ඔහු දෙදෙන අර්හත්වයට පැමිණෙත් නම්, අර්හත්වයට පත් ඔවුන්ගේ විශෙෂයෙක් වන්නේය, නානාකරණයෙක් වන්නේය හෝ? යි.

සුමනාවෙනි, මෙ විෂයෙහි මම උන්ගේ කිසිදු නානාකරුණක් නොවදාරමි. එනම්- (එකකුගේ) විමුක්තිය හා (අනෙකාගේ) විමුක්තිය යි. (අර්හත්වයෙහි වෙනෙසෙක් නොවේ ම ය.)

වහන්ස, අසිරිය, වහන්ස, අද්භූතයි. වහන්ස, දෙව්වූවහුට ද යම් ම පින් උපකාර වේ ද, මිනිස් වූවහුට ද යම් ම පින් උපකාර වේ ද, පැවිදි වූවහුට ද යම් ම පින් උපකාර වේද, එහෙයින් දන්දීම ඉතා නිසි ම ය. පින්කළ යුතු ම ය.

සුමනාවෙනි, තෙල එසේ මැයි. සුමනාවෙනි, තෙල එසේ මැ යි. සුමනාවෙනි, දන්දිය යුතු ම ය. සුමනාවෙනි, පින් කළ යුතු ම ය. දෙව්වූවහුට ද පින් උපකාර වෙයි, මනුෂ්‍යවූවහුට ද පින් උපකාර වෙයි. පැවිදි වූවහුට ද පින් උපකාර වෙයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ශාස්තෘ වූ සුගතයන් වහන්සේ මෙය වදාරා එක්බිති තදනන්‍යය (තෙල ගා) වදාළ සේක:

1. යම් සෙයින් නිර්මල චන්ද්‍රයා අහසින් යනුයේ ලොව හැම තරු කැලන් සිය එළියෙන් අභිභවා වොරදනේ වේ ද,

2. එසෙයින් සිල් සපන් සැදැහැති පුරුෂපුද්ගලයා ලොව හැම මසුරන් ත්‍යාගයෙන් අභිභවා වොරදනේ වේ.

3. යම් සෙයින් විදුලිමැලි ඇති, සියගණන් මේකුළු ඇති, ගිගිරිකරණ මෙඝය පෘථිවිය තෙමමින් ගොඩවළ පුරවාද,

4. එසෙයින් දර්ශන සම්පන්න(සොවන්)පණ්ඩිත සම්‍යක් සම්බුද්ධශ්‍රාවක පස්කරුණෙකින් මසුරහු අභිභවන්නේ වෙයි.

5. ආයුෂයෙන, යශසින, වර්ණයෙන, සුඛයෙනැයි (හේ මසුරා දනන්-නේය.) හෙ එකැතියෙන් දනාඪ්‍යභොගෛශ්‍වර්යයා විසින් (දන නමැති ජලෞඝය විසින් සුගතිය කරා) පමුණුවනු ලැබූයේ පරලොව ගොස් ස්වර්ගයෙහි ද සතුටු වෙයි.

## 5. 1. 4. 2.

### [ චුන්දීසුත්තං ]

32. එකං සමයං භගවා රාජගහෙ විහරති කලන්දකනිවාපෙ. අථ ඛො චුන්දී රාජකුමාරී පඤ්චහි රථසතෙහි පඤ්චහි ච කුමාරිසතෙහි පරිවුතා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො චුන්දී රාජකුමාරී භගවන්තං එතදවොච:

අම්හාකං භන්තෙ භාතා චුන්දො නාම රාජකුමාරො. සො එවමාහ: ''යදෙව සො හොති ඉත්ථී වා පුරිසො වා බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතො, පාණාතිපාතා පටිවිරතො, අදින්නාදානා පටිවිරතො, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො, මුසාවාදා පටිවිරතො, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො, සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං යෙව[1] උපපජ්ජති, නො දුග්ගතින්ති''.

සාහං භන්තෙ භගවන්තං පුච්ඡාමි: කථංරූපෙ නු ඛො[2] භන්තෙ සත්ථරි පසන්නො කායස්ස භෙදා පරම්මරණා සුගතිං යෙව උපපජ්ජති, නො දුග්ගතින්ති? සාහං භන්තෙ භගවන්තං පුච්ඡාමි: කථංරූපෙ නු ඛො[2] භන්තෙ ධම්මෙ පසන්නො -පෙ- කථංරූපෙ නු [2]ඛො භන්තෙ සඞ්ඝෙ පසන්නො -පෙ- කථංරූපෙසු සීලෙසු පරිපූරකාරී කායස්ස භෙදා පරම්මරණා සුගතිං යෙව[1] සග්ගං ලොකං උපපජ්ජති, නො දුග්ගතින්ති?

යාවතා චුන්දි සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මා සම්බුද්ධො. යෙ ඛො චුන්දී බුද්ධෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

යාවතා චුන්දි ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා විරාගො තෙසං අග්ගමක්ඛායති යදිදං මදනිම්මදනො පිපාසවිනයො[3] ආලයසමුග්ඝාතො වට්ටූපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. යෙ ඛො චුන්දි විරාගෙ ධම්මෙ පසන්නා. අග්ගෙ තෙ පසන්නා අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

යාවතා චුන්දි සඞ්ඝා වා ගණා වා තථාගතසාවකසංඝො තෙසං අග්ගමක්ඛායති යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා. එස භගවතො සාවකසංඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. යෙ ඛො චුන්දි සංඝෙ පසන්නා, අග්ගෙ තෙ පසස්න්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

---

1. සුගතිඤ්ඤෙව - සයා. 2 කථං රූපෙ ඛො - මජසං. 3. පිපාසාවිනයො සීමු.

## 5. 1. 4. 2.

## [ චුන්දි සූත්‍රය ]

32. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ සමීපයෙහි වූ කලන්දකනිවාප නම් වේළුවනයෙහි වැඩ වසන සේක. එකල චුන්දි රජකුමරි පන්සියක්රිය පිරිවරිනුදු පන්සියක් කුමරි පිරිවරිනුදු පිරිවැරුණී භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියා. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැද එකත් පසෙක හුනු. එකත්පසෙක හුන් චුන්දී රජකුමරි භාග්‍යවතුන් වහන්සේට තෙල කියාළා:

වහන්ස, අපගේ භ්‍රාතෘ වූ චුන්ද නම් රාජකුමාරයෙක් ඇත. හේ මෙසේ කියයි: "යම් ඒ ස්ත්‍රියක් වේ ව යි, පුරුෂයෙක් වේ ව යි, බුදුන් සරණ ගියේ, දහම් සරණ ගියේ, සඟුන් සරණ ගියේ, පණිවායෙන් දුරු වූයේ, අයිනාදනින් දුරු වූයේ, කාමයෙහි මිසහසරින් දුරු වූයේ, මුසවායෙන් දුරු වූයේ, මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ ද, හෙ කාබුන් මරණින් මතු සුගතියට ම එළඹේ. දුගතියට නොයේ ය" යි.

වහන්ස, තෙල මම් භාග්‍යවතුන් පුළුවුස්නෙමි. වහන්ස, කෙබඳු ශාස්තෘකෙනකුන් කෙරෙහි පහන් වූයේ කාබුන් මරණින් මතු සුගතියට ම එළඹෙන්නේ වේ ද, දුගතියට නොයන්නේ වේ ද? වහන්ස, කෙබඳු වූ ධර්මයෙක්හි පහන් වූයේ... වහන්ස, කෙබඳු සඟුන් කෙරෙහි පහන් වූයේ... වහන්ස, කෙබඳු සීලයෙහි පරිපූර්කාරී වූයේ කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට ම එළඹේ ද, දුගතියට නො යේ ද?

චුන්දියෙනි, අපදයෝ වෙත් ව යි, ද්විපදයෝ වෙත් ව යි, චතුෂ්පදයෝ වෙත් ව යි, බහුපදයෝ වෙත් ව යි, රූපීහු වෙත් ව යි, අරූපීහු වෙත් වයි, සංඥිහු වෙත් ව යි, අසංඥීහු වෙත් ව යි, නෛවසංඥීනාසංඥීහු වෙත් ව යි, යම්තාක් සත්ත්වයෝ වෙත් නම්, අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගතයෝ ඔවුනට අග්‍රයහ යි කියනු ලැබේ. චුන්දියෙනි, යම් කෙනෙක් බුදුන් කෙරෙහි පහන් වූවාහු නම්, ඔහු අග්‍රයා කෙරෙහි පහන්හ. අග්‍රයා කෙරෙහි පහන් වූවනට අග්‍ර විපාක වෙයි.

චුන්දියෙනි, සංස්කෘතයෝ වෙත් ව යි, අසංස්කෘතයෝ වෙත් ව යි, යම් තාක් ධර්මයෝ වෙත් නම්, විරාගය ඔවුනට අග්‍රය යි කියනු ලැබේ. එනම්: මදනිම්මදනය වූ පිපාසාවිනය වූ ආලයාගේ සමුග්ඝාතය වූ වර්තෝපච්ඡේදය වූ තෘෂ්ණාක්ෂය වූ විරාග වූ නිරොධ වූ නිර්වාණ ය යි. චුන්දියෙනි, යම් කෙනෙක් විරාගධර්මයෙහි පහන්හු ද, ඔහු අග්‍රයෙහි පහන්හ. අග්‍රයෙහි පහන් වූවනට අග්‍රවිපාක වෙයි.

චුන්දියෙනි, සඟහු වෙත් ව යි, ගණහු වෙත් ව යි, යම් තාක් සමූහ කෙනෙක් වෙත් නම්, තථාගතයන්ගේ ශ්‍රාවකසඞ්ඝයා ඔවුනට අග්‍රය යි කියනු ලැබේ. එනම්: චතුෂ්පුරුෂයුග්ම වූ අෂ්ටපුරුෂපුද්ගලයෝ යි. භගවත්හුගේ තෙල ශ්‍රාවකසඞ්ඝයා ගෙනවුත් දෙන දනට තිසි ය. ප්‍රාඝූර්ණ සත්කාරයට තිසි ය. දක්ෂිණාවට තිසි ය. අඤ්ජලිකරණයට තිසි ය. ලොකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි. චුන්දියෙනි, යම් කෙනෙක් සඞ්ඝයා කෙරෙහි පහන්හු ද, ඔහු අග්‍රයෙහි පහන්හ. අග්‍රයෙහි පහන් වූවනට අග්‍රවිපාක වෙයි.

යාවතා චුන්දි සීලානි, අරියකන්තානි[1] තෙසං අග්ගමක්ඛායති – යදිදං අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි. යෙ ඛො චුන්දි අරියකන්තෙසු සීලෙසු පරිපූරකාරිනො, අග්ගෙ තෙ පරිපූරකාරිනො. අග්ගෙ ඛො පන පරිපූරකාරීනං අග්ගො විපාකො හොතීති.

6. අග්ගතො වෙ පසන්නානං අග්ගං ධම්මං විජානතං
අග්ගෙ බුද්ධෙ පසන්නානං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ,

7. අග්ගෙ ධම්මෙ පසන්නානං විරාගූපසමෙ සුඛෙ
අග්ගෙ සංඝෙ පසන්නානං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ,

8. අග්ගස්මිං දානං දදතං අග්ගං පුඤ්ඤං පවඩ්ඪති
අග්ගං ආයු ච[2] වණ්ණො ච යසො කිත්ති සුඛං බලං.

9. අග්ගස්ස දාතා මෙධාවී අග්ගධම්මසමාහිතො
දෙවභූතො මනුස්සො වා අග්ගප්පත්තො පමොදතීති.

## 5. 1. 4. 3.

## [ උග්ගහසුත්තං ]

33. එකං සමයං භගවා භද්දියෙ[3] විහරති ජාතියා වනෙ. අථ ඛො උග්ගහො මෙණ්ඩකනත්තා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උග්ගහො මෙණ්ඩකනත්තා භගවන්තං එතදවොච:

අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය අත්තචතුත්ථො භත්තන්ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො උග්ගහො මෙණ්ඩකනත්තා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන උග්ගහස්ස මෙණ්ඩකනත්තුනො නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො උග්ගහො මෙණ්ඩකනත්තා භගවන්තං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි.

අථ ඛො උග්ගහො මෙණ්ඩකනත්තා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උග්ගහො මෙණ්ඩකනත්තා භගවන්තං එතදවොච:

---

1. අරියකන්තානි සීලානි - මජසං.
2. ආයුඤ්ච - සීමු.
3. භද්දිකෙ - අට්ඨකථා.

චුන්දියෙනි, යම් තාක් සිල් ඇත් නම්, ආර්‍ය්‍යයනට කාන්ත වූ (මාර්ගඵල-සම්ප්‍රයුක්ත වූ) සීලයෝ ඔවුනට අග්‍රහයි කියනු ලැබේ. එනම්: අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අශබල වූ අකල්මාෂ වූ භුජිස්‍ය වූ නුවණැතියන් විසින් පසස්නා ලද තෘෂ්ණා දෘෂ්ටීන් අපරාමෘෂ්ට වූ සමාධියට හිත පිණිස වූ සීලයෝ යි. චුන්දියෙනි, යම් කෙනෙක් ආර්‍ය්‍යකාන්තශීලයෙහි පරිපූරකාරී වෙත් නම්, ඔහු අග්‍රයෙහි පරිපූරකාරී වෙත්. අග්‍රයෙහි පරිපූරකාරීනට අග්‍රවිපාක වේ ය යි.

6. ඒකාන්තයෙන් (රත්නත්‍රය විෂයෙහි) අග්‍රභාවයෙන් පහන් වූ අග්‍ර ධර්මය (රත්නත්‍රයෙහි උත්තමස්වභාවය) දක්නාවුන්ට ද, අනුත්තරදක්ෂිණාර්හ වූ අග්‍ර බුදුරජුන් කෙරෙහි පහන් වූවනට ද (අග්‍රවිපාක වේ.)

7. විරාගයට හා උපශමයට හෙතු වූ, සංසාර දුඃඛක්‍ෂය භාවයෙන් සුඛ ඇති, අග්‍ර වූ ධර්මයෙහි පහන් වූවනට ද, අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වූ අග්‍රසඞ්ඝයා කෙරෙහි පහන් වූවනට ද (අග්‍රවිපාක වේ.)

8. අග්‍ර වූ රත්නත්‍රය විෂයයෙහි දන් දෙනුවනට අග්‍ර පුණ්‍යය වැඩෙ යි. අග්‍ර ආයුෂ ද වර්ණය ද යශස් (පිරිවර) ද කීර්තිය ද සුඛය ද බලය ද වැඩේ.

9. අග්‍ර වූ රත්නත්‍රයට (අග්‍ර වූ දෙයධර්මය) දෙන අග්‍රප්‍රසාදධර්මයෙහි මොනොවට පිහිටි නුවණැතියේ දෙව් වූයේ හෝ මිනිස් වූයේ හෝ අග්‍රභාවයට පැමිණියේ ප්‍රමුදිත වෙයි.

## 5. 1. 4. 3.

## [ උග්ගහ සූත්‍රය ]

33. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භද්දිය නගරයෙහි **ජාතියාවන** නම් ස්වයංජාත වෙනෙහි වැඩවසන සේක. එකල **මෙණ්ඩක** සිටුහුගේ මුනුබුරු **උග්ගහ** සිටු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හින. එකත්පස්ව හුන් මෙණ්ඩක සිටුහු මුනුබුරු උග්ගහ සිටු භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය:

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සෙට දවස් වියයුතු දන් පිණිස තමන් වහන්සේ සතර වන කොට ඇති සේක් මාගේ බත අධිවාසනා කරණ සේක්වා යි. භාග්‍යවතුන් වහන්සේ තූෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක. එකල්හි මෙණ්ඩකනප්තෘ උග්ගහ සිටු භාග්‍යවතුන් වහන්සේගේ අධිවාසනය දැන හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නැගී ගියේය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ රෑ ඇවෑමෙන් පෙරවරු වේලෙහි හැඳ පෙරව පා සිවුරු ගෙණ මෙණ්ඩකනප්තෘ උග්ගහ සිටුගේ නිවෙසනයට වැඩිසේක. වැඩ පැන් වූ අස්නෙහි වැඩ හුන්සේක. ඉක්බිති මෙණ්ඩකනප්තෘ උග්ගහ සිටු භාග්‍යවතුන් වහන්සේ ප්‍රණීත ඛාද්‍යභොජ්‍යයෙන් සියතින් සැතැප්පී ය, පැවරීය.

ඉන්පසු මෙණ්ඩකනප්තෘ උග්ගහ සිටු දන් වැළඳූ, පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති, භාග්‍යවතුන් වහන්සේ දැන එකත් පසෙක හින. එකත් පසෙක හුන් මෙණ්ඩකනප්තෘ උග්ගහ සිටු භාග්‍යවත්හට තෙල සැල කෙළේ ය:

ඉමා මෙ භන්තෙ කුමාරියො පතිකුලානි ගමිස්සන්ති. ඔවදතු තාසං භන්තෙ භගවා, අනුසාසතු තාසං භන්තෙ භගවා, යං තාසං අස්ස දීඝරත්තං හිතාය සුඛායාති.

අථ ඛො භගවා තා කුමාරියො එතදවොච: තස්මාතිහ කුමාරියො එවං සික්ඛිතබ්බං: යස්ස වො[1] මාතා පිතරො භත්තුනො දස්සන්ති අත්ථකාමා හිතෙසිනො අනුකම්පකා අනුකම්පං උපාදාය, තස්ස භවිස්සාම පුබ්බුට්ඨායිනියො පච්ඡානිපාතිනියො කිංකාරපටිස්සාවිනියො මනාපචාරිනියො පියවාදිනියොති. එවං හි වො කුමාරියො සික්ඛිතබ්බං.

තස්මාතිහ කුමාරියො එවං සික්ඛිතබ්බං: යෙ තෙ භත්තු ගරුනො භවිස්සන්ති මාතාති වා පිතාති වා සමණබ්‍රාහ්මණාති වා, තෙ සක්කරිස්සාම ගරුකරිස්සාම,[2] මානිස්සාම, පූජෙස්සාම, අබ්භාගතෙ ච ආසනොදකෙන පතිපූජෙස්සාමාති.[3] එවං හි වො කුමාරියො සික්ඛිතබ්බං.

තස්මාතිහ කුමාරියො එවං සික්ඛිතබ්බං: යෙ තෙ භත්තු අබ්භන්තරා කම්මන්තා උණ්ණාති වා කප්පාසාති වා, තත්ථ දක්ඛා භවිස්සාම අනලසා තත්‍රුපායාය විමංසාය සමන්නාගතා අලං කාතුං අලං සංවිධාතුන්ති එවං හි වො කුමාරියො සික්ඛිතබ්බං.

තස්මාතිහ කුමාරියො එවං සික්ඛිතබ්බං: යො සො භත්තු අබ්භන්තරො අන්තොජනො, දාසාතිවා පෙස්සාති වා කම්මකරාති වා, තෙසං කතඤ්ච කතතො ජානිස්සාම, අකතඤ්ච අකතතො ජානිස්සාම, ගිලානකානඤ්ච බලාබලං ජානිස්සාම, ඛාදනීයං භොජනීයං චස්ස පච්චයෙන විභජිස්සාමාති.[4] එවං හි වො කුමාරියො සික්ඛිතබ්බං.

තස්මාතිහ කුමාරියො එවං සික්ඛිතබ්බං: යං භත්තා ආහරිස්සති ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වා, තං ආරක්ඛෙන[5] ගුත්තියා සම්පාදෙස්සාම. තස්ස භවිස්සාම අධුත්තී අථෙනී අසොණ්ඩී අවිනාසිකායොති. එවං හි වො කුමාරියො සික්ඛිතබ්බං.

ඉමෙහි ඛො කුමාරියො පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා මනාපකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

10. යො නං භරති සබ්බදා නිච්චං ආතාපි උස්සුකො
සබ්බකාමහරං[6] පොසං භත්තාරං නාති මඤ්ඤති.

11. න චාපි සොත්ථි භත්තාරං ඉච්ඡාචාරෙන රොසයෙ[7]
භත්තු ච ගරුනො සබ්බෙ පටිපූජෙති පණ්ඩිතා.

12. උට්ඨාහිකා[8] අනලසා සඞ්ගහිතපරිජ්ජනා
භත්තු මනාපා[9] චරති සම්භතං අනුරක්ඛති.

13. යා එවං වත්තති නාරී භත්තුච්ඡන්දවසානුගා
මනාපා නාම තෙ දෙවා යත්ථ සා උපපජ්ජතීති.

---

1 යස්ස ඛො - සීමු. 2 ගරුං කරිස්සාම - මජසං

3. පටිපූජෙස්සාමාති - ස්‍යා, මජසං 4. පච්චයංසෙන විභජිස්සාමාති - ස්‍යා, සී

5. ආරක්ඛාය - සීමු. 6. සබ්බකාමකරං, සීමු.

7. ඉස්සාචාරෙන රොසයෙ - ස්‍යා, මජසං - ඉස්සාවාදෙන - PTS

8 උට්ඨායිකා - ස්‍යා, 9. භත්තුමනාපං - මජසං

වහන්ස, මාගේ මේ දූකුමරියෝ පතිකුලයට යන්නාහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඔවුනට ඔවා දෙන සේක්වා. වහන්ස, යම් සේ ඔවුනට දීර්ඝරාත්‍රයක් හිත සුව පිණිස පවත්නේ වේ නම්, භාග්‍යවතුන් වහන්සේ ඔවුනට එසේ අනුශාසනා කරණ සේක්වා.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එ කුමරියනට තෙල වදාළ සේක: කුමරියෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මෙන්නේ ය: ''වැඩ කැමැති හිත කැමැති අනුකම්පා ඇති මාපියෝ අනුකම්පා හේතුවෙන් යම් හිමියකුහට දක්වා දෙත් නම්, ඔහට පළමු නැඟී සිටුනා සුල්ලමෝ පසුව නින්දට යන සුල්ලමෝ කුම් කෙරෙම් දැ යි විමසා කරණ සුල්ලමෝ මනවඩන පරිදි හැසිරෙන සුල්ලමෝ ප්‍රියතෙපුල් බණන සුල්ලමෝ වම්හ''යි. කුමරියෙනි, තොප මෙසේ ම හික්මෙන්නේ ය

කුමරියෙනි, මෙහි මෙසේ හික්මෙන්නේ ය.: ''මව වේව යි, පියා වේව යි, මහණබමුණෝ වෙත්ව යි හනීහුගේ යම් ඒ ගුරුහු වෙත් නම්, ඔවුනට සත්කාර කරම්හ, ගුරුකාර කරම්හ, බුහුමන් කරම්හ, පුදම්හ, හමුවට පත් ඔවුන් අස්නෙනුදු පාදෝනා දියෙනුදු පුදම්හ''යි. කුමාරියෙනි, තොප මෙසේම හික්මෙන්නේ ය.

කුමරියෙනි, මෙ කරුණෙහි මෙසේ හික්මෙන්නේ ය: ''හනීහුගේ එළලොම් (ගෙතීම්) වේව යි, කපු (කැටීම) වේව යි, යම් ඒ අභ්‍යන්තර (ගෘහ) කර්මාන්ත කෙනෙක් වෙත් නම්, එ එ විෂයෙහි දක්‍ෂ වූවමෝ, අනලස් වූවමෝ එහි සංවිධානොපාය වූ විමසීමෙන් යුක්ත වූවමෝ, කරන්නට නිසි වූවමෝ, කරවන්නට නිසි වූවමෝ වම්හ''යි. කුමාරියෙනි, තොප මෙසේ ම හික්මෙන්නේ ය.

කුමරියෙනි, මෙ කරුණෙහි මෙසේ ම හික්මෙන්නේ ය: හනීහුගේ දස්හු වෙත්ව යි, ප්‍රේෂ්‍යයෝ (දූතයෝ) වෙත්ව යි, කම්කරුවෝ වෙත්ව යි- යම් ඒ අභ්‍යන්තර වූ ඇතුළත ජනයෝ වෙත් නම්, ඔවුන්ගේ කළ දැ කළ විසින් දනුම්හ, නො කළ දෑ නො කළවිසින් දනුම්හ, ගිලනුන්ගේ ද බල - අබල දනුම්හ. (උවටැන් කරම්හ.) ඒ අනොතාජනයාට ඛාද්‍යභොජ්‍යයනුදු උන් උන් ලදමනා කොටස් විසින් බෙදා දෙම්හ''යි. කුමරියෙනි, තොප මෙසේ ම හික්මෙන්නේ ය.

කුමරියෙනි, මෙහි මෙසේ හික්මෙන්නෝ ය: ''හනීතෙමේ ධන වේ වයි, ධාන්‍ය වේ ව යි, රිදී වේ ව යි, රන් වේ ව යි - එ යමක් ම ගෙණ එයි නම්, එය ආරක්‍ෂායෙන් ගොපනයෙන් සම්පාදනය කරම්හ, ඔහට ධූර්තී (පුරුෂ ධූර්තී, සුරා ධූර්තී) නො වම්හ, නො සෙර වම්හ, (රහසොඩ ආදීන්) සොඩ නො වම්හ, විනාශිකා නො වම්හ''යි. කුමරියෙනි, තොප මෙසේ ම හික්මෙන්නේ ය.

කුමරියෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්වාගත මාගම කාබුන් මරණින් මතු මනාපකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ.

10. යම් හිමියෙක් හැම කල්හි වීර්‍ය්‍ය ඇතියේ උත්සාහවත් වූයේ නිතර ඇය පුස්නේ වේ ද, හැම කැමති දැය ම ගෙණදෙන පුස්නා හනී වූ එ පුහුල් අතිමඤ්ඤනා විසින් (ඉක්ම) නො සිතන්නී ය.

11. කළණ එ ස්ත්‍රී ඊර්ෂ්‍යාචාරයෙන් (හිතුවා කිරීමෙන්) හනීහු කුපිත නො කරන්නී ය. නුවණැති ඕ හනීහුගේ වැඩිසිටි දනන් පුදන්නී ය.

12. පළමු මැ නැඟි සිටුනා සුලු වූවා, අනලස් වූවා, සඟත් පිරිවර දනන් ඇත්තී, හනීහට ම නවඩනුවට හැස්රෙයි. ඉපයූ දෑ රක්නී ය.

13. යම් ස්ත්‍රියක් මෙසේ පවත්නී සවාමියාගේ සඳවිසිය අනුව ගියා යම් දෙවන්කායෙක්හි ඕ උපදිනී වූ නම්, ඒ දෙවියෝ මනාපකායිකා නිම්මාණරතී) නම්හ.

## 5. 1. 4. 4

### [සීහසෙනාපතිසුත්තං

34. එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො **සීහො** සෙනාපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සීහො සෙනාපති භගවන්තං එතදවොච:

සක්කා නු ඛො භන්තෙ සන්දිට්ඨිකං දානඵලං පඤ්ඤපෙතුන්ති?

සක්කා සීහාති භගවා අවොච. දායකො සීහ දානපති බහුනො ජනස්ස පියො හොති මනාපො. යම්පි සීහ දායකො දානපති බහුනො ජනස්ස පියො හොති මනාපො, ඉදම්පි සන්දිට්ඨිකං දානඵලං.

පුනචපරං සීහ දායකං දානපතිං සන්තො සප්පුරිසා භජන්ති. යම්පි සීහ දායකං දානපතිං සන්තො සප්පුරිසා භජන්ති, ඉදම්පි සන්දිට්ඨිකං දානඵලං.

පුනචපරං සීහ දායකස්ස දානපතිනො කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. යම්පි සීහ දායකස්ස දානපතිනො කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, ඉදම්පි සන්දිට්ඨිකං දානඵලං.

පුනචපරං සීහ දායකො දානපති යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති: යදි ඛත්තියපරිසං, යදි බ්‍රාහ්මණපරිසං, යදි ගහපතිපරිසං, යදි සමණපරිසං, විසාරදෙව[1] උපසඞ්කමති අමඞ්කුභූතො. යම්පි සීහ දායකො දානපති යඤ්ඤදෙවපරිසං උපසඞ්කමති: යදි ඛත්තියපරිසං, යදි බ්‍රාහ්මණපරිසං, යදි ගහපති පරිසං, යදි සමණපරිසං, විසාරදෙව උපසඞ්කමති අමඞ්කුභූතො; ඉදම්පි සන්දිට්ඨිකං දානඵලං.

පුනචපරං සීහ දායකො දානපති කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. යම්පි සීහ දායකො දානපති කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති; ඉදං[2] සම්පරායිකං දානඵලන්ති.

එවං වුත්තෙ සීහො සෙනාපති භගවන්තං එතදවොච 'යානිමානි භන්තෙ භගවතා චත්තාරි සන්දිට්ඨිකානි දානඵලානි අක්ඛාතානි, නාහං එත්ථ භගවතො සද්ධාය ගච්ඡාමි. අහමෙපතානි ජානාමි. අහං භන්තෙ දායකො දානපති බහුනො ජනස්ස පියො මනාපො. අහං භන්තෙ දායකො දානපති, මං සන්තො සප්පුරිසා භජන්ති. අහං භන්තෙ දායකො දානපති, මය්හං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: සීහො සෙනාපති දායකො කාරකො සඞ්ඝුපට්ඨාකොති. අහං භන්තෙ දායකො දානපති, යඤ්ඤදෙව පරිසං උපසඞ්කමාමි: යදි ඛත්තියපරිසං, යදි බ්‍රාහ්මණපරිසං, යදි ගහපති පරිසං, යදි සමණපරිසං, විසාරදෙව උපසඞ්කමාමි අමඞ්කුභූතො. යානිමානි භන්තෙ භගවතා චත්තාරි සන්දිට්ඨිකානි දානඵලානි අක්ඛාතානි, නාහං එත්ථ භගවතො සද්ධාය ගච්ඡාමි. අහමෙපතානි ජානාමි. යඤ්ච ඛො මං භන්තෙ භගවා එවමාහ: 'දායකො සීහ දානපති කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතී'ති එතාහං න ජානාමි. එත්ථ ච පනාහං භගවතො සද්ධාය ගච්ඡාමී''ති.

---

1. විසාරදො - මජසං. 2. ඉදම්පි - සයා

## 5. 1. 4. 4.

### [ සීහසෙනාපති සූත්‍රය ]

34. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලාමහනුවර අබියෙස්හි මහාවනයෙහි වූ කූටාගාරශාලායෙහි (කැණිමඬුලු යොදා කළ පහයෙහි) වසන සේක. එකල්හි සීහ සෙනාපති භාග්‍යවතුන්වහන්සේ කරා එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් සීහ සෙනාපති භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කෙළේ ය:

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සාන්දෘෂ්ටික (තමන් විසින් ම දක්ක යුතු) දානඵල පණවන්නට හැකිවන සේක් ද හෝ?"යි.

සීහය, 'හැක්කම්හ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. සීහය, දානපති දායකයා බොහෝ දෙනාට ප්‍රිය-මනාප වෙයි. සීහය, යම් හෙයෙකින් දානපති දායකයා බොහෝ දෙනාට ප්‍රිය-මනාප වේ නම්, මෙ ද සාන්දෘෂ්ටික දානඵල යි.

තවද සීහය, ශාන්ත සත්පුරුෂයෝ දානපති දායකයා ඇසුරු කෙරෙත්. සීහය, යම් හෙයෙකින් ශාන්ත සත්පුරුෂයෝ දානපති දායකයා ඇසුරු කෙරෙත් ද, මෙ ද සාන්දෘෂ්ටික දානඵලයි.

තවද සීහය, දානපති දායකයාගේ කල්‍යාණකීර්තිඝොෂ උස්ව නැගේ. සීහය, යම් හෙයෙකින් දානපති දායකයාගේ කල්‍යාණකීර්තිඝොෂ උස්ව නැගේ ද, මෙ ද සාන්දෘෂ්ටික දානඵල යි.

තවද සීහය, දානපති දායකයා ක්‍ෂත්‍රිය පර්ෂදකට වේව යි, බ්‍රාහ්මණ පර්ෂදකට වේ ව යි, ගෘහපති පර්ෂදකට වේ වයි, ශ්‍රමණපර්ෂදකට වේ ව යි, යම් ම පිරිසකට එළඹේ නම්, විශාරදව ම නො මකුව ම එළඹෙයි. සීහය, යම් හෙයෙකින් දානපති දායකයා ක්‍ෂත්‍රියපර්ෂදකට වේව යි, බ්‍රාහ්මණපර්ෂදකට වේ ව යි, ගෘහපති පර්ෂදකට වේ ව යි, ශ්‍රමණපර්ෂදකට වේ ව යි, යම් ම පිරිසකට එළඹේ නම්, විශාරදව ම තෙද සහිතව ම එළඹෙයි. මෙ ද සාන්දෘෂ්ටික දානඵල යි.

තවද සීහය, දානපති දායකයා කාබුන් මරණින් මතු සුගතිසඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණෙයි. සීහය, යම් හෙයෙකින් දානපති දායක කාබුන් මරණින් මතු සුගතිසඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණෙන්නේ වේද, මෙ සාම්පරායික (පරලොව) දානඵල යි.

මෙසේ වදාළ කල්හි සීහ සෙනාපති භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කෙළේ ය: "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ සතර සාන්දෘෂ්ටිකදානඵල කෙනෙක් වදාරණ ලදහු නම්, එහි මම භගවද්ගත ශ්‍රද්ධායෙන් නො එමි. (ශ්‍රද්ධායෙන් ම නො අදහමි.) මම ද තෙල (ප්‍රත්‍යක්‍ෂයෙන්) දනිමි. වහන්ස, මම දානපති දායකයෙමි. බොහෝ දෙනාහට ප්‍රියමනාපයෙමි. වහන්ස, මම දානපති දායකයෙමි. සත්පුරුෂයෝ මා භජනය කෙරෙත්. වහන්ස, මම දානපති දායකයෙමි. මාගේ කල්‍යාණකීර්ති ශබ්දය උස්ව නැඟිත: 'සිංහසේනාපති දායකය, කාරකය, සඞ්ඝොපස්ථායකයැ'යි වහන්ස, මම දානපති දායකයෙමි ක්‍ෂත්‍රියපර්ෂදකට වේ ව යි, බ්‍රාහ්මණපර්ෂදකට වේ වයි, ගෘහපති පර්ෂදකට වේ ව යි, ශ්‍රමණ පර්ෂදකට වේ ව යි, යම් ම පිරිසකට එළඹෙන්නෙම් නම්, විසාරදයෙම් ම තෙදැතියෙම් ම එළඹෙමි. වහන්ස, භගවත්හු විසින් යම් බඳු මේ සතර සාන්දෘෂ්ටික දානඵල කෙනෙක් වදාරණ ලද්දහු නම්, එහි මම භගවද්ගත සැදැහැයෙන් නො යෙමි. තෙල කරුණු මම ද දනිමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ 'සීහය, දානපති දායකයා කාබුන් මරණින් මතු සුගතිසඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණේ ය' යි මෙසේ යමක් වදාළ සේක් නම්, තෙල කරුණ මම නො දනිමි. මෙ කරුණෙහි මම භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ ශ්‍රද්ධායෙන් යෙමි (අදහමි)" යි.

එවමෙතං සීහ, එව මෙතං සීහ, දායකො[1] දානපති කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

14. දදං පියො හොති භජන්ති නං බහූ කිත්තිඤ්ච පප්පොති යසොභිවඩ්ඪති,[2]
අමඞ්කුභූතො පරිසං විගාහති විසාරදො හොති නරො අමච්ඡරී.

15. තස්මා හි දානානි දදන්ති පණ්ඩිතා විනෙය්‍ය මච්ඡෙරමලං සුඛෙසිනො,
තෙ දීඝරත්තං තිදිවෙ පතිට්ඨිතා දෙවානං සහබ්‍යතං ගතා රමන්ති.[3]

16. කතාවාසා කතකුසලා තතො චුතා[4] සයංපභා අනුවිචරන්ති නන්දනං,[5]
තෙ තත්ථ නන්දන්ති රමන්ති මොදරෙ සමප්පිතා කාමගුණෙහි පඤ්චහි.
කත්වාන වාක්‍යං අසිතස්ස තාදිනො රමන්ති සග්ගෙ සුගතස්ස සාවකා'ති.[6]

## 5. 1. 4. 5.

## [ දානානිසංසසුත්තං ]

35. පඤ්චිමෙ භික්ඛවෙ දානෙ ආනිසංසා. කතමෙ පඤ්ච?

බහුනො ජනස්ස පියො හොති මනාපො. සන්තො සප්පුරිසා භජන්ති. කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. ගිහිධම්මා අනපෙතො හොති. කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච දානෙ ආනිසංසාති.

17. දදමානො පියො හොති සතං ධම්මං අනුක්කමං,
සන්තො නං භජන්ති සප්පුරිසා[7] සඤ්ඤතා බ්‍රහ්මචාරිනො.

18 තෙ තස්ස ධම්මං දෙසෙන්ති සබ්බදුක්ඛාපනූදනං,
යං සො ධම්මං ඉධඤ්ඤාය පරිනිබ්බාති අනාසවොති.[8]

## 5. 1. 4. 6.

## [ කාලදානසුත්තං ]

36. පඤ්චිමානි භික්ඛවෙ කාලදානානි. කතමානි පඤ්ච?

ආගන්තුකස්ස දානං දෙති. ගමිකස්ස දානං දෙති. ගිලානස්ස දානං දෙති. දුබ්භික්ඛෙ දානං දෙති. යානි තානි නවසස්සානි නවඵලානි, තානි පඨමං සීලවන්තෙසු පතිට්ඨාපෙති. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච කාලදානානීති.

---

1. දායකො සීහ - සී. 2. යසස්ස වඩ්ඪති - ස්‍යා. - යසො ච වඩ්ඪති - මජ්ඣං.
3. දෙවානං සහබ්‍යගතා රමන්ති තෙ - ස්‍යා - මජ්ඣං.
4. කතාවකාසා කතකුසලා ඉතො චුතා - මජ්ඣං. ස්‍යා
5. නන්දනෙ - ස්‍යා 6. රමන්ති සබ්බ සුගතස්ස සාවකා - ස්‍යා
7. සන්තො නං සදා භජන්ති - ස්‍යා - මජ්ඣං. 8. පරිනිබ්බාතනාසවොති - ස්‍යා

සිහය, තෙල එසේ ම ය, සිහය, තෙල එසේ ම ය. දානපති දායක කාබුත් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලෝකයට එළඹෙන්නේ ය යි.

14. නො මසුරු මිනිස් තෙමේ දන් දෙනුයේ ප්‍රිය වෙයි. බොහෝ දෙන ඔහු ඇසුරු කෙරෙත්. කීර්තියට ද පැමිණේ. යශස් ද වැඩේ. සතෙජසකව ම පිරිස් වැද ගණී. විශාරද (ඥානසෞමනස්‍යයට පැමිණියේ) වෙයි.

15. එහෙයින් ම සුව කැමැති පණ්ඩිතයෝ මසුරු මල දුරු කොට දන් දෙත්. ඔහු දිගුකලක් දෙව් ලොව පිහිටියාහු දෙවියන්ගේ සහවාසයට ගියාහු රමණය කරත්.

16. කරණ ලද ආවාස (දෙව්ලොව වාස පිණිස කලකම්) ඇති, කළ කුසල් ඇති ඔහු එයින් (මිනිස් බැවින්) සැව ස්වයම්ප්‍රභ වූවාහු නඳුනුයනෙහි සැරිසරත්. ඔහු එහි සතුටු වෙත්. සිත් අලවා වෙසෙත්. පස්කම් ගුණයෙන් සමර්පිත වූවාහු අනිඃශ්‍රිත වූ (තෘෂ්ණා දෘෂ්ටිමාන ඇසුරු නො කළ) තාදී ගුණ ඇති භගවත්හුගේ භාෂිතය කොට තථාගතශ්‍රාවකයෝ ස්වර්ගයෙහි රමණය කෙරෙත්.

## 5. 1. 4. 5.

## [ දානානිසංස සූත්‍රය ]

35. මහණෙනි, දානයෙහි මේ අනුසස්හු පස්දෙනෙක් වෙති. පස්දෙන කවරයහ යත්:

බොහෝ දෙනහට ප්‍රිය - මනාප වෙයි. ශාන්ත සත්පුරුෂයෝ භජනය කෙරෙත්. කල්‍යාණ කීර්තිශබ්දය උස්ව පැන නැගේ. ගිහි ධර්මයෙන් (අඛණ්ඩපඤ්චශීලයෙන්) නොතොර වෙයි. කාබුත් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලෝකයෙහි උපදනේ යි. මහණෙනි, දානයෙහි මේ අනුසස්හු පස්දෙන වෙති.

17. සත්පුරුෂ ධර්මය අනුව යන දෙන තැනැත්තේ ප්‍රිය වෙයි. සංයත බ්‍රහ්මචාරී ශාන්ත සත්පුරුෂයෝ ඔහු ඇසුරු කෙරෙත්.

18. ඔහු ඔහට හැමදුක් බැහැර ලන යම් දහමක් දෙසත් ද, මෙ ලොව්හිදී ම හේ එදහම් පිළිබඳ ආස්‍රවරහිත වූයේ පිරිනිවේ යි.

## 5. 1. 4. 6.

## [ කාලදානසූත්‍රය ]

36. මහණෙනි, මේ කාලදානයෝ පස්දෙනෙක් වෙත්. කවර පස්දෙනෙක යත්:

ආගන්තුකයා හට දන් දෙයි. ගමිකහට දන් දෙයි. ගිලනාහට දන් දෙයි. දුර්භික්ෂයෙහි දන් දෙයි. යම් ඒ නවසස්‍ය - නවඵල කෙනෙක් වෙත් නම් එය පළමු කොට සිල්වතුන් කෙරෙහි පිහිටුවයි. මහණෙනි, මේ වනාහි කාලදානයෝ පස්දෙන වෙති යි.

19. කාලෙ දදන්ති සප්පඤ්ඤා වදඤ්ඤූ වීතමච්ඡරා
කාලෙන දින්නං අරියෙසු උජුභූතෙසු තාදිසු,
විප්පසන්නමනා තස්ස විපුලා හොති දක්ඛිණා,

20. යෙ තත්ථ අනුමොදන්ති වෙය්‍යාවච්චං කරොන්ති වා
න තෙසං[1] දක්ඛිණා ඌනා තෙපි පුඤ්ඤස්ස භාගිනො.

21. තස්මා දදෙ ච[2] අප්පටිවානචිත්තො යත්ථ දින්නං මහප්ඵලං
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.

## 5. 1. 4. 7.

## [ භොජනසුත්තං ]

37. භොජනං භික්ඛවෙ දදමානො දායකො පටිග්ගාහකානං පඤ්ච ඨානානි දෙති. කතමානි පඤ්ච?

ආයුං දෙති, වණ්ණං දෙති, සුඛං දෙති, බලං දෙති, පටිභාණං දෙති. ආයුං ඛො පන දත්වා ආයුස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා, වණ්ණං දත්වා -පෙ- සුඛං දත්වා -පෙ- බලං දත්වා -පෙ- පටිභාණං දත්වා -පෙ- පටිභාණස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා. භොජනං භික්ඛවෙ දදමානො දායකො පටිග්ගාහකානං ඉමානි පඤ්ච ඨානානි දෙති.

22. ආයුදො බලදො ධීරො වණ්ණදො පටිභාණදො
සුඛස්ස දාතා මෙධාවී සුඛං සො අධිගච්ඡති.

23. ආයුං දත්වා බලං වණ්ණං සුඛඤ්ච පටිභාණකං
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජතීති.

## 5. 1. 4. 8.

## [ සද්ධසුත්තං ]

38. පඤ්චිමෙ භික්ඛවෙ සද්ධෙ කුලපුත්තෙ ආනිසංසා. කතමෙ පඤ්ච?

යෙ තෙ භික්ඛවෙ ලොකෙ සන්තො සප්පුරිසා, තෙ සද්ධංයෙව[3] පඨමං අනුකම්පන්ති, නො තථා අස්සද්ධං. සද්ධංයෙව පඨමං උපසඞ්කමන්තා උපසඞ්කමන්ති, නො තථා අස්සද්ධං. සද්ධස්සෙව පඨමං පතිගණ්හන්තා පතිගණ්හන්ති, නො තථා අස්සද්ධං. සද්ධස්සෙව පඨමං ධම්මං දෙසෙන්තා දෙසෙන්ති, නො තථා අස්සද්ධං. සද්ධො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.[4]

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච සද්ධෙ කුලපුත්තෙ ආනිසංසා.

සෙය්‍යථාපි භික්ඛවෙ සුභූමියං චාතුම්මහාපථෙ[5] මහානිග්‍රොධො සමන්තා පක්ඛීනං පටිසරණං හොති, එවමෙව ඛො භික්ඛවෙ සද්ධො කුලපුත්තො බහුනො ජනස්ස පටිසරණං හොති: භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානන්ති.

---

1. තෙසංදක්ඛිණාඌනා - මජසං PTS. 2. දදෙ - සයා - ඡජසං
3 සද්ධඤ්ඤෙව - මජසං - සයා 4 උපපජ්ජතී, සීමු.
5. චතුම්මහාපථෙ - සයා. චතුමහාපථෙ - මජසං.

19. හල මසුරුමල ඇති භාෂිතඥ (බස දන්නා) වූ සප්‍රාඥයෝ නිසි කල්හි දන් දෙති. තාදී ගුණ ඇති ඍජුභූත ආර්‍ය්‍යයන් කෙරෙහි නිසි කල්හි පහන් සිතින් දුන් දයෙක් වේ නම් ඔහුගේ දක්ෂිණාව විපුල වෙයි.

20. එහි යම් කෙනෙක් අනුමෝදන් වෙත් ද, වතාවත් හෝ කරත් ද, ඔවුන්ගේ දක්ෂිණාව ඌනත නො වෙයි. ඔහුදු පුණ්‍යභාගීහු වෙත්.

21. එහෙයින් යම් තැනෙක්හි දුන් දය මහත්ඵල වේ නම් (එහි) උත්කණ්ඨාරහිත සිත් ඇතිව දෙන්නේ ය. පුණ්‍යයෝ ම සත්නට පරලොව්හි පිහිට වෙති යී.

## 5. 1. 4. 7.

## [ භොජනසූත්‍රය ]

37. මහණෙනි, බොජුන් දෙන දයක ප්‍රතිග්‍රාහකයන්ට (පිළිගාවනට) පස්කරුණෙක් දෙයි කවර පස්කරුණෙක යත්:

ආයුෂ දෙයි. ශරීරවර්ණය දෙයි, කායිකචෛතසිකසුඛය දෙයි. යුක්තමුක්ත ප්‍රතිභානය දෙයි. ආයුෂය දී දිව්‍ය වූ හෝ මානුෂ්‍ය වූ හෝ ආයුෂයට හිමි වෙයි. වර්ණය දී ... සුඛය දී ... බලය දී ... ප්‍රතිභානය දී දිව්‍ය වූ හෝ මානුෂ්‍ය වූ හෝ ප්‍රතිභානයට හිමි වෙයි. මහණෙනි, බොජුන් දෙන දයක පිළිගාවනට මෙ පස් කරුණු දෙයි.

22. ආයුෂය දෙන බලය දෙන, ධෛර්‍ය්‍යසම්පන්න වූ ඒ ප්‍රාඥ සුවයට පැමිණෙයි.

23. ආයුෂය ද බලය ද වර්ණය ද සුඛය ද ප්‍රතිභානය ද දී යම් යම් තැනෙක උපනේ වේ නම් දීර්ඝායුෂ්ක වූයේ යශස් ඇති වෙයි.

## 5. 1. 4. 8.

## [ සද්ධා සූත්‍රය ]

38. මහණෙනි, සැදැහැති කුලපුත් කෙරෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, ලොකයෙහි පරනට අනුග්‍රහ කරණ යම් ඒ ශාන්ත සත්පුරුෂ කෙනෙක් වෙත් නම්, ඔහු පළමු ම සැදැහැතියහුට ම අනුග්‍රහ කරත්. සැදැහැ නැතියහුට එසේ නො කෙරෙත්. එළඹෙන්නාහු සැදැහැතියහු කරා ම එළඹෙත්. සැදැහැ නැතියහු කරා එසේ නො එළඹෙත්. පිළිගන්නාහු පළමු සැදැහැතියහු ම පිළිගන්නාහ. සැදැහැ නැතියහු නො පිළිගණිත්. දම් දෙසන්නාහු පළමු ම සැදැහැතියහුට ම දෙසත්. සැදැහැ නැතියනට නො දෙසත්. සැදැහැතියේ කාබුන් මරණින් මතු සුගතිසඞ්ඛ්‍යාත ස්වර්ගයට පැමිණෙ යි.

මහණෙනි, සැදැහැවත් කුලපුත් කෙරෙහි මේ අනුසස් පසෙක් ඇත.

මහණෙනි, යම් පරිදි මහා බිමෙක්හි සිවුමංසන්ධියෙක වූ මහ නුගරුක හාත්පසින් ලිහිණියනට පිළිසරණ වේ ද, මහණෙනි, එසෙයින් ම සැදැහැති කුලපුත් භික්ෂු-භික්ෂුණී-උපාසක-උපාසිකා යන බොහෝ දෙනාට පිළිසරණ වෙයි.

24. සාඛාපත්තඵලූපෙතො ඛන්ධිමා ච මහාදුමො,
මූලවා ඵලසම්පන්නො පතිට්ඨා හොති පක්ඛිනං.

25. මනොරමෙ ආයතනෙ සෙවන්ති තං විහඞ්ගමා,
ඡායං ඡායත්ථිකා[1] යන්ති ඵලත්ථා ඵලභොජිනො.

26. තථෙව සීලසම්පන්නං සද්ධං පුරිසපුග්ගලං,
නිවාතවුත්තිං අත්ථද්ධං සොරතං සඛිලං මුදුං

27. වීතරාගා වීතදොසා වීතමොහා අනාසවා,
පුඤ්ඤක්ඛෙත්තානි ලොකස්මිං සෙවන්ති තාදිසං නරං.

28. තෙ තස්ස ධම්මං දෙසෙන්ති සබ්බදුක්ඛා පනූදනං,
යං සො ධම්මං ඉධඤ්ඤාය පරිනිබ්බාති අනාසවොති[2].

## 5. 1. 4. 9.

### [ පුත්තසුත්තං ]

39. පඤ්චිමානි භික්ඛවෙ ඨානානි සම්පස්සන්තා මාතාපිතරො පුත්තං ඉච්ඡන්ති කුලෙ ජායමානං. කතමානි පඤ්ච?

භතො වා නො භරිස්සති. කිච්චං වා නො කරිස්සති. කුලවංසො චිරං ඨස්සති. දායජ්ජං පටිපජ්ජති. අථ වා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සතීති. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච ඨානානි සම්පස්සන්තා මාතාපිතරො පුත්තං ඉච්ඡන්ති කුලෙ ජායමානන්ති.

29. පඤ්ච ඨානානි[3] සම්පස්සං පුත්තං ඉච්ඡන්ති පණ්ඩිතා,
භතො වා නො භරිස්සති කිච්චං වා නො කරිස්සති-

30. කුලවංසො චිරං ඨස්සති[4] දායජ්ජං පටිපජ්ජති,
අථවා පන පෙතානං දක්ඛිණං අනුප්පදස්සති.

31. ඨානානෙතානි සම්පස්සං පුත්තං ඉච්ඡන්ති පණ්ඩිතා.
තස්මා සන්තො සප්පුරිසා කතඤ්ඤූ කතවෙදිනො,

32. භරන්ති මාතාපිතරො පුබ්බෙ කතමනුස්සරං,
කරොන්ති තෙසං කිච්චානි යථා තං පුබ්බකාරිනං.

33. ඔවාදකාරී භතපොසී කුලවංසං අහාපයං,
සද්ධො සීලෙන සම්පන්නො පුත්තො හොති පසංසියොති.

1. ඡායත්ථිනො - සීමු. 2. පරිනිබ්බාතනාසවොති - සයා.
3. පඤ්චට්ඨානානි - සයා. 4. තිට්ඨෙ - මජසං., සයා

24. සා පත් පල යුත්, කඳැති, හිටි මුල් ඇති, මහාද්‍රැමයෙක් ප්‍රතිෂ්ඨිතට පිහිට වෙයි.

25. රමණීය අයිනෙහි පිහිටි එ රුක විහඟයෝ ඇසුරු කෙරෙත්. සෙවණ රිසියහු සෙවණට යෙත්. පලැටිහු ඵලාර්පී ව (එහි) යෙත්.

26. එසෙයින් ම ශීලයෙන් සමෘද්ධ, සැදැහැති, යටත් පැවතුම් ඇති, (මානාදීන්) නො තද, සුරතභාවයෙන් යුත්, සමෙමාදක, මාදීව ඇති, එ වන් මිනිසා,

27. වීතරාග වූ වීතද්වෙෂ වූ වීතමොහ වූ, ලොවිහි පින්කෙත් වූ රහත්හු ඇසුරු කෙරෙත්.

28. හෙ යම් ධර්මයක් ඉහාත්මයෙහි ම පසක් කොට අනාස්‍රව ව පිරිනිවේ නම්, ඒ රහත්හු හැමදුක් දුරලන එ දහම් ඔහට දෙසත්.

## 5. 1. 4 9

### [ පුත්‍ත සූත්‍රය ]

39. මහණෙනි, මාපියෝ මේ කරුණු පස දක්නාහු පුතකු කුලයෙහි උපදනහු කැමැති වෙත්. කවර පසෙක යත්:

පුත්නා ලදුයේ අප ද පුස්නේ ය. අපගේ කිස ද කරන්නේ ය. අපගේ කුලපරපුර ද දීර්ඝරාත්‍රයෙහි සිටුනේ ය. දායාද්‍යය පිළිපදනේ ය. වැළිත් කලුරිය කොට පරලොව ගියවුන් උදෙසා (ප්‍රාප්තිදන කොට) දක්ෂිණා දෙන්නේ ය යි. මහණෙනි, මෙ කරුණු පස දක්නා මාපියෝ පුතකු කුලෙහි උපදනහු කැමැති වෙති යි.

29. පණ්ඩිත (මාපියෝ) කරුණු පසක් දක්නාහු පුතකු පතත්. පුස්නාලදුයේ අප ද පුස්නේ ය. අපගේ කිස ද කරන්නේ ය.

30. බොහෝ කලක් කුලවංශය සිටුනේ ය. දායාද්‍යය පිළිපදනේ ය. වැළිත් පරලොව ගියවුනට දක්ෂිණා ද දෙන්නේ ය.

31. පණ්ඩිතයෝ තෙල කරුණු පස දක්නාහු පුතකු පතත්. එහෙයින් ශාන්ත, කළ ගුණ දන්නා, කෘතවෙදී, සත්පුරුෂයෝ-

32. (මාපියන්) පෙර කළ දෑ සිහි කරමින් ඒ මාපියන් පුස්නාහ. පූර්වොප-කාරී වූ ඔවුන්ගේ කිස ඔවුන් කළ පරිදි කරත්.

33 අවවාද පිළිපදිනා, (තමා) පොෂණය කළවුන් පුස්නා, කුලවංශය නො පිරිහෙළන, සැදැහැති, සිල්සපන් පුත්‍ර ප්‍රශංසාහී වෙයි.

## 5. 1. 4. 10.

### [ මහාසාලසුත්තං ]

40. හිමවන්තං භික්ඛවෙ පබ්බතරාජං නිස්සාය මහාසාලා පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪන්ති. කතමාහි පඤ්චහි?

සාඛාපත්තපලාසෙන වඩ්ඪන්ති. තචෙන වඩ්ඪන්ති. පපටිකාය වඩ්ඪන්ති. ඵෙග්ගුනා වඩ්ඪන්ති. සාරෙන වඩ්ඪන්ති. හිමවන්තං භික්ඛවෙ පබ්බතරාජං නිස්සාය මහාසාලා ඉමාහි පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪන්ති.

එවමෙව ඛො භික්ඛවෙ සද්ධං කුලපතිං[1] නිස්සාය අන්තොජනො පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪති. කතමාහි පඤ්චහි?

සද්ධාය වඩ්ඪති. සීලෙන වඩ්ඪති. සුතෙන වඩ්ඪති චාගෙන වඩ්ඪති. පඤ්ඤාය වඩ්ඪති. සද්ධං භික්ඛවෙ කුලපතිං නිස්සාය අන්තොජනො ඉමාහි පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪතීති.

34. යථා ච[2] පබ්බතො සෙලො අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ,
තං රුක්ඛා උපනිස්සාය වඩ්ඪන්තෙ තෙ වනප්පතී.

35. තථෙව සීලසම්පන්නං සද්ධං කුලපතිං[3] ඉධ[4],
උපනිස්සාය වඩ්ඪන්ති පුත්තදාරා ච බන්ධවා,
අමච්චා ඤාතිසඞ්ඝා ච යෙ චස්ස අනුජීවිනො.

36. තස්ස සීලවතො සීලං චාගං සුචරිතානි ච,
පස්සමානානුකුබ්බන්ති යෙ භවන්ති විචක්ඛණා.

37. ඉධ ධම්මං චරිත්වාන මග්ගං සුගතිගාමිනං,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනොති.

සුමනාවග්ගො චතුත්ථො.

**තස්සුද්දානං:**

සුමනා චුන්දී උග්ගහො සීහදානානිසංසයො
කාල භොජන සද්ධාය පුත්තසාලෙහි තෙ දසාති.

---

1. කුලපුත්තං - මජ්සං.
2. යථාපි - සතා - මජ්සං.
3. කුලපුත්තං - මජ්සං. සතා.
4. ඉමං - මජ්සං.

**5. 1. 4. 10.**

**[ මහාසාල සූත්‍රය ]**

40. මහණෙනි, හිමවත් පර්වතරාජයා නිසා මහරුක්හු වෘද්ධි පසෙකින් වැඩෙත්. කවර පසෙකින යත්:

සාපත්පලුයෙන් වැඩෙත්. තැසෙන් වැඩෙත්. පතුයෙන් වැඩෙත්. බොරුදුයෙන් වැඩෙත්. හරයෙන් වැඩෙත්. මහණෙනි, හිමවත් රදපර්ය නිසා මහරුක්හු මේ වෘද්ධි පසින් වැඩෙත්.

මහණෙනි, එ පරිදි සැදැහැති කුලපතිහු නිසා ඇතුළුදෙතො වෘද්ධි පසෙකින් වැඩෙත්. කවර පසෙකින යත්:

සැදැයෙන් වැඩෙයි. සීලයෙන් වැඩෙයි. ශ්‍රුතයෙන් වැඩෙයි. ත්‍යාගයෙන් වැඩෙයි. ප්‍රඥයෙන් වැඩෙයි. මහණෙනි, සැදැහැති කුලපතිහු නිසා ඇතුළුදෙතො මෙ පඤ්ච වෘද්ධින් වැඩෙති යි.

34. යම් පරිදි වෙනෙහි ශෛලපර්වතයෙක් වේ ද, එ ඇසුරු කොට එ වනස්පතිවෘක්ෂයෝ වැඩෙත් ද,

35. එ පරිදි මෙ ලොව්හි සිල්සපන් සැදැහැති කුලපතිහු නිසා පුත්‍රදරයෝ ද බාන්ධවයෝ ද සහජීවිහු ද ඥතිසමූහයෝ ද ඔහුගේ අනුජීවී කෙනෙක් වෙත් නම් ඔහු ද වැඩෙත්.

36. යම් බදු විචක්ෂණයෝ වෙත් නම් ඔහු සිල්වත් ඔහුගේ සීලය හා ත්‍යාගය හා සුචරිතයන් හා දක්නාහු අනුකරණ කරත්.

37. මෙ ලොව්හි සුගතිගාමීමාර්ගය වූ සුචරිතධර්මය කොට කම්සුව කැමැතියාහු දෙව්ලොව තුටු වන්නාහු (විපාකමොදනායෙන්) ප්‍රමුදිත වෙත්.

**සුමනාවර්ගය සතර වැනි යි.**

**එහි උද්දානය:**

සුමනා සූත්‍රය, චුන්දී සූත්‍රය, උග්ගහ සූත්‍රය, සීහ සූත්‍රය, දානානිසංස සූත්‍රය, කාලදාන සූත්‍රය, භොජන සූත්‍රය, සද්ධා සූත්‍රය, පුත්‍ර සූත්‍රය, මහාසාල සූත්‍රය දැයි දශයෙකි.

# 5. මුණ්ඩරාජවග්ගො

## 5. 1. 5. 1.

### [ පඤ්චභොගආදියසුත්තං ]

41. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථ-**පිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො **අනාථපිණ්ඩිකො** ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

පඤ්චිමෙ ගහපති භොගානං ආදියා. කතමෙ පඤ්ච?

ඉධ ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි අත්තානං සුඛෙති, පීණෙති, සම්මා සුඛං පරිහරති. මාතාපිතරො සුඛෙති, පීණෙති, සම්මා සුඛං පරිහරති. පුත්තදාරදාසකම්මකරපොරිසෙ සුඛෙති, පීණෙති, සම්මා සුඛං පරිහරති. අයං පඨමො භොගානං ආදියො.

පුන ච පරං ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි මිත්තාමච්චෙ සුඛෙති, පීණෙති, සම්මා සුඛං පරිහරති. අයං දුතියො භොගානං ආදියො

පුන ච පරං ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි යා තා හොන්ති ආපදා අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියතො වා දායාදතො, තථාරූපාසු ආපදාසු භොගෙහි පරියොධාය වත්තති, සොත්ථිං අත්තානං කරොති. අයං තතියො භොගානං ආදියො.

පුන ච පරං ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි පඤ්ච බලීකත්තා හොති: ඤාතිබලිං, අතිථිබලිං, පුබ්බපෙතබලිං, රාජබලිං, දෙවතාබලිං. අයං චතුත්ථො භොගානං ආදියො.

පුන ච පරං ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි යෙ තෙ සමණබ්‍රාහ්මණා මදප්පමාදා පටිවිරතා ඛන්තිසොරච්චෙ නිවිට්ඨා එකමත්තානං දමෙන්ති, එකමත්තානං සමෙන්ති, එකමත්තානං පරිනිබ්බාපෙන්ති, තථාරූපෙසු සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං. අයං පඤ්චමො භොගානං ආදියො.

ඉමෙ ඛො ගහපති පඤ්ච භොගානං ආදියා.

# 5. මුණ්ඩරාජවග්ගය

## 5. 1. 5. 1.

### [ භොගආදිය සූත්‍රය ]

41. එක් කලෙක භාග්‍යවත් බුදුහු **සැවැත්නුවර** ඇසුරු කොට **ජෙතවන** නම් වූ **අනේපිඩු** සිටුහුගේ අරම්හි වැඩ වෙසෙත සේක. **එ කල්හි අනේපිඩු ගෘහපති** භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හිඳගත. බුදුහු එකත්පස් ව හුන් අනේපිඩු ගැහැවි හට තෙල වදාළ සේක:

ගැහැවිය, භොගයන් පිළිබඳ වූ මේ ආදෙයයෝ (ගතයුතු ප්‍රයොජනයෝ) පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්:

ගැහැවිය, මෙ ලොව ආර්‍ය්‍යශ්‍රාවක උත්ථානවීර්‍ය්‍යයෙන් (කායිකචෛතසික වීර්‍ය්‍යයෙන්) ලත්, බාහුබලයෙන් රැස් කළ දහදිය නගා උපයාලූ, දැහැමි වූ දැහැමින් ලැබූ භොගයෙන් තමා සුවපත් කෙරෙයි. පිණවයි. සම්‍යක් සුඛ පරිහරණ කෙරෙයි. මාතාපිතෲන් සුවපත් කෙරෙයි. පිණවයි. සම්‍යක් සුඛ පරිහරණ කෙරෙයි. පුත්‍රදාර, දාස, කම්කරපුරුෂයන් සුවපත් කෙරෙයි. පිණවයි. සම්‍යක් සුඛ පරිහරණ කෙරෙයි. මෙ භොගයන්ගේ පළමු ආදෙය වේ.

තවද ගැහැවිය, ආර්‍ය්‍යශ්‍රාවක උත්ථානවීර්‍ය්‍යයෙන් ලත්, බාහුබලයෙන් රැස් කළ, දහදිය නගා උපයාලූ, දැහැමි වූ දැහැමින් ලත් භොගයෙන් මිත්‍රාමාත්‍යයන් සුවපත් කෙරෙයි. පිණවයි. සම්‍යක් සුඛ පරිහරණ කෙරෙයි. මෙ භොගයන්ගේ දෙවෙනි ආදෙය වේ.

තවද ගැහැවිය, ආර්‍ය්‍යශ්‍රාවක උත්ථානවීර්‍ය්‍යයෙන් ලත්, බාහුබලයෙන් රැස් කළ, දහදිය නගා උපයන ලද, දැහැමි වූ දැහැමින් ලත් භොගයෙන් ගින්නෙන් වේවයි, දියෙන් වේවයි, රජුන් ගෙන් වේවයි, සොරුන්ගෙන් වේවයි, අප්‍රිය දායාදයන්ගෙන් වේවයි යම් ඒ ආපදාවෝ වෙත් නම්, එබඳු ආපදාවන්හි භොගයෙන් වසා (උවදුරු වළකා ගෙණ) වැටෙයි ආත්මභාවය නිරුපද්‍ර ව කෙරෙයි. මෙ භොගයන්ගේ තුන් වන ආදෙය වේ.

තවද ගැහැවිය, ආර්‍ය්‍යශ්‍රාවක උත්ථානවීර්‍ය්‍යයෙන් ලද, බාහුබලයෙන් රැස් කළ, දහදිය නගා උපයාගත්, දැහැමි වූ දැහැමින් ලත් භොගයෙන් ඥාතිබලි ය, අතිථිබලි ය, පූර්‍වප්‍රෙතබලි ය, රාජබලි ය, දෙවතාබලි ය යි බලි (සත්කාර) පසක් කරන්නේ වෙයි. මෙ භොගයන්ගේ සිවු වන ආදෙය වේ.

තවද ගැහැවිය, ආර්‍ය්‍යශ්‍රාවක උත්ථානවීර්‍ය්‍යයෙන් ලත්, බාහුබලයෙන් රැස් කොට ගත්, දහදිය නගා උපයා ගත්, දැහැමි වූ දැහැමින් ලත් භොගයෙන් මද පමා දෙකින් විරත වූ ක්‍ෂාන්තියෙහි හා සුරතභාවයෙහි පිවිසගත් යම් එ ශ්‍රමණබ්‍රාහමණ කෙනෙක් එක් ම (තමන්ගේ ම) ආත්මභාවය දමනය කෙරෙත් නම්, එක් ම ආත්මභාවය සන්හිඳුවත් නම්, එක් ම ආත්ම භාවය පිරිනිවත් නම්, එබඳු මහණ බමුණන් කෙරෙහි (මතු මතු භූමින්හි එලදන වශයෙන්) ඌර්ධ්වාග්‍ර ඇති, ස්වර්‍ගයට හිත වූ, සුඛ විපාක ඇති, ස්වර්‍ග-භාවයට හිත ව වැටෙන (අග්‍ර වූ රූපාදිය මොනවට ගෙණ දෙන) දක්ෂිණාව පිහිටුවයි. මෙ භොගයන්ගේ පස් වන ආදෙය වේ.

ගැහැවිය, භොගයන්ගේ මෙ ආදෙය පස යි.

තස්ස චෙ ගහපති අරියසාවකස්ස ඉමෙ පඤ්ච භොගානං ආදියෙ ආදියතො භොගා පරික්ඛයං ගච්ඡන්ති, තස්ස එවං හොති: "යෙ වත භොගානං ආදියා, තෙ චාහං ආදියාමි. භොගා ච මෙ පරික්ඛයං ගච්ඡන්තී"ති. ඉතිස්ස හොති අවිප්පටිසාරො. තස්ස චෙ ගහපති අරියසාවකස්ස ඉමෙ පඤ්ච භොගානං ආදියෙ ආදියතො භොගා අභිවඩ්ඪන්ති, තස්ස එවං හොති: "යෙ වත භොගානං ආදියා, තෙ චාහං ආදියාමි භොගා ච මෙ අභිවඩ්ඪන්තී"ති ඉතිස්ස හොති උභයෙනෙව අවිප්පටිසාරොති.[1]

38. භුත්තා භොගා භතා භච්චා විතිණ්ණා ආපදාසු මෙ,
උද්ධග්ගා දක්ඛිණා දින්නා අථො පඤ්ච බලී කතා.
උපට්ඨිතා සීලවන්තො සඤ්ඤතා බ්‍රහ්මචාරයො.

32. යදත්ථං භොගං ඉච්ඡෙය්‍ය පණ්ඩිතො ඝරමාවසං,
සො මෙ අත්ථො අනුප්පත්තො කතං අනනුතාපියං.

40. එතං අනුස්සරං මච්චො අරියධම්මෙ ඨිතො නරො,
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදතීති.[2]

## 5. 1. 5. 2.

## [සප්පුරිසසුත්තං]

[සාවත්ථිනිදානං:]

42. සප්පුරිසො භික්ඛවෙ කුලෙ ජායමානො බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය හොති: මාතාපිතුන්නං[3] අත්ථාය හිතාය සුඛාය හොති පුත්තදාරස්ස අත්ථාය හිතාය සුඛාය හොති. දාසකම්මකරපොරිසස්ස අත්ථාය හිතාය සුඛාය හොති. මිත්තාමච්චානං අත්ථාය හිතාය සුඛාය හොති. සමණබ්‍රාහ්මණානං අත්ථාය හිතාය සුඛාය හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ මහාමෙඝො සබ්බසස්සානි සම්පාදෙන්තො බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය හොති, එවමෙව ඛො භික්ඛවෙ සප්පුරිසො කුලෙ ජායමානො බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය හොති: මාතා-පිතුන්නං අත්ථාය හිතාය සුඛාය හොති. පුත්තදාරස්ස අත්ථාය හිතාය සුඛාය හොති. දාසකම්මකරපොරිසස්ස අත්ථාය හිතාය සුඛාය හොති. මිත්තාමච්චානං අත්ථාය හිතාය සුඛාය හොති. සමණබ්‍රාහ්මණානං අත්ථාය හිතාය සුඛාය හොතීති.

41. හිතො බහුන්නං පටිපජ්ජ භොගෙ තං දෙවතා රක්ඛති දෙවගුත්තං,
බහුස්සුතං සීලවතූපපන්නං ධම්මෙ ඨිතං න විජහාති[4] කිත්ති.

42. ධම්මට්ඨං සීලසම්පන්නං සච්චවාදිං හිරීමතං,
නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති,
දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතොති.

---

1. ඉතිස්ස හොති අවිප්පටිසාරො - සයා. 2. සග්ගෙ ච මොදතීති - සීමු.
3. මාතාපිතූනං - මජසං. 4 විජහති - මජසං.

ගෘහපතිය, භොගයන්ගේ මේ ආදෙය පස ගන්නා වූ එ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ භොගයෝ අවසනට යෙත් නම්, ඔ හට මේ සිත් වෙයි: "එකාන්තයෙන් භොගයන්ගේ යම් ආදෙයයෝ වෙත් නම් මම ඔවුනුදු ගත්මි. මාගේ භොගයෝ ද (ප්‍රයොජනය ගැන්මෙන්) පරික්‍ෂයට යෙති"යි. මෙසෙයින් ඔහට අවිප්‍රතිසාරය වෙයි. ගෘහපතිය, භොගයන්ගේ මේ ආදෙය පස ගන්නා එ ආර්‍ය්‍යශ්‍රාවකහට ඉදින් භොගයෝ අභිවර්‍ද්ධනයට යෙත් නම්, ඔහට මේ සිත වෙයි: "එකාන්තයෙන් භොගයන්ගේ යම් ආදෙයයෝ වෙත් නම් ඔවුනුදු මම ගත්මි. මාගේ භොගයෝ ද (වඩාලා ම) අභිවර්‍ද්ධනයට යෙති" යි. මෙසෙයින් ඔහට දෙපරිදියෙන් ම අවිප්‍රතිසාරය වේ ය යි.

38. ම විසින් භොගයෝ වළඳන ලදහ. පොෂණයට නිසියෝ ද පුස්නාලදහ. ආපද්හි දී ආපදාවෝ ද තරණය කරණ ලදහ. සිල්වත් සංයත වූ බ්‍රහ්මචාරීහු වටන ලදහ.

39. ගෙයි වෙසෙන නුවණැතියේ යමක් සඳහා භොග කැමැති වේ නම් මා විසින් එ අර්‍ථය ලබන ලද වේ. නො තැවීමට හිත කර්‍මය කරණ ලදි.

40. තෙල සිහි කරණ මිනිස් තෙමේ ආර්‍ය්‍යධර්‍මයෙහි සිටියේ වෙයි. මේ අත්බවුහි ම (නැණැතියෝ) ඔහු පසසත්. මිය පරලොව ගියේ ස්වර්‍ගයෙහි විපාකමොදනා කෙරේ.

## 5. 1. 5. 2.

## [ සප්පුරිස සූත්‍රය ]

[සැවැත්නිදාන යි:]

42. මහණෙනි, කුලයෙහි උපදනා සත්පුරුෂ බොහෝ දෙනහට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. දෙ මාපියනට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. අඹුදරුවනට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. දස් කම්කරුපුරිස්නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. සගයහළුවනට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වේ මහණ බමුණනට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වේ.

මහණෙනි, යම් සෙ වට මහවැසි හැම සස්වග සපයනුයේ බොහෝ දෙන හට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වේ ද, එසෙයින් ම මහණෙනි, සත්පුරුෂ කුලයෙහි උපදනේ බොහෝ දෙනහට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි: දෙ මාපියනට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. අඹුදරුවනට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. දස්කම්කරු පුරිස්නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. සගයහළුවනට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වේ. මහණ බමුණනට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වේ.

41. (සත්පුරුෂ වූ යමෙක්) උපභොග පරිභොග සම්පත් ලැබ මාපිය ඇ බොහෝ දෙනහට හිත වූයේ ද, ඔහු ලෝපල් දෙවි රක්නේ ය. දෙවියන් විසින් රක්නා ලද බොහෝ ඇසුපිරු තැන් ඇති, ශීලය හා ව්‍රතයෙන් සමෘද්ධ වූ දස කුසල් දහම්හි සිටියහු කීර්ත්තිය නො හරී.

42. දහම්හි සිටි ශීලයෙන් සමෘද්ධ වූ සත්‍යවාදී වූ අකුසලින් හැකිළෙන සිතැති ඔහු ජාම්බොනදසුවර්‍ණයාගේ නිෂ්කයක් සෙයින් නිගන්නට කවරෙක් අර්‍හ වේ ද, දෙවියෝත් ඔහු පසසති. බඹහු විසිනුදු හේ පසස්නා ලද්දේ යි.

## 5. 1. 5. 3

## [ පඤ්චඉට්ඨධම්මසුත්තං ]

[සාවත්ථිනිදානං:]

43. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

පඤ්චිමෙ ගහපති ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං. කතමෙ පඤ්ච?

ආයු ඛො ගහපති ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං. වණ්ණො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං. සුඛං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං. යසො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං. සග්ගා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං.

ඉමෙ ඛො ගහපති පඤ්ච ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං.

ඉමෙසං ඛො ගහපති පඤ්චන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං න ආයාචනාහෙතු වා පත්ථනාහෙතු වා පටිලාභං වදාමි. ඉමෙසං ඛො ගහපති පඤ්චන්නං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං ආයාචනාහෙතු වා පත්ථනාහෙතු වා පටිලාභො අභවිස්ස, කො ඉධ කෙන හායෙථ?

න ඛො ගහපති අරහති අරියසාවකො ආයුං කාමො ආයුං ආයාචිතුං වා අභිනන්දිතුං වා ආයුස්ස වා පිහෙතුං. ආයුකාමෙන ගහපති අරියසාවකෙන ආයුසංවත්තනිකා පටිපදා පටිපජ්ජිතබ්බා. ආයුසංවත්තනිකා හිස්ස පටිපදා පටිපන්නා ආයුපටිලාභාය සංවත්තති. සො ලාභී හොති ආයුස්ස දිබ්බස්ස වා මානුසස්ස වා.

න ඛො ගහපති අරහති අරියසාවකො වණ්ණකාමො වණ්ණං ආයාචිතුං වා අභිනන්දිතුං වා වණ්ණස්ස වා පිහෙතුං. වණ්ණකාමෙන ගහපති අරියසාවකෙන වණ්ණසංවත්තනිකා පටිපදා පටිපජ්ජිතබ්බා. වණ්ණසංවත්තනිකා හිස්ස පටිපදා පටිපන්නා වණ්ණපටිලාභාය සංවත්තති. සො ලාභී හොති වණ්ණස්ස දිබ්බස්ස වා මානුසස්ස වා.

න ඛො ගහපති අරහති අරියසාවකො සුඛකාමො සුඛං ආයාචිතුං වා අභිනන්දිතුං වා සුඛස්ස වා පිහෙතුං. සුඛකාමෙන ගහපති අරියසාවකෙන සුඛසංවත්තනිකා පටිපදා පටිපජ්ජිතබ්බා. සුඛසංවත්තනිකා හිස්ස පටිපදා පටිපන්නා සුඛපටිලාභාය සංවත්තති. සො ලාභී හොති සුඛස්ස දිබ්බස්ස වා මානුසස්ස වා.

## 5. 1. 5. 3.

## [ ඉට්ඨධම්ම සූත්‍රය ]

[සැවැත්නිදානය:]

43. එ කල අනේපිඬු ගැහැවි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ, භාග්‍යවතුන් වහන්සේ පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව හිඳ ගත. එකත්පස් ව හුන් අනේපිඬු ගැහැවිහට බුදුහු මෙල වදාළ සේක:

ගැහැවිය, ලොව ඉෂ්ට වූ කමනීය වූ මන වඩන දුකසේ ලැබිය හැකි මේ පස් දහම් කෙනෙක් වෙති. කවර පස්දෙනෙක යත්:

ගැහැවිය, ලොව ඉෂ්ට වූ, කමනීය වූ, මන වඩන්නා වූ ආයුෂය දුර්ලභ වූයේ වෙයි. ලොව ඉෂ්ට වූ, කාන්ත වූ, මනාප වූ ශරීරවර්ණය දුර්ලභ වෙයි. ලොව ඉෂ්ට වූ, කාන්ත වූ, මනාප වූ කායිකචෛතසික සුඛ ය දුර්ලභ වෙයි. ලොව ඉෂ්ට වූ, කාන්ත වූ, මනාප වූ යශස් (භොගපරිවාර) දුර්ලභ වෙයි. ලොව ඉෂ්ට වූ, කමනීය වූ, මන වඩනා වූ ස්වර්ගයෝ දුර්ලභවූවාහු වෙත්.

ගැහැවිය, ලොව ඉෂ්ට වූ, කමනීය වූ, මන වඩනා වූ මේ පඤ්චධර්මයෝ දුර්ලභ වූවාහු වෙත්.

ගැහැවිය, ලොව ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ දුර්ලභ වූ මේ පඤ්චධර්මයන් ආයාචනාහෙතුයෙන් වේවයි ප්‍රාර්ථනාහෙතුයෙන් වේවයි ප්‍රතිලාභය නො කියමි. ගැහැවිය, ආයාචනාහෙතුයෙන් වේවයි ප්‍රාර්ථනාහෙතුයෙන් වේවයි ලොව ඉෂ්ට වූ කමනීය වූ මන වඩන්නා වූ දුර්ලභ වූ මේ පඤ්චධර්මයන්ගේ ලැබීමෙක් වේ නම් මේ ලොව කවරෙක් කිමෙකින් පිරිහේ ද?

ගැහැවිය, ආයු කැමැති වූ ආර්‍යශ්‍රාවක ආයුෂය යදනට හෝ කැමැති වන්නට හෝ ආයුෂයට රිසි වන්නට හෝ සුදුසු නො වෙයි. ගැහැවිය, ආයු කැමැති වූ ආර්‍යශ්‍රාවකයා විසින් ආයු පිණිස පවත්නා (දන් සිල් ඈ) පුණ්‍යප්‍රතිපදාව පිළිපැද්ද යුතු ය. ඔහු විසින් ප්‍රතිපාදනා කළ ආයුසංවර්තනික පුණ්‍යප්‍රතිපදාව ආයු ලැබීම පිණිස පවත්නී ම ය. එහෙයින් හේ දිව්‍ය වූ හෝ මානුෂ්‍ය වූ හෝ ආයුෂය ලබන්නේ වෙයි.

ගැහැවිය, ශරීරවර්ණ කැමැති වූ ආර්‍යශ්‍රාවක ශරීරවර්ණය යදනට හෝ කැමැති වන්නට හෝ ශරීරවර්ණයට රිසි වන්නට හෝ අගී නො වෙයි. ගැහැවිය, වර්ණය කැමැති වූ ආර්‍යශ්‍රාවකයා විසින් වර්ණය පිණිස පවත්නා පුණ්‍යප්‍රතිපදාව පිළිපැද්ද යුතු ය. ඔහු විසින් ප්‍රතිපාදනා කළ වර්ණය පිණිස පවත්නා පුණ්‍යප්‍රතිපදාව ශරීරවර්ණප්‍රතිලාභය පිණිස පවත්නී ම ය. එහෙයින් හේ දිව්‍ය වූ හෝ මානුෂ්‍ය වූ හෝ ශරීරවර්ණ ලබන්නේ වෙයි.

ගැහැවිය, සුව කැමැති වූ ආර්‍යශ්‍රාවක සුවය යදනට හෝ අභිනන්දනා කරන්නට හෝ සුවයට රිසි වන්නට හෝ නො ම අගී වෙයි. ගැහැවිය, සුව කැමැති ආර්‍යශ්‍රාවකයා විසින් සුව පිණිස පවත්නා පුණ්‍යප්‍රතිපදාව පිළිපැද්ද යුතු වෙයි. ඔහු විසින් ප්‍රතිපාදනා කළ සුඛසංවර්තනික වූ පුණ්‍යප්‍රතිපදාව සුව ලැබීම පිණිස පවත්නී ම ය. එහෙයින් හේ දිව්‍ය වූ හෝ මානුෂ්‍ය වූ හෝ සුවය ලබන්නේ වෙයි.

න ඛො ගහපති අරහති අරියසාවකො යසකාමො යසං ආයාචිතුං වා අභිනන්දිතුං වා යසස්ස වා පිහෙතුං. යසකාමෙන ගහපති අරියසාවකෙන යසසංවත්තනිකා පටිපදා පටිපජ්ජිතබ්බා. යසසංවත්තනිකා හිස්ස පටිපදා පටිපන්නා යසපටිලාභාය සංවත්තති. සො ලාභී හොති යසස්ස දිබ්බස්ස වා මානුසස්ස වා.

න ඛො ගහපති අරහති අරියසාවකො සග්ගකාමො සග්ගං ආයාචිතුං වා අභිනන්දිතුං වා සග්ගානං වා[1] පිහෙතුං. සග්ගකාමෙන ගහපති අරියසාවකෙන සග්ගසංවත්තනිකා පටිපදා පටිපජ්ජිතබ්බා. සග්ගසංවත්තනිකා හිස්ස පටිපදා පටිපන්නා සග්ගපටිලාභාය සංවත්තති. සො ලාභී හොති සග්ගානන්ති.

43. ආයුං වණ්ණං යසං කිත්තිං සග්ගං උච්චාකුලීනතං,
රතියො පත්ථයානෙන උළාරා අපරාපරං,[2]

44. අප්පමාදං පසංසන්ති පුඤ්ඤකිරියාසු පණ්ඩිතා,
අප්පමත්තො උභො අත්ථෙ අධිගණ්හාති පණ්ඩිතො,

45. දිට්ඨෙව ධම්මෙ යො අත්ථො යො චත්ථො සම්පරායිකො.
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චතීති.

## 5. 1. 5. 4

## [ මනාපදායීසුත්තං ]

44. එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ **කූටාගාරසාලායං**. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන උග්ගස්ස ගහපතිනො වෙසාලිකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො **උග්ගො** ගහපති වෙසාලිකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උග්ගො ගහපති වෙසාලිකො භගවන්තං එතදවොච:

"සම්මුඛා මෙතං[3] භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං 'මනාපදායී ලභතෙ මනාප'න්ති. මනාපං මෙ භන්තෙ සාලපුප්ඵකං ඛාදනීයං. තං මෙ භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායා"ති. පටිග්ගහෙසි භගවා අනුකම්පං උපාදාය.

"සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං 'මනාපදායී ලභතෙ මනාප'න්ති මනාපං මෙ භන්තෙ සම්පන්නකොලකං, සම්පන්නසූකරමංසං.[4] තං මෙ භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායා"ති. පටිග්ගහෙසි භගවා අනුකම්පං උපාදාය.

---

1. සග්ගං වා - සීමු. 2. අපරාපරා - මජසං
3. සම්මුඛා එතං - සීමු. 4. සූකරමංසං - මජසං, සම්පන්නවරසූකරමංසං - සයා.

ගැහැවිය, යශස් කැමැති වූ ආර්‍යශ්‍රාවක යශස් යදනට හෝ අභිනන්‍දනා කරන්නට හෝ යශසට රිසි වන්නට හෝ නො ම අහී වෙයි. ගැහැවිය, යශස් කැමැති වූ ආර්‍යශ්‍රාවකයා විසින් යශස් පිණිස පවත්නා පුණ්‍ය-ප්‍රතිපදාව පිළිපැද්ද යුතු ය. ඔහු විසින් ප්‍රතිපාදනා කළ යශස් පිණිස පවත්නා පුණ්‍යප්‍රතිපදාව යශස්ප්‍රතිලාභය පිණිස පවත්නී ම ය: එහෙයින් හේ දිව්‍ය වූ හෝ මානුෂ්‍ය වූ හෝ යශස් ලබන්නේ වෙයි.

ගැහැවිය, ස්වර්ගය කැමැති වූ ආර්‍යශ්‍රාවක ස්වර්ගය යදනට හෝ අභිනන්‍දනා කරන්නට හෝ ස්වර්ගයට රිසි වන්නට හෝ නො ම අහී වෙයි. ගැහැවිය, ස්වර්ගය කැමැති ආර්‍යශ්‍රාවකයා විසින් ස්වර්ගය පිණිස පවත්නා (දානශීලාදී) පුණ්‍යප්‍රතිපදාව පිළිපැද්ද යුතු වෙයි. ඔහු විසින් ප්‍රතිපාදනා කළ ස්වර්ගය පිණිස පවත්නා පුණ්‍යප්‍රතිපදාව ස්වර්ගප්‍රතිලාභයට වැටේ ම ය. එහෙයින් හේ ස්වර්ගයන් ලබන්නේ වේ.

43. ආයුෂ ය, ශරීරවර්ණ ය, පරිවාර යශස් ය, කීර්ති ය, ස්වර්ග ය, උසස් කුලවත් බව ය යන උදාර වූ කාමරතීන් වෙන් වෙන් සේ පතනුවන්හු විසින්-

44-45. පුණ්‍යක්‍රියායෙහි නොපමා වීම බුද්ධාදි පණ්ඩිතයෝ පසසති. (කුශලයෙහි) අප්‍රමත්ත වූ පණ්ඩිත තෙම දෘෂ්ටධර්මයෙහි වූ යම් අර්ථයෙකුත් වේ ද, සාම්පරායික වූ යම් අර්ථයෙකුත් වේ ද, ඒ උභයාර්ථයන් ලබයි. උභයාර්ථයාගේ ප්‍රතිලාභයෙන් ධීරයා පණ්ඩිතයෙකැයි කියනු ලැබේ.

## 5. 1. 5. 4.

## [ මනාපදායී සූත්‍රය ]

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර ඇසුරු කොට මහා වනයෙහි කූටාගාරශාලායෙහි වාස කරණ සේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුකාලයෙහි හැද පෙරව පාසිවුරු ගෙණ විසල්පුර වැසි උග්‍ර ගෘහපතිහුගේ නිවෙස්න කරා එළැඹි සේක. එළැඹ පත්වාළු අස්නෙහි වැඩහුන් සේක. එ කල්හි විසල්පුර වැසි උග්‍ර ගෘහපති භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ, භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හින. එකත්පස් ව හුන් විසල්පුර වැසි උග්‍ර ගෘහපති භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ ය:

"වහන්ස, 'මනාප දෑ දෙනුයේ මනාප දෑය ලබා'යි මෙල මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි අසන ලදි, හමුයෙහි පිළිගන්නා ලදි. මට සල්පුප් (සිවුම්යුරු යොදා සල්පිටියෙන් සල්මල් බඳු කොට තැනූ) කැවුම් මනාප ය. භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා කොට මාගේ ඒ ඛාද්‍යය පිළිගන්නා සේක්වා"යි. බුදුහු අනුකම්පා පිණිස පිළිගත්හ.

"වහන්ස, 'මනාප දෑ දෙනුයේ මනාප දෑය ලබා'යි මෙල මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි අසන ලදි. හමුයෙහි පිළිගන්නා ලදි. වහන්ස, මට ඩෙබරපල මුසු (කොට පිසූ එක් හැවිරිදි) හූරුමස් මනාප ය. භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස මාගේ ඒ සූකරමාංසය පිළිගන්නා සේක්වා"යි. බුදුහු අනුකම්පා පිණිස පිළිගත්හ.

“සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං ‘මනාපදායී ලභතෙ මනාප’න්ති. මනාපං මෙ භන්තෙ නිබද්ධතෙලකං[1] නාළියසාකං. තං මෙ භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායා”ති. පටිග්ගහෙසි භගවා අනුකම්පං උපාදාය.

“සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං ‘මනාපදායී ලභතෙ මනාප’න්ති. මනාපො මෙ භන්තෙ සාලීනං ඔදනො විචිතකාළකො අනෙකසූපො අනෙකබ්‍යඤ්ජනො. තං මෙ භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායා”ති. පටිග්ගහෙසි භගවා අනුකම්පං උපාදාය.

“සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං ‘මනාපදායී ලභතෙ මනාප’න්ති. මනාපානි මෙ භන්තෙ කාසිකානි වත්ථානි. තානි මෙ භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායා”ති. පටිග්ගහෙසි භගවා අනුකම්පං උපාදාය.

“සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං ‘මනාපදායී ලභතෙ මනාප’න්ති. මනාපො මෙ භන්තෙ පල්ලඞ්කො ගොණකත්ථතො පටිකත්ථතො පටලිකත්ථතො කාදලිමිගපවරපච්චත්ථරණො[2] සඋත්තරච්ඡදො උභතො ලොහිතකූපධානො. අපි ච භන්තෙ මයමෙතං ජානාම ‘නෙතං භගවතො කප්පතී’ති. ඉදං මෙ භන්තෙ චන්දනඵලකං අග්ඝති අධිකං සහස්සං. තං මෙ භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායා”ති. පටිග්ගහෙසි භගවා අනුකම්පං උපාදාය.

අථ ඛො භගවා උග්ගං ගහපතිං වෙසාලිකං ඉමිනා අනුමොදනීයෙන අනුමොදි:

46. මනාපදායී ලභතෙ මනාපං යො උජ්ජුභූතෙසු දදාති ඡන්දසා,
අච්ඡාදනං සයනමථන්නපානං[3] නානප්පකාරානි ච පච්චයානි.

47. චත්තඤ්ච මුත්තඤ්ච අනග්ගහීතං[4] ඛෙත්තූපමෙ අරහන්තෙ විදිත්වා,
සො දුච්චජං සප්පුරිසො චජිත්වා මනාපදායී ලභතෙ මනාපන්ති.

අථ ඛො භගවා උග්ගං ගහපතිං වෙසාලිකං ඉමිනා අනුමොදනීයෙන අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො උග්ගො ගහපති වෙසාලිකො අපරෙන සමයෙන කාලමකාසි. කාලකතො ච උග්ගො ගහපති වෙසාලිකො අඤ්ඤතරං මනොමයං කායං උපපජ්ජි.

1. නිබ්බට්ටතෙලකං - සයා, නිබ්බත්තතෙලකං - සීමු,
2. කදලිමිගපවරපච්චත්ථරණො - මජසං, සයා.
3. සයනමන්නපානං - මජසං. 4. අනුග්ගහීතං - සයා - PTS

"වහන්ස, 'මනාප දෑ දෙනුයේ මනාප දෑයක් ලබා'යි තෙල මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි අසන ලදී. හමුයෙහි පිළිගන්නා ලදී. වහන්ස, මට තෙලින් වැටූ (හල්පිටි සමඟ මැඩ දුරු ඇ යෙදූ ගිතෙලෙහි පිස වතුමධුර යොදා තැනූ) තැළිපලා මනාප ය. භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස මාගේ ඒ තැළිපලා පිළිගන්නා සේක්වා"යි. බුදුහු අනුකම්පා පිණිස පිළිගත්හ.

"වහන්ස, 'මනාප දෑ දෙනුයේ මනාප දෑයක් ලබා'යි තෙල මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි අසන ලදී. හමුයෙහි පිළිගන්නා ලදී. වහන්ස, මට තඟාලූ කළුසහල් ඇති නොයෙක් සූප ඇති නොයෙක් ව්‍යඤ්ජන ඇති හැල්සහලින් කළ බත මනාප ය. භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස මාගේ ඒ ඔදනය පිළිගන්නා සේක්වා"යි. බුදුහු අනුකම්පා පිණිස පිළිගත්හ.

"වහන්ස, 'මන වඩනා දෑ දෙනුයේ මන වඩනා දෑයක් ලබා'යි තෙල මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙන් අසන ලදී. හමුයෙන් පිළිගන්නා ලදී. වහන්ස, මට කසීසළු මනාප ය. භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස මාගේ ඒ කසීසළු පිළිගන්නා සේක්වා"යි. බුදුහු අනුකම්පා පිණිස පිළිගත්හ.

වහන්ස, "මන වඩන දෑ දෙනුයේ මන වඩනා දෑයක් ලබා"යි තෙල මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙන් අසන ලද. හමුයෙන් පිළිගන්නා ලද. වහන්ස, මට (සිවු අඟලකට වැඩි ලොම් ඇති) කළු කොඳුපලස් අතුළ, එළලොම්මුවා සුදු ඇතිරි අතුළ, ඝනපුප් ඇති එළලොම් ඇතිරි අතුළ, උතුම් කෙසෙල්මුව සම් ඇතිරි අතුළ, (රත්) උඩුවියන් සහිත වූ, දෙපස තැබූ රත්කන්වයින් ඇති පලඟ මන වඩනේ ය. වහන්ස, එතෙකුදුවත් 'තෙලෙ භාග්‍යවතුන් වහන්සේට කැප නො වෙයි' යන මෙ කරුණ අපි ද දනුම්හ. වහන්ස, මාගේ මේ සඳුන්පුවරුකඩ අසිරාදහසක් අගනෙ ය. භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස මාගේ ඒ චන්‍දනඵලකය පිළිගන්නා සේක්වා" යි බුදුහු අනුකම්පා පෙරදැරි කොට එය පිළිගත්හ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසල්පුරවැසි උග්‍ර ගෘහපතිහු මේ අනුමෝදනායෙන් අනුමෙවූනී කළ සේක:

46. මන වඩන දෑ දෙනුයේ මන වඩන දෑයක් ලබයි. යමෙක් කායෘජුන් සෘජු වූවන් විෂයෙහි ප්‍රෙමයෙන් යුක්ත ව හඳනා පොරෝනා වස්ත්‍ර ද ශයනාසන ද යළි ආහාරපාන ද නන් වැදෑරුම් ප්‍රත්‍යය ද දෙයි ද—

47. රහතුන් (පුණ්‍යවිරූහණාඨියෙන්) ක්ෂෙත්‍රසදෘශ කොට සලකා සිතින් අගෘහිත ව (අපෙක්ෂාරහිත ව) පරිත්‍යාග කරණ ලද්දේත් මුදන ලද්දේත් වේ ද, ත්‍යාගයට දුෂ්කර දෑය ත්‍යාග කොට දෙන ඒ සත්පුරුෂ මන වඩන දෑය ලබා" යි.

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ විසාලානුවර වැසි උග්‍ර ගෘහපතිහු මේ අනුමෝදනායෙන් අනුමෙවූනී කොට හුනස්නෙන් නැඟී නික්මුනු සේක. ඉක්බිති විසාලාවැසි උග්‍ර ගෘහපති පසු කලෙක කලුරිය කෙළේ ය. තවද කලුරිය කළා වූ ම විසල්වැසි උග්‍ර ගෘහපති ධ්‍යාන සිතින් උපන් එක්තරා (ශුද්ධාවාස) දෙව්කායකට පිළිසඳ විසින් පැමිණියේ ය.

තෙන ඛො පන සමයෙන භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො **උග්ගො** දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො උග්ගං දෙවපුත්තං භගවා එතදවොච:

'කච්චි තෙ උග්ග යථාධිප්පායො'ති. 'තග්ඝ මෙ භන්තෙ යථාධිප්පායො'ති.

අථ ඛො භගවා උග්ගං දෙවපුත්තං ගාථාහි අජ්ඣභාසි:

48. මනාපදායී ලභතෙ මනාපං
අග්ගස්ස දාතා ලභතෙ පුනග්ගං,
වරස්ස දාතා වරලාභි හොති
සෙට්ඨන්දදො සෙට්ඨමුපෙති ඨානං.

49. යො අග්ගදායී වරදායී සෙට්ඨදායී ච යො නරො,
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජතී"ති.

### 5. 1. 5. 5.

### [ පුඤ්ඤාභිසන්දසුත්තං ]

**[සාවත්ථිනිදානං:]**

45. පඤ්චිමෙ භික්ඛවෙ පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා සොවග්ගිකා සුඛවිපාකා සග්ගසංවත්තනිකා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. කතමෙ පඤ්ච?

යස්ස භික්ඛවෙ භික්ඛු චීවරං පරිභුඤ්ජමානො අප්පමාණං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති, අප්පමාණො තස්ස පුඤ්ඤාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

යස්ස භික්ඛවෙ භික්ඛු පිණ්ඩපාතං පරිභුඤ්ජමානො -පෙ- විහාරං පරිභුඤ්ජමානො -පෙ- මඤ්චපීඨං පරිභුඤ්ජමානො -පෙ- ගිලානපච්චය-භෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජමානො අප්පමාණං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති, අප්පමාණො තස්ස පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා සොවග්ගිකා සුඛවිපාකා සග්ගසංවත්තනිකා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති.

ඉමෙහි ච පන භික්ඛවෙ පඤ්චහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගහෙතුං: "එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තතී"ති. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධො-ත්වෙව සඞ්ඛං ගච්ඡති.

එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එ කල්හි උග්‍ර දෙව්පුත්‍ර මධ්‍යමරාත්‍රිය පැමිණි කල්හි මන වඩනා සිරුරුපැහැ ඇති ව සියලු දෙව්රම් වෙහෙර බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව සිටියේ ය. එකත්පස් ව සිටි උග්‍ර දෙව්පුත්‍ර හට භාග්‍යවතුන් වහන්සේ මෙල වදාළ සේක:

'කිම උග්‍රය, තොපගේ අදහස් වූ පරිදි වී දැ'යි.

'වහන්ස, එකාන්තයෙන් මාගේ අදහස් වූ පරිදි වී යැ'යි.

එ කල්හි බුදුහු උග්‍ර දෙව්පුත්‍ර හට ගාථායෙන් වදාළහ:

48. මනාප දෑ දෙනුයේ මනාප දෑ ලබයි. අග්‍ර වූ දෑය දෙනුයේ පෙරළා අග්‍ර වූ සුව ලබයි. උතුම් දෑය දෙනුයේ උතුම් දෑය ලබන්නේ වෙයි. ශ්‍රෙෂ්ඨය දෙනුයේ ශ්‍රෙෂ්ඨ වූ ස්වර්ගස්ථානයට පැමිණේ.

49. යමෙක් අග්‍රදායී වරදායී වේ ද, යම් මිනිසෙක් ශ්‍රෙෂ්ඨදායීත් වේ ද, හේ යම් යම් තැනෙක උපදනේ නම් දීර්ඝායු ඇත්තේ යශස් ඇත්තේ වේ ය යි.

## 5. 1. 5. 5.

## [ පුඤ්ඤාභිසන්ද සූත්‍රය ]

[සැවැත්නිදාන යි:]

45. මහණෙනි, සුව එළවන, අග්‍ර රූපාදි සම්පත් මොනවට ගෙණ දෙන, සුඛවිපාක ඇති, ස්වර්ගය පිණිස පවත්නා, ඉෂ්ටබව පිණිස කාන්තබව පිණිස මන වඩන පිණිස හිත පිණිස සුඛ පිණිස පවත්නා මේ පුණ්‍යප්‍රවාහයෝ කුශලප්‍රවාහයෝ (කුශලොපපත්තීහු) පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, යම් දායකයකුගේ සිවුරු වළඳ කරණ මහණෙක් අප්‍රමාණ අර්හත්ඵලසමාධිය උපයාගෙණ වෙසේ ද ඒ දායක හට සුව එළවන, මනා අග්‍ර රූපාදිසම්පත් දෙන, සුඛවිපාක ඇති, ස්වර්ගය පිණිස පවත්නා, ඉෂ්ටබව පිණිස මන වඩන පිණිස හිත පිණිස සුඛ පිණිස පවත්නා අප්‍රමාණ පුණ්‍ය-ප්‍රවාහයෙක් කුශලප්‍රවාහයෙක් වෙයි.

මහණෙනි, යම් දායකයකුගේ පිඬුවා වළඳ කරණ මහණෙක් ... වෙහෙර වළඳ කරණ මහණෙක් ... මැසි පුටු වළඳ කරණ මහණෙක් ... ගිලන්පස බෙහෙසත් පිරිකර වළඳ කරණ මහණෙක් අප්‍රමාණ අර්හත්ඵලසමාධියට එළඹ වෙසේ ද, ඔහට සුව එළවන, සවග්‍රරූපාදිසම්පත් ගෙණ දෙන, සුඛවිපාක ඇති, ස්වර්ගය පිණිස පවත්නා, ඉෂ්ටබව පිණිස කාන්තබව පිණිස මන වඩන පිණිස හිත පිණිස සුඛ පිණිස පවත්නා අප්‍රමාණ පුණ්‍යප්‍රවාහයෙක් කුශල ප්‍රවාහයෙක් වෙයි.

මහණෙනි, සුඛය ගෙණ දෙන සවග්‍රසම්පත් පිණිස වැටෙන, සුඛ-විපාකාවහ වූ, ස්වර්ගය පිණිස පවත්නා, ඉෂ්ටබව පිණිස කාන්ත බව පිණිස මන වඩන පිණිස හිත පිණිස සුඛ පිණිස පවත්නා මේ පුණ්‍යප්‍රවාහයෝ කුශලප්‍රවාහයෝ පස් දෙන ය.

මහණෙනි, මේ පඤ්චපුණ්‍යප්‍රවාහයෙන් කුශලප්‍රවාහයෙන් සමන්වාගත ආර්‍ය්‍යශ්‍රාවකයාගේ – "සුව එළවන සවග්‍රරූපාදිසම්පත් ගෙණ දෙන සුඛ විපාක ඇති ස්වර්ගය පිණිස පවත්නා ඉෂ්ටබව පිණිස කාන්තබව පිණිස මන වඩන පිණිස හිත පිණිස සුඛ පිණිස පවත්නා පුණ්‍යප්‍රවාහය කුශලප්‍රවාහය මෙ තෙක" සියා පුණ්‍යප්‍රමාණය ගන්නට සුකර නො වේ. වැලිත් අසඞ්ඛ්‍යය වූ අප්‍රමෙය වූ මහාපුණ්‍යස්කන්ධයෙක් ම යැ යි ගණනට යෙයි.

සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දෙ න සුකරං උදකස්ස පමාණං ගහෙතුං 'එත්තකානි උදකාළ්හකානීති වා එත්තකානි උදකාළ්හකසතානීති වා එත්තකානි උදකාළ්හකසතසහස්සානී'ති වා. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාඋදකක්ඛන්ධො ත්වෙව සඞ්ඛං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ ඉමෙහි පඤ්චහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගහෙතුං 'එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තතී'ති. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධො ත්වෙව සඞ්ඛං ගච්ඡතීති.

50. මහොදධිං අපරිමිතං මහාසරං
බහුභෙරවං රතනගණානමාලයං,
නජ්ජො යථා නරගණ සඞ්ඝසෙවිතා[1]
පුථූ සවන්ති උපයන්ති සාගරං.

51. එවං නරං අන්නදපානවත්ථදං
සෙය්‍යා නිසජ්ජත්ථරණස්ස දායකං,
පුඤ්ඤස්ස ධාරා උපයන්ති පණ්ඩිතං
නජ්ජො යථා වාරිවහාව සාගරන්ති.

### 5. 1. 5. 6.

### [ පඤ්චසම්පදා සුත්තං ]

[සාවත්ථිනිදානං:]

46. පඤ්චිමා භික්ඛවෙ සම්පදා. කතමා පඤ්ච?

සද්ධාසම්පදා, සීලසම්පදා, සුතසම්පදා, චාගසම්පදා, පඤ්ඤාසම්පදා. ඉමා ඛො භික්ඛවෙ පඤ්ච සම්පදාති.

### 5. 1. 5. 7.

### [ පඤ්චධනසුත්තං ]

[සාවත්ථිනිදානං:]

47. පඤ්චිමානි භික්ඛවෙ ධනානි. කතමානි පඤ්ච? සද්ධාධනං, සීලධනං, සුතධනං, චාගධනං, පඤ්ඤාධනං

කතමඤ්ච භික්ඛවෙ සද්ධාධනං? ඉධ භික්ඛවෙ අරියසාවකො සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං: "ඉතිපි සො භගවා අරහං -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ඉදං වුච්චති භික්ඛවෙ සද්ධාධනං.

කතමඤ්ච භික්ඛවෙ සීලධනං? ඉධ භික්ඛවෙ අරියසාවකො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති ඉදං වුච්චති භික්ඛවෙ සීලධනං.

කතමඤ්ච භික්ඛවෙ සුතධනං? ඉධ භික්ඛවෙ අරියසාවකො බහුස්සුතො හොති. [යෙ තෙ ධම්මා -පෙ- කෙවලපරිපුණ්ණං බ්‍රහ්මචරියං පකාසෙන්ති. තථාරූපාස්ස ධම්මා] -පෙ-* දිට්ඨියා සුප්පටිවිද්ධා. ඉදං වුච්චති භික්ඛවෙ සුතධනං.

---

1. මච්ඡගණසඞ්ඝසෙවිතා - ස්‍යා.

* පෙය්‍යාලමුඛෙහි සඞ්ඛිත්තා චතුක්කනිපාතෙ උරුවෙලවග්ගෙ දුතියසුත්තෙ ආගතනයෙන වෙදිතබ්බං. (පිට්ඨෙකා - 46.)

මහණෙනි, දියලහ මෙ තෙකැයි හෝ දියලහසිය මෙ තෙකැයි හෝ දියලහදහස් මෙ තෙකැයි හෝ දියලහසුවහස් මෙ තෙකැයි හෝ යම්සේ මහමුහුදෙහි දිය පමණ ගන්නට නො හැකි වේ ද, අසඞ්ඛ්‍යය වූ අප්‍රමෙය වූ මහත් උදකස්කන්ධයෙක් ම යැ යි ගණනට යේ ද, මහණෙනි, එ පරිදි ම මේ පඤ්චපුණ්‍යප්‍රවාහයෙන් කුශලප්‍රවාහයෙන් සමන්‍වාගත ආර්‍ය්‍යශ්‍රාවකයාගේ- "සුඛ ඵලවත සවග්‍ර්‍රූපාදිසම්පත් ගෙණ දෙන සුඛවිපාක ඇති ස්වර්ගීය පිණිස පවත්නා ඉෂ්ටබව පිණිස කාන්තබව පිණිස මන වඩන පිණිස හිතය පිණිය සුඛය පිණිස පවත්නා පුණ්‍යප්‍රවාහය කුශලප්‍රවාහය මෙ තෙක" කියා පින්පමණ ගන්නට සුකර නො වේ. අසඞ්ඛ්‍යය වූ අප්‍රමෙය වූ මහත් පුණ්‍යස්කන්ධයෙක් ම ය යි ගණනට යෙයි.

50. අපරිමිත වූ බොහොබිහිසුනු අරමුණු ඇති සත්රුවන්ගණට නිවෙස් වූ මහදියකඳ ඇති සයුරුමහදහතලාව කරා නරගණසමූහයා විසින් සෙවුනා ලද බොහෝ කොට ගලන නදීහු යම්සේ වැදගණිද්ද,

51. එ පරිදි ම අන්නපානවස්ත්‍රදායක වූ ශය්‍යානිෂද්‍යාස්තරණදායක වූ පණ්ඩිත මිනිසා කරා පුණ්‍යධාරාවෝ වැදගණිත්. දිය වහන නදීන් සයුර කරා වැදගන්නාක් සෙයිනි.

### 5. 1 5. 6.

### [ පඤ්චසම්පදා සූත්‍රය ]

**[සැවැත්නිදාන යි:]**

46. මහණෙනි, මේ සම්පත්හු පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්:

ශ්‍රද්ධාසම්පත් ය, ශීලසම්පත් ය, ශ්‍රුතසම්පත් ය, ත්‍යාගසම්පත් ය, ප්‍රඥසම්පත් ය. මහණෙනි, මේ පඤ්චසම්පත්හු යි.

### 5. 1. 5. 7.

### [ පඤ්චධන සූත්‍රය ]

**[සැවැත්නිදානයි:**

47. මහණෙනි, මේ ධනයෝ පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්: ශ්‍රද්ධාධන ය, ශීලධන ය, ශ්‍රුතධන ය, ත්‍යාගධනය, ප්‍රඥධන යි.

මහණෙනි, ශ්‍රද්ධාධන කවරේ ය? මහණෙනි, මෙ සස්නෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක සැදැහැති වෙයි. තථාගතයන් වහන්සේගේ සම්බෝධිය හදහයි: "මේ මේ කරුණින් ඒ භාග්‍යවත්හු අර්හත්හ .. දෙව්මිනිසුන්ට ශාස්තෘයහ. සියුසස් අවබොධ කළහ. භාග්‍යවත්හ" කියා යි. මහණෙනි, මේ ශ්‍රද්ධාධනය යි කියනු ලැබේ.

මහණෙනි, ශීලධන කවරේ ය? මහණෙනි, මෙ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක පණිවායෙන් දුරු වූයේ වෙයි .. මදපමාදෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ වෙයි. මහණෙනි, මේ ශීලධනය යි කියනු ලැබේ.

මහණෙනි, ශ්‍රුතධන කවරේ ය? මහණෙනි, මෙ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක බහුශ්‍රැත වෙයි. ... යම් ඒ දහම්හු ... කෙවලපරිපූර්ණ වූ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙද්ද, එබඳු දහම්හු ඔහු විසින් ... ප්‍රඥවෙන් සුප්‍රවිදිත වෙති. මහණෙනි, මේ ශ්‍රුතධනය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ චාගධනං? ඉධ භික්ඛවෙ අරියසාවකො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. ඉදං වුච්චති භික්ඛවෙ චාගධනං.

කතමඤ්ච භික්ඛවෙ පඤ්ඤාධනං? ඉධ භික්ඛවෙ අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. ඉදං වුච්චති භික්ඛවෙ පඤ්ඤාධනං.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච ධනානීති.

52. යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා,
සීලඤ්ච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං.

53. සඞ්ඝෙ පසාදො යස්සත්ථි උජුභූතඤ්ච දස්සනං,
අදලිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

54. තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්මදස්සනං,
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනං.

## 5. 1. 5. 8

## [ අලබ්භනීයඨානසුත්තං ]

[සාවත්ථිනිදානං:]

48. පඤ්චිමානි භික්ඛවෙ අලබ්භනීයානි ඨානානි සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. කතමානි පඤ්ච?

'ජරාධම්මං මා ජීරී'ති අලබ්භනීයං ඨානං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. 'ව්‍යාධිධම්මං මා ව්‍යාධීයී'ති -පෙ- 'මරණධම්මං මා මීයී'ති -පෙ- 'ඛයධම්මං මා ඛීයී'ති -පෙ- 'නස්සනධම්මං මා නස්සී'ති අලබ්භනීයං ඨානං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං.

අස්සුතවතො භික්ඛවෙ පුථුජ්ජනස්ස ජරාධම්මං ජීරති. සො ජරාධම්මෙ ජිණ්ණෙ න ඉති පටිසඤ්චික්ඛති: "න ඛො මය්හමෙවෙකස්ස[1] ජරාධම්මං ජීරති. අථ ඛො යාවතා සත්තානං ආගති, ගති, චුති, උපපත්ති' සබ්බෙසං සත්තානං ජරාධම්මං ජීරති. අහඤ්චෙව ඛො පන ජරාධම්මෙ ජිණ්ණෙ සොචෙය්‍යං, කිලමෙය්‍යං, පරිදෙවෙය්‍යං, උරත්තාළිං කන්දෙය්‍යං, සම්මොහං ආපජ්ජෙය්‍යං, භත්තම්පි මෙ නච්ඡාදෙය්‍ය. කායෙපි දුබ්බණ්ණියං ඔක්කමෙය්‍ය. කම්මන්තාපි නප්පවත්තෙය්‍යුං. අමිත්තාපි අත්තමනා අස්සු. මිත්තාපි දුම්මනා අස්සු"ති. සො ජරාධම්මෙ ජිණ්ණෙ සොචති, කිලමති, පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො විද්ධො සවිසෙන සොකසල්ලෙන අත්තානංයෙව පරිතාපෙති.

1. මය්හමෙවෙකස්ස - සයා, මජ්සං.

මහණෙනි, ත්‍යාගධන කවරේ ය? මහණෙනි, මෙ සස්නෙහි, ආර්‍ය්‍ය-ශ්‍රාවක පැහුමල හා මසුරු ඇති සිතින් අගාරයෙහි වෙසෙයි. විහුවූ තෑගි ඇති වෙයි. දන් දෙනුවට දෙවූ අත් ඇති වෙයි. දීමෙහි ඇලුම් ඇති වෙයි. යදනට නිසි වෙයි. දෙයධර්මසංවිභාගයෙහි ඇලුම් ඇති වෙයි. මහණෙනි, මේ ත්‍යාගධනය යි කියනු ලැබේ.

මහණෙනි, ප්‍රඥාධන කවරේ ය? මහණෙනි, මෙ සස්නෙහි ආර්‍ය්‍ය-ශ්‍රාවක ප්‍රඥාවත් වෙයි. ආර්‍ය්‍ය වූ නිර්වේධක වූ සම්‍යග්දුඃඛක්‍ෂයගාමී වූ උදයාස්තගාමී වූ ප්‍රඥායෙන් සමන්විාගත වෙයි. මහණෙනි, මේ ප්‍රඥාධනය යි කියනු ලැබේ.

මහණෙනි, මේ පඤ්චධනයෝ යි.

52. යමකුගේ ශ්‍රද්ධාව තථාගතයන් කෙරෙහි (මූලජාතවශයෙන්) සුපිහිටියා අචල වේ ද, යමකුගේ ශීලයත් කල්‍යාණ වූයේ ආර්‍ය්‍යයනට කාන්ත වූයේ පසස්නා ලද වේ ද,

53. යමකුහට සඟුන් කෙරෙහි ප්‍රසාදය ඇත් ද, ඍජු දර්‍ශන (සම්‍යග්දෘෂ්ටි) ඇත් ද, ඔහු නොදිළිඳු ය යි කීහු. ඔහුගේ ජීවිතය නොසිස් වේ.

54. එහෙයින් නුවණැතියේ බුදුන්ගේ අනුශාසනය සිහි කරන්නේ ශ්‍රද්ධා හා ශීල හා ප්‍රසාද හා ධර්මදර්‍ශන හා පුනපුනා යෙදෙන්නේ ය.

## 5. 1. 5. 8.

## [ අලබ්භනීයඨාන සූත්‍රය ]

[සාවත්ථිනිදාන යි:]

48. මහණෙනි, ලොව්හි මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරකු විසින් වේවයි, බඹකු විසින් වේවයි, අන් කිසිවකු විසින් වේවයි නො ලද හැකි කරුණු පසෙකි. කවර පසෙක යත්:

"(මාගේ) ජරාධර්මය (ජරා සවභාව මා) නහමක් දිරාවා" යනු ලොව්හි මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරකු විසින් වේවයි, අන් කවර කෙනකුදු විසින් වේවයි නො ලද හැකි කරුණෙකි. මාගේ ව්‍යාධිධර්මය මා නහමක් පෙළාවායි යනු ... මරණධර්මය නහමක් මියේවා"යි යනු ... ක්‍ෂයධර්මය නහමක් ක්‍ෂය කෙරේවා යි යනු ... නස්නා සවභාවය නහමක් නැසේවා යි" යනු ලොව්හි මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි මරකු විසින් වේවයි බඹකු විසින් වේවයි අන් කවරකු විසින් වේවයි නො ලද හැකි කරුණෙකි.

මහණෙනි, අශ්‍රුතවත් පෘථග්ජනයාගේ ජරාධර්මය දිරන්නේ ය. ජරා-ධර්මය දිරත් ම හෙ මෙසේ නුවණින් නො විමසයි: "එකලා මාගේ ම ජරාධර්මය නො දිරයි. වැලි යම් තාක් සත්ත්වයන්ගේ (ගුධාගමන සඞ්ඛ්‍යාත) ආගතිය (පරලොක) ගතිය, ච්‍යුතිය, උපපත්තිය වේ නම් එ තාක් සියලු සත්ත්වයන්ගේ ජරාධර්මය දිරන්නේ ය. ජරාධර්මය දිරත් ම මමත් ශොක කෙරෙම් නම්, ක්ලාන්ත වෙම් නම්, පරිදෙවනා කෙරෙම් නම්, ළෙහි අත් පැහැර හඬම් නම්, සිහිමුළාවට යෙම් නම්, මට බතුදු නො රුස්නේ ය. කයෙහිදු දුර්වර්ණභාවය වැදගන්නේ ය. කර්මාන්තයෝ ද නො පවත්නාහ. අමිත්‍රයෝ ද සතුටුසිතැති වන්නාහ. මිත්‍රයෝ ද නොසතුටුසිතැත්තාහු වන්නාහ" කියා යි. හෙ ජරාධර්මය දිරත් ම ශොක කරයි. ක්ලාන්ත වෙයි. පරිදෙවනා කරයි. ළෙහි අත් පැහැර හඬයි. සිහිමුළාවට යෙයි. මහණෙනි, මෙ අශ්‍රුතවත් පෘථග්ජන විසැති සෝහුලින් විදුනා ලදුයේ ම තමත් තවා ය යි කියනු ලැබේ.

පුන ච පරං භික්ඛවෙ අස්සුතවතො පුථුජ්ජනස්ස බ්‍යාධිධම්මං බ්‍යාධියති -පෙ- මරණධම්මං මීයති -පෙ- ඛයධම්මං ඛීයති -පෙ- නස්සනධම්මං නස්සති. සො නස්සනධම්මෙ නට්ඨෙ න ඉති පටිසඤ්චික්ඛති: "න ඛො මය්හමෙවෙකස්ස නස්සනධම්මං නස්සති. අථඛො යාවතා සත්තානං ආගති, ගති, චුති, උපපත්ති, සබ්බෙසං සත්තානං නස්සනධම්මං නස්සති. අහඤ්චෙව ඛො පන නස්සනධම්මෙ නට්ඨෙ සොචෙය්‍යං, කිලමෙය්‍යං, පරිදෙවෙය්‍යං, උරත්තාළිං කන්දෙය්‍යං, සම්මොහං ආපජ්ජෙය්‍යං, භත්තම්පි මෙ නච්ඡාදෙය්‍ය. කායෙපි දුබ්බණ්ණියං ඔක්කමෙය්‍ය. කම්මන්තාපි නප්පවත්තෙය්‍යුං. අමිත්තාපි අත්තමනා අස්සු. මිත්තාපි දුම්මනා අස්සූ"ති. සො නස්සනධම්මෙ නට්ඨෙ සොචති, කිලමති, පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො විද්ධො සවිසෙන සොකසල්ලෙන අත්තානං යෙව පරිතාපෙති.

සුතවතො ච ඛො භික්ඛවෙ අරියසාවකස්ස ජරාධම්මං ජීරති. සො ජරාධම්මෙ ජිණ්ණෙ ඉති පටිසඤ්චික්ඛති: "න ඛො මය්හමෙවෙකස්ස ජරාධම්මං ජීරති. අථ ඛො යාවතා සත්තානං ආගති, ගති, චුති, උපපත්ති, සබ්බෙසං සත්තානං ජරාධම්මං ජීරති. අහඤ්චෙව ඛො පන ජරාධම්මෙ ජිණ්ණෙ සොචෙය්‍යං. කිලමෙය්‍යං, පරිදෙවෙය්‍යං, උරත්තාළිං කන්දෙය්‍යං, සම්මොහං ආපජ්ජෙය්‍යං, භත්තම්පි මෙ නච්ඡාදෙය්‍ය. කායෙපි දුබ්බණ්ණියං ඔක්කමෙය්‍ය, කම්මන්තාපි නප්පවත්තෙය්‍යුං. අමිත්තාපි අත්තමනා අස්සු. මිත්තාපි දුම්මනා අස්සූ"ති. සො ජරාධම්මෙ ජිණ්ණෙ න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ අරියසාවකො අබ්බහි[1] සවිසං සොකසල්ලං යෙන විද්ධො අස්සුතවා පුථුජ්ජනො අත්තානං යෙව පරිතාපෙති. අසොකො විසල්ලො අරියසාවකො අත්තානං යෙව පරිනිබ්බාපෙති.

පුනචපරං භික්ඛවෙ සුතවතො අරියසාවකස්ස ව්‍යාධිධම්මං ව්‍යාධියති -පෙ- මරණධම්මං මීයති -පෙ- ඛයධම්මං ඛීයති -පෙ- නස්සනධම්මං නස්සති. සො නස්සනධම්මෙ නට්ඨෙ ඉතිපටිසඤ්චික්ඛති: "න ඛො මය්හමෙවෙකස්ස නස්සනධම්මං නස්සති. අථ ඛො යාවතා සත්තානං ආගති, ගති, චුති, උපපත්ති, සබ්බෙසං නස්සනධම්මං නස්සති. අහඤ්චෙව ඛො පන නස්සනධම්මෙ නට්ඨෙ සොචෙය්‍යං, කිලමෙය්‍යං, පරිදෙවෙය්‍යං උරත්තාළිං කන්දෙය්‍යං, සම්මොහං ආපජ්ජෙය්‍යං, භත්තම්පි මෙ නච්ඡාදෙය්‍ය. කායෙ පි දුබ්බණ්ණියං ඔක්කමෙය්‍ය. කම්මන්තාපි නප්පවත්තෙය්‍යුං. අමිත්තාපි අත්තමනා අස්සු. මිත්තාපි දුම්මනා අස්සූ"ති. සො නස්සනධම්මෙ නට්ඨෙ න සොචති, න කිලමති න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ සුතවා අරියසාවකො අබ්බහි[1] සවිසං සොකසල්ලං යෙන විද්ධො අස්සුතවා පුථුජ්ජනො අත්තානං යෙව පරිතාපෙති. අසොකො විසල්ලො අරියසාවකො අත්තානං යෙව පරිනිබ්බාපෙතී"ති.

1. අබ්බුහි - ස්‍යා, මජසං

තව ද මහණෙනි, අශ්‍රුතවත් පෘථග්ජනයාගේ ව්‍යාධිධර්මය පෙළයි ... මරණධර්මය මැරේ ... ක්‍ෂයධර්මය ක්‍ෂීණ වේ ... නස්නා ධර්මය නැසේ. හේ නස්නාසැහැවිය නැසෙත් ම මෙසේ නුවණින් නො විමසන්නේ ය: “එකලා මාගේ ම නස්නා ධර්මය නො නස්නේ ය. වැලිත් යම් තාක් සත්ත්වයන්ගේ ආගතිය, ගතිය, ච්‍යුතිය, උපප්‍රාප්තිය වේ නම්, එ තාක් හැම සතුන්ගේ නස්නා ධර්මය නස්නේ ය. මමත් නශ්‍යමානධර්මය නසුත් ම ශොක කෙරෙම් නම්, ක්ලාන්ත වෙම් නම් පරිදෙවනා කෙරෙම් නම්, ළෙහි අත් පැහැර හඬම් නම්, සම්මෝහයට යෙම් නම්, මට බතුදු නො රුස්නේ ය. කයෙහිදු දුර්වර්ණභාවය වදනේ ය. කර්මාන්තයෝ ද නො පවත්නාහ. අමිතුරෝ ද සතුටු සිතැත්තාහු වන්නාහ. මිතුරෝ ද නොසතුටු සිතැත්තාහු වන්නාහ’ කියා සි. නස්නාසැහැවිය නසුත් ම හෙ ශොක කෙරෙයි, ක්ලාන්ත වෙයි, පරිදෙවනා කරයි, ළෙහි අත් පැහැර හඬයි. සම්මෝහයට යෙයි. මහණෙනි මෙ අශ්‍රුතවත් පෘථග්ජන විෂ සහිත ශොකශල්‍යයෙන් විදුනා ලදුයේ ආත්මභාවය තවනේ ය යි කියනු ලැබේ

මහණෙනි, ශ්‍රුතවත් අරීසවුහුගේ ද ජරාධර්මය දිරන්නේ ය. හෙ ජරා ධර්මය දිරත් ම මෙසේ නුවණින් විමසා බලයි. “හුදෙකලා මාගේ ම ජරා ධර්මය නො දිරන්නේ ය. වැලිත් යම් තාක් සත්ත්වයන්ගේ ඊම, යාම, මැරීම, උපදීම වේ නම්, එ තාක් හැම සත්ත්වයන් ගේ ජරාධර්මය දිරයි. මමත් ජරාධර්මය දිරත් ම ශොක කෙරෙම් නම්, ක්ලාන්ත වෙම් නම්, පරිදෙවනා කරම් නම්, ළෙහි අත් පැහැර හඬම් නම්, සිහිමුළාවට පැමිණෙම් නම්, මට බතුදු නො රුස්නේ ය. කයෙහිත් දුර්වර්ණභාවය වැද ගන්නේ ය. කර්මාන්තයෝ ද නො පවත්නාහ. අමිත්‍රයෝ ද තුටු වන්නාහ. මිත්‍රයෝ ද නොසතුටු වන්නාහ” කියා සි. හෙ ජරාධර්මය දිරත් ම ශොක නො කරයි. ක්ලාන්ත නො වෙයි, පරිදෙවනා නො කෙරෙයි. ළෙහි අත් පැහැර නො හඬයි. සම්මෝහයට නො යෙයි. මහණෙනි, මෙ අරීසවු යම් සෝහුලෙකින් අශ්‍රුතවත් පෘථග්ජන ආත්මභාවය තවා නම්, එ සවිෂ ශොකශල්‍ය උදුළේ ය යි කියනු ලැබේ. ශොක නැතියේ විගතශල්‍ය වූ ආර්‍යශ්‍රාවක ආත්මභාවය පිරිනිවන්නේ (නිවාලන්නේ) ය.

තවද මහණෙනි, ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවකයාගේ ව්‍යාධිධර්මය ව්‍යාධි කෙරෙයි ... මරණධර්මය මියෙයි ... ක්‍ෂයධර්මය ක්‍ෂීණ කෙරෙයි... නස්නා ධර්මය නස්සි. හේ නස්නා දහම නට කල මෙසේ නුවණින් සලකයි: “එකලා මාගේ ම නස්නා දහම නො නස්නේ ය. වැලිදු යම් පමණ සත්ත්වයන්ගේ ආගතිය, ගතිය, චුතිය, උපපත්තිය වේ නම්’ එ හැම සතුන්ගේ නස්නා දහම නස්නේ ය. මම නස්නා දහම නට කල සොස්නෙම් නම්, කිලත් වෙම් නම්, වලප්නෙම් නම්, ලමඩියෙහි අත් පැහැර හඬන්නෙම් නම්, මුළාබවට වදනෙම් නම්, මට බත ද නො රුස්නේ ය. සිරුරෙහි ද දුර්වර්ණභාවය බස්නේ ය. කමන්හු ද නො පවත්නාහ. අමිත්‍රයෝ ද සතුටුසිතැති වෙති. මිත්‍රයෝ ද නො සතුටු වෙති”සි. හේ නස්නා දහම නට කල නො සොස්නේ ය. කලකුළු නො වන්නේ ය. නො වලප්නේ ය. ලමඩියෙහි අත් පැහැර නො හඬන්නේ ය. මුළාබවට නො වදනේ ය. මහණෙනි, මේ අරීසවු ශ්‍රැතවත් වූයේ, යමෙකින් විත්කැ අශ්‍රුතවත් පෘථග්ජන තමා ම තවන්නේ වේ ද, ඒ විස සහිත සෝහුල උපුළේ ය යි ද, නිශ්ශොක වූ ආර්‍යශ්‍රාවක තමා ම පිරිනිවන්නේ ය යි ද කියනු ලැබේ.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අලබ්භනීයානි ඨානානි සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

55 න සොචනාය න පරිදෙවනාය අත්ථො අලබ්භො[1] අපි අප්පකොපි,
සොචන්තමෙනං දුඛිතං විදිත්වා[2] පච්චත්ථිකා අත්තමනා භවන්ති.

56. යතො ච ඛො පණ්ඩිතො ආපදාසු න වෙධති අත්ථවිනිච්ඡයඤ්ඤූ,
පච්චත්ථිකාස්ස දුඛිතා භවන්ති දිස්වා මුඛං අවිකාරං පුරාණං.

57. ජප්පෙන මන්තෙන සුභාසිතෙන අනුප්පදානෙන පවෙණියා ච,
යථා යථා යත්ථ ලභෙථ අත්ථං තථා තථා තත්ථ පරක්කමෙය්‍ය.

58. සචෙ පජානෙය්‍ය අලබ්භනෙය්‍යො මයා ච[3] අඤ්ඤෙන වා එස අත්ථො
අසොචමානො අධිවාසයෙය්‍ය කම්මං දළ්හං කින්ති කරොමි'දානීති.[4]

## 5. 1. 5. 9.

## [ කොසලසුත්තං ]

49. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ **අනාථ-පිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො රාජා **පසෙනදි කොසලො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

(—) අථ ඛො අඤ්ඤතරො පුරිසො යෙන රාජා පසෙනදි කොසලො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස උපකණ්ණකෙ ආරොචෙසි: "මල්ලිකා දෙවී දෙව[5] කාලකතා"ති.

එවං වුත්තෙ රාජා පසෙනදි කොසලො දුක්ඛී දුම්මනො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදි.

අථ ඛො භගවා රාජානං පසෙනදිං කොසලං දුක්ඛිං දුම්මනං පත්තක්ඛන්ධං අධොමුඛං පජ්ඣායන්තං අප්පටිභානං විදිත්වා රාජානං පසෙනදිං කොසලං එතදවොච:

පඤ්චිමානි මහාරාජ අලබ්භනීයානි. ඨානානි සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. [කතමානි පඤ්ච? 'ජරා ධම්මං මා ජීරී'ති අලබ්භනීයං ඨානං] -පෙ-* [අසොචමානො අධිවාසයෙය්‍ය] කම්මං දළ්හං කින්ති කරොමි' දානීති.

1. අත්ථො ඉධ ලබ්භති-සයා අත්ථො ඉධ ලබ්භා - PTS අත්ථොධලබ්භා - මජසං
2. දුක්ඛිතං විදිත්වා-සයා. 3. මයා වා - සයා. 4. කරොමි ඉදානී-මජසං.
(—) තෙන ඛො පන සමයෙන මල්ලිකාදෙවී කාලකතා හොති - සයා, මජසං
5. දෙව දෙවී - සයා.
* ඉධ පෙය්‍යාලමුඛෙන සඞ්ඛිත්තං සබ්බං අලබ්භනීයඨානසුත්තෙ වුත්තනයෙන වෙදිතබ්බං.

මහණෙනි, මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරහු විසින් වේවයි, බඹහු විසින් වේවයි, ලොකයෙහි යම් ම කෙනකු විසින් වේවයි නො ලැබියහෙක කරුණු මේ පස් දෙන ය.

55. ශොචනායෙනුදු, පරිදෙවනායෙනුදු, අල්පමාත්‍ර වූ ද අර්ථයෙක් නො ලැබිය හෙන්නේ ය. තුලු සොස්නහු දුක්පත්හු දුන සතුරෝ සතුටු වෙති.

56. යම් දවසෙක කාරණාර්ථ විනිශ්චයෙහි දක්ෂ වූ පණ්ඩිත ආයතිශ්‍රාවකයා උපද්‍රව පැමිණෙත් ම නො කැපී සිටුනේ වේ ද, උහුගේ පසමිතුරෝ විකෘති නැති (ශොක නැති බැවින්) පැරණි ම වූ මුහුණ දුක දුඃඛිත වෙති.

57 වර්ණිහණනයෙනුදු, මන්ත්‍රපරිවර්තනයෙනුදු, සුභාෂිතකථනයෙනුදු, (ශතසහස්‍රාදි විසින් දෙන) අනුප්‍රදානයෙනුදු, පරම්පරාගත ආචීර්ණක්‍රියාමාර්ග-යෙනුදු, යම් යම් සැටියෙකින් යම් ආපදායෙක දී අර්ථසිද්ධිය ලැබිය හෙන්නේ වේ ද, එහි ලා ඒ ඒ සැටියෙන් පරාක්‍රම කරන්නේ ය.

58. ඉදින් මා විසිනුදු මෙරමා විසිනුදු තෙල අර්ථය නො ලැබිය හෙති යි දන්නේ නම්, නො සොස්මින් "(කළ)කම් දළ වෙයි. දැන් කුම් කරමි"යි සිතා ඉවසන්නේ ය.

## 5. 1. 5. 9

## [ කොසල සූත්‍රය ]

49. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති පසෙනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හිඳ.

එක්බිති අන්‍යතර පුරුෂයෙක් පසේනදි කොසොල්රජු වෙත එළැඹියේ ය. එළැඹ පසේනදී කොසොල් රජහුගේ කන්මුලැ "මල්ලිකා දෙවී කලුරිය කළෝ ය"යි සැළ කෙළේ ය.

මෙසේ කියත් ම, පසෙනදි කොසලරජු උපන් දුක් ඇතියේ නො සතුටු සිත් ඇතියේ හෙළු කඳ ඇතියේ යටිකුරු මුව ඇතියේ සිහිවිලි සිතනුයේ පිළිබහන් (නුවණක්) නැතියේ හිඳ.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ හටගත් ශොක ඇති නොසතුටු සිත් ඇති හෙළු සිරුරු කඳ ඇති යටිකුරු මුව ඇති සිහිවිලි සිතන පිළිබහන් නැති පසෙනදි කොසොල් රජු දුන වදුරු පසෙනදි කොසල රජුට තෙල කරුණ වදාළ සේක:

මහරජ, මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරකු විසින් වේවයි, බ්‍රහ්මයකු විසින් වේවයි, ලොව්හි කිසිදු කෙනකු විසින් වේවයි නො ලැබිය හෙන මෙ කරුණු පසෙකි. කවර පසෙක යත්: 'ජරාධර්මය නො දිරාවා'යි ... කිසිවකු විසින් නො ලැබිය හෙන කරුණෙකි.... "කර්මය දුඩි ය. දැන් කුමක් කෙරෙම් දැ"යි සිතා ශොක නො කෙරෙමින් ඉවසන්නේ ය.

## 5. 1. 5. 10.

### [ සොකසල්ලහරණසුත්තං* ]

50. එකං සමයං ආයස්මා **නාරදො පාටලිපුත්තෙ** විහරති **කුක්කුටාරාමෙ**. තෙන ඛො පන සමයෙන **මුණ්ඩස්ස** රඤ්ඤො **භද්දා** දෙවී කාලකතා හොති පියා මනාපා. සො භද්දාය දෙවියා කාලකතාය පියාය මනාපාය නෙව නහායති,[1] න විලිම්පති, න භත්තං භුඤ්ජති, න කම්මන්තං පයොජෙති. රත්තින්දිවං භද්දාය දෙවියා සරීරෙ අජ්ඣොමුච්ඡිතො. අථ ඛො මුණ්ඩො රාජා **පියකං** කොසාරක්ඛං[2] ආමන්තෙසි: තෙන හි සම්ම පියක භද්දාය දෙවියා සරීරං ආයසාය තෙලදොණියා පක්ඛිපිත්වා අඤ්ඤිස්සා ආයසාය දොණියා පටිකුජ්ජථ[3] යථා මයං භද්දාය දෙවියා සරීරං චිරතරං පස්සෙය්‍යාමාති.

එවං දෙවාති ඛො පියකො කොසාරක්ඛො මුණ්ඩස්ස රඤ්ඤො පටිස්සුත්වා භද්දාය දෙවියා සරීරං ආයසාය තෙලදොණියා පක්ඛිපිත්වා අඤ්ඤිස්සා ආයසාය දොණියා පටිකුජ්ජි.

අථ ඛො පියකස්ස කොසාරක්ඛස්ස එතදහොසි: "ඉමස්ස ඛො මුණ්ඩස්ස රඤ්ඤො භද්දා දෙවී කාලකතා පියා මනාපා. සො භද්දාය දෙවියා කාලකතාය පියාය මනාපාය නෙව නහායති, න විලිම්පති, න භත්තං භුඤ්ජති, න කම්මන්තං පයොජෙති. රත්තින්දිවං භද්දාය දෙවියා සරීරෙ අජ්ඣොමුච්ඡිතො. කං නු ඛො මුණ්ඩො රාජා සමණං වා බ්‍රාහ්මණං වා පයිරුපාසෙය්‍ය යස්ස ධම්මං සුත්වා සොකසල්ලං පජහෙය්‍යා"ති.

අථ ඛො පියකස්ස කොසාරක්ඛස්ස එතදහොසි: "අයං ඛො ආයස්මා නාරදො පාටලිපුත්තෙ විහරති කුක්කුටාරාමෙ. තං ඛො පන ආයස්මන්තං නාරදං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභානො වුද්ධො චෙව අරහා ච. යං නූන මුණ්ඩො රාජා ආයස්මන්තං නාරදං පයිරුපාසෙය්‍ය, අප්පෙව නාම මුණ්ඩො රාජා ආයස්මතො නාරදස්ස ධම්මං සුත්වා සොකසල්ලං පජහෙය්‍යා"ති. අථ ඛො පියකො කොසාරක්ඛො යෙන මුණ්ඩො රාජා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මුණ්ඩං රාජානං එතදවොච:

"අයං ඛො දෙව ආයස්මා නාරදො පාටලිපුත්තෙ විහරති කුක්කුටාරාමෙ. තං ඛො පනායස්මන්තං නාරදං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී කල්‍යාණපටිභානො වුද්ධො චෙව අරහා ච. යදි පන දෙවො ආයස්මන්තං නාරදං පයිරුපාසෙය්‍ය, අප්පෙව නාම දෙවො ආයස්මතො නාරදස්ස ධම්මං සුත්වා සොකසල්ලං පජහෙය්‍යා"ති.

තෙන හි සම්ම පියක ආයස්මන්තං නාරදං පටිවෙදෙහි. කථං හි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං පුබ්බෙ අප්පටිසංවිදිතො උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යාති.

1. නහායති - මජසං. 2 කොසාරක්ඛං - සයා 3. පටිකුජ්ජථ - සයා, මජසං.
* නාරදසුත්ත - උද්දාන; මජසං

## 5. 1. 5. 10

### [ සොකසල්ලහරණ සූත්‍රය ]

50. එක් කලෙක ආයුෂ්මත් නාරද තෙරණුවෝ පැළැළුප් නුවර කුක්කුටාරාමයෙහි වැඩ වෙසෙති. එ සමයෙහි මුණ්ඩ රජහුගේ ප්‍රිය වූ මනාප වූ භද්‍රා නම් දෙවී කලුරිය කළෝ ය. හෙ ප්‍රිය වූ මනාප වූ භද්‍රාදෙවිය කලුරිය කළ කල්හි, සනාත නො කෙරෙයි. විලෙවුන් නො ගල්වයි. බත් නුබුදුනේ ය. කර්මාන්ත නො යොදවයි. රෑ දෙවෙහි භද්‍රාදෙවියගේ සිරුරෙහි බෙහෙවින් මුසපත් වූයේ වෙයි. එක්බිති මුණ්ඩ රජ පියක නම් කොෂාරක්ෂකාමාත්‍යයා ඇමතී ය: යහළු පියකය, එහෙයින් ම භද්‍රා දෙවියගේ ශරීරය යමුවා තෙල් දෙණෙක්හි බහා අනෙක් යමුවා දෙණෙකින් වසාලව. "යම් පරිදි අපි භද්‍රාදෙවියගේ ශරීරය චිරතර කාලයක් දක්නමෝ දැ"යි

'දෙවයෙනි, එසේ ය'යි පියක නම් කොෂාරක්ෂක තෙම මුණ්ඩ රජුහට පිළිවදන් අස්වා භද්‍රාදෙවියගේ මළසිරුර යමුවා තෙල්දෙණෙක බහා අනෙක් යමුවා දෙණෙකින් වැසී ය. එක්බිති පියක නම් කොෂාරක්ෂක හට මෙ සිත් විය:

"මේ මුණ්ඩ රජුගේ ප්‍රිය වූ මන වඩන්නා වූ භද්‍රාදෙවිය කලුරිය කළෝ ය. හෙ ප්‍රිය වූ මනාප වූ භද්‍රාදෙවිය කලුරිය කළ කල්හි නො නහන්නේ ය. විලෙවුන් නො ද ගල්වන්නේ ය බත් නුබුදුනේ ය. කර්මාන්ත නො යොදවනේ ය. රෑදෙවෙහි භද්‍රාදෙවියගේ සිරුරෙහි බෙහෙවින් මුසපත් වූයේ වෙයි. මුණ්ඩ රජ යමකුගේ ධර්මය අසා සෝහුල් දුරලන්නේ නම්, එබඳු කවර නම් මහණකු හෝ බමුණකු හෝ පයර්‍යුපාසනය කෙරේ දැ"යි.

එක්බිති පියක නම් කොෂාරක්ෂකහට මෙ සිත් විය: "මෙ ආයුෂ්මත් නාරද තෙරණුවෝ පාටලිපුත්‍රයෙහි කුක්කුටාරාමයෙහි වාස කරත්. 'පණ්ඩිතයහ, ව්‍යක්තයහ, ප්‍රශස්තබුද්ධි ඇතියහ, බහුශ්‍රැතයහ, චිත්‍ර-කථිකහ, කලණ වැටැහීම් ඇතියහ, මහලුහ, අර්හත්හ' මෙ සේ එ ආයුෂ්මත් නාරද තෙරුන්ගේ කලණයසගී උස් ව නැංගේ ය. යම් හෙයෙකින් මුණ්ඩ රජ ආයුෂ්මත් නාරද තෙරුන් පයර්‍යුපාසනා කෙරේ නම්, එකාන්තයෙන් මුණ්ඩ රජ ආයුෂ්මත් නාරද තෙරුන්ගේ ධර්මය අසා ශොකශල්‍යය දුරලන්නේ ය"යි. එක්බිති පියක කොෂාරක්ෂක ඇමැති මුණ්ඩ රජු කරා එළැඹියේ ය. එළැඹ මුණ්ඩ රජහට තෙල කරුණ සැළ කෙළේ ය:

දෙවයෙනි, මෙ ආයුෂ්මත් නාරද තෙරණුවෝ පාටලිපුත්‍රයෙහි කුක්කුටාරාමයෙහි වෙසෙත්. "පණ්ඩිතයහ, ව්‍යක්තයහ, මෙධාවීහ, බහුශ්‍රැතයහ, චිත්‍රකථිහ, කල්‍යාණප්‍රතිභාන ඇතියහ, වෘද්ධයහ, අර්හත්හ" මෙ සේ එ ආයුෂ්මත්හුගේ කලණකිත්ඝොසෙක් උස් ව නැංගේ ය. ඉදින් දෙවයෝ ආයුෂ්මත් නාරද තෙරුන් පයර්‍යුපාසනය කෙරෙත් නම්, එකාන්තයෙන් දෙවයෝ ආයුෂ්මත් නාරද තෙරුන්ගේ දහම් අසා ශොකශල්‍යය හරිති"යි.

"යහළු පියකයෙනි, එ කරුණින් ම ආයුෂ්මත් නාරද තෙරුන් හට දන්වව. කෙසේ නම් මබඳුයෙක් සවිජිතයෙහි වෙසෙන මහණකු හෝ බමුණකු කරා පළමු ප්‍රතිඥා නො ලද්දේ එළැඹිය යුතු කොට සිතනේ දැ"යි.

එවං දෙවා'ති ඛො පියකො කොසාරක්ඛො මුණ්ඩස්ස රඤ්ඤො පටිස්සුත්වා යෙනායස්මා නාරදො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං නාරදං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පියකො කොසාරක්ඛො ආයස්මන්තං නාරදං එතදවොච: ඉමස්ස භන්තෙ මුණ්ඩස්ස රඤ්ඤො භද්දා දෙවී කාලකතා පියා මනාපා. සො භද්දාය දෙවියා කාලකතාය පියාය මනාපාය නෙව න්හායති, න විලිම්පති, න භත්තං භුඤ්ජති, න කම්මන්තං පයොජෙති. රත්තින්දිවං භද්දාය දෙවියා සරීරෙ අජ්ඣොමුච්ඡිතො. සාධු භන්තෙ ආයස්මා නාරදො මුණ්ඩස්ස රඤ්ඤො තථා ධම්මං දෙසෙතු, යථා මුණ්ඩො රාජා ආයස්මතො නාරදස්ස ධම්මං සුත්වා සොකසල්ලං පජහෙය්‍යා'ති.

'යස්සදානි පියක මුණ්ඩො රාජා කාලං මඤ්ඤතී'ති,

අථ ඛො පියකො කොසාරක්ඛො උට්ඨායාසනා ආයස්මන්තං නාරදං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන මුණ්ඩො රාජා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මුණ්ඩං රාජානං එතදවොච: කතාවකාසො ඛො දෙව ආයස්මතා නාරදෙන, යස්සදානි දෙවො කාලං මඤ්ඤතී'ති.

'තෙන හි සම්ම පියක භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙහී'ති

එවං දෙවා'ති ඛො පියකො කොසාරක්ඛො මුණ්ඩස්ස රඤ්ඤො පටිස්සුත්වා භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා මුණ්ඩං රාජානං එතදවොච: යුත්තානි ඛො තෙ දෙව භද්‍රානි භද්‍රානි යානානි. යස්ස'දානි දෙවො කාලං මඤ්ඤතී'ති.

අථ ඛො මුණ්ඩො රාජා භද්‍රං යානං[1] අභිරූහිත්වා භද්‍රෙහි යානෙහි[2] යෙන කුක්කුටාරාමො තෙන පායාසි මහච්චා රාජානුභාවෙන ආයස්මන්තං නාරදං දස්සනාය. යාවතිකා යානස්ස භූමි තාවතිකං යානෙන ගන්ත්වා යානා පච්චො-රොහිත්වා පත්තිකොව ආරාමං පාවිසි.

අථ ඛො මුණ්ඩො රාජා යෙනායස්මා නාරදො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං නාරදං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො මුණ්ඩං රාජානං ආයස්මා නාරදො එතදවොච:

පඤ්චිමානි මහාරාජ අලබ්භනීයානි ඨානානි සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. කතමානි පඤ්ච?

ජරාධම්මං මා ජීරීති අලබ්භනීයං ඨානං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං.

ව්‍යාධිධම්මං මා ව්‍යාධීයීති -පෙ- මරණධම්මං මා මීයීති, -පෙ- ඛය ධම්මං මා ඛීයීති -පෙ- නස්සනධම්මං මා නස්සීති අලබ්භනීයං ඨානං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

---

1. භද්‍රං භද්‍රං - යානං - මජ්ඣං. - භද්‍රානි භද්‍රානි යානානි - සයා.
2. භද්‍රෙහි භද්‍රෙහි යානෙහි - සයා. - මජ්ඣං.

පියක කොෂාරක්‍ෂ ඇමැති 'එසේ ය, දෙවයෙනි'යි මුණ්ඩ රජුට පිළිවදන් දී ආයුෂ්මත් නාරද තෙරණුවන් කරා එළඹියේ ය. එළඹ ආයුෂ්මත් නාරද තෙරණුවන් වැඳ එකත්පස් ව හිඳ. එකත්පස් ව හුන් පියක කොෂාරක්‍ෂ ඇමැති තෙල සැළ කෙළේ ය: වහන්ස, මේ මුණ්ඩරජුගේ ප්‍රියමනාප භද්‍රාදෙවිය කලුරිය කළා. හේ ප්‍රියමනාප භද්‍රාදෙවිය කලුරිය කළ සඳ නො ම නහයි. විලෙවුන් නො ගල්වයි. බත නො වළඳයි. කර්මාන්ත නො යොදවයි. දව රෑ භද්‍රාදෙවියගේ ශරීරයෙහි ගැලගත් සැහැවි ඇති ශොකමූර්ඡායෙන් මූර්ඡිත ය. අයදිමි, වහන්ස, යම් පරිදි මුණ්ඩරජ ආයුෂ්මත් නාරද තෙරණුවන්ගේ දහම් අසා ශොකශල්‍යය හරණේ වේ ද, ආයුෂ්මත් නාරද තෙරණුවෝ මුණ්ඩරජුට එසේ දහම් දෙසත් නම් මැනැව.

'පියකය, මුණ්ඩරජ යම් අවියකට කල් හඟනේ නම් දැන් කලි'.

එක්බිති පියක කොෂාරක්‍ෂ ඇමැති හුනස්නෙන් නැඟී ආයුෂ්මත් නාරද තෙරණුවන් සකසා වැඳ පැදකුණු කොට මුණ්ඩරජු කරා එළඹියේ ය. එළඹ මුණ්ඩරජුට තෙල කී: "දෙවයෙනි, දෙව තෙමේ යම් අවියකට දැන් කල් හඟනේ නම්, ආයුෂ්මත් නාරද තෙරණුවන් විසින් තෙල අවියට කළ අවකාශ ඇතැ"යි.

දරුව, පියකයෙනි, එහෙයින් භද්‍ර භද්‍ර යානයන් යොදව යි.

'දෙවයෙනි, එසේ ය'යි පියක කොෂාරක්‍ෂ ඇමැති මුණ්ඩරජුට පිළිවදන් අස්වා භද්‍රභද්‍රයානයන් යොදවා මුණ්ඩරජුට තෙලබස් කී: දෙවයෙනි, දෙව-තෙමේ යම් අවියකට දැන් කල් හඟනේ වේ නම් එයට භද්‍රභද්‍රයාන යුතු ව ඇතැ යි.

ඉක්බිති මුණ්ඩරජ භද්‍රයානයකට නැඟී භද්‍රයානයෙන් පරිවෘත ව කුක්කුටා-රාමය කරා මහත් රාජානුභාවයෙන් ආයුෂ්මත් නාරද තෙරණුවන් දක්නා සඳහා ගියේ. යානභූමි තෙක් යානයෙන් ගොස් යානයෙන් බැස පාදචාරීව ම අරමට පිවිසින.

ඉක්බිති මුණ්ඩරජ ආයුෂ්මත් නාරද තෙරණුවන් කරා එළඹියේ ය. එළඹ ආයුෂ්මත් නාරද තෙරණුවන් සකසා වැඳ එකත්පස් ව හිඳ. එකත්පස් ව හුන් මුණ්ඩ රජුට ආයුෂ්මත් නාරද තෙරණුවෝ තෙල දහම් දෙසූහ:

මහරජ, මහණකු විසින් වේවයි. බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරහු විසින් වේවයි, බඹහු විසින් වේවයි, ලොව යම් ම කිසිවකු විසින් වේවයි නො ලැබිය හෙන මේ කරුණු පසෙකි. කවර පසෙක යත්:

'ජරාධර්මය නහමක් දිරාව' යි මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරහු විසින් වේවයි, බඹහු විසින් වේවයි, ලොවැ යම් ම කිසිවකුන් විසින් වේවයි නො ලැබිය හෙන කරුණෙකි.

ව්‍යාධිධර්මය නහමක් පෙළාව යි ... මරණ ධර්මය නහමක් මියේව යි ... ක්‍ෂයධර්මය නහමක් කිය කෙරේව යි ... නශ්වරධර්මය නහමක් නො නස්සී ව යි මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, මරහු විසින් වේවයි, බඹහු විසින් වේවයි, ලොව යම් ම කවරකු විසින් වේවයි නො ලැබිය හෙන කරුණෙකි.

අස්සුතවතො බො මහාරාජ පුථුජ්ජනස්ස ජරාධම්මං ජීරති. සො ජරාධම්මෙ ජිණ්ණෙ න ඉති පටිසඤ්චික්ඛති: න බො මය්හමෙවෙකස්ස[1] ජරාධම්මං ජීරති. අථ බො යාවතා සත්තානං ආගති ගති චුති උපපත්ති, සබ්බෙසං සත්තානං ජරාධම්මං ජීරති. අහං චෙව බො පන ජරාධම්මෙ ජිණ්ණෙ සොචෙය්‍යං, කිලමෙය්‍යං, පරිදෙවෙය්‍යං, උරත්තාළිං කන්දෙය්‍යං, සම්මොහං ආපජ්ජෙය්‍යං, හත්තම්පි මෙ නච්ඡාදෙය්‍ය. කායෙපි දුබ්බණ්ණියං ඔක්කමෙය්‍ය. කම්මන්තාපි නප්පවත්තෙය්‍යුං.[2] අමිත්තා'පි අත්තමනා අස්සු. මිත්තා'පි දුම්මනා අස්සු'ති. සො ජරාධම්මෙ ජිණ්ණෙ සොචති, කිලමති, පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති. අයං වුච්චති මහාරාජ අස්සුතවා පුථුජ්ජනො විද්ධො සවිසෙන සොකසල්ලෙන අත්තානං යෙව පරිතාපෙති.

පුන ච පරං මහාරාජ අස්සුතවතො පුථුජ්ජනස්ස ව්‍යාධිධම්මං ව්‍යාධීයති -පෙ- මරණධම්මං මීයති -පෙ- ඛයධම්මං ඛීයති -පෙ- නස්සනධම්මං නස්සති. සො නස්සනධම්මෙ නට්ඨෙ න ඉති පටිසඤ්චික්ඛති: න බො මය්හමෙවෙකස්ස නස්සනධම්මං නස්සති. අථ බො යාවතා සත්තානං ආගති ගති චුති උපපත්ති, සබ්බෙසං සත්තානං නස්සනධම්මං නස්සති. අහඤ්චෙව බො පන නස්සනධම්මෙ නට්ඨෙ සොචෙය්‍යං, කිලමෙය්‍යං, පරිදෙවෙය්‍යං, උරත්තාළිං කන්දෙය්‍යං, සම්මොහං ආපජ්ජෙය්‍යං. හත්තම්පි මෙ නච්ඡාදෙය්‍ය. කායෙපි දුබ්බණ්ණියං ඔක්කමෙය්‍ය. කම්මන්තා'පි නප්පවත්තෙය්‍යුං.. අමිත්තාපි අත්තමනා අස්සු. මිත්තා'පි දුම්මනා අස්සු'ති. සො නස්සනධම්මෙ නට්ඨෙ සොචති, කිලමති, පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති. අයං වුච්චති මහාරාජ අස්සුතවා පුථුජ්ජනො විද්ධො සවිසෙන සොකසල්ලෙන අත්තානං යෙව පරිතාපෙතීති.

සුතවතො ච බො මහාරාජ අරියසාවකස්ස ජරාධම්මං ජීරති. සො ජරාධම්මෙ ජිණ්ණෙ ඉති පටිසඤ්චික්ඛති, න බො මය්හමෙවෙකස්ස ජරාධම්මං ජීරති. අථ බො යාවතා සත්තානං ආගති ගති චුති උපපත්ති, සබ්බෙසං සත්තානං ජරාධම්මං ජීරති. අහඤ්චෙව බො පන ජරාධම්මෙ ජිණ්ණෙ සොචෙය්‍යං, කිලමෙය්‍යං, පරිදෙවෙය්‍යං, උරත්තාළිං කන්දෙය්‍යං, සම්මොහං ආපජ්ජෙය්‍යං, හත්තම්පි මෙ නච්ඡාදෙය්‍ය. කායෙ'පි දුබ්බණ්ණියං ඔක්කමෙය්‍ය. කම්මන්තා'පි නප්පවත්තෙය්‍යුං. අමිත්තා'පි අත්තමනා අස්සු. මිත්තා'පි දුම්මනා අස්සු'ති. සො ජරාධම්මෙ ජිණ්ණෙ න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. අයං වුච්චති මහාරාජ සුතවා අරියසාවකො අබ්බහි[1] සවිසං සොකසල්ලං යෙන විද්ධො අස්සුතවා පුථුජ්ජනො අත්තානං යෙව පරිතාපෙති. අසොකො විසල්ලො අරියසාවකො අත්තානං යෙව පරිනිබ්බාපෙති.

1. මය්හෙවෙකස්ස - මජසං. 2. නප්පවත්තෙය්‍ය - මජසං. 3. අබ්බූහි - මජසං

මහරජ, අශ්‍රැතවත් පෘථග්ජනයාහට ජරාධර්මය දිරයි. හේ ජරාධර්මය දිරූ කල මෙසේ ප්‍රත්‍යවේක්ෂා නො කෙරෙයි: එකලා මාහට ම ජරාධර්මය නො දිරයි. වැලිදු යම් තාක් සත්ත්වයන්ගේ ආගතිය ගතිය ච්‍යුතිය උපපත්තිය වේ ද, එ හැම සතුන්ගේ ජරාධර්මය දිරයි. මම වනාහි ජරාධර්මය දිරූ කල ශොක කරන්නෙම් නම්, ක්ලාන්ත වන්නෙම් නම්, පරිදෙවනා කරන්නෙම් නම්, ළමැඩියෙහි අත් පැහැර හඬන්නෙම් නම්, සම්මෝහයට පැමිණෙම් නම්, මට බත ද නො රුස්නේ ය. කයෙහිදු දුර්වර්ණභාවය බැසගන්නේ ය. කර්මාන්තයෝත් නො පවත්නාහ. අමිත්‍රයෝත් සතුටු වන්නාහ. මිත්‍රයෝත් නො සතුටු වන්නාහ'යි. හේ ජරාධර්මය දිරූ කල සොස්නේ ය. ක්ලාන්ත වන්නේ ය. පරිදෙවනා කරන්නේ ය. ළෙහි අත් පැහැර හඬන්නේ ය. සම්මෝහයට පැමිණෙන්නේ ය. මහරජ, මේ අශ්‍රැතවත් පෘථග්ජන සවිෂශොකශල්‍යයෙන් විදුනා ලදුයේ තමා ම තවන්නේ ය යි කියනු ලැබේ.

තවද මහරජ, අශ්‍රැතවත් පෘථග්ජනයාහට ව්‍යාධිධර්මය පෙළයි ... මරණධර්මය මියෙයි ... ක්‍ෂයධර්මය ක්‍ෂය කෙරෙයි  නශ්වර ධර්මය නස්සි. හේ නශ්වර ධර්මය නට කල්හි මෙසේ ප්‍රත්‍යවේක්ෂා නො කරන්නේ ය: එකලා මට ම නශ්වර ධර්මය නො නස්සී, වැලිදු යම් තාක් සත්ත්වයන්ගේ ආගතිය ගතිය චුතිය, උපපත්තිය වේ ද, ඒ හැම සතුන්ගේ නශ්වරධර්මය නස්සී. මම ද වනාහි නශ්වර ධර්මය නට කල ශොක කෙරෙම් නම්, ක්ලාන්ත වෙම් නම්, පරිදෙවනා කෙරෙම් නම්, ළෙහි අත් ගසා හඬන්නෙම් නම්, සම්මෝහයට පැමිණෙම් නම්, මට බත ද නො රුස්නේ ය. කයෙහිදු දුර්වර්ණභාවය බැස ගන්නේ ය. කර්මාන්තයෝ ද නො පවත්නාහ. අමිත්‍රයෝ ද තුටු වන්නාහ. මිත්‍රයෝ ද නො සතුටු වන්නාහ යි. හේ නශ්වර ධර්මය නට කල්හි සොස්නේ ය. ක්ලාන්ත වන්නේ ය. පරිදෙවනා කරන්නේ ය. ළෙහි අත් පැහැර හඬන්නේ ය. සම්මෝහයට පැමිණෙන්නේ ය. මහරජ, මේ අශ්‍රැතවත් පෘථග්ජන සවිෂශොකශල්‍යයෙන් විදුනා ලදුයේ තමා ම තවන්නේ ය යි කියනු ලැබේ.

මහරජ, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට ද ජරාධර්මය දිරයි. හේ ජරාධර්මය දිරූ කල මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි: එකලා මාහට ම ජරාධර්මය නො දිරයි. වැලිදු යම් තාක් සත්ත්වයන්ගේ ආගතිය ගතිය චුතිය උපපත්තිය වේ ද, එ හැම සතුන්ගේ ජරාධර්මය දිරයි. මම ද ජරාධර්මය දිරූ කල ශොක කරන්නෙම් නම්, ක්ලාන්ත වන්නෙම් නම්, පරිදෙවනා කරන්නෙම් නම්, ළෙහි අත් පැහැර හඬන්නෙම් නම්, සම්මෝහයට යන්නෙම් නම්, බත ද මට නො රුස්නේ ය. කයෙහිදු දුර්වර්ණභාවය බැස ගන්නේ ය. කර්මාන්තයෝත් නො පවත්නාහ. අමිත්‍රයෝ සතුටු වන්නාහ. මිත්‍රයෝත් නො සතුටු වන්නාහ යි හේ ජරා සැහැවි දිරූ කල නො සොස්නේ ය. ක්ලාන්ත නො වන්නේ ය. පරිදෙවනා නො කරන්නේ ය. ළෙහි අත් පැහැර නො හඬන්නේ ය. සම්මෝහයට නො පැමිණෙන්නේ ය. මහරජ, මේ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක යමෙකින් විදුනා ලද අශ්‍රැතවත් පෘථග්ජන තමා ම තවන්නේ ද, ඒ සවිෂ ශොකශල්‍යය උපුටා හළේ ය යි කියනු ලැබේ. අශොක වූ විශල්‍ය වූ ආර්‍ය්‍යශ්‍රාවක තමා ම සන්හිඳුවන්නේය යි කියනු ලැබේ.

පුන ච පරං මහාරාජ සුතවතො අරියසාවකස්ස ව්‍යාධිධම්මං ව්‍යාධීයති -පෙ- මරණධම්මං මීයති -පෙ- ඛයධම්මං ඛීයති -පෙ- නස්සනධම්මං නස්සති. සො නස්සනධම්මෙ නට්ඨෙ ඉති පටිසඤ්චික්ඛති: න ඛො මය්හමේවෙකස්ස නස්සනධම්මං නස්සති. අථ ඛො යාවතා සත්තානං ආගති ගති චුති උපපත්ති, සබ්බෙසං සත්තානං නස්සනධම්මං නස්සති. අහඤ්චෙව ඛො පන නස්සනධම්මෙ නට්ඨෙ සොචෙය්‍යං, කිලමෙය්‍යං, පරිදෙවෙය්‍යං, උරත්තාළිං කන්දෙය්‍යං, සම්මොහං ආපජ්ජෙය්‍යං, භත්තම්පි මෙ නච්ඡාදෙය්‍ය. කායෙ'පි දුබ්බණ්ණියං ඔක්කමෙය්‍ය. කම්මන්තා'පි නප්පවත්තෙය්‍යුං. අමිත්තා'පි අත්තමනා අස්සු. මිත්තා'පි දුම්මනා අස්සූ'ති. සො නස්සනධම්මෙ නට්ඨෙ න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. අයං වුච්චති මහාරාජ සුතවා අරියසාවකො අබ්බහි සවිසං සොකසල්ලං යෙන විද්ධො අස්සුතවා පුථුජ්ජනො අත්තානං යෙව පරිතාපෙති. අසොකො විසල්ලො අරියසාවකො අත්තානං යෙව පරිනිබ්බාපෙති.

ඉමානි ඛො මහාරාජ පඤ්ච අලබ්භනීයානි ඨානානි සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති,

59. න සොචනාය පරිදෙවනාය අත්ථො අලබ්භො[1] අපි අප්පකොපි,
සොචන්තමෙනං දුඛිතං විදිත්වා පච්චත්ථිකා අත්තමනා භවන්ති.

60. යතො ච ඛො පණ්ඩිතො ආපදාසු න වෙධති අත්ථවිනිච්ඡයඤ්ඤූ,
පච්චත්ථිකාස්ස දුඛිතා භවන්ති දිස්වා මුඛං අවිකාරං පුරාණං.

61. ජප්පෙන මන්තෙන සුභාසිතෙන අනුප්පදානෙන පවෙණියා වා,
යථා යථා යත්ථ ලභෙථ අත්ථං තථා තථා තත්ථ පරක්කමෙය්‍ය.

62. සචෙ පජානෙය්‍ය අලබ්භනෙය්‍යො මයා ච අඤ්ඤෙන වා එසඅත්ථො
අසොචමානො අධිවාසයෙය්‍ය කම්මං දළ්හං කින්ති කරොමි'දානීති.

එවං වුත්තෙ මුණ්ඩො රාජා ආයස්මන්තං නාරදං එතදවොච: කො නාමො[2] අයං භන්තෙ ධම්මපරියායො'ති?

**සොකසල්ලහරණො** නාම අයං මහාරාජ ධම්මපරියායොති.

තග්ඝ භන්තෙ සොකසල්ලහරණො, තග්ඝ භන්තෙ සොකසල්ලහරණො. ඉමං හි මෙ භන්තෙ ධම්මපරියායං සුත්වා සොකසල්ලං පහීනන්ති.

---

1. -අත්ථො'ධලබ්භො- මජසං. 2 කො නුඛො - සීමු.

තවද මහරජ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාහට ව්‍යාධි ධර්මයගේ පෙළෙයි ... මරණධර්මය මියෙයි .. ක්‍ෂයධර්මය ක්‍ෂය වෙයි ... නශ්වරධර්මය නැසෙයි. හේ නශ්වරධර්මය නට කල්හි මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කරයි: 'එකලා මාගේ ම නශ්වරධර්මය නො නැසේ. වැලිදු යම් තාක් සත්ත්වයන්ගේ ආගතියෙක් ගතියෙක් ච්‍යුතියෙක් උත්පත්තියෙක් ඇත් ද, එ හැම සත්ත්වයන්ගේ නශ්වරධර්මය නැසේ, මම ද නශ්වරධර්මය නට කල්හි සොස්නෙම් නම්, කලාන්ත වන්නෙම් නම්, ළෙහි අත් පැහැර හඬන්නෙම් නම්, සම්මොහයට පැමිණෙන්නෙම් නම්, මට බත ද නොරුස්නේ ය. කයෙහිදු දුර්වර්ණභාවය බැසගන්නේ ය. කර්මාන්තයෝ ද නො පවත්නාහ. අමිත්‍රයෝ ද සතුටු වන්නාහ. මිත්‍රයෝ ද නො සතුටුවන්නාහ'යි. හේ නශ්වරධර්මය නට කල්හි නොසොස්නේ ය. කලාන්ත නො වන්නේ ය. පරිදෙවනා නො කරන්නේ ය. ළෙහි අත් පැහැර නො හඬන්නේ ය. සම්මොහයට නො පැමිණෙන්නේ ය. මහරජ, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක, යමෙකින් විදුනාලද අශ්‍රැතවත් පෘථග්ජනයා තමා ම තවන්නේ නම්, එ සවිෂ ශොකශල්‍යය උපුටා හළේ ය යි කියනු ලැබේ. අශොක වූ විශල්‍ය වූ ආර්‍ය්‍යශ්‍රාවක තමා ම පිරිනිවන්නේ ය.

මහරජ, මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරහු විසින් වේවයි, බඹහු විසින් වේවයි, ලොව යම් ම කවරකු විසින් වේවයි නො ලැබියහෙන මේ කරුණු පස යි.

59. ශොචනායෙනුදු පරිදෙවනායෙනුදු අල්ප වූ ද අර්ථයෙක් නො ලැබිය හෙයි. සොස්නාවූ හටගත් දුක් ඇති තුලුත් දුන පසමිතුරෝ සොම්නස් වෙති.

60. යම් කලෙක කාරණාර්ථවිනිශ්චයෙහි කුශල වූ පණ්ඩිත තෙමේ උපද්‍රවයෙහි දී නො සැලේ ද, එ සඳ ඔහුගේ පසමිතුරෝ අවිකාරවූ පැරණි මුහුණ ම දැක දුඃඛිත වෙත්.

61. වර්ණභණනයෙනුදු මන්ත්‍ර පරිවර්තනයෙනුදු සුභාෂිතකථායෙනුදු ශතප්‍රමාණ හෝ සහස්‍රප්‍රමාණ දානයෙනුදු කුලවංශාවර්ණධර්මයෙනුදු යම් තැනෙක යම් පරිදි අර්ථය ලැබේ නම්, එ තැන එ එ පරිදි ඊහා කරන්නේ ය.

62. ඉදින් මා විසින් වේවයි අනෙකක්හු විසින් වේවයි මෙල අර්ථය නොලැබිය හෙන්නේ ය යි දන්නේ නම්, 'කර්මය දැඩය, දැන් කුම් කෙරෙම්'යි සලකා නො සොස්මින් ඉවසන්නේ ය.

මෙසේ කී කල්හි මුණ්ඩරජ ආයුෂ්මත් නාරද තෙරුන්හට මෙල කරුණ කී: 'වහන්ස, මේ ධර්මපර්‍ය්‍යාය කිනම් දැ යි?

'මහරජ, මේ ධර්මපර්‍ය්‍යාය සොකසල්ලහරණ නමැ' යි.

වහන්ස, එකැතියෙන් සොකසල්ලහරණ නම් වෙයි. වහන්ස, එකැතින් සොකසල්ලහරණ නම් වෙයි. වහන්ස, මේ ධර්මපර්‍ය්‍යාය අසා මාගේ ශොකශල්‍යය ප්‍රහීණ වී ය යි.

අථ ඛො මුණ්ඩො රාජා පියකං කොසාරක්ඛං ආමන්තෙසි: "තෙන හි සම්ම පියක, භද්දාය දෙවියා සරීරං නික්ඛිපෙථ. ථූපං චස්සා කරොථ. අජ්ජතග්ගෙ' දානි මයං නහායිස්සාම චෙව විලිම්පිස්සාම. භත්තං ච භුඤ්ජිස්සාම. කම්මන්තෙ ච පයොජෙස්සාමා"ති.

මුණ්ඩරාජවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

ආදියො සප්පුරිසො ච ඉට්ඨා මනාපදායීභිසන්දං,
සම්පදා ච ධනං ඨානං කොසලො නාරදෙන චා'ති.

පඨමො පණ්ණාසකො.

ඉක්බිති මුණ්ඩරජ පියක නම් කොෂාරක්‍ෂ ඇමැතියා ඇමැතී ය: ''එසේ නම් දරුව, පියකයෙනි, භද්‍රාදෙවියගේ සිරුර දවව. ඇයට ස්තූපයක් ද කරව. අපි අද පටන් කොට දිය නහන්නෙමු. විලෙවුන් ගල්වන්නෙමු. බතුදු බුදින්නෙමු, කර්මාන්තයනුදු යොදන්නෙමු'' යි.

මුණ්ඩරාජවර්ගය පස්වැනි යි.

**එහි උද්දානය:**

ආදිය සූත්‍රය, සප්පුරිස සූත්‍රය, ඉට්ඨ සූත්‍රය, මනාපදායී සූත්‍රය, අභිසන්ද සූත්‍රය, සම්පද සූත්‍රය, ධන සූත්‍රය, ඨාන සූත්‍රය, කොසල සූත්‍රය, නාරද (සොකසල්ලහරණ) සූත්‍රය දැයි දශයෙකි.

ප්‍රථම පණ්ණාසක යි.

# 2. දුතියං පණ්ණාසකං

## 1. නීවරණවග්ගො

### 5. 2. 1. 1

### [ නීවරණසුත්තං ]

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති. භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

පඤ්චිමෙ භික්ඛවෙ ආවරණා නීවරණා චෙතසො අජ්ඣාරුහා පඤ්ඤාය දුබ්බලීකරණා. කතමෙ පඤ්ච?

කාමච්ඡන්දො භික්ඛවෙ ආවරණො නීවරණො චෙතසො අජ්ඣාරුහො පඤ්ඤාය දුබ්බලීකරණො. ව්‍යාපාදො භික්ඛවෙ ආවරණො නීවරණො චෙතසො අජ්ඣාරුහො පඤ්ඤාය දුබ්බලීකරණො. ථීනමිද්ධං භික්ඛවෙ ආවරණං නීවරණං චෙතසො අජ්ඣාරුහං පඤ්ඤාය දුබ්බලීකරණං. උද්ධච්ච-කුක්කුච්චං භික්ඛවෙ ආවරණං නීවරණං චෙතසො අජ්ඣාරුහං පඤ්ඤාය දුබ්බලීකරණං. විචිකිච්ඡා භික්ඛවෙ ආවරණා නීවරණා චෙතසො අජ්ඣාරුහා පඤ්ඤාය දුබ්බලීකරණා.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආවරණා නීවරණා චෙතසො අජ්ඣාරුහා පඤ්ඤාය දුබ්බලීකරණා.

සො වත භික්ඛවෙ භික්ඛු, ඉමෙ පඤ්ච ආවරණෙ නීවරණෙ චෙතසො අජ්ඣාරුහෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ අප්පහාය අබලාය පඤ්ඤාය දුබ්බලාය අත්තත්ථං වා ඤස්සති, පරත්ථං වා ඤස්සති, උභයත්ථං වා ඤස්සති, උත්තරිං වා[1] මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතී'ති නෙතං ඨානං විජ්ජති.

සෙය්‍යථාපි භික්ඛවෙ නදී පබ්බතෙය්‍යා දූරඞ්ගමා සීඝසොතා හාරහාරිණී, තස්සා පුරිසො උභතො නඞ්ගලමුඛානි විවරෙය්‍ය, එවං හි සො භික්ඛවෙ මජ්ඣෙ නදියා සොතො වික්ඛිත්තො විසටො බ්‍යාදින්නො න චෙව[2] දූරඞ්ගමො අස්ස, න සීඝසොතො, න හාරහාරී. එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු ඉමෙ පඤ්ච ආවරණෙ නීවරණෙ චෙතසො අජ්ඣාරුහෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ අප්පහාය අබලාය පඤ්ඤාය දුබ්බලාය අත්තත්ථං වා ඤස්සති, පරත්ථං වා ඤස්සති, උභයත්ථං වා ඤස්සති, උත්තරිං වා මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතී'ති නෙතං ඨානං විජ්ජති.

---

1 උත්තරි වා - මජසං 2 නෙව - මජසං

# 2. දෙවැනි පණ්ණාසකය

## 1. නීවරණවග්ගය

### 5. 2. 1. 1

### [ නීවරණ සූත්‍රය ]

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** අනේපිඬුසිටුහුගේ **ජේතවන** නම් වූ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ'යි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මහණෙනි, (සිත අවුරාගෙණ සිටිනා හෙයින්) ආවරණ වූ (ධ්‍යානාදීනට බාධක වන හෙයින්) නීවරණ වූ, සිත ඔබාගෙණ සිටිනා, විදර්ශනාප්‍රඥා දුර්වල කරණ මේ කරුණුහු පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, කාමච්ඡන්දය ආවරණ ය, නීවරණ ය, චිත්තය මැඩගෙණ සිටුනේ ය, ප්‍රඥාව දුර්වල කරන්නේ ය. මහණෙනි, ව්‍යාපාදය ආවරණ ය, නීවරණ ය, චිත්තයාගේ අධ්‍යාරුහ ය, ප්‍රඥාව දුර්වල කරන්නේ ය. මහණෙනි, ථිනමිද්ධය ආවරණ ය, නීවරණ ය, චිත්තයාගේ අධ්‍යාරුහ ය, ප්‍රඥාව දුර්වල කරන්නේ ය. මහණෙනි, උද්ධච්චකුක්කුච්චය (සිත්හි නොසන්හුන් බව හා කුකුස) ආවරණ ය, නීවරණ ය, චිත්තයාගේ අධ්‍යාරුහ ය, ප්‍රඥාව දුර්වල කරන්නේ ය. මහණෙනි, විචිකිච්ඡාව ආවරණ ය, නීවරණ ය, චිත්තයාගේ අධ්‍යාරුහ ය, ප්‍රඥාව දුර්වල කරන්නේ ය.

මහණෙනි, මෙ පස් දෙන ආවරණයහ, නීවරණයහ, චිත්තයාගේ අධ්‍යාරුහයහ, ප්‍රඥාව දුර්වල කරන්නාහ.

මහණෙනි, ඒ මහණ එකැතින් නීවරණ වූ, සිත මැඩගෙණ සිටුනා, පැණ දුබල කරණ මේ පඤ්චාවරණයන් නො තබා අබල වූ, දුර්වල වූ ප්‍රඥයෙන් "ආත්මාර්ථය වේ ව යි දන්නේ ය, පරාර්ථය වේ ව යි දන්නේ ය, උභයාර්ථය වේ ව යි දන්නේ ය, මනුෂ්‍යධර්මයෙන් මතුයෙහි ආර්‍ය්‍යභාවකරණයට නිසි ඥානදර්ශනවිශෙෂයක් වේ ව යි සාක්ෂාත් කරන්නේ ය යන මෙල කරුණ සිදු නො වන්නේ ය.

මහණෙනි, යම් පරිදි පව්යෙන් ඇද හැලෙන දුර ගලා බස්නා ශීඝ්‍ර ස්‍රොතස් ඇති හලයුතු දෑ හැරලනසුලු නදියෙක් වේ ද, පුරුෂයෙක් ඒ නදියගේ දෙපස නඩගලමුඛ (නගුලෙන් කළ ඇළි) විවර කරන්නේ ය. මහණෙනි, එසේ වත් ම, නදීමධ්‍යයෙහි ඒ ස්‍රොතස විසිර ගියේ විසුළේ දෙපසට ඇදගන්නා ලදුයේ දුරගමන් නැතියේ වෙයි. ශීඝ්‍රස්‍රොතස් නැතියේ වෙයි. හර්තව්‍යය ගෙණ යන සුලු නො වෙයි.

මහණෙනි, එ පරිදි ම එකැතින් එ මහණ මේ පඤ්චආවරණයන් නීවරණයන්, චිත්තයාගේ අධ්‍යාරුහයන්, ප්‍රඥාදුර්වලකරණයන් නො හැරලා අබල වූ දුබල වූ ප්‍රඥයෙන් ආත්මාර්ථය වේවයි දන්නේ ය. පරාර්ථය වේවයි දන්නේ ය, උභයාර්ථය වේ ව යි දන්නේ ය, මනුෂ්‍යධර්මයෙන් මතුයෙහි ආර්‍ය්‍යභාවකරණයට නිසි ඥානදර්ශනවිශෙෂයක් වේවයි සාක්ෂාත් කරන්නේ ය යන මෙල කරුණ ඇති නො වේ.

සො වත භික්ඛවෙ භික්ඛු ඉමෙ පඤ්ච ආවරණෙ නීවරණෙ චෙතසො අජ්ඣාරුහෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ පහාය බලවතියා පඤ්ඤාය අත්තත්ථං වා ඤස්සති, පරත්ථං වා ඤස්සති, උභයත්ථං වා ඤස්සති, උත්තරිං වා මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතී'ති ඨානමෙතං විජ්ජති.

සෙය්‍යථාපි භික්ඛවෙ නදී පබ්බතෙය්‍යා දූරඞ්ගමා සීඝසොතා හාරහාරිණී, තස්සා පුරිසො උභතො නඞ්ගලමුඛානි පිදහෙය්‍ය, එවං හි සො භික්ඛවෙ මජ්ඣෙ නදියා සොතො අවික්ඛිත්තො අවිසටො අබ්‍යාදින්නො දූරඞ්ගමො චෙව අස්ස සීඝසොතො ච හාරහාරී ච එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු ඉමෙ පඤ්ච ආවරණෙ නීවරණෙ චෙතසො අජ්ඣාරුහෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ පහාය බලවතියා පඤ්ඤාය අත්තත්ථං වා ඤස්සති, පරත්ථං වා ඤස්සති, උභයත්ථං වා ඤස්සති, උත්තරිං වා මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතී'ති ඨානමෙතං විජ්ජති.

## 5. 2. 1. 2

## [ අකුසලරාසිසුත්තං ]

**[ සාවත්ථිනිදානං: ]**

2. අකුසලරාසීති භික්ඛවෙ වදමානො ඉමෙ* පඤ්චනීවරණෙ සම්මා වදමානො වදෙය්‍ය. කෙවලොහයං[1] භික්ඛවෙ අකුසලරාසි යදිදං පඤ්චනීවරණා. කතමෙ පඤ්ච?

කාමච්ඡන්දනීවරණං, බ්‍යාපාදනීවරණං, ථීනමිද්ධනීවරණං, උද්ධච්චකුක්කුච්චනීවරණං, විචිකිච්ඡානීවරණං.

අකුසලරාසීති භික්ඛවෙ වදමානො ඉමෙ පඤ්චනීවරණෙ සම්මා වදමානො වදෙය්‍ය. කෙවලොහයං භික්ඛවෙ අකුසලරාසී යදිදං ඉමෙ පඤ්චනීවරණා'ති.[2]

---

* 'ඉමෙ' ඉති මජසං පොත්ථකෙ න දිස්සති

1 කෙවලොහායං - මජසං; කෙවලොවායං - සයා

2 ඉමෙ පඤ්චනීවරණානී'ති - සීමු

මහණෙනි, එකැතියෙන් එ මහණ මේ පඤ්ච ආවරණයන් නීවරණයන් චිත්තයාගේ අධ්‍යාරුහයන් ප්‍රඥාදුර්වලකරණයන් හැරපියා බලවත් ප්‍රඥායෙන් ආත්මාර්ථය වේවයි දන්නේ ය, පරාර්ථය වේවයි දන්නේ ය, උභයාර්ථය වේවයි දන්නේ ය, මනුෂ්‍යධර්මයෙන් මතුයෙහි ආර්‍ය්‍යභාවකරණයට සමර්ථ ඥානදර්ශනවිශෙෂයක් වේවයි සාක්ෂාත් කරන්නේ ය යන තෙල කරුණ ඇති වේ.

මහණෙනි, යම් පරිදි පර්වතයෙන් ඇද හැලෙන දුර ගලා බස්නා ශීඝ්‍රස්‍රෝතස් ඇති හරණට නිසි දූ හැරලන සුලු නදියෙක්වේ නම්, පුරුෂයෙක් එ නදියගේ නඞගලමුඛ (නඟුලෙන් කළ ඇළි) වසන්නේ ය. මහණෙනි, එසේ වත් ම නදීමධ්‍යයෙහි ඒ ස්‍රොතස නො විසිර ගියේ නො විසුලේ දෙපසට නො ඇදගන්නා ලදුයේ දුරගමන් ඇතියේ ද ශීඝ්‍රස්‍රොතස් ඇතියේ ද හර්තව්‍යය හරණ සුලු ද වෙයි. මහණෙනි, එ පරිදි ම එකැතියෙන් එ මහණ ආවරණ වූ නිවරණ වූ, සිත මඩනා, පැණ දුබල කරණ මේ පඤ්ච ධර්මයන් හැරපියා බලවත් ප්‍රඥයෙන් ආත්මාර්ථය වේවයි දන්නේ ය, පරාර්ථය වේවයි දන්නේ ය, උභයාර්ථය වේවයි දන්නේ ය, මනුෂ්‍යධර්මයෙන් මතුයෙහි වූ ආර්‍ය්‍යභාවකරණයට නිසි ඥානදර්ශන විශෙෂය වේවයි සාක්ෂාත් කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වන්නේ ය.

5. 2· 1. 2

[ අකුසලරාශි සූත්‍රය ]

[සැවැත්නිදාන යි. ]

2. මහණෙනි, 'අකුශලරාශිය'යි කියනුයෙක් මොනොවට කියනුයේ මේ පඤ්චනීවරණයන් කියන්නේ ය. මහණෙනි, මේ නීවරණපස නම් මේ හුදු අකුශලරාශි ම වෙයි. කවර පස් දෙනෙක යත්:

කාමච්ඡන්දනීවරණ ය, ව්‍යාපාදනීවරණ ය, ථිනමිද්ධනීවරණ ය, උද්ධච්ච-කුක්කුච්චනීවරණ ය, විචිකිච්ඡානීවරණ යි.

මහණෙනි, අකුශලරාශි ය යි කියනුයෙක් මොනොවට කියනුයේ මේ පඤ්චනීවරණයන් කියන්නේ ය. මහණෙනි, මේ පඤ්චනීවරණ නම් තෙල හුදු අකුශලරාශි ම වෙයි.

## 5. 2. 1. 3

### [ පධානියඞ්ගසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

3. පඤ්චිමානි භික්ඛවෙ පධානියඞ්ගානි. කතමානි පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.

අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය.

අසඨො හොති අමායාවී යථාභූතං අත්තානං ආවිකත්තා සත්ථරි වා විඤ්ඤූසු වා සබ්රහ්මචාරීසු.

ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහාණාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු.

පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච පධානියඞ්ගානී'ති.

## 5. 2. 1. 4

### [ අසමය-සමයසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

4. පඤ්චිමෙ භික්ඛවෙ අසමයා පධානාය. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු ජිණ්ණො හොති ජරාය අභිභූතො. අයං භික්ඛවෙ පඨමො අසමයො පධානාය.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු ව්‍යාධිතො හොති ව්‍යාධිනා අභිභූතො. අයං භික්ඛවෙ දුතියො අසමයො පධානාය.

පුන ච පරං භික්ඛවෙ දුබ්භික්ඛං හොති දුස්සස්සං දුල්ලභපිණ්ඩං න සුකරං උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. අයං භික්ඛවෙ තතියො අසමයො පධානාය.

පුන ච පරං භික්ඛවෙ භයං හොති අටවිසඞ්කොපො චක්කසමාරූළ්හා ජානපදා පරියායන්ති. අයං භික්ඛවෙ චතුත්ථො අසමයො පධානාය.

පුන ච පරං භික්ඛවෙ සඞ්ඝො භින්නො හොති. සඞ්ඝෙ ඛො පන භික්ඛවෙ භින්නෙ අඤ්ඤමඤ්ඤං අක්කොසා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිභාසා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරික්ඛෙපා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිච්චජනා[1] ච හොන්ති. තත්ථ අප්පසන්නා චෙව නප්පසීදන්ති. පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තං හොති. අයං භික්ඛවෙ පඤ්චමො අසමයො පධානාය.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච අසමයා පධානායා'ති.

---

1 පරිච්චජා - මජසං, සයා

## 5. 2. 1. 3.

## [ පධානියඞ්ග සූත්‍රය ]

[ සැවැත්නිදාන යි ]

3. මහණෙනි, ප්‍රධන් වීර්‍ය්‍යය කරණ මහණහුගේ මේ අඞ්ග පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සැදැහැති වෙයි. තථාගතයන්ගේ සම්බෝධිය (චතුර්මාර්ගඥානය) හදහයි. එ භගවත්හු මෙ කරුණිනුදු අර්හත්හ. සම්‍යක්සම්බුද්ධයහ. විද්‍යාචරණසම්පන්නයහ. සුගතයහ. ලොකවිද්හ. අනුත්තර පුරුෂදම්‍යසාරථිහ. දෙව්මිනිස්නට ශාස්තෘහ. බුද්ධයහ. භගවත්හ''යි.

අල්පාබාධ වූයේ අල්පාතඞ්ක (නිදුක්) වූයේ සම ව පස්නා අතිශීත නොවූ අත්‍යුෂ්ණ නො වූ මධ්‍යම වූ ප්‍රධානක්‍ෂමවූ ග්‍රහණියෙන් සමන්‍වාගත වෙයි.

තමා නැති ගුණ නො පාළ කරණුයේ, තමා ඇති අගුණ නොසඟවනුයේ වෙයි ශාස්තෘන් කෙරෙහි වේවයි, විඥයන් කෙරෙහි වේවයි, සබ්‍රම්සරුන් කෙරෙහි වේවයි, තමා ඇතිතතු පහළ කරනුයේ වෙයි.

අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ උපසම්පත් පිණිස ඇරඹූ වැර ඇතියේ, කුශලධර්මයෙහි ස්ථාම ඇතියේ, දළපැරකුම් ඇතියේ, බහා නො තැබූ වීර්‍ය්‍යධූර ඇතියේ වාස කෙරෙයි.

උදැවිය පිරිසිඳුනට සමත්, පරිශුද්ධ, නොබුත්විරූ කෙලෙස්කඳ බිඳුනට සමත්, මොනොවට දුඃඛක්‍ෂයගාමිනී ප්‍රඥයෙන් සමන්‍වාගත වූයේ ප්‍රඥවත් වෙයි.

මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍ය වඩන මහණහුගේ මේ පඤ්චාඞ්ග යි.

## 5. 2. 1 4.

## [ අසමය - සමය සූත්‍රය ]

[ සැවැත්නිදාන යි: ]

4. මහණෙනි, ප්‍රධන් වීර්‍ය්‍යකරණයට මේ නො කල් පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, මහණ ජරායෙන් මැඩුනේ ජීර්ණ වෙයි. මහණෙනි, ප්‍රධන් වීර්‍ය්‍යකරණයට මේ පළමු නො කලි.

තවද මහණෙනි, මහණ ව්‍යාධියෙන් මැඩුනේ රොගයෙන් පෙළුනේ වෙයි. මහණෙනි, මේ ප්‍රධන්වීර්‍ය්‍යකරණයට දෙවන නො කලි.

තවද මහණෙනි, නට ශස්‍ය ඇති, දුලබපිඬු ඇති සායෙක් වෙයි. පාත්‍රය ගෙණ සිඟීමෙන් යැපෙන්නට සුකර නොවෙයි. මේ ප්‍රධන්වීර්‍ය්‍යයට තෙවනු නො කලි

තවද මහණෙනි, අටවි සඞ්කොපනයෙක් (කඩපලා සොර බියෙක්) වෙයි පිය නැගි දනව් වැස්සෝ ඔබමොබ දිවෙත්. මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍යයට මේ සතර වන නො කලි.

තවද මහණෙනි, සඞ්ඝයා බිඳුනේ වෙයි. මහණෙනි, සඞ්ඝයා බුත් කල්හි උනුන් අක්කොසවතින් හවත්නාහු ද වෙති. උනුන් තෙද කියා (බිය දක්වා සන්තර්ජනයෙන්) බණන්නාහු ද වෙති, උනුන් (විරුද්ධව්සින්) වටාගන්නාහු ද වෙති, උනුන් මිගදෙඩා හැරපියන්නාහු ද වෙත්.

එහි ලා අප්‍රසන්නයෝ ද නො පහන්හු ම ය. පහන් වූ ඇතැම්කෙනෙකුගේ අන්‍යථාත්වය (වෙනස) ද වෙයි. මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍යයට මේ පස් වන නො කලි.

මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍යය පිණිය මේ නොකල් පස යි.

පඤ්චිමෙ භික්ඛවෙ සමයා පධානාය. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු දහරො හොති යුවා සුසු කාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා. අයං භික්ඛවෙ පඨමො සමයො පධානාය.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය. අයං භික්ඛවෙ දුතියො සමයො පධානාය.

පුන ච පරං භික්ඛවෙ සුභික්ඛං හොති සුසස්සං සුලභපිණ්ඩං, සුකරං උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. අයං භික්ඛවෙ තතියො සමයො පධානාය.

පුන ච පරං භික්ඛවෙ මනුස්සා සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති. අයං භික්ඛවෙ චතුත්ථො සමයො පධානාය.

පුන ච පරං භික්ඛවෙ සඞ්ඝො සමග්ගො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරති. සඞ්ඝෙ ඛො පන භික්ඛවෙ සමග්ගෙ න චෙව අඤ්ඤමඤ්ඤං අක්කොසා හොන්ති. න ච අඤ්ඤමඤ්ඤං පරිභාසා හොන්ති. න ච අඤ්ඤමඤ්ඤං පරික්ඛෙපා හොන්ති. න ච අඤ්ඤමඤ්ඤං පරිච්චජනා හොන්ති. තත්ථ අප්පසන්නා චෙව පසීදන්ති. පසන්නානඤ්ච භිය්‍යොභාවො[1] හොති. අයං භික්ඛවෙ පඤ්චමො සමයො පධානාය.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච සමයා පධානායා'ති.

### 5. 2. 1. 5.

### [ මාතාපුත්තසුත්තං ]

5. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සාවත්ථියං උභො මාතාපුත්තා වස්සාවාසං උපගමිංසු භික්ඛු ච භික්ඛුණී ච.

තෙ අඤ්ඤමඤ්ඤස්ස අභිණ්හං දස්සනකාමා අහෙසුං. මාතාපි පුත්තස්ස අභිණ්හං දස්සනකාමා අහොසි. පුත්තො'පි මාතරං අභිණ්හං දස්සනකාමො අහොසි. තෙසං අභිණ්හං දස්සනා සංසග්ගො අහොසි සංසග්ගෙ සති විස්සාසො අහොසි. විස්සාසෙ සති ඔතාරො අහොසි. තෙ ඔතිණ්ණචිත්තා සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවිංසු.

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසංකමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "ඉධ භන්තෙ සාවත්ථියං උභො මාතාපුත්තා වස්සාවාසං උපගමිංසු භික්ඛු ච භික්ඛුණී ච. තෙ අඤ්ඤමඤ්ඤස්ස අභිණ්හං දස්සනකාමා අහෙසුං. මාතාපි පුත්තස්ස අභිණ්හං දස්සනකාමා අහොසි. පුත්තොපි මාතරං අභිණ්හං දස්සනකාමො අහොසි. තෙසං අභිණ්හං දස්සනා සංසග්ගො අහොසි. සංසග්ගෙ සති විස්සාසො අහොසි. විස්සාසෙ සති ඔතාරො අහොසි. තෙ ඔතිණ්ණචිත්තා සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවිංසූ"ති.

1. භීයොභාවො - සීමු.

මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍යය සඳහා මේ කල් පසෙක කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ තරුණ කළු කෙහෙ ඇති, සොඳුරු යොවුනෙන් ද පළමුවයසින් ද සමන්‍වාගත වූ තරුණයෙක් වෙයි මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍යයට මේ පළමු කලි.

තවද මහණෙනි, මහණ අල්පාබාධ ඇතියේ නිදුක් වූයේ අතිශීත නො වූ අත්‍යුෂ්ණ නො වූ මධ්‍ය ම වූ ප්‍රධන්වීර්‍ය්‍යයට නිසි වූ සමව පස්නා කර්‍මජතෙජොධාතුයෙන් සමන්‍වාගත වූයේ වෙයි. මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍යය සඳහා මේ දෙවන කලි.

තවද මහණෙනි, මනා ශස්‍යසමපත් ඇති සුලභ පිඬු ඇති සුභික්ෂයෙක් වෙයි. පා ගෙණ සිඟාගත් පිඬුයෙන් යැපීමට සුකර වෙයි. මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍යයට මේ තෙවන කලි.

තවද මහණෙනි, මනුෂ්‍යයෝ සමඟ වූවාහු මොනොවට තුටු වන්නාහු විවාද නො කරන්නාහු කිරි හා දිය මෙන් එක් වූවාහු උනුන් ප්‍රිය ඇසින් දක්නාහු වෙසෙත්. මහණෙනි, මේ ප්‍රධන්වීර්‍ය්‍යයට සතර වන කලි.

තවද මහණෙනි, සමඟ සඞ්ඝයා මොනොවට සතුටු වනුයේ විවාද නො කරණුයේ එකුද්දෙස ඇතියේ සුවසේ වෙසෙයි. මහණෙනි, සඟුන් සමඟ කල්හි උනුන්ට ආක්‍රොශ ද නො කෙරෙත්. උනුනට පරිභාෂා ද නො කෙරෙත්. උනුන්ට පරික්ෂෙප ද නො කෙරෙත්. උනුන් හැරපියන්නාහු ද නො වෙත්. එහි ලා අප්‍රසන්නයෝ ද පහදිති පහන් වූවන්ගේ ද භියොභාව වෙයි. මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍යය පිණිස මේ පස් වන කලි.

මහණෙනි, ප්‍රධන්වීර්‍ය්‍යය පිණිස මේ සමය පස යි.

## 5. 2. 1. 5.

## [ මාතාපුත්‍ත සූත්‍රය ]

5 එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුහුගේ ජේතවන නම් අරම්හි වැඩවසන සේක. එකල සැවැත්හි මහණ හා මෙහෙණ හා දෙ මාපුත් කෙනෙක් වස් එළඹියහ.

ඔහු නරතුරු උනුන් දක්නා කැමති වූහ. මවු ද නරතුරු පුතු දක්නා කැමති වූය. පිත් ද නරතුරු මව දක්නා කැමැති විය. ඔවුන්ගේ නරතුරු දැක්මෙන් සංසර්‍ගයෙක් වී. ස සර්‍ගය ඇති වත් ම විශ්වාසය විය විශ්වාසය ඇති වත් ම (කාම්රා විසින්) බැස ගැන්ම විය. (කාම්රා විසින්) බට සිත් ඇති ඔහු ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන නො කොට දුබල බැව් පාළ නො කොට මෙවුන්දම් සෙවියහ.

එ කල බොහෝ වහන්දෑ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් එ මහණහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ: “වහන්ස, මෙ සැවැත්හි මහණ මෙහෙණ දෙමාපුතු කෙනෙක් වස් එළඹියහ ඔහු උනුන් නරතුරු දර්‍ශනය කැමැති වූහ. මවුදු නරතුරු පුතු දක්නා කැමැත්තී වූය පුත් ද නරතුරු මව දක්නා කැමති විය. නරතුරු දැක්මෙන් ඔවුන්ගේ සංසර්‍ගයෙක් විය. සසර්‍ග ඇති වත් ම විශ්වාසය විය. විශ්වාසය ඇති වත් ම කාම්රායෙන් බැසගැන්ම විය. බැසගත් සිත් ඇති ඔහු ශික්ෂා-ප්‍රත්‍යාඛ්‍යාන නො කොට දෞර්‍බල්‍යය පාළ නො කොට මෙවුන්දම් සෙවියහ’යි.

කින්නු සො භික්ඛවෙ මොඝපුරිසො මඤ්ඤති න මාතා පුත්තෙ සාරජ්ජති පුත්තො වා පන මාතරී'ති.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි යං[1] එවං රජනීයං එවං කමනීයං එවං මදනීයං එවං බන්ධනීයං එවං මුච්ඡනීයං එවං අන්තරායකරං අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය, යථයිදං භික්ඛවෙ ඉත්ථිරූපං. ඉත්ථිරූපෙ භික්ඛවෙ සත්තා රත්තා ගධිතා ගිද්ධා මුච්ඡිතා අජ්ඣොපන්නා. තෙ දීඝරත්තං සොචන්ති ඉත්ථිරූපවසානුගා.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකසද්දම්පි -පෙ- එකගන්ධම්පි -පෙ- එකරසම්පි -පෙ- එකඵොට්ඨබ්බම්පි සමනුපස්සාමි, යං එවං රජනීයා එවං කමනීයං එවං මදනීයං එවං බන්ධනීයං එවං මුච්ඡනීයං එවං අන්තරායකරං අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය, යථයිදං භික්ඛවෙ ඉත්ථිඵොට්ඨබ්බො. ඉත්ථිඵොට්ඨබ්බෙ භික්ඛවෙ සත්තා රත්තා ගිද්ධා ගධිතා මුච්ඡිතා අජ්ඣොපන්නා. තෙ දීඝරත්තං සොචන්ති ඉත්ථිඵොට්ඨබ්බවසානුගා.

ඉත්ථි භික්ඛවෙ ගච්ඡන්තී'පි පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති. ඨිතා'පි නිසින්නා'පි[2] සයානා'පි හසන්තී'පි භණන්තී'පි ගායන්තී'පි රොදන්තී'පි උග්ඝාතිතා'පි[3] මතා'පි පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති. යම්පි තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය සමන්තපාසො මාරස්සා'ති.

1. සල්ලපෙ අසිහත්ථෙන පිසාචෙනපි සල්ලපෙ.
ආසීවිසම්පි ආසීදෙ යෙන දට්ඨො න ජීවති

2. නත්වෙව එකො එකාය මාතුගාමෙන සල්ලපෙ.
මුට්ඨස්සතිං තා බන්ධන්ති පෙක්ඛිතෙන සිතෙන ච,

3. අථොපි දුන්නිවත්ථෙන මඤ්ජුනා භණිතෙන ච
නෙසො ජනො සුචාසීදො[4] අපි උග්ඝාතිතො[5] මතො

4. පඤ්චකාමගුණා එතෙ ඉත්ථිරූපස්මිං දිස්සරෙ,
රූපා සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනොරමා.

5 තෙසං කාමොඝවූළ්හානං කාමෙ අපරිජානතං,
කාලං ගතිං[6] භවාභවං සංසාරස්මිං පුරක්ඛතා

6. යෙ ච කාමෙ පරිඤ්ඤාය චරන්ති අකුතොභයා,
තෙ වෙ පාරගතා ලොකෙ යෙ පත්තා ආසවක්ඛය'න්ති.

---

1 (යං) මජසං - නත්ථි  2. නිපන්නාපි - සයා  3. උග්ඝාසිතාපි - සයා, මජසං.
4 සුචාසීදො - මජසං - සචාසන්දො - සයා,  5. උග්ඝාතිතො - සයා, මජසං.
6. ගති - මජසං.

මහණෙනි, එ මොඝපුරුෂ ''මව පුතු කෙරෙහි රාග විසින් නො ඇලේ, පුත් හෝ මව කෙරෙහි නො ඇලේ ය'යි කිම නො හඟනේ ද?

මහණෙනි, මේ සා රඤ්ජනයට හිත වූ, මේ සා කාමයට හිත වූ, මේ සා මදයට හිත වූ, මේ සා බන්ධනයට හිත වූ, මේ සා කාමමූර්ඡාවට හිත වූ, අනුත්තරයොගක්ෂෙමාධිගමයට මේ සා අන්තරායකර වූ යම් රූපයෙක් ඇත් ද, මහණෙනි, මේ ස්ත්‍රීරූපය බඳු අන් එක රූපයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි සත්ත්වයෝ ස්ත්‍රීරූපයෙහි රාගවිසින් ඇලුනාහු ගෙතුනාහු ගිජු වූවාහු මූසපත් වූවාහු බැසගත්තාහු වෙති. ඔහු ස්ත්‍රීරූප වශානුගත ව දීර්ඝරාත්‍රයෙහි ශොක කෙරෙත්.

මහණෙනි, මම අන් එක ද ශබ්දයක් ... එක ද ගන්ධයක් ... එක ද රසයක් ... මේ සා රජනීය වූ, මේ සා කමනීය වූ, මේ සා මදනීය වූ මේ සා බන්ධනීය වූ, මේ සා මූර්ඡාවට හිත වූ, අනුත්තරයොගක්ෂෙමාධිගමයට මේ සා අන්තරායකර වූ යම් ස්පර්ශයෙක් ඇද්ද, මහණෙනි, ස්ත්‍රීස්පර්ශ බඳු අන් එක ද ස්ප්‍රෂ්ටව්‍යයක් මම නො දක්මි. මහණෙනි, ස්ත්‍රීස්ප්‍රෂ්ටව්‍යයෙහි සත්ත්වයෝ රැඳුනාහු ගිජු වූවාහු ගෙතුනාහු මූසපත් වූවාහු බැසගත්තාහු වෙති. ඔහු ස්ත්‍රීස්ප්‍රෂ්ටව්‍යවශයට ගියාහු දීර්ඝරාත්‍රයෙහි සොස්නාහ.

මහණෙනි, ස්ත්‍රී යන්නී ද පුරුෂයා සිත ගෙණ සිටුනී ය. සිටියා ද, හුන්නී ද, හෝනී ද, සෙත්නී ද, බණන්නී ද, ගයන්නී ද, හඩන්නී ද, ඉදිමුනී ද, මළා ද, පුරුෂයා සිත් ගෙන සිටුනීය. මහණෙනි, යම් දෑසක් සඳහා මොනොවට බණනුයේ ''මරු විසින් වටා ලූ මලෙකැ''යි කියා නම් ඒ ස්ත්‍රිය ම දක්වා කියයි.

1. කඩු ගත් අත් ඇතියහු හා ද බණන්නේ ය. පිසාචයකු හා ද බණන්නේ ය. යමකු විසින් ඩස්නා ලදුයේ ජීවත් නො වේ ද, එබඳු ඇසිවසකු (සර්පයකු) ද සටන්නේ ය.

2. එකලා වූයේ එකලා මාගමක හා නො ම බණන්නේ ය. ඔහු නට සිහි ඇතියහු ප්‍රෙක්ෂිතයෙනුදු (බැල්මෙන් ද) සිනායෙනුදු බඳනාහ.

3. වැලිදු නො පිළිසන් කොට හැඳීමෙනුදු මොළොක් තෙපුලෙනුදු බඳනාහ. තෙල ස්ත්‍රීජනයා ඉදිමුනේ හෝ මළේ හෝ ගැටුමට නො තිසි වේ.

4. රූප ය ශබ්ද ය ගන්ධ ය රස ය ස්ප්‍රෂ්ටව්‍ය ය යන තෙල මනරම් පස්කම් ගුණයෝ ස්ත්‍රීරූපයෙහි දක්නා ලැබෙත්.

5. කාමෞඝයෙන් ඇදගණු ලැබූ කාමයන් පිරිසිඳ නො දත්තා වූ ඔවුන්ගේ සංසාරයෙහි කාලය ද ගතිය ද පුනර්භවය ද පෙරටුවත්නාහු ම (නොනවත්නාහුම) වෙති.

6. යම් කෙනෙක් කාමයන් පිරිසිඳ දැන කිසිවකිනුත් බිය නැත්තාහු හැසිරෙත් ද, යම් කෙනෙක් ආස්‍රවක්ෂය සඞ්ඛ්‍යාත අර්හත්ත්වයට පත් වූවාහු ද, ලොව්හි ඔහු ම නිවනට ගියාහු වෙති යි,

## 5. 2. 1. 6.

### [ උපජ්ඣායසුත්තං ]

[ සාවත්ථිනිදානං ]

6. අථ බො අඤ්ඤතරො භික්ඛු යෙන සකො උපජ්ඣායො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සකං උපජ්ඣායං එතදවොච: ''එතරහි මෙ භන්තෙ මධුරකජාතො චෙව කායො දිසා ච මෙ න පක්ඛායන්ති. ධම්මා ච මං නප්පටිභන්ති. ථිනමිද්ධං ච මෙ චිත්තං පරියාදාය තිට්ඨති. අනභිරතො ච බ්‍රහ්මචරියං චරාමි. අත්ථි ච මෙ ධම්මෙසු විචිකිච්ඡා'ති.

අථ බො සො භික්ඛු තං සද්ධිවිහාරිකං භික්ඛුං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො සො භික්ඛු භගවන්තං එතදවොච:

අයං භන්තෙ භික්ඛු එවමාහ: එතරහි මෙ භන්තෙ මධුරකජාතො චෙව කායො. දිසා ච මෙ නපක්ඛායන්ති. ධම්මා ච මං නප්පටිභන්ති. ථිනමිද්ධං ච මෙ චිත්තං පරියාදාය තිට්ඨති. අනභිරතො ච බ්‍රහ්මචරියං චරාමි. අත්ථි ච මෙ ධම්මෙසු විචිකිච්ඡා'ති.

එවං හෙතං භික්ඛු හොති ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරස්ස, භොජනෙ අමත්තඤ්ඤුනො, ජාගරියං අනනුයුත්තස්ස, අවිපස්සකස්ස කුසලානං ධම්මානං පුබ්බරත්තාපරරත්තං බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගං අනනුයුත්තස්ස විහරතො,යං මධුරකජාතො චෙව කායො හොති, දිසා චස්ස න පක්ඛායන්ති, ධම්මා ච තං නප්පටිභන්ති, ථිනමිද්ධං චස්ස චිත්තං පරියාදාය තිට්ඨති, අනභිරතො ච බ්‍රහ්මචරියං චරති, හොති චස්ස ධම්මෙසු විචිකිච්ඡා.

තස්මාතිහ තෙ භික්ඛු එවං සික්ඛිතබ්බං: ''ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භවිස්සාමි, භොජනෙ මත්තඤ්ඤූ, ජාගරියං අනුයුත්තො, විපස්සකො කුසලානං ධම්මානං, පුබ්බරත්තාපරරත්තං බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගං අනුයුත්තො විහරිස්සාමී'ති.'' එවං හි තෙ භික්ඛු සික්ඛිතබ්බන්ති,

අථ බො සො භික්ඛු භගවතා ඉමිනා ඔවාදෙන ඔවදිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ බො සො භික්ඛු එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසි.

**5. 2. 1. 6**

**[උපජ්ඣාය සූත්‍රය]**

**[සැවැත්නිදානයි: ]**

6. **එ කල එක්තරා මහණෙක්** සිය උපාධ්‍යායයන් කරා එළඹියේ ය. එළඹ සිය උපාධ්‍යායයනට තෙල කී ය: ''වහන්ස, දැන් මාගේ කය හටනත් ගුරු බව් ඇතියේ ද වෙයි. දිශාවෝ ද මට නොවටහන්. මට (ශමථවිදර්ශනා) දහම්හුදු නො වටහන්. ථිනමිද්ධය ද මා සිත මැඩගෙණ සිටුනේ ය. අභිරති නැතියෙම් (උකැටියෙම්) බඹසර ද සරමි. දහම්හිදූ මට විසිකිස (සැක) ඇතැ''යි.

ඉක්බිති එ මහණ එ සද්ධිවිහාරිකයා කැඳවාගෙණ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස් ව හින. එකත්පස් ව හුන් එ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය:

වහන්ස, මෙ මහණ මෙසේ කියයි. 'වහන්ස, මෙ කල මා සිරුර හටගත් ගුරුබව් ඇති වෙයි. දික්හුදු මට නොවටහන්. මට දහම්හුදු නො වටහන් ථිනමිද්ධය ද මසිත් මැඩගෙණ සිටුනේ ය අභිරති නැති ව බඹසර ද සරමි. මට දහම්හි විචිකිච්ඡා ද ඇතැ''යි.

මහණ, ඉන්ද්‍රියෙහි නො රැකි දොරටු ඇතියහුට බොජුන්හි පමණ නො දන්නහුට, නිදිවැරුම්හි නො යෙදුනහුට, කුසල්දහම් නො දක්නාහට, පූර්‍වාපරරාත්‍රයෙහි (රෑ පෙරයම පැසුළුයම) බෝපැකිදම් පිළිබඳ භාවනානු-යොගයෙහි නො යෙදී වාස කරන්නහුට, යම් හෙයෙකින් කය උපන් ගුරුබව් ඇති වේ ද, දිසාවෝත් ඔහට නො පැණෙත් ද, ඔහට දහම්හුදු නොවටහන් ද, ථිනමිද්ධය ද ඔහු සිත මැඩගෙණ සිටුනේ ද, අභිරති නැති ව බඹසරත් නෙරේ ද, ධර්මයෙහි විචිකිච්ඡාත් ඔහට වේ ද, තෙල කරුණ එසේම වන්නේ ය

මහණ, එ හෙයින් තා විසින් මෙ කරුණෙහි මෙසේ හික්මිය යුතු: ඉඳුරන්හි රැකි දොර ඇති වන්නෙමි. හොජනයෙහි මාත්‍රඥ වෙමි. නිදි වැරීමෙහි යෙදුනෙම් වෙමි, කුශලධර්මයෙහි විදර්ශක වන්නෙමි. පූර්‍වරාත්‍ර අපර රාත්‍රයෙහි බොධිපාක්ෂිකධර්මභාවනානුයොගයෙහි යෙදුනෙම් වාස කරන්-නෙමි''යි. මහණ, තා විසින් මෙසේ ම හික්මිය යුතු යි

එ කල එ මහණ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අවවාදයෙන් ඔවා දෙන ලදුයේ හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

ඉක්බිති එ මහණ හුදෙකලාව (ගණයාගෙන් හා කෙලෙසුන්ගෙන්) වෙන් ව අප්‍රමත්තව කෙලෙස් තවන වැර ඇති ව නිවණට ගිය සිතැති ව වාස කරමින් යම් රහත් ඵලයක් පිණිස කුලපුත්‍රයෝ මොනොවට ගෙන් නික්ම පැවිද්දට වදනාහු ද, අනුත්තර වූ බ්‍රහ්මචර්‍යයීය කෙළවර කොට ඇති ඒ රහත්ඵලය තමා විසින් දිටූ දුම්හෙහි ම විශිෂ්ටඥනයෙන් දැන පසක් කොට නොබෝකලෙකින් ම එය ලබා විසී. ජාති ක්ෂීණ විය. බඹසරවස් වැස නිමවන ලද. සිවුමඟ කරණී කරණ ලදී. මේ රහත් බව පිණිස මතු (කටයුතු) අනෙකෙක් නැති යි මොනොවට දැනගත්තේ ය. එ මහණ රහතුන් අතුරෙහි එක් නමෙක් ද වී.

අථ ඛො සො භික්ඛු අරහත්තප්පත්තො යෙන සකො උපජ්ඣායො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සකං උපජ්ඣායං එතදවොච: "එතරහි මෙ භන්තෙ නචෙව[1] මධුරකජාතො කායො. දිසා ච මෙ පක්ඛායන්ති. ධම්මා ච ම පටිභන්ති. ථිනමිද්ධං ච මෙ චිත්තං න පරියාදාය තිට්ඨති. අභිරතො ච බ්‍රහ්මචරියං චරාමි නත්ථි ච මෙ ධම්මෙසු විචිකිච්ඡා"ති.

අථ ඛො සො භික්ඛු තං සද්ධිවිහාරිකං භික්ඛුං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

අයං භන්තෙ භික්ඛු එවමාහ: "එතරහි මෙ භන්තෙ නචෙව[1] මධුරක-ජාතො කායො. දිසා ච මෙ පක්ඛායන්ති. ධම්මා ච මං පටිභන්ති. ථිනමිද්ධං ච මෙ චිත්තං පරියාදාය න තිට්ඨති. අභිරතො ච බ්‍රහ්මචරියං චරාමි. නත්ථි ච මෙ ධම්මෙසු විචිකිච්ඡා"ති.

එවං හි තං භික්ඛු හොති ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරස්ස, භොජනෙ මත්තඤ්ඤුනො, ජාගරියං අනුයුත්තස්ස, විපස්සකස්ස කුසලානං ධම්මානං, පුබ්බරත්තාපරරත්තං බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගං අනු-යුත්තස්ස විහරතො, යං න චෙව මධුරකජාතො කායො හොති, දිසා චස්ස පක්ඛායන්ති, ධම්මා ච තං පටිභන්ති, ථිනමිද්ධං චස්ස චිත්තං න පරියාදාය තිට්ඨති, අභිරතො ච බ්‍රහ්මචරියං චරති, න චස්ස හොති ධම්මෙසු විචිකිච්ඡා

තස්මාතිහ වො භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: "ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා භවිස්සාම, භොජනෙ මත්තඤ්ඤුනො, ජාගරියං අනුයුත්තා, විපස්සකා කුසලානං ධම්මානං, පුබ්බරත්තාපරරත්තං බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගං අනුයුත්තා විහරිස්සාමා"ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 5. 2. 1. 7.

## [ ඨානසුත්තං ]

**[ සංවණ්ණිතදානං: ]**

7. පඤ්චිමානි භික්ඛවෙ ඨානානි අභිණ්හං පච්චවෙක්ඛිතබ්බානි ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා. කතමානි පඤ්ච?

ජරාධම්මොම්හි ජරං අනතීතො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

ව්‍යාධිධම්මොම්හි ව්‍යාධිං අනතීතො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

මරණධම්මොම්හි මරණං අනතීතො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

---

1. න චෙව, -ස්ස මජසං.

ඉක්බිති අභීත්ඛයට පත් එ මහණ තමාගේ උපාධ්‍යායන් කරා එළඹියේ ය. එළඹ තම උපාධ්‍යායන්ට මෙසේ කී ය: "වහන්ස, දැන් මාගේ කය උපන් ගුරුසැහැවි නො ඇති ම වෙයි. මට දිශාවෝ පැණෙත්. ධර්මයෝ ද මට වැටහෙත්. ථිනමිද්ධයත් මාගේ සිත මැඩගෙණ නො සිටුනේ ය. අභිරති ඇතියෙම් බඹසර ද සෙරෙමි. මට දහම්හිදු විචිකිච්ඡා නැතැ"යි.

ඉක්බිති එ මහණ එ සද්ධිවිහාරික භික්ෂු කැඳවාගෙණ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් එ මහණ භගවත් හට මෙසේ කරුණ කී:

වහන්ස, මෙ මහණ මෙසේ කියයි: "වහන්ස, දැන් මාගේ කය ද ගුරු සැහැවිනැතියේ ම ය. මට දිශාවෝ ද පැණෙත්. මට දහම්හුදු වැටහෙත්. ථිනමිද්ධයද මා සිත මැඩගෙණ නො සිටුනේ ය. අභිරති ඇතියෙම් බඹසර සෙරෙමි. මට ධර්මයෙහිදු විසිකිස නැතැ"යි.

මහණ, ඉඳුරන්හි රැකි දොර ඇතියහුට, භොජනයෙහි මාත්‍රඥයාහට ජාගරණයෙහි නියැලුනහුට, කුසල්දහම්හි විදර්ශනා කරණුවහට, පූර්වරාත්‍ර අපරරාත්‍රයෙහි බෝපැකිදම් වැඩීමෙහි යෙදුනහුට, යම් සේ කය උපන් ගුරු සැහැවි නැති වේ ද, දිශාවෝ ද ඔහට වැටහෙත් ද, ධර්මයෝ ද ඔහුට වැටහෙත් ද, ථිනමිද්ධය ද ඔහුගේ සිත මැඩගෙණ නො සිටුනේ ද, අභිරති ඇති ව බඹසරත් සෙරේ ද, ඔහට ධර්මයෙහිදු විචිකිච්ඡා නැත් ද, එය එසේ ම වෙයි.

මහණෙනි, එහෙයින් ම තොප විසින් මෙහි මෙසේ හික්මිය යුතු ඉඳුරන්හි පියූ දොර ඇති වම්හ. භොජනයෙහි මාත්‍රඥ වම්හ. ජාගරණයෙහි අනුයුක්ත වම්හ. කුශලධර්මයෙහි විදර්ශක වම්හ. පූර්වරාත්‍ර අපරරාත්‍රයෙහි බෝපැකිදම් පිළිබඳ භාවනානුයොගයෙහි අනුයුක්ත ව වසම්හ"යි. මහණෙනි, තොප මෙසේ ම හික්මිය යුතු ය යි.

## 5. 2. 1. 7.

## [ ඨාන සූත්‍රය ]

**[සැවැත් නිදනයි. ]**

7. මහණෙනි, මාගමක විසින් වේ ව යි, පිරිමියකු විසින් වේ ව යි, ගිහියකු විසින් වේ ව යි, පැවිද්දකු විසින් වේ ව යි මෙ කරුණු පස නිරතුරු පස්විකිය යුතු. කවර පසෙක යත්:

'ජරා ස්වභාව ඇතියෙම් ජරාව නො ඉක්මවූයෙම් වෙමි'යි ස්ත්‍රියක විසින් වේ ව යි, පුරුෂයකු විසින් වේ ව යි, ගෘහස්ථයකු විසින් වේ ව යි, පැවිද්දකු විසින් වේ ව යි නිතර පස්විකිය යුතු.

'ව්‍යාධි සවභාව ඇතියෙම්, ව්‍යාධිය නො ඉක්මවූයෙම් වෙමැ'යි ස්ත්‍රියක විසින් වේ ව යි, පුරුෂයකු විසින් වේ ව යි, ගෘහස්ථයකු විසින් වේ ව යි. පැවිදියකු විසින් වේ ව යි නිතර පස්විකිය යුතු.

මරණ සවභාව ඇතියෙම් මරණය නො ඉක්මවූයෙම් වෙමැ'යි ස්ත්‍රියක විසින් වේ ව යි, පුරුෂයකු විසින් වේ ව යි, ගෘහස්ථයකු විසින් වේ ව යි. පැවිද්දකු විසින් වේ ව යි නිතර පස්විකිය යුතු.

'සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

'කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමී'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

කිඤ්ච භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'ජරාධම්මොම්හි ජරං අනතීතො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා? අත්ථි භික්ඛවෙ සත්තානං යොබ්බනෙ යොබ්බනමදො යෙන මදෙන මත්තා කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා දුච්චරිතං චරන්ති. තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො යො යොබ්බනෙ යොබ්බනමදො සො සබ්බසො වා පහීයති, තනු වා පන හොති ඉදං ඛො භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'ජරාධම්මොම්හි ජරං අනතීතො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

කිඤ්ච භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'ව්‍යාධිධම්මොම්හි ව්‍යාධිං අනතීතො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා? අත්ථි භික්ඛවෙ සත්තානං ආරොග්‍යෙ ආරොග්‍යමදො යෙන මදෙන මත්තා කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා දුච්චරිතං චරන්ති. තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො යො ආරොග්‍යෙ ආරොග්‍යමදො සො සබ්බසො වා පහීයති තනු වා පන හොති. ඉදං ඛො භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'ව්‍යාධිධම්මොම්හි ව්‍යාධිං අනතීතො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

කිඤ්ච භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'මරණධම්මොම්හි මරණං අනතීතො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා? අත්ථි භික්ඛවෙ සත්තානං ජීවිතෙ ජීවිතමදො යෙන මදෙන මත්තා කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා දුච්චරිතං චරන්ති. තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො යො ජීවිතෙ ජීවිතමදො සො සබ්බසො වා පහීයති, තනු වා පන හොති. ඉදං ඛො භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'මරණධම්මොම්හි මරණං අනතීතො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

'මාගේ හැම ප්‍රියයන් කෙරෙන් මනාපයන් කෙරෙන් නානාභාවය විනාභාවය වේ ය'යි ස්ත්‍රියක විසින් වේ ය යි, පුරුෂයකු විසින් වේව යි, ගෘහස්ථයකු විසින් වේව යි, ප්‍රව්‍රජිතයකු විසින් වේ ව යි නිතර පස්විකුම් කටයුතු.

'කර්මය ස්වකීය කොට ඇතියෙම්, කර්මය දායාද කොට ඇතියෙම්, කර්මය උත්පත්ති කාරණ කොට ඇතියෙම්, කර්මය බන්ධු කොට ඇතියෙම්, කර්මය පිළිසරණ කොට ඇතියෙම් වෙමි. කල්‍යාණ වේ ව යි, ලමු වේ ව යි, යම් ම කර්මයක් කරන්නෙම් නම්, එයට දායාද වෙම්'යි ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ ප්‍රව්‍රජිතයකු විසින් හෝ නිතර පස්විකුම් කටයුතු.

මහණෙනි, කවර අර්ථයක් පිණිස 'ජරාස්වභාව ඇතියෙම්, ජරාව තුළ වූයෙම් වෙම්'යි ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ ප්‍රව්‍රජිතයකු විසින් හෝ නිතර නුවණින් මෙනෙහි කටයුතු ය යත්: මහණෙනි, යම් මදයෙකින් මත් වූවාහු කයින් දුශ්චරිත කෙරෙත් නම්, වචනයෙන් දුශ්චරිත කෙරෙත් නම්, මනසින් දුශ්චරිත කෙරෙත් නම්, සත්නට ඒබඳු යෞවනයෙහි යොවුන් ඇරැබි උපන් මදයෙක් ඇත. එ කරුණ නිතර පස්විකන ඔහුගේ යොවුනෙහි යම් යෞවනමදයෙක් වේ නම් එය සර්වප්‍රකාරයෙන් හෝ ප්‍රහීණ වෙයි. තුනී හෝ වෙයි. මහණෙනි, මෙ කරුණ පිණිස 'ජරාස්වභාව ඇතියෙම් ජරාව නො ඉක්මවූයෙම් වෙම්'යි ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ පැවිද්දකු විසින් හෝ නිතර පස්විකිය යුතු

මහණෙනි, කවර කරුණක් පිණිස ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ පැවිද්දකු විසින් හෝ 'ව්‍යාධිස්වභාව කොට ඇතියෙම්, ව්‍යාධිය නො ඉක්මවූයෙම් වෙම්'යි නිතර පස්විකිය යුතු ය යත්: මහණෙනි, යම් මදයෙකින් මත් වූවාහු කයින් දුසිරිත් කෙරෙත් නම්, බයින් දුසිරිත් කෙරෙත් නම්, මනසින් දුසිරිත් කෙරෙත් නම්, සත්ත්වයනට ආරෝග්‍යයෙහි එබඳු ආරෝග්‍යමදයෙක් ඇත. එ කරුණ නිතර නුවණින් මෙනෙහි කරණ ඔහට ආරෝග්‍යය නිමිති කොට ආරෝග්‍යමදයෙක් (උපදනේ) වේ නම්, එය සර්වප්‍රකාරයෙන් හෝ ප්‍රහීණ වෙයි. තුනී හෝ වෙයි. මහණෙනි, මෙ කරුණ ම පිණිස 'ව්‍යාධිය ස්වභාව කොට ඇතියෙම්, ව්‍යාධිය තුළ ම වූයෙම් වෙම්'යි ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ ප්‍රව්‍රජිතයකු විසින් හෝ නිතර පස් විකිය යුතු.

මහණෙනි, කවර කරුණක් පිණිස 'මරණ ධර්මය ඇතියෙම් මරණය තුළ වූයෙම් වෙම්'යි ස්ත්‍රියක විසින් වේව යි, පුරුෂයකු විසින් වේව යි, ගෘහස්ථයකු විසින් වේව යි, පැවිද්දකු විසින් වේව යි නිතර පස්විකිය යුතුය යත්: මහණෙනි, යම් ජීවිත මදයෙකින් මත් වූවාහු කයින් දුසිරිත් කෙරෙත් නම්, බසින් දුසිරිත් කෙරෙත් නම්, සිතින් දුසිරිත් කෙරෙත් නම්, සත්ත්වයනට ජීවිතයෙහි එබඳු ජීවිත මදයෙක් ඇත. එ කරුණ පස්විකන ඔහට ජීවිතයෙහි යම් ජීවිතමදයෙක් වේ ද, එය සර්වප්‍රකාරයෙන් හෝ ප්‍රහීණ වෙයි. තුනී හෝ වෙයි. මහණෙනි, මෙ කරුණ ම පිණිස ස්ත්‍රියක විසින් වේවයි, පුරුෂයකු විසින් වේවයි, ගෘහස්ථයකු විසින් වේවයි පැවිද්දකු විසින් වේවයි 'මරණ ධර්මයෙම්, මරණය නො ඉක්මියෙම් වෙම්'යි නිතර පස්විකිය යුතු ය.

කිඤ්ච භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා? අත්ථි භික්ඛවෙ සත්තානං පියෙසු ඡන්දරාගො යෙන රාගෙන රත්තා කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා දුච්චරිතං චරන්ති තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො යො පියෙසු ඡන්දරාගො සො සබ්බසො වා පහීයති, තනු වා පන හොති. ඉදං ඛො භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

කිඤ්ච භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමී'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා? අත්ථි භික්ඛවෙ සත්තානං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො සබ්බසො වා තං පහීයති, තනු වා පන හොති ඉදං ඛො භික්ඛවෙ අත්ථවසං පටිච්ච 'කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමී'ති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.

ස ඛො සො භික්ඛවෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: න ඛො අහඤ්ඤෙවෙකො ජරාධම්මො ජරං අනතීතො, අථ ඛො යාවතා සත්තානං ආගති ගති චුති උපපත්ති, සබ්බෙ සත්තා ජරාධම්මා ජරං අනතීතා'ති තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො මග්ගො සඤ්ජායති. සො තං මග්ගං ආසෙවති, භාවෙති, බහුලීකරොති තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සංයොජනා පහීයන්ති,[1] අනුසයා ව්‍යන්තී හොන්ති.

න ඛො අහඤ්ඤෙවෙකො ව්‍යාධිධම්මො ව්‍යාධිං අනතීතො, අථ ඛො යාවතා සත්තානං ආගති ගති චුති උපපත්ති, සබ්බෙ සත්තා ව්‍යාධිං අනතීතා'ති, තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො මග්ගො සඤ්ජායති, සො තං මග්ගං ආසෙවති, භාවෙති, බහුලීකරොති, තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සංයොජනා පහීයන්ති.[1] අනුසයා ව්‍යන්තී හොන්ති.

1. සංයොජනානි පහීයන්ති - ස්‍යා. සංයොජනානි සබ්බසො පහීයන්ති - මජසං.

මහණෙනි, කවර කරුණක් පිණිස 'මාගේ හැම ප්‍රියමනාපයන් කෙරෙන් නානාභාවය විනාභාවය වේ ය'යි ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ ප්‍රව්‍රජිතයකු විසින් හෝ නිතර ප්‍රත්‍යවෙක්ෂා කට යුතු ය යත්: මහණෙනි, යම් රාගයෙකින් රත් වූවාහු කයින් දුසිරිත් කෙරෙත් නම් බසින් දුසිරිත් කෙරෙත් නම් සිතින් දුසිරිත් කෙරෙත් නම් සත්ත්වයනට ප්‍රියයන් කෙරෙහි එබඳු ඡන්දරාගයෙක් ඇත. එ කරුණ නිතර ප්‍රත්‍යවෙක්ෂා කරණ ඔහට ප්‍රියයන් කෙරෙහි යම් ඡන්දරාගයෙක් වේ ද, එය සම්ප්‍රකාරයෙන් හෝ ප්‍රහීණ වෙයි. තුනී හෝ වෙයි. මහණෙනි, මෙ කරුණ ම පිණිස 'හැම ප්‍රියමනාපයන් කෙරෙන් මාගේ නානාභාවය විනාභාවය වේ ය'යි ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ ප්‍රව්‍රජිතයකු විසින් හෝ නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

මහණෙනි, කවර කරුණක් පිණිස 'කර්මස්වකයෙමි, කර්මදායාදයෙමි. කර්මය යොනි කොට ඇතියෙමි, කර්මය බන්ධු කොට ඇතියෙමි, කර්මය පිළි සරණ කොට ඇතියෙමි වෙමි. කල්‍යාණ වූ හෝ ලාමක වූ හෝ යම් ම කර්මයක් කරම් නම් එයට දායාද වෙමි'යි ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ පැවිද්දකු විසින් හෝ නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු ය යත්: මහණෙනි, සත්ත්වයන්ගේ කායදුශ්චරිතය වාග්දුශ්චරිතය මනොදුශ්චරිතය ඇත. එ කරුණ නිතර ප්‍රත්‍යවෙක්ෂා කරණ ඔහට එය සම්ප්‍රකාරයෙන් ප්‍රහීණ හෝ වෙයි. තුනු හෝ වෙයි මහණෙනි, මෙ කරුණ ම පිණිස 'කර්මස්වකයෙමි, කර්මදායාදයෙමි, කර්මයොනි කොට ඇතියෙමි, කර්ම බන්ධු කොට ඇතියෙමි, කර්මය පිළිසරණ කොට ඇතියෙමි වෙමි, කල්‍යාණ වේවයි, ලාමක වේවයි යම් ම කර්මයක් කෙරෙම් ද, එයට දායාද වෙමි'යි ස්ත්‍රියක විසින් වේවයි, පුරුෂයකු විසින් වේවයි ගෘහස්ථයකු විසින් වේවයි පැවිද්දකු විසින් වේවයි නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

මහණෙනි, එ අරිසවු මෙසේ නුවණින් සලකයි: 'එකලා මම් ම ජරාධර්මයෙම් ජරාව නො ඉක්ම සිටියෙම් නො වෙමි. වැලි යම් තාක් සත්ත්වයන්ගේ ආගතිය ගතිය ච්‍යුතිය උපපත්තිය වේ ද, එ හැම සත්ත්වයෝ ජරාධර්මයහ, ජරාව නො ඉක්ම සිටියහ'යි එ කරුණ නිතර ප්‍රත්‍යවෙක්ෂා කරණුවහට ලොකොත්තර මාර්ගය උපදනේ ය. හේ එ මඟ සෙවුනේ ය. වඩනේ ය, බහුල විසින් කරන්නේ ය. එ මඟ සෙවුනා වඩනා බිහිලිවිසින් කරණ ඔහුගේ දශසංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ විගතාන්ත වෙත්.

'එකලා මම් ම ව්‍යාධිය සැහැවි කොට ඇතියෙම්, ව්‍යාධිය නො ඉක්ම වූයෙම්, නො වෙමි. වැලිත් යම් තාක් සත්ත්වයන්ගේ ආගතිය ගතිය ච්‍යුතිය උපපත්තිය වේ නම් එ හැම සත්හු ව්‍යාධිධර්මයහ. ව්‍යාධිය නො ඉක්ම සිටියහ'යි නිතර එ කරුණ ප්‍රත්‍යවෙක්ෂා කරණ ඔහට මාර්ගය උපදනේ ය. හේ මාර්ගය ආසෙවිත කෙරෙයි, භාවිත කෙරෙයි, බහුලීකෘත කෙරෙයි. එ මාර්ගය සෙවනය කරණ, වඩන, බහුල කරණ, ඔහුගේ සංයොජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ විගතාන්ත වෙත්.

‘න ඛො අහඤ්ඤෙවෙකො මරණධම්මො, මරණං අනතීතො, අථ ඛො, යාවතා සත්තානං ආගති ගති චුති උපපත්ති, සබ්බෙ සත්තා මරණධම්මා මරණං අනතීතා’ති තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො මග්ගො සඤ්ජායති සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සංයොජනා පහීයන්ති අනුසයා ව්‍යන්තී හොන්ති.

‘න ඛො මය්හමෙවෙකස්ස සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො, අථ ඛො යාවතා සත්තානං ආගති ගති චුති උපපත්ති, සබ්බෙසං සත්තානං පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො’ති තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො මග්ගො සඤ්ජායති. සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සංයොජනා පහීයන්ති අනුසයා ව්‍යන්තී හොන්ති.

‘න ඛො අහඤ්ඤෙවෙකො කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං ව තස්ස දායාදො භවිස්සාමි, අථ ඛො යාවතා සත්තානං ආගති ගති චුති උපපත්ති, සබ්බෙ සත්තා කම්මස්සකා කම්මදායාදා කම්මයොනී කම්මබන්ධු කම්මපටිසරණා, යං කම්මං කරිස්සන්ති කල්‍යාණං වා පාපකං වා, තස්ස දායාදා භවිස්සන්ති’ති තස්ස තං ඨානං අභිණ්හං පච්චවෙක්ඛතො මග්ගො සඤ්ජායති. සො තං මග්ගං ආසෙවති, භාවෙති, බහුලීකරොති තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සංයොජනා පහීයන්ති. අනුසයා ව්‍යන්තී හොන්ති’ති.

7. ව්‍යාධිධම්මා ජරාධම්මා අථො මරණධම්මිනො,
යථා ධම්මා තථා සත්තා[1] ජිගුච්ඡන්ති පුථුජ්ජනා.

8. අහඤ්චෙතං ජිගුච්ඡෙය්‍යං එවං ධම්මෙසු පාණිසු,
න මෙතං පතිරූපස්ස මම එවං විහාරිනො

9. සොහං එවං විහරන්තො ඤත්වා ධම්මං නිරූපධිං,
ආරොග්‍යෙ යොබ්බනස්මිඤ්ච ජීවිතස්මිඤ්ච යෙ මදා,

10. සබ්බෙ මදෙ අභිභොස්මි නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො
තස්ස මෙ අහු උස්සාහො නිබ්බානං අභිපස්සතො.

11. නාහං භබ්බො එතරහි කාමානි පතිසෙවිතුං,
අනිවත්ති භවිස්සාමි බ්‍රහ්මචරියපරායණොති.

---

1. සත්තා - මජසං.

'එකලා මම් ම මරණසවභාව ඇතියෙම් මරණය නො ඉක්මවූයෙම් නො වෙමි. වැලිත් යම් තාක් සත්‍වයන්ගේ ආගතිය ගතිය ච්‍යුතිය උපපත්තිය වේ නම්, එ හැම සත්හු මරණසවභාවය ඇතියාහු මරණය නො ඉක්මවූවාහු වෙති'යි එකරුණ නිතර ප්‍රත්‍යවෙක්‍ෂා කරණ ඔහට මාර්‍ගය උපදනේ ය. හෙ එ මඟ සෙවුනේ ය. වඩන්නේ ය. බහුලවිසින් කරන්නේ ය. එ මඟ සෙවුනා වඩනා බිහිලි කරණ ඔහට සංයොජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ විගතාන්ත වෙත්.

'එකලා මට ම හැම ප්‍රියමනාපයන් කෙරෙත් නානාභාවය විනාභාවය නො වේ මැ යි. වැලිත් යම් තාක් සත්‍වයන්ගේ ආගතිය ගතිය ච්‍යුතිය උපපත්තිය වේ ද, එ හැම සතුන්ගේ ප්‍රියමනාපයන් කෙරෙන් නානාභාවය විනාභාවය වේ ය'යි එ කරුණ නිතර ප්‍රත්‍යවෙක්‍ෂා කරණ ඔහට මාර්‍ගය උපදනේ ය. හේ එ මඟ සෙවුනේය. වඩන්නේ ය. බහුලවිසින් කරන්නේ ය එ මඟ සෙවුනා වඩනා බිහිලි කරණ ඔහුගේ සංයොජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ විගතාන්ත වෙත්.

'එකලා මම් ම කර්‍මසවකයෙම්, කර්‍මය දායාද කොට ඇතියෙම්, කර්‍මය උත්පත්තිකාරණ කොට ඇතියෙම්, කර්‍මය බන්ධු කොට ඇතියෙම්, කර්‍මය ප්‍රතිශරණ කොට ඇතියෙම්, කලණ වේවයි, ලමු වේවයි යම් ම කර්‍මයක් කෙරෙම් නම්, එයට දායාදයෙම් නො වෙමි. වැලිදු යම් තාක් සත්‍වයන්ගේ ආගතිය ගතිය ච්‍යුතිය උපපත්තිය වේ ද, එ හැම සත්‍වයෝ කර්‍මසවකයහ. කර්‍මදායාදයහ. කර්‍මයොනියහ. කර්‍මබන්ධුයහ. කර්‍මප්‍රතිශරණයහ. කලණ වේවයි, ලමු වේවයි, යම් කර්‍මයක් කෙරෙත් නම්, එයට දායාද වන්නාහ'යි එ කරුණ නිතර ප්‍රත්‍යවෙක්‍ෂා කරන ඔහට මඟ උපදනේ ය. හෙ එ මඟ ආසෙවන කෙරෙයි. භාවිත කෙරෙයි. බහුලීකෘත කෙරෙයි. එ මඟ සෙවුනා වඩනා බිහිලි කරණ ඔහට සංයොජනයෝ ප්‍රහීන වෙත්. අනුශයයෝ විගතාන්ත වෙති යි.

7. ව්‍යාධිය සවභාව කොට ඇති, ජරාව සවභාව කොට ඇති, වැලිත් මරණය සවභාව කොට ඇති පෘථග්ජනයෝ සැහැවිදහම්හු යම් බඳු වෙත් නම්, එබඳු සැහැවි ඇතියාහු ම (එබඳු අන්‍යයනට) ජුගුප්සා කෙරෙත්.

8. මෙබඳු සැහැවි ඇති ප්‍රාණීන් කෙරෙහි ඉදින් මම් තෙල පුහුල් හෙලා දක්නෙම් නම්, මෙබඳු සැහවියෙන් වාස කරණ මට තෙල නිසි නො වන්නේය.

9. මෙසේ වසන එ මම් උපධි රහිත අර්හත්මාර්‍ගය දැන ආරොග්‍යයෙහිදු යෞවනයෙහිදු ජීවිතයෙහිදු යම් මදකෙනෙක් වෙත් නම්,

10. නෛෂ්ක්‍රම්‍ය සඞ්ඛ්‍යාත පැවිද්ද ක්‍ෂෙම විසින් දැක හැම මදයන් මැඩ සිටිනෙම් වෙමි. නිර්‍වාණය මොනොවට දක්නා එමට උත්සාහ සඞ්ඛ්‍යාත සම්‍යක් ව්‍යායාමය විය.

11. දැන් මම් කාමයන් සෙවුනට භව්‍ය නො වෙමි, මාර්‍ගබ්‍රහමචර්‍ය්‍යය පරායණ කොට ඇතියෙම්, නො නවත්නාසුලු වන්නෙමි යි.

## 5. 2. 1. 8.

## [ ලිච්ඡවිකුමාරසුත්තං ]

8. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලියං පිණ්ඩාය පාවිසි වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො මහාවනං අජ්ඣොගාහෙත්වා[1] අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

තෙන ඛො පන සමයෙන සම්බහුලා ලිච්ඡවිකුමාරකා සජ්ජානි ධනූනි ආදාය කුක්කුරසඞ්ඝපරිවුතා මහාවනෙ අනුචඞ්කමමානා අනුවිචරමානා අද්දසංසු භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං දිවාවිහාරං.[2] දිස්වාන සජ්ජානි ධනූනි නික්ඛිපිත්වා කුක්කුරසඞ්ඝං එකමන්තං උය්යොජෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා තුණ්හීභූතා තුණ්හීභූතා පඤ්ජලිකා භගවන්තං පයිරුපාසන්ති

තෙන ඛො පන සමයෙන මහානාමො ලිච්ඡවි මහාවනෙ ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො අද්දස තෙ ලිච්ඡවිකුමාරකෙ තුණ්හීභූතෙ තුණ්හීභූතෙ පඤ්ජලිකෙ භගවන්තං පයිරුපාසන්තෙ. දිස්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො ලිච්ඡවි උදානං උදානෙසි: භවිස්සන්ති වජ්ජී, භවිස්සන්ති වජ්ජී'ති.

කිං පන ත්වං මහානාම එවං වදෙසි 'භවිස්සන්ති වජ්ජී භවිස්සන්ති වජ්ජී'ති.

"ඉමෙ භන්තෙ ලිච්ඡවිකුමාරකා චණ්ඩා ඵරුසා අපජහා[3]ති. යානි'පි තානි කුලෙසු පහෙනකානි[4] පහීයන්ති උච්ඡූනි වා බදරානි වා පූවානි වා මොදකානි වා සඞ්ගුලිකානි[5] වා, තානි විලුම්පිත්වා විලුම්පිත්වා ඛාදන්ති. කුලිත්ථීනම්පි කුලකුමාරීනම්පි පච්ඡාලියං[6] ඛිපන්ති. තෙ'දානිමෙ තුණ්හීභූතා තුණ්හීභූතා පඤ්ජලිකා භගවන්තං පයිරුපාසන්තී'ති.

යස්ස කස්සචි මහානාම කුලපුත්තස්ස පඤ්චධම්මා සංවිජ්ජන්ති, යදි වා රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස[7], යදි වා රට්ඨිකස්ස[8] පෙත්තනිකස්ස, යදි වා සෙනාය සෙනාපතිකස්ස, යදි වා ගාමගාමිකස්ස[9], යදි වා පූගගාමණිකස්ස, යෙ වා පන කුලෙසු පච්චෙකාධිපච්චං කාරෙන්ති, වුද්ධියෙව පාටිකඞ්ඛා, නො පරිහානි කතමෙ පඤ්ච?

ඉධ මහානාම කුලපුත්තො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි මාතාපිතරො සක්කරොති ගරු[10] කරොති මානෙති පූජෙති. තමෙනං මාතාපිතරො සක්කතා ගරුකතා මානිතා පූජිතා කල්‍යාණෙන මනසා අනුකම්පන්ති: 'චිරං ජීව, දීඝමායුං පාලෙහී'ති මාතාපිතානුකම්පිතස්ස මහානාම කුලපුත්තස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා, නො පරිහානි.

---

1 අජ්ඣොගාහෙත්වා - මජසං 2. 'දිව විහාරං' - මජසං, කම්.
3. අපානුභා - මජසං, අපාටුභා - සයා. 4 පහිණකානි - සයා, පහීණකානි - සීමු
5. සංකුලිකානි - මජසං. සංඛලිකානි වා. - සීමු. 6. පච්ඡලියං - කම්.
7. මුද්ධාවසිත්තස්ස, කම් 8. රට්ඨකස්ස - සීමු. 9. ගාමගාමණිකස්ස - මජසං
10. ගරුං - මජසං.

## 5. 2. 1. 8

## [ ලිච්ඡවිකුමාර සූත්‍රය ]

8. එක් කාලෙක භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර** මහවනවෙහෙර **කූඨාගාරශාලායෙහි** වැඩවසන සේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ වෙසාලියෙහි පිඩු පිණිස පිවිසි සේක. වෙසාලියෙහි පිඩු පිණිස හැසිර පස්බත පිඩුවායෙන් පෙරළා වැඩිසේක් මහාවනයට පිවිස ගෙණ අන්‍යතර වෘක්‍ෂමූලයෙක්හි දිවාවිහාරයට වැඩහුන් සේක.

එ සමයෙහි බොහෝ **ලිච්ඡවි** කුමාරයෝ දියනැගි දුනු ගෙණ කුකුරු (සුනඛ)ගණා විසින් පිරිවරණ ලද්දවෝ මහවෙනෙහි අනුවඩක්‍රමණ කරන්නාහු ඇවිදුනාහු එක්තරා රුක්මූලෙක දිවාවිහාරයට වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටහ දැක සහදියදුනු බහා තබා කුකුරුගණා එකත්පසෙක යවා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවිතුන් වහන්සේ සකසා වැඳ තුෂ්ණීම්භූත වූවාහු බඳැඳිලි ඇතියාහු භාග්‍යවතුන් වහන්සේ පයඞ්පාසන කරත්.

එ කල මහානාම ලිච්ඡවි රජ මහවෙනෙහි ජඞඝාවිහාරය පිණිස සක්මන් කරණුයේ ඇවිදිනුයේ තුෂ්ණීම්භූත ව බඳැඳිලි ඇති ව භාග්‍යවතුන් වහන්සේ පයඞ්පාසනා කරණ එ ලිච්ඡවි කුමරුන් දිටි දැක භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන් මහානාම ලිච්ඡවිරජ "වජ්ජිහු වැඩෙන්නාහ, වජ්ජිහු වැඩෙන්නාහ"යි උදන් ඇනී ය

මහානාමය, තෙපි "වජ්ජිහු වැඩෙන්නාහ, වජ්ජිහු වැඩෙන්නාහ"යි කවර හෙයින් මෙසේ කියහු.

"වහන්ස, මේ ලිච්ඡවි කුමරුවෝ කායකර්මයෙන් චණ්ඩයහ. වාක්කර්ම-යෙන් පරුෂයහ. අවෘද්ධිනිඃශ්‍රිතමානයෙන් තදහ. උක්දඬු වේවයි, ඩෙබර වේවයි, මෝදක (මුං කැරලි) වේවයි, තිලසඟලා වේවයි, කුලයන්හි යම් ඒ පඩුරු කෙනෙක් යවනු ලැබෙත් නම් ඒ පුනපුනා වොලොගෙණ කත්. කුලස්ත්‍රීනට කුලකුමාරියනට පසු පසින් ගොස් පිටිපසින් පහර දෙත්. එ මොහු දැන් අත්‍යනතයෙන් තුෂ්ණීම්භූත ව බඳැලි ඇති ව භාග්‍යවතුන් පයඞ්පාසනා කරති" යි.

මහානාමය, කැත්කුලෙහි උපන් මුදුනෙහි බිසෙස් කළ රජකුට වේවයි පියදත්සැපත් වළඳන රැවියකුට වේවයි, සෙනායෙහි සෙන්පතියකුට වේවයි, ගම්හිමියකුට වේවයි, ගණදෙටුවකුට වේවයි, කුලයෙහි ප්‍රත්‍යෙකාධි-පත්‍යය කරණ යම් ම කෙනකුට වේවයි, යම් ඒ කුලපුත්‍රයකුට පඤ්චධර්ම ඇත් ද, වෘද්ධිය ම කැමැති විය යුතුය පරිහානි නො කැමැති විය යුතුය. කවර පඤ්චධර්ම ද යත්:

මහානාමය, මෙ ලොව්හි කුලපුත් බාහුබලයෙන් රැස් කොට ගත්, හෙළු සෝදිය ඇති, දැහැමි, ධර්මයෙන් ම ලත්, උත්ථානවීර්‍යයෙන් උපයා ගත් භොගයෙන් මාපියන් සත්කාර කරත්නේ ය. ගුරුකාර කරත්නේ ය. බුහුමන් කරන්නේ ය. පුදන්නේ ය සත්කාර කරණ ලද, ගුරුකාර කරණ ලද, බුහුමන් කරණ ලද, පුදන ලද මාපියෝ ඔහට කලණසිතින් "සැරදේ, දිගා පල්නේ"ය යි අනුකම්පා කරත්. මහානාමය, මාපියන් විසින් අනුකම්පිත කුලපුත්හට වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානි නො කැමැති විය යුතු.

පුන ච පරං මහානාම කුලපුත්තො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි පුත්තදාරදාසකම්මකරපොරිසෙ සක්කරොති, ගරුකරොති, මානෙති, පූජෙති, තමෙනං පුත්තදාරදාසකම්මකරපොරිසා සක්කතා ගරුකතා මානිතා, පූජිතා කල්‍යාණෙන මනසා අනුකම්පන්ති: 'චිරං ජීව, දීඝමායුං පාලෙහී'ති. පුත්තදාරදාසකම්මකරපොරිසානුකම්පිතස්ස මහානාම කුලපුත්තස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා, නො පරිහානි.

පුන ච පරං මහානාම කුලපුත්තො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි ඛෙත්තකම්මන්තසාමන්තසංවොහාරෙ[1] සක්කරොති, ගරුකරොති, මානෙති, පූජෙති. තමෙනං ඛෙත්තකම්මන්තසාමන්තසංවොහාරා සක්කතා ගරුකතා මානිතා පූජිතා කල්‍යාණෙන මනසා අනුකම්පන්ති: 'චිරං ජීව, දීඝමායුං පාලෙහී'ති. ඛෙත්තකම්මන්තසාමන්තසංවොහාරානුකම්පිතස්ස මහානාම කුලපුත්තස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා, නො පරිහානි.

පුන ච පරං මහානාම, කුලපුත්තො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි යාවතා බලිපටිග්ගාහිකා දෙවතා සක්කරොති, ගරුකරොති, මානෙති, පූජෙති. තමෙනං බලිපටිග්ගාහිකා දෙවතා සක්කතා ගරුකතා මානිතා පූජිතා කල්‍යාණෙන මනසා අනුකම්පන්ති: 'චිරං ජීව, දීඝමායුං පාලෙහී'ති. දෙවතානුකම්පිතස්ස මහානාම කුලපුත්තස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා, නො පරිහානි.

පුන ච පරං මහානාම කුලපුත්තො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි සමණබ්‍රාහ්මණෙ සක්කරොති, ගරුකරොති, මානෙති, පූජෙති. තමෙනං සමණබ්‍රාහ්මණා සක්කතා ගරුකතා මානිතා පූජිතා කල්‍යාණෙන මනසා අනුකම්පන්ති: 'චිරං ජීව, දීඝමායුං පාලෙහී'ති: සමණබ්‍රාහ්මණානුකම්පිතස්ස මහානාම කුලපුත්තස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා, නො පරිහානි.

යස්ස කස්සචි මහානාම කුලපුත්තස්ස ඉමෙ පඤ්ච ධම්මා සංවිජ්ජන්ති, යදි වා රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස යදි වා රට්ඨිකස්ස පෙත්තනිකස්ස යදි වා සෙනාය සෙනාපතිකස්ස යදි වා ගාමගාමිකස්ස යදි වා පූගගාමණිකස්ස, යෙ වා පන කුලෙසු පච්චෙකාධිපච්චං කාරෙන්ති, වුද්ධියෙව පාටිකඞ්ඛා, නො පරිහානී'ති.

1 සාමන්තසබ්‍යොහාරෙ - මජසං

තවද මහානාමය, කුලපුත් උත්ථානවීර්‍යයෙන් ලත්, බාහුබලයෙන් උපයා ගත්, සෝදිය වගුරුවා ඉපයූ, දැහැමි, දැහැමින් ම ලත් භොගයෙන් අඹුදරු දස්කම්කරු පුරිස් සගන්නේ ය. ගුරුකාර කරන්නේ ය. බුහුමන් කරන්නේ ය පුදන්නේ ය, අඹුදරුදස්කම්කරුපුරිස්හු සත්කෘත වූවාහු ගුරුකෘත වූවාහු මානිත වූවාහු පූජිත වූවාහු ''සැරදෙ, දිගා පල්නේ ය''යි කලණ සිතින් ඔහට අනුකම්පා කරත්. මහානාමය, අඹුදරුදස්කම්කරුපුරිස් විසින් අනුකම්පා කරණ ලද කුලපුත් හට වෘද්ධියෙක් ම කැමැත් විය යුතු පරිහානියෙක් නො කැමැති විය යුතු.

තවද මහානාමය, කුලපුත් උත්ථානවීර්‍යාධිගත බාහුබලයෙන් උපයා ගත්, සෝදිය වගුරුවා ඉපයූ, දැහැමි, දැහැමින් ම ලත් භොගයෙන් තමන් කෙත්කමතට අනතුරුකෙත්හිමියන් හා යටවරයනට (බිම් මනන්නන්ට) සත්කාර කෙරෙයි. ගුරුකාර කෙරෙයි. මානනය කෙරෙයි. පූජා කෙරෙයි. සත්කාර කරණ ලද ගුරුකාර කරණ ලද බුහුමන් කරණ ලද පුදන ලද අනතුරුකෙත් හිමියෝ ද යටවරයෝ ද කලණසිතින් ''සැරදෙ, දිගා පල්නේය''යි ඔහට අනුකම්පා කරත්. අනතුරුකෙත්හිමියන් හා යටවරයන් විසින් අනුකම්පිත වූ කුලපුත් හට වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානියෙක් නො කැමැති විය යුතු.

තවද මහානාමය, කුලපුත් උත්ථානවීර්‍යයෙන් ලත්, බාහුබලයෙන් උපයාගත්, සෝදිය වගුරුවා ඉපයූ, දැහැමි, දැහැමින් ම ලත්, භොගයෙන් යම් පමණ පුද පිළිගන්නා දෙවියෝ ඇත් නම්, ඔවුනට (අග්‍ර යාගුභක්තාදීන්) සත්කාර කෙරෙයි. ගුරුකාර කෙරෙයි. මානනා කෙරෙයි. පූජා කෙරෙයි සත්කාර ලත් ගුරුකාර ලත් මානනා ලත් පූජා ලත් පුද පිළිගන්නා දෙවියෝ ''සැරදෙ,දිගා පල්නේ යැ''යි ඔහට කලණසිතින් අනුකම්පා කරත්. මහානාමය, දෙවතාවන් විසින් අනුකම්පිත කුලපුත් හට වෘද්ධිය ම කැමැති විය යුතු. පරිහානි නො කැමැති විය යුතු.

තවද මහානාමය, කුලපුත්‍ර උත්ථානවීර්‍යාධිගත බාහුබලයෙන් උපයා ගත්, සෝදිය වගුරුවා ඉපයූ, දැහැමි වූ, දැහැමින් ම ලද භොගයෙන් මහණ බමුණනට සත්කාර කරයි. ගුරුකාර කරයි. මානනය කරයි. පූජා කරයි. සත්කාර කරණ ලද ගරු කරණ ලද මානනය කරණ ලද පුදන ලද මහණබමුණෝ ''සැරදෙ, දිගා පල්නේ ය''යි ඔහට කලණසිතින් අනුකම්පා කරත්. මහානාමය, මහණබමුණන් විසින් අනුකම්පිත වූ කුලපුත් හට වෘද්ධිය ම කැමැති විය යුතු. පරිහානි නො කැමැති විය යුතු.

මහානාමය, ක්ෂත්‍රිය ජාතිකමූර්ධාභිෂික්ත රජකුට වේවයි, පියදත් සැපත් ඇති රටියකුට වේවයි, සෙනායෙහි සෙන්පතියකුට වේවයි, ගම් හිමියකුට වේවයි, සමූහාධිපතියකුට වේවයි, යම් ම කෙනෙක් කුලයෙහි ප්‍රත්‍යෙක-ආධිපත්‍යය කෙරෙත් නම් එබඳුවනට වේවයි, යම් කිසි කුල පුතකුට මේ පඤ්චධර්මයෝ ඇත් ද වෘද්ධිය ම කැමැති විය යුතු ය. පරිහානි නො කැමැති විය යුතු.

12. මාතාපිතුකිච්චකරො පුත්තදාරහිතො සදා,
අන්තො ජනස්ස අත්ථාය යෙ චස්ස උපජීවිනො.

13. උභින්නං යෙව[1] අත්ථාය වදඤ්ඤූ හොති සීලවා,
ඤාතීනං පුබ්බපෙතානං දිට්ඨධම්මෙ ච ජීවිනං.[2]

14. සමණානං බ්‍රාහ්මණානං දෙවතානං ච පණ්ඩිතො,
විත්තිසඤ්ජනනො හොති ධම්මෙන ඝරමාවසං.

15. සො කරිත්වාන කල්‍යාණං පුජ්ජො හොති පසංසියො,
ඉධ චෙව නං[3] පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදතී'[4]ති.

## 5. 2. 1. 9

### [ පඨමබුඩ්ඪපබ්බජිතසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

9. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො දුල්ලභො බුඩ්ඪපබ්බජිතො. කතමෙහි පඤ්චහි?

දුල්ලභො භික්ඛවෙ බුඩ්ඪපබ්බජිතො නිපුණො, දුල්ලභො ආකප්පසම්පන්නො, දුල්ලභො බහුස්සුතො, දුල්ලභො ධම්මකථිකො, දුල්ලභො විනයධරො.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො දුල්ලභො බුඩ්ඪපබ්බජිතො'ති.

## 5. 2. 1. 10

### [ දුතියබුඩ්ඪපබ්බජිතසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

10. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො දුල්ලභො බුඩ්ඪපබ්බජිතො. කතමෙහි පඤ්චහි?

දුල්ලභො භික්ඛවෙ බුඩ්ඪපබ්බජිතො සුවචො, දුල්ලභො සුග්ගහිතග්ගාහී, දුල්ලභො පදක්ඛිණග්ගාහී, දුල්ලභො ධම්මකථිකො, දුල්ලභො විනයධරො.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො දුල්ලභො බුඩ්ඪපබ්බජිතො'ති.

### නීවරණවග්ගො පඨමො.

**තස්සුද්දානං:**

ආවරණං රාසි අඞ්ගානි සමයං මාතුපුත්තිකා,
උපජ්ඣා ඨානං කුමරා ලිච්ඡවී අපරෙ දුවෙ'ති.

---

1 චෙව - මජ්සං. 2 දිට්ඨධම්මෙ ච ජීවතං - මජ්සං, ජීවිතං - සතා
3 ඉධෙවනං - මජ්සං. 4 සග්ගෙ පමොදති - මජ්සං.

12. හැම කල මාපියන්ගේ කාරණී කරණුයේ, අඹුදරුවන් කෙරෙහි හිතැතියේ, අනෙකාජනයාගේ අර්ථසිද්ධිය සඳහා ද යම් ම කෙනෙක් තුලුහු ඇසිරි කොට දිවි වටනාහු වෙත්නම් උනුදුගේ අර්ථය සඳහා ද කටයුතු කෙරේ නම්,

13. යදිවදත් දත්තේ, සිල්වත් වූයේ, කලුරිය කළ ඥතීන් හා දිට්ඨදම්මයෙහි ජීවත්වන ඥතීහුයයි උභයඥතීන්ගේ අර්ථය පිණිස (වටනේ) වේ නම්,

14. දැහැමින් ගිහිගෙයි වසන එ නුවණැති පුරුෂ මහණබමුණන් හා දෙවියනට සතුටු දනවන්නේ වෙයි.

15. හෙ කලණකම් කොට ප්‍රශංසාවට නිසි වූයේ පූජ්‍ය වෙයි. මෙ ලොව්හිදු ඔහු පසසත්. පරලොව සවර්ගයෙහිදු විපාකමොදනායෙන් ප්‍රමොද කරන්නේ ය.

## 5. 2. 1. 9.

## [පඨමබුඩ්ඪපබ්බජිත සූත්‍රය]

[සැවැත්නිදානයි:]

මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත බුඩ්ඪපබ්බජිත දුර්ලභ ය. කවර පසෙකින යත්:

මහණෙනි, නිපුණ (සියුම් කරුණු දනහෙන) බුඩ්ඪපබ්බජිත දුර්ලභ වෙයි. ආකල්පසම්පන්න (මහණසරුප්) වූයේ දුර්ලභ වෙයි. බහුශ්‍රුත වූයේ දුර්ලභ වෙයි. ධම්මකථික වූයේ වෙයි. විනයධර වූයේ දුර්ලභ වෙයි.

මහණෙනි, මෙ පස්කරුණින් සමන්වාගත බුඩ්ඪපබ්බජිත දුර්ලභ වේ.

## 5. 2. 1. 10

## [දුතියබුඩ්ඪපබ්බජිත සූත්‍රය]

[සැවැත්නිදානයි]

මහණෙනි, ධම් පසෙකින් සමන්වාගත බුඩ්ඪපබ්බජිත දුර්ලභ වෙයි. කවර පසෙකින යත්:

සුවච වූ බුඩ්ඪපබ්බජිත දුර්ලභ වෙයි. සුගෘහීතග්‍රාහී වූයේ (මනාසේ ඉගෙණීම ලබන සුල්ලේ) දුර්ලභ ය. ප්‍රදක්ෂිණාග්‍රාහී වූයේ (දුන් ඔවා පැදකුණු-කොට ගරුකොට ගන්නේ) දුර්ලභ ය. ධම්මකථික වූයේ දුර්ලභ ය. විනයධර වූයේ දුර්ලභ යි.

මහණෙනි, මේ ධම්පසින් සමන්වාගත බුඩ්ඪපබ්බජිත දුර්ලභ වේ.

## නීවරණවර්ගය ප්‍රථම යි.

එහි උද්දානය:

ආවරණ (නීවරණ) සූත්‍ර ය, අකුසලරාසි සූත්‍ර ය පධානියඞ්ග සූත්‍ර ය, සමය සූත්‍රය, මාතාපුත්ත සූත්‍ර ය, උපජ්ඣාය සූත්‍ර ය, ඨාන සූත්‍ර ය, ලිච්ඡවි-කුමාර සූත්‍ර ය, බුඩ්ඪපබ්බජිත සූත්‍ර දෙක ය යි දශයෙකි.

## 2. සඤ්ඤාවග්ගො

### 5. 2. 2. 1.

### [පඨමසඤ්ඤාසුත්තං]

[සාවත්ථිනිදානං]

11. පඤ්චිමා භික්ඛවෙ සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා. කතමා පඤ්ච?

අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආදීනවසඤ්ඤා, ආහාරෙ පටික්කූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා[1]

ඉමා ඛො භික්ඛවෙ පඤ්ච සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා'ති.

### 5. 2. 2. 2.

### [දුතියසඤ්ඤාසුත්තං]

සාවත්ථිනිදානං:]

12. පඤ්චිමා භික්ඛවෙ සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා. කතමා පඤ්ච?

අනිච්චසඤ්ඤා, අනත්තසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙ පටික්කූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා.[1]

ඉමා ඛො භික්ඛවෙ පඤ්ච සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා'ති.

### 5. 2. 2. 3.

### [පඨමවඩ්ඪිසුත්තං]

[සාවත්ථිනිදානං:]

13 පඤ්චහි භික්ඛවෙ වඩ්ඪීහි වඩ්ඪමානො අරියසාවකො අරියාය වඩ්ඪියා වඩ්ඪති, සාරාදායී ච හොති වරාදායී ච කායස්ස. කතමාහි පඤ්චහි?

සද්ධාය වඩ්ඪති, සීලෙන වඩ්ඪති, සුතෙන වඩ්ඪති, චාගෙන වඩ්ඪති, පඤ්ඤාය වඩ්ඪති.

ඉමාහි ඛො භික්ඛවෙ පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪමානො අරියසාවකො අරියාය වඩ්ඪියා වඩ්ඪති, සාරාදායී ච හොති වරාදායී ච කායස්සා'ති.

16. සද්ධාය සීලෙන ච යො'ධ වඩ්ඪති[2] පඤ්ඤාය චාගෙන සුතෙන චූභයං,
සො තාදිසො සප්පුරිසො විචක්ඛණො ආදීයති සාරමිධෙව අත්තනො'ති.

1. අනභිරති සඤ්ඤා - මජසං. 2. යො පවඩ්ඪති මජසං.

## 2. සඤ්ඤා වර්ගය

### 5. 2. 2. 1.

### [ පඨමසඤ්ඤා සූත්‍රය ]

[ සැවත්නිදානයි: ]

11. මහණෙනි, භාවිත වූ බහුලීකෘත වූ මේ සංඥාවෝ පස්දෙන (විපාක-ඵලවිසින්) මහත්ඵල මහානිසංස ඇත්තාහු අමෘතය පිහිට කොට ඇත්තාහු අමෘතය පර්‍යවසාන කොට ඇතියාහු වෙත්. කවර පස්දෙනෙක යත්:

අසුභසඤ්ඤා ය, මරණසඤ්ඤා ය, ආදීනවසඤ්ඤා ය, ආහාරයෙහි පටිකකූලසඤ්ඤා ය, හැම තෙධාතුසත්ත්වාසලොකයෙහි අනභිරත (නො ඇලෙන) සඤ්ඤා යි.

මහණෙනි, මේ සංඥාවෝ පස්දෙන භාවිත බහුලීකෘත වූවාහු මහත්ඵල මහානිසංස ඇත්තාහු අමෘතය ප්‍රතිෂ්ඨා කොට ඇත්තාහු අමෘතය පර්‍යවසාන කොට ඇත්තාහු වෙති.

### 5. 2. 2. 2.

### [ දුතියසඤ්ඤා සූත්‍රය ]

[ සැවැත්නිදාන යි: ]

12. මහණෙනි, වඩන ලද බිහිලි කරණ ලද මේ සංඥාවෝ පස්දෙන මහත්ඵල මහානෘශංස ඇත්තාහු අමෘතයට වන්නාහු අමෘතය පර්‍යවසාන කොට ඇත්තාහු වෙත්. කවරපස්දෙනෙක යත්:

අනිච්චසඤ්ඤා ය, අනත්තසඤ්ඤා ය, මරණසඤ්ඤා ය, ආහාරයෙහි පටිකකූලසඤ්ඤා ය, සකලලොකයෙහි අනභිරත සඤ්ඤා යි.

මහණෙනි, මේ සංඥාවෝ පස්දෙන භාවිත බහුලීකෘත වූවාහු මහත්ඵල හා මහානෘශංස ඇත්තාහු අමෘතයට වන්නාහු අමෘතය පර්‍යවසාන කොට ඇතියාහු වෙති.

### 5. 2. 7. 3.

### [ පඨමවඩ්ඪි සූත්‍රය ]

[ සැවැත්නිදානයි: ]

13. මහණෙනි, පඤ්චවිධ වෘද්ධියෙකින් වැඩෙන ආර්‍යශ්‍රාවක ආර්‍ය-වෘද්ධියෙන් වැඩෙන්නේ ය කායයාගේ සාරය ගන්නා සුල්ලේත්, වරය (උත්තමාර්‍ය) ගන්නා සුලුයේත් වෙයි. කවර පසෙකින යත්:

ශ්‍රද්ධායෙන් වැඩෙයි. ශීලයෙන් වැඩෙයි. ශ්‍රැතයෙන් වැඩෙයි. ත්‍යාගයෙන් වැඩෙයි. ප්‍රඥායෙන් වැඩෙයි.

මහණෙනි, මෙ පඤ්චවිධවෘද්ධියෙන් වැඩන ආර්‍යශ්‍රාවක ආර්‍යවෘද්ධියෙන් වැඩෙයි. කායයාගේ සාරය ගන්න සුල්ලේත්, වරය ගන්නා සුල්ලේත් වෙයි.

16. යමෙක් මෙ ලොව්හි ශ්‍රද්ධායෙනුදු ශීලයෙනුදු ප්‍රඥායෙනුදු ත්‍යාගයෙනුදු ශ්‍රැතයෙනුදු වැඩෙන්නේ නම්, විචක්ෂණවූ එබඳු එ සත්පුරුෂ මේ ආත්මභාවයෙහි ම තමාගේ (ජීවිත) සාරය ලබාගන්නේ යි.

## 5. 2. 2. 4.

## [ දුතියවඩ්ඪිසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

14. පඤ්චහි භික්ඛවෙ වඩ්ඪීහි වඩ්ඪමානා අරියසාවිකා අරියාය වඩ්ඪියා වඩ්ඪති සාරාදායිනී ච හොති වරාදායිනී ච කායස්ස. කතමාහි පඤ්චහි?

සද්ධාය වඩ්ඪති, සීලෙන වඩ්ඪති, සුතෙන වඩ්ඪති චාගෙන වඩ්ඪති, පඤ්ඤාය වඩ්ඪති.

ඉමාහි ඛො භික්ඛවෙ පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪමානා අරියසාවිකා අරියාය වඩ්ඪියා වඩ්ඪති. සාරාදායිනී ච හොති, වරාදායිනී ච කායස්සා’ති.

17. සද්ධාය සීලෙන ච යා’ධ වඩ්ඪති[1] පඤ්ඤාය චාගෙන සුතෙන චූභයං,
සා තාදිසී සීලවතී උපාසිකා ආදීයතී සාරමිධෙව අත්තනො’ති.

## 5. 2. 2. 5.

## [ අලංසාකච්ඡසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

15. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලංසාකච්ඡො සබ්‍රහ්මචාරීනං. කතමෙහි පඤ්චහි?

ඉධ භික්ඛවෙ භික්ඛු අත්තනා ච සීලසම්පන්නො හොති, සීලසම්පදාය[2] කථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති අත්තනා ච සමාධිසම්පන්නො හොති, සමාධිසම්පදාය[3] කථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති, පඤ්ඤාසම්පදාය[4] කථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච විමුත්තිසම්පන්නො හොති, විමුත්තිසම්පදාය[5] කථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති, අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති, විමුත්තිඤාණදස්සනසම්පදාය[6] කථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලංසාකච්ඡො සබ්‍රහ්මචාරීනන්ති.

## 5. 2. 2. 6.

## [ අලංසාජීවසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

16. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලංසාජීවො සබ්‍රහ්මචාරීනං. කතමෙහි පඤ්චහි?

ඉධ භික්ඛවෙ භික්ඛු අත්තනා ච සීලසම්පන්නො හොති, සීලසම්පදාය කථාය ච කතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච සමාධිසම්පන්නො හොති, සමාධිසම්පදාය කථාය ච කතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති, පඤ්ඤාසම්පදාය කථාය ච කතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච විමුත්තිසම්පන්නො හොති, විමුත්තිසම්පදාය කථාය ච කතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති, විමුත්තිඤාණදස්සනසම්පදාය කථාය ච කතං පඤ්හං ව්‍යාකත්තා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලංසාජීවො සබ්‍රහ්මචාරීනන්ති.

---

1. සා පවඩ්ඪති - මජසං. 2, සීලසම්පදා - සීමු 3. සමාධිසම්පදා - සීමු.
4. පඤ්ඤාසම්පදා-සීමු. 6 විමුත්තිසම්පදා-සීමු. 6. විමුත්තිඤාණදස්සනසම්පදා-සීමු

5. 2. 2. 4.

## [ දුතියවඩ්ඪි සූත්‍රය ]

[සැවැත්නිදානයි:]

14. මහණෙනි, පඤ්චවෘද්ධියෙකින් වැඩෙන ආර්‍යශ්‍රාවිකා ආර්‍ය-වෘද්ධියෙන් වැඩෙත්නී ය. (ජීවිතයාගේ) සාරය ගත්නී ද වරය ලබත්නී ද වෙයි. කවර පසෙකින යත්:

ශ්‍රද්ධායෙන් වැඩෙයි. ශීලයෙන් වැඩෙයි. ශ්‍රුතයෙන් වැඩෙයි. ත්‍යාගයෙන් වැඩෙයි. ප්‍රඥයෙන් වැඩෙයි.

මහණෙනි, මෙ පඤ්චවෘද්ධියෙන් වැඩෙන ආර්‍යශ්‍රාවිකා ආර්‍යවෘද්ධියෙන් වැඩෙයි. ජීවිතයාගේ සාරය ගත්නී ද වරය ලබත්නී ද වෙයි.

17. යම් ආර්‍යශ්‍රාවිකාවක් මෙ ලොව්හි ශ්‍රද්ධායෙනුදු ශීලයෙනුදු ප්‍රඥයෙනුදු ත්‍යාගයෙනුදු ශ්‍රුතයෙනුදු වැඩෙත්නී ද, එබඳු ඒ සිල්වත් උවැසි මෙ අත්බැව්හි ම තමාගේ (ජීවිත) සාරය ගත්නී වෙයි.

5. 2. 2. 5.

## [ අලංසාකච්ඡ සූත්‍රය ]

[සැවැත්නිදානයි:]

15. මහණෙනි, ධර්මපසෙකින් සමන්වාගත මහණ සබ්‍රම්සරනට සාකච්ඡාවට යුතු වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙමේත් ශීලසම්පන්න වෙයි. ශීලසම්පත් කථාව පිළිබඳ පුළුවුත් ප්‍රශ්න විසඳත්තේත් වෙයි. තෙමේත් සමාධි-සම්පන්න වෙයි. සමාධිසම්පත්කථාව පිළිබඳ පුළුවුත් ප්‍රශ්න විසඳත්තේත් වෙයි. තෙමේත් ප්‍රඥසම්පන්න වෙයි. ප්‍රඥසම්පත්කථාව පිළිබඳ පුළුවුත් ප්‍රශ්න විසඳත්තේත් වෙයි. තෙමේත් විමුක්තිසම්පන්න වෙයි. විමුක්ති-සම්පත්කථාව පිළිබඳ පුළුවුත් ප්‍රශ්න විසඳනුයේත් වෙයි. තෙමේත් විමුක්ති-ඥානදර්ශනසම්පන්න වෙයි. විමුක්තිඥානදර්ශනකථාව පිළිබඳ පුළුවුත් ප්‍රශ්න විසඳනුයේත් වෙයි.

මහණෙනි, මෙ පඤ්චධර්මයෙන් සමන්වාගත මහණ සබ්‍රම්සරනට සාකච්ඡාවට යුතු වේ ය යි.

5. 2. 2. 6.

## [ අලංසාජීව සූත්‍රය ]

[සැවැත්නිදානයි:]

16. මහණෙනි, ධර්මපසෙකින් සමන්වාගත මහණ සබ්‍රම්සරනට අලංසාජීව වෙයි. (ප්‍රශ්නපෘච්ඡාවිසර්ජනාඛ්‍ය ආජීවයෙන් සමාතාජීව ඇති වෙයි.) කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙමේත් සිල්සපත් වෙයි. ශීලසම්පත් කථාව පිළිබඳ (අභිසංස්කරණ කරණලද) ප්‍රශ්න විසඳනුයේත් වෙයි. තෙමේත් සමාධිසම්පන්න වෙයි. සමාධිසම්පත්කථාව පිළිබඳ කළ ප්‍රශ්න විසඳත්තේත් වෙයි. තෙමේත් ප්‍රඥසම්පන්න වෙයි. ප්‍රඥසම්පත්කථාව පිළිබඳ කළ ප්‍රශ්න විසඳත්තේත් වෙයි. තෙමේත් විමුක්තිසම්පන්න වෙයි. විමුක්තිසම්පත්කථාව පිළිබඳ කළ ප්‍රශ්න විසඳනුයේත් වෙයි. තෙමේත් විමුක්තිඥානදර්ශනසම්පන්න වෙයි. විමුක්තිඥානදර්ශනසම්පත්කථාව පිළිබඳ කළ ප්‍රශ්න විසඳත්තේත් වෙයි.

මහණෙනි, මෙ පඤ්චධර්මයෙන් සමන්වාගත මහණ සබ්‍රම්සරනට අලං-සාජීව වෙයි.

## 5. 2. 2. 7.

## [ පඨමඉද්ධිපාදසුත්තං ]

[ **සාවත්ථිනිදානං:** ]

17. යො හි කොචි භික්ඛවෙ භික්ඛු වා භික්ඛුනී වා පඤ්ච ධම්මෙ භාවෙති, පඤ්ච ධම්මෙ බහුලීකරොති, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං – දිට්ඨෙව ධම්මෙ[1] අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. උස්සොළ්හී යෙව පඤ්චමී.[2]

යො හි කොචි භික්ඛවෙ භික්ඛු වා භික්ඛුනී වා ඉමෙ පඤ්ච ධම්මෙ බහුලීකරොති, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං – දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා'ති.

## 5. 2. 2. 8.

## [ දුතියඉද්ධිපාදසුත්තං ]

[**සාවත්ථිනිදානං** ]

18. පුබ්බෙවා'හං භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධො බොධිසත්තො'ව සමානො පඤ්ච ධම්මෙ භාවෙසිං පඤ්ච ධම්මෙ බහුලීකාසිං[3]. කතමෙ පඤ්ච?

ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙසිං. විරියසමාධි -ප- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙසිං. උස්සොළ්හී යෙව පඤ්චමී.[2]

සො ඛො අහං භික්ඛවෙ ඉමෙසං උස්සොළ්හිපඤ්චමානං ධම්මානං භාවිතත්තා බහුලීකතත්තා යස්ස යස්ස[4] අභිඤ්ඤාසච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙසිං අභිඤ්ඤාසච්ඡිකිරියාය, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිං සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛිං අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවෙය්‍යං -පෙ-* යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙය්‍යන්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිං සති සති ආයතනෙ. -පෙ-*

සො සචෙ ආකඞ්ඛිං -පෙ-* ආසවානං ඛයා -පෙ-* සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිං සති සති ආයතනෙ'ති.

---

1. දිට්ඨෙව ධම්මෙ - මජ්ඣං. 2. උස්සොළ්හිං ඤෙව පඤ්චමිං - මජ්ඣං.
3 බහුලිමකාසිං - මජ්ඣං. 4. යස්ස - සීමු.
* පෙය්‍යාලමුඛෙහි සංඛිත්තා පඤ්චඞ්ගිකවග්ගෙ පඤ්චඞ්ගිකසමාධි සුත්තෙන ආගතනයෙන වෙදිතබ්බං.

5. 2. 2. 7.

[ පඨමඉද්ධිපාද සූත්‍රය ]

[සැවැත්නිදානයි:]

17. මහණෙනි, යම් කිසි මහණෙක් වේවයි, මෙහෙණක් වේවයි දහම් පසක් වඩන්නේ ද, දහම් පසක් බිහිලි කෙරේ ද, ඔහු විසින් ද්විවිධ ඵලයන් අතුරින් අන්‍යතරඵලයෙක් කැමැති විය යුතු:- ඉහාත්මයෙහි අර්හත්ඵලය හෝ උපාදිසෙසය ඇති වත් ම අනාගාමීභාවය හෝ යි. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඡන්දය අධිපති කොට ලත් සමාධියෙන් හා ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය අධිපති කොට ලත් සමාධියෙන් ... චිත්තය අධිපති කොට ලත් සමාධියෙන් ... විමංසාව අධිපති කොට ලත් සමාධියෙන් හා ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයි. (අධිමාත්‍ර උත්සාහ සඞ්ඛ්‍යාත) උස්සොළ්හිය පස් වැන්න යි.

මහණෙනි, යම් කිසි මහණෙක් වේවයි, මෙහෙණක් වේවයි, මේ ධර්‍මපස වඩා නම්, මේ ධර්‍මපස බහුල කෙරේ නම්, ඔහට ද්විවිධඵලයන් අතුරින් අන්‍යතර ඵලයෙක් කැමැති විය යුතු යඃ- ඉහාත්මයෙහි ම අර්හත්වය හෝ උපාදිසෙසය ඇති වත් ම අනාගාමිත්වය හෝ යි.

5. 2. 2. 8.

[ ද්‍රිතියඉද්ධිපාද සූත්‍රය ]

[සැවැත්නිදානයි:]

18. මහණෙනි, මම සම්බොධියෙන් ( චතුසසත්‍යාවබොධයෙන් ) පූර්‍වයෙහි ම අභිසම්බුද්ධ නො වූයෙම් බොධිසත්ත්ව වූයෙම් ම ධර්‍ම පසක් වැඩීමි. ධර්‍ම පසක් බිහිලි කෙළෙමි. කවර පසෙක යත්:

ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් යුත් ප්‍රධානසංස්කාරයෙන් සමන්‍වාගත ඍද්ධිපාදය වැඩීමි. වීර්‍ය්‍ය අධිපති කොට ඇති සමාධියෙන් යුත් ... චිත්තය අධිපති කොට ඇති සමාධියෙන් යුත් ... විමංසාව අධිපති කොට ඇති සමාධියෙන් යුත් ප්‍රධානසංස්කාරයෙන් සමන්‍වාගත ඍද්ධිපාදය වැඩීමි. උස්සොළ්හිය (අධිමාත්‍ර වීර්‍ය්‍යය) ම පස් වැන්න යි.

මහණෙනි, ඒ මම අධිමාත්‍ර ඊහා පස් වනු කොට ඇති මේ පඤ්චධර්‍මයන් වැඩූ හෙයින් බහුල විසින් කළ හෙයින් විශිෂ්ටඥනයෙන් දුන සාක්‍ෂාත් කළ යුතු යම් යම් ධර්‍මයක් සඳහා අභිඥයෙන් පසක් කිරීමට සිත නැමූයෙම් ද, ප්‍රත්‍යය ඇති වත් ම ඒ ඒ ධර්‍මයෙහි ප්‍රත්‍යක්‍ෂභාවයට පැමිණියෙමි. ...

ඉදින් මම නන් වැදෑරුම් ඍද්ධිවිශෙෂයන් අනුභව කෙරෙම්ව යි ... බඹලොව හිම් කොට ද කයින් වශිත්වය පවත්වම්ව යි කැමැති වීම් නම්, කරුණු ඇති වත් ම ඒ ඒ විෂයෙහි ප්‍රත්‍යක්‍ෂභාවයට පැමිණියෙමි.

ඉදින් මම ... ආස්‍රවක්‍ෂයයෙන් ... තෙමේම දූන පසක් කොට එයට පැමිණ වාසය කෙරෙම්ව යි කැමැති වීම් නම්, ප්‍රත්‍යය ඇති වත් ම ඒ ඒ විෂයෙහි ප්‍රත්‍යක්‍ෂභාවයට පැමිණියෙම් යි.

## 5. 2. 2. 9.

### [ නිබ්බිදාසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

19. පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු අසුභානුපස්සී කායෙ විහරති, ආහාරෙ පටික්කූලසඤ්ඤී,[1] සබ්බලොකෙ අනභිරතසඤ්ඤී,[2] සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී. මරණසඤ්ඤා ඛො පනස්ස අජ්ඣත්තං සූපට්ඨිතා හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තී'ති.

## 5. 2. 2. 10.

### [ ආසවක්ඛයසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

20. පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තන්ති. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු අසුභානුපස්සී කායෙ විහරති, ආහාරෙ පටික්කූලසඤ්ඤී[1], සබ්බලොකෙ අනභිරතසඤ්ඤී,[2] සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී. මරණසඤ්ඤා ඛො පනස්ස අජ්ඣත්තං සූපට්ඨිතා හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තන්තී'ති.

සඤ්ඤාවග්ගො දුතියො.

**තස්සුද්දානං**

ද්වෙ ච සඤ්ඤා ද්වෙ වඩ්ඪී ච සාකච්ඡා ච සජීවතා[3]
ඉද්ධිපාදා ච ද්වෙ වුත්තා නිබ්බිදා වාසවක්ඛයා.

1. පටිකූලසඤ්ඤී - මජ්ඣං. 2 අනභිරති සඤ්ඤී - මජ්ඣං.
3. සාකච්ඡෙන ච සාජීවා - මජ්ඣං.

## 5. 2. 2. 9.

## [ නිබ්බිද සූත්‍රය ]

**[සැවැත්නිදානයි:]**

19. මහණෙනි, භාවිත බහුලීකෘත මේ ධර්මයෝ පස්දෙනෙක් ඒකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස කෙලශව්‍යුපශමය පිණිස අභිඥා පිණිස සම්බෝධිය පිණිස නිර්වාණය පිණිස වැටෙත්. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කයෙහි අශුභය නුවණින් දක්නාසුලුයේ, අහරෙහි පිළිකුල් සංඥා ඇතියේ, හැම පස්කඳලොව්හි අනභිරතසංඥා ඇතියේ, සර්වසංස්කාරයෙහි අනිත්‍යය නුවණින් දක්නාසුලුයේ වාස කරයි. ඔහට මරණසංඥාව තමා තුළ මැනැවින් එළඹ සිටියේ ම වෙයි.

මහණෙනි, භාවිත බහුලීකෘත මේ පඤ්චධර්මයෝ ඒකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස ව්‍යුපශමය පිණිස අභිඥා පිණිස සම්බෝධිය පිණිස නිර්වාණය පිණිස වැටෙත්.

## 5. 2. 2 10.

## [ ආසවක්ඛය සූත්‍රය ]

**[ සැවැත්නිදානයි: ]**

20. මහණෙනි, භාවිත බහුලීකෘත මේ ධර්මයෝ පස් දෙනෙක් ආශ්‍රවක්ෂය පිණිස වැටෙත්. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කයෙහි අශුභානුදර්ශී වූයේ, ආහාරයෙහි ප්‍රතිකූලසංඥා ඇතියේ, හැමලොව්හි අනභිරතසංඥා ඇතියේ, සර්වසංස්කාරයෙහි අනිත්‍යානුදර්ශී වූයේ වාස කරයි. ඔහට මරණසංඥාව අධ්‍යාත්මයෙහි මොනවට එළඹ සිටියේ ම වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෝ භාවිත බහුලීකෘත වූවාහු ආශ්‍රවක්ෂය පිණිස වැටෙත්.

**සංඥාවර්ගය දෙවැනි යි.**

**එහි උද්දානය:**

සඤ්ඤා සූත්‍ර දෙකය, වඩ්ඪිසූත්‍ර දෙකය, සාකච්ඡා සූත්‍රය, සාජීවසූත්‍රය, ඉද්ධිපාදසූත්‍ර දෙකය, නිබ්බිද සූත්‍රය, ආසවක්ඛය සූත්‍රය දැයි දසයෙක.

# 3. අනාගතභයවග්ගො*

## 5. 2. 3. 1.

## [ පඨමචෙතොවිමුත්තිඵලසුත්තං ]

[සාවත්ථිනිදානං:]

21. පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා චෙතොවිමුත්තිඵලා ච හොන්ති චෙතොවිමුත්තිඵලානිසංසා ච. පඤ්ඤාවිමුත්තිඵලා ච හොන්ති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා ච. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු අසුභානුපස්සී කායෙ විහරති, ආහාරෙ පටික්කූලසඤ්ඤී, සබ්බලොකෙ අනභිරතසඤ්ඤී, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී, මරණසඤ්ඤා ඛො පනස්ස අජ්ඣත්තං සූපට්ඨිතා හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා භාවිතා බහුලීකතා චෙතොවිමුත්තිඵලා ච හොන්ති, චෙතොවිමුත්තිඵලානිසංසා ච. පඤ්ඤාවිමුත්තිඵලා ච හොන්ති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා ච.

යතො ඛො භික්ඛවෙ භික්ඛු චෙතොවිමුත්තො ච හොති පඤ්ඤාවිමුත්තො ච,[1] අයං වුච්චති භික්ඛවෙ භික්ඛු උක්ඛිත්තපලිඝො ඉතිපි සඞ්කිණ්ණපරිඛො ඉතිපි අබ්බූළ්හෙසිකො ඉතිපි නිරග්ගළො ඉතිපි අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො ඉතිපි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු උක්ඛිත්තපලිඝො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො අවිජ්ජා පහීනා හොති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[2] ආයතිං අනුප්පාදධම්මා. එවං ඛො භික්ඛවෙ භික්ඛු උක්ඛිත්තපලිඝො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සඞ්කිණ්ණපරිඛො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො පොනොභවිකො[3] ජාතිසංසාරො පහීනො හොති -පෙ- එවං ඛො භික්ඛවෙ භික්ඛු සඞ්කිණ්ණපරිඛො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අබ්බූළ්හෙසිකො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො තණ්හා පහීනා හොති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[4] ආයතිං අනුප්පාදධම්මා. එවං ඛො භික්ඛවෙ භික්ඛු අබ්බූළ්හෙසිකො හොති.

1. ච හොති - මජ්ඣං. 2. අනභාවංකතා - මජ්ඣං.
3. පොනොබ්භවිකො - මජ්ඣං. 4. අනභාවංකතා - මජ්ඣං.
* යොධාජීවවග්ගො - සීමු. මජ්ඣං.

## 3. අනාගතභය වර්ගය

### 5. 2. 3. 1.

### [ පඨමචෙතොවිමුත්තිඵල සූත්‍රය ]

[ **සැවැත්නිදානයි:** ]

21. මහණෙනි, මේ ධර්මයෝ පස් දෙනෙක් භාවිත බහුලීකෘත වූවාහු (මාර්ගඵලසමාධි සඞ්ඛ්‍යාත) චිත්තවිමුක්තිය ඵල කොට ඇතියාහු ද, චිත්ත-විමුක්තිඵලය අනුසස් කොට ඇතියාහු ද, (මාර්ගඵලප්‍රඥා සඞ්ඛ්‍යාත) ප්‍රඥාවිමුක්තිය ඵල කොට ඇතියාහු ද, ප්‍රඥාවිමුක්තිඵලය අනුසස් කොට ඇතියාහු ද වෙත්. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කයෙහි අශුභානුදර්ශී වූයේ, ආහාරයෙහි ප්‍රතිකූලසංඥා ඇතියේ, හැම ලොව්හි අනභිරතසංඥා ඇතියේ, සර්වසංස්කාරයෙහි අනාත්මානුදර්ශී වූයේ වාස කරයි. ඔහට මරණ සංඥාව තමා තුළ මනාව පිහිටියේ ම වෙයි.

මහණෙනි, භාවිත බහුලීකෘත මේ පඤ්චධර්මයෝ චිත්තවිමුක්තිය ඵල කොට ඇතියාහු ද, චිත්තවිමුක්තිඵලය අනුසස් කොට ඇතියාහු ද වෙත්. ප්‍රඥාවිමුක්තිය ඵල කොට ඇතියාහු ද, ප්‍රඥාවිමුක්තිඵලය අනුසස් කොට ඇතියාහු ද වෙත්.

මහණෙනි, මහණ යම් කලක් පටන් කොට චෙතොවිමුක්ත හා ප්‍රඥාවිමුක්ත හා වේ ද, මහණෙනි, මෙ මහණ 'උක්ඛිත්තපළිඝ'ය යි ද (උපුටා හළ වටමුල් අවිද්‍යා නමැති කතයම් ඇතියෙකැයි ද), 'සඞ්කිණ්ණපරිඛ'ය යි ද (පුනර්භවසසර නමැති පරිඛා වසනලද්දේ යයි ද), 'අබ්බූළ්හෙසික' ය යි ද (උපුටා හළ තෘෂ්ණා නමැති ඉඳුකිල් ඇතියේ ය යි ද), 'නිරග්ගළ' ය යි ද (උදුරා හළ නීවරණ සඞ්ඛ්‍යාත අගුළු ඇතියේ ය යි ද), ආර්ය වූයේ හෙළා ලූ මානධවජ ඇතියේ ය යි ද, හෙළා ලූ (ස්කන්ධ අභිසංස්කාර ක්ලේශ සඞ්ඛ්‍යාත) බර ඇතියේ ය යි ද, 'විසංයුක්ත' (චතුරොඝයෙන් වෙන් ව සිටියේ) ය යි ද කියනු ලැබේ.

මහණෙනි, මහණ කෙසේ නම් 'උක්ඛිත්තපළිඝ' වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට අවිද්‍යා ප්‍රහීණ වූවා, උපුටන් මුල් වූවා, මුදුන්සුන් තලක් සෙයින් කළ අවාස්තුකභාව ඇත්තී, කෘත අත්‍යන්තාභාව ඇත්තී, මතුයෙහි නූපදනා සැහැවි ඇත්තී වෙයි. මහණෙනි, මෙසේ මහණ 'උක්ඛිත්තපළිඝ' වෙයි.

මහණෙනි, මහණ කෙසේ නම් 'සංකිණ්ණපරිඛ' වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට පුනර්භවාඛ්‍ය ඵලයට අභී වන ජාතිසංසාරය (කර්මාභිසංස්කාරය) ප්‍රහීණ වෙයි ... මහණෙනි, මෙසේ මහණ 'සඞ්කිණ්ණ-පරිඛ' වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ 'අබ්බූළ්හෙසික' වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට තෘෂ්ණාව ප්‍රහීණ වූවා, උපුටන් මුල් ඇත්තී, තාලා-වාස්තුකෘත වූවා, කෘත අත්‍යන්තාභාව ඇත්තී, මතුයෙහි නූපදනා සැහැවි ඇත්තී වෙයි. මහණෙනි, මෙසේ මහණ 'අබ්බූළ්හෙසික' වෙයි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු නිරග්ගළො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො පඤ්චොරම්භාගියානි සංයොජනානි පහීනානි හොන්ති උච්ඡින්නමූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි[1] ආයතිං අනුප්පාදධම්මානි. එවං ඛො භික්ඛවෙ භික්ඛු නිරග්ගළො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො අස්මිමානො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. එවං ඛො භික්ඛවෙ භික්ඛු අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො හොතී'ති.

## 5. 2. 3 2.

## [ දුතියචෙතොවිමුත්තිඵලසුත්තං ]

[සාවත්ථිනිදානං:]

22. පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා චෙතොවිමුත්තිඵලා ච හොන්ති චෙතොවිමුත්තිඵලානිසංසා ච. පඤ්ඤාවිමුත්තිඵලා ච හොන්ති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා ච. කතමෙ පඤ්ච?

අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා; පහාන-සඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා භාවිතා බහුලීකතා චෙතොවිමුත්තිඵලා ච හොන්ති චෙතොවිමුත්තිඵලානිසංසා ච. පඤ්ඤාවිමුත්තිඵලා ච හොන්ති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා ච.

යතො ච ඛො භික්ඛවෙ භික්ඛු චෙතොවිමුත්තො ච හොති පඤ්ඤා-විමුත්තො ච, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු උක්ඛිත්තපලිඝො ඉතිපි සඞ්කිණ්ණ-පරිඛො ඉතිපි අබ්බූළ්හෙසිකො ඉතිපි නිරග්ගළො ඉතිපි අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො ඉතිපි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු උක්ඛිත්තපලිඝො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො අවිජ්ජා පහීනා හොති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. එවං ඛො භික්ඛවෙ භික්ඛු උක්ඛිත්තපලිඝො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සඞ්කිණ්ණපරිඛො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො පොනොභවිකො ජාතිසංසාරො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. එවං ඛො භික්ඛවෙ භික්ඛු සඞ්කිණ්ණපරිඛො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අබ්බූළ්හෙසිකො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො තණ්හා පහීනා හොති, උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. එවං ඛො භික්ඛවෙ භික්ඛු අබ්බූළ්හෙසිකො හොති.

1. අනභාවංකතානි - මජසං.

මහණෙනි, කෙසේ මහණ 'නිරග්ගල' වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට පඤ්ච ඕරම්භාගිය සංයොජනයෝ ප්‍රහීණ වූවාහු උදුරුත් මුල් ඇත්තාහු තාලාවාස්තුකෘත වූවාහු කළ අභාව ඇත්තාහු මතුයෙහි නො උපදනා සැහැවි ඇත්තාහු වෙත්. මහණෙනි, මෙසේ මහණ 'නිරග්ගල' වෙයි.

මහණෙනි, කෙසේ මහණ 'ආර්‍ය්‍ය' වූයේ, 'පන්නද්ධජ' වූයේ, 'පන්නභාර' වූයේ, 'විසංයුත්ත' වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට (පඤ්චස්කන්ධය 'මම' ය ගත්) අස්මිමාන ය ප්‍රහීණ වූයේ, උදුරුත් මුල් ඇතියේ, තාලාවාස්තුකෘත වූයේ, කළ අභාව ඇතියේ, මතුයෙහි නො උපදනා සැහැවි ඇතියේ වෙයි. මහණෙනි, මෙසේ මහණ 'ආර්‍ය්‍ය' වූයේ 'පන්නද්ධජ' වූයේ 'පන්නභාර' වූයේ 'විසංයුක්ත' වේ.

## 5. 2. 3. 2.

## [ දුතියචෙතොවිමුත්තිඵල සූත්‍රය ]

[ සැවැත්නිදානයි: ]

22 මහණෙනි, මේ පඤ්චධර්ම කෙනෙක් භාවිත බහුලීකෘත වූවාහු චිත්ත-විමුක්තිඵල කොට ඇතියාහු චිත්තවිමුක්තිඵලය අනුසස් කොට ඇතියාහු ද වෙත්. ප්‍රඥාවිමුක්තිය ඵල කොට ඇතියාහු ප්‍රඥාවිමුක්තිඵලය අනුසස් කොට ඇතියාහු ද වෙත්. කවර පස්දෙනෙක යත්:

අනිත්‍යසංඥා ය, අනිත්‍යයෙහි දුඃඛසංඥා ය, දුඃඛයෙහි අනාත්මසංඥා ය, ප්‍රහාණසංඥා ය, විරාගසංඥා යි.

මහණෙනි, මේ පඤ්චධර්මයෝ භාවිත බහුලීකෘත වූවාහු, චෙතොවිමුක්තිය ඵල කොට ඇතියාහු ද චෙතොවිමුක්තිඵලය අනුසස් කොට ඇතියාහු ද වෙත්. ප්‍රඥාවිමුක්තිය ඵල කොට ඇතියාහු ද ප්‍රඥාවිමුක්තිඵලය අනුසස් කොට ඇතියාහු ද වෙත්.

මහණෙනි, යම් කලෙක් පටන් කොට මහණ චෙතොවිමුක්ත හා ප්‍රඥා-විමුක්ත හා වේ නම්, මහණෙනි, මෙ මහණ 'උක්ඛිත්තපළිඝ'ය යි ද 'සඞ්කිණ්ණ පරිඛ' ය යි ද 'අබ්බූළ්හෙසික' ය යි ද 'නිරග්ගල' ය යි ද ආර්‍ය්‍ය වූයේ පන්නද්ධජ වූයේ පන්නභාර වූයේ 'විසංයුත්ත' ය යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් මහණ 'උක්ඛිත්තපළිඝ' වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට අවිද්‍යා ප්‍රහීණ වූවා, උදුරුත් මුල් ඇත්තී, තාලා-වාස්තුකෘත වූවා, මතුයෙහි නූපදනා සැහැවි ඇත්තී වෙයි. මහණෙනි, මෙසෙයින් මහණ 'උක්ඛිත්තපළිඝ' වෙයි.

මහණෙනි, කිසෙයින් මහණ 'සඞ්කිණ්ණපරිඛ' වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට පුනර්භවදායක ජාතිසංසාරය ප්‍රහීණ වූයේ උදුරුත් මුල් ඇතියේ, තාලාවාස්තුකෘත වූයේ, කෘත අභාව ඇතියේ, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වෙයි. මහණෙනි, මෙසෙයින් මහණ 'සඞ්කිණ්ණපරිඛ' වෙයි.

මහණෙනි, කිසෙයින් මහණ 'අබ්බූළ්හෙසික'වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට තෘෂ්ණාව ප්‍රහීණ වූවා, උදුරුත් මුල් ඇත්තී, තාලා-වාස්තුකෘත වූවා, කෘත අභාව ඇත්තී මතුයෙහි නො උපදනා සැහැවි ඇත්තී වෙයි. මහණෙනි, මෙසෙයින් මහණ 'අබ්බූළ්හෙසික' වෙයි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු නිරග්ගළො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො පඤ්චොරම්භාගියානි සංයොජනානි පහීනානි හොන්ති උච්ඡින්නමූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි ආයතිං අනුප්පාදධම්මානි. එවං ඛො භික්ඛවෙ භික්ඛු නිරග්ගළො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො හොති? ඉධ භික්ඛවෙ භික්ඛුනො අස්මිමානො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො[1] ආයතිං අනුප්පාදධම්මො. එවං ඛො භික්ඛවෙ භික්ඛු අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො හොතී'ති.

## 5 2 3. 3.

## [පඨමධම්මවිහාරී සුත්තං]

**[සාවත්ථිනිදානං:]**

23. අථ ඛො **අඤ්ඤතරො භික්ඛු** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

'ධම්මවිහාරී ධම්මවිහාරී'ති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ භික්ඛු ධම්මවිහාරී හොතී'ති?

ඉධ භික්ඛු, භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො තාය ධම්මපරියත්තියා දිවසං අතිනාමෙති. රිඤ්චති පටිසල්ලානං. නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං වුච්චති භික්ඛු, භික්ඛු පරියත්තිබහුලො නො ධම්මවිහාරී.

පුනච පරං භික්ඛු, භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති. සො තාය ධම්මසඤ්ඤත්තියා[2] දිවසං අතිනාමෙති. රිඤ්චති පටිසල්ලානං. නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං වුච්චති භික්ඛු, භික්ඛු සඤ්ඤත්තිබහුලො[3] නො ධම්මවිහාරී

පුනච පරං භික්ඛු, භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති. සො තෙන සජ්ඣායෙන දිවසං අතිනාමෙති. රිඤ්චති පටිසල්ලානං. නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං වුච්චති භික්ඛු, භික්ඛු සජ්ඣායබහුලො නො ධම්මවිහාරී.

පුනච පරං භික්ඛු, භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති. සො තෙහි ධම්මවිතක්කෙහි දිවසං අතිනාමෙති. රිඤ්චති පටිසල්ලානං. නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං වුච්චති භික්ඛු, භික්ඛු විතක්කබහුලො නො ධම්මවිහාරී.

ඉධ භික්ඛු, භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො තාය ධම්මපරියත්තියා න දිවසං අතිනාමෙති. නාපි රිඤ්චති පටිසල්ලානං. අනුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං එවං ඛො භික්ඛු, භික්ඛු ධම්මවිහාරී හොති.

---

1. අනභාවං කතො - මජසං. 2. ධම්මපඤ්ඤත්තියා - මජසං.
3. පඤ්ඤත්තිබහුලො - මජසං.

මහණෙනි, කිසෙයින් මහණ නිරග්ගල වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට පඤ්චඔරම්භාගිය සංයොජනයෝ ප්‍රහීණ වූවාහු උපුත් මුල් ඇතියාහු තාලාවාස්තුකෘත වූවාහු කෘත අභාව ඇතියාහු මතුයෙහි නො උපදනා සැහැවි ඇතියාහු වෙත්. මහණෙනි, මෙ සෙයින් මහණ නිරග්ගල වේ යයි.

මහණෙනි, කිසෙයින් මහණ ආර්‍ය්‍ය වූයේ, පන්නද්ධජ වූයේ, පන්නභාර වූයේ විසංයුක්ත වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට අස්මි-මානය ප්‍රහීණ වූයේ, උපුත් මුල් ඇතියේ, තාලාවාස්තුකෘත වූයේ, කෘත අභාව ඇතියේ, මතුයෙහි නො උපදනා සැහැවි ඇතියේ වෙයි. මහණෙනි, මෙසෙයින් මහණ ආර්‍ය්‍ය වූයේ පන්නද්ධජ වූයේ පන්නභාර වූයේ විසංයුක්ත වෙයි.

## 5. 2. 3. 3.

## [ පඨමධම්මවිහාරී සූත්‍රය ]

[සැවැත්නිදානයි:]

23. එකල්හි **එක්තරා මහණෙක්** භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හින. එකත්පස් ව හුන් එ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය:

වහන්ස, ‘ධම්මවිහාරී ය, ධම්මවිහාරී’ ය යි කියනු ලැබේ. වහන්ස, මහණ කෙතෙක් කරුණින් ධම්මවිහාරී වේ ද?

මහණෙනි, මෙ සස්නෙහි මහණ සූත්‍ර ය, ගෙය්‍ය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදාන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අබ්භූතධම්ම ය, වෙදල්ල ය යි නවඟ විසින් චතුසත්‍යධර්මය වළඳ කෙරෙයි. හෙ එ ධර්මපර්‍ය්‍යාප්තියෙන් දවස ගෙවයි. පිළිසලන (එකීභාවය) හරියි. සිය සතන්හි සමාධිය (ශමථකර්මස්ථාන) නො වඩයි. මහණ, මෙ මහණ පර්‍ය්‍යාප්තිබහුල කොට ඇත්තේ ය, ධර්මවිහාරී නො ම වෙයි කියනු ලැබේ.

තව ද මහණ, භික්ෂු යථාශ්‍රුත යථාපර්‍ය්‍යාප්ත ධර්මය විතර විසින් අන්හට දෙසයි. හෙ ඒ ධර්මසංඥපනායෙන් දවස ගලවයි. පිළිසලන හරියි. සිය සතන්හි සමාධිය නො වඩයි. මහණ, මෙ භික්ෂු සංඥපතිබහුල කොට ඇත්තේ ය, ධර්මවිහාරී නො වේ යි කියනු ලැබේ.

තවද මහණ, භික්ෂු යථාශ්‍රුත යථාපර්‍ය්‍යාප්ත ධර්මය විතර විසින් හදාරණු කෙරෙයි. හෙ එ වාක්පරිචයෙන් දවස ගෙවයි. පිළිසලන හරියි. ආධ්‍යාත්මිකචිත්තශමථයෙහි නො යෙදෙයි. මහණ, මෙ මහණ සජ්ඣායනා බහුල කොට ඇත්තේ ය, ධර්මවිහාරී නො වේ යි කියනු ලැබේ.

තවද මහණ, භික්ෂු යථාශ්‍රුත යථාපර්‍ය්‍යාප්ත ධර්මය සිතින් අනුවිතර්කිත කරයි. අනුවිචාරණ කරයි. මනසින් අනුප්‍රෙක්ෂණා කරයි. හෙ එ ධර්මවිතර්කයෙන් දවස ගෙවයි. පිළිසලන හරියි. ආධ්‍යාත්මිකචිත්තශමථයෙහි නො යෙදෙයි. මහණ, මෙ මහණ විතර්කබහුලයෙක, ධර්මවිහාරී නො වේ යි කියනු ලැබේ.

මහණ, මෙ සස්නෙහි භික්ෂු සූත්‍ර ය, ගෙය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදාන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අබ්භූතධම්ම ය, වෙදල්ල ය යන පර්‍ය්‍යාප්ති-ධර්මය ප්‍රගුණ කරයි. හෙ එ ධර්මපර්‍ය්‍යාප්තියෙන් දවස නො ගෙවයි. එකීභාවය නො හරියි. අධ්‍යාත්මචිත්තශමථයෙහි යෙදෙයි. මහණ, භික්ෂු මෙසේ ධර්මවිහාරී වෙයි.

ඉති ඛො භික්ඛු, දෙසිතො මයා පරියත්තිබහුලො, දෙසිතො සඤ්ඤත්ති-බහුලො,[1] දෙසිතො සජ්ඣායබහුලො, දෙසිතො විතක්කබහුලො, දෙසිතො ධම්මවිහාරී.

යං ඛො භික්ඛු, සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා. එතානි භික්ඛු රුක්ඛමූලානි. එතානි සුඤ්ඤාගාරානි. ඣායථ භික්ඛු, මා පමාදත්ථ. මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. අයං අම්හාකං අනුසාසනී'ති.

## 5. 2. 3. 4.

## [ දුතියධම්මවිහාරීසුත්තං ]

**[සාවත්ථිනිදානං:]**

24. අථ ඛො **අඤ්ඤතරො භික්ඛු** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

'ධම්මවිහාරී' ධම්මවිහාරී'ති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ භික්ඛු ධම්මවිහාරී හොතී'ති?

ඉධ භික්ඛු, භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. උත්තරිඤ්චස්ස[2] පඤ්ඤාය අත්ථං නප්පජානාති. අයං වුච්චති භික්ඛු, භික්ඛු පරියත්තිබහුලො නො ධම්මවිහාරී.

පුන ච පරං භික්ඛු, භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති. උත්තරිඤ්චස්ස පඤ්ඤාය අත්ථං නප්පජානාති. අයං වුච්චති භික්ඛු, භික්ඛු සඤ්ඤත්තිබහුලො නො ධම්මවිහාරී.

පුන ච පරං භික්ඛු, භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති. උත්තරිඤ්චස්ස[2] පඤ්ඤාය අත්ථං නප්පජානාති. අයං වුච්චති භික්ඛු, භික්ඛු සජ්ඣායබහුලො නො ධම්මවිහාරී.

පුන ච පරං භික්ඛු, භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති. උත්තරිඤ්චස්ස[2] පඤ්ඤාය අත්ථං නප්පජානාති. අයං වුච්චති භික්ඛු, භික්ඛු විතක්කබහුලො නො ධම්මවිහාරී.

ඉධ භික්ඛු, භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. උත්තරිඤ්චස්ස[2] පඤ්ඤාය අත්ථං පජානාති. එවං ඛො භික්ඛු, භික්ඛු ධම්මවිහාරී හොති.

---

1. පඤ්ඤත්තිබහුලො - මජසං. 2. උත්තරිමස්ස - මජසං.

මහණ, මෙසෙයින් මා විසින් පර්‍ය්‍යාප්තිබහුල කොට ඇති පුද්ගල දෙසන ලදි. සංඥප්තිබහුල කොට ඇති පුද්ගල දෙසන ලදි. සජ්ඣාය බහුල කොට ඇති පුද්ගල දෙසන ලදි. විතර්‍ක බහුල පුද්ගල දෙසන ලදි. ධර්‍මවිහාරී පුද්ගල දෙසන ලද්දේ ය.

මහණ, ශ්‍රාවකයනට (මෛත්‍රියෙන් උපසංහරණ විසින්) හිත කැමැති (කරුණායෙන්) අනුකම්පා කරණ ශාස්තෘවරයකු විසින් අනුකම්පාව නිසා යම් කරණී කළ යුතු වේ නම්, (පඤ්ච පුද්ගලයන් දෙසන) මා විසින් එය තොපට කරණ ලදි. මහණ, තෙල රුක්මුල් ඇත. තෙල ශූන්‍යාගාරයෝ ඇත. මහණ (ආරම්මණූපනිජ්ඣාන ලක්ඛණූපනිජ්ඣාන විසින්) ධ්‍යාන කරව (සමථවිපස්සනා වඩව). නහමක් පමා වව. නහමක් පසු විපිළිසර වව. මේ තොපට අපගේ අනුශාසනිය යි.

## 5. 2. 3. 4.

## [ ද්‍විතියධම්මවිහාරී සූත්‍රය ]

[ සැවැත්නිදානයි: ]

24. එකල අන්‍යතර මහණෙක් භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හිඳ. එකත්පස් ව හුන් එ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය:

වහන්ස, 'ධර්‍මවිහාරී ය, ධර්‍මවිහාරී' ය යි කියනු ලැබේ වහන්ස, කෙතෙක් කරුණින් මහණ ධර්‍මවිහාරී ද ?

මහණ, මෙ සස්නෙහි මහණ සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල ය යි චතුස්සත්‍යධර්‍මය ප්‍රගුණ කරයි. (ඒ පර්‍ය්‍යාප්තියෙන්) මතුයෙහිදු එ ධර්‍මයාගේ අර්‍ථය සවිදර්‍ශනා මාර්‍ගප්‍රඥයෙන් නො දන්නේ ය. මහණ, මෙ මහණ පර්‍ය්‍යාප්තිබහුල ය, ධර්‍මවිහාරී නො වෙ යි කියනු ලැබේ.

තවද මහණ, භික්ෂු ඇසූ පරිදි ප්‍රගුණ කළ පරිදි ධර්‍මය විස්තරවශයෙන් අන්‍යයනට දෙසන්නේ ය. ඉන් මත්තෙහි ද එ ධර්‍මයාගේ අර්‍ථය ප්‍රඥයෙන් නො දැනගන්නේ ය. මහණ, මෙ මහණ සංඥප්තිය බහුල කොට ඇත්තෙක, ධර්‍මවිහාරී නො වෙ යි කියනු ලැබේ.

තවද මහණ, භික්ෂු ඇසූ පරිදි පුහුණු කළ පරිදි ධර්‍මය විස්තරවශයෙන් සජ්ඣායනා කරයි. ඉන් මත්තෙහිදු එ ධර්‍මයාගේ අර්‍ථය ප්‍රඥයෙන් නො දැන ගන්නේ ය. මහණ, මෙ භික්ෂු සජ්ඣායබහුලයෙක, ධර්‍මවිහාරී නො වේ ය යි කියනු ලැබේ.

තවද මහණ, භික්ෂු ඇසූ පරිදි, පුහුණු කළ පරිදි ධර්‍මය සිතින් අනුවිතර්‍කන කරයි. අනුවිචරණ කරයි. මනසින් අනුප්‍රෙක්ෂණ කරයි. ඉන් මත්තෙහිදු එ ධර්‍මයාගේ අර්‍ථය ප්‍රඥයෙන් නො දැනගන්නේ ය. මහණ, මෙ මහණ විතර්‍කබහුලයෙක, ධර්‍මවිහාරී නො වේ ය යි කියනු ලැබේ.

මහණ, මෙ සස්නෙහි මහණ සූත්‍ර ය, ගෙය්‍ය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදාන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අද්භූතධර්‍ම ය, වෙදල්ල ය යන (පර්‍ය්‍යාප්ති) ධර්‍මය ප්‍රගුණ කරයි. මතුයෙහි ද ප්‍රඥයෙන් ඒ ධර්‍මයාගේ අර්‍ථය දැන ගන්නේ ය. මහණ, මෙසෙයින් මහණ ධර්‍මවිහාරී වෙයි.

ඉති ඛො භික්ඛු, දෙසිතො මයා පරියත්තිබහුලො, දෙසිතො සඤ්ඤත්ති-බහුලො,[1] දෙසිතො සජ්ඣායබහුලො, දෙසිතො විතක්කබහුලො, දෙසිතො ධම්මවිහාරී.

යං ඛො භික්ඛු, සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා. එතානි භික්ඛු, රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි. ඣායථ භික්ඛු, මා පමාදත්ථ. මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. අයං වො අම්හාකං අනුසාසනීති.

5. 2. 3. 5

[ පඨමයොධාජීවූපම සුත්තං ]

[සාවත්ථිනිදානං:]

25. පඤ්චිමෙ භික්ඛවෙ යොධාජීවා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ, එකච්චො යොධාජීවො රජග්ගඤ්ඤෙව[2] දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවරූපො[3] භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ පඨමො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනච පරං භික්ඛවෙ, ඉධෙකච්චො යොධාජීවො සහති රජග්ගං. අපි ච ඛො ධජග්ගඤ්ඤෙව දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවරූපො'පි ඛො භික්ඛවෙ[5] ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ දුතියො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනච පරං භික්ඛවෙ, ඉධෙකච්චො යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං. අපි ච ඛො උස්සාදනං යෙව[5] සුත්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවරූපො'පි ඛො භික්ඛවෙ, ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ තතියො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනච පරං භික්ඛවෙ, ඉධෙකච්චො යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං.[6] අපි ච ඛො සම්පහාරෙ ආහඤ්ඤති,[7] ව්‍යාපජ්ජති. එවරූපො'පි ඛො භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ චතුත්ථො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනච පරං භික්ඛවෙ, ඉධෙකච්චො යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං, සහති සම්පහාරං. සො තං සඞ්ගාමං අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති. එවරූපො'පි ඛො භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ පඤ්චමො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

1. සඤ්ඤත්ති බහුලො - මජ්සං. 2 රජග්ගංයෙව - සීමු.
3. එවරූපො'පි - මජ්සං. 4. එවරූපොපි භික්ඛවෙ - මජ්සං.
5. උස්සාරණඤ්ඤෙව - මජ්සං 6. උස්සාරණං - මජ්ස. 7. හඤ්ඤති - මජ්සං

මහණ, මෙසේසින් මා විසින් පයණිඤත්තිබහුලයා දෙසන ලද්දේ ය. සංඥප්තිබහුලයා දෙසන ලද්දේ ය. සජ්ඣායබහුලයා දෙසන ලද්දේ ය. විතර්කබහුලයා දෙසන ලද්දේ ය. ධම්මවිහාරියා දෙසන ලද්දේ ය.

මහණ, සච්වනට හිත කැමැති අනුකම්පා කරණ ශාස්තෘහු විසින් අනුකම්පාව නිසා යමෙක් කටයුතු වේ නම්, එය තොපට මා විසින් කරණ ලදි. මහණ, තෙල වෘක්ෂමූලයෝ ය. තෙල ශූන්‍යාගාරයෝ ය. මහණ, ධ්‍යාන කරව. නහමක් පමා වව. පසු විපිළිසර නො වව. මේ තොපට මාගේ අනුශාසනී යි.

## 5. 2. 3. 5.

## [ පඨමයොධාජීවූපම සූත්‍රය ]

[ සැවැත්නිදනයි. ]

25. මහණෙනි, ලොව්හි මේ යොධාජීවයෝ පස් දෙනෙක් විද්‍යමාන වෙත්. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යුද්ධොපජීවියෙක් (ඇත් අස් ආදීන්ගේ පාපහරින් බුත් බිමින් නැගි) රජස් සකන්ධය ම දැක ගැලෙයි. (තොසැලී සිටිනු නොහැකි වෙයි.) වෙසෙසින් ගැලෙයි. ධෘතිමත් ව නො සිටුනේ ය. සඞ්ග්‍රාමභූමියට බස්නට නො හැකි වෙයි. මහණෙනි, මෙ බඳු වූ ඇතැම් යුද්ධොපජීවියෙක් ඇත. මහණෙනි, මෙ ලොව්හි විද්‍යමාන වන මේ ප්‍රථම යුද්ධොපජීවියා වෙයි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යුද්ධොපජීවියෙක් රජස්සකන්ධය (දැක ද) ඉවසන්නේ ය. වැලිත් (ඇත් අස් පිටෙහි හෝ රියෙහි නැගූ) ධ්වජාග්‍රය ම දැක ගැලෙයි. වෙසෙසින් ගැලෙයි. ධෘතිමත් ව නො සිටුනේ ය. සඞ්ග්‍රාමභූමියට බස්නට නො හැකි වෙයි. මහණෙනි, මෙ ලොව්හි මෙ බඳු වූ ද ඇතැම් යුද්ධොපජීවියෙක් ඇත. මහණෙනි, ලොව්හි විද්‍යමාන වන මේ දෙවන යුද්ධොපජීවී යි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යුද්ධොපජීවියෙක් රජස්සකන්ධය ඉවසන්නේ ය. ධ්වජාග්‍රය ඉවසන්නේ ය. එහෙත්, (ඇත්අස්රියසෙන් ආදීන්ගේ) මහාශබ්දය ම අසා ගැලෙයි. වෙසෙසින් ගැලෙයි. ධෘතිමත් ව නො සිටියි. සඞ්ග්‍රාමභූමියට බස්නට නො හැකි වෙයි. මහණෙනි, මෙ ලොව්හි මෙ බඳු වූ ද ඇතැම් යුද්ධොපජීවියෙක් ඇත. මහණෙනි ලොව්හි විද්‍යමාන වන මේ තුන් වන යුද්ධොපජීවී යි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යුද්ධොපජීවියෙක් රජස්සකන්ධය ඉවසන්නේ ය. ධ්වජාග්‍රය ඉවසන්නේ ය. උස්සාදනය (ඇත් අස් ආදීන්ගේ මහහඬ) ඉවසන්නේ ය. වැලිදු සපැමිණි සවල්ප ප්‍රහාරයෙහිදු විඝාතයට යෙයි. විඝාතියට පත් වෙයි. මහණෙනි, මෙ ලොව්හි මෙ බඳු වූ ද ඇතැම් යොධාජීවයෙක් ඇත. මහණෙනි, ලොව්හි විද්‍යමාන වන මේ සතර වන යොධාජීව යි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යොධාජීවයෙක් රජස්සකන්ධය ඉවසන්නේ ය. ධ්වජාග්‍රය ඉවසන්නේ ය. උස්සාදනය ඉවසන්නේ ය. සම්ප්‍රහාරය ඉවසන්නේ ය. හේ ඒ සඞ්ග්‍රාමය දිනා දිනූ සඞ්ග්‍රාම ඇතියේ එ ම සඞ්ග්‍රාමශීර්ෂයෙහි (සත්දිනක් පමණ ඉසුරු සුබ විඳිමින්) වෙසෙයි. මහණෙනි, මෙ ලොව්හි මෙ බඳු වූ ද ඇතැම් යොධාජීවයෙක් ඇත. මහණෙනි, ලොව්හි විද්‍යමාන වන මේ පස් වන යොධාජීව යි.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච යොධාජීවා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

එවමෙව ඛො භික්ඛවෙ, පඤ්ච[1]යොධාජීවූපමා පුග්ගලා සන්තො සංවිජ්ජ–මානා භික්ඛූසු. කතමෙ පඤ්ච?

යො ඉධ භික්ඛවෙ, භික්ඛු රජග්ගඤ්ඤෙව දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං.[2] සික්ඛාදුබ්බල්‍යං ආවීකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. කිමස්ස රජග්ගස්මිං?

ඉධ භික්ඛවෙ, භික්ඛු සුණාති: 'අසුකස්මිං[3] නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා කුමාරී වා අභිරූපා දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා'ති. සො තං සුත්වා සංසීදති, විසීදති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං. සික්ඛාදුබ්බල්‍යං ආවීකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. ඉදමස්ස රජග්ගස්මිං.

සෙය්‍යථාපි සො භික්ඛවෙ, යොධාජීවො රජග්ගං දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං, තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි. එවරූපො[4] භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො හොති. අයං භික්ඛවෙ පඨමො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සහති රජග්ගං. අපි ච ඛො ධජග්ගඤ්ඤෙව[5] දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තා–නෙතුං. සික්ඛාදුබ්බල්‍යං ආවීකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. කිමස්ස ධජග්ගස්මිං?

ඉධ භික්ඛවෙ භික්ඛු න හෙව ඛො සුණාති: 'අසුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා කුමාරී වා අභිරූපා දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා'ති. අපි ච ඛො සාමං පස්සති ඉත්ථිං වා කුමාරිං වා අභිරූපං දස්සනීයං පාසාදිකං පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතං. සො තං දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං. සික්ඛාදුබ්බල්‍යං ආවීකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. ඉදමස්ස ධජග්ගස්මිං.

සෙය්‍යථාපි සො භික්ඛවෙ, යොධාජීවො සහති රජග්ගං, අපි ච ඛො ධජග්ගඤ්ඤෙව දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි. එවරූපො'පි භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො හොති. අයං භික්ඛවෙ, දුතියො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සහති රජග්ගං, සහති ධජග්ගං. අපි ච ඛො උස්සාදනං යෙව සුත්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං. සික්ඛාදුබ්බල්‍යං ආවීකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. කිමස්ස උස්සාදනාය?[6]

---

1. පඤ්චිමෙ - මජසං. 2. සන්ධාරෙතුං - මජසං. 3 අමුකස්මිං - මජසං
 එවරූපොපි - මජසං. 5. ධජග්ගංයෙව - සීමු. 6. උස්සාරණාය-මජසං.

මහණෙනි, මේ යොධාජීවයෝ පස් දෙන ලොව්හි විද්‍යමාන වෙත්.

මහණෙනි, එසෙයින් ම භික්ෂූන් කෙරෙහි විද්‍යමාන වන මේ යොධාජීවොපම පුද්ගලයෝ පස් දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ රජස්සකන්ධය ම දැක ගැලෙයි. වෙසෙසින් ගැලෙයි. ධෘතිමත් ව නො සිටියි. බඹසර (නොසිඳ) රක්නට නොහැකි වෙයි. ශික්ෂායෙහි දුබල බව පළ කොට ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට හුනු (ගිහි) බවට පෙරළෙයි. ඔහට රජස්සකන්ධය නම් කිමෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණෙක් අසෝ ගම්හි වේවයි, නියම්ගම්හි වේවයි, ස්ත්‍රියක් වේවයි, කුමරියක් වේවයි. 'විශිෂ්ට රූ ඇත්තී ය, දර්ශනීය ය, ප්‍රසාදජනක ය, උත්තමශරීරවර්ණ හා අඞ්ගවින්‍යාසයෙන් සමන්‍වාගතය'යි අසයි. හේ එ අසා (මිථ්‍යාවිතර්කයෙහි) ගැලෙයි. වෙසෙසින් ගැලෙයි. පැවිද්දෙහි නො සිටුනේ ය. බඹසර (නොසිඳ) රක්නට නොසමත් වෙයි. ශික්ෂායෙහි දුබල බව පළ කොට හුනු බවට පෙරළෙයි. මෙ ඔහට රජස්සකන්ධ යි.

මහණෙනි, යම් පරිදි එ යොධාජීව රජස්සකන්ධය දැක ගැලෙන්නේ වේ ද, වෙසෙසින් ගැලෙන්නේ වේ ද, ධෘතිමත් ව නො සිටුනේ වේ ද, සඞ්ග්‍රාමයට බස්නට නො හැකියේ වේ ද, මහණෙනි, මම මෙ පුහුලා එ බඳු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු ඇතැම් පුද්ගලයෙක් ඇත. මහණෙනි, භික්ෂූන් අතුරෙහි විද්‍යමාන වන මේ ප්‍රථම යොධාජීවොපම පුද්ගල යි.

තවද මහණෙනි, මහණ රජස්කඳ ඉවසන්නේ ය. වැලිත් ධ්වජාග්‍රය ම දැක ගැලෙන්නේ ය. වෙසෙසින් ගැලෙන්නේ ය. ධෘතිමත් ව නොසිටුනේ ය. බඹසර ගළවනුවට (නොසිඳ රක්නට) නො හැකි වෙයි. ශික්ෂායෙහි දුබල බව පළ කොට ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට පෙරළෙයි. ඔහට ධ්වජාග්‍ර නම් කිමෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අසෝ ගම්හි හෝ නියම්ගම්හි හෝ ස්ත්‍රියක් හෝ කුමරියක් අභිරූප ය, දර්ශනීය ය, ප්‍රසාදජනක ය, උතුම් ශරීරවර්ණ හා අඞ්ගසංස්ථානයෙන් සමන්‍වාගත ය යි නො ම අසන්නේ ය. වැලිදු තෙමේ ම අභිරූප ඇති දකුම්කලු පහන් එළවන උතුම් රූ සපු අවයව සැරැසිල්ලෙන් යුත් ස්ත්‍රියක වේවයි කුමරියක වේවයි දක්නේ ය. හේ ඇය දැක ගැලෙන්නේ ය. වෙසෙසින් ගැලෙන්නේ ය. ධෘතිමත් ව නො සිටුනේ ය. බඹසර රක්නට නො පොහොසත් ය. ශික්ෂායෙහි දුර්වලභාවය පළ කොට සික හැර දමා හුනුබවට නවත්නේ ය (පෙරළෙයි). මෙ ඔහට ධ්වජාග්‍ර යි.

මහණෙනි, යම් පරිද්දෙකින් එ යොධාජීව රජස්කඳ ඉවසන්නේ වේ ද, වැලිත් ධ්වජාග්‍රය ම දැක ගැලෙන්නේ වේ ද, වෙසෙසින් ගැලෙන්නේ වේ ද, ධෘතිමත් ව නො සිටුනේ වේ ද, සඞ්ග්‍රාමයට බස්නට නො හැකියේ වේ ද, මහණෙනි, මම මෙ පුහුල් එ බඳු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු ඇතැම් පුද්ගලයෙක් ඇත. මහණෙනි, භික්ෂූන් අතුරෙහි විද්‍යමාන වන මෙ දෙවන යොධාජීවොපම පුද්ගල යි.

තවද මහණෙනි, මහණ රජස්කඳ ඉවසන්නේ ය. ධ්වජාග්‍රය ඉවසන්නේය. වැලිත් උස්රණහඬ ම අසා ගැලෙයි. වෙසෙසින් ගැලෙයි. ධෘතිමත් ව නො සිටුනේය. බඹසර රක්නට නො පොහොනේ ය. ශික්ෂායෙහි දුබල බව ප්‍රකට කොට ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනත්වයට වටාලා යෙයි. ඔහට උස්සාදනය නම් කිමෙක යත්:

ඉධ භික්ඛවෙ, භික්ඛුං අරඤ්ඤගතං වා රුක්ඛමූලගතං වා සුඤ්ඤාගාරගතං වා මාතුගාමො උපසඞ්කමිත්වා ඌහසති[1], උල්ලපති, උජ්ඣග්ඝති[2], උප්පණ්ඩෙති. සො මාතුගාමෙන ඌහසියමානො[3] උල්ලපියමානො උජ්ඣග්ඝියමානො[4] උප්පණ්ඩියමානො සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං.[5] සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. ඉදමස්ස උස්සාදනාය[6].

සෙය්‍යථාපි සො භික්ඛවෙ යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, අපි ච ඛො උස්සාදනං යෙව[7] සුත්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො හොති. අයං භික්ඛවෙ, තතියො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

පුනච පරං භික්ඛවෙ, භික්ඛු සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං.[8] අපි ච ඛො සම්පහාරෙ ආහඤ්ඤති[9] ව්‍යාපජ්ජති. කිමස්ස සම්පහාරස්මිං?

ඉධ භික්ඛවෙ, භික්ඛුං අරඤ්ඤගතං වා රුක්ඛමූලගතං වා සුඤ්ඤාගාරගතං වා මාතුගාමො උපසඞ්කමිත්වා අභිනිසීදති, අභිනිපජ්ජති, අජ්ඣොත්ථරති. සො මාතුගාමෙන අභිනිසීදියමානො අභිනිපජ්ජියමානො අජ්ඣොත්ථරියමානො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවති. ඉදමස්ස සම්පහාරස්මිං.

සෙය්‍යථාපි සො භික්ඛවෙ, යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං,[8] අපි ච ඛො සම්පහාරෙ ආහඤ්ඤති[9], ව්‍යාපජ්ජති, තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො හොති. අයං භික්ඛවෙ, චතුත්ථො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

පුනච පරං භික්ඛවෙ, භික්ඛු සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං[8], සහති සම්පහාරං. සො තං සඞ්ගාමං අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති. කිමස්ස සඞ්ගාමවිජයස්මිං?

---

1. උහසති-මජසං. ඔහසති-සාළුවි 2. උජ්ඣග්ඝෙති-සීමු. 3. උහසියමානො-මජසං.
4. උජ්ඣගනියමානො - සීමු. 5. සන්ධාරෙතුං - මජසං 6. උස්සාරණාය- මජසං.
7. උස්සාරණඤ්ඤෙව, - මජසං 8, උස්සාරණං - මජසං. 9, හඤ්ඤති, - මජසං.

මහණෙනි, මෙ සස්නෙහි අරණ්‍යගත වූ හෝ වෘක්‍ෂමූලගත වූ හෝ ශූන්‍යාගාරගත වූ හෝ මහණකු කරා මාගමක් එළඹ අවහාස විසින් සිනාසෙයි. උල්ලපනා (හුවාබිණීම) කරයි අත් පැහැර මහ සිනා සෙයි. වෙළෙවයි (උප්පණ්ඩන-විසුළුකථා කෙරෙයි). හේ මාගම විසින් අවහාස විසින් සිනාසෙන ලදුයේ උල්ලපනා කරණ ලදුයේ, මහහඬින් සිනාසෙන ලදුයේ, වෙළෙවන ලදුයේ කාමරාග විසින් ගැලෙයි. වෙසෙසින් ගැලෙයි. ධෘතිමත් ව නො සිටියි. බඹසර රක්නට නොසමත් වෙයි. ශික්‍ෂායෙහි දුර්වලභාවය ප්‍රකට කොට සික හැර පියා හීනභාවයට පෙරළා වැටෙයි. මෙ ඔහට උස්සාදනා යි

මහණෙනි, යම් පරිදි එ යොධාජීව රජස්කඳ ඉවසන්නේ ද, ධවජාග්‍රය ඉවසන්නේ ද, වැලිත් උස්සාදනය ම අසා සංසීදන (ගැලීම) කෙරේ ද, විසීදන (වෙසෙසින් ගැලීම) කෙරේ ද, ධෘතිමත් ව නොසිටුනේ වේ ද, සඞ්ග්‍රාමයට බස්නට නොහැකි වේද, මහණෙනි, මෙ පුහුල් මම එ බඳු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු ඇතැම් පුද්ගලයෙක් ද ඇත. මහණෙනි, භික්‍ෂූන් අතුරෙහි විද්‍යමාන වන මේ තුන් වන යොධාජීවොපම පුද්ගල යි.

තව ද මහණෙනි, මහණ රජස්සකන්ධය ඉවසන්නේ ය. ධවජාග්‍රය ඉවසන්නේ ය. උස්සාදනය ඉවසන්නේ ය. වැලිත් සම්ප්‍රහාරයෙහි දී විඝාතයට සෙයි. විකෘතියට පැමිණෙයි. ඔහට සම්ප්‍රහාරය කිමෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි අරණ්‍යගත වූ හෝ වෘක්‍ෂමූලගත වූ හෝ ශූන්‍යාගාරගත වූ හෝ භික්‍ෂූහු කරා මාගම සමීපස්ථ ව හිඳියි. ගැටී හොවියි. මතුයෙහි වැතිර ගණී. හේ මාගම විසින් සමීප ව හිඳිනු ලැබුයේ, ගැටී හොවිනු ලැබුයේ, වැතිර ගණු ලැබුයේ සිකපද නො හැර පියා දුබල බව පාළු නො කොට මෙවුන්දම් ප්‍රතිසෙවනා කරයි. මෙ ඔහට සම්ප්‍රහාරය යි.

මහණෙනි, යම් පරිද්දෙකින් ඒ යොධාජීව රජස් කඳ ඉවසා ද, ධවජාග්‍රය ඉවසා ද, උස්සාදනය ඉවසා ද, වැලිත් සම්ප්‍රහාරයෙහි ලා විඝාතයට යේ ද, ප්‍රකෘතිභාවය හරණේ ද, මහණෙනි, මම මෙ පුහුල් එ බඳු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු වූ ද ඇතැම් පුද්ගලයෙක් වෙයි. මහණෙනි, භික්‍ෂූන් අතුරෙහි විද්‍යමාන වන මේ සතර වන යොධාජීවොපම පුද්ගල යි.

තව ද මහණෙනි, මහණ රජස්කඳ ඉවසන්නේ ය. ධවජාග්‍රය ඉවසන්නේ ය. උස්සාදනය ඉවසන්නේ ය. පහර ඉවසන්නේ ය. හේ එ සඞ්ග්‍රාමය දිනා, දිනූ සඞ්ග්‍රාම ඇතියේ එ ම සඞ්ග්‍රාමශීර්ෂයෙහි වෙසෙයි. ඔහට සඞ්ග්‍රාමවිජය කිමෙක යත්:

ඉධ භික්ඛවෙ භික්ඛුං අරඤ්ඤගතං වා රුක්ඛමූලගතං වා සුඤ්ඤාගාරගතං වා මාතුගාමො උපසඞ්කමිත්වා අභිනිසීදති, අභිනිපජ්ජති, අජ්ඣොත්ථරති. සො මාතුගාමෙන අභිනිසීදියමානො අභිනිපජ්ජියමානො අජ්ඣොත්ථරියමානො විනිවෙඨෙත්වා විනිමොචෙත්වා යෙන කාමං පක්කමති.

සො විවිත්තං සෙනාසනං භජති: අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති, අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. ව්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො. ථීනමිද්ධාය චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] -පෙ- ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති.

සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති. ඉදමස්ස සඞ්ගාමවිජයස්මිං.

සෙය්‍යථාපි සො භික්ඛවෙ, යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං[2], සහති සම්පහාරං, සො තං සඞ්ගාමං අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති. තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො හොති. අයං, භික්ඛවෙ, පඤ්චමො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච යොධාජීවූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛූසූ'ති.

1. ආනෙජප්පත්තෙ - සී මු. 2. උස්සාරණං - මජසං

මහණෙනි, මෙ සස්නෙහි අරණ්‍යට ගිය හෝ රුක්මුලට ගිය හෝ ජන ශූන්‍යාගාරයට ගිය හෝ මහණකු කරා මාගමක් එළඹ ලංව හිඳින්නී ය. ගැටී හෝනී ය. යට කොට වැතිර ගන්නී ය. හේ මාගමක විසින් ලංව හිඳිනු ලබනුයේ, හෝනා ලබන්නේ, යට කොට වැතිරෙණු ලබන්නේ අත්වෙළුම් හැර ගෘහිත ග්‍රහණය මුදා ගෙණ යම් ම තැනකට කැමැති සේ යෙයි.

හේ අරණ්‍ය ය, රුක්මුල ය, පර්‍වත ය, කඳුරු ය, ගිරිගුහා ය, සොහොන ය, වනපෙත් ය, අබ්වස ය, පිදුරු කිළි ය යන විවිකත ශයනාසනය සෙවුනේ ය. හේ වලට ගියේ වේවයි, රුක්මුලට ගියේ වේවයි, හිස් ගෙයට ගියේ වේවයි පලක් බැඳ උඩුකය සෘජු කොට පිහිටුවා කමටහන් අබිමුව කොට සිහිය පිහිටුවා හිඳුනේ ය. හේ (පඤ්චෝපාදානස්කන්ධසඞ්ඛ්‍යාත) ලොකයෙහි අභිධ්‍යාව හැරපියා (විෂ්කම්භනා විසින්) දුරු වූ අභිධ්‍යායෙන් යුත් සිතින් වාස කරයි. අභිධ්‍යායෙන් සිත මුදන්නේ ය. ව්‍යාපාද ප්‍රද්වෙෂ හැරපියා ව්‍යාපාදයට නො පත් සිතැතියේ, සර්‍වප්‍රාණී ගණයා කෙරෙහි හිතානුකම්පා ඇතියේ, වාස කරයි. ව්‍යාපාද ප්‍රද්වෙෂයෙන් සිත පිරිසිදු කෙරෙයි. ථීනමිද්ධය හැරපියා පහ වූ ථීනමිද්ධ ඇත්යේ, ආලොකසංඥ ඇතියේ, සමෘතිමත් වූයේ, සම්ප්‍රඥත ඇතියේ වසයි. ථීනමිද්ධයෙන් සිත මුදයි. උද්ධච්චකුක්කුච්චය හැරපියා උද්ධත නොවූයේ, අධ්‍යාත්මයෙහි සන්හුන් සිතැතියේ වාස කරයි. උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරෙයි. විචිකිච්ඡාව හැරපියා තුණු විචිකිච්ඡා ඇත්තේ, කුශලධර්මයෙහි කථංකථභාව නැතියේ වාස කරයි. විචිකිච්ඡායෙන් සිත මුදාලයි.

හේ චිත්තයට උපක්ලෙශ වන ප්‍රඥව දුර්‍වල කරණ, මේ පඤ්චනීවරණයන් හැරපියා කාමයන් කෙරෙන් වෙන් ව ම...චතුර්ථධ්‍යානයට පැමිණ වාස කරයි.

හේ මෙසේ එකඟ වූ සිත පිරිසිදු වත් ම, පර්‍යවදාත වත් ම, අඞ්ගණ නැති වත් ම, පහ වූ උපක්ලෙශ ඇති වත් ම, මෘදු වත් ම, කර්මණ්‍ය වත් ම, ස්ථිත වත් ම, නොසැලෙන බවට පත් වත් ම ... ආස්‍රවක්ෂයඥනය සඳහා චිත්තය නැඹුරු කෙරෙයි.

හේ මේ (පඤ්චස්කන්ධය) දුකැයි ඇති සැටි දන්නේ ය. මේ (තෘෂ්ණාව) දුඃඛ සමුදය යි ඇති සැටි දන්නේ ය. මේ (නිර්‍වාණය) දුඃඛ නිරොධය යි ඇති සැටි දන්නේ ය. මේ (අරි අටඟි මඟ) දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද් ය යි ඇති සැටි දන්නේ ය. මොහු ආස්‍රවයහ යි යථාභූතය දන්නේ ය. මේ ආස්‍රව සමුදය යි යථාභූතය දන්නේ ය. මේ ආස්‍රව නිරොධ ය යි යථාභූතය දන්නේ ය. මේ ආස්‍රවනිරොධගාමිනීප්‍රතිපද් ය යි යථාභූතය දන්නේ ය. මෙසෙයින් දන්නහුගේ චිත්තය කාමාස්‍රවයෙනුදු මිදෙයි. භවාස්‍රවයෙනුදු චිත්තය මිදෙයි. අවිද්‍යාස්‍රවයෙනුදු චිත්තය මිදෙයි. මෙසේ මිදුනු කල්හි විමුක්තය යි ඥනය වෙයි. ජාතිය ක්ෂීණ විය. මාර්‍ගබ්‍රහමචර්‍ය්‍යය වැස නිමවන ලදි. සිවු මඟ කරණී කරණ ලදි. පිළි මෙ බවට නො එම් දන්නේ ය. මෙ ඔහට සඞ්ග්‍රාමවිජය යි.

මහණෙනි, යම් පරිද්දෙකින් යොධාජීවයෙක් රජස් කඳ ඉවසන්නේ ද, ධවජාග්‍රය ඉවසන්නේ ද, උස්සාදනය ඉවසන්නේ ද, සම්ප්‍රහාරය ඉවසන්නේ ද, හේ එ සඞ්ග්‍රාමය දිනා දිනූ සඞ්ග්‍රාම ඇතියේ, එ සඞ්ග්‍රාමශීර්ෂයෙහි වෙසෙයි. මහණෙනි, මම මෙ පුද්ගලයා එ බඳු යයි කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු වූ ද, ඇතැම් පුද්ගලයෙක් ඇත. මහණෙනි, මහණුන් අතුරෙහි විද්‍යමාන වන මේ පස් වන යොධාජීවොපම පුද්ගල යි.

මහණෙනි, භික්ෂූන් අතුරෙහි විද්‍යමාන වන මේ යොධාජීවොපම පුද්ගලයෝ පස් දෙන යි.

## 5. 2. 3. 6

## [දුතියයොධාජීවූපම සුත්තං]

**[සාවත්ථිනිදානං:]**

26. පඤ්චිමෙ භික්ඛවෙ යොධාජීවා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ එකච්චො යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති. සො තස්මිං සඞ්ගාමෙ උස්සහති, වායමති. තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති, පරියාපාදෙන්ති.[1] එවරූපො[2] භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ පඨමො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනච පරං භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති. සො තස්මිං සඞ්ගාමෙ උස්සහති, වායමති. තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ උපලික්ඛන්ති. තමෙනං අපනෙන්ති. අපනෙත්වා ඤාතකානං නෙන්ති. සො ඤාතකෙහි නීයමානො අප්පත්වාව ඤාතකෙ අන්තරා මග්ගෙ කාලං කරොති. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ දුතියො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනච පරං භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති. සො තස්මිං සඞ්ගාමෙ උස්සහති, වායමති. තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ උපලික්ඛන්ති. තමෙනං අපනෙන්ති. අපනෙත්වා ඤාතකානං නෙන්ති. තමෙනං ඤාතකා උපට්ඨහන්ති, පරිචරන්ති. සො ඤාතකෙහි උපට්ඨහියමානො පරිචරියමානො තෙනෙවාබාධෙන කාලං කරොති. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ තතියො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනච පරං භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති. සො තස්මිං සඞ්ගාමෙ උස්සහති, වායමති. තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ උපලික්ඛන්ති. තමෙනං අපනෙන්ති අපනෙත්වා ඤාතකානං නෙන්ති. තමෙනං ඤාතකා උපට්ඨහන්ති, පරිචරන්ති සො ඤාතකෙහි උපට්ඨහියමානො පරිචරියමානො වුට්ඨාති තම්හා ආබාධා. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ චතුත්ථො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනච පරං භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති. සො තං සඞ්ගාමං අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො යොධාජීවො හොති. අයං භික්ඛවෙ පඤ්චමො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච යොධාජීවා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං

---

1. පරියාදියන්ති - සීමු. 2. එවරූපොපි - මජසං.

[5. 2. 3. 6.]

[ද්‍රිතියයොධාජීවූපම සූත්‍රය]

[සැවැත්නිදානයි:]

26. මහණෙනි, ලොකයෙහි විද්‍යමාන වන මේ යුද්ධාජීවිහු පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යොධාජීවයෙක් කඩු පලිස් ගෙණ දුනු හියොවුරු සදගෙණ සෙනාව්‍යුහසංවිධාන විසින් සනාථිවිෂ්ට වූ සඞ්ග්‍රාම භූමියට වදනේ ය. හේ එ සඞ්ග්‍රාමයෙහි යුද්ද විසින් උත්සාහ කෙරෙයි. ව්‍යායාම කෙරෙයි. සතුරෝ එසේ උත්සාහ කරණ ව්‍යායාම කරණ තෙල පුහුල් නසත්, මරණයට පමුණුවත්. මහණෙනි, මෙ ලොව්හි මේ බඳු ඇතැම් යොධාජීවයෙක් ඇත. මහණෙනි, ලොකයෙහි විද්‍යමාන වන මේ ප්‍රථම යොධාජීව යි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යොධාජීවයෙක් කඩු පලිස් ගෙණ දුනුහියොවුරු සදගෙණ දෙපස මූළුදුන් සඞ්ග්‍රාම භූමියට වදනේ ය. හේ එ සඞ්ග්‍රාමයෙහි උත්සාහ කරයි. ව්‍යායාම කරයි පරහු ඒ උත්සාහ කරණ, ව්‍යායාම කරණ, තෙල (යොධාජීව) පුහුල් විදිත්. (පරහු) තෙල පුහුල් (සියසෙන් කරු) හැර ගෙණ යත්. හැර ගෙණ ගොස් ඥතීන් වෙත පමුණුවත්. (ඥතීන් විසින් සියගෙට හෝ නෙසු ඥතීන් වෙත) ගෙණ යනු ලබන හේ ඥතීන් වෙත නො පැමිණ ම අතුරුමග කලුරිය කෙරෙයි. මහණෙනි, මෙ ලොව්හි මෙ බඳු වූ ද ඇතැම් යොධාජීවයෙක් ඇත. මහණෙනි, ලොකයෙහි විද්‍යමාන වන මේ දෙවන යොධාජීව යි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යොධාජීවයෙක් කඩු පලිස් ගෙණ දුනුහියොවුරු සදගෙණ දෙපසින් මූළුදුන් සඞ්ග්‍රාමභූමියට බස්නේ ය. හේ එ සඞ්ග්‍රාමයෙහි උත්සාහ කෙරෙයි. ව්‍යායාම කරයි. සතුරහු උත්සාහ කරණ ව්‍යායාම කරණ තෙල යොධාජීවයා විදුනාහ. තෙල යොධාජීවයා හැරගෙණ යත්. හැරගෙණ ගොස් ඥතීන් කරු පමුණුවත්. ඥතීහු තෙල යොධාජීවයා උපස්ථාන කරත්. මෙහෙයින් වටත්. හේ නෑ සබඳුන් විසින් වටනු ලබනුයේ, මෙහෙයින් වටනු ලබනුයේ එ ආබාධයෙන් ම කලුරිය කරයි. මහණෙනි, මෙ ලොව්හි මේ බඳු වූ ද ඇතැම් යොධාජීවයෙක් ඇත. මහණෙනි, ලොකයෙහි විද්‍යමාන වන මේ තෙවන යොධාජීව යි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යුද්ධොපජීවියෙක් කඩු හා පලිස් ගෙණ දුනු හා හියොවුරු සදගෙණ උභයසෙනායෙන් මූළුදුන් සඞ්ග්‍රාම භූමියට බස්නේ ය. හෙ සඞ්ග්‍රාමයෙහි උත්සාහ කරයි. ව්‍යායාම කරයි. අමිත්‍රයෝ ඒ උත්සාහ කරණ ව්‍යායාම කරණ තෙල යොධාජීවයා විදුනාහ. තුලුන් හැරගෙණ යෙත්. හැරගෙණ ගොස් නෑයනට දක්වා දෙත්. නෑ සබඳහු තුලුනට උවටැන් කරත්. මෙහෙ කරත්. හෙ නෑයන් විසින් වටනු ලබන්නේ මෙහෙ කරණු ලබන්නේ එ ආබාධයෙන් නැඟෙයි. මහණෙනි, මෙ ලොව්හි මෙ බඳු වූ ද ඇතැම් යොධාජීවයෙක් ඇත. මහණෙනි, මෙ ලොව්හි විද්‍යමාන වන මේ සතර වන යොධාජීව යි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් යොධාජීවයෙක් කඩු පලිස් ගෙණ දුනුහියොවුරු සදගෙණ දෙපසින් මූළුදුන් සඞ්ග්‍රාමයට බස්නේ ය. හේ එ සඞ්ග්‍රාමය දිනා දුනු සඞ්ග්‍රාම ඇතියේ එ ම සඞ්ග්‍රාමභූමියෙහි සතුරන් මැඩ වෙසෙයි. මහණෙනි, මෙ ලොව්හි මෙ බඳු වූ ද ඇතැම් යුද්ධොපජීවියෙක් ඇත. මහණෙනි, ලොව්හි විද්‍යමාන වන මේ පස් වන යුද්ධොපජීවි යි. මහණෙනි, ලොකයෙහි විද්‍යමාන වන මේ යොධාජීවයෝ පස්දෙනහ.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්ච[1] යොධාජීවූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛූසු. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. සො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය තමෙව ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්ථ පස්සති මාතුගාමං දුන්නිවත්ථං වා දුප්පාරුතං වා. තස්ස තං මාතුගාමං දිස්වා දුන්නිවත්ථං වා දුප්පාරුතං වා රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසිතෙන[2] චිත්තෙන සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පතිසෙවති.[3]

සෙය්‍යථාපි සො භික්ඛවෙ යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති, සො තස්මිං සඞ්ගාමෙ උස්සහති, වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති. පරියාපාදෙන්ති. තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. එවරූපො[4] භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො හොති. අයං භික්ඛවෙ පඨමො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

පුනච පරං භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උප-නිස්සාය විහරති. සො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය තමෙව ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්ථ පස්සති මාතුගාමං දුන්නිවත්ථං වා දුප්පාරුතං වා. තස්ස තං මාතුගාමං දිස්වා දුන්නිවත්ථං වා දුප්පාරුතං වා රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසිතෙන[2] චිත්තෙන පරිඩය්හතෙව කායෙන. පරිඩය්හති චෙතසා. තස්ස එවං හොති: යන්නූනාහං ආරාමං ගන්ත්වා භික්ඛූනං ආරොචෙය්‍යං රාගායිතොම්හි[5] ආවුසො රාගපරෙතො. න සක්කොමි බ්‍රහ්මචරියං සන්තානෙතුං.[6] සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී'ති. සො ආරාමං ගච්ඡන්තො අප්පත්වාව ආරාමං අන්තරා-මග්ගෙ සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

සෙය්‍යථාපි සො භික්ඛවෙ යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති, සො තස්මිං සඞ්ගාමෙ උස්සහති, වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ උපලික්ඛන්ති, තමෙනං අපනෙන්ති, අපනෙත්වා ඤාතකානං නෙන්ති, සො ඤාතකෙහි නීයමානො අප්පත්වාව ඤාතකෙ අන්තරාමග්ගෙ කාලං කරොති, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො හොති. අයං භික්ඛවෙ දුතියො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

1. පඤ්චිමෙ - මජසං. 2. රාගානුද්ධසෙතා - සිමු.
3. පටිසෙවති - මජසං. 4 එවරූපොපි - මජසං. 5. රාගපරියුට්ඨිතොම්හි - මජසං.
6. සන්ධාරෙතුං - මජසං.

මහණෙනි, එසෙයින් ම භික්ෂූන් අතුරෙහි විද්‍යමාන වන මේ යොධාජීවයන් බඳු පුද්ගලයෝ පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණෙක් අන්‍යතර ග්‍රාමයක් හෝ නියම්ගමක් හෝ ඇසුරු කොට වෙසෙයි. හෙ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ එ ම ගමට හෝ නියම් ගමට හෝ නො රක්නා ලද ම කයින් නොරක්නා ලද වචනයෙන් නොරක්නා ලද සිතින් නො එළඹ සිටි කායිගා සිහියෙන් අසංවෘත ඉන්ද්‍රියයෙන් පිඩු පිණිස වදනේ ය. හේ එහි වසඩක් නො වසා හැඳි හෝ වසඩක් නො වසා පෙරෙවි හෝ මාගමක් දක්නේ ය. නො සකස් කොට හැඳි හෝ නො සකස් කොට පෙරෙවි හෝ එ මාගම දුක රාගය ඔහුගේ (ශමථ-විදර්ශනා) සිත (අරමුණින්) බැහැරලයි. රාගය විසින් අනුධ්වස්ත සිතින් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන නො කොට දුබල බව පාළ නො කොට මෙවුන්දම් සෙවුනේ ය.

මහණෙනි, එ යොධාජීව යම් පරිද්දෙකින් කඩු පලිස් රැගෙණ දුනු හියොවුරු සදාගෙණ ව්‍යූඪසඬග්‍රාමයට වදනේ ද, හෙ එ සඬග්‍රාමයෙහි උත්සාහ කෙරේ ද, ව්‍යායාම කෙරේ ද, වෛරීහු උත්සාහ කරණ ව්‍යායාම කරණ යොධාජීවයා නසත්, දිවි ගලවත්. මහණෙනි, මම මෙ පුද්ගලයා එ බඳු උපමා ඇති කොට කියමි. මහණෙනි, මෙසස්නෙහි මෙ බඳු ඇතැම් පුද්ගලයෙක් ඇත. මහණෙනි, භික්ෂූන් අතුරෙහි විද්‍යමාන වන මේ ප්‍රථම යොධාජීවොපම පුද්ගල යි.

තවද මහණෙනි, මහණ අන්‍යතර ග්‍රාමයක් හෝ නිගමයක් හෝ ඇසුරු කොටගෙණ වාස කරයි. හේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ එ ම ගමට හෝ නියම්ගමට හෝ නො රක්නාලද ම කයින් නොරක්නා ලද ම වචනයෙන් නොරක්නා ලද ම සිතින් නො එළැවූ (කායිගා) සිහියෙන් අසංවෘත ඉන්ද්‍රියයෙන් යුක්ත ව පිඩු පිණිස වදනේ ය. හේ එහි නො සකස් කොට හැඳි හෝ නො සකස් කොට පෙරෙවි හෝ මාගමක් දක්නේය. නො සකස් කොට හැඳියා වූ හෝ නො සකස් කොට පෙරෙවියා වූ හෝ මාගම දැකීමෙන් රාගය ඔහුගේ ශමථවිදර්ශනාචිත්තය (අරමුණෙන්) නෙරලයි. රාගාධ්‍යුධ්වස්තචිත්තයෙන් යුත් හේ කයින් දැවෙමය. සිතින් දැවෙමය. ඔහට මෙබඳු සිතෙක් වෙයි: මම ආරාමයට ගොස් “ඇවැත්නි, මම රාගයෙන් රකත වූයෙමි. (සම්දෂ්ටයකු සෙයින්) රාගයෙන් මඩනාලදුයෙමි වෙමි. බඹසර රක්නට නො හැකියෙමි. දුර්වලභාවය පාළ කොට ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හුනු බවට වැටෙමි යි භික්ෂූන්ට කියන්නෙම් නම් මනා මැනූ”යි. හේ ආරාමයට යනුයේ අරමට නො පැමිණ ම අතරමග ශික්ෂායෙහි දෞර්වල්‍යය පාළ කොට ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හුනුබවට වැටෙයි.

මහණෙනි, යම් පරිදි එ යොධාජීව කඩු පලිස් රැගෙණ දුනු හියොවුරු සදගෙණ සෙනා වින්‍යාස ඇති යුදබිමට බස්නේ වේ ද, හෙ එ සඬග්‍රාමයෙහි උත්සාහ කෙරෙයි, ව්‍යායාම කෙරෙයි. උත්සාහ කරණ ව්‍යායාම කරණ තුලුන් සතුරෝ විදින්. විත්කෑ තුලුන් සියසෙන් කරු ගෙණ යත්. ඉන් ඉවත් කොට ගෙණ නෑයන් වෙත පමුණුවත්. හෙ නෑයන් විසින් (සියගෙට හෝ නෙසු නෑයන් වෙත) ගෙණ යනු ලබන්නේ ඥතීන් වෙත නො පැමිණ ම අතරමග කලුරිය කෙරෙයි ද, මහණෙනි, මම මෙ පුගුල් එ බඳු උපමා ඇත්තකු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙබඳුවූද ඇතැම් පුද්ගලයෙක් ඇත. මහණෙනි, භික්ෂූන් අතුරෙහි විද්‍යමාන වන මෙ දෙවන යොධාජීවොපම පුද්ගල යි.

පුනච පරං භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. සො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය තමෙව ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්ථ පස්සති මාතුගාමං දුන්නිවත්ථං වා දුප්පාරුතං වා. තස්ස තං මාතුගාමං දිස්වා දුන්නිවත්ථං වා දුප්පාරුතං වා රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසිතෙන[1] චිත්තෙන පරිඩය්හතෙව කායෙන, පරිඩය්හති චෙතසා. තස්ස එවං හොති: යන්නූනාහං ආරාමං ගන්ත්වා භික්ඛූනං ආරොචෙය්‍යං: "රාගායිතොම්හි ආවුසො රාගපරෙතො. න සක්කොමි බ්‍රහ්මචරියං සන්තානෙතුං.[2] සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී"ති. සො ආරාමං ගන්ත්වා භික්ඛූනං ආරොචෙති: රාගායිතොම්හි ආවුසො රාගපරෙතො. න සක්කොමි බ්‍රහ්මචරියං සන්තානෙතුං.[2] සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී"ති.

තමෙනං සබ්‍රහ්මචාරී ඔවදන්ති අනුසාසන්ති: "අප්පස්සාදා ආවුසො කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. මංසපෙසූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. තිණුක්කූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. අඞ්ගාරකාසූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. සුපිනකූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. යාචිතකූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. රුක්ඛඵලූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා, බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. අසිසූනූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. සත්තිසූලූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. සප්පසිරූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භීය්‍යො. අභිරමතායස්මා බ්‍රහ්මචරියං.[3] මා ආයස්මා සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තී"ති.[4]

1. රාගානුද්ධසෙන - සීමු. 2, සන්ධාරෙතුං මජසං.
3. බ්‍රහ්මචරියෙ - මජසං. 4 හීනායාවත්තතීති - සීමු

තවද මහණෙනි, මහණ එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරු කොට වෙසේ. හෙ පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ එම ගමට හෝ නියම් ගමට හෝ පිඬු පිණිස නො රක්නා ලද කායෙන් නො රක්නා ලද වචනයෙන් නො රක්නා ලද සිතින් නො එළවූ සිහියෙන් අසංවෘත ඉන්ද්‍රියයෙන් පිවිසෙයි. හෙ එහි නො සකස් කොට හැඳි හෝ නො සකස් කොට පෙරෙව ගත් හෝ මාගමක දක්නේ ය. නො සකස් කොට හැඳි හෝ නො සකස් කොට පෙරෙව ගත් හෝ ඒ මාගම දුටු රාගය ඔහුගේ සිත දූෂණය කරයි. හෙ රාගයා විසින් නැසූ සිත් ඇත්තේ යුක්ත ව කයින් දූවේ ම ය. සිතින් දූවේ ම ය. ඔහට මේ බඳු සිතෙක් වෙයි: "මම ආරාමයට ගොස් 'ඇවැත්නි, රාගයෙන් රත්වූයෙම් රාගයෙන් මැඩුනෙම් වෙමි. බඹසර රක්නට නො හැකියෙම් වෙමි. ශික්ෂායෙහි දෞර්බල්‍යය පළ කොට ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි බවට වැටෙමි'යි භික්ෂූන්ට සැළ කරන්නෙම් නම් මනා මැනැ"යි. හෙ අරමට ගොස් ''ඇවැත්නි, රාගයෙන් රත්වූයෙම් රාගයෙන් මැඩුනෙම් වෙමි. බඹසර රක්නට නො හැකියෙමි. ශික්ෂායෙහි දෞර්බල්‍යය පළ කොට ශික්ෂාප්‍රත්‍යා-ඛ්‍යානය කොට හීනභාවයට වැටෙමි''යි භික්ෂූන්ට සැළ කරයි.

තෙල මහණහට සබ්‍රම්හචාරීහු "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අල්පාස්වාද ඇතියහ යි, බොහෝ දුක් ඇතියහ යි (උපක්ලේශසාධක-වන බැවින්) බොහෝ උපායාස ඇතියහ යි, මෙහි (උපද්‍රවාධික වන බැවින්) ආදීනව බෙහෙවැ යි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ (අල්පාස්වාද වන බැවින්) ඇටසැකිල්ලක් වැනිය හ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතිය හ යි, මෙහි ආදීනව බෙහෙවැ යි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ (බහුසාධාරණ වන බැවින්) මාංසපේශී බඳුවහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බෙහෙවැ යි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ( දහනකෘත්‍යසාධක වන බැවින් ) තෘණෝල්කෝපමයහ (තණ හුලක් බඳුහ) යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බෙහෙවැයි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ (මහාභිතාපකරවන බැවින්) අඟුරුවළක් බඳුවහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බෙහෙවැයි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ (ඉත්වර ව වැටහෙන බැවින්) සිහිනයක් බඳුහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බෙහෙවැයි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ (තාවත්-කාලික වන බැවින්) යාචිතකෝපමයහ (ඉල්වා ගත්තක් බඳුහ)යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බෙහෙවැයි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ (අඟ පසඟ බිඳලන බැවින්) වෘක්ෂඵලෝපමයහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇති-යහ යි, මෙහි ආදීනව බෙහෙවැයි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ (අධිකුට්ටනාර්ථයෙන්) මස්ලොඹු බඳුවහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බෙහෙවැයි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ (විනිවිධනාර්ථයෙන්) ශක්ති-ශූලෝපමයහ යි, (අඩයටි හුල් බඳුහ යි), බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බෙහෙවැයි වදාරණලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ (සප්‍රතිභයාර්ථයෙන්) සර්පශිරෝපම බඳුවහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බෙහෙවැයි වදාරණ ලදහ. ආයුෂ්මත් තෙමේ බඹසරෙහි ඇලුම් කෙරේවා. ආයුෂ්මත් ශික්ෂායෙහි දෞර්බල්‍යය පළ කොට ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට හීනභාවයට නහමක් වැටේවා"යි ඔවා දෙත් අනුශාසනා කරත්.

සො සබ්‍රහ්මචාරීහි එවං ඔවදියමානො එවං අනුසාසියමානො එවමාහ: "කිඤ්චාපි ආවුසො 'අප්පස්සාදා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො', අථ ඛො නෙවාහං සක්කොමි බ්‍රහ්මචරියං සන්තානෙතුං. සික්ඛාදුබ්බල්‍යං ආවීකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායා-වත්තිස්සාමී"ති. සො සික්ඛාදුබ්බල්‍යං ආවීකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

සෙය්‍යථාපි සො භික්ඛවෙ යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති, සො තස්මිං සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ උපලික්ඛන්ති, තමෙනං අපනෙන්ති, අපනෙත්වා ඤාතකානං[2] නෙන්ති, තමෙනං ඤාතකා උපට්ඨහන්ති, පරිචරන්ති, සො ඤාතකෙහි උපට්ඨහියමානො පරිචරියමානො තෙනෙවාබාධෙන කාලං කරොති, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො හොති. අයං භික්ඛවෙ තතියො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. සො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය තමෙව ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්ථ පස්සති මාතුගාමං දුන්නිවත්ථං වා දුප්පාරුතං වා. තස්ස තං මාතුගාමං දිස්වා දුන්නිවත්ථං වා දුප්පාරුතං වා රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසිතෙන[3] චිත්තෙන පරිඩය්හතෙව කායෙන, පරිඩය්හති චෙතසා. තස්ස එවං හොති:

1. සන්ධාරෙතුං - මජ්සං 2. ඤාතීනං - සීමු. 3. රාගානුබද්ධෙන - සීමු.

හෙ සබ්‍රම්සරුන් විසින් මෙසෙයින් ඔවා දෙනු ලබනුයේ, මෙසෙයින් අනුසස්නා ලබනුයේ, මෙසේ කියයි: "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අල්පාස්වාදයහ, බොහෝ දුක් ඇතියහ, බොහෝ උපායාස ඇතියහ, මෙහි ආදීනව බොහෝ ය යි වදරණ ලද, වැලින් මම් බඹසර රක්නට නො හැකියෙමි. ශික්‍ෂාහි දුබලබැව් පාළ කොට ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහභාවයට වැටෙමි"යි. හෙ ශික්‍ෂායෙහි දෞර්බල්‍යය පහළ කොට ශික්‍ෂා හැරපියා හුනු බවට වැටෙයි.

මහණෙනි, යම් පරිදි එ යොධාජීව කඩු පලිස් ගෙණ දුනු හියොවුරු සදා ගෙණ සෙනානිවෙශනයෙන් සිටි සඞ්ග්‍රාමයට බස්නේ වේ ද, හෙ එ සඞ්ග්‍රාම-යෙහි උත්සාහ කෙරෙයි, ව්‍යායාම කෙරෙයි, සතුරෝ උත්සාහ කරණ ව්‍යායාම කරණ තෙල යොධාජීවයා විදුනාහ, ඔහු බැහැර ගෙණ යත්, ගෙණ ගොස් නෑයන් වෙත පමුණුවත්, ඥාතීහු ඔහු වටත්, මෙහෙ කරත්, හෙ නෑයන් විසින් වටනු ලබනුයේ, මෙහෙ කරණු ලබනුයේ ඒ ආබාධයෙන් ම කලුරිය කරයි ද, මහණෙනි, මෙ පුහුල් ඔහු වැනිය යි මම කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු ඇතැම් පුද්ගලයෙක් ද ඇත. මහණෙනි, භික්‍ෂූන් අතුරෙහි විද්‍යමාන වන මෙ තුන් වන යොධාජීවොපම පුද්ගල යි.

තවද මහණෙනි, මහණ එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරු කොට වෙසේ. හෙ පෙරවරුයෙහි හැද පෙරෙව පාසිවුරු ගෙණ එ ම ගමට හෝ නියම්ගමට හෝ නො රක්නා ලද කයින් ම නො රක්නා ලද වචනයෙන් ම නො රක්නා ලද සිතින් ම නො එළඹ සිටි කායියා සිහියෙන් ම අසංවෘත ඉන්ද්‍රියයෙන් පිඬු පිණිස වන්නේ ය. හෙ එහි නො සකස් කොට හැඳි හෝ නො සකස් කොට පෙරෙවි හෝ මාගමක දක්නේ ය. නො සකස් කොට හැඳි හෝ නො සකස් කොට පෙරෙවි හෝ එ මාගම දැක්මෙන් රාගය ඔහුගේ සිත (විදසුන් අරමුණින්) නෙරයි. හෙ රාගයෙන් ධර්ෂිත සිත් ඇතියේ කයින් දැවේමැයි, සිතින් දැවේමැයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි:

“යන්නූනාහං ආරාමං ගන්ත්වා භික්ඛූනං ආරොචෙය්‍යං: රාගායිතොම්හි[1] ආවුසො රාගපරෙතො, න සක්කොමි බ්‍රහ්මචරියං සන්තානෙතුං.[2] සික්ඛා-දුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී”ති සො ආරාමං ගන්ත්වා භික්ඛූනං ආරොචෙති: “රාගායිතොම්හි[1] ආවුසො රාගපරෙතො, න සක්කොමි බ්‍රහ්මචරියං සන්තානෙතුං.[2] සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී”ති.

තමෙනං සබ්‍රහ්මචාරී ඔවදන්ති අනුසාසන්ති: “අප්පස්සාදා ආවුසො කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො. අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො. මංසපෙසූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො. තිණුක්කූපමා කාමා වුත්තා භගවතා -පෙ- අඞ්ගාරකාසූපමා කාමා වුත්තා භගවතා -පෙ- සුපිනකූපමා කාමා වුත්තා භගවතා -පෙ- යාචිතකූපමා කාමා වුත්තා භගවතා -පෙ- රුක්ඛඵලූපමා කාමා වුත්තා භගවතා -පෙ- අසිසූනූපමා කාමා වුත්තා භගවතා -පෙ- සත්තිසූලූපමා කාමා වුත්තා භගවතා -පෙ- සප්පසිරූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො. අභිරමතු ආයස්මා බ්‍රහ්මචරියං[3]. මා ආයස්මා සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තී”ති.[4] සො සබ්‍රහ්මචාරීහි එවං ඔවදියමානො එවං අනුසාසියමානො එවමාහ: “උස්සහිස්සාමි ආවුසො, ධාරයිස්සාමි[5] ආවුසො, අභිරමිස්සාමි ආවුසො. න දානාහං ආවුසො සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී”ති.

සෙය්‍යථාපි සො භික්ඛවෙ යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති, සො තස්මිං සඞ්ගාමෙ උස්සහති, වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ උපලික්ඛන්ති, තමෙනං අපනෙන්ති, අපනෙත්වා ඤාතකානං නෙන්ති, තමෙනං ඤාතකා උපට්ඨහන්ති, පරිචරන්ති, සො ඤාතකෙහි උපට්ඨහියමානො පරිචරියමානො වුට්ඨාති තම්හා ආබාධා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො හොති. අයං භික්ඛවෙ චතුත්ථො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

---

1- රාගපරියුට්ඨිතොම්හි - මජසං. 2. සන්ධාරෙතුං - මජසං. 3. බ්‍රහ්මචරියෙ - මජසං
4. හීනායාවත්තති - සීමු. 5. වායමිස්සාමි - මජසං.

"මම ආරාමයට ගොස් 'ඇවැත්නි, රාගයෙන් රක්ත වූයෙමි, රාගයෙන් මැඩුනෙම් වෙමි. බඹසර (නො සිඳ) රක්නට නො පොහොසත්මි. ශික්‍ෂායෙහි දෞර්බල්‍යය පාළු කොට ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිබවට පැමිණෙම්'යි භික්‍ෂූන්ට සැළ කෙරෙම් නම් මැනැවැ"යි. හෙ අරමට ගොස් භික්‍ෂූන්ට සැළ කරයි: "ඇවැත්නි. රාගයෙන් රක්ත වූයෙමි, රාගයෙන් මැඩුනෙම් වෙමි. බ්‍රහමචර්‍ය්‍යය (නො සිඳ) රක්නට නොපොහොසත්මි. ශික්‍ෂායෙහි දෞර්බල්‍යය ප්‍රකට කොට ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිභාවයට වැටෙමි"යි.

තෙල මහණ හට සබ්‍රම්සරහු ඔවා දෙත්, අනුශාසනා කෙරෙත්: "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අල්පාස්වාදයහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බොහෝ ය යි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අස්ථිකඞ්කාල වැන්නහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බොහෝ ය යි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ මාංසපෙශියක් වැනියහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බොහෝ ය යි වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ තණසුළු වැනි ය යි...වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අඞ්ගාරකර්ෂූපමයහ යි...වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ස්වප්නොපමයහ යි ... වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ පිරුළු අළ දෑයක් (යැද ඉල්වා ගන්නා ලද්දක්) වැනියහ යි ... වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ වෘක්‍ෂඵල වැනියහ යි ... වදාරණලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අසිසූනොපමයහ යි ... වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ශක්තිශූල වැනියහ යි... වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ සර්පශිරස් වැනියහ යි, බොහෝ දුක් ඇතියහ යි, බොහෝ උපායාස ඇතියහ යි, මෙහි ආදීනව බොහෝ ය යි වදාරණ ලදහ. ආයුෂ්මත් බඹසරෙහි ඇලුම් කෙරේවා. ආයුෂ්මත් ශික්‍ෂායෙහි දෞර්බල්‍යය ප්‍රකට කොට ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිභාවයට තහමක් වැටේවා" යි. හෙ සබ්‍රම්සරුන් විසින් මෙසේ ඔවා දෙනු ලබනුයේ, මෙසේ අනුසස්නා ලබනුයේ මෙසේ කියයි: "ඇවැත්නි, උත්සාහ කරණෙමි. ඇවැත්නි, ධරණෙමි. ඇවැත්නි, සිත් අලවනෙමි. ඇවැත්නි, මම දූත් ශික්‍ෂායෙහි දෞර්බල්‍යය පහළ කොට සිකපද හැරපියා ගිහිබවයට නො වැටෙන්නෙමි"යි.

මහණෙනි, යම් පරිදි එ යොධාජීව කඩුපලිස් ගෙණ දුනුහීයොවුරු සැදගෙණ ව්‍යූඪසඞ්ග්‍රාමයට වදනේ වේ ද, හෙ එ සඞ්ග්‍රාමයෙහි උත්සාහ කෙරෙයි, ව්‍යායාම කෙරෙයි. සතුරෝ උත්සාහ කරණ ව්‍යායාම කරණ ඔහු විදිත්. ඔහු සියසෙන් වෙත ගෙණ යත්, ගෙණ ගොස් නෑයනට පමුණුවත්, නෑයෝ තෙල යොධාජීවයා වටත්, මෙහෙ කරත්, හෙ නෑයන් විසින් වටනු ලබනුයේ, මෙහෙ කරණු ලබනුයේ, එ ආබාධයෙන් නැඟිටුනේ ද, මහණෙනි, මම මෙ පුහුල් ඔහු බඳු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු වූ ද ඇතැම් පුද්ගලයෙක් ඇත. මහණෙනි, භික්‍ෂූන් අතර විද්‍යමාන වන මේ සතර වන යොධාජීවොපම පුද්ගල යි.

පුනච පරං භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. සො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය තමෙව ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති රක්ඛිතෙන[1] කායෙන රක්ඛිතාය වාචාය රක්ඛිතෙන චිත්තෙන උපට්ඨිතාය සතියා සංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා, -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති.

සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො විවිත්තං සෙනාසනං භජති: අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය -පෙ- සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං[2] උපසම්පජ්ජ විහරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාති.

සෙය්‍යථාපි සො භික්ඛවෙ යොධාජීවො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා වියූළ්හං සඞ්ගාමං ඔතරති, සො තං සඞ්ගාමං අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො හොති. අයං භික්ඛවෙ පඤ්චමො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛූසු.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච යොධාජීවූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛූසූති.

---

1. රක්ඛිතෙනෙව - මජසං.
2. චතුත්ථජ්ඣානං - සීමු. අනෙජ්ජප්පත්තෙ - සීමු.

තවද මහණෙනි, මහණ එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරු කොට වෙසෙයි. හෙ පෙරවරුයෙහි හැඳ පාසිවුරු ගෙණ එ ගමට හෝ නියම්ගමට හෝ රක්නා ලද කයින් රක්නා ලද වචනයෙන් රක්නා ලද සිතින් එළඹ සිටි කායිගතාසිහියෙන් සංවෘත ඉන්ද්‍රියයෙන් පිඬු පිණිස පිවිසෙයි. හෙ ඇසින් රූපයක් දැක නිමිති නො ගන්නා සුලුයේ, අනුව්‍යඤ්ජන නො ගන්නා සුලුයේ වෙයි. යම් හෙයෙකින් චක්ෂුරින්ද්‍රියය අසංවෘත කොට වාස කරණ තෙල පුහුල් කරා ලාමක අකුශලධර්ම වූ අභිද්‍යාදෞර්මනස්‍යයෝ ලුහුබඳනාහු වෙත් නම්, එහි සංවරණ පිණිස පිළිපදනේ ය. චක්ෂුරින්ද්‍රියය රකියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කණින් ශබ්දයක් අසා ... ඝ්‍රාණයෙන් ගන්ධයක් අසා ... ජිහ්වායෙන් රස විඳ ... කයින් ස්පර්ශය පැහැස...මනසින් ධර්මායතන දැන නිමිති නො ගන්නා සුලුයේ, අනුව්‍යඤ්ජන නො ගන්නා සුලුයේ වෙයි. යම් හෙයෙකින් මනින්ද්‍රියය අසංවෘත කොට වාස කරණ තෙල මහණ කරා ලාමක අකුශලධර්ම වූ අභිධ්‍යාදෞර්මනස්‍යයෝ ලුහුබඳනාහු වෙත් නම්, එහි සංවරණ පිණිස පිළිපදනේ ය. මනින්ද්‍රියය රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

හෙ පසුබත්හි පිඬුවායෙන් පෙරලා ආයේ විවික්තශයනාසන වූ අරණ්‍ය ය වෘක්ෂමූල ය පර්වත ය කන්දරය ගිරිගුහා ය ශමශාන ය වනප්‍රස්ථ ය අභ්‍යවකාශ ය පලාලපුඤ්ජ ය බෙජේ හෙ වලට ගියේ වේවයි, රුක්මුලට ගියේ වේවයි, ශූන්‍යාගාරයට ගියේ වේවයි. පලක් බැඳ කය සෘජු කොට තබා සිහිය අභිමුඛ කොට එළවා හිඳුනේ ය. හෙ පඤ්චස්කන්ධලොකයෙහි අභිධ්‍යාව දුරු කොට .. හෙ චිත්තයාගේ උපක්ලෙශ වූ ප්‍රඥාවගේ දුර්වලකරණ පඤ්චනීවරණ ධර්මයන් දුරු කොට කාමයන් කෙරෙන් වෙන් ව ම ... චතුර්ථධ්‍යානය උපයා වෘස කරයි.

හෙ මෙසෙයින් සමාහිගත සිත පිරිසිදු වූ කල්හි, පර්‍ය්‍යවදාතවූ කල්හි, අඞ්ගණරහිත වූ කල්හි, පහව ගිය උපක්ලෙශ ඇති වත් ම මෘදු වත් ම, කර්මණ්‍ය වත් ම, ස්ථිතිප්‍රාප්ත වත් ම, නො සැලෙන බවට පැමිණෙත් ම ආස්‍රවයන්ගේ ක්ෂයඥනය සඳහා සිත අභිමුඛ කොට නමයි. හෙ මේ පඤ්චස්කන්ධය දුකැයි යථාභූතය මැනැවින් දන්නේ ය...මෙ රහත් බව පිණිස කටයුතු අනෙකෙක් නැතැයි මැනැවින් දන්නේ ය.

මහණෙනි, යම් සෙයින් එ යොධාජීව කඩු පලිස් ගෙණ දුනු හියොවුරු සදගෙණ සන්නිවිෂ්ටසෙනා ඇති සඞ්ග්‍රාමභූමියට බස්නේ වේ ද, හෙ එ සඞ්ග්‍රාමය දිනා දිනූ සඞ්ග්‍රාම ඇත්තේ එ ම සඞ්ග්‍රාමශීර්ෂයෙහි වෙසේ ද, මහණෙනි, මම මෙ පුහුල් එ බඳු කොට කියමි. මහණෙනි, මෙ බඳු සැහැවි ඇති ඇතැම් පුද්ගලයෙක් ද මේ සස්නෙහි ඇත. මහණෙනි, මහණුන් අතුරෙහි වසන මේ පස් වන යොධාජීවෞපම පුද්ගල යි.

මහණෙනි, මේ යොධාජීවෝපම පුද්ගලයෝ පස්දෙන මහණුන් අතුරෙහි විද්‍යමාන වෙති යි.

## 5. 2. 3. 7.

## [පඨමඅනාගතභයසුත්තං]

[සාවත්ථිනිදානං:]

27. පඤ්චිමානි භික්ඛවෙ අනාගතභයානි සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. කතමානි පඤ්ච?

ඉධ භික්ඛවෙ ආරඤ්ඤකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: “අහං ඛො එතරහි එකකොව[1] අරඤ්ඤෙ විහරාමි. එකකා ඛො පන මං[2] අරඤ්ඤෙ විහරන්තං අහි වා ඩංසෙය්‍ය, විච්ඡිකො වා මං ඩංසෙය්‍ය, සතපදී වා මං ඩංසෙය්‍ය. තෙන මෙ අස්ස කාලකිරියා[3]. සො මමස්ස අන්තරායො. හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා”ති. ඉදං භික්ඛවෙ පඨමං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

පුනච පරං භික්ඛවෙ ආරඤ්ඤකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: “අහං ඛො එතරහි එකකො අරඤ්ඤෙ විහරාමි. එකකො පනාහං අරඤ්ඤෙ විහරන්තො උපක්ඛලිත්වා වා පපතෙය්‍යං, භත්තං වා මෙ භුත්තං[4] ව්‍යාපජ්ජෙය්‍ය, පිත්තං වා මෙ කුප්පෙය්‍ය, සෙම්හං වා මෙ කුප්පෙය්‍ය, සත්ථකා වා මෙ වාතා කුප්පෙය්‍යුං, තෙන මෙ අස්ස කාලකිරියා[3]. සො මමස්ස අන්තරායො. හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා”ති. ඉදං භික්ඛවෙ දුතියං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

පුනච පරං භික්ඛවෙ ආරඤ්ඤකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: “අහං ඛො එතරහි එකකො අරඤ්ඤෙ විහරාමි. එකකො ඛො පනාහං අරඤ්ඤෙ විහරන්තො වාළෙහි වා සමාගච්ඡෙය්‍යං, සීහෙන වා ව්‍යග්ඝෙන වා දීපිනා වා, අච්ඡෙන වා තරච්ඡෙන වා, තෙ මං ජීවිතා වොරොපෙය්‍යුං, තෙන මෙ අස්ස කාලකිරියා.[3] සො මමස්ස අන්තරායො. හන්ද’හං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා”ති. ඉදං භික්ඛවෙ තතියං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

---

1 එකකො - මජසං. 2 එකකං ඛො පන මං - සතා
3 කාලං කිරියා - මජසං. 4. භත්තං වා භුත්තං මෙ - මජසං.

# 5. 2. 3. 7.

## [ පඨමඅනාගතභය සූත්‍රය ]

[සැවැත් නිදාන යි.]

27. මහණෙනි, මේ පස් අනාගතභයයක් මොනොවට දක්නා ආරණ්‍යක භික්ෂුහු විසින් අප්‍රාප්ත (ධ්‍යානවිදර්ශනාමාර්ගඵලප්‍රභෙද) විශෙෂයාගේ ප්‍රාප්තිය සඳහා, අනධිගතවිශෙෂයාගේ අධිගමය සඳහා, අප්‍රත්‍යක්ෂ විශෙෂයාගේ ප්‍රත්‍යක්ෂකරණය සඳහා අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව නිවනට යැවූ සිත ඇති ව වසන්නට නිසි මැ යි. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි ආරණ්‍යක මහණ මෙසේ නුවණින් සිතයි: "මම මෙ කල අරණෙහි එකලා වූයෙම් ම වෙසෙමි. එකලා ව ම අරණෙහි වාස කරණ මා සර්පයෙක් හෝ ඩස්නේ ය, තුහුසුයෙක් හෝ මා ඩස්නේ ය, පත්වහයෙක් හෝ මා ඩස්නේ ය, එයින් මාගේ කාලක්‍රියාව වෙයි. එ මට අනතරායෙක් වෙයි. එකාන්තයෙන් නො පත් විශෙෂයාගේ ප්‍රාප්තිය සඳහා, අනධිගත විශෙෂයාගේ අධිගමය සඳහා, අසාක්ෂාත්කෘත විශෙෂයාගේ සාක්ෂාත්කරණය සඳහා, (ද්විවිධවීර්යයෙන්) වැර අරඹමි"යි. මහණෙනි, මේ ප්‍රථම අනාගතභය දක්නා ආරණ්‍යක මහණහු විසින් නො පත් විශෙෂයාගේ ලාභය පිණිස, අනධිගත විශෙෂයාගේ අධිගමය පිණිස, අසාක්ෂාත්කෘතවිශෙෂයාගේ පසක් කිරීම පිණිස නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් කෙරෙහි මෙහෙයූ සිත් ඇති ව වසන්නට නිස්ස.

තවද මහණෙනි, වනවැසි මහණ මෙසේ නුවණින් සිතයි: "මම මෙ කල්හි එකලා ව ම වෙනෙහි වසමි. එකලා ව ම වෙනෙහි වසන මම පැකිල හෝ හෙන්නෙමි. මා වැළඳූ බත හෝ (අජීර්ණකාදි වශයෙන්) විකෘතියට පත් වන්නේ ය. මාගේ පිත හෝ කිපෙන්නේ ය. මාගේ සෙම් හෝ කිපෙන්නේ ය. මාගේ (සන්ධිබන්ධන සිඳුනා) ශස්ත්‍රකවාතයෝ හෝ කිපෙන්නාහ. එයින් මාගේ කළුරිය වෙයි. එ මට අන්තරාය වෙයි. මම නො ලත් වෙසෙස්හුගේ ලාභය සඳහා, අනධිගත වෙසෙස්හුගේ අධිගම සඳහා, අසාක්ෂාත්කෘත වෙසෙස්හුගේ සාක්ෂාත්කරණය සඳහා වැර වඩන්නෙම් මැ"යි. මහණෙනි, මෙ දෙවන අනාගතභය දක්නා වනවැසි මහණහු විසින් අප්‍රාප්තවිශෙෂයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගත විශෙෂයාගේ අධිගමය පිණිස, පසක් නො කරණ ලද විශෙෂයාගේ පසක් කිරීම පිණිස අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වසන්නට නිසි ය.

තවද මහණෙනි, වනවැසි මහණ මෙසේ නුවණින් සිතයි: "මම මෙකල වනයෙහි එකලා වූයෙම් වසමි. වනයෙහි එකලා ව වසන මම සිංහයකු සමග හෝ ව්‍යාඝ්‍රයකු සමග හෝ දිවියකු සමග හෝ වලසකු සමග හෝ කරබානා වලසකු සමග හෝ ය යි මෙසේ ව්‍යාලයන් හා ද එකතු වන්නෙමි. ඔහු මා දිවි ගලවන්නාහ. එයින් මාගේ කළුරිය වෙයි. එ මාහට අනතරාය වෙයි. එකාන්තයෙන් අප්‍රාප්තවිශෙෂයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගත විශෙෂයාගේ අධිගමය පිණිස, අසාක්ෂාත්කෘතවිශෙෂයාගේ සාක්ෂාත්කරණය පිණිස වැර අරඹමි"යි. මහණෙනි, මේ තුන් වන අනාගතභය දක්නා ආරණ්‍යක මහණහු විසින් අප්‍රාප්තවිශෙෂයාගේ ප්‍රාප්තිය සඳහා, අනධිගතවිශෙෂයාගේ අධිගමය පිණිස, අසාක්ෂාත්කෘත-විශෙෂයාගේ සාක්ෂාත්කරණය පිණිස අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වසන්නට නිසි ය.

පුනච පරං භික්ඛවෙ ආරඤ්ඤකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: "අහං ඛො එතරහි එකකො අරඤ්ඤෙ විහරාමි. එකකො ඛො පනාහං අරඤ්ඤෙ විහරන්තො මාණවෙහි[1] සමාගච්ඡෙය්‍යං කතකම්මෙහි වා අකතකම්මෙහි වා. තෙ මං ජීවිතා වොරොපෙය්‍යුං. තෙන මෙ අස්ස කාලකිරියා.[2] සො මමස්ස අන්තරායො. හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායාති." ඉදං භික්ඛවෙ චතුත්ථං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

පුනච පරං භික්ඛවෙ ආරඤ්ඤකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: "අහං ඛො එතරහි එකකො අරඤ්ඤෙ විහරාමි. සන්ති ඛො පන අරඤ්ඤෙ[3] වාළා අමනුස්සා. තෙ මං ජීවිතා වොරොපෙය්‍යුං. තෙන මෙ අස්ස කාලකිරියා.[2] සො මමස්ස අන්තරායො. හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා"ති. ඉදං භික්ඛවෙ පඤ්චමං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අනාගතභයානි සම්පස්සමානෙන අලමෙව ආරඤ්ඤකෙන භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායාති.

## 5. 2. 3. 8.

## [දුතියඅනාගතභයසුත්තං]

[සාවත්ථිනිදානං]

28. පඤ්චිමානි භික්ඛවෙ අනාගතභයානි සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. කතමානි පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: "අහං ඛො එතරහි දහරො යුවා සුසු කාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා. හොති ඛො පන සො සමයො යං ඉමං කායං ජරා ඵුසති. ජිණ්ණෙන ඛො පන ජරාය අභිභූතෙන න සුකරං බුද්ධානං සාසනං මනසිකාතුං.

---

1 මානවෙහි - සකළවි  2 කාලංකිරියා - මජසං.  3. පනාරඤ්ඤෙ - මජසං.

තවද මහණෙනි, ආරණ්‍යක භික්‍ෂු මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කරයි: "මම මේ කල වනයෙහි එකලායෙම් වසමි. එකලායෙම් වෙනෙහි වසන්නෙම් කල සොරකම් ඇති හෝ නො කළ සොරකම් ඇති සොරුන් හා එකතු වෙමි. ඔහු මා දිවි ගළවන්නාහ. එයින් මාගේ කාලක්‍රියාව වෙයි. එ මට අන්තරාය වෙයි. එකාන්තයෙන් මම අප්‍රාප්තවිශෙෂයාගේ ප්‍රාප්තිය සඳහා, අනධිගතවිශෙෂයාගේ අධිගමය සඳහා, අසාක්‍ෂාත්කෘත-විශෙෂයාගේ සාක්‍ෂාත්කරණය සඳහා වැර අරඹමි"යි. මහණෙනි, මේ සතර වන අනාගතභය දක්නා ආරණ්‍යක මහණහු විසින් අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය සඳහා, අනධිගතයාගේ අධිගමය සඳහා, අසාක්‍ෂාත්කෘතයාගේ සාක්‍ෂාත්-කරණය සඳහා අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වසන්නට නිසිමැ යි.

තවද මහණෙනි, ආරණ්‍යක භික්‍ෂු මෙසේ නුවණින් මෙනෙහි කරයි: "මම මේ කල එකලායෙම් අරණෙහි වෙසෙමි. අරණ්හි කැකුළු යක්‍ෂ දි අමනුෂ්‍යයෝ ඇත්ම ය. ඔහු මා දිවියෙන් ගළවන්නාහ. ඉන් මාගේ කාලක්‍රියාව වෙයි. එ මට අන්තරාය වෙයි. එකාන්තයෙන් මම් අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස අසාක්‍ෂාත්කෘතයාගේ සාක්‍ෂාත්ක්‍රියාව පිණිස වැර අරඹමි"යි. මහණෙනි, මේ පස් වන අනාගතභය දක්නා ආරණ්‍යක මහණහු විසින් අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්‍ෂාත්කෘතයාගේ සාක්‍ෂාත් ක්‍රියාව පිණිස අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වසන්නට නිසි මැ යි.

මහණෙනි, මේ පඤ්ච අනාගතභය දක්නා ආරණ්‍යක භික්‍ෂුහු විසින් අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්‍ෂාත් කෘතයාගේ සාක්‍ෂාත්ක්‍රියා පිණිස අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාස කරන්නට නිසි මැ යි.

5. 2. 3. 8.

[ දුතියඅනාගතභයසුත්‍රය ]

[ සැවැත්නිදානයි: ]

28. මහණෙනි, මේ පඤ්ච අනාගතභයක් දක්නා මහණහු විසින් අප්‍රාප්තවිශෙෂයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතවිශෙෂයාගේ අධිගමය පිණිස, අසාක්‍ෂාත්කෘතවිශෙෂයාගේ සාක්‍ෂාත්කෘතිය පිණිස, වාස කරන්-නට නිසි මැ යි. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි: "මම මේ කල දහරයෙම් තුරුණුයෙම් මනා කළු කෙහෙ ඇතියෙම් සොඳුරුයොවුනෙන් සමන්‍වාගතයෙමි. යම් හෙයෙකින් මේ කය ජරාව පහස්නේ නම්, එ බඳු සමයෙක් ඇත් මැ යි. ජීර්ණ වූ ජරායෙන් මැඩුනහු විසින් බුදුරජුන්ගේ සස්න මෙනෙහි කරන්නට සුකර නො වේ මැ යි.

න සුකරානි අරඤ්ඤෙ[1] වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං පුරා මං සො ධම්මො ආගච්ඡති අනිට්ඨො අකන්තො අමනාපො. හන්දාහං පටිගච්චෙව[2] විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය-යෙනාහං ධම්මෙන සමන්නාගතො ජිණ්ණකො'පි ඵාසුං විහරිස්සාමී''ති. ඉදං භික්ඛවෙ පඨමං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

පුනච පරං භික්ඛවෙ භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛො එතරහි අප්පාබාධො අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය. හොති ඛො පන සො සමයො යං ඉමං කායං ව්‍යාධි ඵුසති. බ්‍යාධිතෙන ඛො පන බ්‍යාධාභිභූතෙන[3] න සුකරං බුද්ධානං සාසනං මනසිකාතුං. න සුකරානි අරඤ්ඤෙ[1] වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං. පුරා මං සො ධම්මො ආගච්ඡති අනිට්ඨො අකන්තො අමනාපො, හන්දාහං පටිගච්චෙව[2] විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය-යෙනාහං ධම්මෙන සමන්නාගතො බ්‍යාධිතොපි ඵාසුං[4] විහරිස්සාමී'ති. ඉදං භික්ඛවෙ දුතියං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

පුනච පරං භික්ඛවෙ භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: 'එතරහි ඛො සුභික්ඛං සුසස්සං සුලභපිණ්ඩා, සුකරං උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. හොති ඛො පන සො සමයො යං දුබ්භික්ඛං හොති දුස්සස්සං දුල්ලභපිණ්ඩං, න සුකරං උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. දුබ්භික්ඛෙ ඛො පන මනුස්සා යෙන සුභික්ඛං තෙන සඞ්කමන්ති තත්ථ සඞ්ගණිකවිහාරො හොති ආකිණ්ණවිහාරො. සඞ්ගණිකාවිහාරෙ ඛො පන සති ආකිණ්ණවිහාරෙ න සුකරං බුද්ධානං සාසනං මනසිකාතුං. න සුකරානි අරඤ්ඤෙ[1] වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං. පුරා මං සො ධම්මො ආගච්ඡති අනිට්ඨො අකන්තො අමනාපො හන්දාහං පටිගච්චෙව[2] විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය-යෙනාහං ධම්මෙන සමන්නාගතො දුබ්භික්ඛෙ'පි ඵාසුං විහරිස්සාමී'ති. ඉදං භික්ඛවෙ තතියං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

---

1. අරඤ්ඤ-මජසං. 2. පටිකච්චෙව - මජසං 3. බ්‍යාධිනා අභිභූතෙන - මජසං
4. ඵාසු - මජසං.

අරන් හා වානප්‍රස්ථ හා ප්‍රාන්තසෙනසුන් හා සෙවුනට සුකර නො වේ. ඒ අනිටු අකාන්ත අමනාප ධර්මය ඇසිල්ලකින් මා වෙත එයි. (එයට පෙරම-යම් තාක් එ නො එළඹේ ද ඒ තාක්) මම අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කෘතිය පිණිස වැර අරඹම් මැයි - යම් ධර්මයෙකින් සමන්‍ගාගත වූ මම් දිරුයෙම් නමුදු සැපසේ වෙසෙම් නම් එයින් යුක්ත වෙම්"යි. මහණෙනි, මේ ප්‍රථම අනාගතභය දක්නා මහණ විසින් අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාස කරන්නට තිසි ම ය.

තවද මහණෙනි, මහණ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: "දැන් මම් අල්පාබාධයෙම් අල්පාතඞ්කයෙම් නාතිශීත, නාත්‍යුෂ්ණ, මධ්‍යම, ප්‍රධන්වීයර්‍ය-යට ක්‍ෂම වන, සම ව පස්නා කර්මජතෙජොධාතුයෙන් සමන්‍ගාගතයෙම් වෙමි. යම් හෙයෙකින් මෙ කය ව්‍යාධිය පහස්නේ නම්, එ බඳු කාලෙක් ඇත් මැ යි-මා ව්‍යාධිත ව ව්‍යාධියෙන් මඩනාලදහු විසින් බුදුරජුන්ගේ සස්න කරනට සුකර නොවේ මැ යි. අරන් හා වානප්‍රස්ථ හා ප්‍රාන්ත සෙනසුන් හා සෙව්නට සුකර නො වේ. අනිෂ්ට අකාන්ත අමනාප ඒ ධර්මය මා කරා මතු එයි. (එයට පෙර) මම අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කෘතිය පිණිස, වැර අරඹම් මැ යි. යම් ධර්මයෙකින් සමන්‍ගාගත වූයෙම් ව්‍යාධියෙන් පෙළුනෙම් නමුදු පහසු සේ වෙසෙම් නම් එයින් යුක්ත වෙම්"යි. මහණෙනි, මේ දෙවන අනාගතභය දක්නා මහණහු විසින් අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාස කරන්නට තිසි මැ යි.

තවද මහණෙනි, මහණ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: "මෙ කල භික්ෂාසම්පන්න වෙයි, සමෘද්ධ ශස්‍ය වෙයි, සුලභ පිණ්ඩ වෙයි, භික්ෂාපාත්‍රය ගෙණ උඤ්ඡාචරියායෙන් යැපීමට සුකර වෙයි. යම් හෙයෙකින් දුර්භික්ෂ හා දුශ්ශස්‍ය හා දුර්ලභ පිණ්ඩ හා වේ නම්, භික්ෂාපාත්‍රය ගෙණ උඤ්ඡාචරියායෙන් යැපීමට සුකර නො වේ නම්, එ බඳු සමයෙක් වෙයි. දුර්භික්ෂයෙහි වනාහි මනුෂ්‍යයෝ සුභික්ෂස්ථාන කරා සඞ්ක්‍රමණ කෙරෙත්. එ තන්හි සඞ්ගණිකා-විහාරය ආකීර්ණවිහාරය (උතුන් හා මුසු විහරණ) වෙයි. ගණසඟ විහරණය මුසුවිහරණය ඇති වත් ම බුදුරජුන්ගේ සස්න මෙනෙහි කිරීමට සුකර නො වෙයි. අරන් හා වානප්‍රස්ථ හා ගැඹුරු වල් සෙනසුන් හා සෙව්මට සුකර නො වෙයි. අනිෂ්ට අකාන්ත අමනාප ඒ ධර්මය මා කරා වහා එයි. (එයට පෙර) මම අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස, වැර අරඹම් මැයි - යම් ධර්මයෙකින් සමන්‍ගාගතයෙම් දුර්භික්ෂයෙහිදු පහසු සේ වෙසෙම් නම්, එයින් යුක්ත වෙම්"යි. මහණෙනි, මේ තුන් වන අනාගතභය දක්නා මහණහු විසින් අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාස කරන්නට තිසි මැයි.

පුනච පරං භික්ඛවෙ භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: එතරහි ඛො මනුස්සා සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති. හොති ඛො පන සො සමයො යං භයං හොති අටවිසංකොපො. චක්කසමාරූළ්හා ජානපදා පරියායන්ති. භයෙ ඛො පන සති මනුස්සා යෙන ඛෙමං තෙන සඞ්කමන්ති. තත්ථ සඞ්ගණිකවිහාරො හොති ආකිණ්ණවිහාරො සඞ්ගණිකවිහාරෙ ඛො පන සති ආකිණ්ණ-විහාරෙ න සුකරං බුද්ධානං සාසනං මනසිකාතුං. න සුකරානි අරඤ්ඤ[1] වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං. පුරා මං සො ධම්මො ආගච්ඡති අනිට්ඨො අකන්තො අමනාපො, හන්දා'හං පටිගච්චෙව[2] විරියං ආරභාමි [අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස ආධිගමාය, අසච්ඡිකතස්ස*] සච්ඡිකිරියාය – යෙනා'හං ධම්මෙන සමන්නාගතො භයෙ'පි ඵාසුං විහරිස්සාමී''ති. ඉදං භික්ඛවෙ චතුත්ථං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං [අප්පත්තස්ස පත්තියා 'අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස*] සච්ඡිකිරියාය.

පුනච පරං භික්ඛවෙ භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: ''එතරහි ඛො සඞ්ඝො සමග්ගො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසුං[3] විහරති. හොති ඛො පන සො සමයො යං සඞ්ඝො භිජ්ජති. සඞ්ඝෙ ඛො පන භින්නෙ න සුකරං බුද්ධානං සාසනං මනසිකාතුං. න සුකරානි අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං. පුරා මං සො ධම්මො ආගච්ඡති අනිට්ඨො අකන්තො අමනාපො, හන්දා'හං පටිගච්චෙව[2] විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, යෙනා'හං ධම්මෙන සමන්නාගතො භින්නෙ'පි සඞ්ඝෙ ඵාසුං[3] විහරිස්සාමී''ති ඉදං භික්ඛවෙ පඤ්චමං අනාගතභයං සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අනාගතභයානි සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා අප්පමත්තෙන ආතාපිනා පහිතත්තෙන විහරිතුං අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති.

1. අරඤ්ඤ - මජසං. 2. පටිකච්චෙව - මජසං.
3. ඵාසු - මසජං. * පොත්ථකෙසු පෙය්‍යාලමුඛෙන සංඛිත්තං.

තවද මහණෙනි, මහණ මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි: "මෙ කල්හි මනුෂ්‍යයෝ සමඟ වූවාහු, එක්ව තුස්නාහු, විවාද නො කරන්නාහු, කිරි හා දිය මෙන් එක්වූවාහු, උනුන් පිය ඇසින් දක්නාහු වෙසෙත්. යම් හෙයෙකින් කාවපලාසොරබියෙක් (වලවැසි සොරුන් ගම් වැද කරණ විලොපයෙක්) වේ ද, රියසක් නැඟි දනව්වැස්සෝ ඔබමොබ (හිස් ලූලූ අත) පැන යෙද් ද, එබඳු සමයෙක් වේ මැයි. භය ඇති වත්ම මනුෂ්‍යයෝ ක්‍ෂෙමස්ථාන කරා සඞ්ක්‍රමණ කෙරෙත්. එ තන්හි සඞ්ගණිකා විහරණය වෙයි. ආකීර්ණවිහරණය වෙයි. සඞ්ගණිකවිහරණ හා ආකීර්ණ විහරණ හා ඇති වත් ම බුදුරජුන්ගේ සස්න මෙනෙහි කරන්නට සුකර නො වේ. අරන් හා වනප්‍රස්ථ හා ප්‍රාන්ත සෙනසුන් හා සෙව්නට සුකර නො වේ. එ අනිෂ්ට අකාන්ත අමනාප ධර්මය මා කරා වහා එයි. එයට පෙර මම අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්‍ෂාත්-කෘතයාගේ සාක්‍ෂාත්කරණය පිණිස වැර අරඹම් මැයි. මම යම් වීර්‍ය්‍ය ධර්මයෙකින් සමන්වාගත වූයෙම් භයෙහිදු පහසු සේ වෙසෙම් නම්, එයින් යුක්තවෙම්'යි. මහණෙනි, මේ සතර වන අනාගතභය දක්නා මහණහු විසින් අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්‍ෂාත්කෘතයාගේ සාක්‍ෂාත්කරණය පිණිස, අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාස කිරීමට නිසි මැ යි.

තවද මහණෙනි, මහණ මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි: "මෙ කල සඞ්ඝ තෙමේ සමඟ වූයේ, සම්මොදමාන වූයේ, විවාද නො කරන්නේ, එකුද්දෙස ඇතියේ පහසු සේ වෙසෙයි. යම් හෙයෙකින් සඞ්ඝ බිදේ නම් එ බඳු කලෙක් වෙයි. සඞ්ඝයා බුන් කල්හි බුදුරජුන්ගේ සසුන මෙනෙහි කරන්නට සුකර නො වේ. අරන් හා වනප්‍රස්ථ හා ප්‍රාන්ත සෙනසුන් හා සෙව්නට සුකර නො වේ. ඒ අනිෂ්ට අකාන්ත අමනාප ධර්මය මා කරා වහා එයි. එයට පෙර මම අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්‍ෂාත්කෘතයාගේ සාක්‍ෂාත්කරණය පිණිස වැර අරඹම් මැයි. මම යම් ධර්මයෙකින් සමන්වාගත වූයෙම් සඞ්ඝයා බුන ද පහසු සේ වෙසෙම් නම්, එයින් යුක්ත වෙම්"යි. මහණෙනි, මේ පස් වන අනාගතභය දක්නා මහණහු විසින් අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස,, අනධිගතයාගේ අධිගමය පිණිස, අසාක්‍ෂාත්කෘතයාගේ සාක්‍ෂාත්කරණය පිණිස අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාස කරන්නට නිසි මැයි.

මහණෙනි, මේ පඤ්ච අනාගතභය දක්නා මහණහු විසින් අප්‍රාප්ත-යාගේ ප්‍රාප්තිය පිණිස, අනධිතයාගේ අධිගමය පිණිස අසාක්‍ෂාත් කෘතයාගේ සාක්‍ෂාත් කරණය පිණිස අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාස කිරීමට නිසි මැයි.

## 5. 2. 3. 9.

[සාවත්ථිනිදානං]

### [තතියඅනාගතභයසුත්තං]

29. පඤ්චිමානි භික්ඛවෙ අනාගතභයානි එතරහි අසමුප්පන්නානි ආයතිං සමුප්පජ්ජිස්සන්ති, තානි වො පටිබුජ්ඣිතබ්බානි. පටිබුජ්ඣිත්වා ච තෙසං පහානාය වායමිතබ්බං. කතමානි පඤ්ච?

භවිස්සන්ති භික්ඛවෙ භික්ඛූ අනාගතමද්ධානං අභාවිතකායා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා. තෙ අභාවිතකායා සමානා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා අඤ්ඤෙ උපසම්පාදෙස්සන්ති. තෙ[1] න සක්ඛිස්සන්ති විනෙතුං අධිසීලෙ අධිචිත්තෙ අධිපඤ්ඤාය. තෙපි භවිස්සන්ති අභාවිතකායා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා. තෙ අභාවිතකායා සමානා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා අඤ්ඤෙ උපසම්පාදෙස්සන්ති. තෙපි න සක්ඛිස්සන්ති විනෙතුං අධිසීලෙ අධිචිත්තෙ අධිපඤ්ඤාය. තෙපි භවිස්සන්ති අභාවිතකායා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා. ඉති ඛො භික්ඛවෙ ධම්මසන්දොසා විනයසන්දොසො, විනයසන්දොසා ධම්මසන්දොසො. ඉදං භික්ඛවෙ පඨමං අනාගතභයං එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං. පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

පුනච පරං භික්ඛවෙ භවිස්සන්ති භික්ඛූ අනාගතමද්ධානං අභාවිතකායා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා. තෙ අභාවිතකායා සමානා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා අඤ්ඤෙසං නිස්සයං දස්සන්ති. තෙ න සක්ඛිස්සන්ති විනෙතුං අධිසීලෙ අධිචිත්තෙ අධිපඤ්ඤාය. තෙපි භවිස්සන්ති අභාවිතකායා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා. තෙ අභාවිතකායා සමානා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා අඤ්ඤෙසං නිස්සයං දස්සන්ති. තෙපි න සක්ඛිස්සන්ති විනෙතුං අධිසීලෙ අධිචිත්තෙ අධිපඤ්ඤාය. තෙපි භවිස්සන්ති අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා. ඉති ඛො භික්ඛවෙ ධම්මසන්දොසා විනයසන්දොසො, විනයසන්දොසා ධම්මසන්දොසො. ඉදං භික්ඛවෙ දුතියං අනාගතභයං එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං. පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

පුනච පරං භික්ඛවෙ භවිස්සන්ති භික්ඛූ අනාගතමද්ධානං අභාවිතකායා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා. තෙ අභාවිතකායා සමානා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා අභිධම්මකථං වෙදල්ලකථං කථෙන්තා කණ්හං ධම්මං[1] ඔක්කමමානා න පටිබුජ්ඣිස්සන්ති.[3] ඉති ඛො භික්ඛවෙ ධම්මසන්දොසා විනයසන්දොසො, විනයසන්දොසා ධම්මසන්දොසො. ඉදං භික්ඛවෙ තතියං අනාගතභයං එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං. පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

---

1. තෙපි - මජසං 2. කණ්හධම්මං - මජසං 3. නබුජ්ඣිස්සන්ති - මජසං

## 5. 2. 3. 9.

## [ තතියඅනාගතභය සූත්‍රය ]

[සැවැත්නිදන යි.]

29. මහණෙනි, මේ අනාගතභය පස් දෙනෙක් දැන් නූපන්නාහු මතුයෙහි උපදිති. ඔහු තොප විසින් දතයුතු වෙති. දැන ද ඔවුන්ගේ ප්‍රහාණය සඳහා වැර වැඩිය යුතු ය. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, අනාගතකාලයෙහි නො වැඩූ කය ඇති නො වැඩූ සිල් ඇති නො වැඩූ සිත් ඇති නො වැඩූ ප්‍රඥ ඇති භික්ෂූහු වෙති. නො වැඩූ කය ඇති නො වැඩූ සිල් ඇති නො වැඩූ සිත් ඇති නො වැඩූ ප්‍රඥ ඇති ඔහු අන්‍යයන් උපසපත් කෙරෙති. ඔහු අධිශීල යෙහි අධිචිත්තයෙහි අධිප්‍රඥයෙහි හික්මවීමට නො හැකි වෙති. ඔහුදු නො බැවූ කය ඇතියාහු නො බැවූ සිල් ඇතියාහු නො බැවූ සිත් ඇතියාහු නො බැවූ පැණ ඇතියාහු ම වෙති. අභාවිතකාය, අභාවිතශීල, අභාවිතචිත්ත, අභාවිතප්‍රඥ වූ ම ඔහු ද අනුන්, උපසපත් කරත්. ඔහුදු අධිශීලයෙහි අධිචිත්තයෙහි අධිප්‍රඥයෙහි හික්ම-වීමට නො හැකි වෙති. ඔහුදු අභාවිතකාය, අභාවිතසීල, අභාවිතචිත්ත, අභාවිතපඤ්ඤ වෙති. මහණෙනි, මෙසේ ධර්මසන්දූෂණයෙන් (ධර්මපරිහාණියෙන් ශමථවිදර්ශනා ධර්ම ගැබ්නොගැණීමෙන්) විනය සන්දූෂණ ය (විනය පරිහාණිය වෙයි. විනයසන්දූෂණයෙන්) ධර්මසන්දූෂණ වෙයි. මහණෙනි, දැන් නූපන් මේ ප්‍රථම අනාගතභය මතුයෙහි උපදනේ ය. එය තොප විසින් දතයුතු ය දැන ද එ ප්‍රහාණ කරණු පිණිස ව්‍යායාම කටයුතු.

තවද මහණෙනි, අනාගතකාලයෙහි මහණහු අභාවිතකාය, අභාවිතසීල අභාවිතචිත්ත, අභාවිතපඤ්ඤ වෙති. අභාවිතකාය, අභාවිතසීල, අභාවිත-චිත්ත, අභාවිතපඤ්ඤ වන ඔහු අන් මහණුනට නිස දෙත්. ඔහු අධිශීලයෙහි අධිචිත්තයෙහි අධිප්‍රඥයෙහි විනයනට නො හැකි වෙත්. ඔහුදු අභාවිතකාය, අභාවිතසීල, අභාවිතචිත්ත, අභාවිතපඤ්ඤ වෙත්. අභාවිතකාය, අභාවිතසීල අභාවිතචිත්ත, අභාවිතපඤ්ඤ වන ඔහු ද අන් මහණුනට නිස දෙත්. ඔහුදු අධිශීලයෙහි අධිචිත්තයෙහි අධිප්‍රඥයෙහි විනයනට නොහැකි වෙත්. ඔහුදු අභාවිතකාය, අභාවිතසීල, අභාවිතචිත්ත, අභාවිතපඤ්ඤ වෙති. මහණෙනි, මෙසේ ධර්මසන්දෝෂයෙන් විනයසන්දෝෂය වෙයි. විනය-සන්දෝෂයෙන් ධර්මසන්දෝෂය වෙයි. මහණෙනි, දැන් නූපන් මේ දෙවන අනාගතභය මතුයෙහි උපදනේ ය. එ තොප විසින් පිළිවිදිය යුතු. පිළිවිද ද එය ප්‍රහීණ කිරීමට ව්‍යායාම කටයුතු යි.

තවද මහණෙනි, අනාගතකාලයෙහි භික්ෂූහු අභාවිතකාය, අභාවිතසීල, අභාවිතචිත්ත, අභාවිතපඤ්ඤ වෙත්. ඔහු අභාවිතකාය, අභාවිතසීල, අභාවිතචිත්ත, අභාවිතපඤ්ඤ වන්නාහු ම අභිධර්මකථා හා ඥනප්‍රතිසංයුක්ත කථා කියන්නාහු කෘෂ්ණධර්මයට (උපාරම්භලාභසත්කාරපයෝෂණ වශයෙන් අකුශලයට) බැස ගන්නාහු නො පිළිවිදුනාහ. මහණෙනි, මෙසේ ධර්ම-සන්දෝෂයෙන් විනයසන්දෝෂය වෙයි. විනයසන්දෝෂයෙන් ධර්මසන්දෝෂය වෙයි. මහණෙනි, දැන් නූපන් මේ තුන් වන අනාගතභය මතුයෙහි උපදනේ ය. එය තොප විසින් පිළිවිදිය යුතු. පිළිවිද ද එය ප්‍රහීණ කිරීමට ව්‍යායාම කටයුතු.

පුනච පරං භික්ඛවෙ භවිස්සන්ති භික්ඛූ අනාගතමද්ධානං අභාවිතකායා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා. තෙ අභාවිතකායා සමානා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා යෙ තෙ සුත්තන්තා තථාගත-භාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතාපටිසංයුත්තා, තෙසු භඤ්ඤමානෙසු න සුස්සූසන්ති,[1] න සොතං ඔදහිස්සන්ති, න අඤ්ඤාචිත්තං උපට්ඨපෙස්සන්ති. න ච තෙ ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤිස්සන්ති. යෙ පන තෙ සුත්තන්තා කවිකතා[2] කාවෙය්‍යා චිත්තක්ඛරා චිත්තබ්‍යඤ්ජනා බාහිරකා සාවකභාසිතා, තෙසු භඤ්ඤමානෙසු සුස්සූසන්ති[3] සොතං ඔදහිස්සන්ති, අඤ්ඤාචිත්තං උපට්ඨපෙස්සන්ති. තෙ ච ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤිස්සන්ති. ඉති ඛො භික්ඛවෙ ධම්මසන්දොසා විනයසන්දොසො, විනයසන්දොසා ධම්මසන්දොසො. ඉදං භික්ඛවෙ චතුත්ථං අනාගතභයං එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං, පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

පුනච පරං භික්ඛවෙ භවිස්සන්ති භික්ඛූ අනාගතමද්ධානං අභාවිතකායා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා. තෙ අභාවිතකායා සමානා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා ථෙරා භික්ඛූ බාහුලිකා භවිස්සන්ති සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා. න විරියං ආරභිස්සන්ති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජිස්සති. සාපි භවිස්සති බාහුලිකා සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා න විරියං ආරභිස්සති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉති ඛො භික්ඛවෙ ධම්මසන්දොසා විනයසන්දොසො, විනයසන්දොසා ධම්මසන්දොසො. ඉදං භික්ඛවෙ පඤ්චමං අනාගතභයං එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අනාගතභයානි එතරහි අසමුප්පන්නානි ආයතිං සමුප්පජ්ජිස්සන්ති. තානි වො පටිබුජ්ඣිතබ්බානි. පටිබුජ්ඣිත්වා ච තෙසං පහානාය වායමිතබ්බන්ති.

## 5. 2. 3. 10.

## [චතුත්ථඅනාගතභය සුත්තං.]

[සාවත්ථිනිදානං:]

30. පඤ්චිමානි භික්ඛවෙ අනාගතභයානි එතරහි අසමුප්පන්නානි ආයතිං සමුප්පජ්ජිස්සන්ති. තානි වො පටිබුජ්ඣිතබ්බානි. පටිබුජ්ඣිත්වා ච තෙසං පහානාය වායමිතබ්බං. කතමානි පඤ්ච?

භවිස්සන්ති භික්ඛවෙ භික්ඛූ අනාගතමද්ධානං චීවරෙ කල්‍යාණකාමා. තෙ චීවරෙ කල්‍යාණකාමා සමානා රිඤ්චිස්සන්ති පංසුකූලිකත්තං. රිඤ්චිස්සන්ති අරඤ්ඤෙ[3] වනපත්ථානි පන්තානි සෙනාසනානි. ගාමනිගම-රාජධානීසු ඔසරිත්වා වාසං කප්පෙස්සන්ති. චීවරහෙතු ච අනෙකවිහිතං අනෙසනං අප්පතිරූපං ආපජ්ජිස්සන්ති. ඉදං භික්ඛවෙ පඨමං අනාගතභයං. එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං. පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

---

1. සුස්සූසිස්සන්ති - මජ්සං  2. කවිතා - මජ්සං  3. අරඤ්ඤෙ - මජ්සං.

තවද මහණෙනි, අනාගතකාලයෙහි භික්ෂූහු අභාවිතකාය, අභාවිතශීල, අභාවිතචිත්ත, අභාවිතප්‍රඥ වෙත්. අභාවිතකාය, අභාවිතශීල, අභාවිතචිත්ත, අභාවිතප්‍රඥ වන්නාහු ම ඔහු තථාගතභාෂිත වූ ගැඹුරු පෙළ ඇති, ගැඹුරු අරුත් ඇති, ලොකොත්තරධර්මදීපක, ශූන්‍යතාප්‍රතිසංයුක්ත, යම් ඒ සූත්‍රාන්තකෙනෙක් වෙත් නම්, ඔවුන් දෙසනු ලබන කල්හි ඇසුමට රුචි නො කෙරෙත්. කන් රැකොට නො ගණිත්. දැනුමට සිත් නො එළවත්. ඒ දහම් උගතයුතු කොට ප්‍රගුණ කටයුතු කොට නො සිතත්. කවීන් විසින් ගොතන ලද, කවියනට අයත්, විසිතුරු අකුරු ඇති, විසිතුරු වියඳුන් ඇති සස්නෙන් බැහැර ව ගියා වූ බැහැරිසව්වන් විසින් කියූ යම් සූත්‍රාන්තකෙනෙක් වෙත් නම්, ඔවුන් දෙසනු ලබන කල්හි ඇසුමට රුචි කෙරෙත් කන් රැකොට ගණිත්. දැනුමට සිත් එළවත්. ඒ දහම් ද උගතයුතු කොට ප්‍රගුණ කටයුතු කොට සිතත්. මහණෙනි, මෙසේ ධර්මසන්දොෂයෙන් විනයසන්දොෂය වෙයි. විනයසන්දොෂයෙන් ධර්මසන්දොෂය වෙයි. මහණෙනි, දැන් නූපන් මේ සතර වන අනාගතභය මතුයෙහි උපදනේ ය. එ තොප විසින් පිළිවිදිය යුතු. පිළිවිද ද එය ප්‍රහීණ කිරීමට වෑයම් කටයුතු.

තවද මහණෙනි, අනාගතකාලයෙහි භික්ෂූහු අභාවිතකාය, අභාවිතශීල, අභාවිතචිත්ත, අභාවිතප්‍රඥ වෙත්. අභාවිතකාය වන, අභාවිතශීල වන, අභාවිතචිත්ත වන, අභාවිතප්‍රඥ වන, එ ස්ථවිරභික්ෂූහු සිවුපස බහුල කොට ඇත්තාහු සස්න ලිහිල් කොට ගත්තාහු නීවරණ සඞ්ඛ්‍යාත අවක්‍රමණයෙහි පුරෝගාමී වන්නාහු ප්‍රකර්ෂවිවෙකයෙහි බහා තැබූ වීර්‍යධුර ඇත්තාහු අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස වැර නො අරඹන්නාහ. ඔවුන්ගේ පශ්චිමජනතාව දෘෂ්ටානුගතියට පැමිණෙයි. ඒ පශ්චිමජන ද සිවුපස බහුල කොට ඇත්තේ, සස්න ලිහිල් කොට ගත්තේ, අවක්‍රමණයෙහි පූර්වඞ්ගම වූයේ, ප්‍රවිවෙකයෙහි හළ වැර ධුර ඇතියේ අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස වැර නො අරඹන්නේ ය. මහණෙනි, මෙසේ වනාහි ධර්මසන්දොෂයෙන් විනයසන්දොෂය වේ. විනයසන්දොෂයෙන් ධර්මසන්දොෂය වෙයි. මහණෙනි, දැන් නූපන් මෙ පස් වන අනාගතභය මතුයෙහි උපදනේ ය. එ තොප විසින් පිළිවිදිය යුතු. පිළිවිද ද එ ප්‍රහීණ කිරීමට වෑයම් කටයුතු.

මහණෙනි, මෙ කල නූපන් මේ පඤ්ච අනාගතභය මතුයෙහි උපදනාහ. ඔහු තොප විසින් පිළිවිදිය යුතුහ. පිළිවිද ද ඔවුන් ප්‍රහීණ කිරීමට වෑයම් කටයුතු සි.

### 5. 2. 3. 10.

### [ චතුත්ථඅනාගතභය සූත්‍රය ]

[ සැවැත්නිදාන සි: ]

30. මහණෙනි, දැන් නූපන් මේ අනාගත භය පස් දෙනෙක් මතුයෙහි උපදනාහ. ඔහු තොප විසින් පිළිවිදිය යුතු වෙති. පිළිවිදත් ඔවුන් ප්‍රහීණ කිරීමට වෑයම් කටයුතු. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, අනාගතකාලයෙහි මහණහු සිවුරෙහි කල්‍යාණකාම වෙත්. චීවරයෙහි කල්‍යාණකාම වන ඔහු පාංශුකූලිකත්වය හැරපියත්. අරණ්‍යයත් ද වනප්‍රස්ථයත් ද ප්‍රාන්ත සෙනසුන් ද හැරපියත්. ගම් නියම්ගම් රජ දහන්හි වැද වාස කරත්. සිවුරු හෙතු කොට ද නන් වැදෑරුම් නොමනා අනෙෂණයට පැමිණෙත්. මහණෙනි, මෙ කල නූපන් මේ ප්‍රථම අනාගතභය මතුයෙහි උපදනේ ය. එ තොප විසින් පිළිවිදිය යුතු. පිළිවිද ද එය දුර ලීමට වෑයම් කටයුතු.

පුනච පරං භික්ඛවෙ භවිස්සන්ති භික්ඛූ අනාගතමද්ධානං පිණ්ඩපාතෙ කල්‍යාණකාමා. තෙ පිණ්ඩපාතෙ කල්‍යාණකාමා සමානා රිඤ්චිස්සන්ති පිණ්ඩපාතිකත්තං, රිඤ්චිස්සන්ති අරඤ්ඤ[1] වනපත්ථානි පන්තානි සෙනාසනානි. ගාමනිගමරාජධානීසු ඔසරිත්වා වාසං කප්පෙස්සන්ති ජිව්හග්ගෙන රසග්ගානි පරියෙසමානා, පිණ්ඩපාතහෙතුච්ච අනෙකවිහිතං අනෙසනං අප්පතිරූපං ආපජ්ජිස්සන්ති. ඉදං භික්ඛවෙ දුතියං අනාගතභයං එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං. පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

පුනච පරං භික්ඛවෙ භවිස්සන්ති භික්ඛූ අනාගතමද්ධානං සෙනාසනෙ කල්‍යාණකාමා. තෙ සෙනාසනෙ කල්‍යාණකාමා සමානා රිඤ්චිස්සන්ති රුක්ඛමූලිකත්තං. රිඤ්චිස්සන්ති අරඤ්ඤ[1] වනපත්ථානි පන්තානි සෙනාසනානි. ගාමනිගමරාජධානීසු ඔසරිත්වා වාසං කප්පෙස්සන්ති. සෙනාසනහෙතුච්ච[2] අනෙකවිහිතං අනෙසනං අප්පතිරූපං ආපජ්ජිස්සන්ති. ඉදං භික්ඛවෙ තතියං අනාගතභයං එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං. පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

පුනච පරං භික්ඛවෙ භවිස්සන්ති භික්ඛූ අනාගතමද්ධානං භික්ඛුනී-සික්ඛමානාසමණුද්දෙසෙහි සංසට්ඨා විහරිස්සන්ති භික්ඛුනීසික්ඛමානා සමණුද්දෙසෙහි සංසග්ගෙ ඛො පන භික්ඛවෙ සති එතං පාටිකඞ්ඛං "අනභිරතා වා බ්‍රහ්මචරියං චරිස්සන්ති, අඤ්ඤතරං වා සඞ්කිලිට්ඨං ආපත්තිං ආපජ්ජිස්සන්ති, සික්ඛං වා පච්චක්ඛාය හීනායාවත්තිස්සන්ති". ඉදං භික්ඛවෙ චතුත්ථං අනාගතභයං එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

පුනච පරං භික්ඛවෙ භවිස්සන්ති භික්ඛූ අනාගතමද්ධානං ආරාමික-සමණුද්දෙසෙහි සංසට්ඨා විහරිස්සන්ති. ආරාමිකසමණුද්දෙසෙහි සංසග්ගෙ ඛො පන භික්ඛවෙ සති එතං පාටිකඞ්ඛං: "අනෙකවිහිතං සන්නිධිකාර-පරිභොගං අනුයුත්තා විහරන්ති[3]. ඔළාරිකම්පි නිමිත්තං කරිස්සන්ති පඨවියාපි හරිතග්ගෙපි ඉදං භික්ඛවෙ පඤ්චමං අනාගතභයං එතරහි අසමුප්පන්නං ආයතිං සමුප්පජ්ජිස්සති. තං වො පටිබුජ්ඣිතබ්බං. පටිබුජ්ඣිත්වා ච තස්ස පහානාය වායමිතබ්බං.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අනාගතභයානි එතරහි අසමුප්පන්නානි ආයතිං සමුප්පජ්ජිස්සන්ති, තානි වො පටිබුජ්ඣිතබ්බානි, පටිබුජ්ඣිත්වා ච තෙසං පහානාය වායමිතබ්බන්ති.

**අනාගතභයවග්ගො තතියො**

**තස්සුද්දානං:**

දුවෙ ච චෙතොවිමුත්ති[4] ද්වෙ ච ධම්මවිහාරිනො
යොධාජිවා ච ද්වෙ වුත්තා චත්තාරො ච අනාගතා'ති

---

1. අරඤ්ඤ - මජසං. 2. සෙනාසන හෙතු ච - මජසං. 3 විහරිස්සන්ති - මජසං.
4. ද්වෙචෙතො විමුත්ති ඵලා ච - මජසං. * යොධාජීව වග්ගො - සීමු මජසං

තවද මහණෙනි, අනාගතයෙහි භික්ෂූහු පිණ්ඩපාතයෙහි කල්‍යාණකාම වෙති. පිණ්ඩපාතයෙහි කල්‍යාණකාම වන ඔහු පිඩු සිඟා යැපෙනසිල් ඇති බව හැර පියා වනයන් ද වානප්‍රස්ථ සෙනසුන් ද ගැඹුරු වල් ද හැර පියත්. ගම් නියම්ගම් රජදහන්හි වැද දිවගින් ප්‍රණීත රස සොයන්නාහු වාස කෙරෙත්. පිඩුවා හෙතුයෙනුදු නන් වැදෑරුම් නොනිසි අන්‍වෙෂණයට වැටෙත්. මහණෙනි, මෙ කල නූපන් මේ දෙවන අනාගතභය අනාගතයෙහි උපදනේ ය. එය තොප විසින් පිළිවිදිය යුතු. පිළිවිද ද එ දුර ලීමට වෑයම් කටයුතු.

තවද මහණෙනි, අනාගතයෙහි භික්ෂූහු සෙනසුන්හි කල්‍යාණකාම වෙති. සෙනසුන්හි කල්‍යාණකාම් වන ඔහු වෘක්ෂමූලිකත්වය හැරපියත් වනයත් ද වානප්‍රස්ථයත් ද ප්‍රාන්තසෙනසුන් ද හැරපියත්. ගම් නියම්ගම් රජදහන්හි වැද වාස කෙරෙත්. සෙනසුන් හෙතු කොට ද අකෙවිෂිත අප්‍රතිරූප අන්‍වෙෂණයට වැටෙත්. මහණෙනි, දැන් නූපන් මේ තුන් වන අනාගතභය මතු උපදනේය. එය තොප විසින් පිළිවිදිය යුතු පිළිවිද ද එය දුර ලීමට වෑයම් කටයුතු.

තවද මහණෙනි, අනාගතකාලයෙහි භික්ෂූහු භික්ෂුණීශික්ෂමානා ශ්‍රාමණෙරයන් හා සසට ව වෙසෙත්. මහණෙනි, භික්ෂුණීශික්ෂමානා ශ්‍රාමණෙරයන් හා සසඟ ඇති වත් ම අනභිරත වූවාහු හෝ බඹසර සෙරෙත්. අන්‍යතර වූ හෝ සකිලිට් ඇවතකට පැමිණෙත්. සිකපද හෝ ප්‍රත්‍යාඛ්‍යානය කොට හීනභාවයට වැටෙත්" යන තෙල කැමැති විය යුතු. මහණෙනි, මෙ කල නූපන් මේ සතර වන අනාගතභය මතු ඇති වෙයි. එය තොප විසින් පිළිවිදිය යුතු. පිළිවිද ද එ දුරලීමට ව්‍යායාම කටයුතු.

තවද මහණෙනි, අනාගතකාලයෙහි භික්ෂූහු ආරාමිකයන් හා ශ්‍රාමණෙරයන් හා සසට ව වසන්නාහ. ආරාමිකශ්‍රාමණෙරයන් හා සංසර්ගය ඇති වත් ම අනෙකවිහිත වූ සන්නිධිකාරපරිභොගයෙහි අනුයුක්ත ව වෙසෙති. පොළොව්හිදු (පෘථිවීබනනයෙහිදු) හරිතයෙහිදු (රුක්වැල් ඈ සිඳුම්හිදු) ඖදාරික නිමිති (හැඟවීම්) පාළ කරත්. මහණෙනි, මෙ කල නූපන් මේ පස් වන අනාගතභය මතුයෙහි උපදනේ ය. එය තොප විසින් පිළිවිදිය යුතු. පිළිවිද ද එ දුරලීමට ව්‍යායාම කටයුතු.

මහණෙනි, මේ කල්හි නූපන්නාවූ මේ පඤ්ච අනාගතභය මතුයෙහි පාළ වන්නාහ. ඔහු තොප විසින් පිළිවිදිය යුතුවහ. පිළිවිද ද ඔවුන් දුරලීමට ව්‍යායාම් කටයුතු ය යි.

**අනාගතභය වර්ගය තුන් වැනි යි.**

**එහි උද්දානය:**

චෙතො විමුත්ති සූත්‍ර දෙකෙක, ධම්මවිහාරී සූත්‍ර දෙකෙක, යොධාජීව සූත්‍ර ද දෙකෙක, අනාගතභය සූත්‍ර සතරෙකැයි දශයෙකි.

# 4. ථෙරවග්ගො

## 5. 2. 4. 1.

## [රජනීය සුත්තං]

[සාවත්ථිනිදානං:]

31. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච කතමෙහි පඤ්චහි?

රජනීයෙ රජ්ජති, දුස්සනීයෙ[1] දුස්සති, මොහනීයෙ[2] මුය්හති, කුප්පනීයෙ[3] කුප්පති, මදනීයෙ මජ්ජති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනියො චා'ති.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි?

රජනීයෙ න රජ්ජති, දුස්සනීයෙ[1] න දුස්සති, මොහනීයෙ[2] න මුය්හති, කුප්පනීයෙ[3] න කුප්පති, මදනීයෙ න මජ්ජති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චා'ති.

## 5. 2. 4. 2.

## [වීතරාග සුත්තං]

[සාවත්ථිනිදානං]

32. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච. කතමෙහි පඤ්චහි?

අවීතරාගො හොති, අවීතදොසො හොති, අවීතමොහො හොති, මක්ඛී ච, පළාසී ච. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි?

වීතරාගො හොති, වීතදොසො හොති, වීතමොහො හොති, අමක්ඛී ච, අපළාසී ච. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චාති.

1. දුසනීයෙ සිමු. 2. මුහනීයො, සිමු 3. කුපනීයෙ, සිමු.

# 4. ථෙරවග්ගය

## 5. 2. 4. 1.

## [ රජනීය සූත්‍රය ]

[සැවැත්නිදානයි:]

31. මහණෙනි, ධර්ම පසෙකින් සමන්වාගත තෙරමහණ සබ්‍රම්සරනට අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

රාගයට කරුණු වූ අරමුණෙහි රක්ත වෙයි. ද්වේෂයට කරුණු වූ අරමුණෙහි දුෂ්ට වෙයි. මොහයට කරුණු වූ අරමුණෙහි මූඪ වෙයි. කොපයට කරුණු වූ අරමුණෙහි කුපිත වෙයි. මදයට කරුණු වූ අරමුණෙහි මත්ත වෙයි. මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්වාගත ස්ථවිර මහණ අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි.

මහණෙනි, ධර්මපසෙකින් සමන්වාගත තෙර මහණ සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

රාගයට කරුණු වූ අරමුණෙහි නො ඇලෙයි. ද්වේෂයට කරුණු වූ අරමුණෙහි ද්වේෂ නො කරයි. මොහයට කරුණු වූ අරමුණෙහි මූළා නො වෙයි. කොපයට කරුණු වූ අරමුණෙහි නො කිපෙයි. මදයට කරුණු වූ අරමුණෙහි මත් නො වෙයි. මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්වාගත වූ ස්ථවිර මහණ සබ්‍රම්සරුන්හට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි.

## 5. 2. 4. 2.

## [ වීතරාග සූත්‍රය ]

[සැවැත්නිදානයි:]

32. මහණෙනි, ධර්ම පසෙකින් සමන්වාගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

අවීතරාග වෙයි. අවීතදෙස වෙයි. අවීතමොහ වෙයි. ගුණමකු ද වෙයි. (-යුගග්‍රාහ ලක්ෂණ) පළාස ඇති වෙයි. මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්වාගත ස්ථවිර මහණ සබ්‍රම්සරුනට අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි.

මහණෙනි, ධර්ම පසෙකින් සමන්වාගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

වීතරාග වෙයි. වීතදෙස වෙයි. වීතමොහ වෙයි. ගුණමකු නො වූයේ ද වෙයි. පළාස නැතියේ ද වෙයි. මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්වාගත ස්ථවිර මහණ ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි.

5. 2. 4. 3.

[ කුහක සුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

33. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච. කතමෙහි පඤ්චහි?

කුහකො ච හොති, ලපකො ච, නෙමිත්තිකො ච,[1] නිප්පෙසිකො ච, ලාභෙන ලාභං නිජිගිංසිතා[2] ච. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො චා'ති.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච, ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි?

න ච කුහකො හොති, න ච ලපකො, න ච නෙමිත්තිකො,[1] න ච නිප්පෙසිකො, න ච ලාභෙන ලාභං නිජිගිංසිතා.[2] ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චාති.

5. 2. 4. 4.

[ අස්සද්ධසුත්තං ]

[සාවත්ථිනිදානං:]

34. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච. කතමෙහි පඤ්චහි?

අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, කුසීතො හොති, දුප්පඤ්ඤො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච, අගරු ච අභාවනීයො චා'ති.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි?

සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, ආරද්ධවිරියො හොති, පඤ්ඤවා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චා'ති.

---

1. නිමිත්තිකො ච - සයා. 2. නිජිගීසිතා -මජසං.

5. 2. 4. 3.

[ කුහක සූත්‍රය ]

[සැවැත්නිදානයි:]

34. මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

(ත්‍රිවිධකුහනවස්තුයෙන් යුත්) කුහකයෙක් ද වෙයි. (ලාභනිඃශ්‍රිත-සමුල්ලපනායෙන්) ලපක (උසස් කොට බිණුම් ඈ විසින් බණනුයේ) ද වෙයි. (ප්‍රත්‍යය සඳහා කරණ කායවාග්විඥප්ති සඞ්ඛ්‍යාත) නිමිති ඇතියේ ද වෙයි. (ලාභසත්කාර සඳහා කරණ) නිෂ්පෙෂණකථා (නොහමියෙහි පරා ගුණ සුණු කරණ කථා) ඇතියේ ද වෙයි. ලාභයෙන් ලාභය සොයනුයේ ද වෙයි. මේ ධර්ම පසින් සමන්‍වාගත වූ ස්ථවිර මහණ සබ්‍රම්සරනට අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි.

මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

නො ද කුහක වෙයි. නො ද ලපක වෙයි. නො ද නෙමිත්තික වෙයි. නො ද නිප්පෙසික වෙයි. ලාභයෙන් ලාභ සොයනුයේ නො ද වෙයි. මහණෙනි, මේ ධර්ම පසින් සමන්‍වාගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වේ ය යි.

5. 2. 4. 4.

[ අශ්‍රද්ධ සූත්‍රය ]

[සැවැත්නිදාන යි ]

34. මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත ස්ථවිර භික්‍ෂු සබ්‍රම්සරනට අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

සැදැහැ නැතියේ වෙයි. ලජ්ජා නැතියේ වෙයි. අපත්‍රපා නැතියේ වෙයි. කුසීත වෙයි. දුෂ්ප්‍රාඥ වෙයි. මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි.

මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

සැදැහැතියේ වෙයි. ලජ්ජා ඇතියේ වෙයි. අපත්‍රපා ඇතියේ වෙයි. රුකුළුවැර ඇතියේ වෙයි. පැණැතියේ වෙයි. මහණෙනි, මේ පස් දහමින් සමන්‍වාගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි.

5. 2. 4. 5.

[ අක්ඛමසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

35. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච. කතමෙහි පඤ්චහි?

අක්ඛමො හොති රූපානං, අක්ඛමො සද්දානං, අක්ඛමො ගන්ධානං, අක්ඛමො රසානං, අක්ඛමො ඵොට්ඨබ්බානං. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො චා'ති.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි?

ඛමො හොති රූපානං, ඛමො සද්දානං, ඛමො ගන්ධානං, ඛමො රසානං, ඛමො ඵොට්ඨබ්බානං. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චා'ති.

5. 2. 4. 6.

[ පටිසම්භිදාසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

36. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි?

අත්ථපටිසම්භිදාපත්තො[1] හොති, ධම්මපටිසම්භිදාපත්තො හොති. නිරුත්තිපටිසම්භිදාපත්තො හොති, පටිභානපටිසම්භිදාපත්තො හොති. යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චා'ති.

1. අත්ථපටිසම්භිදප්පත්තො - මජසං.

### 5. 2. 4. 5.

### [ අක්ඛම සූත්‍රය ]

[ සැවැත්නිදන සි: ]

35. මහණෙනි, ධර්‍ම පසෙකින් සමන්‍විතගත ස්ථවිර භික්‍ෂු සබ්‍රම්සරනට අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

රූපාරම්මණයත් නො ඉවසනුයේ (එයින් අභිභූත) වෙයි. ශබ්දාරම්මණයත් නො ඉවසනුයේ වෙයි. ගන්‍ධාරම්මණයත් නො ඉවසනුයේ වෙයි. රසාරම්මණයත් නො ඉවසනුයේ වෙයි. ඵොට්ඨබ්බාරම්මණයත් නො ඉවසනුයේ වෙයි. මහණෙනි, මේ ධර්‍මපසින් සමන්‍විතගත ස්ථවිර භික්‍ෂු තෙමේ සබ්‍රම්සරනට අප්‍රිය ද අමනාප ද අගරු ද අභාවනීය ද වෙයි.

මහණෙනි, පඤ්චධර්‍මයෙකින් සමන්‍විතගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

රූපාරම්මණ ඉවසනුයේ (එයින් නො මැඩුනේ) වෙයි. ශබ්දාරම්මණ ඉවසනුයේ වෙයි. ගන්‍ධාරම්මණ ඉවසනුයේ වෙයි. රසාරම්මණ ඉවසනුයේ වෙයි. ඵොට්ඨබ්බාරම්මණ ඉවසනුයේ වෙයි. මහණෙනි, මේ පඤ්චධර්‍මයෙන් සමන්‍විතගත ස්ථවිර භික්‍ෂු සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි.

### 5. 2. 4. 6.

### [ පටිසම්භිදා සූත්‍රය ]

[සැවැත්නිදන සි:]

36. මහණෙනි, පඤ්චධර්‍මයෙකින් සමන්‍විතගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි. කවර පසෙකින යත්:

අර්ථප්‍රතිසම්භිදාවට පැමිණියේ වෙයි. ධර්‍මප්‍රතිසම්භිදාවට පැමිණියේ වෙයි. නිරුක්තිප්‍රතිසම්භිදාවට පැමිණියේ වෙයි. ප්‍රතිභානප්‍රතිසම්භිදාවට පැමිණියේ වෙයි. සබ්‍රම්සරුන්ගේ කුදුමහත් යම් ඒ ඉතිකර්තව්‍යයෝ (කුම් කෙරෙම් දැයි පිළිවිස කළයුතු කටයුතු) වෙත් නම්, එහි දක්‍ෂ වූයේ අනලස වූයේ ඒ ඒ කරුණෙහි උපායභූත විමංසාප්‍රඥයෙන් සමන්‍විතගත වූයේ (එය තමන්) කිරීමට සමර්ථ වූයේ ද සංවිධානයට (අනුන් ලවා කරවීමට) සමර්ථ වූයේ ද වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්‍මයෙන් සමන්‍විතගත ස්ථවිර මහණ සබ්‍රම්සරනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි.

## 5. 2. 4. 7.

## [ සීලසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

37. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි:

සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[1] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චා'ති.

## 5. 2. 4. 8.

## [ ථෙරසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

38. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු බහුජනාහිතාය[2] පටිපන්නො හොති, බහුජනාසුඛාය[3] බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. කතමෙහි පඤ්චහි:

ථෙරො හොති රත්තඤ්ඤූ චිරපබ්බජිතො. ඤාතො හොති යසස්සී ගහට්ඨපබ්බජිතානං[4] බහුජනපරිවාරො. ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[1] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා.[5] මිච්ඡාදිට්ඨිකො හොති විපරීතදස්සනො. සො බහුජනං සද්ධම්මා වුට්ඨාපෙත්වා අසද්ධම්මෙ පතිට්ඨාපෙති. ථෙරො භික්ඛු රත්තඤ්ඤූ චිරපබ්බජිතොතිපිස්ස[6] දිට්ඨානුගතිං ආපජ්ජන්ති. ඤාතො ථෙරො භික්ඛු යසස්සී ගහට්ඨපබ්බජිතානං.[2] බහුජනපරිවාරොතිපිස්ස[6] දිට්ඨානුගතිං ආපජ්ජන්ති. ලාභී ථෙරො භික්ඛු චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්තිපිස්ස[6] දිට්ඨානුගතිං ආපජ්ජන්ති. බහුස්සුතො ථෙරො භික්ඛු සුතධරො සුතසන්නිචයොතිපිස්ස[6] දිට්ඨානුගතිං ආපජ්ජන්ති.

---

1. ධාතා - මජසං. 2. බහුජන අහිතාය - මජසං. 3. බහුජන අසුඛාය - මජසං.
4. සගහට්ඨපබ්බජිතානං - මජසං. 5. අප්පටිවිද්ධා - මජසං. 6. ඉතිපිස්ස - මජසං.

## 5. 2. 4. 7.

## [ සීල සූත්‍රය ]

**[සැවැත්නිදාන යි.]**

37. මහණෙනි, ධර්මපසෙකින් සමන්‍විතගත ස්ථවිර මහණ සබ්‍රහමචාරීන්ට ප්‍රිය හා මනාප හා ගරු හා භාවනීය හා වෙයි. කවර පසෙකින යත්:

සිල්වත් වෙයි. ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූයේ ආචාරගොචර-සම්පන්න වූයේ අණුමාත්‍රවරදෙහි භය දක්නාසුලු වූයේ වාස කරයි. සමාදන් කොට ශෙණ සිකපෙදෙහි හික්මෙයි. බහුශ්‍රැත වූයේ ශ්‍රැතධර වූයේ සන්නිචිත ශ්‍රැත ඇතියේ වෙයි. යම් ඒ ධර්මකෙනෙක් ආදිකල්‍යාණ වූවාහු මධ්‍ය-කල්‍යාණ වූවාහු පර්‍යවසානකල්‍යාණ වූවාහු සාර්ථ වූවාහු සව්‍යඤ්ජන වූවාහු කෙවලපරිපූර්ණ පරිශුද්ධ බ්‍රහමචර්‍ය්‍ය ප්‍රකට කොට පවසත් නම්, එබඳු ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසන ලද්දාහු, ධරණ ලද්දාහු, වචනයෙන් පරිචිත වූවාහු, මනසින් අනුප්‍රෙක්ෂිත වූවාහු, ප්‍රඥයෙන් සුපිළි-විදියාහු වෙත්. කල්‍යණවදන් ඇතියේ කල්‍යාණවාක්කරණ ඇතියේ පිරිපුන් වූ අපළිබුද්ධ වූ නිදොස් වූ අර්ථය හඟුන්වන වචනයෙන් සමන්‍විතගත වූයේ වෙයි. අභිචිත්තයෙහි උපදනා දිට්ඨධර්මයෙහි සුඛවිහරණ වූ සතරධ්‍යානයන් රිසි සේ ලබනුයේ සුවසේ ලබනුයේ විපුල කොට ලබනුයේත් වෙයි. ආශ්‍රවක්ෂයයෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්ති හා ප්‍රඥ විමුක්ති දිට්ඨධර්මයෙහි ම තෙමේ විශිෂ්ටඥනයෙන් දැන සාක්ෂාත් කොට එයට එළඹ වෙසෙයි.

මහණෙනි, මේ ධර්මපසින් සමන්‍විතගත ස්ථවිර මහණ සබ්‍රහ්මචාරීනට ප්‍රිය හා මනාප හා ගරු හා භාවනීය හා වෙයි

## 5. 2. 4. 8.

## [ ථෙර සූත්‍රය ]

**[ සැවැත්නිදාන යි: ]**

38. මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍විතගත ස්ථවිර මහණ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට අසුබ පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙව් මිනිස්නට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නේ වෙයි. කවර පසෙකින යත්:

චිරරාත්‍රඥ, පැවිදි බොහෝ කල් ඇති, (වටාලා හුනුබවට නොවැටෙනු-යෙන් සස්නෙහි) ස්ථිරභාවයට පැමිණියේ වෙයි. ගිහි-පැවිද්දන් විසින් අභිඥත, යශස්වී, බහුජනපරිවාර ඇතියේ ද වෙයි. සිවුරුපිඬුවාසෙනසුන් බෙහෙසත් පිරිකර ලබන සුල්ලේ ද වෙයි. බොහෝ ඇසූ පිරූ තැන් ඇතියේ ශ්‍රැතධර වූයේ, සන්නිචිත ශ්‍රැත ඇතියේ, යම් ඒ ධර්මකෙනෙක් ආදිකල්‍යාණ, මධ්‍යකල්‍යාණ, පර්‍යවසානකල්‍යාණ වූවාහු, සාර්ථ වූවාහු, සව්‍යඤ්ජන වූවාහු කෙවල පරිපූර්ණ වූ පිරිසිදු බඹසර ප්‍රකට කොට කියත් නම්, එබඳු ධර්මයෝ ඔහු විසින් බොහෝ අසන ලද්දාහු, දරණ ලද්දාහු වචනයෙන් ප්‍රගුණ කරණ ලද්දාහු, සිතින් විමසන ලද්දාහු, ප්‍රඥයෙන් සුපිළිවිදියාහු වෙත්. විපරීත දර්ශන ඇතියේ මිථ්‍යාදෘෂ්ටිකා වෙයි. හේ බොහෝ දෙන සදහමින් නංවා අසද්ධර්මයෙහි පිහිටුවයි. 'මහණ චිරරාත්‍රඥ චිරප්‍රව්‍රජිත ස්ථිර පැවිදි නමෙකැ'යි ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත්. 'මහණ ගිහිපැවිද්දන් විසින් අභිඥත යශස්වී වූ බොහෝ දෙන පිරිවර කොට ඇති ස්ථවිර නමෙකැ'යි ඔහුගේ දෘෂ්ටානුගතියට යෙත්. 'තෙර මහණ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකර ලබන සුලුයේ ය'යි ද ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත්. 'බහුශ්‍රැත වූ ශ්‍රැතධර වූ ශ්‍රැතසන්නිචය ඇති ස්ථවිර මහණෙකැ'යි ද ඔහුගේ දෘෂ්ටානුගතියට යෙත්.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු බහුජනාහිතාය පටිපන්නො හොති බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානන්ති.[1]

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු බහුජනහිතාය පටිපන්නො හොති බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමෙහි පඤ්චහි:

ථෙරො හොති රත්තඤ්ඤු චිරපබ්බජිතො. ඤාතො හොති යසස්සී ගහට්ඨපබ්බජිතානං[2] බහුජනපරිවාරො. ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා[3] කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති, ධතා[4] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සම්මාදිට්ඨිකො හොති අවිපරීතදස්සනො.

සො බහුජනං අසද්ධම්මා වුට්ඨාපෙත්වා සද්ධම්මෙ පතිට්ඨාපෙති. ථෙරො භික්ඛු රත්තඤ්ඤු චිරපබ්බජිතොතිපිස්ස[5] දිට්ඨානුගතිං ආපජ්ජන්ති. ඤාතො ථෙරො භික්ඛු යසස්සී ගහට්ඨපබ්බජිතානං බහුජනපරිවාරොතිපිස්ස[5] දිට්ඨානුගතිං ආපජ්ජන්ති. ලාභී ථෙරො භික්ඛු -පෙ- බහුස්සුතො ථෙරො භික්ඛු සුතධරො සුතසන්නිචයොතිපිස්ස[5] දිට්ඨානුගතිං ආපජ්ජන්ති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු බහුජනහිතාය පටිපන්නො හොති බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

## 5. 2. 4. 9.

## [පඨමසෙඛසුත්තං]

[ සාවත්ථිනිදානං: ]

39. පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

කම්මාරාමතා, භස්සාරාමතා, නිද්දාරාමතා, සඞ්ගණිකාරාමතා, යථාවිමුත්තං චිත්තං න පච්චවෙක්ඛති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

න කම්මාරාමතා, න භස්සාරාමතා, න නිද්දාරාමතා, න සඞ්ගණිකාරාමතා, යථාවිමුත්තං චිත්තං පච්චවෙක්ඛති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති.

1. දෙවමනුස්සානං - මජ්සං. 2. සගහට්ඨපබ්බජිතානං - මජ්සං
3. සාත්ථං සබ්‍යඤ්ජනං - මජ්සං 4 ධාතා - මජ්සං. 5. ඉති පිස්ස - මජ්සං

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍විතගත ස්ථවිර මහණ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට අසුබ පිණිස බොහෝ දෙනාට අනර්‍ථ පිණිස දෙව් මිනිසුනට අහිත පිණිස දුක් පිණිස පළිපන්නේ වෙයි.

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍විතගත ස්ථවිර භික්‍ෂු තෙමේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝදෙනාට සුව පිණිස බොහෝ දෙනාට අර්‍ථ පිණිස දෙව් මිනිස්නට හිත පිණිස සුව පිණිස පිළිපන්නේ වෙයි. කවර ධර්මපසෙකින යත්:

චිරරාත්‍රඥ, චිරප්‍රව්‍රජිත ස්ථිර මහණෙක් වෙයි. ගිහි පැවිද්දන් විසින් අභිඥාත, යශස්වී, බොහෝ පිරිවර ඇත්තේ වෙයි. සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකර ලබන සුලුයේ ද වෙයි. බහුශ්‍රැත වූයේ ශ්‍රැතධරවූයේ ශ්‍රැතසන්නිචය ඇතියේ ද වෙයි. යම් ඒ ධර්ම කෙනෙක් ආදිකල්‍යාණ, මධ්‍යකල්‍යාණ, පර්‍යවසානකල්‍යාණ වූවාහු සාර්‍ථ වූවාහු සව්‍යඤ්ජන වූවාහු කෙවලපරිපූර්‍ණ පරිශුද්ධ බ්‍රහමචර්‍ය්‍යය ප්‍රකට කොට කියත් නම්, එ බඳු ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසන ලද්දාහු ධරණ ලද්දාහු වචනයෙන් ප්‍රගුණ කරණ ලද්දාහු ප්‍රඥයෙන් සුපිළිවිදියාහු වෙත්. අවිපරීත-දර්‍ශන ඇතියේ සම්‍යග්දෘෂ්ටික වෙයි.

හේ බොහෝදෙන අසද්ධර්මයෙන් නංවා සද්ධර්මයෙහි පිහිටුවයි. චිර රාත්‍රඥ, චිර ප්‍රව්‍රජිත ස්ථිර මහණැ'යි ඔහුගේ දෘෂ්ටානුගතියට ද පැමිණෙත්. 'ස්ථවිර මහණ ගිහි පැවිද්දන් විසින් ඥාත ය, යශස්වී ය, බහුජනපරිවාර ය'යි ද ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත්. 'ස්ථවිර මහණ ... ලාභී ය, 'ස්ථවිර මහණ බහුශ්‍රැත ය ශ්‍රැතධර ය ශ්‍රැතසන්නිචය ය'යි ද ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත්.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍විතගත ස්ථවිර මහණ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, බොහෝ දෙනාට අර්‍ථය පිණිස දෙවමනුෂ්‍යයනට හිත පිණිස සුව පිණිස පිළිපන්නේ වෙයි.

## 5. 2. 4. 9.

### [පඨමසෙඛ සූත්‍රය]

සැවැත්නිදාන යි: ]

39. මහණෙනි, මේ ධර්මයෝ පස්දෙනෙක් ශෛක්‍ෂ (සකරණීය) මහණහුගේ පරිහානිය පිණිස පවත්නාහ: කවර පස් දෙනෙක යත්:

නවකර්මයෙහි ඇලුම්ඇති බව ය, (සත්පුරුෂවර්‍ණනාදි විසින් වැටෙන ආලාපසංලාපසඞ්ඛ්‍යාත) භාෂණයෙහි ඇලුම් ඇති බව ය, නිදීමෙහි ඇලුම් ඇති බව ය, ගණසඞ්ගණිකායෙහි ඇලුම් ඇති බව ය, යථාවිමුක්තචිත්තය (පැහු දෙස්, ලැබූ ගුණ මේ යයි සලකා මතු ගුණ ලාභය පිණිස සිත මිදුනු පරිදි) ප්‍රත්‍යවෙක්‍ෂා නො කෙරෙයි. (යනු යි.) මහණෙනි, මේ පඤ්ච ධර්මයෝ ශෛක්‍ෂ මහණහුගේ පරිහානිය පිණිස පවත්නාහ.

මහණෙනි, මේ ධර්මයෝ පස් දෙනෙක් ශෛක්‍ෂ මහණහුගේ අපරිහානිය පිණිස පවත්නාහ. කවර පස් දෙනෙක යත්:

කම්මාරාමතා නො වෙයි, භස්සාරාමතා නො වෙයි, නිද්දාරාමතා නො වෙයි, සඞ්ගණිකාරාමතා නො වෙයි, යථාවිමුක්තචිත්තය ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි. මහණෙනි, මේ පඤ්චධර්මයෝ ශෛක්‍ෂ මහණහුගේ අපරිහානිය පිණිස පවත්නාහ.

## 5. 2. 4. 10.

## [දුතියසෙඛසුත්තං]

[සාවත්ථිනිදානං:]

40. පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ සෙඛො භික්ඛු බහුකිච්චො හොති බහුකරණීයො ව්‍යත්තො කිංකරණීයෙසු. රිඤ්චති පටිසල්ලානං. නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං භික්ඛවෙ පඨමො ධම්මො සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තති.

පුනච පරං භික්ඛවෙ සෙඛො භික්ඛු අප්පමත්තකෙන කම්මෙන දිවසං අතිනාමෙති. රිඤ්චති පටිසල්ලානං. නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං භික්ඛවෙ දුතියො ධම්මො සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තති.

පුනච පරං භික්ඛවෙ සෙඛො භික්ඛු සංසට්ඨො විහරති ගහට්ඨපබ්බජිතෙහි අනනුලොමිකෙන ගිහිසංසග්ගෙන. රිඤ්චති පටිසල්ලානං. නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං භික්ඛවෙ තතියො ධම්මො සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තති.

පුනච පරං භික්ඛවෙ සෙඛො භික්ඛු අතිකාලෙන[1] ගාමං පවිසති, අතිදිවා පටික්කමති. රිඤ්චති පටිසල්ලානං. නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං භික්ඛවෙ චතුත්ථො ධම්මො සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තති.

පුනච පරං භික්ඛවෙ සෙඛො භික්ඛු යායං කථා ආභිසල්ලෙඛිකා[2] චෙතොවිවරණසප්පායා - සෙය්‍යථීදං: අප්පිච්ඡකථා සන්තුට්ඨිකථා පවිවෙකකථා අසංසග්ගකථා විරියාරම්භකථා සීලකථා සමාධිකථා පඤ්ඤාකථා විමුත්තිකථා විමුත්තිඤාණදස්සනකථා, එවරූපාය[3] කථාය න නිකාමලාභී හොති කිච්ඡලාභී[4] කසිරලාභී.[5] රිඤ්චති පටිසල්ලානං. නානුයුඤ්ජති අජ්ඣත්තං චෙතො සමථං. අයං භික්ඛවෙ පඤ්චමො ධම්මො සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ සෙඛො භික්ඛු න බහුකිච්චො හොති න බහුකරණීයො වියත්තො කිං කරණීයෙසු. න රිඤ්චති පටිසල්ලානං. අනුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං භික්ඛවෙ පඨමො ධම්මො සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තති.

පුනච පරං භික්ඛවෙ සෙඛො භික්ඛු න අප්පමත්තකෙන කම්මෙන දිවසං අතිනාමෙති, න රිඤ්චති පටිසල්ලානං. අනුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං භික්ඛවෙ දුතියො ධම්මො සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තති.

---

1 අකාලෙන - මජසං. 2. අභිසල්ලෙඛිකා - ස්‍යා, සීමු. 3. එවරූපියා - මජසං, සීමු
4 න අකිච්ඡලාභී - මජසං. 5. න අකසිරලාභී - මජසං.

5. 2. 4. 10.

[ද්විතියසෙඛ සූත්‍රය]

[ සැවැත්නිදාන යි: ]

40. මහණෙනි, මේ ධර්මයෝ පස් දෙනෙක් ශෛක්‍ෂමහණහුගේ පරිහානිය පිණිස පවත්නාහ. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි ශෛක්‍ෂ මහණ බොහෝ කරණී ඇති, බොහෝ කිස ඇතියෙක් වෙයි. ඉතිකර්තව්‍යයෙහි ඡෙක වෙයි. පිළිසලන හැරපියයි. තමා තුළ සමාධිකමටහනෙහි නො යෙදෙයි. මහණෙනි, මේ පළමු දහම ශෛක්‍ෂ මහණහුගේ පරිහානිය පිණිස වැටෙයි.

වැලිදු මහණෙනි, ශෛක්‍ෂ මහණ අල්පමාත්‍රක කර්මයෙකින් දවස ගලවයි. පිළිසලන හැරපියයි. තමාතුළ සමාධිකමටහනෙහි නො යෙදෙයි. මහණෙනි, මේ දෙවන දහම ශෛක්‍ෂ මහණහුගේ පරිහානිය පිණිස වැටෙයි.

තවද මහණෙනි, ශෛක්‍ෂ මහණ ගිහිපැවිද්දන් සමඟ අනුලොම් නො වන ගිහිසසඟින් සසට ව වෙසෙයි. පිළිසලන හැරපියයි. අධ්‍යාත්ම චිත්තශමථයෙහි නො යෙදෙයි. මහණෙනි, මේ තෙවන ධර්මය ශෛක්‍ෂ මහණහුගේ පරිහානිය පිණිස වැටෙයි.

තවද මහණෙනි, ශෛක්‍ෂ මහණ ඉතා අලුයම ගම් වදනේ ය. මධ්‍යාහ්නය පත්වා පෙරළා එයි. පිළිසලන පියයි. අධ්‍යාත්මචිත්තශමථයෙහි නො යෙදෙයි. මහණෙනි, මේ සතර වන ධර්මය ශෛක්‍ෂ මහණහුගේ පරිහානිය පිණිස වැටෙයි.

තවද මහණෙනි, ශෛක්‍ෂ මහණ කෙලෙස් ලියා හරණ ශමථවිදර්ශනා සඞ්ඛ්‍යාත චිත්තවිවරණයට සත්ප්‍රාය වූ අප්පිච්ඡකථා ය, සන්තුට්ඨිකථා ය, පවිවෙකකථා ය. අසංසග්ගකථා ය, විරියාරම්භකථා ය. සීලකථා ය, සමාධිකථා ය, පඤ්ඤාකථා ය, විමුත්තිකථා ය, විමුත්තිඤාණදස්සනකථා ය යන යම් කථායෙක් වේ නම්, එ බඳු කථාව කැමැති සේ නො ලබන සුලුයේ කිච්ඡලාභී, කසිරලාභී වෙයි. පිළිසලන පියයි. අධ්‍යාත්මචිත්තශමථයෙහි නො යෙදෙයි. මහණෙනි, මේ පස් වන ධර්මය ශෛක්‍ෂභික්‍ෂුහුගේ පරිහානිය පිණිස පවත්නේ ය. මහණෙනි, මේ පඤ්චධර්මයෝ ශෛක්‍ෂභික්‍ෂුහුගේ පරිහානිය පිණිස වැටෙත්.

මහණෙනි, මේ ධර්මයෝ පස් දෙනෙක් ශෛක්‍ෂ භික්‍ෂුහුගේ අපරිහානිය සඳහා වැටෙත්. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි ශෛක්‍ෂ මහණ බොහෝ කිස ඇතියේ, බොහෝ කරණී ඇතියේ නො වෙයි. කිංකරණීයයෙහි ව්‍යක්ත වෙයි. පිළිසලන නො පියයි. අධ්‍යාත්මචිත්තශමථයෙහි යෙදෙයි. මහණෙනි, ශෛක්‍ෂ මහණහුගේ අපරිහානිය පිණිස මේ ප්‍රථමධර්මය වැටෙයි.

තවද මහණෙනි, ශෛක්‍ෂ මහණ අල්පමාත්‍රකර්මයෙකින් දවස නො ගලවයි. පිළිසලන නො පියයි. අධ්‍යාත්මචිත්තශමථයෙහි යෙදෙයි. මහණෙනි, මේ දෙවන ධර්මය ශෛක්‍ෂ මහණහුගේ අපරිහානිය සඳහා වැටෙයි.

පුනච පරං භික්ඛවෙ සෙඛො භික්ඛු අසංසට්ඨො විහරති ගහට්ඨ-පබ්බජිතෙහි අනනුලොමිකෙන ගිහිසංසග්ගෙන. න රිඤ්චති පටිසල්ලානං. අනුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං භික්ඛවෙ තතියො ධම්මො සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තති.

පුනච පරං භික්ඛවෙ සෙඛො භික්ඛු නාතිකාලෙන[2] ගාමං පවිසති, නාතිදිවා පටික්කමති. න රිඤ්චති පටිසල්ලානං. අනුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං භික්ඛවෙ චතුත්ථො ධම්මො සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තති.

පුනච පරං භික්ඛවෙ සෙඛො භික්ඛු යායං කථා ආභිසල්ලෙඛිකා[2] චෙතොවිවරණසප්පායා, සෙය්‍යථීදං: අප්පිච්ඡකථා සන්තුට්ඨිකථා පවිවෙක-කථා අසංසග්ගකථා විරියාරම්භකථා සීලකථා සමාධිකථා පඤ්ඤාකථා විමුත්තිකථා විමුත්තිඤාණදස්සනකථා, එවරූපාය[3] කථාය නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. න රිඤ්චති පටිසල්ලානං. අනුයුඤ්ජති අජ්ඣත්තං චෙතොසමථං. අයං භික්ඛවෙ පඤ්චමො ධම්මො සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති.

ථෙරවග්ගො චතුත්ථො.

**තස්සුද්දානං:**

රජනීයං වීතරාගා කුහකො' සද්ධඅක්ඛමා[4]
පටිසම්භිදා ච සීලෙන ථෙරො සෙඛා පරෙ දුවෙති.

1. න අතිකාලෙන - මජසං.
2 අභිසල්ලෙඛිකා - සයා, සීමු.
3. එවරූපියා - මජසං, සීමු.
4. රජනීයො වීතරාගො කුහකාසද්ධ අක්ඛමා-මජසං.

තවද මහණෙනි, ශෛක්‍ෂමහණ සස්නට අනුලෝම් නොවන ගිහි-සංසග්ගියෙන් ගිහිපැවිද්දන් සමඟ සසට ව නො වෙසෙයි. පිළිසලන නො පියයි. අධ්‍යාත්මචිත්තශමථයෙහි යෙදෙයි. මහණෙනි, මේ තෙවන ධර්මය ශෛක්‍ෂ මහණහුගේ අපරිහානිය සඳහා වැටෙයි.

තවද මහණෙනි, ශෛක්‍ෂ භික්‍ෂු තෙමේ ඉතා අළුයම ගම් නො වදනේ ය, දහවල පත්වා පෙරළා නො එයි. පිළිසලන නො පියයි. අධ්‍යාත්මචිත්ත ශමථයෙහි යෙදෙයි. මහණෙනි, මේ සතර වන ධර්මය ශෛක්‍ෂ මහණහුගේ අපරිහාණිය සඳහා පවත්නේ ය.

තවද මහණෙනි, ශෛක්‍ෂ භික්‍ෂු තෙමේ කෙලෙස් ලියා හරණා චිත්ත විවරණයට සතප්‍රාය වූ අප්පිච්ඡකථා ය, සන්තුට්ඨිකථා ය, පවිවෙකකථා ය, අසංසග්ගකථාය, විරියාරම්භකථාය, සීලකථාය, සමාධිකථාය, පඤ්ඤකථාය, විමුත්තිකථා ය, විමුත්තිඤාණදස්සනකථා ය යන යම් කථායෙක් වේ නම්, එ බඳු කථා කැමැති සේ ලබන සුලුයේ නිදුකින් ලබන සුලුයේ මහත් සේ ලබන සුලුයේ වෙයි. පිළිසලන නො පියයි. අධ්‍යාත්මචිත්තශමථයෙහි යෙදෙයි. මහණෙනි, මේ පස් වන ධර්මය ශෛක්‍ෂ භික්‍ෂුහුගේ අපරිහානිය සඳහා වැටෙයි.

මහණෙනි, මේ පඤ්ච ධර්මයෝ ශෛක්‍ෂ භික්‍ෂුහුගේ අපරිහානිය සඳහා වැටෙති යි.

**ථෙර වර්ගය සතර වැනියි.**

එහි **උද්දානය**:

රජනීය සූත්‍රය, වීතරාග සූත්‍රය, කුහකසූත්‍රය, අසද්ධ සූත්‍රය, අක්ඛම සූත්‍රය, පටිසම්භිදා සූත්‍රය, සීල සූත්‍රය, ථෙර සූත්‍රය, සෙඛ සූත්‍ර දෙක දැයි දශසූත්‍රයෙකි.

# 5. කකුධවග්ගො

5. 2. 5. 1.

## [පඨමසම්පදාසුත්තං]

**[සාවත්ථිනිදානං:]**

41. පඤ්චිමා භික්ඛවෙ සම්පදා. කතමා පඤ්ච?

සද්ධාසම්පදා සීලසම්පදා සුතසම්පදා චාගසම්පදා පඤ්ඤාසම්පදා. ඉමා ඛො භික්ඛවෙ පඤ්ච සම්පදාති.

5. 2. 5. 2.

## [දුතියසම්පදාසුත්තං]

**[සාවත්ථිනිදානං:]**

42. පඤ්චිමා භික්ඛවෙ සම්පදා. කතමා පඤ්ච?

සීලසම්පදා සමාධිසම්පදා පඤ්ඤාසම්පදා විමුත්තිසම්පදා. විමුත්තිඤාණදස්සනසම්පදා. ඉමා ඛො භික්ඛවෙ පඤ්ච සම්පදාති.

5. 2. 5. 3.

## [අඤ්ඤාබ්‍යාකරණසුත්තං]

**[සාවත්ථිනිදානං:]**

43. පඤ්චිමානි භික්ඛවෙ අඤ්ඤාබ්‍යාකරණානි.[1] කතමානි පඤ්ච?

මන්දත්තා මොමූහත්තා අඤ්ඤං බ්‍යාකරොති, පාපිච්ඡො ඉච්ඡාපකතො අඤ්ඤං බ්‍යාකරොති, උම්මාදා චිත්තවික්ඛෙපා අඤ්ඤං බ්‍යාකරොති, අධිමානෙන අඤ්ඤං බ්‍යාකරොති, සම්මදෙව අඤ්ඤං බ්‍යාකරොති. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අඤ්ඤාබ්‍යාකරණානීති.[2]

5. 2. 5. 4.

## [ඵාසුවිහාරසුත්තං]

**[සාවත්ථිනිදානං:]**

44. පඤ්චිමෙ භික්ඛවෙ ඵාසුවිහාරා. කතමෙ පඤ්ච?

ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං - තතියං ඣානං - චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ඵාසුවිහාරාති.

1. අඤ්ඤාබ්‍යාකරණානි - මජසං. සීමු. 2. අඤ්ඤාබ්‍යාකරණානීති - මජසං. සීමු.

# 5. කකුධ වර්ගය

### 5. 2. 5. 1.

### [පඨමසම්පදා සූත්‍රය]

[ සැවැත්නිදාන යි: ]

41. මහණෙනි, මේ සම්පදා පසෙකි. කවර පසෙක යත්: සද්ධාසම්පදා හා සීලසම්පදා හා සුතසම්පදා හා චාගසම්පදා හා පඤ්ඤාසම්පදා හා යි. මහණෙනි, මේ පඤ්චසම්පදා යි.

### 5. 2. 5. 2.

### [ දුතියසම්පදා සූත්‍රය ]

[ සැවැත්නිදාන යි: ]

42. මහණෙනි, මේ සම්පදා පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්: සීලසම්පදා හා සමාධිසම්පදා හා පඤ්ඤාසම්පදා හා විමුත්තිසම්පදා හා විමුත්තිඤාණදස්සනසම්පදා හා යි. මහණෙනි, මේ පඤ්චසම්පදා යි.

### 5. 2. 5. 3.

### [ අඤ්ඤබ්‍යාකරණ සූත්‍රය ]

[ සැවැත්නිදාන යි. ]

43. මහණෙනි, මේ අර්හත්ත්වව්‍යාකරණයෝ පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්: අඥානභාවයෙන් අතිමුඪභාවයෙන් අර්හත්වය පාළ කෙරෙයි. ලාමු ඉච්ඡා ඇතියේ ඉච්ඡායෙන් මැඩුනේ අර්හත්වය පාළ කෙරෙයි. උමතුයෙන් චිත්තක්ෂෙපයෙන් අර්හත්වය පාළ කරයි. අධිමානයෙන් අර්හත්වය පාළ කෙරෙයි. මනා (හෙතු) යෙන් ම අර්හත්වය පාළ කෙරෙයි. මහණෙනි, මෙ පස් දෙන අර්හත්ත්වව්‍යාකරණයෝ යි.

### 5 2 5. 4.

### [ ඵාසුවිහාර සූත්‍රය ]

[ සැවැත්නිදාන යි: ]

44. මහණෙනි, මේ ඵාසුවිහාරයෝ පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් ව ම අකුශලධර්මයෙන් වෙන් ව ම සවිතර්ක වූ සවිචාර වූ විවෙකයෙන් උපන්, ප්‍රීති හා සුඛ ඇති ප්‍රථමධ්‍යානයට එළඹ වාස කෙරෙයි. විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට එළඹ වාස කෙරෙයි. ආශ්‍රවයන්ගේ ක්‍ෂයයෙන් අනාශ්‍රව චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා ඉහාත්මයෙහි ම තමා විසින් විශිෂ්ටඥානයෙන් සාක්‍ෂාත් කොට එයට එළඹ වාස කෙරෙයි. මහණෙනි, මෙ පඤ්චඵාසු විහරණයෝ යි.

5. 2. 5. 5.

[ අකුප්පසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

45. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව අකුප්පං පටිවිජ්ඣති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අත්ථපටිසම්භිදප්පත්තො[1] හොති, ධම්මපටිසම්භිදප්පත්තො හොති, නිරුත්තිපටිසම්භිදප්පත්තො හොති, පටිභානපටිසම්භිදප්පත්තො හොති, යථා විමුත්තං චිත්තං පච්චවෙක්ඛති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව අකුප්පං පටිවිජ්ඣතීති.

5. 2. 5. 6.

[ දුතියඅකුප්පසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

46. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආනාපානසතිං ආසෙවන්තො න චිරස්සෙව අකුප්පං පටිවිජ්ඣති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අප්පට්ඨො හොති අප්පකිච්චො සුභරො සුසන්තොසො ජීවිතපරික්ඛාරෙසු. අප්පාහාරො හොති අනොදරිකත්තං අනුයුත්තො. අප්පමිද්ධො හොති ජාගරියං අනුයුත්තො. බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[2] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. යථාවිමුත්තං චිත්තං පච්චවෙක්ඛති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආනාපානසතිං ආසෙවන්තො න චිරස්සෙව අකුප්පං පටිවිජ්ඣතීති.

5. 2. 5. 7.

[ තතියඅකුප්පසුත්තං ]

[ සාවත්ථිනිදානං: ]

47. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආනාපානසතිං භාවෙන්තො න චිරස්සෙව අකුප්පං පටිවිජ්ඣති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අප්පට්ඨො හොති අප්පකිච්චො සුභරො සුසන්තොසො ජීවිතපරික්ඛාරෙසු. අප්පාහාරො හොති අනොදරිකත්තං අනුයුත්තො. අප්පමිද්ධො හොති ජාගරියං අනුයුත්තො. යායං කථා ආභිසල්ලෙඛිකා[3] චෙතොවිවරණසප්පායා - සෙය්‍යථීදං? අප්පිච්ඡකථා -පෙ- එවරූපාය[4] කථාය නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. යථාවිමුත්තං චිත්තං පච්චවෙක්ඛති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආනාපානසතිං භාවෙන්තො න චිරස්සෙව අකුප්පං පටිවිජ්ඣතී'ති.

---

1 පටිසම්භිදප්පත්තො - මජ්ඣං, (සබ්බත්ථ) 2 ධාතා - මජ්ඣං.
3. අභිසල්ලෙඛිකා - සත්‍යා සිමු. 4 එවරූපියා - මජ්ඣා - සිමු.

5. 2. 5. 5.

[අකුප්පසූත්‍රය]

[සැවැත්නිදානයි]

45. මහණෙනි, ධර්‍ම පසෙකින් සමන්‍වාගත වූ මහණ නොබෝ කලෙකින් මැ අර්‍හත්ත්‍වය පිළිවිදුනේ ය. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අර්‍ථප්‍රතිසම්භිදාඥානයට පැමිණියේ වෙයි. ධර්‍මප්‍රතිසම්භිදාඥානයට පැමිණියේ වෙයි. නිරුක්තිප්‍රතිසම්භිදාඥානයට පැමිණියේ වෙයි. ප්‍රතිභානප්‍රතිසම්භිදාඥානයට පැමිණියේ වෙයි. යථාවිමුක්තචිත්තය (සිත කෙලෙසුන්ගෙන් මිදුණු සැටිය) ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි.

මහණෙනි, මේ පඤ්චධර්‍මයෙන් සමන්‍වාගත මහණ නොබෝ කලෙකින් මැ අර්‍හත්ත්‍වය පිළිවිදුනේ ය.

5. 2. 5. 6.

[දෙවන අකුප්පසූත්‍රය]

[සැවැත්නිදානයි]

46. මහණෙනි, ධර්‍ම පසෙකින් සමන්‍වාගත මහණ ආනාපානසතිය සෙවුනේ නොබෝ කලෙකින් මැ අර්‍හත්ත්‍වය පිළිවිදුනේ ය. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අල්පකෘත්‍ය ඇතියේ සුභර (පොෂණයට පහසු) වූයේ ජීවිතපරිෂ්කාරයෙහි මනා සන්‍තොෂ ඇතියේ අල්පවූ ක්‍රියා සමාරම්භ ඇතියේ වෙයි. අනෞදරිකත්‍වයෙහි (අහරෙහි නොගිජු බැව්හි) යෙදුනේ අල්පාහාර වෙයි. ජාගර්‍ය්‍යායෙහි (නිදිවැරීමෙහි) යෙදුනේ අල්පමිද්ධ වෙයි. ශ්‍රැතධර වූයේ ශ්‍රැතසන්‍නිචය (රැස්කරගත් ශ්‍රැත) ඇතියේ බහුශ්‍රැත වෙයි. යම් ධර්‍ම කෙනෙක් ආදිකල්‍යාණ, මධ්‍යකල්‍යාණ, පර්‍ය්‍යවසානකල්‍යාණ වූවාහු, සාර්‍ථ සව්‍යඤ්ජන වූවාහු කෙවලපරිපූර්‍ණ පරිශුද්ධ ශාසන බ්‍රහ්මචර්‍ය්‍ය මැනැවින් කියත් ද, එබඳු ධර්‍මයෝ ඔහු විසින් බොහෝ අසන ලද්දාහු ධරණ ලද්දාහු වචනයෙන් ප්‍රගුණ කරණ ලද්දාහු සිතින් විමසන ලද්දාහු ප්‍රඥයෙන් පිළිවිදුනා ලද්දාහු වෙත්. යථාවිමුක්තචිත්තය ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි.

මහණෙනි, මෙ පඤ්චධර්‍මයෙන් සමන්‍වාගත මහණ ආනාපානසතිය ඇසුරු කරණුයේ නොබෝ කලෙකින් මැ අර්‍හත්ත්‍වය පිළිවිදුනේ යි.

5. 2. 5. 7.

[තෙවන අකුප්ප සූත්‍රය]

[සැවැත්නිදානයි]

47. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත මහණ ආනාපානසතිය වඩනුයේ නොබෝ කලෙකින් මැ අර්‍හත්ත්‍වය පිළිවිදුනේ ය. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අල්පකෘත්‍ය ඇතියේ සුභර වූයේ ජීවිතපරිෂ්කාරයෙහි මනා සන්‍තොෂ ඇතියේ අල්පසමාරම්භ වෙයි. අනෞදරිකත්‍වයෙහි යෙදුනේ අල්පාහාර වෙයි. ජාගර්‍ය්‍යායෙහි යෙදුනේ අල්පමිද්ධ වෙයි. කෙලෙස් ලියා ලන චිත්තවිවරණයට සත්ප්‍රාය වන අප්පිච්ඡකථා ... [සන්තුට්ඨිකථා, පවිවෙකථා, අසංසග්ගකථා, විරියාරම්භකථා, සීලකථා, සමාධිකථා, පඤ්ඤකථා, විමුත්තිකථා, විමුත්තිඤාණදස්සනකථා] යන යම් දස කථායෙක් වේ නම්, එබඳු කථා කැමැතියේ ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල කොට ලබනුයේ වෙයි. යථාවිමුක්තචිත්තය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ ය.

මහණෙනි, මෙ කරුණුපසින් සමන්‍වාගත මහණ ආනාපානසතිය වඩනුයේ නොබෝ කලෙකින් මැ අර්‍හත්ත්‍වය පිළිවිදුනේ යි.

5. 2. 5. 8.

[චතුත්ථ අකුප්පසුත්තං]

[සාවත්ථිනිදානං]

48. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආනාපානසතිං බහුලීකරොන්තො නචිරස්සෙව අකුප්පං පටිවිජ්ඣති. කතමෙහි පඤ්චහි?

ඉධ භික්ඛවෙ, භික්ඛු අප්පට්ඨො හොති අප්පකිච්චො සුභරො හොති සුසන්තොසො ජීවිතපරික්ඛාරෙසු. අප්පාහාරො හොති අනොදරිකත්තං අනුයුත්තො. අප්පමිද්ධො හොති ජාගරියං අනුයුත්තො. ආරඤ්ඤකො හොති. පන්තසෙනාසනො. යථාවිමුත්තචිත්තං පච්චවෙක්ඛති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආනාපාන-සතිං බහුලීකරොන්තො නචිරස්සෙව අකුප්පං පටිවිජ්ඣතීති.

5. 2. 5. 9.

[සීහසුත්තං]

[සාවත්ථිනිදානං]

49. සීහො භික්ඛවෙ, මිගරාජා සායන්හසමයං ආසයා නික්ඛමති. ආසයා නික්ඛමිත්වා විජම්භති. විජම්භිත්වා සමන්තා චතුද්දිසං අනුවිලොකෙති. සමන්තා චතුද්දිසං අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදති. තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමති.

සො හත්ථිස්ස චෙපි පහාරං දෙති, සක්කච්චඤ්ඤෙව පහාරං දෙති නො අසක්කච්චං. මහිසස්ස[1] චෙපි පහාරං දෙති, සක්කච්චඤ්ඤෙව පහාරං දෙති නො අසක්කච්චං. ගවස්ස චෙපි පහාරං දෙති, සක්කච්චඤ්ඤෙව පහාරං දෙති නො අසක්කච්චං. දීපිස්ස චෙපි පහාරං දෙති, සක්කච්චඤ්ඤෙව පහාරං දෙති නො අසක්කච්චං. ඛුද්දකානං චෙපි පාණානං පහාරං දෙති අන්තමසො සසබිළාරානම්පි, සක්කච්චඤ්ඤෙව පහාරං දෙති නො අසක්කච්චං. තං කිස්ස හෙතු? මා මෙ යොග්ගපථො නස්සාති.

සීහොති ඛො භික්ඛවෙ, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මා සම්බුද්ධස්ස. යං ඛො භික්ඛවෙ තථාගතො පරිසාය ධම්මං දෙසෙති, ඉදමස්ස හොති සීහනාදස්මිං.

භික්ඛූනං චෙපි භික්ඛවෙ තථාගතො ධම්මං දෙසෙති, සක්කච්චඤ්ඤෙව තථාගතො ධම්මං දෙසෙති නො අසක්කච්චං. භික්ඛුනීනං චෙපි භික්ඛවෙ තථාගතො ධම්මං දෙසෙති, සක්කච්චඤ්ඤෙව තථාගතො ධම්මං දෙසෙති නො අසක්කච්චං. උපාසකානං චෙපි භික්ඛවෙ තථාගතො ධම්මං දෙසෙති, සක්කච්චඤ්ඤෙව තථාගතො ධම්මං දෙසෙති නො අසක්කච්චං. උපාසිකානඤ්චෙපි භික්ඛවෙ තථාගතො ධම්මං දෙසෙති, සක්කච්චඤ්ඤෙව තථාගතො ධම්මං දෙසෙති නො අසක්කච්චං. පුථුජ්ජනානඤ්චෙපි භික්ඛවෙ තථාගතො ධම්මං දෙසෙති අන්තමසො අන්නභාරනෙසාදානම්පි, සක්කච්ච-ඤ්ඤෙව තථාගතො ධම්මං දෙසෙති නො අසක්කච්චං. තං කිස්ස හෙතු? ධම්මගරු භික්ඛවෙ තථාගතො ධම්මගාරවොති.

1. මහිංසස්ස - මජ්ඣසං.

**5. 2. 5. 8.**
**[සිවුවන අකුසල සූත්‍රය]**

**[සැවැත්නිදානයි]**

48. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත මහණ ආනාපානසතිය බහුල කරණුයේ අනීතනවය පිළිවිදිනේ ය. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අල්පකෘත්‍ය ඇතියේ සුභර වූයේ ජීවිත පරිෂ්කාරයෙහි මොනොවට සතුටු වූයේ අල්පසමාරම්භ ඇති වෙයි. අනෞදරිකත්වයෙහි යෙදුනේ අල්පාහාර වෙයි. ජාගර්‍යයෙහි යෙදුනේ අල්පමිද්ධ වෙයි. අරණෙහි වසන සුලුයේ ප්‍රාන්තශයනාසන ඇතියේ වෙයි. යථාවිමුක්තචිත්තය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ ආනාපානසතිය බහුල කොට වඩනුයේ නොබෝ කලෙකින් මැ අනීතනවය පිළිවිදුනේ යි.

**5. 2. 5. 9.**
**[සීහ සූත්‍රය]**

**[සැවැත්නිදානයි]**

49. මහණෙනි, මෘගරාජන් වූ සිංහ සවස් කාලයෙහි වාසස්ථානයෙන් නික්මෙයි. වාසස්ථානයෙන් නික්මැ වජඹනේ (කය පොළා වෙරගන්නේ) ය. වැජැඹැ හාත්පස සිවුදිගුන් අනුවිලොකනා කරන්නේ ය. වටා සිවුදිගුන් නහමා තුන්යලක් සිංහනාද කරන්නේ ය. තෙවිටක් සිංහනාද කොට ගොදුරු සඳහා නික්මැ යෙයි.

හේ ඇතක්හට හෝ පහර දේ නම්, සකසා මැ පහර දෙයි. නො සකසා පහර නො දෙයි. මීහිවකුහට හෝ පහර දේ නම්, සකසා මැ පහර දෙයි. නො සකසා පහර නොදෙයි. ගවයකුහට හෝ පහර දේ නම්, සකසා මැ පහර දෙයි. සකස් නො කොට පහර නො දෙයි. දිවියකුහට හෝ පහර දේ නම්, සකසා මැ පහර දෙයි. සකස් නො කොට පහර නො දෙයි. ක්‍ෂුද්‍රක ප්‍රාණීනට නමුදු පහර දේ නම්, සකසා මැ පහර දෙයි. සකස් නො කොට පහර නො දෙයි. යටත් පිරිසෙයින් සා බළලුනට හෝ පහර දේ නම්, සකසා මැ පහර දෙයි. නො සකසා පහර නො දෙයි. කවර හෙයින යත්: මාගේ යොග්‍යපථය (අභ්‍යාසමාර්ගය) නහමක් නසීවයි.

මහණෙනි, සිංහ යනු අභීත් සම්‍යක් සම්බුද්ධ තථාගතයනට නෙල නමෙකි. මහණෙනි, තථාගතයෝ පර්ෂද්හි දහම් දෙසති යන යමෙක් වේ නම්, මෙ ඔවුන්ගේ සිංහනාද වෙයි.

මහණෙනි, භික්‍ෂූනට ද ඉදින් තථාගතයෝ දහම් දෙසත් නම්, සකස් කොට වත් මුත් නො සකස් කොට දහම් නො දෙසන්නාහ. මහණෙනි, මෙහෙණනට ද ඉදින් තථාගතයෝ දහම් දෙසත් නම්, සකස් කොට වත් මුත් නො සකස් කොට දහම් නො දෙසන්නාහ. මහණෙනි, ඉදින් තථාගතයෝ උවසුවනට ද දහම් දෙසත් නම්, සකසා මැ වත් මුත් නො සකසා දහම් නො දෙසන්නාහ. මහණෙනි, ඉදින් උවැසියනට ද තථාගතයෝ දහම් දෙසත් නම්, සකසා මැ වත් මුත් නො සකසා දහම් නො දෙසන්නාහ. මහණෙනි, ඉදින් තථාගතයෝ පුහුදුනට ද යටත් පිරිසෙයින් අන්නහාර (තෘණහාරකයනට) හා ලිහිණිවැද්දනට ද දහම් දෙසත් නම්, සකසා මැ වත් මුත් නො සකසා දහම් නො දෙසන්නාහ. එ කවර හෙයින යත්: මහණෙනි, තථාගතයෝ ධර්මය ගුරු කොට ඇතියහ. ධර්ම ගෞරව ඇතියහ.

## 5. 2. 5. 10.

### [කකුධසුත්තං]

50. එවං මෙ සුතං: එකං සමයං භගවා **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ**. තෙන ඛො පන සමයෙන **කකුධො** නාම කොලියපුත්තො ආයස්මතො **මහාමොග්ගල්ලානස්ස** උපට්ඨාකො අධුනා කාලකතො අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො. තස්ස එවරූපො අත්තභාවපටිලාභො හොති: සෙය්‍යථාපි නාම ද්වෙ වා තීණි වා මාගධකානි ගාමක්ඛෙත්තානි. සො තෙන අත්තභාවපටිලාභෙන නෙවත්තානං නො පරං ව්‍යාබාධෙති.

අථ ඛො කකුධො දෙවපුත්තො යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො කකුධො දෙවපුත්තො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: **දෙවදත්තස්ස** භන්තෙ එවරූපං ඉච්ඡාගතං උප්පජ්ජි "අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමී"ති. සහචිත්තුප්පාදා ච භන්තෙ දෙවදත්තො තස්සා ඉද්ධියා පරිහීනො"ති. ඉදමවොච කකුධො දෙවපුත්තො. ඉදං වත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භගවන්තං එතදවොච:

"**කකුධො** නාම භන්තෙ, කොලියපුත්තො මමං උපට්ඨාකො අධුනා කාලකතො අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො. තස්ස එවරූපො අත්තභාව පටිලාභො හොති: සෙය්‍යථාපි නාම ද්වෙ වා තීණි වා මාගධකානි ගාමක්ඛෙත්තානි. සො තෙන අත්තභාවපටිලාභෙන නෙවත්තානං නො පරං ව්‍යාබාධෙති. අථ ඛො භන්තෙ කකුධො දෙවපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො භන්තෙ කකුධො දෙවපුත්තො මං එතදවොච: **දෙවදත්තස්ස** භන්තෙ, එවරූපං ඉච්ඡාගතං උප්පජ්ජි 'අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමි'ති. සහචිත්තුප්පාදා ච භන්තෙ දෙවදත්තො තස්සා ඉද්ධියා පරිහීනොති. ඉදමවොච භන්තෙ, කකුධො දෙවපුත්තො. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායී"ති.

කිං පන තෙ මොග්ගල්ලාන, කකුධො දෙවපුත්තො චෙතසා චෙතො පරිච්ච විදිතො, යං කිඤ්චි කකුධො දෙවපුත්තො භාසති, සබ්බං තං තථෙව හොති නො අඤ්ඤථාති?

"චෙතසා චෙතො පරිච්ච විදිතො මෙ භන්තෙ කකුධො දෙවපුත්තො. යං කිඤ්චි කකුධො දෙවපුත්තො භාසති, සබ්බං තං තථෙව හොති නො අඤ්ඤථා"ති. රක්ඛස්සෙතං මොග්ගල්ලාන වාචං.[1] ඉදානි සො මොඝපුරිසො අත්තනාව අත්තානං පාතුකරිස්සතීති.

---

1. රක්ඛස්සෙතං මොග්ගල්ලාන වාචං රක්ඛස්සෙතං මොග්ගල්ලාන වාචං - මජ්ඣං. විනයපිටකෙපි.

## 5. 2. 5. 10.

## [කකුධ සූත්‍රය]

50. මා විසින් මෙසේ අසන ලදි: **එක් කලෙක** භාග්‍යවතුන් වහන්සේ **කොසඹෑනුවර** සමීපයෙහි වූ **ඝොෂිතාරාමයෙහි** වැඩ වසන සේක. එකල ආයුෂ්මත් **මහාමෞද්ගල්‍යායන** තෙරණුවන්ගේ උපස්ථායක වූ **කකුධ** නම් කොලිය පුත්‍ර නොබෝ දිනෙකින් කලුරිය කෙළේ අන්‍යතර මනොමය - දෙවනිකායෙක්හි උපන්නේ වෙයි. ඔහුට මෙබඳු වූ ආත්මභාව (ශරීර) ප්‍රතිලාභයෙක් වෙයි. එනම්: මගධදෙශයට අයත් ග්‍රාමක්ෂෙත්‍ර දෙකෙක් හෝ තුණෙක් යම් පමණ වේ නම්, එ පමණ වූවෙකි. හේ එ ආත්මභාව- ප්‍රතිලාභයෙන් තමා වේවයි මෙරමා වේවයි නො මැ පෙළයි.

ඉක්බිති **කකුධ දෙවපුත්‍ර** ආයුෂමත් මහමුගලන් තෙරුන් කරා එළඹියේ ය. එළඹ ආයුෂමත් මහමුගලන් තෙරුන් සකසා වැඳ එකත්පසෙක සිටියේ ය. එකත් පසෙක සිටි කකුධදෙවපුත්‍ර ආයුෂමත් මහමුගලන් තෙරුන්හට තෙල කී ය: "වහන්ස, **දෙව්දතුනට** 'මම භික් සඟුන් පිළිදගුම්ව'යි යන මෙබඳු ඉච්ඡායෙක් උපන. වහන්ස, චිත්තොත්පාදය හා සමග මැ දෙවදත්ත එ ඉදුහයෙන් පිරිහිනැ" යි කකුධදෙවපුත්‍ර මෙය කී ය. මෙය කියා ආයුෂමත් මහමුගලන් තෙරුන් සකසා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් කෙළේ ය.

එකල ආයුෂමත් මහමුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂමත් මහමුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැළ කළහ:

"වහන්ස, මාගේ උපස්ථායක වූ **කකුධ** නම් කොලියපුත්‍ර නොබෝදා කලුරිය කෙළේ අන්‍යතර මනොමයකායයෙක්හි උපන. ඔහුගේ ආත්මභාව- ප්‍රතිලාභය මගධ දෙශීය ග්‍රාමක්ෂෙත්‍ර දෙකෙක් හෝ තුණෙක් යම් පමණ වේ නම්, එපමණ වූයේ වෙයි. හේ එ අත්බැවින් තමා හෝ මෙරමා නො මැ පෙළයි. වහන්ස, ඉක්බිති කකුධ දෙවපුත්‍ර මා කරා එළඹියේ ය. එළඹ මා සකසා වැඳ එකත්පස්ව සිටියේ ය. වහන්ස, එකත්පස්ව සිටි කකුධ- දෙවපුත්‍රයා මට තෙල කරුණ කී ය: වහන්ස, **දෙවදත්ත** හට 'මම භික්සඟුන් පරිහරණය කෙරෙමි' යන මෙබඳු ඉච්ඡායෙක් උපන. වහන්ස, චිත්තොත්පාදයාගේ උපත් හා සමග මැ දෙවදත්ත එ ඉදුහයෙන් පිරිහිනැ යි. වහන්ස, කකුධදෙවපුත්‍රයා මෙය කී ය. මෙය කියා මා සකසා වැඳ පැදකුණු කොට එහි මැ අතුරුදහන් කෙළේ" යයි.

මුගලන කිමෙක, තා විසින් කකුධදෙවපුත්‍රයා සියසිතින් ඔහු සිත පිරිසිඳ දන්නා ලද ද: 'යමක් කකුධ දෙවපුත්‍රයා කියා නම්' එ හැම අන් පරිද්දෙකින් නොව එපරිද්දෙන් මැ වේ ය' යි කියා යි.

වහන්ස, "කකුධ දෙවපුත්‍ර යමක් කියා නම්, එ හැම එපරිදි මැ වෙයි. අන්පරිදි නො වේ ය"යි ම විසින් මා සිතින් ඔහු සිත පිරිසිඳ කකුධ දෙවපුත්‍ර දන්නා ලද්දේ ය. මුගලන, තෙල බස රකුව. දැන් එ (දෙවදත්ත) මොඝපුරුෂයා තෙමේ මැ තමා පළ කරන්නේ ය යි.

පඤ්චිමෙ මොග්ගල්ලාන සත්ථාරො සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ පඤ්ච:

ඉධ මොග්ගල්ලාන, එකච්චො සත්ථා අපරිසුද්ධසීලො සමානො පරිසුද්ධසීලොම්හීති පටිජානාති, පරිසුද්ධං මෙ සීලං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. තමෙනං සාවකා එවං ජානන්ති "අයං ඛො භවං සත්ථා අපරිසුද්ධසීලො සමානො පරිසුද්ධසීලොම්හීති පටිජානාති, පරිසුද්ධං මෙ සීලං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. මයං චෙව ඛො පන ගිහීනං ආරොචෙය්‍යාම, නාස්සස්ස මනාපං. යං ඛො පනස්ස අමනාපං, කථන්නු[1] මයං තෙන සමුදාචරෙය්‍යාම. සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති තුමොව තෙන පඤ්ඤායිස්සතී"ති. එවරූපං ඛො පන මොග්ගල්ලාන, සත්ථාරං සාවකා සීලතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි සීලතො රක්ඛං පච්චාසිංසති. (1)

පුන ච පරං මොග්ගල්ලාන, ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධාජීවො සමානො පරිසුද්ධාජීවොම්හීති පටිජානාති, පරිසුද්ධො මෙ ආජීවො පරියොදාතො අසඞ්කිලිට්ඨොති. තමෙනං සාවකා එවං ජානන්ති "අයං ඛො භවං සත්ථා අපරිසුද්ධාජීවො සමානො පරිසුද්ධාජීවොම්හීති පටිජානාති, පරිසුද්ධො මෙ ආජීවො පරියොදාතො අසඞ්කිලිට්ඨොති. මයං චෙව ඛො පන ගිහීනං ආරොචෙය්‍යාම, නාස්සස්ස මනාපං. යං ඛො පනස්ස අමනාපං කථන්නු මයං තෙන සමුදාචරෙය්‍යාම. සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති තුමොව තෙන පඤ්ඤායිස්සතී"ති. එවරූපං ඛො මොග්ගල්ලාන සත්ථාරං සාවකා ආජීවතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි ආජීවතො රක්ඛං පච්චාසිංසති. (2)

පුන ච පරං මොග්ගල්ලාන, ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධධම්මදෙසනො සමානො පරිසුද්ධධම්මදෙසනොම්හීති පටිජානාති, පරිසුද්ධා මෙ ධම්මදෙසනා පරියොදාතා අසංකිලිට්ඨාති. තමෙනං සාවකා එවං ජානන්ති "අයං ඛො භවං සත්ථා අපරිසුද්ධධම්මදෙසනො සමානො පරිසුද්ධධම්මදෙසනොම්හීති පටිජානාති, පරිසුද්ධා මෙ ධම්මදෙසනා පරියොදාතා අසඞ්කිලිට්ඨාති. මයං චෙව ඛො පන ගිහීනං අරොචෙය්‍යාම, නාස්සස්ස මනාපං. යං ඛො පනස්ස අමනාපං, කථන්නු තං මයං තෙන සමුදාචරෙය්‍යාම. සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති, තුමොව තෙන පඤ්ඤායිස්සතී"ති. එවරූපං ඛො මොග්ගල්ලාන සත්ථාරං සාවකා ධම්මදෙසනතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි ධම්මදෙසනතො රක්ඛං පච්චාසිංසති (3)

පුන ච පරං මොග්ගල්ලාන, ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධවෙය්‍යාකරණො සමානො පරිසුද්ධවෙය්‍යාකරණොම්හීති පටිජානාති, පරිසුද්ධං මෙ වෙය්‍යාකරණං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. තමෙනං සාවකා එවං ජානන්ති "අයං ඛො භවං සත්ථා අපරිසුද්ධවෙය්‍යාකරණො සමානො පරිසුද්ධවෙය්‍යාකරණොම්හීති පටිජානාති, පරිසුද්ධං මෙ වෙය්‍යාකරණං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. මයං චෙව ඛො පන ගිහීනං ආරොචෙය්‍යාම,

1. කථං නං - මජසං.

මුගලන, ලොව්හි මේ ශාස්තෘහු පස් දෙනෙක් විද්‍යමාන වෙත්. කවර පස් දෙනක යත්:

මුගලන, මෙ ලොව්හි අන්‍යතර ශාස්තෘයෙක් නොපිරිසිදු සිල් ඇතියේ මැ "පිරිසිදු සිල් ඇතියෙමි, මාගේ ශීලය පරිශුද්ධ ය, පයර්‍යවදාත ය, අසංක්ලිෂ්ට ය"යි ප්‍රතිඥා කරයි. ශ්‍රාවකයෝ තෙල සථරහු මෙසේ හඳුනත්: "මෙ භවත් ශාස්තෘ තෙමේ අපරිශුද්ධ ශීල ඇතියේ මැ 'පරිශුද්ධ ශීලයෙමි, මාගේ ශීලය පරිශුද්ධ ය, පයර්‍යවදාත ය, නොකිලිටි ය'යි පිළින කරයි. අපිදු වනාහි එ බව් ගිහිනට සැළ කරමෝ නම්, ඔහට එ මනාප නොවන්නේ ය. යම් කිසිවක් ඔහට අමනාප වේ නම්, අපි කිසෙයින් නම් එය කියමෝ ද! සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරින් ලොකයා ඔහු සගන්නේ ම ය. තෙමේ යමක් කෙරේ ද, එයින් හේ තෙමේ මැ පළට වන්නේ ය"යි. මුගලන, ශ්‍රාවකයෝ මෙබඳු සථරහු ශීලයෙන් රක්නාහ. මෙබඳු ශාස්තෘ තෙමේ ශ්‍රාවකයන්ගෙන් ශීල හෙතුයෙන් ආරක්‍ෂාව පතන්නේ ය. (1)

තවද මුගලන, මෙලොව්හි ඇතැම් ශාස්තෘයෙක් නො පිරිසිදු ආජීව ඇතියේ මැ 'පිරිසිදු ආජීව ඇතියෙමි, මාගේ ආජීවය පරිශුද්ධ ය, පයර්‍යවදාත ය, නොකිලිටි ය'යි ප්‍රතිඥා කෙරෙයි. ශ්‍රාවකයෝ තෙල සථරහු මෙසේ හඳුනත්: "මෙ භවත් ශාස්තෘ තෙමේ අපරිශුද්ධ ආජීව ඇතියේ මැ 'පිරිසිදු ආජීව ඇතියෙමි, මාගේ ආජීවය පරිශුද්ධ ය, පයර්‍යවදාත ය, නොකිලිටි ය'යි පිළින කෙරෙයි. අපිදු එබව් ගිහියනට සැළ කරමෝ නම්, එය ඔහට මනාප නොවන්නේ ය. යමක් ඔහට අමනාප වේ නම්, කිසෙයින් අපි ඔහු එයින් කියමෝ ද! ලොකයා ඔහුට සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරින් බුහුමන් කෙරේ මැයි. තෙමේ යමක් කෙරේ නම්, හෙ තෙමේ මැ එයින් පළට වන්නේ ය"යි. මුගලන, ශ්‍රාවකයෝ මෙබඳු ශාස්තෘහු ආජීවයෙන් රක්නාහ. මෙබඳු ශාස්තෘ තෙමේත් ශ්‍රාවකයන්ගෙන් ආජීවහෙතුයෙන් ආරක්‍ෂාව පතයි. (2)

තවද මුගලන, මෙලොව්හි ඇතැම් ශාස්තෘයෙක් අපරිශුද්ධ ධර්‍මදෙශනා ඇතියේ මැ 'පරිශුද්ධධර්‍ම දෙශනා ඇතියෙමි, මාගේ ධර්‍මදෙශනාව පරිශුද්ධ ය, පයර්‍යවදාත ය, නොකිලිටි ය'යි පිළින කරයි. සව්වෝ තෙල සථරහු මෙසේ හඳුනත්: "මෙ භවත් ශාස්තෘ තෙමේ අපරිශුද්ධ ධර්‍මදෙශනා ඇතියේ මැ 'පරිශුද්ධධර්‍මදෙශනා ඇතියෙමි, මාගේ ධර්‍මදෙශනාව පරිශුද්ධ ය, පයර්‍යවදාත ය, අසංක්ලිෂ්ට ය'යි පිළින කරයි. අපිදු ගිහිනට මෙබව් සැළ කරමෝ නම්, එය ඔහට මනාප නොවන්නේ ය. යමක් ඔහට අමනාප වේ නම්, කිසෙයින් අපි ඔහු එයින් කියමෝ ද! ලොකයා ඔහට චීවරපිණ්ඩපාතශයනාසන-ගලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයෙන් බුහුමන් කෙරේ මැයි. යමක් තෙමේ කෙරේ නම්, එයින් හෙ තෙමේ මැ පළට වන්නේ ය"යි. මුගලන, ශ්‍රාවකයෝ මෙබඳු සථරහු ධර්‍මදේශනා හෙතුයෙන් රක්නාහ. මෙ බඳු ශාස්තෘ තෙමේත් ශ්‍රාවකයන් වෙතින් ධර්‍මදෙශනා හෙතුයෙන් රක්‍ෂා පතන්නේ ය. (3)

තවද මුගලන, මෙලොව්හි ඇතැම් ශාස්තෘයෙක් නොපිරිසිදු ව්‍යාකරණ (කථා) ඇත්තේ මැ 'පිරිසිදු ව්‍යාකරණ ඇතියෙම් වෙමි, මාගේ ව්‍යාකරණය පරිශුද්ධ ය, පයර්‍යවදාත ය, නො කිලිටි ය'යි පිළින කෙරෙයි. ශ්‍රාවකයෝ තෙල පුහුල්හු 'මෙ භවත් ශාස්තෘ තෙමේ නොපිරිසිදු ව්‍යාකරණ ඇතියේ මැ පිරිසිදු ව්‍යාකරණ ඇතියෙමි, මාගේ ව්‍යාකරණය පිරිසිදු ය, පයර්‍යවදාතය, නො කිලිටිය'යි පිළින කෙරෙයි. ඉදින් අපිදු මෙබව් ගිහිනට සැළ කරමෝ නම්,

නාස්සස්ස මනාපං. යං ඛො පනස්ස අමනාපං කථන්නු තං මයං තෙන සමුදාචරෙය්‍යාම. සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති, තුමොව තෙන පඤ්ඤායිස්සතී’’ති. එවරූපං ඛො මොග්ගල්ලාන සත්ථාරං සාවකා වෙය්‍යාකරණතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි වෙය්‍යාකරණතො රක්ඛං පච්චාසිංසති. (4)

පුන ච පරං මොග්ගල්ලාන, ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධඤාණදස්සනො සමානො පරිසුද්ධඤාණදස්සනොම්හීති පටිජානාති, පරිසුද්ධං මෙ ඤාණදස්සනං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. තමෙනං සාවකා එවං ජානන්ති: ‘‘අයං ඛො භවං සත්ථා අපරිසුද්ධඤාණදස්සනො සමානො පරිසුද්ධඤාණදස්සනොම්හීති පටිජානාති, පරිසුද්ධං මෙ ඤාණදස්සනං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. මයං චෙව ඛො පන ගිහීනං ආරොචෙය්‍යාම, නාස්සස්ස මනාපං. යං ඛො පනස්ස අමනාපං කථන්නු තං මයං තෙන සමුදාචරෙය්‍යාම. සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති, තුමොව තෙන පඤ්ඤායිස්සතී’’ති. එවරූපං ඛො පන මොග්ගල්ලාන, සත්ථාරං සාවකා ඤාණදස්සනතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි ඤාණදස්සනතො රක්ඛං පච්චාසිංසති. (5)

ඉමෙ ඛො මොග්ගල්ලාන, පඤ්ච සත්ථාරො සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

අහං ඛො පන මොග්ගල්ලාන, පරිසුද්ධසීලො සමානො පරිසුද්ධසීලොම්හීති පටිජානාමි, පරිසුද්ධං මෙ සීලං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. න ච මං සාවකා සීලතො රක්ඛන්ති. න චාහං සාවකෙහි සීලතො රක්ඛං පච්චාසිංසාමි.

පරිසුද්ධාජීවො සමානො පරිසුද්ධාජීවොම්හීති පටිජානාමි, පරිසුද්ධො මෙ ආජීවො පරියොදාතො අසඞ්කිලිට්ඨොති. න ච මං සාවකා ආජීවතො රක්ඛන්ති. න චාහං සාවකෙහි ආජීවතො රක්ඛං පච්චාසිංසාමි.

පරිසුද්ධධම්මදෙසනො සමානො පරිසුද්ධධම්මදෙසනොම්හීති පටිජානාමි, පරිසුද්ධා මෙ ධම්මදෙසනා පරියොදාතා අසඞ්කිලිට්ඨාති. න ච මං සාවකා ධම්මදෙසනතො රක්ඛන්ති. න චාහං සාවකෙහි ධම්මදෙසනතො රක්ඛං පච්චාසිංසාමි.

පරිසුද්ධවෙය්‍යාකරණො සමානො පරිසුද්ධවෙය්‍යාකරණොම්හීති පටිජානාමි, පරිසුද්ධං මෙ වෙය්‍යාකරණං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. න ච මං සාවකා වෙය්‍යාකරණතො රක්ඛන්ති. න චාහං සාවකෙහි වෙය්‍යාකරණතො රක්ඛං පච්චාසිංසාමි.

පරිසුද්ධඤාණදස්සනො සමානො පරිසුද්ධඤාණදස්සනොම්හීති පටිජානාමි, පරිසුද්ධං මෙ ඤාණදස්සනං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. න ච මං සාවකා ඤාණදස්සනතො රක්ඛන්ති. න චාහං සාවකෙහි ඤාණදස්සනතො රක්ඛං පච්චාසිංසාමීති.

**කකුධවග්ගො පඤ්චමො.**

**තස්සුද්දානං:**

ද්වෙ සම්පදා වියාකරණං ඵාසුකුප්පෙන පඤ්චමං[1]
සුතං කථා අරඤ්ඤෙන සීහො ච කකුධො[2] දසාති.

**දුතියං පණ්ණාසකං නිට්ඨිතං.**

---

1. ඵාසුඅකුප්පා පඤ්චමං - මජසං  2. සීහබුද්ධෙන දසාති - සීමු.

ඔහට මනාප නොවන්නේ ය. යමක් ඔහට අමනාප වේ නම්, කෙසේ නම් අපි ඔහු එයින් කියමෝ ද! සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරින් ලොකයා ඔහු සඟන්නේ ම ය. තෙමේ යමක් කෙරේ නම්, හෙ තෙමේ මැ එයින් පැණෙන්නේ ය''යි. මුගලන, මෙබඳු සථරහු සච්චෝ ව්‍යාකරණහෙතුයෙන් රක්නාහ. මෙබඳු ශාස්තෘ තෙමේ ශ්‍රාවකයන් වෙතින් ව්‍යාකරණ හෙතුයෙන් රක්‍ෂණය පතයි. (4)

තවද මුගලන, මෙලොව්හි, ඇතැම් ශාස්තෘයෙක් නොපිරිසිදු ඥානදර්‍ශන ඇතියේ මැ 'පිරිසිදු ඥානදර්‍ශන ඇතියෙමි, මාගේ ඥානදර්‍ශනය පරිශුද්ධය, පයර්‍ය්‍යාවදාත ය, නො කිලිටි ය'යි පිළිත කෙරෙයි. තෙල පුහුල්හු සච්චෝ මෙසේ හඳුනත්: ''මේ හවත් ශාස්තෘ තෙමේ අපරිශුද්ධ ඥානදර්‍ශන ඇතියේ මැ 'පරිශුද්ධ ඥානදර්‍ශන ඇතියෙමි, මාගේ ඥානදර්‍ශනය පරිශුද්ධ ය, පයර්‍ය්‍යාවදාත ය, නො කිලිටි ය'යි පිළිත කරන්නේ ය. අපිදු ගිහිනට මෙබව් සැළ කරමෝ නම්, ඔහට මනාප නොවන්නේ ය. යමක් ඔහට අමනාප වේ නම්, කෙසේ නම් අපි ඔහු එයින් කියමෝ ද! සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙසද් පිරිකරින් ලොකයා ඔහු සඟන්නේ ම ය. තෙමේ යමක් කෙරේ නම්, හේ තෙමේ මැ එයින් පළට වන්නේ ය''යි. මෞද්ගල්‍යායනය, මෙබඳු සථරහු ශ්‍රාවකයෝ ඥානදර්‍ශන හෙතුයෙන් රක්නාහ. මෙබඳු ශාස්තෘ තෙමේත් ශ්‍රාවකයන් වෙතින් ඥානදර්‍ශන හෙතුයෙන් රක්‍ෂණය පතයි. (5)

මෞද්ගල්‍යායනය, මේ ශාස්තෘහු පස් දෙන ලොව්හි විද්‍යමාන වෙත් මැයි.

මුගලන, මම පිරිසිදු සිල් ඇතියෙම් ම ''පිරිසිදු සිල් ඇතියෙම් වෙමි, මාගේ ශීලය පරිශුද්ධ ය, පයර්‍ය්‍යාවදාත ය, අසංක්ලිෂ්ට ය''යි පිළිත කෙරෙමි. සච්චෝ මා ශීලයෙන් නො රක්නාහ. මම ද සච්චන් වෙතින් ශීලහෙතුයෙන් රක්‍ෂණය නො පතමි.

පිරිසිදු ආජීව ඇතියෙම් මැ ''පරිශුද්ධාජීවයෙම් වෙමි, මාගේ ආජීවය පරිශුද්ධ ය, පයර්‍ය්‍යාවදාත ය, අසංකලිෂ්ට ය''යි පිළිත කරමි. සච්චෝ ද, මා ආජීවහෙතුයෙන් නො රක්නාහ. මම ද ශ්‍රාවකයන් වෙතින් ආජීවහෙතුයෙන් රක්‍ෂා නො පතමි.

පිරිසිදු ධර්‍මදෙශනා ඇතියෙම් මැ ''පරිශුද්ධධර්‍මදෙශනා ඇතියෙම් වෙමි, මාගේ ධර්‍මදෙශනා පරිශුද්ධ ය, පයර්‍ය්‍යාවදාතය, අසංකලිෂ්ට ය''යි පිළිත කරමි. ශ්‍රාවකයෝ මා ධර්‍මදෙශනා හෙතුයෙන් නො රක්නාහ. මම ද ශ්‍රාවකයන් වෙතින් ධර්‍මදෙශනා හෙතුයෙන් රක්‍ෂා නො පතමි.

පිරිසිදු, ව්‍යාකරණ ඇතියෙම් මැ ''පිරිසිදු ව්‍යාකරණ ඇතියෙම් වෙමි, මාගේ ව්‍යාකරණය පරිශුද්ධ ය, පයර්‍ය්‍යවදාත ය, අසංකලිෂ්ට ය''යි පිළිත කරමි. සච්චෝ ද මා ව්‍යාකරණහෙතුයෙන් නො රක්නාහ. මම ද සච්චන් වෙතින් ව්‍යාකරණහෙතුයෙන් රක්‍ෂා නො පතමි.

පරිශුද්ධඥානදර්‍ශන ඇතියෙම් මැ ''පරිශුද්ධඥානදර්‍ශන ඇතියෙම් වෙමි, මාගේ ඥානදර්‍ශනය පරිශුද්ධ ය, පර්‍ය්‍යාවදාත ය, අසකලිෂ්ට ය''යි පිළිත කරමි. ශ්‍රාවකයෝ මා ඥානදර්‍ශනහෙතුයෙන් නො රක්නාහ. මම ද ශ්‍රාවකයන් කෙරෙන් ඥානදර්‍ශනහෙතුයෙන් රක්‍ෂා නො පතමි යි.

**කකුධ වර්‍ගය පස්වැනි යි.**

**එහි උද්දානය:**

සම්පදා සූත්‍ර දෙකෙක, ව්‍යාකරණ සූත්‍රය, ඵාසුවිහාර සූත්‍රය, අකුප්ප සූත්‍රය, සුතධර (දෙවන අකුප්ප) සූත්‍රය, කථා (තෙවන අකුප්ප) සූත්‍රය, අරඤ්ඤක (සිවුවන අකුප්ප) සූත්‍රය, සිංහ සූත්‍රය, කකුධ සූත්‍රය දැයි සූත්‍රයෝ දශ දෙනෙක.

**ද්විතීය පණ්ණාසකය නිමියේ ය.**

# 3. තතියං පණ්ණාසකං

## 1. ඵාසුවිහාර වග්ගො

### 5. 3. 1. 1.

### [සෙඛවෙසාරජ්ජසුත්තං]

[සාවත්ථිනිදානං]

1. පඤ්චිමෙ භික්ඛවෙ සෙඛවෙසාරජ්ජකරණා ධම්මා. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධො හොති, සීලවා හොති, බහුස්සුතො හොති, ආරද්ධවිරියො හොති, පඤ්ඤවා හොති.

යං ඛො භික්ඛවෙ[1] අස්සද්ධස්ස සාරජ්ජං හොති, සද්ධස්ස තං සාරජ්ජං න හොති. තස්මායං ධම්මො සෙඛවෙසාරජ්ජකරණො.

යං භික්ඛවෙ දුස්සීලස්ස සාරජ්ජං හොති, සීලවතො තං සාරජ්ජං න හොති. තස්මායං ධම්මො සෙඛවෙසාරජ්ජකරණො.

යං භික්ඛවෙ අප්පස්සුතස්ස සාරජ්ජං හොති, බහුස්සුතස්ස තං සාරජ්ජං න හොති. තස්මායං ධම්මො සෙඛවෙසාරජ්ජකරණො.

යං භික්ඛවෙ කුසීතස්ස සාරජ්ජං හොති, ආරද්ධවිරියස්ස තං සාරජ්ජං න හොති. තස්මායං ධම්මො සෙඛවෙසාරජ්ජකරණො.

යං භික්ඛවෙ දුප්පඤ්ඤස්ස සාරජ්ජං හොති, පඤ්ඤවතො තං සාරජ්ජං න හොති. තස්මායං ධම්මො සෙඛවෙසාරජ්ජකරණො.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච සෙඛවෙසාරජ්ජකරණා ධම්මාති.

### 5. 3. 1. 2.

### [සඞ්කිතසුත්තං]

[සාවත්ථිනිදානං]

2. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු උස්සඞ්කිත-පරිසඞ්කිතො හොති, පාපභික්ඛූති අපි අකුප්පධම්මො. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු වෙසියගොචරො[2] වා හොති, විධවගොචරො වා හොති, ථුල්ලකුමාරිගොචරො[3] වා හොති, පණ්ඩකගොචරො වා හොති, භික්ඛුනී ගොචරො වා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු උස්සඞ්කිත පරිසඞ්කිතො හොති පාපභික්ඛූති අපි අකුප්පධම්මොති.[4]

---

1. යං භික්ඛවෙ - මජසං. 2. වෙසියාගොචරො - මජසං 3. ථුල්ලකුමාරිකා - මජසං.
4. අකුප්පධම්මොපි - මජසං

# 3. තෙවැනි පණ්ණාසකය

## 1. ඵාසු විහාර වග්ගය

### 5. 3. 1. 1.

### [සෙඛවෙසාරජ්ජ සූත්‍රය]

[සැවැත්නිදානයි]

1. මහණෙනි, ශෛක්ෂයාගේ වෙසරද බව කරණ මේ ධර්ම පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රද්ධා ඇතියේ වෙයි, සිල් ඇතියේ වෙයි, බහුශ්‍රැත වෙයි, රැකුළු වැර ඇතියේ වෙයි, පැණැතියේ වේ.

මහණෙනි, ශ්‍රද්ධා නැතියහට යම් ශාරද්‍යයෙක් (දෞර්මනසෙක්) වේ නම්, ශ්‍රද්ධා ඇතියහුට ඒ ශාරද්‍යය නො වෙයි. එහෙයින් මෙ දහම සෙඛවෙසාරජ්ජ-කරණ යි. (ශෛක්ෂපුද්ගලයාගේ විශාරදභාවය කරන්නේ වේ.)

මහණෙනි, දුසිල්හට යම් ශාරද්‍යයෙක් වේ නම්, සිල්වත්හට ඒ ශාරද්‍යය නො වෙයි. එහෙයින් මෙ දහම සෙඛවෙසාරජ්ජකරණ යි.

මහණෙනි, අල්පශ්‍රැතයාහට යම් ශාරද්‍යයෙක් වේ නම්, බහුශ්‍රැතයාහට ඒ ශාරද්‍යය නො වෙයි. එහෙයින් මෙ ධර්මය සෙඛවෙසාරජ්ජකරණ යි.

මහණෙනි, කුසීතයාහට යම් ශාරද්‍යයෙක් වේ නම්, රැකුළුවැර ඇතියහුට ඒ ශාරද්‍යය නො වෙයි. එහෙයින් මේ ධර්මය සෙඛවේසාරජ්ජකරණ යි.

මහණෙනි, දුෂ්ප්‍රාඥයාහට යම් ශාරද්‍යයෙක් වේ නම්, ප්‍රඥවත්හට ඒ ශාරද්‍යය නො වෙයි. එහෙයින් මෙ දහම සෙඛවෙසරජ්ජකරණ යි.

මහණෙනි, මෙ දහම් පස සෙඛවෙසාරජ්ජකරණ යි.

### 5. 3. 1. 2

### [සඞ්කිත සූත්‍රය]

[සැවැත්නිදානයි]

2. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත මහණ අකොප්‍යධර්ම ඇති ක්ෂීණාස්‍රව වූයේ නමුදු පාපභික්ෂුයැයි මතුමතුයෙහි සැක කරණ ලදුයේ හැම සෙයින් සැක කරණ ලදුයේ වෙයි. කවර පසෙකිනයත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ගණිකාව ගොචර (එළැඹිය යුතු තැන්) කොට ඇතියේ හෝ වෙයි, වැන්දඹුව ගොචර කොට ඇතියේ හෝ වෙයි, ථුල්ලකුමාරි (විවාහයට නොගිය මහලු කුමරිය) ගොචර කොට ඇතියේ හෝ වෙයි, පණ්ඩක (නපුංසක) ගොචර කොට ඇතියේ හෝ වෙයි, මෙහෙණ ගොචර කොට ඇතියේ හෝ වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්වාගත මහණ අකොප්‍යධර්ම ඇතියේ නමුදු පාපභික්ෂු යයි මෙරමා විසින් මතු මතුයෙහි සැක කරණ ලදුයේ හැමසෙයින් සැක කරණ ලදුයේ වේ යයි.

5. 3. 1. 3.

## [මහාචොරසුත්තං]

[සංවණ්ණනිදානං]

3. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො මහාචොරො සන්ධිම්පි ඡින්දති. නිල්ලොපම්පි හරති. එකාගාරිකම්පි කරොති. පරිපන්ථෙපි තිට්ඨති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ මහාචොරො විසමනිස්සිතො ච හොති ගහනනිස්සිතො ච බලවනිස්සිතො ච භොගචාගී ච එකචාරී ච.

කථඤ්ච භික්ඛවෙ, මහාචොරො විසමනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ මහාචොරො නදීවිදුග්ගං වා නිස්සිතො හොති පබ්බතවිසමං වා. එවං ඛො භික්ඛවෙ මහාචොරො විසමනිස්සිතො හොති.

කථඤ්ච භික්ඛවෙ, මහාචොරො ගහනනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ මහාචොරො තිණගහනං වා නිස්සිතො හොති රුක්ඛගහනං වා ගෙධං[1] වා පන වනසණ්ඩං. එවං ඛො භික්ඛවෙ මහාචොරො ගහනනිස්සිතො හොති.

කථඤ්ච භික්ඛවෙ, මහාචොරො බලවනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ මහාචොරො රාජානං වා රාජමහාමත්තං වා නිස්සිතො හොති. තස්ස එවං හොති: සචෙ මං කොචි කිඤ්චි වක්ඛති, ඉමෙ මෙ රාජානො වා රාජමහාමත්තා වා පරියොධාය අත්ථං භණිස්සන්තීති. සචෙ නං කොචි කිඤ්චි ආහ, ත්‍යාස්ස රාජානො වා රාජමහාමත්තා වා පරියොධාය අත්ථං භණන්ති. එවං ඛො භික්ඛවෙ මහාචොරො බලවනිස්සිතො හොති.

කථඤ්ච භික්ඛවෙ, මහාචොරො භොගචාගී හොති: ඉධ භික්ඛවෙ මහාචොරො අඩ්ඪො හොති මහද්ධනො මහාභොගො. තස්ස එවං හොති: සචෙ මං කොචි කිඤ්චි වක්ඛති, ඉතො භොගෙන පටිසන්ථරිස්සාමීති. සචෙ නං කොචි කිඤ්චි ආහ, තතො භොගෙන පටිසන්ථරති. එවං ඛො භික්ඛවෙ මහාචොරො භොගචාගී හොති.

කථඤ්ච භික්ඛවෙ, මහාචොරො එකචාරී හොති: ඉධ භික්ඛවෙ මහාචොරො එකකො නිග්ගහණානි කත්තා හොති. තං කිස්ස හෙතු: මා මෙ ගුය්හමන්තා බහිද්ධා සම්භෙදං අගමංසූති. එවං ඛො භික්ඛවෙ මහාචොරො එකචාරී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො මහාචොරො සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති.

1. රොධං මජසං.

## 5. 3. 1. 3.

## [මහා චෝර සූත්‍රය]

### [සැවැත්නිදානයි]

3. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍විගත මහසොර ගෘහසන්ධි ද බිඳියි. වොලොගැනුමුදු කෙරෙයි. ගෙපැහැරුම් (එක් ගෙයක් වටලා පැහැර ගැණීම් ද) කෙරෙයි. කඩපලාසොරකම් (පල්හොරකම්) ද කෙරෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ ලොව්හි මහසොර විෂමනිඃශ්‍රිත ද වෙයි, ගහනනිඃශ්‍රිත ද වෙයි, බලවන්‍තනිඃශ්‍රිත ද වෙයි, භොගචාගී ද වෙයි, එකචාරී ද වේ.

මහණෙනි, මහසොර කෙසේ නම් විෂමනිඃශ්‍රිත වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි මහසොර නදීවිදුර්ගයෙක් වේවයි, පර්‍වතවිෂමයෙක් වේවයි, ඇසුරු කෙළේ වෙයි. මහණෙනි, මෙසෙයින් මහසොර විෂමනිඃශ්‍රිත වෙයි.

මහණෙනි, කෙසේ නම් මහසොර ගහනනිඃශ්‍රිත වේ ය යත්· මහණෙනි, මෙලොව්හි මහසොර තෘණගහනයෙක් වේවයි, වෘක්ෂගහනයෙක් වේවයි, ඝනවන ලැහැබෙක් වේවයි, ඇසුරු කෙළේ වෙයි. මහණෙනි, මෙසේ මහසොර ගහනනිඃශ්‍රිත වෙයි.

මහණෙනි, මහසොර කෙසේ නම් බලවන්‍තනිඃශ්‍රිත වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි මහසොර රජහු හෝ, රජමහමැතියකු හෝ, ඇසුරු කෙළේ වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: ඉදින් මට කිසිවෙක් කිසිවක් කියා නම්, මේ රජහු හෝ රජමහමැතියෝ හෝ මාගේ දෙෂය ඔබා පියා අරුත් බණන්නාහ යි. ඉදින් කිසිවෙක් ඔහට කිසිවක් කියා නම්, රජහු හෝ රජමහමැතිහු හෝ ඔහුගේ අපරාධය ඔබාපියා අරුත් බෙණෙති. මහණෙනි, මෙසෙයින් මහසොර බලවන්‍තනිඃශ්‍රිත වෙයි.

මහණෙනි, කෙසේ නම් මහසොර භොගචාගී වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි මහසොර මහාධන ඇති මහා භොග ඇති ආඪ්‍යයෙක් වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: ඉදින් කිසිවෙක් මට කිසිවක් (දෙසක්) කියා නම්, මේ භොගයෙන් පිළිසතර කරන්නෙමියි ('භොගදානයෙන් දෙස් වසාගන්නෙමි'යි). ඉදින් ඔහට කිසිවෙක් කිසිවක් කී නම්, හේ භොගයෙන් පිළිසඳර කරයි. මහණෙනි, මෙ සෙයින් මහසොර භොගචාගී වෙයි.

මහණෙනි, කෙසේ නම් මහසොර එකචාරී වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි මහසොර එකලා වූයේ මැ මෙරමා සතු දැය පැහැර ගැණීම් කරන්නේ වෙයි. එ කවර හෙයින යත්: මාගේ ගුහ්‍යමන්‍ත්‍රයෝ (සැඟැවිය යුතු රහස්) නහමක් බැහැර නො යෙත් වා යි. මහණෙනි, මෙසේ මහසොර එකචාරී වෙයි.

මහණෙනි, මෙ කරුණු පසෙන් සමන්‍විගත මහසොර ගෘහසන්ධිද සිඳුනේ ය. වොලො ගන්නේ ය. ගෙපැහැරීම් ද කරන්නේ ය. කඩපලා-සොරකම් ද කෙරෙයි.

එවමෙව බො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො පාපභික්ඛු ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච[1] අපුඤ්ඤං පසවති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ, පාපභික්ඛු විසමනිස්සිතො ච හොති ගහනනිස්සිතො ච බලවනිස්සිතො ච භොගචාගී ච එකචාරී ච.

කථඤ්ච භික්ඛවෙ, පාපභික්ඛු විසමනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ පාපභික්ඛු විසමෙන කායකම්මෙන සමන්නාගතො හොති, විසමෙන වචීකම්මෙන සමන්නාගතො හොති, විසමෙන මනොකම්මෙන සමන්නාගතො හොති. එවං බො භික්ඛවෙ පාපභික්ඛු විසමනිස්සිතො හොති.

කථඤ්ච භික්ඛවෙ, පාපභික්ඛු ගහනනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ පාපභික්ඛු මිච්ඡාදිට්ඨිකො හොති අන්තග්ගාහිකාය දිට්ඨියා සමන්නාගතො.[2] එවං බො භික්ඛවෙ පාපභික්ඛු ගහනනිස්සිතො හොති.

කථඤ්ච භික්ඛවෙ, පාපභික්ඛු බලවනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ පාපභික්ඛු රාජානං වා රාජමහාමත්තං වා නිස්සිතො හොති. තස්ස එවං හොති: සචෙ මං කොචි කිඤ්චි වක්ඛති, ඉමෙ මෙ රාජානො වා රාජමහාමත්තා වා පරියොධාය අත්ථං භණිස්සන්තීති. සචෙ නං කොචි කිඤ්චි ආහ, ත්‍යාස්ස රාජානො වා රාජමහාමත්තා වා පරියොධාය අත්ථං භණන්ති. එවං බො භික්ඛවෙ පාපභික්ඛු බලවනිස්සිතො හොති.

කථඤ්ච භික්ඛවෙ, පාපභික්ඛු භොගචාගී හොති: ඉධ භික්ඛවෙ පාපභික්ඛු ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරානං. තස්ස එවං හොති: සචෙ මං කොචි කිඤ්චි වක්ඛති ඉතො ලාභෙන පටිසන්ථරිස්සාමීති. සචෙ නං කොචි කිඤ්චි ආහ, තතො ලාභෙන පටිසන්ථරති. එවං බො භික්ඛවෙ පාපභික්ඛු භොගචාගී හොති.

කථඤ්ච භික්ඛවෙ, පාපභික්ඛු එකචාරි හොති: ඉධ භික්ඛවෙ පාපභික්ඛු එකකො[3] පච්චන්තිමෙසු ජනපදෙසු නිවාසං කප්පෙති. සො තත්ථ කුලානි උපසඞ්කමන්තො ලාභං ලභති. එවං බො භික්ඛවෙ පාපභික්ඛු එකචාරී හොති.

ඉමෙහි බො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො පාපභික්ඛු ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවතීති.

---

1. බහුං ච - සීමු. 2. සමන්නාගතො හොති - සීමු. 3. එකකො ච - මජසං

මහණෙනි, එ පරිදි ම කරුණු පසෙකින් සමන්‍වාගත පාපභික්‍ෂු තෙමේ සාළු ගුණ ඇති, නටගුණ ඇති ආත්මය (තමා) පරිහරණ කෙරෙයි. සදෙස් වූයේ විඥයන් විසින් අනුවාද කටයුතු ද වෙයි. බොහෝ පව් ද රැස් කරයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි පාපභික්‍ෂු විෂමනිඃශ්‍රිත ද වෙයි, ගහනනිඃශ්‍රිත ද වෙයි, බලවත්නිඃශ්‍රිත ද වෙයි, භොගවාගී ද වේ. එකචාරී ද වේ.

මහණෙනි, කෙසේ නම් පවිටු මහණ විෂමනිඃශ්‍රිත වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි පවිටු මහණ විෂමකායකර්මයෙන් සමන්‍වාගත වෙයි, විෂමවාක්කර්මයෙන් සමන්‍වාගත වෙයි, විෂමමනඃකර්මයෙන් සමන්‍වාගත වෙයි. මහණෙනි, මෙසේ පවිටු මහණ විෂමනිඃශ්‍රිත වේ.

මහණෙනි, කෙසේ නම් පවිටු මහණ ගහනනිඃශ්‍රිත වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි පවිටු මහණ අන්තග්‍රාහික (ශාශ්වත හෝ උච්ඡෙද හෝ) දෘෂ්ටියෙන් සමන්‍වාගත වූයේ මිථ්‍යාදෘෂ්ටික වෙයි. මහණෙනි, මෙසේ පවිටු මහණ ගහනනිඃශ්‍රිත වේ.

මහණෙනි, කෙසේ නම් පාපභික්‍ෂු බලවත්නිඃශ්‍රිත වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි පවිටු මහණ රජකු හෝ රජමහමැතියකු හෝ ඇසුරු කෙළේ වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: ඉදින් කිසිවෙක් මට කිසිවක් කියා නම්, මෙ රජහු හෝ රජමහමැතිහු හෝ මාගේ දෙස් ඔබාපියා අරුත් බණන්නාහ යි. ඉදින් ඔහට කිසිවෙක් කිසිවක් කියා නම් එ රජහු හෝ රජමහමැතියෝ හෝ ඔහුගේ දෙස් වසාපියා අරුත් බෙණෙති. මහණෙනි, මෙසේ පාපභික්‍ෂු බලවත්නිඃශ්‍රිත වෙයි.

මහණෙනි, කෙසේ නම් පවිටු මහණ භොගවාගී (භොග දෙන්නේ) වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි පවිටු මහණ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකර ලබනසුලු වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: ඉදින් මාහට කිසිවෙක් කිසිවක් කියා නම්, මේ ලාභයෙන් පිළිසතර (සඞ්ග්‍රහ) කරන්නෙමි යි. ඉදින් ඔහට කිසිවෙක් කිසිවක් කියා නම්, එ ලාභයෙන් පිළිසතර කරයි. මහණෙනි, මෙසේ පාපභික්‍ෂු තෙමේ භොගවාගී වෙයි.

මහණෙනි, කෙසේ නම් පාපභික්‍ෂු එකචාරී වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි පාපභික්‍ෂු තෙමේ එකලා වූයේ පසල්දනව්හි වාස කරයි. හෙ එහි කුලයන් කරා එළඹෙනුයේ ලාභ ලබයි. මහණෙනි, මෙසේ පාපභික්‍ෂු එකචාරී වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත පාපභික්‍ෂු සාරාලු ගුණ ඇති, නටගුණ ඇති, ආත්මය පරිහරණ කරයි. සදෙස් වූයේ විඥයන් විසින් අනුවාද (නින්‍දා) කටයුතු ද වෙයි. බොහෝ අකුසල් ද රැස් කෙරේ ය යි.

5. 3. 1. 4.

[සමණසුඛුමාලසුත්තං]

[සාවත්ථිනිදානං]

4. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු සමණෙසු සමණසුඛුමාලො හොති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු යාචිතොව බහුලං චීවරං පරිභුඤ්ජති, අප්පං අයාචිතො. යාචිතොව බහුලං පිණ්ඩපාතං පරිභුඤ්ජති, අප්පං අයාචිතො. යාචිතොව. බහුලං සෙනාසනං පරිභුඤ්ජති, අප්පං අයාචිතො. යාචිතොව බහුලං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජති, අප්පං අයාචිතො.

යෙහි ඛො පන සබ්‍රහ්මචාරීහි සද්ධිං[1] විහරති, ත්‍යාස්ස මනාපෙනෙව බහුලං කායකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපෙනෙව බහුලං වචීකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපෙනෙව බහුලං මනොකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙනං, මනාපං යෙව බහුලං උපහාරං[2] උපහරන්ති, අප්පං අමනාපං.

යානි ඛො පන තානි වෙදයිතානි පිත්තසමුට්ඨානානි වා සෙම්හසමුට්ඨානානි වා වාතසමුට්ඨානානි වා සන්නිපාතිකානි වා උතුපරිනාම-ජානි වා විසමපරිහාරජානි වා ඔපක්කමිකානි වා කම්මවිපාකජානි වා, තානිස්ස න බහුදෙව උප්පජ්ජන්ති. අප්පාබාධො හොති.

චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සමණෙසු සමණසුඛුමාලො හොති.

යං හි තං භික්ඛවෙ, සම්මා වදමානො වදෙය්‍ය, 'සමණෙසු සමණ-සුඛුමාලො'ති මමෙව තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය, 'සමණෙසු සමණසුඛුමාලො'ති.

අහං හි භික්ඛවෙ යාචිතොව බහුලං චීවරං පරිභුඤ්ජාමි, අප්පං අයාචිතො. යාචිතොව බහුලං පිණ්ඩපාතං -පෙ- සෙනාසනං -පෙ- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජාමි. අප්පං අයාචිතො.

---

1. සබ්‍රහ්මචාරීහි සීමු.
2. මනාපං යෙව උපහාරං - මජසං, සයා

## 5. 3. 1. 4.

## [සමණසුඛුමාල සූත්‍රය]

[සැවැත්නිදානයි]

4. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත ශ්‍රමණ තෙමේ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සුකුමාර (සැප බහුල) වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණෙක් (පිළිගත මැනැවයි) ආරාධිත වූයේ ම බොහෝ කොට චීවර වළඳ කෙරෙයි. ආරාධිත නො වූයේ අල්ප ය. ආරාධිත වූයේ ම බොහෝ කොට පිණ්ඩපාත වළඳ කෙරෙයි. ආරාධිත නො වූයේ අල්ප ය. ආරාධිත වූයේ ම බොහෝ කොට සෙනසුන් වළඳ කෙරෙයි. ආරාධිත නො වූයේ අල්ප ය. ආරාධිත වූයේ ම බොහෝ කොට ගිලන්පස බෙහෙසත් පිරිකර වළඳ කෙරෙයි. ආරාධිත නො වූයේ අල්ප ය.

යම් සබ්‍රම්සරුන් සමග එක්ව වාස කෙරේ ද, ඔහට ඒ සබ්‍රම්සරහු බහුල කොට මනාප වූ ම කායකර්මයෙන් පවත්නාහ. අමනාප කායකර්මයෙන් පවත්නාහු අල්පයහ. මනාප වූ ම වාක්කර්මයෙන් බහුල කොට පවත්නාහ. අමනාප වාක්කර්මයෙන් පවත්නාහු අල්පයහ. මනාප වූ ම මනඃකර්මයෙන් බහුල කොට පවත්නාහ. අමනාප මනඃකර්මයෙන් පවත්නාහු අල්පයහ. මනාප වූ ම පඬුරු එළවත්. අමනාප පඬුරු අල්ප ය.

යම් ඒ වෙදනායෙක් පිත්තසමුට්ඨාන වේවයි, ශෙලෂ්මසමුට්ඨාන වේවයි, වාතසමුට්ඨාන වේවයි, සාන්නිපාතික වේවයි, ඍතුපරිණාමජ වේවයි, විෂමපරිහාරජ වේවයි, ඖපක්‍රමික වේවයි, කර්මවිපාකජ වේවයි, ඒ වෙදනා බෙහෙවින් ම ඔහට නූපදී. අල්පාබාධ වෙයි.

අධිචිත්තයෙහි උපදනා ඉහාත්මසුඛවිහරණ වන සතර ධ්‍යානයන් කැමැතිසේ ලබන සුලුයේ, නිදුකින් ලබනසුලුයේ, විපුල කොට ලබනසුලුයේ වෙයි.

ආස්‍රවයන්ගේ ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ට ඥනයෙන් දැන සාක්‍ෂාත් කොට සපයා වාස කරයි.

මහණෙනි, මෙ කරුණු පසෙන් සමන්වාගත මහණ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සුකුමාර වෙයි.

මහණෙනි, යම් පුහුලකු ගෙණ මැනැවින් කියනුයෙක්, 'ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සුකුමාරයෙකැ'යි කියා නම්, මහණෙනි, මැනැවින් කියන හේ 'ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සුකුමාරය'යි ඒ මා මැ සඳහා කියන්නේ යි.

මහණෙනි, මම ආරාධිත වූයෙම් මැ බොහෝ කොට සිවුරු වළඳ කරමි. අනාරාධිත වූයෙම් අල්ප ය. ආරාධිත වූයෙම් මැ බොහෝ කොට පිණ්ඩපාත, ශයනාසන, ගිලන්පස බෙහෙසත් පිරිකර වළඳ කෙරෙමි. අනාරාධිත වූයෙම් අල්ප කොට වළඳ කෙරෙමි.

යෙහි බො පන භික්ඛූහි සද්ධිං විහරාමි, තෙ මං මනාපෙනෙව බහුලං කායකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපෙනෙව බහුලං වචීකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපෙනෙව බහුලං මනොකම්මෙන සමුදාචරන්ති, අප්පං අමනාපෙන. මනාපං යෙව බහුලං උපහාරං උපහරන්ති, අප්පං අමනාපං.

යානි බො පන තානි වෙදයිතානි පිත්තසමුට්ඨානානි වා සෙම්හසමුට්ඨානානි වා වාතසමුට්ඨානානි වා සන්නිපාතිකානි වා උතුපරිනාමජානි වා විසමපරිහාරජානි වා ඔපක්කමිකානි වා කම්මවිපාකජානි වා, තානි මෙ න බහුදෙව උප්පජ්ජන්ති. අප්පාබාධොහමස්මි.

චතුන්නං බො පනම්හි[1] ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී.

ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමි.

යං හි තං භික්ඛවෙ, සම්මා වදමානො වදෙය්‍ය, 'සමණෙසු සමණසුඛුමාලො'ති මමෙ ව තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය, 'සමණෙසු සමණසුඛුමාලො'ති.

## 5. 3. 1. 5.

## [ඵාසුවිහාර සුත්තං]

[සංවත්තනිකං]

5. පඤ්චිමෙ භික්ඛවෙ, ඵාසුවිහාරා. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛුනො මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවී චෙව රහො ච. මෙත්තං වචීකම්මං -පෙ- මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවී චෙව රහො ච. යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි, තථාරූපෙහි සීලෙහි සීලසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවී චෙව රහො ච. යායං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය, තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවී චෙව රහො ච.

ඉමෙ බො භික්ඛවෙ, පඤ්ච ඵාසුවිහාරාති.

---

1. චතුන්නං බො පන - සීමු.

යම් මැ භික්ෂු කෙනකුන් සමග වාස කෙරෙම් නම්, ඔහු මට මනාප වූ ම කායකර්මයෙන් බහුල කොට පවත්නාහ. අමනාපකායකර්මයෙන් පවත්නාහු අල්පයහ. මනාප වූ මැ වාක්කර්මයෙන් බහුල කොට පවත්නාහ. අමනාප-වාක්කර්මයෙන් පවත්නාහු අල්පයහ. මනාප වූ මැ මනඃකර්මයෙන් බහුල කොට පවත්නාහ, අමනාපමනඃකර්මයෙන් පවත්නාහු අල්පයහ. මනාප වූ මැ උපහාර බහුල කොට එළවත්. අමනාප උපහාර අල්ප යි.

යම් වේදනායෙක් - පිත්තසමුට්ඨාන වේවයි, සෙම්හසමුට්ඨාන වේවයි, වාතසමුට්ඨාන වේවයි, සාන්නිපාතික වේවයි, ඍතුපරිණාමජ වේවයි, විෂමපරිහාරජ වේවයි, ඖපක්‍රමික වේවයි, කර්මවිපාකජ වේවයි, ඒ වේදනා මට බෙහෙවින් නූපදී. මම අල්පාබාධයෙමි.

අධිචිත්තයෙහි (රූපාවචර සිත්හි) උපදනා වූ ඉහාත්මයෙහි සුඛවිහරණ වන සතරධ්‍යානයන් කැමැති සෙයින් ලබන සුලුයෙමි, නිදුකින් ලබන සුලුයෙමි, විපුල සේ ලබන සුලුයෙමි වෙමි.

ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥවිමුක්තිය ඉහාත්මයෙහි මැ තෙමේ විශිෂ්ටඥනයෙන් දැන සාක්ෂාත් කොට සපයා වාස කරමි.

මහණෙනි, යම් පුහුලකු ගෙන ‘ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සුකුමාර’යි මොනොවට කියනුයෙක් පවසන්නේ නම්, මහණෙනි, ඒ මා සඳහා ‘ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සුකුමාර’යි මැනැවින් කියන හේ පවසන්නේ ය යි.

## 5. 3. 1. 5.

## [ඵාසුවිහාර සූත්‍රය]

### [සැවැත් නිදනයි]

5. මහණෙනි, මේ ඵාසුවිහාරයෝ පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ මෛත්‍රීචිත්තයෙන් යුත් කායකර්මය සබ්‍රම්සරුන් කෙරෙහි සම්මුඛයෙහිත් පරම්මුඛයෙහිත් එළඹ සිටියේ වෙයි. මෛත්‍රියෙන් යුත් වාක්කර්මය ... මෛත්‍රියෙන් යුත් මනඃකර්මය සබ්‍රම්සරුන් කෙරෙහි සම්මුඛයෙහිත් පරම්මුඛයෙහිත් එළඹ සිටියේ වෙයි. නොකඩ වූ නොසිදුරු වූ අශබල වූ අකල්මාෂ වූ නිදහස් වූ විඥයන් විසින් පසස්නා ලද තෘෂ්ණාදෘෂ්ටියෙන් අපරාමෘෂ්ට වූ සමාධියට හිතවත් ව වැටෙන යම් ශීල කෙනෙක් වෙත් නම්, එබඳු ශීලයෙන් සබ්‍රම්සරුන් සමග සම්මුඛයෙහිත් පරාම්මුඛයෙහිත් ශීලයෙන් සමභාවයට ගියේ වාස කරයි. ආර්‍ය්‍ය වූ නෛර්‍ය්‍යාණික වූ යම් දෘෂ්ටියෙක් එය කරණුවහුගේ දුක් මැනැවින් ගෙවීමට පමුණුවා නම්, සම්මුඛයෙහිත් පරම්මුඛයෙහිත් එබඳු දෘෂ්ටියෙන් සබ්‍රම්සරුන් හා දෘෂ්ටිසමභාවයට ගියේ වාස කරයි.

මහණෙනි, මේ ඵාසු විහාර පස යි.

## 5. 3. 1. 6.

### ආනන්දසුත්තං

6. එකං සමයං භගවා **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ.** අථ ඛො ආයස්මා **ආනන්දො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

කිත්තාවතා නු ඛො භන්තෙ, භික්ඛු සඞ්ඝෙ[1] විහරන්තො ඵාසුං විහරෙය්‍යාති.

යතො ඛො ආනන්ද, භික්ඛු අත්තනා[2] සීලසම්පන්නො හොති නො ච පරං අධිසීලෙ සම්පවත්තා. එත්තාවතාපි ඛො ආනන්ද භික්ඛු සඞ්ඝෙ විහරන්තො ඵාසුං විහරෙය්‍යාති.

සියා පන භන්තෙ, අඤ්ඤොපි පරියායො යථා භික්ඛු සඞ්ඝෙ ඵාසුං විහරෙය්‍යාති.

සියා ආනන්ද, යතො ඛො ආනන්ද භික්ඛු අත්තනා සීලසම්පන්නො හොති නො ච පරං අධිසීලෙ සම්පවත්තා හොති. අත්තානුපෙක්ඛී ච හොති නො පරානුපෙක්ඛී. එත්තාවතා පි ඛො ආනන්ද භික්ඛු සඞ්ඝෙ විහරන්තො ඵාසුං විහරෙය්‍යාති.

සියා පන භන්තෙ, අඤ්ඤොපි පරියායො යථා භික්ඛු සඞ්ඝෙ විහරන්තො ඵාසුං විහරෙය්‍යාති.

සියා ආනන්ද, යතො ඛො ආනන්ද භික්ඛු අත්තනා සීලසම්පන්නො හොති නො ච පරං අධිසීලෙ සම්පවත්තා. අත්තානුපෙක්ඛී ච නො පරානුපෙක්ඛී හොති. අප්පඤ්ඤාතො[3] ච හොති, තෙන ච අප්පඤ්ඤාතකෙන නො පරිතස්සති. එත්තවතාපි ඛො[4] ආනන්ද භික්ඛු සඞ්ඝෙ විහරන්තො ඵාසුං විහරෙය්‍යාති.

සියා පන භන්තෙ, අඤ්ඤොපි පරියායො යථා භික්ඛු සඞ්ඝෙ විහරන්තො ඵාසුං විහරෙය්‍යාති.

සියා ආනන්ද, යතො ඛො ආනන්ද භික්ඛු අත්තනා සීලසම්පන්නො හොති, නො පරං අධිසීලෙ සම්පවත්තා. අත්තානුපෙක්ඛී ච හොති නො පරානුපෙක්ඛී. අප්පඤ්ඤාතො ච හොති. තෙන ච අප්පඤ්ඤාතකෙන නො පරිතස්සති. චතුන්නඤ්ච ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්ම-සුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. එත්තාවතාපි ඛො ආනන්ද භික්ඛු සඞ්ඝෙ විහරන්තො ඵාසුං විහරෙය්‍යාති.

---

1. භික්ඛු සඞ්ඝො - ස්‍යා. 2. අත්තනාතං ච - සීමු. 3. අප්පඤ්ඤාතො - මජ්සං, 4. එත්තාවතාපි - මජ්සං.

## 5. 3. 1. 6.

### [ආනන්ද සූත්‍රය]

6. **එක් සමයෙක්හි** භාග්‍යවතුන්වහන්සේ **කොසැඹෑ** නුවර **ඝෝසිතාරාමයෙහි** වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කරුණු සැළ කළහ:

වහන්ස, කෙතෙක් කරුණෙකින් සඞ්ඝයා කෙරෙහි වසන මහණ සුවසේ වසන්නේ දැ යි.

ආනන්දයෙනි, යම් කරුණෙකින් මහණ තෙමේ සිල්සපන් වූයේ, මෙරමා අධිශීලයෙහි ලා උපවාද නොකරණුයේ වේ ද, ආනන්දයෙනි, මේ කරුණෙනුදු මහණ සඞ්ඝයා කෙරෙහි සුවසේ වාස කරන්නේ ය යි.

වහන්ස, මහණ යම් කරුණෙකින් සඞ්ඝයා කෙරෙහි සුවසේ වෙසේ නම් එබඳු අන් කරුණෙක් වන්නේ ද?

ආනන්දයෙනි, වන්නේ ය. ආනන්දයෙනි, යම් හෙයෙකින් මහණ තෙමේ සිල්සපන් වූයේ මෙරමා අධිශීලයෙහි ලා නො ද ගරහනුයේත් වේ, තමාගේ කිස දක්නා සුලු වූයේත් වෙයි, මෙරමාගේ කෘතාකෘත නො විමසනුයේත් වෙයි, ආනන්දයෙනි, මහණ මේ කරුණෙනුදු සඟුන් කෙරෙහි සුවසේ වසන්නේ ය යි.

වහන්ස, යම් කරුණෙකින් මහණ සඟුන් කෙරෙහි සුවසේ වෙසේ නම්, එබඳු අන් කරුණෙකුදු වන්නේ ද?

ආනන්දයෙනි, වන්නේ ය. ආනන්දයෙනි, යම් කරුණෙකින් මහණ තෙමේ සිල්සපන් වූයේ අන්‍යයා අධිශීලයෙහි ලා නො ගරහන්නේ වෙයි, තමාගේ කල නොකල දෑ දක්නා සුල්ලේත් වෙයි, මෙරමා නො විමසනුයේත් වෙයි, අප්‍රකට වූයේත් වෙයි, ඒ අප්‍රකට භාවයෙන් නො තැවෙනුයේත් වෙයි. ආනන්දයෙනි, මේ කරුණෙනුදු මහණ සඟුන් කෙරෙහි වසනුයේ සුවසේ වසන්නේ ය යි.

වහන්ස, යම් කරුණෙකින් මහණ සඟුන් කෙරෙහි වසනුයේ සුවසේ වාස කෙරේ නම්, එබඳු අන් කරුණෙකුදු වන්නේ ද?

ආනන්දයෙනි, වන්නේ ය. ආනන්දයෙනි, යම් කරුණෙකින් මහණ තෙමේ සිල් සපන් වූයේ මෙරමා අධිශීලයෙහි ලා නො ගරහන්නේ වේ ද, ආත්මානුප්‍රෙක්ෂී වේ ද, පරානුප්‍රෙක්ෂී නො වේ ද, අල්පඥාත වේ ද, ඒ අල්පඥාතභාවයෙන් නො තැවෙන්නේ ද, අධිචිත්තයෙහි උපදනා ඉහාත්මභාවයෙහි සුඛවිහරණ ඇති සතර ධ්‍යානයන් රිසි සේ ලබනසුලුයේ, නිදුකින් ලබනසුලුයේ, විපුල කොට ලබනසුලුවූයේත් වේ ද, ආනන්දයෙනි, මෙ කරුණෙනුදු මහණ සඟුන් කෙරෙහි වසනුයේ සුවසේ වාස කරන්නේ ය යි

සියා පන භන්තෙ, අඤ්ඤෝපි පරියායො යථා භික්ඛු සඞ්ඝෙ විහරන්තො ඵාසුං විහරෙය්‍යාති.

සියා ආනන්ද, යතො ඛො ආනන්ද භික්ඛු අත්තනා සීලසම්පන්නො හොති, නො ච පරං අධිසීලෙ සම්පවත්තා. අත්තානුපෙක්ඛී ච හොති නො පරානුපෙක්ඛී. අපඤ්ඤාතො ච හොති තෙන අපඤ්ඤාතකෙන නො පරිතස්සති. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එත්තාවතා ඛො ආනන්ද භික්ඛු සඞ්ඝෙ විහරන්තො ඵාසුං විහරෙය්‍ය.

ඉමම්හා චාහං ආනන්ද ඵාසුවිහාරා අඤ්ඤෝ ඵාසුවිහාරො උත්තරිතරො වා පණීතතරො වා නත්ථීති වදාමී'ති.

## 5. 3. 1. 7.

## [සීලසම්පන්නසුත්තං]

### [සාවත්ථිනිදානං]

7. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි පඤ්චහි?

ඉධ භික්ඛවෙ, භික්ඛු සීලසම්පන්නො හොති, සමාධිසම්පන්නො හොති, පඤ්ඤාසම්පන්නො හොති, විමුත්තිසම්පන්නො හොති, විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 5. 3. 1. 8.

## [අසෙඛසුත්තං]

### [සාවත්ථිනිදානං]

8. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො[1] -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

---

1. ආහුණෙය්‍යො පාහුණෙය්‍යො - සීමු, මජසං.

වහන්ස, යම් කරුණෙකින් සඟුන් කෙරෙහි වසන මහණ සුවසේ වෙසේ නම්, එබඳු අන් කරුණෙකුදු ඇත් ද?

ආනන්දයෙනි, ඇත. ආනන්දයෙනි, යම් කරුණෙකින් මහණ තෙමේ සිල් සපන් වූයේ, මෙරමා අධිශීලයෙහි ලා නො ගරහනුයේ වේ ද, ආත්මානුප්‍රෙක්ෂී වේ ද පරානුප්‍රෙක්ෂී නො වේ ද, අල්පඥත වේ ද, ඒ අල්පඥතභාවයෙන් නො තැවේ ද, ආභිචෙතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ සතර ධ්‍යානයන් රිසි සේ ලබනසුලුයේ, නිදුකින් ලබනසුලුයේ, විපුල සේ ලබනසුලුයේත් වේ ද, ආශ්‍රවයන්ගේ ක්‍ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය තෙමේ මැ විශිෂ්ටඥනයෙන් දැන සාක්‍ෂාත් කොට එයට එළඹ වෙසේ ද, ආනන්දයෙනි, මෙ කරුණෙනුදු මහණ සඟුන් කෙරෙහි වසනුයේ සුවසේ වාස කරන්නේ ය යි.

ආනන්දයෙනි, මේ (ආශ්‍රවක්‍ෂය) ඵාසුවිහාරයෙන් උත්තරීතර වූ හෝ ප්‍රණීතතර වූ අනෙක් ඵාසුවිහාරයෙක් නැතැයි කියමි යි.

## 5. 3. 1. 7.

## [සීලසම්පන්න සූත්‍රය]

[සැවැත්නිදනයි]

7. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත මහණ ආහුනෙය්‍ය වෙයි, ප්‍රාහුණෙය්‍ය වෙයි, දක්ෂිණෙය්‍ය වෙයි, අඤ්ජලිකරණීය වෙයි, ලොකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සීලසම්පන්න වෙයි, සමාධිසම්පන්න වෙයි, ප්‍රඥසම්පන්න වෙයි, විමුක්තිසම්පන්න වෙයි, විමුක්තිඥනදර්ශනසම්පන්න වෙයි.

මහණෙනි, මේ කරුණු පසින් සමන්‍වාගත මහණ ආහුනෙය්‍ය වෙයි, ප්‍රාහුණෙය්‍ය වෙයි, දක්ෂිණෙය්‍ය වෙයි, අඤ්ජලිකරණීය වෙයි, ලොකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වේ ය යි.

## 5. 3. 1. 8.

## [අසෙඛ සූත්‍රය]

[සැවැත්නිදනයි]

8. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත මහණ ආහුනෙය්‍ය වෙයි, ප්‍රාහුණෙය්‍ය වෙයි, දක්ෂිණෙය්‍ය වෙයි, අඤ්ජලිකරණීය වෙයි, ලොකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වෙයි, කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අශෛක්‍ෂශීලස්කන්ධයෙන් සමන්‍වාගත වෙයි, අශෛක්‍ෂසමාධිස්කන්ධයෙන් සමන්‍වාගත වෙයි, අශෛක්‍ෂප්‍රඥස්කන්ධයෙන් සමන්‍වාගත වෙයි, අශෛක්‍ෂවිමුක්තිස්කන්ධයෙන් සමන්‍වාගත වෙයි, අශෛක්‍ෂවිමුක්තිඥනදර්ශනස්කන්ධයෙන් සමන්‍වාගත වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත මහණ ආහුනෙය්‍ය වෙයි, ප්‍රාහුණෙය්‍ය වෙයි, දක්ෂිණෙය්‍ය වෙයි, අඤ්ජලිකරණීය වෙයි, ලොකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වේ ය යි.

## 5. 3. 1. 9.

### [චාතුද්දිසසුත්තං]

**[සාවත්ථිනිදානං]**

9. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු චාතුද්දිසො හොති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා[1] කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[2] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා.

සන්තුට්ඨො හොති ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය-භෙසජ්ජපරික්ඛාරෙන.

චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාම-ලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව-ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු චාතුද්දිසො හොතීති.

## 5. 3. 1. 10.

### [අරඤ්ඤසුත්තං]

**[සාවත්ථිනිදානං]**

10. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

1. සාත්ථං සබ්‍යඤ්ජනං - මජ්ඣං. 2. ධාතා - මජ්ඣං.

## 5. 3. 1. 9.

### [චාතුද්දිස සූත්‍රය]

**[සැවැත් නිදානයි]**

9. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත මහණ සිවුදිග්හි නො පැකිළි ආචාර ඇතියේ වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි, ආචාරගොචර සම්පන්‍න වූයේ ප්‍රාතිමොක්‍ෂසංවරශීලයෙන් සංවෘත වූයේ වාස කරයි, අණුමාත්‍ර වරදෙහි භය දක්නාසුලුයේ ශික්‍ෂාපදයෙහි සමාදන් කොට ගෙණ හික්මෙයි.

ශ්‍රුතධර වූයේ ශ්‍රුතසන්නිචය ඇතියේ බහුශ්‍රුත වෙයි, ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ සාර්ථ වූ සව්‍යඤ්ජන වූ යම් ධර්‍ම කෙනෙක් කෙවල පරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහමචර්‍ය්‍යය ප්‍රකාශ කරත් නම්, එබඳු ධර්‍මයෝ ඔහු විසින් බහුශ්‍රුතවූවාහු ධරණ ලද්දාහු වෙත්, වචනයෙන් පිරිවහන ලදහු වෙත්, මනසින් අනුප්‍රෙක්‍ෂිත වෙත්, ප්‍රඥාදෘෂ්ටියෙන් මොනොවට පිළිවිදුනා ලද වෙත්.

ඉතරෙතර (යථාලාභ වූ) චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙන් සතුටු වූයේ වෙයි.

ආභිචෙතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ සතර ධ්‍යානයන් කැමැති සෙයින් ලබනසුලුයේ නිදුකින් ලබනසුලුයේ විපුල කොට ලබනසුලුයේ වෙයි.

ආස්‍රවක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්ති හා ප්‍රඥාවිමුක්ති හා තෙමේ ඉහාත්මයෙහි මැ විශිෂ්ටඥානයෙන් දැන සාක්‍ෂාත් කොට එයට පැමිණ වාස කෙරෙයි.

මහණෙනි, මේ කරුණු පසින් සමන්‍වාගත මහණ සිවුදිග්හි නො පැකිළි ආචාර ඇතියේ වේ ය යි.

## 5. 3. 1. 10.

### [අරඤ්ඤ සූත්‍රය]

**[සැවැත්නිදානයි]**

10. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත මහණ වන සෙනසුන් හා වෙනෙහි දුර සෙනසුන් හා ගැඹුරු වල්සෙනසුන් හා සෙවුනට නිසි වූයේ වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්‍ෂ සංවරයෙන් සංවෘත වූයේ සමාදන් කොට ගෙන සිකපදයෙහි හික්මෙයි.

බහුස්සුතො හොති -පෙ- තථාරූපාස්ස ධම්මා -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා.

ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු.

චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති. අකිච්ඡලාභී අකසිරලාභී.

ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුන්ති.

**ඵාසුවිහාරවග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

සාරජ්ජං සඞ්කිතො චොරො සුඛුමාලං ඵාසු පඤ්චමං[1]
ආනන්ද සීලා සෙඛා ච[2] චාතුද්දිසො අරඤ්ඤෙන චාති.

1. සුඛුමාලඵාසු පඤ්චමං - සතා. 2. ආනන්ද සීල සෙඛියා - සීමු, සතා.

බහුශ්‍රැත වෙයි ... බ්‍රහ්මචය්‍යීය ප්‍රකාශ කරණ එබඳු ධර්මයෝ ... නුවණින් මොනොවට පිළිවිදුනා ලද්දාහු වෙත්.

අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ උපසම්පත් පිණිස ඇරඹුවැර ඇතියේ වාස කරයි. වීය්‍යීසථාම ඇතියේ දළ පැරකුම් ඇතියේ කුශලධර්මයෙහි නො බහා ලූ ධූර ඇතියේ වෙයි.

ආභිචෛතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ සතර ධ්‍යානයන් කැමැතිසෙයින් ලබනසුලු වූයේ නිදුකින් ලබනසුලු වූයේ විපුල කොට ලබනසුලු වූයේ වෙයි.

ආස්‍රවයන්ගේ ක්‍ෂයවීමෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට එළඹ වෙසෙයි.

මහණෙනි, මේ කරුණු පසින් සමන්‍වාගත මහණ අරණ්‍යයෙහි වානප්‍රස්ථයෙහි වනපය්‍යීන්තයෙහි ශයනාසනයන් සෙවුනට නිසි වේ ය යි.

**ඵාසුවිහාර වග්ගය පළමු වැනි යි.**

**එහි උද්දානය:**

වෙසාරජ්ජ සූත්‍රය, සඞ්කිත සූත්‍රය, මහාචොර සූත්‍රය, සමණ සුඛුමාල සූත්‍රය, පස්වැනි ඵාසුවිහාර සූත්‍රය, ආනන්ද සූත්‍රය, සීලසම්පන්න සූත්‍රය, අසෙඛ සූත්‍රය, චාතුද්දිස සූත්‍රය, අරඤ්ඤ සූත්‍රය දැයි සූත්‍ර දශයෙකි.

5. 3. 2. 1.

[කුලූපගසුත්තං]

[සාවත්ථිනිදානං]

11. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො කුලූපගො භික්ඛු කුලෙසු අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච. කතමෙහි පඤ්චහි:

අසන්ථුතවිස්සාසී[1] ච හොති, අනිස්සරවිකප්පී ච, වියත්ථුපසෙවී[2] ච, උපකණ්ණකජප්පී ච, අතියාචනකො ච.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො කුලූපගො භික්ඛු කුලෙසු අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො කුලූපගො භික්ඛු කුලෙසු පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි:

න අසන්ථුතවිස්සාසී[1] ච හොති, න අනිස්සරවිකප්පී ච, න වියත්ථුපසෙවී[2] ච, න උපකණ්ණකජප්පී ච, න අතියාචනකො ච.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො කුලූපගො භික්ඛු කුලෙසු පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චාති.

5. 3. 2. 2.

[පච්ඡාසමණසුත්තං]

[සාවත්ථිනිදානං]

12. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො පච්ඡාසමණො න ආදාතබ්බො. කතමෙහි පඤ්චහි:

අතිදූරෙ වා ගච්ඡති අච්චාසන්නෙ වා, න පත්තපරියාපන්නං ගණ්හාති, ආපත්තිසාමන්තා භණමානං න නිවාරෙති, භණමානස්ස අන්තරන්තරා කථං ඔපාතෙති, දුප්පඤ්ඤො හොති ජළො එළමූගො.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො පච්ඡාසමණො න ආදාතබ්බො.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො පච්ඡාසමණො ආදාතබ්බො. කතමෙහි පඤ්චහි:

නාතිදූරෙ ගච්ඡති න අච්චාසන්නෙ, පත්තපරියාපන්නං ගණ්හාති, ආපත්තිසාමන්තා භණමානං නිවාරෙති, භණමානස්ස න අන්තරන්තරා කථං ඔපාතෙති, පඤ්ඤවා හොති අජළො අනෙළමූගො.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො පච්ඡාසමණො ආදාතබ්බොති.

---

1 අසන්ථවවිස්සාසී - මජසං.
2. විස්සට්ඨුපසෙවී - මජසං

## 5. 3. 2. 1.

## [කුලූපගසුත්‍රය]

**[සැවැත්නිදනයි]**

11. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත කුලොපග මහණ කුලයෙහි අප්‍රිය, අමනාප, අගරු, අභාවනීය (බුහුමනට අනිසි) ද වෙයි. කවර පසෙකින යත්:

අසංස්තුතයන් (තමා හා මිත්‍ර නොවූවන්) කෙරෙහි විශ්වාස ඇතියේ ද වෙයි. අනීශ්වර වූයේ (අධිපතියකු සෙයින්) විකල්පන (විධාන) කරනුයේ ද වෙයි. වියත්ථූපසෙවී (විසපිත කුලයන් නැවත සටනුවස් සෙවුනෝ) ද වෙයි. උපකණ්ණජල්පී (කණෙහි කොඳුරණුයේ) ද වෙයි. අතියාචනක (ඉබොහෝ යදනෝ) ද වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත කුලොපග මහණ කුලන්හි අප්‍රිය, අමනාප, අගරු, අභාවනීය ද වෙයි.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත කුලොපග මහණ කුලෙහි ප්‍රිය, මනාප, ගරු, භාවනීය, ද වෙයි. කවර පසෙකින යත්:

අසංස්තුතයන් කෙරෙහි විශ්වාස ඇතියේ ද නො වෙයි. ඊශ්වරවිකල්පී ද නො වෙයි. වියත්ථූපසෙවී ද නො වෙයි. උපකණ්ණජල්පී ද නො වෙයි. අතියාචනක ද නො වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත කුලොපග මහණ කුලයෙහි ප්‍රිය, මනාප, ගරු, භාවනීය (බුහුමනට නිසි) ද වේ යයි.

## 5. 3. 2. 2.

## [පච්ඡාසමණසූත්‍රය]

**[සැවැත්නිදනයි]**

12. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත පසුමහණ (උවටැන් සඳහා තමා කැටුව යන මහණ සේ) නො ගත යුත්තේය. කවර පසෙකින යත්:

ඉතා දුරෙහි හෝ යෙයි, අත්‍යාසන්නයෙහි හෝ යෙයි, පාත්‍රපර්‍යාපන්නය (පාත්‍රයෙන් දුන් දැය) නො ගන්නේ වෙයි. ආපත්ති සාමන්ත කොට (ඇවැත් වියහැකි) වචන බණනුවහු (මෙබඳු බස් නො කිය යුතුයයි) නො වළහන්නේ ය. ඔහු (උවදූ තෙරුන්) බෙණෙත් ම අතරතුරු කථා හෙළණුයේ වෙයි. ජඩ (බුද්ධි රහිත) වූයේ කෙළතොලු වූයේ දුස්ප්‍රාඥ වෙයි.

මහණෙනි, මේ ධර්ම පසින් සමන්‍වාගත පසුමහණ නො ගත යුත්තේය.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත පසුමහණ ගතයුතු වෙයි. කවර පසෙකින යත්:

ඉතා දුරෙහි නොයෙයි, ඉතා ආසන්නයෙහි නොයෙයි. පාත්‍රපර්‍යා-පන්නය ගන්නේය. ආපත්ති සාමන්ත කොට බණන්නහු වළහන්නේය. ඔහු බණත් ම අතරතුර කථා නො හෙළන්නේය. ජඩ නො වූයේ කෙළතොලු නො වූයේ ප්‍රාඥ (නැණවත්) වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත පසුමහණ ගතයුතු වෙයි.

## [5. 3. 2. 3.]

## [සම්මාසමාධිසුත්තං]

**[සාවත්ථිනිදානං]**

13. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො සම්මා-සමාධිං උපසම්පජ්ජ විහරිතුං. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු අක්ඛමො හොති රූපානං, අක්ඛමො සද්දානං, අක්ඛමො ගන්ධානං, අක්ඛමො රසානං, අක්ඛමො ඵොට්ඨබ්බානං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො සම්මාසමාධිං උපසම්පජ්ජ විහරිතුං.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො සම්මාසමාධිං උපසම්පජ්ජ විහරිතුං. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු ඛමො හොති රූපානං, ඛමො සද්දානං, ඛමො ගන්ධානං, ඛමො රසානං, ඛමො ඵොට්ඨබ්බානං.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො සම්මාසමාධිං උපසම්පජ්ජ විහරිතුන්ති.

## 5. 3. 2. 4.

## [අන්ධකවින්දසුත්තං]

14. එකං සමයං භගවා මගධෙසු විහරති **අන්ධකවින්දෙ.** අථඛො ආයස්මා **ආනන්දො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

යෙ තෙ ආනන්ද, භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙ වො ආනන්ද භික්ඛූ පඤ්චසු ධම්මෙසු සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා. කතමෙසු පඤ්චසු:

"එථ තුම්හෙ ආවුසො, සීලවා හොථ පාතිමොක්ඛසංවරසංවුතා විහරථ ආචාරගොචරසම්පන්නා, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවිනො සමාදාය සික්ඛථ සික්ඛාපදෙසූති" ඉති පාතිමොක්ඛසංවරෙ සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා.

"එථ තුම්හෙ ආවුසො, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා විහරථ ආරක්ඛසතිනො නිපක්කසතිනො සාරක්ඛිතමානසා සතාරක්ඛෙන චෙතසා සමන්නාගතාති." ඉති ඉන්ද්‍රියසංවරෙ සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා.

## 5. 3. 2. 3.

## [සම්මාසමාධිසූත්‍රය]

[සැවැත්නිදානයි]

13. මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ සම්‍යක් සමාධියට එළඹ වාස කරන්නට අභව්‍ය (නුසුදුසු) වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපයන් නො සහතේ වෙයි. ශබ්දයන් නො සහතේ වෙයි. ගන්‍ධයන් නො සහතේ වෙයි. රසයන් නො සහතේ වෙයි. සප්‍රෂ්ටව්‍යයන් නො සහතේ වෙයි. (රූපාදි අරමුණු පසෙහි ඇලුනේ වෙයි.)

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ සම්‍යක් සමාධියට එළඹ වෙසෙනුවට අභව්‍ය වෙයි.

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත මහණ සම්‍යක් සමාධියට එළඹ වාසකරණුවට භව්‍ය වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපයන් සහතේ වෙයි. ශබ්දයන් සහතේ වෙයි. ගන්‍ධයන් සහතේ වෙයි. රසයන් සහතේ වෙයි. සප්‍රෂ්ටව්‍යයන් සහතේ වෙයි. (රූපාදි අරමුණු පසෙහි නො ඇලුනේ වෙයි.)

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ සම්‍යක්සමාධියට එළඹ වසන්නට භව්‍ය වෙ යි.

## 5. 3. 2. 4.

## [අන්ධකවින්දසූත්‍රය]

14. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මගධරට **අන්ධකවින්දයෙහි** වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ භාග්‍යවතුන් කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරුන්හට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

ආනන්දයෙනි, නවක වූ පැවිදිව නොබෝ කල් ඇති මෙ සස්නට අලුත පැමිණි යම් භික්ෂු කෙනෙක් වෙත් නම්, ආනන්දයෙනි, තොප විසින් එ මහණහු පස්දහමෙක සමාදන් කරවිය යුතු වෙති. යෙදවිය යුතු වෙති. පිහිටුවිය යුතු වෙති. කවර පසෙක යත්:

"එව ඇවැත්නි, තෙපි සිල්වත් වැ, ප්‍රාතිමොක්‍ෂ සංවරයෙන් සංවෘතව වසව, අණුමාත්‍ර වරදෙහිදු භය දක්නාහු, ආචාරගොචරසම්පන්න වූවහු සමාදන් කොටගෙණ සික්පදයෙහි මොනොවට හික්මෙව" යි සීල සංවරයෙහි සමාදන් කරවියයුතු වෙති, යෙදවියයුතු වෙති, පිහිටු-වියයුතු වෙති.

"එව ඇවැත්නි, තෙපි ඉන්‍ද්‍රියයෙහි පියු දොර ඇතිවැ වසවු, (ද්වාරයන්) ආරක්‍ෂා කරණ සිහි ඇතිවැ (ද්වාරයන්) රක්නා සිහි නුවණ ඇතිවැ මොනොවට රක්නාලද සිත් ඇතිවැ සමෘති ආරක්‍ෂා සහිත සිතින් සමන්‍වාගත වූවහු වාස කරව"යි ඉන්‍ද්‍රියසංවරයෙහි සමාදන් කරවියයුතු වෙති, යෙදවියයුතු වෙති, පිහිටුවියයුතු වෙති.

"එථ තුම්හෙ ආවුසො, අප්පභස්සා හොථ භස්සෙ පරියන්තකාරිනො"ති" ඉති භස්සපරියන්තෙ සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා.

"එථ තුම්හෙ ආවුසො, ආරඤ්ඤිකා හොථ අරඤ්ඤෙ වනපත්ථානි[1] පන්තානි සෙනාසනානි පටිසෙවථා"ති ඉති කායවූපකාසෙ සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා.

"එථ තුම්හෙ ආවුසො, සම්මාදිට්ඨිකා හොථ සම්මාදස්සනෙන සමන්නාගතා"ති" ඉති සම්මාදස්සනෙ සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා.

යෙ තෙ ආනන්ද, භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙ වො ආනන්ද භික්ඛූ ඉමෙසු පඤ්චසු ධම්මෙසු සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා"ති.

## 5. 3. 2. 5.

## [මච්ඡරිසුත්තං]

**[සාවත්ථිනිදානං]**

15. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

ආවාසමච්ඡරිනී හොති, කුලමච්ඡරිනී හොති, ලාභමච්ඡරිනී හොති, වණ්ණමච්ඡරිනී හොති, ධම්මමච්ඡරිනී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

න ආවාසමච්ඡරිනී හොති, න කුලමච්ඡරිනී හොති, න ලාභමච්ඡරිනී හොති, න වණ්ණමච්ඡරිනී හොති, න ධම්මමච්ඡරිනී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙති.

## 5. 3. 2. 6.

## [වණ්ණසුත්තං]

**[සාවත්ථිනිදානං]**

16. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති. අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති. අනනුවිච්ච අපරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති. අනනුවිච්ච අපරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසෙති. සද්ධාදෙය්‍යං විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ.

1. අරඤ්ඤවනපත්ථානි - මජ්ඣං.

“එව ඇවැත්නි, තෙපි කථාපර්‍යන්ත ඇති වැ අල්පකථා ඇතිවව”යි මෙසේ කථාපර්‍යන්තයෙහි (සීමාසහිත කථායෙහි) සමාදන් කරවිය යුතු වෙති, යෙදවිය යුතු වෙති, පිහිටුවාලිය යුතු වෙති.

“එව ඇවැත්නි, තෙපි අරණ්‍යසෙනසුන් ඇති වව, අරණ්‍යයෙහි වානප්‍රස්ථ ප්‍රාන්තශයනාසනයන් සෙවන කරව”යි මෙසේ කායවිවෙකයෙහි සමාදන් කරවිය යුතු වෙති, යෙදවිය යුතු වෙති, පිහිටුවාලිය යුතු වෙති.

“එව ඇවැත්නි, තෙපි සම්දිටු ඇත්තහු සම්‍යග් දර්ශනයෙන් සමන්වාගත වව”යි මෙසේ සම්‍යග්දර්ශනයෙහි සමාදන් කරවිය යුත්තාහ, යෙදවිය යුත්තාහ, පිහිටුවාලිය යුත්තාහ.

ආනන්දයෙනි, නවක වූ, පැවිදිව නොබෝ කල් ඇති, මේ ධර්මවිනයට අලුත පැමිණි, යම් මහණහු වෙත් නම්, තොප විසින්, ආනන්දයෙනි, එ මහණහු මේ පඤ්චධර්මයෙහි සමාදන් කරවිය යුත්තාහ, යෙදවිය යුත්තාහ, පිහිටුවාලිය යුත්තාහයි.

**5. 3. 2. 5.**

**[මච්ඡරිසූත්‍රය]**

**[සැවැත්නිදානයි]**

**15.** මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්වාගත මෙහෙණ ගෙණවුත් බහා තැබූවක සෙයින් නිරයෙහි (උපදනී) වෙයි. කවර පසෙකින යත්:

ආවාසයෙහි මසුරුබව ඇත්තී වෙයි, කුලයෙහි මසුරුබව ඇත්තී වෙයි, ලාභයෙහි මසුරුබව ඇත්තී වෙයි, වර්ණ (ගුණ) යෙහි මසුරුබව ඇත්තී වෙයි, ධර්මයෙහි මසුරුබව ඇත්තී වෙයි.

මහණෙනි, මෙ පස් කරුණින් සමන්වාගත මෙහෙණ ගෙණවුත් බහා තැබූවක සෙයින් නිරයෙහි (උපදනී) වෙයි.

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්වාගත මෙහෙණ ගෙණවුත් තැබූවක සෙයින් ස්වර්ගයෙහි (උපදිනී) වෙයි. කවර පසෙකින යත්:

ආවාසමාත්සර්‍යයී ඇත්තී නො වෙයි, කුල (උපස්ථායක කුලයෙහි) මාත්සර්‍යයී ඇත්තී නො වෙයි, ලාභමාත්සර්‍යයී ඇත්තී නො වෙයි, වර්ණමාත්සර්‍යයී ඇත්තී නො වෙයි, ධර්මමාත්සර්‍යයී ඇත්තී නොවේ.

මහණෙනි, මේ ධර්මපසින් සමන්වාගත මෙහෙණ ගෙණවුත් බහා තැබූවක සෙයින් ස්වර්ගයෙහි (උපදනී) වෙයි.

**5. 3 2. 6.**

**[වණ්ණසූත්‍රය]**

**[සැවැත්නිදානයි]**

**16**. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත මෙහෙණ ගෙණවුත් තැබූවක සෙයින් නිරයෙහි (උපදනී) වෙයි. කවර පසෙකින යත්:

නො දැන නො විමසා අවර්ණාර්හයාට (ගුණනැත්තාහට) වර්ණ (ගුණ) බෙණෙයි, නො දැන නො විමසා වර්ණාර්හයාට (ගුණැත්තාහට) අවර්ණ (අගුණ) බෙණෙයි, නො දැන නො විමසා නො පැහැදිය යුතු තන්හි ප්‍රසාදය උපදවයි. නො දැන නො විමසා පැහැදිය යුතු තන්හි අප්‍රසාදය උපදවයි. ශ්‍රද්ධාදෙයය (සැදැහැයෙන් දුන් දෙය) විනිපාතන (නසාලීම්) කෙරෙයි.

මහණෙනි, මේ පඤ්ච ධර්මයෙන් සමන්වාගත මෙහෙණ ගෙණවුත් බහා තැබූවක සෙයින් නිරයෙහි (උපදනී) වෙයි.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසෙති, අනුවිච්ච පරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති, සද්ධාදෙය්‍යං න විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙති.

## 5 3. 2. 7.

## [ඉස්සුකීසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**17**. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති, අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති, ඉස්සුකිනී ච හොති, මච්ඡරිනී ච, සද්ධාදෙය්‍යං විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති, අනිස්සුකී ච හොති, අමච්ඡරිනී ච, සද්ධාදෙය්‍යං න විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙති.

## 5. 3. 2. 8.

## [මිච්ඡාදිට්ඨිකසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**18**. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති, අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති, මිච්ඡාදිට්ඨිකා ච හොති, මිච්ඡාසඞ්කප්පා ච, සද්ධාදෙය්‍යං විනිපාතෙති.

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්වාගත මෙහෙණ ගෙණවූත් තැබූවක සෙයින් ස්වර්ගයෙහි (උපදනී) වෙයි. කවර පසෙකින යත්:

දැනැ (කරුණු) විමසා අවර්ණාර්හයාට අවර්ණ බෙණෙයි, දැනැ විමසා වර්ණාර්හයාට වර්ණ බෙණෙයි, දැනැ විමසා නො පැහැදිය යුතු තන්හි අප්‍රසාදය උපදවයි, දැනැ විමසා පැහැදිය යුතු තන්හි ප්‍රසාදය උපදවයි, ශ්‍රද්ධාදෙයය (සැදැහැයෙන් දුන් දැය) විනිපාතන (විනාශ) නො කෙරෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්වාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක එසෙයින් ස්වර්ගයෙහි වේ යයි.

### 5. 3. 2. 7.

### [ඉස්සුකිනීසූත්‍රය]

[සැවැත්නිදනයි]

**17**. මහණෙනි, ධර්ම පසෙකින් සමන්වාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් නිරයෙහි වෙයි. කවර පසෙකින යත්:

නො දැනැ නො විමසා අවර්ණාර්හයාට ගුණ කියයි, නො දැනැ නො විමසා වර්ණාර්හයාට නුගුණ කියයි. ඊර්ෂ්‍යා ඇත්තී ද වෙයි, මාත්සර්‍ය්‍ය ඇත්තී ද වෙයි, ශ්‍රද්ධාදෙයය විනිපාතන කෙරෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්වාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් නිරයෙහි වෙයි.

මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් ස්වර්ගයෙහි වෙයි. කවර පසෙකින යත්:

දැනැ විමසා අවර්ණාර්හයාට අවර්ණ කියයි, දැනැ විමසා වර්ණාර්හයාට වර්ණ කියයි, ඊර්ෂ්‍යා නැත්තී ද වෙයි, මාත්සර්‍ය්‍ය නැත්තී ද වෙයි, ශ්‍රද්ධාදෙයය විනිපාතන නො කෙරෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්වාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් ස්වර්ගයෙහි වේ යයි.

### 5. 3. 2. 8.

### [මිච්ඡාදිට්ඨිකසූත්‍රය]

[සැවැත්නිදනයි]

**18**. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් නිරයෙහි වෙයි. කවර පසෙකින යත්:

නො දැනැ නො විමසා ගුණ නො වැණිය යුතුවහුගේ ගුණ කියයි. නො දැනැ නො විමසා ගුණ වැණිය යුතුවහුගේ අගුණ කියයි. මිසදිටු ඇත්තී ද වෙයි. මිථ්‍යාසංකල්ප ඇත්තී ද වෙයි. ශ්‍රද්ධාදෙයය විනිපාතන කෙරෙයි.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති, සම්මාදිට්ඨිකා ච හොති, සම්මාසඞ්කප්පා ච, සද්ධාදෙය්‍යං න විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙති.

## 5. 3. 2. 9.

## [මිච්ඡාවාචා සුත්තං]

[සාවත්ථිනිදානං]

**19**. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති, අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති, මිච්ඡාවාචා ච හොති, මිච්ඡාකම්මන්තා ච, සද්ධාදෙය්‍යං විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති, සම්මාවාචා ච හොති, සම්මාකම්මන්තා ච, සද්ධාදෙය්‍යං න විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙති.

## 5. 3. 2. 10.

## [මිච්ඡාවායාම සුත්තං]

[සාවත්ථිනිදානං]

**20**. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති, අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති, මිච්ඡාවායාමා ච හොති, මිච්ඡාසතිනී ච, සද්ධාදෙය්‍යං විනිපාතෙති.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍ාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් නිරයෙහි වෙයි.

මහණෙනි, කරුණු පසෙකින් යුත් මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් සවර්ගයෙහි වෙයි. කවර පසෙකින යත්:

නුවණින් දැනැ කරුණු විමසා නුගුණ කියයුත්තාහට නුගුණ කියයි. දැනැ කරුණු විමසා ගුණ කියයුත්තාහට ගුණ කියයි. සම්‍යග්දෘෂ්ටි ඇත්තී ද වෙයි. සම්‍යක්සංකල්ප ඇත්තී ද වෙයි. ශ්‍රද්ධාදෙයය විනිපාතන නො කෙරෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් යුත් මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සේ සවර්ගයෙහි වේ ය යි.

## 5. 3. 2 9.

## [මිච්ඡාවාචා සූත්‍රය]

[සැවැත්නිදනයි]

19. මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍ාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් නිරයෙහි වෙයි. කවර පසෙකින යත්:

නො දැනැ කරුණු නො විමසා අවර්ණාර්හයාගේ ගුණ වර්ණනය කියයි. නො දැනැ කරුණු නො විමසා වර්ණාර්හයාගේ අවර්ණය කියයි. මිථ්‍යාවචන ඇත්තී වෙයි. මිථ්‍යාකර්මාන්ත ඇත්තී වෙයි. ශ්‍රද්ධාදෙයය විනිපාතන කරයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍ාගත භික්‍ෂුණී ගෙණවූත් බහා තැබූවක සෙයින් නිරයෙහි (උපදනී) වෙයි.

මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍ාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් සවර්ගයෙහි (උපදනී) වෙයි. කවර පසෙකින යත්:

දැනැ කරුණු විමසා අවර්ණාර්හයාගේ අවර්ණය කියයි. දැනැ කරුණු විමසා වර්ණාර්හයාගේ ගුණ කියයි. සම්‍යග්වචන ඇත්තී වෙයි. සම්‍යක්කර්මාන්ත ඇත්තී ද වෙයි. ශ්‍රද්ධාදෙයය විනිපාතන නො කරයි.

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍ාගත මෙහෙණ ගෙණවූත් බහා තැබූවක සෙයින් සවර්ගයෙහි උපදිනී වේ ය යි.

## 5. 3. 2. 10.

## [මිච්ඡාවායාම සූත්‍රය]

[සැවැත්නිදනයි]

20. මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍ාගත භික්‍ෂුණී ගෙණවූත් බහා තැබූවක සෙයින් නිරයෙහි (උපදනී) වෙයි. කවර පසෙකින යත්:

නො දැන කරුණු නො විමසා අවර්ණාර්හයාගේ ගුණ කියයි. නො දැන කරුණු නො විමසා වර්ණාර්හයාගේ නුගුණ කියයි. මිථ්‍යාව්‍යායාම ඇත්තී ද වෙයි. මිථ්‍යාස්මෘති ඇත්තී ද වෙයි. ශ්‍රද්ධාදෙයය විනිපාතන කෙරෙයි.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති, සම්මාවායාමො ච හොති, සම්මාසතිනී ච, සද්ධාදෙය්‍යං න විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙති.

**අන්ධකවින්දවග්ගො දුතියො.**

**තස්සුද්දානං:**

කුලූපගො, පච්ඡාසමණො සමාධි අන්ධකවින්දං
මච්ඡරී වණ්ණනා ඉස්සා දිට්ඨිවාචාය වායාමාති.[1]

1. වායාමො - සීමු.

මහණෙනි, මේ ධර්ම පසින් සමන්වාගත භික්ෂුණී ගෙණවුත් බහා තැබූවක සෙයින් නිරයෙහි වෙයි.

මහණෙනි, කරුණු පසෙකින් යුත් භික්ෂුණී ගෙණවුත් බහා තැබූවක සේ ස්වර්ගයෙයි වෙයි. කවර පසෙකින යත්·

දැනැ කරුණු විමසා අවර්ණාර්හයාගේ නුගුණ කියයි. දැනැ කරුණු විමසා වර්ණාර්හයාගේ ගුණ කියයි. සම්‍යග්ව්‍යායාම ඇත්තී ද වෙයි. සම්‍යක්සමාධි ඇත්තී ද වෙයි. ශ්‍රද්ධාදෙයය විනිපාතන නො කෙරෙයි.

මහණෙනි, මේ කරුණු පසින් සමන්වාගත භික්ෂුණී ගෙණවුත් බහා තැබූවක සෙයින් ස්වර්ගයෙහි (උපදනී) වේ ය යි.

**අන්ධකවින්දවග්ගය දෙවැනි යි.**

**එහි උද්දානය:**

කුලූපග සූත්‍රය, පච්ඡාසමණ සූත්‍රය, සම්මාසමාධි සූත්‍රය, අන්ධකවින්ද සූත්‍රය, මච්ඡරිනී සූත්‍රය, වණ්ණ සූත්‍රය, ඉස්සුකී සූත්‍රය, මිච්ඡාදිට්ඨික සූත්‍රය, මිච්ඡාවාචා සූත්‍රය, මිච්ඡාවායාම සූත්‍රය යි සූත්‍ර දශයෙකි.

# 3. ගිලානවග්ගො

## 5. 3. 3. 1

## [ගිලානසුත්තං]

**21.** එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ **කූටාගාරසාලායං.** අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන ගිලානසාලා තෙනුපසඞ්කමි. අද්දසා ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං දුබ්බලං ගිලානකං. දිස්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි:

යං කඤ්චි[1] භික්ඛවෙ දුබ්බලං[2] ගිලානකං පඤ්ච ධම්මා න විජහන්ති, තස්සෙතං පාටිකඞ්ඛං: න චිරස්සෙව ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛු අසුභානුපස්සී කායෙ විහරති, ආහාරෙ පටික්කූලසඤ්ඤී, සබ්බලොකෙ අනභිරතසඤ්ඤී, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී, මරණසඤ්ඤා ඛො පනස්ස අජ්ඣත්තං සූපට්ඨිතා හොති.

යං කඤ්චි[1] භික්ඛවෙ දුබ්බලං[2] ගිලානකං ඉමෙ පඤ්ච ධම්මා න විජහන්ති, තස්සෙතං පාටිකඞ්ඛං: න චිරස්සෙව ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති.

## 5. 3. 3. 2.

## [සතිසූපට්ඨිතසුත්තං]

[සාවත්ථි නිදානං]

**22.** යො හි කොචි භික්ඛවෙ භික්ඛු වා භික්ඛුනී වා පඤ්ච ධම්මෙ භාවෙති, පඤ්ච ධම්මෙ බහුලීකරොති, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛුනො අජ්ඣත්තං යෙව සති සූපට්ඨිතා හොති, ධම්මානං උදයත්ථගාමිනියා පඤ්ඤාය අසුභානුපස්සී කායෙ විහරති, ආහාරෙ පටික්කූලසඤ්ඤී, සබ්බලොකෙ අනභිරතසඤ්ඤී, සබ්බසංඛාරෙසු අනිච්චානුපස්සී.

යො හි කොචි භික්ඛවෙ භික්ඛු වා, භික්ඛුනී වා, ඉමෙ පඤ්ච ධම්මෙ භාවෙති, ඉමෙ පඤ්ච ධම්මෙ බහුලීකරොති, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා.

1. යංකිඤ්චි - සතා. 2. භික්ඛුං දුබ්බලං - මජසං.

# 3. ගිලාන වග්ගය

## 5. 3. 3. 1.

### [ගිලාන සූත්‍රය]

**21**. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **විසාලායෙහි** මහාවනයෙහි වූ **කූටාගාරසාලායෙහි** වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පිළිසලතින් නැගී සිටි සේක් ගිලන්හල කරා වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ එක්තරා දුබල ගිලන් මහණකු දුටු සේක. දැක පැන්වූ අස්නෙහි වැඩහුන්සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ මහණුන් ඇමතූ සේක:

මහණෙනි, පඤ්චධර්ම කෙනෙක් යම් කිසි දුබල ගිලනක්හු නොපියා සිටිත් නම්, ඔහු විසින් නොබෝකලෙකින් ම ආස්‍රවයන්ගේ ක්‍ෂය වීමෙන් ආස්‍රව රහිත වූ චිත්තවිමුක්තිය ද, ප්‍රඥාවිමුක්තිය ද තෙමේ දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වාස කරන්නේ ය යන මෙල කාරණ කැමැති විය යුතු යි. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කාරජකායයෙහි අශුභය නුවණින් දක්මින් වෙසෙයි. ආහාරයෙහි ප්‍රතිකූලසංඥා ඇතියේ, හැම ලොව්හි අනභිරතසංඥා ඇතියේ, හැම සංස්කාරයෙහි අනිත්‍යානුදර්ශීව වෙසෙයි. මරණසංඥාව ඔහුගේ සිත්හි මොනොවට එළඹ සිටියා වෙයි.

මහණෙනි, මේ පඤ්ච ධර්මයෝ යම් කිසි දුබල ගිලනක්හු නො පියා සිටිත් නම්, ඔහු විසින් නොබෝකලෙකින් ම ආස්‍රව ක්‍ෂය වීමෙන් ආස්‍රව රහිත වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය තෙමේ දැන පසක් කොට එයට පැමිණ වාස කරන්නේ ය යන මෙල කාරණ කැමැති විය යුතු යි.

## 5. 3. 3. 2.

### [සතිසූපට්ඨිත සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**22**. මහණෙනි, යම් කිසි මහණෙක් වේවයි, මෙහෙණක් වේවයි, කරුණු පසක් වඩා නම්, කරුණු පසක් බහුල කෙරේ නම්, ඔහු විසින් ඉහාත්මයෙහි ම අර්හත්ත්වය හෝ උපාදිශෙෂයක් ඇතිවත් ම අනාගාමිත්වය හෝ යන උභය ඵලයන් අතුරෙන් අන්‍යතර ඵලයෙක් කැමැති විය යුතු. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ අධ්‍යාත්මයෙහි ම සමෘතිය මැනැවින් එළැඹ සිටියා වෙයි. සකන්ධධර්මයන්ගේ උදයව්‍යය පිරිසිඳිනට සමර්ථ වූ ප්‍රඥායෙන් කායෙහි අශුභානුදර්ශී වූයේ, ආහාරයෙහි ප්‍රතිකූලසංඥා ඇතියේ, හැම ලොව්හි අනභිරතසංඥා ඇතියේ, සර්වසංස්කාරයෙහි අනිත්‍යානුදර්ශී ව වෙසෙයි.

මහණෙනි, යම් කිසි මහණෙක් වේවයි, මෙහෙණක් වේවයි, මේ පඤ්චධර්මයන් වඩනේ ද, මේ පඤ්චධර්මයන් බහුල කෙරේ ද, ඔහු විසින් ඉහාත්මයෙහි ම අර්හත්ත්වය හෝ උපාදිශෙෂයක් ඇති වත් ම අනාගාමිත්වය හෝ යන උභය ඵලයන්ගෙන් අන්‍යතර ඵලයෙක් කැමැති විය යුතු යි.

## 5. 3. 3. 3

### [දූපට්ඨාකගිලානසුත්තං]

[සාවත්ථිනිදානං]

**23.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ගිලානො දූපට්ඨාකො[1] හොති. කතමෙහි පඤ්චහි:

අසප්පායකාරී හොති. සප්පායෙ මත්තං න ජානාති. භෙසජ්ජං න පටිසෙවිතා හොති. අත්ථකාමස්ස ගිලානුපට්ඨාකස්ස න යථාභූතං ආබාධං ආවීකත්තා හොති: අභික්කමන්තං වා අභික්කමතීති, පටික්කමන්තං වා පටික්කමතීති ඨිතං වා ඨිතො'ති. උප්පන්නානං වා සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අනධිවාසකජාතිකො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ගිලානො දූපට්ඨාකො හොති.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ගිලානො සූපට්ඨාකො හොති. කතමෙහි පඤ්චහි:

සප්පායකාරී හොති. සප්පායෙ මත්තං ජානාති. භෙසජ්ජං පටිසෙවිතා හොති. අත්ථකාමස්ස ගිලානුපට්ඨාකස්ස යථාභූතං ආබාධං ආවීකත්තා හොති: අභික්කමන්තං වා අභික්කමතීති, පටික්කමන්තං වා පටික්කමතීති, ඨිතං වා ඨිතොති. උප්පන්නානං වා සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ගිලානො සූපට්ඨාකො හොතීති.

## 5. 3. 3. 4.

### [ගිලානුපට්ඨාකසුත්තං]

[සාවත්ථිනිදානං]

**24.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ගිලානුපට්ඨාකො නාලං ගිලානං උපට්ඨාතුං. කතමෙහි පඤ්චහි:

න පටිබලො හොති භෙසජ්ජං සංවිධාතුං. සප්පායාසප්පායං න ජානාති, අසප්පායං උපනාමෙති, සප්පායං අපනාමෙති. ආමිසන්තරො ගිලානං උපට්ඨහති නො මෙත්තචිත්තො. ජෙගුච්ඡී හොති උච්චාරං වා පස්සාවං වා වන්තං වා ඛෙළං වා නීහරිතුං. න පටිබලො[2] හොති ගිලානං කාලෙන කාලං ධම්මියා කථාය සන්දස්සෙතුං සමාදපෙතුං සමුත්තෙජෙතුං සම්පහංසෙතුං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ගිලානුපට්ඨාකො නාලං ගිලානං උපට්ඨාතුං.

---

1. දුපට්ඨාකො - PTS,ස්‍යා. 2. නප්පටිබලො - මජසං.

### 5. 3. 3. 3.

### [දුපට්ඨාක ගිලාන සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**23**. මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත ගිලන් තෙමේ උවටනට නො පහසු වෙයි. කවර පසෙකින යත්:

අසත්‍ප්‍රාය (ලෙඩට අහිත) දෑ කරණ සුලුයේ වෙයි. සත්‍ප්‍රායයෙහි (හිත දෑහි) පමණ නොදන්නේ වෙයි. බෙහෙසද් නො සෙවුනේ වෙයි. හිත කැමැති ගලානොපස්ථායකහට වැඩෙන රොගය වැඩේ ය යි ද සන්හිඳුනා රොගය සන්හිඳේ ය යි ද පවත්නා රොගය හෝ පවත්නේ ය යි ද යථාභූත ආබාධය පාළ නො කරණුයේ වෙයි. උපන් දුක් වූ තීව්‍ර වූ රළු වූ කටුක වූ අමධුර වූ අමනාප වූ ප්‍රාණහර වූ ශාරීරික වෙදනාවන් නො ඉවසන සුලුයේ වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත ගිලන් තෙමේ උවටනට නො පහසු වෙයි.

මහණෙනි, පඤ්චධර්මයෙකින් සමන්‍වාගත ගිලන් තෙමේ උවටනට පහසු වෙයි. කවර පසෙකින යත්:

සත්‍ප්‍රායකාරී වෙයි. සත්‍ප්‍රායයෙහි පමණ දන්නේ වෙයි. බෙහෙසද් සෙවුනේ වෙයි. හිත කැමැති ගලානොපස්ථායකයාට වැඩෙන රොගය වැඩේ ය යි ද සන්හිඳුනා රොගය සන්හිඳේ ය යි ද ස්ථිත රොගය ස්ථිත ය යි ද යථාභූත ආබාධය පාළ කරණුයේ වෙයි. උපන් දුක් වූ තීව්‍ර වූ රළු වූ කටුක වූ අමධුර වූ අමනාප වූ ප්‍රාණහර වූ ශාරීරික වෙදනාවන් ඉවසන සැහැවි ඇතියේ වෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත ගිලන් තෙමේ උවටනට පහසු වූයේ වෙයි.

### 5. 3. 3. 4.

### [ගිලානූපට්ඨාක සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**24**. මහණෙනි, පඤ්ච ධර්මයෙකින් සමන්‍වාගත ගලානොපස්ථායක ගිලන් උවටනට නො නිසි වෙයි. කවර පසෙකින යත්:

බෙහෙසද් සංවිධාන කරන්නට ප්‍රතිබල නො වෙයි. සත්‍ප්‍රාය දෑ හා අසත්‍ප්‍රාය දෑ නො දන්නේ අසත්‍ප්‍රාය දෑ එළවයි, සත්‍ප්‍රාය දෑ බැහැර කෙරෙයි. මෛත්සිත් නැතියේ ලාභාපෙක්‍ෂා ඇතියේ ගිලනා වටයි. මල හෝ මූ හෝ වමන හෝ කෙළ හෝ බැහැර ලන්නට ජුගුප්සා ඇතියේ වෙයි. කලින් කල ගිලනහු දැහැමි කථායෙන් කරුණු දක්වන්නට හෝ සමාදන් කරවන්නට හෝ තෙද ගන්වන්නට හෝ පහන් කරවන්නට හෝ ප්‍රතිබල නො වෙයි.

මහණෙනි, මෙ පඤ්ච ධර්මයෙන් සමන්‍වාගත ගලානොපස්ථායක ගිලනුන් උවටනට නො නිසි වෙයි.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ගිලානුපට්ඨාකො අලං ගිලානං උපට්ඨාතුං. කතමෙහි පඤ්චහි:

පටිබලො හොති භෙසජ්ජං සංවිධාතුං. සප්පායාසප්පායං ජානාති, අසප්පායං අපනාමෙති, සප්පායං උපනාමෙති. මෙත්තචිත්තො ගිලානං උපට්ඨහති නො ආමිසන්තරො. අජෙගුච්ඡී හොති උච්චාරං වා පස්සාවං වා වන්තං වා ඛෙලං වා නීහරිතුං. පටිබලො හොති ගිලානං කාලෙන කාලං ධම්මියා කථාය සන්දස්සෙතුං සමාදපෙතුං සමුත්තෙජෙතුං සම්පහංසෙතුං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ගිලානුපට්ඨාකො අලං ගිලානං උපට්ඨාතුන්ති.

## 5. 3. 3. 5.

## [පඨම ආයුස්සසුත්තං]

[සාවත්ථිනිදානං]

**25**. පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා අනායුස්සා. කතමෙ පඤ්ච:

අසප්පායකාරී හොති, සප්පායෙ මත්තං න ජානාති, අපරිනත-භොජී[1] ච හොති, අකාලචාරී ච හොති, අබ්‍රහ්මචාරී ච. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා අනායුස්සා.

පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා ආයුස්සා. කතමෙ පඤ්ච:

සප්පායකාරී හොති, සප්පායෙ මත්තං ජානාති, පරිනතභොජී ච හොති, කාලචාරී ච හොති, බ්‍රහ්මචාරී ච. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා ආයුස්සා ති.

## 5. 3. 3. 6.

## [දුතිය ආයුස්සසුත්තං]

[සාවත්ථිනිදානං]

**26**. පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා අනායුස්සා. කතමෙ පඤ්ච:

අසප්පායකාරී හොති, සප්පායෙ මත්තං න ජානාති, අපරිනතභොජී ච හොති, දුස්සීලො ච, පාපමිත්තො ච. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා අනායුස්සා.

පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා ආයුස්සා. කතමෙ පඤ්ච:

සප්පායකාරී හොති, සප්පායෙ මත්තං ජානාති, පරිනතභොජී ච හොති, සීලවා ච, කල්‍යාණමිත්තො ච. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා ආයුස්සා ති.

---

1. අපරිණතභොගීච - සීමු.

මහණෙනි, පඤ්ච ධර්මයෙකින් සමන්‍වාගත ගිලානොපස්ථායක ගිලනුන් වටනට නිස්සේ වෙයි. කවර පසෙකින යත්:

බෙහෙසද් සංවිධාන කිරීමට ප්‍රතිබල වෙයි. සතප්‍රාය හා අසතප්‍රාය හා දන්නේ අසතප්‍රාය දූ බැහැර කරයි, සතප්‍රාය එළවයි. ලාභාපෙක්‍ෂා නැතියේ මෛත්සිතැතියේ ගිලන්හු වටයි. මල හෝ මූ හෝ වමන හෝ කෙළ හෝ බැහැර ලනුවට ජුගුප්සා නැතියේ වෙයි. කලින් කල ගිලනහු දැහැමි කථායෙන් කරුණු ගන්වන්නට සමාදන් කරවන්නට උත්සුක කරවන්නට පහදවන්නට ප්‍රතිබල වෙයි.

මහණෙනි, මෙ පඤ්චධර්මයෙන් සමන්‍වාගත ගිලානොපස්ථායකයා ගිලනුන් වටනට නිසි වේ ය යි.

**5. 3. 3. 5.**

**[ප්‍රථම අනායුස්ස සූත්‍රය]**

**[සැවැත්නිදාන යි]**

**25.** මහණෙනි, මේ අනායුෂ්‍ය (ආයු හිතනොවූ) ධර්ම පසෙකි. කවර පසෙක යත්:

අසතප්‍රායකාරී වෙයි, සතප්‍රායයෙහි මාත්‍රා නො දන්නේ ය, අපරිණත හොජී (ගත් අහර නොදිරූ කල්හි අනුභව කරන්නේ) ද වෙයි, නොකල්හි හැසිරුණුයේ වෙයි, බ්‍රහ්මචර නැතියේ ද වෙයි. මහණෙනි, මේ අනායුෂ්‍යධර්ම පස යි.

මහණෙනි, මේ ආයුෂ්‍ය (ආයුෂට හිතකර) ධර්ම පසෙකි. කවර පසෙක යත්:

සතප්‍රායකාරී වේ, සතප්‍රායයෙහි මාත්‍රා දන්නේ ය, පරිණතහොජී ද වෙයි, කල්හි හැසිරෙණුයේ ද වෙයි, බ්‍රහ්මචර ඇතියේ ද වෙයි. මහණෙනි, මේ ආයුෂ්‍ය ධර්ම පස යි.

**5. 3. 3. 6.**

**[ද්විතීය අනායුස්ස සූත්‍රය]**

**[සැවැත්නිදාන යි]**

**26.** මහණෙනි, මෙ අනායුෂ්‍ය ධර්ම පසෙකි. කවර පසෙක යත්:

අසතප්‍රායකාරී වෙයි, සතප්‍රායයෙහි මාත්‍රා නො දනී, අපරිණතහොජී ද වෙයි, දුශ්ශීල ද වෙයි, පවිටු මිතුරන් ඇතියේ ද වේ. මහණෙනි, මේ අනායුෂ්‍ය ධර්ම පස යි.

මහණෙනි, මේ ආයුෂ්‍ය ධර්ම පසෙකි. කවර පසෙක යත්:

සතප්‍රායකාරී වෙයි, සතප්‍රායයෙහි පමණ දනී, පරිණතහොජී ද වෙයි. සිල්වත් ද වෙයි, කලණමිතුරන් ඇතියේ ද වේ. මහණෙනි, මේ ආයුෂ්‍ය ධර්ම පස යි.

5. 3. 3. 7.

[වපකාසසුත්තං]

[සාවත්ථිනිදානං]

**27**. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු නාලං සඞ්ඝම්හා වපකාසිතුං. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අසන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන, අසන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, අසන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, අසන්තුට්ඨො හොති ඉතරීතරෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, කාමසඞ්කප්පබහුලො ච විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු නාලං සඞ්ඝම්හා වපකාසිතුං.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං සඞ්ඝම්හා වපකාසිතුං. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන, සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, සන්තුට්ඨො හොති ඉතරීතරෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, නෙක්ඛම්මසඞ්කප්පබහුලො ච විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං සඞ්ඝම්හා වපකාසිතුන්ති.

5. 3. 3. 8

[සමණදුක්ඛ - සුඛ සුත්තං]

[සාවත්ථිනිදානං]

**28. පඤ්චිමානි භික්ඛවෙ සමණදුක්ඛානි. කතමානි පඤ්ච:**

ඉධ භික්ඛවෙ භික්ඛු අසන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන, අසන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, අසන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, අසන්තුට්ඨො හොති ඉතරීතරෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, අනභිරතො ච බ්‍රහ්මචරියං චරති. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සමණදුක්ඛානි.

පඤ්චිමානි භික්ඛවෙ සමණසුඛානි. කතමානි පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන, සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, සන්තුට්ඨො හොති ඉතරීතරෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, අභිරතො ච බ්‍රහ්මචරියං චරති. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සමණසුඛානී ති.

5. 3. 3. 7.

[වපකාස සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**27**. මහණෙනි, ධර්ම පසෙකින් සමන්වාගත මහණ සඟුන් කෙරෙන් වියෝ ව වසන්නට නො හිසි වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඉතරෙතර චීවරයෙන් (ලද පරිදි යම් මැ සිවුරකින්) නොසතුටු වෙයි. ඉතරෙතර පිණ්ඩපාතයෙන් නොසතුටු වෙයි. ඉතරෙතර ශයනාසනයෙන් නොසතුටු වෙයි. ඉතරෙතර ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙන් නොසතුටු වෙයි. කාමසංකල්ප-බහුල ව ද වෙසෙයි.

මහණෙනි, මෙ පඤ්ච ධර්මයෙන් සමන්වාගත මහණ සඟුන් කෙරෙන් වියෝ ව වසන්නට නො හිසි වේ ය යි.

මහණෙනි, පඤ්ච ධර්මයෙකින් සමන්වාගත මහණ සඟුන් කෙරෙන් වියෝ ව වසන්නට හිසි වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඉතරෙතර චීවරයෙන් සතුටු වෙයි. ඉතරෙතර පිණ්ඩපාතයෙන් සතුටු වෙයි. ඉතරෙතර ශයනාසනයෙන් සතුටු වෙයි. ඉතරෙතර ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍ය පරිෂ්කාරයෙන් සතුටු වෙයි. නෛෂ්ක්‍රම්‍යසංකල්ප බහුල ව ද වෙසේ.

මහණෙනි, මෙ පඤ්චධර්මයෙන් සමන්වාගත මහණ සඟුන් කෙරෙන් වියෝ ව වසන්නට හිසි වේ ය යි.

5. 3. 3. 8.

[සමණදුක්ඛ - සුඛ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**28**. මහණෙනි, මේ මහණදුක් පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඉතරෙතර චීවරයෙන් නොසතුටු වෙයි. ඉතරෙතර පිණ්ඩපාතයෙන් නොසතුටු වෙයි. ඉතරෙතර ශයනා-සනයෙන් නොසතුටු වෙයි. ඉතරෙතරග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර-යෙන් නොසතුටු වෙයි. සස්නෙහි ඇලුම් නැති ව බඹසර සරයි. මහණෙනි, මේ මහණදුක් පස යි.

මහණෙනි, මෙ මහණ සුව පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඉතරෙතර චීවරයෙන් සතුටු වෙයි. ඉතරෙතර පිණ්ඩපාතයෙන් සතුටු වෙයි. ඉතරෙතර ශයනාසනයෙන් සතුටු වෙයි. ඉතරෙතර ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයෙන් සතුටු වෙයි. සස්නෙහි ඇලුම් ඇති ව බ්‍රහ්මසර ද හැසිරෙයි. මහණෙනි, මේ මහණසුව පස යි.

## 5. 3. 3. 9.

### [පරිකුප්පසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**29.** පඤ්චිමෙ භික්ඛවෙ ආපායිකා නෙරයිකා පරිකුප්පා අතෙකිච්ඡා. කතමෙ පඤ්ච:

මාතා ජීවිතා වොරොපිතා හොති, පිතා ජීවිතා වොරොපිතො හොති, අරහං[1] ජීවිතා වොරොපිතො හොති, තථාගතස්ස දුට්ඨෙන චිත්තෙන ලොහිතං උප්පාදිතං හොති, සඞ්ඝො භින්නො හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආපායිකා නෙරයිකා පරිකුප්පා අතෙකිච්ඡා ති.

## 5. 3. 3. 10.

### [සම්පදාසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**30.** පඤ්චිමානි භික්ඛවෙ බ්‍යසනානි. කතමානි පඤ්ච:

ඤාතිබ්‍යසනං, භොගබ්‍යසනං, රොගබ්‍යසනං, සීලබ්‍යසනං, දිට්ඨිබ්‍යසනං.

න භික්ඛවෙ සත්තා ඤාතිබ්‍යසනහෙතු වා භොගබ්‍යසනහෙතු වා රොගබ්‍යසනහෙතු වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.[2]

සීලබ්‍යසනහෙතු වා භික්ඛවෙ සත්තා දිට්ඨිබ්‍යසනහෙතු වා
කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.[2]

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච බ්‍යසනානි.

පඤ්චිමා භික්ඛවෙ සම්පදා. කතමා පඤ්ච:

ඤාතිසම්පදා, භොගසම්පදා, ආරොග්‍යසම්පදා, සීලසම්පදා, දිට්ඨිසම්පදා.

න භික්ඛවෙ සත්තා ඤාතිසම්පදාහෙතු වා භොගසම්පදාහෙතු වා ආරොග්‍යසම්පදාහෙතු වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

සීලසම්පදාහෙතු වා භික්ඛවෙ සත්තා දිට්ඨිසම්පදාහෙතු වා
කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

ඉමා ඛො භික්ඛවෙ පඤ්ච සම්පදා ති.

### ගිලානවග්ගො තතියො.

**තස්සුද්දානං:**

1. ගිලානො සතිපට්ඨානං ද්වෙ උපට්ඨාකා ද්වායුසා
වපකාසසමණසුඛානි පරිකුප්පො ච සම්පදාති.

---

1. අරහං - සයා  2. උපපජ්ජන්ති - සීමු.

## 5. 3. 3. 9.

## [පරිකුප්ප සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**29**. මහණෙනි, මේ අපායගාමීහු නිරයගාමීහු පරිකොප්‍ය (කිපෙන සැහැවි ඇති) වූවාහු පිළියම් නොකට හැකියාහු පස් දෙනෙකි. කවර පස් දෙනක යත්:

මව දිවියෙන් තොර කරණ ලද වෙයි, පියා දිවියෙන් තොර කරණ ලද වෙයි, අර්හත් දිවියෙන් තොර කරණ ලද වෙයි, දුෂ්ටචිත්තයෙන් තථාගතයන්ගේ ලෙහෙ උපදවන ලද වෙයි, සඞ්ඝයා බිඳින ලද වේ.

මහණෙනි, මොහු පස්දෙන අපායගාමීහු නිරයගාමීහු පරිකොප්‍ය (පැරැණි වණයන් වැනි) වූවාහු පිළියම් නොකට හැකියාහු වෙත් ය යි.

## 5. 3. 3. 10.

## [සම්පදා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**30**. මහණෙනි, මේ ව්‍යසන (විපත්) පසෙකි. කවර පසෙක යත්:

ඥාතිව්‍යසනය, භොගව්‍යසනය, රොගව්‍යසනය, ශීලව්‍යසනය, දෘෂ්ටිව්‍යසන යි.

මහණෙනි, සත්ත්වයෝ ඥාතිව්‍යසනහෙතුවින් වේවයි, භොගව්‍යසනහෙතුවින් වේවයි, රොගව්‍යසනහෙතුවින් වේවයි, කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට නො පැමිණෙත්.

මහණෙනි, ශීලව්‍යසනහෙතුවින් වේවයි, දෘෂ්ටිව්‍යසනහෙතුවින් වේවයි සත්ත්වයෝ කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණෙත්.

මහණෙනි, මේ ව්‍යසන පස යි.

මහණෙනි, මෙ සම්පත් පසෙකි. කවර පසෙක යත්:

ඥාතිසම්පද් හා භොගසම්පද් හා ආරොග්‍යසම්පද් හා ශීලසම්පද් හා දෘෂ්ටිසම්පද් හා යැ.

මහණෙනි, සත්ත්වයෝ ඥාතිසම්පද්හෙතුවින් වේවයි, භොගසම්පද්හෙතුවින් වේවයි, ආරොග්‍යසම්පද්හෙතුවින් වේවයි කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට නො පැමිණෙත්.

මහණෙනි, සත්ත්වයෝ ශීලසම්පද්හෙතුවින් හෝ දෘෂ්ටිසම්පද්හෙතුවින් හෝ කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණෙත්.

මහණෙනි, මේ සම්පත් පස යි.

### ගිලාන වර්ගය තුන් වැනි යි.

**එහි උද්දානය:**

ගිලාන සූත්‍ර ය, සතිසූපට්ඨිත සූත්‍ර ය, උපට්ඨාක සූත්‍ර දෙක ය, අනායුස්ස සූත්‍ර දෙක ය, වපකාස සූත්‍ර ය, සමණසුඛ සූත්‍ර ය, පරිකුප්ප සූත්‍ර ය, සම්පදා සූත්‍රය දැ යි සූත්‍ර දශයෙකි.

# 4. රාජවග්ගො

## 5. 3. 4. 1.

## [පඨමචක්කානුවත්තනසුත්තං]

### [සාවත්ථිනිදානං]

**31.** පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රාජා චක්කවත්ති ධම්මෙනෙව චක්කං පවත්තෙති.[1] තං හොති චක්කං අප්පතිවත්තියං[2] කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පාණිනා. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ රාජා චක්කවත්ති අත්ථඤ්ඤූ ච හොති, ධම්මඤ්ඤූ ච, මත්තඤ්ඤූ ච, කාලඤ්ඤූ ච, පරිසඤ්ඤූ ච.

ඉමෙහි ඛො පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො රාජා චක්කවත්ති ධම්මෙනෙව චක්කං වත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං[2] කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පාණිනා.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මෙනෙව අනුත්තරං ධම්මචක්කං පවත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං[2] සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ තථාගතො අරහං සම්මාසම්බුද්ධො අත්ථඤ්ඤූ, ධම්මඤ්ඤූ, මත්තඤ්ඤූ, කාලඤ්ඤූ, පරිසඤ්ඤූ.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මෙනෙව අනුත්තරං ධම්මචක්කං පවත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං[2] සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

## 5. 3. 4. 2.

## [දුතියචක්කානුවත්තනසුත්තං]

### [සාවත්ථිනිදානං]

**32.** පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො චක්කවත්තිස්ස ජෙට්ඨො පුත්තො පිතරා පවත්තිතං චක්කං ධම්මෙනෙව අනුප්පවත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං[2] කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පාණිනා. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො චක්කවත්තිස්ස ජෙට්ඨො පුත්තො අත්ථඤ්ඤූ ච හොති, ධම්මඤ්ඤූ ච, මත්තඤ්ඤූ ච, කාලඤ්ඤූ ච, පරිසඤ්ඤූ ච.

---

1. වත්තෙති - සීමු. 2. අප්පටිවත්තියං - මජ්ඣං

# 4. රාජවග්ගය.

## 5. 3. 4. 1.

### [ප්‍රථම චක්කානුවත්තන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**31.** මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත සක්විති රජ (දසකුසල්) දැහැමින් ම අණසක් පවත්වයි. කිසිදු මනුෂ්‍ය වූ පසමිතුරු ප්‍රාණියකු විසින් එ අණසක් ප්‍රතිවර්තන නො කළ හැකි වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ ලොව්හි සක්විතිරජ (හෙතු සඞ්ඛ්‍යාත) අර්ථය දනුයේ ද, ප්‍රවෙණිධර්මය දනුයේ ද, (දඬුවම්හි වේවයි, කරවුවරෙහි වේවයි) මාත්‍රා දනුයේ ද, (රාජ්‍යසුඛානුභව - විනිශ්චයකරණ - චාරිකා පිළිබඳ) කාලය දනුයේ ද, (ක්‍ෂත්‍රිය-බ්‍රාහමණ-වෛශ්‍ය-ශුද්‍ර-ශ්‍රමණපර්ෂද් ආදි) පර්ෂද් දනුයේ ද වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත සක්විති රජ දැහැමින් ම අණසක් පවත්වයි. එ අණසක් වනාහි කිසිදු මනුෂ්‍ය වූ පසමිතුරු ප්‍රාණියකු විසින් ප්‍රතිවර්තන නො කළ හැකි වෙයි.

මහණෙනි, එ පරිද්දෙන් ම දහම් පසෙකින් සමන්‍වාගත තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ දැහැමින් ම (නවලොකොත්තර ධර්මයෙන්) අනුත්තර වූ ධර්මචක්‍රය පවත්වන සේක. එ ශ්‍රෙෂ්ඨචක්‍රය වනාහි ශ්‍රමණයකු විසින් වේවයි, බ්‍රාහමණයකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මාරයකු විසින් වේවයි, බ්‍රහ්මයකු විසින් වේවයි, ලොව්හි කිසිවකු විසින් වේවයි ප්‍රතිවර්තනය කළ හැකි නො වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ ලොව්හි තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ (පඤ්චවිධ) අර්ථ දන්නාහ. (සතර) ධර්මයන් දන්නාහ. (සිවුපසෙහි) මාත්‍රා දන්නාහ. (පටිසල්ලානආදි) කාල දන්නාහ. පිරිස් දන්නාහ.

මහණෙනි, මේ පඤ්චධර්මයෙන් සමන්‍වාගත තථාගත අර්හත් සම්‍යක්-සම්බුද්ධයන් වහන්සේ ධර්මයෙන් ම අනුත්තරධර්මචක්‍රය පවත්වන්නාහ. එ ධර්මචක්‍රය ශ්‍රමණයකු විසින් වේවයි, බ්‍රාහමණයකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මාරයකු විසින් වේවයි, බ්‍රහ්මයකු විසින් වේවයි, ලොව්හි කිසිවකු විසින් වේවයි ප්‍රතිවර්තන කළ හැකි නො වේ ය යි.

## 5. 3. 4. 2.

### [දෙවැනි චක්කානුවත්තන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**32.** මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත වූ සක්විති රජුගේ දෙටු පුත් පියහු විසින් පවත්වන ලද ආඥාචක්‍රය දැහැමින් ම අනුව පවත්වයි. එ අණසක් මනුෂ්‍ය වූ කිසිදු පසමිතුරු ප්‍රාණියකු විසින් ප්‍රතිවර්තන කළ හැකි නො වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ ලොව්හි සක්විති රජහුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර අර්ථඥ ද වෙයි, ධර්මඥ ද වෙයි, මාත්‍රඥ ද වෙයි, කාලඥ ද වෙයි, පර්ෂද් දන්නේ ද වේ.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො චක්කවත්තිස්ස ජෙට්ඨො පුත්තො පිතරා පවත්තිතං චක්කං ධම්මෙනෙව අනුප්පවත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං[1] කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පාණිනා.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො **සාරිපුත්තො** තථාගතෙන පවත්තිතං අනුත්තරං ධම්මචක්කං සම්මදෙව අනුප්පවත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ සාරිපුත්තො අත්ථඤ්ඤූ, ධම්මඤ්ඤූ, මත්තඤ්ඤූ, කාලඤ්ඤූ, පරිසඤ්ඤූ.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සාරිපුත්තො තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතං සම්මදෙව අනුප්පවත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං[1] සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

## 5. 3. 4. 3

## [ධම්මරාජසුත්තං]

### [සාවත්ථිනිදානං]

**33.** යො පි ඛො භික්ඛවෙ රාජා චක්කවත්ති ධම්මිකො ධම්මරාජා, සො පි න අරාජකං චක්කං වත්තෙතීති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: කො පන භන්තෙ රඤ්ඤො චක්කවත්තිස්ස ධම්මිකස්ස ධම්මරඤ්ඤො රාජා?ති. 'ධම්මො භික්ඛූ'ති භගවා අවොච.

ඉධ භික්ඛු රාජා චක්කවත්ති ධම්මිකො ධම්මරාජා ධම්මඤ්ඤෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරු[2]කරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති අන්තොජනස්මිං.

පුනචපරං භික්ඛු රාජා චක්කවත්ති ධම්මිකො ධම්මරාජා ධම්මඤ්ඤෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති ඛත්තියෙසු අනුයුත්තෙසු[3], බලකායස්මිං, බ්‍රාහ්මණගහපතිකෙසු, නෙගමජානපදෙසු, සමණබ්‍රාහ්මණෙසු, මිගපක්ඛිසු.

ස ඛො සො භික්ඛු රාජා චක්කවත්ති ධම්මිකො ධම්මරාජා ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා අන්තොජනස්මිං, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා ඛත්තියෙසු අනුයුත්තෙසු[3], බලකායස්මිං, බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමජානපදෙසු, සමණබ්‍රාහ්මණෙසු, මිගපක්ඛිසු, ධම්මෙනෙව චක්කං පවත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං[1] කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පාණිනා.

---

1. අප්පටිවත්තියං - මජසං. 2. ගරුං - මජසං. 3. අනුයන්තෙසු - මජසං.

මහණෙනි, මෙ පස් කරුණින් සමන්‍වාගත සක්විති රජුගේ දෙටුපුත් පියහු විසින් පැවැත්වූ අණසක් දැහැමින් ම අනුව පවත්වයි. එ අණසක් වනාහි මනුෂ්‍ය වූ කිසිදු පසමිතුරු ප්‍රාණියකු විසින් ප්‍රතිවර්තන කළ හැකි නො වෙයි. (ප්‍රතික්‍ෂෙප හෝ කළ නො හෙයි.)

මහණෙනි, එසෙයින් ම කරුණු පසෙකින් සමන්‍වාගත ශාරීපුත්‍ර තෙරණුවෝ තථාගතයන් වහන්සේ විසින් පවත්වන ලද අනුත්තර ධර්මචක්‍රය මැනැවින් පවත්වන්නාහ. එ ධර්මචක්‍රය වනාහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහමණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහමයකු විසින් හෝ ලොවැ වෙන කිසිවකු විසින් හෝ නො පැවැත්විය හෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි ශාරිපුත්‍රයෝ අර්ථඥයහ, ධර්මඥයහ, මාත්‍රඥයහ, කාලඥයහ, පර්ෂද් දත්නාහ.

මහණෙනි, මේ කරුණු පසින් සමන්‍වාගත ශාරිපුත්‍රයෝ තථාගතයන් වහන්සේ විසින් පවත්වන ලද අනුත්තර ධර්මචක්‍රය මනාකොට අනුව පවත්වත්. එ ධර්මචක්‍රය ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහමණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බ්‍රහමයකු විසින් හෝ ලොවැ කිසිවකු විසින් හෝ ප්‍රතිවර්තන කළ හැකි නො වෙයි. (ප්‍රතික්‍ෂෙප ද කළ නො හෙයි.)

## 5. 3. 4. 3.

## [ධම්මරාජ සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**33.** මහණෙනි, "දැහැමි වූ ධර්මරාජන් වූ යම් චක්‍රවර්ති රජෙක් වේ නම්, හෙ ද අරාජක ආඥචක්‍රය නො පවත්වා ය"යි. මෙ සෙයින් වදාළ කල්හි අන්‍යතර මහණෙක් භාග්‍යවත්හට තෙල කරුණ සැළ කෙළේ ය: "වහන්ස, ධාර්මික වූ ධර්මරාජන් වූ චක්‍රවර්ති රජහට කවරෙක් රජ වේ දැ"?යි, "මහණ, ධර්මය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

මහණ, මෙ ලොව්හි දැහැමි වූ ධර්මරාජන් වූ සක්විතිරජ ධර්මය ම නිසා ධර්මයට සත්කාර කරණුයේ ධර්මයට බුහුමන් කරණුයේ ධර්මය ධවජ කොට ඇතියේ ධර්මය කෙතු කොට ඇතියේ ධර්මය ආධිපත්‍යය කොට ඇතියේ අන්තඃපුරජනයා කෙරෙහි දැහැමි රැකවරණ ගොපන සංවිධාන කරයි.

තවද මහණ, ධාර්මික ධර්මරාජන් වූ සක්විතිරජ දහම ම නිසා ධර්මයට සත්කාර කරණුයේ ධර්මය ගුරු කරණුයේ ධර්මයට බුහුමන් කරණුයේ ධර්මය ධවජ කොට ඇතියේ ධර්මය කෙතු කොට ඇතියේ ධර්මය ආධිපත්‍යය කොට ඇතියේ අනුයුක්ත ක්‍ෂත්‍රියයන් කෙරෙහිදු, බලකාය කෙරෙහිදු, බමුණු ගැහැවියන් කෙරෙහිදු, නියම්ගම් දනවුවැස්සන් කෙරෙහිදු, ශ්‍රමණබ්‍රාහමණයන් කෙරෙහිදු, මෘගපක්‍ෂීන් කෙරෙහිදු ධාර්මික රක්‍ෂාවරණගොපන කරයි.

මහණ, ධාර්මික වූ ධර්මරාජන් වූ එ සක්විතිරජ ධර්මය ම නිසා ධර්මයට සත්කාර කරණුයේ ධර්මය ගුරු කරණුයේ ධර්මයට බුහුමන් කරණුයේ ධර්මධවජ වූයේ ධර්මකෙතු වූයේ ධර්මාධිපත්‍යය ඇතියේ අන්තඃපුරජනයා කෙරෙහි ධාර්මිකරක්‍ෂාවරණගොපනය කොට අනුයුක්ත ක්‍ෂත්‍රියයන් කෙරෙහි ද බලකාය කෙරෙහි ද බ්‍රාහමණගෘහපතියන් කෙරෙහි ද නියම්ගම්-දනවුවැසියන් කෙරෙහි ද ශ්‍රමණබ්‍රාහමණයන් කෙරෙහි ද මෘගපක්‍ෂීන් කෙරෙහි ද ධාර්මික රක්‍ෂාවරණගුප්තිය කොට ධර්මයෙන් ම ආඥචක්‍රය පවත්වයි. එ ආඥචක්‍රය වනාහි මනුෂ්‍යභූත කිසිදු පසමිතුරු ප්‍රාණියකු විසින් ප්‍රත්‍යර්ථිනාය කළ හැකි නො වෙයි.

එවමෙව ඛො භික්ඛු තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මිකො ධම්මරාජා ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති භික්ඛූසු: "එවරූපං කායකම්මං සෙවිතබ්බං, එවරූපං කායකම්මං න සෙවිතබ්බං, එවරූපං වචීකම්මං සෙවිතබ්බං, එවරූපං වචීකම්මං න සෙවිතබ්බං, එවරූපං මනොකම්මං සෙවිතබ්බං, එවරූපං මනොකම්මං න සෙවිතබ්බං, එවරූපො ආජීවො සෙවිතබ්බො, එවරූපො ආජීවො න සෙවිතබ්බො, එවරූපො ගාමනිගමො සෙවිතබ්බො, එවරූපො ගාමනිගමො න සෙවිතබ්බො"ති.

පුනචපරං භික්ඛු තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මිකො ධම්මරාජා ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරෙන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති භික්ඛුනීසු -පෙ- උපාසකෙසු -පෙ- උපාසිකාසු: "එවරූපං කායකම්මං සෙවිතබ්බං, එවරූපං කායකම්මං න සෙවිතබ්බං, එවරූපං වචීකම්මං සෙවිතබ්බං, එවරූපං වචීකම්මං න සෙවිතබ්බං, එවරූපං මනොකම්මං සෙවිතබ්බං, එවරූපං මනොකම්මං න සෙවිතබ්බං, එවරූපො ආජීවො සෙවිතබ්බො, එවරූපො ආජීවො න සෙවිතබ්බො, එවරූපො ගාමනිගමො සෙවිතබ්බො, එවරූපො ගාමනිගමො න සෙවිතබ්බො"ති.

ස ඛො භික්ඛු තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මිකො ධම්මරාජා ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා භික්ඛූසු, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා භික්ඛුනීසු, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා උපාසකෙසු, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා උපාසිකාසු, ධම්මෙනෙව අනුත්තරං ධම්මචක්කං පවත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

## 5. 3. 4. 4.

## [ඛත්තියරාජසුත්තං]

### [සාවත්ථිනිදානං]

**34.** පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රාජා ඛත්තියො මුද්ධාවසිත්තො යස්සං යස්සං දිසායං විහරති සකස්මිං යෙව විජිතෙ විහරති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාවසිත්තො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො, යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අඩ්ඪො මහද්ධනො මහාභොගො පරිපුණ්ණකොසකොට්ඨාගාරො. බලවා ඛො පන හොති චතුරඞ්ගිනියා සෙනාය සමන්නාගතො අස්සවාය ඔවාදපතිකරාය.[1] පරිනායකො ඛො

1. ඔවාදපටිකරාය - මජසං.

මහණ, එ පරිද්දෙන් ම ධාර්මික ධම්රජන් වූ තථාගත අර්හත් සම්‍යක්-සම්බුද්ධයන් වහන්සේ ධර්මය ම නිසා ධර්මයට සත්කාර කරන්නාහු ධර්මය ගුරු කරන්නාහු ධර්මයට බුහුමන් කරන්නාහු ධර්මය ධ්වජ කොට ඇත්තාහු ධර්මය කෙතු කොට ඇත්තාහු ධර්මය ආධිපත්‍යය කොට ඇත්තාහු භික්ෂූන් කෙරෙහි ධාර්මික රක්‍ෂාවරණගුප්තිය සලසන්නාහ: "මෙබඳු කායකර්මය සෙවිය යුතු ය, මෙබඳු කායකර්මය නොසෙවිය යුතු ය, මෙබඳු වාක්කර්මය සෙවිය යුතු ය, මෙබඳු වාක්කර්මය නො සෙවිය යුතු ය, මෙබඳු මනඃකර්මය සෙවිය යුතු ය, මෙබඳු මනඃකර්මය නො සෙවිය යුතු ය, මෙබඳු ආජීවය සෙවිය යුතු ය, මෙබඳු ආජීවය නො සෙවිය යුතු ය, මෙබඳු ගම් නියම්ගම සෙවිය යුතු ය, මෙබඳු ගම් නියම්ගම නො සෙවිය යුතු ය"යි.

තවද මහණ, ධාර්මික ධර්මරාජන් වූ අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගතයන් වහන්සේ ධර්මය ම නිසා ධර්මයට සත්කාර කරන්නාහු ධර්මය ගුරු කරන්නාහු ධර්මයට බුහුමන් කරන්නාහු ධර්මය ධ්වජ කොට ඇත්තාහු ධර්මය කෙතු කොට ඇත්තාහු ධර්මය ආධිපත්‍යය කොට ඇත්තාහු භික්‍ෂුණීන් කෙරෙහි ... උපාසකයන් කෙරෙහි ... උපාසිකාවන් කෙරෙහි "මෙබඳු කායකර්මය සෙවිය යුතු, මෙබඳු කායකර්මය නො සෙවිය යුතු, මෙබඳු වාක්කර්මය සෙවිය යුතු, මෙබඳු වාක්කර්මය නො සෙවිය යුතු, මෙබඳු මනඃකර්මය සෙවිය යුතු, මෙබඳු මනඃකර්මය නො සෙවිය යුතු, මෙබඳු ආජීවය සෙවිය යුතු, මෙබඳු ආජීවය නො සෙවිය යුතු, මෙබඳු ගම් නියම්ගම් සෙවිය යුතු, මෙබඳු ගම් නියම්ගම් නො සෙවිය යුතු ය"යි ධාර්මික රක්‍ෂාවරණගුප්තිය සලසන්නාහ.

මහණ, එ ධාර්මික ධර්මරාජන් වූ අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගතයන් වහන්සේ ධර්මය ම නිසා ධර්මයට සත්කාර කරන්නාහු ධර්මය ගුරු කරන්නාහු ධර්මයට බුහුමන් කරන්නාහු ධර්මය ධ්වජ කොට ඇතියාහු ධර්මය කෙතු කොට ඇතියාහු ධර්මය ආධිපත්‍යය කොට ඇතියාහු භික්‍ෂූන් කෙරෙහි ධාර්මික-රක්‍ෂාවරණගොපනය සලසා, භික්‍ෂුණීන් කෙරෙහි ධාර්මික රක්‍ෂාවරණගොප-නය සලසා, උපාසකයන් කෙරෙහි ධාර්මික රක්‍ෂාවරණගොපනය සලසා, උපාසිකාවන් කෙරෙහි ධාර්මික රක්‍ෂාවරණගොපනය සලසා, ධර්මයෙන් ම අනුත්තරධර්මචක්‍රය පවත්වන සේක. එ ධර්මචක්‍රය ලොවිහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ අන් කිසිවකු විසින් හෝ ප්‍රතිවර්තනය කළ හැකි නොවේ ය යි.

## 5. 3. 4. 4.

## [ඛත්තියරාජ සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**34**. මහණෙනි, කරුණු පසෙකින් සමන්විත මූර්ධාභිෂික්ත වූ ක්‍ෂත්‍රිය රජ යම් ම දිශායෙක්හි වාස කෙරේ නම්, සවකීය වූ ම විජිතයෙහි වෙසෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ ලොවිහි මූර්ධාභිෂික්ත ක්‍ෂත්‍රිය රජ මවු පසින් හා පියපසින් හා යන උභයපාර්ශ්වයෙන් මනා කොට උපන්නේ, සුපිරිසිදු මවුකුසැතියේ, සත්මුතු පරපුර තෙක් ජාතිවාදයෙන් බැහැර නොලන ලදුයේ උපක්‍රොශ නො ලදුයේ වෙයි. මහාධන ඇතියේ මහාභොග ඇතියේ පිරිපුන් ධනකොෂ හා ධාන්‍යකොෂ්ඨාගාර ඇතියේ ආඪ්‍ය වෙයි. කිකරු වූ ඔවා අනුව යරණ සිවුරඟසෙනඟින් සමන්විත වූයේ බලවත් වෙයි. ඔහුගේ

පනස්ස හොති පණ්ඩිතො වියත්තො මෙධාවී පටිබලො අතීතානාගත-පච්චුප්පන්නෙ අත්ථෙ චින්තෙතුං. තස්සිමෙ චත්තාරො ධම්මා යසං පරිපාචෙන්ති. සො ඉමිනා යසපඤ්චමෙන[1] ධම්මෙන සමන්නාගතො යස්සං යස්සං දිසායං විහරති, සකස්මිං යෙව විජිතෙ විහරති. තං කිස්ස හෙතු: එවං හෙතං භික්ඛවෙ හොති විජිතාවිනං.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු යස්සං යස්සං දිසායං විහරති විමුත්තචිත්තො[2] විහරති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති. ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. රාජා'ව ඛත්තියො මුද්ධාවසිත්තො ජාතිසම්පන්නො.

බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සංබ්‍යඤ්ජනා කෙවල-පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[3] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. රාජා'ව ඛත්තියො මුද්ධාවසිත්තො අඩ්ඪො මහද්ධනො මහාභොගො පරිපුණ්ණකොසකොට්ඨාගාරො.

ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. රාජා'ව ඛත්තියො මුද්ධාවසිත්තො බලසම්පන්නො.

පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. රාජා'ව ඛත්තියො මුද්ධාවසිත්තො පරිණායකසම්පන්නො.

තස්සිමෙ චත්තාරො ධම්මා විමුත්තිං පරිපාචෙන්ති. සො ඉමිනා විමුත්තිපඤ්චමෙන ධම්මෙන සමන්නාගතො යස්සං යස්සං දිසායං විහරති විමුත්තචිත්තො[2] විහරති. තං කිස්ස හෙතු: එවං හෙතං භික්ඛවෙ හොති විමුත්තචිත්තානන්ති.

### [5. 3. 4. 5]

### පඨම පත්ථනාසුත්තං

**[සාවත්ථිනිදානං]**

**35**. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ජෙට්ඨො පුත්තො රජ්ජං පත්ථෙති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ජෙට්ඨො පුත්තො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අභිරූපො හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො. මාතාපිතුන්නං[4] පියො හොති මනාපො. නෙගමජානපදස්ස පියො හොති මනාපො. යානි තානි රඤ්ඤං ඛත්තියානං මුද්ධාවසිත්තානං සිප්පට්ඨානානි[5] හත්ථිස්මිං වා අස්සස්මිං වා රථස්මිං වා ධනුස්මිං වා ථරුස්මිං වා තත්ථ සික්ඛිතො හොති අනවයො.

1. ඉමිනා පඤ්චමෙන - සීමු. 2. විමුත්තචිත්තොව - මජ්ඣසං 3. ධාතා - මජ්ඣසං
4. මාතා පිතූනං - මජ්ඣසං 5. සිප්පුට්ඨානානි - සභා.

පරිණායක පණ්ඩිත වෙයි. (ප්‍රඥව්‍යක්තතායෙන්) ව්‍යක්ත වෙයි. (ස්ථානොචිතප්‍රඥයෙන් යුක්තවන හෙයින්) මෙධාවී වෙයි. අතීතානාගත-ප්‍රත්‍යුත්පන්නාර්ථයන් සිතීමට ප්‍රතිබල වෙයි. මෙ සතර දහම්හු ඔහුගේ යශස් පරිපාක කරවත්. මේ යශස නැමැති පස්වන කරුණින් සමන්‍වාගත හෙතෙමේ යම්ම දිශායෙක්හි වෙසේ නම්, ස්වකීය වූ ම විජිතයෙහි (වෙසෙන සේ) වෙසෙයි. ඒ කවර හෙතුයෙන යත්: විජෙතෘනට (ධර්මවිජය ඇත්තනට) තෙල එසෙයින් ම වෙයි.

මහණෙනි, එපරිද්දෙ ම කරුණු පසෙකින් සමන්‍වාගත මහණ යම් ම දිශායෙක්හි වාස කෙරේ නම්, පඤ්චවිධ විමුක්තියෙන් යුත් සිත් ඇතියේ ම වාස කොරෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. ප්‍රාතිමොක්‍ෂසංවර-ශීලයෙන් සංවෘත ව වෙසෙයි. ආචාරගොචරසම්පන්න වූයේ අණුමාත්‍ර-වරදෙහි දු බිය දක්නා සුලුයේ සිකපදයෙහි සමාදන් කොටගෙණ හික්මෙයි. ජාතිසම්පන්න වූ මූර්ධාභිෂික්ත ක්‍ෂත්‍රිය මහරජකු සෙයිනි.

(නවාඞ්ගශාසනසඞ්ඛ්‍යාත) ශ්‍රුතයට ආධාර වූයේ රාශි කොටගත් ශ්‍රුත ඇතියේ බහුශ්‍රුත වෙයි. යම් ධර්මකෙනෙක් ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්‍යවසානකල්‍යාණ වූවාහු අර්ථසහිත ව්‍යඤ්ජන සහිත වූවාහු කෙවල-පරිපූර්ණ වූ පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍ය පවසත් නම්, එබඳු ධර්මයෝ ඔහු විසින් අසා උගත්නා ලද්දාහු ප්‍රගුණ කරණ ලද්දාහු වචනයෙන් වනපොත් කරණ ලද්දාහු (සූත්‍ර දශකාදි විසින්) සිතින් පිරික්සා බලන ලද්දාහු ප්‍රඥයෙන් මොනොවට පිළිවිදුනා ලද්දාහු වෙත්. ආඪ්‍ය වූ මහද්ධන ඇති මහාභොග ඇති පිරිපුන් ධනාගාර හා ධාන්‍යාගාර ඇති මුදුනෙහි බිසෙස් ලද කැත්මහ-රජකු මෙනි.

අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ උපසම්පත්තිය පිණිස ස්ථාමවත් වූයේ දළපැරැකුම් ඇතියේ කුශලධර්මයෙහි නොහළ වැර ධුර ඇතියේ ඇරැඹූ වීර්‍ය්‍ය ඇතියේ වාස කොරෙයි. බලසම්පන්න මූර්ධාභිෂික්ත ක්‍ෂත්‍රිය රජකු මෙනි.

ආර්‍ය්‍ය වූ නිර්වේදයට නිසි වූ මැනැවින් දුඃඛක්‍ෂයට යන සුලු උදයව්‍යය දෙක අනුව ගිය විදර්ශනාප්‍රඥයෙන් සමන්‍වාගත වූයේ ප්‍රඥවත් වෙයි. පරිණායකයා ගෙන් සමන්‍වාගත මූර්ධාභිෂික්ත ක්‍ෂත්‍රිය මහරජු සෙයිනි.

ඔහුගේ මේ සතර දහම්හු විමුක්තිපරිපාකය කරවත්. හේ මේ විමුක්තිය පස්වනු කොට ඇති ධර්මයෙන් සමන්‍වාගත වූයේ යම් ම දිශායෙක්හි වෙසේ නම්, විමුක්තචිත්ත ව වෙසෙයි. එ කවර හෙයින යත්: මහණෙනි, විමුක්තචිත්තයනට (මිදුනා සිත් ඇතියනට) තෙල එසෙයින් ම වෙයි.

## 5. 3. 4. 5

## [පලමුවන පත්ථනා සූත්‍රය]

### [සැවැත් නිදනයි]

**35**. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත වූ මූර්ධාභිෂික්ත ක්‍ෂත්‍රිය-රජුගේ දෙටුපුත් රාජ්‍යය පතන්නේ ය. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ ලොව්හි මූර්ධාභිෂික්ත වූ ක්‍ෂත්‍රියරජුගේ ජ්‍යෙෂ්ඨපුත්‍ර තෙමේ මවුපසින් හා පියපසින් හා යන දෙපසින් සුජාත වූයේ, පිරිසිදු මවුකුස් ඇතියේ, සත්මුතුපරපුර තෙක් ජාතිවාදයෙන් බැහැර නො කරණ ලදුයේ උපක්‍රොෂ නැතියේ වෙයි. උත්තම වර්ණසෞන්දර්‍ය්‍යයෙන් සමන්‍වාගත වූයේ ප්‍රසාද එළවන සුලුයේ අභිරූප වෙයි. මාපියනට ප්‍රිය මනාප වෙයි. නියම්-ගම්දනවූ වැස්සනට ප්‍රිය මනාප වෙයි. හස්තිශිල්ප වේවයි, අශ්වශිල්ප වේවයි, රථ ශිල්ප වේවයි, ධනුශ්ශිල්ප වේවයි, ඛඩ්ගශිල්ප වේවයි. මූර්ධාභිෂික්ත ක්‍ෂත්‍රිය රජුන්ගේ යම් ශිල්පස්ථානයෝ වෙත් නම්, එහි හික්මුනේ පරිපූර්ණ වෙයි.

තස්ස එවං හොති: අහං ඛොම්හි උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො, යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. කස්මාහං රජ්ජං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො. කස්මාහං රජ්ජං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි මාතාපිතූනං පියො මනාපො. කස්මාහං රජ්ජං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි නෙගමජානපදස්ස පියො මනාපො. කස්මාහං රජ්ජං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි යානි තානි රඤ්ඤං ඛත්තියානං මුද්ධාවසිත්තානං සිප්පට්ඨානානි හත්ථිස්මිං වා අස්සස්මිං වා රථස්මිං වා ධනුස්මිං වා ථරුස්මිං වා, තත්ථම්හි සික්ඛිතො[1] අනවයො. කස්මාහං රජ්ජං න පත්ථෙය්‍යන්ති?

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ජෙට්ඨො පුත්තො රජ්ජං පත්ථෙති.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආසවානං ඛයං පත්ථෙති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං: "ඉතිපි සො භගවා අරහං-සම්මාසම්බුද්ධො-විජ්ජාචරණසම්පන්නො-සුගතො-ලොකවිදූ-අනුත්තරො පුරිසදම්මසාරථි-සත්ථා දෙවමනුස්සානං-බුද්ධො-භගවාති." අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය. අසඨො හොති අමායාවී යථාභූතං අත්තානං[2] ආවිකත්තා[3] සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු. ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා.

තස්ස එවං හොති: 'අහං ඛොම්හි සද්ධො, සද්දහාමි තථාගතස්ස බොධිං: 'ඉතිපි සො භගවා අරහං-සම්මාසම්බුද්ධො -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො-භගවාති' කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි අප්පාබාධො අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය. කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි අසඨො අමායාවී යථාභූතං අත්තානං ආවිකත්තා[3] සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු. කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි ආරද්ධවිරියො විහරාමි අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි පඤ්ඤවා උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යන්ති?'

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආසවානං ඛයං පත්ථෙතීති.

---

1. තත්ථ සික්ඛිතො - මජසං. 3. ආවිකත්තා - මජසං, සසා, සීමු.
2. යථාභූතානං අත්ථානං - සීමු.

ඔහට මෙබඳු සිතෙක් වෙයි: "මම වනාහි මවුපසින් හා පියපසින් හා දෙපසින් සුජාතයෙම්, පිරිසිදු මවුකුස් ඇතියෙම්, සත්මුතු පරපුර තෙක් ජාති වාදයෙන් බැහැර නො කරණ ලද්දයෙම්, අනුපක්‍රුෂ්ටයෙම් වෙම්. කවර හෙයින් මම රාජ්‍යය නො පතනෙම් ද? මම් වනාහි දැකුම්කලුයෙම් ප්‍රසාදජනකයෙම් උත්තම වර්ණසෞන්දර්‍ය්‍යයෙන් සමන්‍වාගතයෙම් අභිරූප යෙම් වෙමි. කවර හෙයින් මම රාජ්‍යය නො පතන්නෙම් ද? මම වනාහි මා පියනට ප්‍රියමනාප යෙම් වෙමි. කවර හෙයින් මම රාජ්‍ය නො පතන්නෙම් ද? මම වනාහි නියම්ගම් දනවුවැස්සනට ප්‍රිය මනාපයෙම් වෙමි. කවර හෙයින් මම රාජ්‍යය නො පතන්නෙම් ද? මම වනාහි හස්තිශිල්ප වේවයි, අශ්වශිල්ප වේවයි, රථශිල්ප වේවයි, ඛඩ්ගශිල්ප වේවයි, මූර්ධාභිෂික්ත ක්‍ෂත්‍රිය රජුන්ගේ යම් ශිල්පස්ථාන කෙනෙක් වෙත් නම්, එහි නික්මුනෙම් පරිපූර්ණයෙම් වෙමි. කවර හෙයින් මම රජය නො පතන්නෙම් ද?"යි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත මූර්ධාභිෂික්ත වූ ක්‍ෂත්‍රිය රජුගේ දෙටුපුත් රජය පතයි.

මහණෙනි, එපරිද්දෙන් ම කරුණු පසෙකින් සමන්‍වාගත මහණ ආස්‍රව-යන්ගේ ක්‍ෂයය (නිවන) පතන්නේ ය. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සැදැහැති වෙයි: "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙ මෙ කරුණෙනුදු අර්හත්හ. සම්‍යක්සම්බුද්ධයහ. විද්‍යාචරණ-සම්පන්නයහ. සුගතයහ. ලොකවිද්හ. අනුත්තරපුරුෂදම්‍යසාරථිහ. දෙව් මිනිස්නට ශාස්තෘහ. බුද්ධයහ. භගවත් හ"යි තථාගතයන් වහන්සේගේ (චතුස්සත්‍යඥන) බොධිය හදහයි. අල්පාතඞ්ක වූයේ ස්වල්පාබාධ වෙයි. ඉතා සිහිල් නො වූ ඉතා උණුසුම් නැති මධ්‍යම වූ ප්‍රධන්වියර්යට නිසි වූ සමව අහර පැසවන ජඨරාග්නියෙන් සමන්‍වාගත වෙයි. මායා නැතියේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි වේවයි, විඥ සබ්‍රම්සරුන් කෙරෙහි වේවයි, තමා තතුසේ පාළ කරණුයේ සළබව් නැතියේ වේ. අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ ප්‍රතිලාභය පිණිස රුකුළු වැර ඇතියේ දළපැරකුම් ඇතියේ කුශලධර්මයන්හි නො හළ වැරඹුර ඇතියේ ස්ථාමවත් වූයේ විහරණ කෙරෙයි. ආර්‍ය්‍ය වූ නිර්ඵේදයට වැටෙන මනා සේ දුඃඛක්‍ෂය කරා යන උදයව්‍යයට යන ප්‍රඥයෙන් සමන්‍වාගත වෙයි.

ඔහට මෙබඳු සිතෙක් වෙයි: "මම සැදැහැතියෙම් වෙමි. තථාගතයන් වහන්සේගේ සම්බොධිය "මෙ කරුණිනුදු ඒ භාග්‍යවත්හු අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ ... දෙව්මිනිස්නට ශාස්තෘහ. බුද්ධයහ. භාග්‍යවත්හ"යි හදහම්. කවර කරුණෙකින් මම ආස්‍රවක්‍ෂය නො පතම් ද? මම වනාහි අල්පාතඞ්ක ඇතියෙම් අල්පාබාධ ඇතියෙම්, අතිශීත නො වූ අත්‍යුෂ්ණ නො වූ මධ්‍යම වූ ප්‍රධානක්‍ෂම වූ සම ව අහර පැසවන ජඨරාග්නියෙන් සමන්‍වාගතයෙමි. කවර කරුණෙකින් මම ආස්‍රවක්‍ෂය (නිර්වාණය) නො පතන්නෙම් ද? මම වනාහි මායා රහිතයෙම්, අශඨයෙම් ශාස්තෘන් කෙරෙහි වේවයි, විඥ සබ්‍රම්සරුන් කෙරෙහි වේවයි, තමා තතුසේ පාළ කරන්නෙම් වෙමි. කවර හෙයින් මම ආස්‍රවක්‍ෂයය නො පතම් ද? මම වනාහි අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස, කුශලධර්මයන්ගේ ලාභය පිණිස රුකුළු වැර ඇතියෙම් කුශලධර්මයෙහි නො හළ වැර ඇතියෙම් දළපැරකුම් ඇතියෙම් ස්ථාමවත්ව වෙසෙමි. කවර හෙයින් මම ආස්‍රවක්‍ෂය නො පතන්නෙම් ද? මම වනාහි ආර්‍ය්‍ය වූ නිර්ඵේදය ඇසුරු කළ මොනොවට දුඃඛක්‍ෂයට යන උදයව්‍යයගාමිනීප්‍රඥයෙන් සමන්‍වාගත වෙමි. කවර කරුණෙකින් මම ආස්‍රවක්‍ෂය නො පතන්නෙම් ද?

මහණෙනි, මේ පඤ්ච ධර්මයෙන් සමන්‍වාගත මහණ ආස්‍රවක්‍ෂය පතන්නේ ය යි.

5. 3. 4. 6.

## [දුතිය පඤ්හාසුත්තං]

[සාවත්ථිනිදානං]

**36.** පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ජෙට්ඨො පුත්තො ඔපරජ්ජං පත්ථෙති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ජෙට්ඨො පුත්තො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධ ගහණිකො, යාව සත්තමා පිතාමහයුගා. අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අභිරූපො හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො. මාතාපිතුන්නං[1] පියො හොති මනාපො. බලකායස්ස පියො හොති මනාපො. පණ්ඩිතො හොති වියත්තො මෙධාවී පටිබලො අතීතානාගතපච්චුප්පන්නෙ අත්ථෙ චින්තෙතුං.

තස්ස එවං හොති: 'අහං බොම්හි උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො, යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. කස්මාහං ඔපරජ්ජං න පත්ථෙය්‍යං? අහං බොම්හි අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො. කස්මාහං ඔපරජ්ජං[2] න පත්ථෙය්‍යං? අහං බොම්හි මාතාපිතුන්නං පියො මනාපො. කස්මාහං ඔපරජ්ජං න පත්ථෙය්‍යං? අහං බොම්හි බලකායස්ස පියො මනාපො. කස්මාහං ඔපරජ්ජං න පත්ථෙය්‍යං? අහං බොම්හි පණ්ඩිතො වියත්තො මෙධාවී පටිබලො අතීතානාගත-පච්චුප්පන්නෙ අත්ථෙ චින්තෙතුං. කස්මාහං ඔපරජ්ජං න පත්ථෙය්‍යන්ති?

ඉමෙහි බො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ජෙට්ඨො පුත්තො ඔපරජ්ජං පත්ථෙති.

එවමෙව බො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආසවානං ඛයං පත්ථෙති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා. චතුසු සති පට්ඨානෙසු සුපට්ඨිතචිත්තො[3] හොති. ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා.

---

1. මාතාපිතූනං - මජසං 2. උපරජ්ජං - සයා, PTS. 3. සුප්පතිට්ඨිතචිත්තො - මජසං
සුපට්ඨිතචිත්තො - සයා.

## 5. 3. 4. 6.

## [දෙවැනි පත්ථනාසූත්‍රය]

### [සැවැත්නිදනයි]

**36.** මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත මූර්ධාභිෂික්ත වූ ක්‍ෂත්‍රිය රජුගේ දෙටු පුත් යුවරජ තනතුර පතන්නේ ය. කවර පසෙකින යත්:

මහණෙනි, මූර්ධාභිෂික්ත වූ ක්‍ෂත්‍රිය රජුගේ දෙටුපුත් මවුපසින් හා පියපසින් හා උභයපක්‍ෂයෙන් සුජාත වූයේ, පිරිසිදු මවුකුස ඇතියේ, සත්වන පියමුතුපරපුර තෙක් ජාතිවාදයෙන් බැහැර නො කරණ ලදුයේ උපක්‍රෂට නො වෙයි. උත්තමරූපසෞන්‍දර්‍ය්‍යයෙන් සමන්‍වාගත වූයේ දැකුම්කලු වූයේ ප්‍රසාදජනක වූයේ විශිෂ්ට රූපසම්පත් ඇතියේ වෙයි. මවුපියනට ප්‍රියමනාප වෙයි. බලසෙනඟට ප්‍රියමනාප වෙයි. පාණ්ඩිත්‍යයෙන් සමන්‍වාගත වූයේ ප්‍රඥාව්‍යක්තභාවයෙන් යුක්ත වූයේ තත්වැසි නුවණින් යුක්ත වූයේ අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න වූ වෘද්ධි අර්‍ථයන් සිතීමෙහි ප්‍රතිබල වෙයි.

ඔහට මෙබඳු සිතෙක් වෙයි: ‘මම වනාහි මවුපසින් හා පියපසින් හා දෙපසින් ම සුජාතයෙම් පිරිසිදු මවුකුස් ඇතියෙම් සත්වන පියමුතුපරපුර තෙක් ජාතිවාදයෙන් අක්‍ෂිප්තයෙම් උපක්‍රොශ නො ලදුයෙම් වෙමි. කවර හෙයින් මම යුවරජ තනතුරු නො පතම් ද? මම වනාහි පරමවර්‍ණසෞන්‍දර්‍ය්‍ය යෙන් සමන්‍වාගතයෙම් අභිරූපයෙම් දර්‍ශනීයයෙම් ප්‍රසාදජනකයෙමි. කවර හෙයින් මම යුවරජය නො පතම් ද? මම වනාහි මාපියනට ප්‍රියමනාපයෙමි. කවර හෙයින් මම යුවරජය නො පතම් ද? මම වනාහි බලසෙනඟට ප්‍රියමනාපයෙමි. කවර හෙයින් මම යුවරජය නො පතම් ද? මම වනාහි පණ්ඩිතයෙමි, ව්‍යක්තයෙමි, තත්වැසි නුවණැතියෙමි. අතීතානාගත-ප්‍රත්‍යුත්පන්න අර්‍ථයන් සිතීමට ප්‍රතිබලයෙමි. කවර හෙයින් මම යුවරජය නො පතම් ද?

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත මූර්ධාභිෂික්ත ක්‍ෂත්‍රිය රජුගේ දෙටුපුත් යුවරජය පතන්නේ ය.

මහණෙනි, එපරිද්දෙන් ම කරුණු පසෙකින් සමන්‍වාගත මහණ ආශ්‍රවක්‍ෂය පතයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි ... සික්‍ෂාපදයෙහි සමාදන් කොට ගෙණ හික්මෙයි. බහුශ්‍රැත වෙයි ... (ධර්‍මයෝ) ප්‍රඥායෙන් සුප්‍රතිවිද්‍ධ වෙත්. සතර සිවටන්හි මොනොවට එළඹ සිටි සිත් ඇතියේ වෙයි. අකුශලධර්‍මයන්ගේ ප්‍රහාණය සඳහා කුශලධර්‍මයන්ගේ උපසම්පත් සඳහා රැකුළු වැර ඇතිව වාස කරයි, දළපැරකුම් ඇතියේ කුශලධර්‍මයෙහි නො හළ වැර ඇතියේ ස්ථාමවත් වෙයි. ආර්‍ය්‍ය වූ නිර්‍වේදයට වැටෙන මැනැවින් දුඃඛක්‍ෂයට යන උදවියට යන ප්‍රඥායෙන් සමන්‍වාගත වූයේ ප්‍රඥාවත් වෙයි.

තස්ස එවං හොති: අහං ඛොම්හි සීලවා පාතිමොක්ඛසංවර සංවුතො විහරාමි, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවි සමාදාය සික්ඛාමි සික්ඛාපදෙසු. කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි බහුස්සුතො සුතධරො සුතසන්නිචයො – 'යෙ තෙ ධම්මා ආදි-කල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා,[1] කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපා මෙ ධම්මා බහුස්සුතා හොන්ති.[2] ධතා[3] ච වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තො. කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි ආරද්ධවිරියො විහරාමි අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යං? අහං ඛොම්හි පඤ්ඤවා උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. කස්මාහං ආසවානං ඛයං න පත්ථෙය්‍යන්ති?

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආසවානං ඛයං පත්ථෙතීති.

### 5. 3. 4. 7.

### [අප්පංසුපතිසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**37.** පඤ්චිමෙ භික්ඛවෙ අප්පං රත්තියා සුපන්ති, බහුං ජග්ගන්ති. කතමෙ පඤ්ච:

ඉත්ථි භික්ඛවෙ පුරිසාධිප්පායා අප්පං රත්තියා සුපති, බහුං ජග්ගති. පුරිසො භික්ඛවෙ ඉත්ථාධිප්පායො අප්පං රත්තියා සුපති, බහුං ජග්ගති. චොරො භික්ඛවෙ ආදානාධිප්පායො අප්පං රත්තියා සුපති, බහුං ජග්ගති. රාජා භික්ඛවෙ රාජකරණීයෙසු යුත්තො අප්පං රත්තියා සුපති, බහුං ජග්ගති. භික්ඛු භික්ඛවෙ විසංයොගාධිප්පායො අප්පං රත්තියා සුපති, බහුං ජග්ගති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච අප්පං රත්තියා සුපන්ති, බහුං ජග්ගන්තීති.

### 5. 3 4. 8.

### [භත්තාදකසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**38.** පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො භත්තාදකො ච හොති ඔකාසඵරණො ච ලණ්ඩසාටනො[4] ච සලාකගාහී[5] ච රඤ්ඤො නාගොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි:

---

1. සාත්ථං සබ්‍යඤ්ජනං - මජසං. 2. බහුස්සුතා - සීමු. 3. ධාතා - මජසං.
4 ලණ්ඩසාරණො - මජසං. 5. සලාකග්ගාහී - මජසං.

ඔහට මෙබඳු සිතෙක් වෙයි: 'මම වනාහි සිල්වත් වෙමි. ප්‍රාතිමොක්ෂසංවරශීලයෙන් සංවෘතයෙමි. ආචාරගොචර සම්පන්නයෙමි. අණුමාත්‍ර වරදෙහි භය දක්නා සුල්ලෙම් වාස කරමි. සමාදන් කොට ගෙණ ශික්ෂාපදයෙහි හික්මෙමි. කවර හෙයින් මම ආස්‍රවක්ෂය නො පතම් ද? මම වනාහි ශ්‍රැතධරයෙම් ශ්‍රැතසන්නිචය ඇතියෙම්, බහුශ්‍රැතයෙමි. ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ සාර්ථවූ සව්‍යඤ්ජන වූ යම් ධර්ම කෙනෙක් කෙවලපරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය පාළ කෙරෙත් නම්, එබඳු ධර්මයෝ මා විසින් බහුශ්‍රැත වූවාහු ධෘත වෙත්. වචනයෙන් ප්‍රගුණ කරණ ලදහ. මනසින් අනුප්‍රෙක්ෂිතයහ. ප්‍රඥයෙන් සුපිළිවිදුනා ලදහ. කවර හෙයින් මම ආස්‍රවක්ෂය නො පතම් ද? මම වනාහි සතර සම්‍යක්ප්‍රස්ථානයෙහි එළඹ සිටි සිහි ඇතියෙම් වෙමි. කවර හෙයින් මම ආස්‍රවක්ෂය නො පතම් ද? මම වනාහි අකුශලධර්මයන්ගේ ප්‍රහාණය සඳහා කුශලධර්මයන්ගේ උපසම්පත් සඳහා රුකුළු වැර ඇතියෙම් වෙසෙමි· කුශලධර්මයෙහි නො හළ වීර්‍ය්‍යධුර ඇතියෙම් දළපැරකුම් ඇතියෙම් ස්ථාමවත් වෙමි. කවර හෙයින් මම ආස්‍රවක්ෂය නො පතම් ද? මම වනාහි ආර්‍ය්‍ය වූ නිර්වේදය පිණිස පවත්නා මැනැවින් දුඃඛක්ෂයට යන සුලු උදැවිය නුවණින් ප්‍රඥවත් වෙමි. කවර හෙයින් මම ආස්‍රවක්ෂය නො පතම් දැ?'යි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්වාගත මහණ ආස්‍රවක්ෂය පතන්නේ යයි.

## 5. 3. 4. 7.

## [අප්පංසුපති සූත්‍රය]

### [සැවැත්නිදනයි]

**37**. මහණෙනි, මෙ පස් දෙනෙක් රාත්‍රියෙහි අල්ප කොට නිදන්නාහ. බහුල කොට නිදි වරන්නාහ. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, පුරුෂයන් කෙරෙහි අභිප්‍රාය ඇති ස්ත්‍රී රාත්‍රියෙහි අල්ප කොට නිදයි. බහුල කොට නිදි වරයි. මහණෙනි, ස්ත්‍රීන් කෙරෙහි අභිප්‍රාය ඇති පුරුෂ රාත්‍රියෙහි අල්ප කොට නිදයි. බහුල කොට නිදි වරයි. මහණෙනි, වස්තු පැහැර ගැණීමෙහි අභිප්‍රාය ඇති සොර රාත්‍රියෙහි අල්ප කොට නිදයි. බොහෝ කොට නිදිවරයි. මහණෙනි, රජකරණීහි නියුතු රජ රාත්‍රියෙහි අල්ප කොට නිදයි. බෙහෝ කොට නිදි වරයි. මහණෙනි, කෙලෙසුන්ගෙන් මිදීමෙහි අභිප්‍රාය ඇති මහණ රාත්‍රියෙහි අල්ප කොට නිදයි. බොහෝ කොට නිදි වරයි.

මහණෙනි, මේ පස්දෙන රාත්‍රියෙහි අල්ප කොට නිදත්. බොහෝ කොට නිදි වරත් යයි.

## 5. 3. 4 8

## [භත්තාදක සූත්‍රය]

### [සැවැත්නිදනයි]

**38**. මහණෙනි, රජුගේ ඇත් කරුණු පසෙකින් සමන්වාගත වූයේ බොහෝ බත් බුදින්නේ ද වෙයි. (අන්‍යයන්ට බාධාවනසේ) ඇවුරු අවකාශ ඇතියේ ද වෙයි. (තත්හි තත්හි) ලඬ හෙළනුයේත් වෙයි. ඇතුන් ගණින කලැ ලභගන්නා සුලුයේ ද වෙයි. රජුගේ හස්තියා මැ යි යන සංඛ්‍යාවට ද යෙයි. කවර පසෙකින යත්:

ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති රූපානං, අක්ඛමො සද්දානං, අක්ඛමො ගන්ධානං, අක්ඛමො රසානං, අක්ඛමො ඵොට්ඨබ්බානං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො භත්තාදකො ච හොති ඔකාසඵරණො ච ලණ්ඩසාටනො ච සලාකගාහී ච රඤ්ඤො නාගොත්වෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භත්තාදකො ච හොති ඔකාසඵරණො ච පීඨමද්දනො[1] ච සලකගාහී ච භික්ඛුත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති රූපානං, අක්ඛමො සද්දානං, අක්ඛමො ගන්ධානං, අක්ඛමො රසානං, අක්ඛමො ඵොට්ඨබ්බානං.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භත්තාදකො ච හොති ඔකාසඵරණො ච පීඨමද්දනො ච සලකගාහී ච භික්ඛුත්වෙව සඞ්ඛං ගච්ඡතීති.

## 5. 3. 4. 9.

## [අක්ඛමසුත්තං]

[සාවත්ථිනිදානං]

**39.** පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො න රාජාරහො හොති න රාජභොග්ගො. න රඤ්ඤො අඞ්ගන්ත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති රූපානං, අක්ඛමො සද්දානං, අක්ඛමො ගන්ධානං, අක්ඛමො රසානං, අක්ඛමො ඵොට්ඨබ්බානං.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති රූපානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො හත්ථිකායං වා දිස්වා අස්සකායං වා දිස්වා රථකායං වා දිස්වා පත්තිකායං වා දිස්වා සංසීදති විසීදති න සන්ථම්භති න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති රූපානං.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති සද්දානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො හත්ථිසද්දං වා සුත්වා, අස්සසද්දං වා සුත්වා රථසද්දං වා සුත්වා පත්තිසද්දං වා සුත්වා භෙරිපණවසඞ්ඛතිණවනින්නාදසද්දං වා සුත්වා සංසීදති විසීදති න සන්ථම්භති න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති සද්දානං.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති ගන්ධානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො යෙ තෙ රඤ්ඤො නාගා අභිජාතා සඞ්ගාමාවචරා, තෙසං මුත්තකරීසස්ස ගන්ධං ඝායිත්වා සංසීදති විසීදති, න සන්ථම්භති න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති ගන්ධානං.

---

1 මඤ්චපීඨමද්දනො - මජසං.

මහණෙනි, මෙ ලොව්හි රජුගේ ඇත් රූප නො සහනුයේ වෙයි. ශබ්දයත් නොසහනුයේ වෙයි. ගන්ධයත් නොසහනුයේ වෙයි. රස නොසහනුයේ වෙයි. ස්ප්‍රෂ්ටව්‍යයත් නොසහනුයේ වෙයි.

මහණෙනි, රජුගේ හස්තිනාගයා මෙ කරුණු පසින් සමන්‍වාගත වූයේ භක්තාදක ද වෙයි. අවකාශස්ඵරණ ද වෙයි. ලඩ හෙළනුයේ ද වෙයි. ලඟ ගනුයේ ද වෙයි. 'රජුගේ නාගයා ම වේ' යන සඞ්ඛ්‍යාවට ද යෙයි.

මහණෙනි, එ පරිද්දෙන් ම කරුණු පසෙකින් සමන්‍වාගත මහණ බොහෝ අහර වළඳනුයේත් වෙයි. අවකාශ අවුරණුයේත් වෙයි. (ඇඳ) පුටු මඩනේ ද වෙයි. ශලාකග්‍රාහී ද වෙයි. 'මහණෙක' යන සඞ්ඛ්‍යාවට ද යෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපාලම්බනයත් නොසහනේ වෙයි. ශබ්දාලම්බනයත් නොසහනේ වෙයි. ගන්ධාලම්බනයත් නොසහනේ වෙයි. රසාලම්බනයත් නොසහනේ වෙයි. ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයත් නොසහනේ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත මහණ බොහෝ අහර වළඳනේ වෙයි. අවකාශ අවුරණුයේ ද වෙයි. පීඨමර්දන කරණුයේ ද වෙයි. ශලාකග්‍රාහී ද වෙයි. 'මහණෙක් ම ය' යන සඞ්ඛ්‍යාවට ද යේ යයි.

## 5. 3. 4. 9.

### [අක්ඛමසුත්‍රය]

[සැවැත් නිදානයි]

**39.** මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත රාජකීය හස්ති රාජාර්හ නො වෙයි, රාජභොග්‍ය නො වෙයි, 'රාජාඞ්ගයෙක' යන සඞ්ඛ්‍යාවට ද නො යෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ ලොව රජුගේ ඇත් රූප නොසහනේ වෙයි. ශබ්ද නොසහනේ වෙයි. ගන්ධ නොසහනේ වෙයි. රස නොසහනේ වෙයි. ස්පර්ශ නොසහනේ වෙයි.

මහණෙනි, රජුගේ ඇත්රජ කෙසේ නම් රූප නො ඉවසන්නේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ ඇත්රජ සඞ්ග්‍රාමභූමියට ගියේ ඇත්මුළ හෝ දැක අස්මුළ හෝ දැක රියසෙන් හෝ දැක පාබලසෙන් හෝ දැක ගැලෙයි. වෙසෙසින් ගැලෙයි. මැනැවින් නො සිටුනේ ය. සඞ්ග්‍රාමභූමියට බස්නට නොපොහොසත් වෙයි. මහණෙනි, මෙසෙයින් රජුගේ හස්තිරාජයා රූප නො ඉවසන්නේ වෙයි.

මහණෙනි, කෙසේ නම් රජුගේ ඇත් ශබ්ද නො ඉවසන්නේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ ඇත්රජ සඞ්ග්‍රාමභූමියට ගියේ ඇත්හඬ වේවයි අසා අස්හඬ වේවයි අසා රියහඬ වේවයි අසා පාබලසෙන්හඬ වේවයි අසා බෙර පණාබෙර සක් තිණව යන තූර්‍යනාද වේවයි අසා ගැලෙයි. වෙසෙසින් ගැලෙයි. දැඩිව නො සිටුනේ ය. සඞ්ග්‍රාමභූමියට බස්නට නො පොහොනේ වෙයි. මහණෙනි, මෙසෙයින් රජුගේ ඇත්රජ ශබ්ද නොඉවසන්නේ වෙයි.

මහණෙනි, රජුගේ හස්තිනාග කෙසේ නම් ගන්ධයන් නො ඉවසන්නේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ ඇත් සඞ්ග්‍රාමයට ගියේ රජුගේ අභිජාත වූ යම් ඇත්කෙනෙක් සඞ්ග්‍රාමාවචර වුහු නම්, උන්ගේ මූත්‍රපුරීෂ ගන්ධය අසා ගැලෙයි. පසුබසී. මනා කොට නොසිටුනේ ය. සංග්‍රාමාවතරණයට නොපොහොනේ වෙයි. මහණෙනි, මෙසේ රජුගේ ඇත්රජ ගන්ධයනට අක්ෂම වෙයි.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති රසානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො එකිස්සා වා තිණොදකදත්තියා විමානිතො[1], ද්වීහි වා තීහි වා චතූහි වා පඤ්චහි වා තිණොදකදත්තීහි විමානිතො[1] සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති රසානං.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති ඵොට්ඨබ්බානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො එකෙන වා සරවෙධෙන[2] විද්ධො, ද්වීහි වා තීහි වා චතූහි වා පඤ්චහි වා සරවෙධෙහි[2] විද්ධො සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො අක්ඛමො හොති ඵොට්ඨබ්බානං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො න රාජාරහො හොති න රාජභොග්ගො. න රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු න ආහුනෙය්‍යො හොති, න පාහුනෙය්‍යො, න දක්ඛිණෙය්‍යො, න අඤ්ජලි-කරණීයො, න අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති රූපානං, අක්ඛමො සද්දානං, අක්ඛමො ගන්ධානං, අක්ඛමො රසානං, අක්ඛමො ඵොට්ඨබ්බානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති රූපානං? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා රජනීයෙ රූපෙ සාරජ්ජති. න සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති රූපානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති සද්දානං? ඉධ භික්ඛවෙ භික්ඛු සොතෙන සද්දං සුත්වා රජනීයෙ සද්දෙ සාරජ්ජති. න සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති සද්දානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති ගන්ධානං? ඉධ භික්ඛවෙ භික්ඛු ඝානෙන ගන්ධං ඝායිත්වා රජනීයෙ ගන්ධෙ සාරජ්ජති. න සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති ගන්ධානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති රසානං? ඉධ භික්ඛවෙ භික්ඛු ජිව්හාය රසං සායිත්වා රජනීයෙ රසෙ සාරජ්ජති. න සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති රසානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති ඵොට්ඨබ්බානං? ඉධ භික්ඛවෙ භික්ඛු කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා රජනීයෙ ඵොට්ඨබ්බෙ සාරජ්ජති. න සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු අක්ඛමො හොති ඵොට්ඨබ්බානං.

---

1. විහනීතො - සසා. 2. සරවෙගෙන - මජසං.

මහණෙනි, කෙසේ නම් රජුගේ හස්තියා රසයනට අක්‍ෂම වේය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ ඇත් සංග්‍රාමභූමියට ගියේ එක් දිනෙක තණ දිය දීමෙකින් අපමානිත වූයේ (දිනක තණදිය නො ලද්දයේ) හෝ, තෘණෝදකදන දෙකෙකින් හෝ තුණෙකින් හෝ සතරෙකින් හෝ පසෙකින් හෝ අපමානිත වූයේ ගැලෙයි. වෙසෙසින් ගැලෙයි. මනා සේ නො සිටුනේ ය. සඞ්ග්‍රාමභූමියට වදනට නො හැකි වෙයි. මහණෙනි, මෙසේ රජුගේ නාග රසයනට අක්‍ෂම වෙයි.

මහණෙනි, කෙසේ නම් රජුගේ ඇත් ස්ප්‍රෂ්ටව්‍යයනට අක්‍ෂම වේය යත්: මහණෙනි, මෙලොව්හි රජුගේ ඇත් සඞ්ග්‍රාමභූමියට ගියේ එක් ශරවේධයෙකින් හෝ විදුනා ලදුයේ, (ශරවේධ) දෙකෙකින් හෝ තුණෙකින් හෝ සතරෙකින් හෝ ශරවේධ පසෙකින් හෝ විදුනා ලදුයේ සංසීදන කෙරෙයි. විසීදන කෙරෙයි. මනා කොට නොසිටුනේ ය. සඞ්ග්‍රාමභූමියට බස්නට නොසමත් වෙයි. මහණෙනි, මෙ සෙයින් රජුගේ ඇත් ස්ප්‍රෂ්ටව්‍යයනට අක්‍ෂම වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත රාජකීය නාග රාජාර්හ නො වෙයි. රාජභොග්‍ය නො වෙයි. 'රාජාඞ්ගයෙක' යන ගණනට නො ම යෙයි.

මහණෙනි, එපරිද්දෙන් ම කරුණු පසෙකින් සමන්‍වාගත මහණ ආහුනාර්හ නො වෙයි. ප්‍රාඝූර්ණාර්හ නො වෙයි. දක්‍ෂිණාර්හ නො වෙයි. අඤ්ජලිකරණාර්හ නො වෙයි. ලොකයට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර නො වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපයන් නො සහනේ වෙයි. ශබ්දයන් නොසහනේ වෙයි. ගන්‍ධයන් නොසහනේ වෙයි. රසයන් නොසහනේ වෙයි. ස්ප්‍රෂ්ටව්‍යයන් නොසහනේ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ රූපයන් නො ඉවසන්නේ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ චක්‍ෂුසින් රූපාලම්බන දැක රඤ්ජනයට නිසි රූපයෙහි රැඳෙයි. සිත සමාහිත කිරීමට නො හැක්කේ ය. මහණෙනි, මෙ සෙයින් මහණ රූපයන් නො ඉවසන්නේ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ශබ්ද නො ඉවසන්නේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රොත්‍රයෙන් ශබ්ද අසා රජනීය ශබ්දයෙහි රැඳෙයි. චිත්තය සමාහිත කරණට නො හැකි වෙයි. මහණෙනි, මෙසේ මහණ ශබ්දයන් නො ඉවසන්නේ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ගන්‍ධයන් නො ඉවසන්නේ ය යත්: මහණෙනි, මෙ සස්ණෙහි මහණ ඝ්‍රාණයෙන් ගන්‍ධ අසා රජනීය ගන්‍ධයෙහි රැඳෙයි. චිත්තය සමාහිත කිරීමට නො හැකි වෙයි. මහණෙනි, මෙසෙයින් මහණ ගන්‍ධයන් ඉවසනුවට නො හැකි වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ රසයන් නො සහනේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ජිහ්වායෙන් රස විඳ රජනීය රසයෙහි රැඳෙයි. සිත සමාහිත කිරීමට නො හැකි වෙයි. මහණෙනි, මෙසේ මහණ රසයන් ඉවසනුවට අක්‍ෂම වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ස්ප්‍රෂ්ටව්‍යයන් ඉවසනුවට අක්‍ෂම වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ කයින් ස්ප්‍රෂ්ටව්‍යය පැහැස රජනීය ස්ප්‍රෂ්ටව්‍යයෙහි රැඳෙයි. චිත්තය සමාහිත කිරීමට නො හැකි වෙයි. මහණෙනි, මෙසේ මහණ ස්ප්‍රෂ්ටව්‍යයන් නො සහනේ වෙයි.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු න ආහුනෙය්‍යො හොති, න පාහුනෙය්‍යො, න දක්ඛිණෙය්‍යො, න අඤ්ජලි-කරණීයො, න අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්ත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති රූපානං. ඛමො හොති සද්දානං. ඛමො හොති ගන්ධානං. ඛමො හොති රසානං. ඛමො හොති ඵොට්ඨබ්බානං.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති රූපානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො හත්ථිකායං වා දිස්වා අස්සකායං වා දිස්වා රථකායං වා දිස්වා පත්තිකායං වා දිස්වා න සංසීදති, න විසීදති, සන්ථම්භති, සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති රූපානං.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති සද්දානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො හත්ථිසද්දං වා සුත්වා අස්සසද්දං වා සුත්වා රථසද්දං වා සුත්වා පත්තිසද්දං වා සුත්වා භෙරිපණවසඞ්ඛතිණවනින්නාද-සද්දං වා සුත්වා න සංසීදති, න විසීදති, සන්ථම්භති, සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති සද්දානං.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති ගන්ධානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො යෙ තෙ රඤ්ඤො නාගා අභිජාතා සඞ්ගාමාවචරා, තෙසං මුත්තකරීසස්ස ගන්ධං ඝායිත්වා න සංසීදති, න විසීදති, සන්ථම්භති, සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති ගන්ධානං.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති රසානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො එකිස්සා වා තිණොදකදත්තියා විමානිතො, ද්වීහි වා තීහි වා චතූහි වා පඤ්චහි වා තිණොදකදත්තීහි විමානිතො න සංසීදති, න විසීදති, සන්ථම්භති, සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති රසානං.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති ඵොට්ඨබ්බානං? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො එකෙන වා සරවෙධෙන විද්ධො, ද්වීහි වා තීහි වා චතූහි වා පඤ්චහි වා සරවෙධෙහි විද්ධො න සංසීදති, න විසීදති, සන්ථම්භති, සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති ඵොට්ඨබ්බානං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්ත්වෙව සඞ්ඛං ගච්ඡති.

මහණෙනි, මෙ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ ආහුනෙය්‍ය නො වෙ යි. ප්‍රාහුණෙය්‍ය නො වෙයි. දක්ෂිණෙය්‍ය නො වෙයි. අඤ්ජලිකරණීය නො වෙයි. ලොකයට අනුත්තරපුණ්‍යක්‍ෂෙත්‍ර නො වෙයි.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත රජුගේ හස්තිනාග රාජාර්හ වෙයි. රාජභොග්‍ය වෙයි. 'රාජාඞ්ගයෙක' යන සඞ්ඛ්‍යාවට යෙයි. කවර පසෙකින යත්:

මහණෙනි. මෙ ලොව්හි රජුගේ හස්තිනාග රූපයන් සහනු වෙයි ... සප්‍රෂ්ටව්‍යයන් සහනට ක්‍ෂම වෙයි.

මහණෙනි, කෙසේ නම් රජුගේ හස්තිනාග රූපයන් සහනු වේය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ හස්තිනාග සඞ්ග්‍රාමයට ගියේ ඇත්මුළු දැක වේවයි ... සඞ්ග්‍රාමභූමියට බස්නට සමත් වෙයි. මහණෙනි, මෙසෙයින් රජුගේ හස්ති රූපයන් සහනු වෙයි.

මහණෙනි, කෙසේ නම් රජුගේ ඇත් ශබ්දයන් සහනු වේය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ ඇත් සඞ්ග්‍රාමභූමියට ගියේ හස්තිශබ්ද අසා හෝ අශ්වශබ්ද අසා හෝ රථශබ්ද අසා හෝ පදාතිශබ්ද අසා හෝ භෙරිපණවශඞ්ඛතිණවනිනාද අසා හෝ සංසිඳන නො කෙරෙයි. විසිඳන නො කෙරෙයි. සංස්තම්භන කෙරෙයි. සඞ්ග්‍රාමභූමියට වදනට හැකි වෙයි. මහණෙනි, මෙසේ රජුගේ ඇත් ශබ්දයන් සහනු වෙයි.

මහණෙනි, කෙසේ නම් රජුගේ හස්ති ගන්ධයන් සහනු වේය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ ඇත් සඞ්ග්‍රාමභූමියට ගියේ රජුගේ යම් අභිජාත වූ සඞ්ග්‍රාමාවචීර්ණ වූ හස්තිහු වෙත් නම්, ඔවුන්ගේ මූත්‍රපුරීෂ-ගන්ධ අසා සංසිඳන නො කරයි. විසිඳන නො කරයි. සංස්තම්භන කරයි. සංඞ්ග්‍රාමභූමියට බස්නට හැකි වෙයි. මහණෙනි, මෙසෙයින් රජුගේ හස්ති ගන්ධයන් සහනු වෙයි.

මහණෙනි, කෙසේ නම් රජුගේ හස්ති රසයන් සහනු වේය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ ඇත් සඞ්ග්‍රාමභූමියට ගියේ එක් තණදිය දීමෙකින් වේවයි අපමානිත වූයේ, (තණදිය දීම්) දෙකෙකින් වේවයි තුණෙකින් සතරෙකින් වේවයි තණ දිය දීම් පසෙකින් වේවයි අපමානිත වූයේ සංසිඳන නො කෙරෙයි. විසිඳන නො කෙරෙයි. සංස්තම්භන කෙරෙයි. සඞ්ග්‍රාමාවතරණයට සමත් වෙයි. මහණෙනි, මෙසෙයින් රජුගේ හස්ති රසයන් සහනු වෙයි.

මහණෙනි, කෙසේ නම් රජුගේ ඇත් සප්‍රෂ්ටව්‍යයන් සහනු වේය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ ඇත් සඞ්ග්‍රාමයට ගියේ එක් ශරවෙධයෙ-කින් විදුනා ලදුයේ හෝ ශරවෙධ දෙකෙකින් හෝ තුණෙකින් හෝ සතරෙකින් හෝ පසෙකින් හෝ විදුනා ලදුයේ සංසිඳන නො කෙරෙයි. විසිඳන නො කෙරෙයි. සංස්තම්භන කෙරෙයි. සඞ්ග්‍රාමයට බස්නට සමත් වෙයි. මහණෙනි, මෙසේ රජුගේ ඇත් සප්‍රෂ්ටව්‍යයන් සහනු වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත රජුගේ ඇත් රාජාර්හ වෙයි. රාජභොග්‍ය වෙයි. 'රාජාඞ්ගයෙක' යන සඞ්ඛ්‍යාවට යෙයි.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු ඛමො හොති රූපානං. ඛමො සද්දානං, ඛමො ගන්ධානං, ඛමො රසානං, ඛමො ඵොට්ඨබ්බානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඛමො හොති රූපානං? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා රජනීයෙ රූපෙ න සාරජ්ජති. සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඛමො හොති රූපානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඛමො හොති සද්දානං? ඉධ භික්ඛවෙ භික්ඛු සොතෙන සද්දං සුත්වා රජනීයෙ සද්දෙ න සාරජ්ජති. සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඛමො හොති සද්දානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඛමො හොති ගන්ධානං? ඉධ භික්ඛවෙ භික්ඛු ඝානෙන ගන්ධං ඝායිත්වා රජනීයෙ ගන්ධෙ න සාරජ්ජති. සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඛමො හොති ගන්ධානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඛමො හොති රසානං? ඉධ භික්ඛවෙ භික්ඛු ජිව්හාය රසං සායිත්වා රජනීයෙ රසෙ න සාරජ්ජති. සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඛමො හොති රසානං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඛමො හොති ඵොට්ඨබ්බානං? ඉධ භික්ඛවෙ භික්ඛු කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා රජනීයෙ ඵොට්ඨබ්බෙ න සාරජ්ජති. සක්කොති චිත්තං සමාදහිතුං. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඛමො හොති ඵොට්ඨබ්බානං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

### 5. 3. 4. 10.

### [සොතාරසුත්තං]

[සාවත්ථිනිදානං]

**40.** පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සොතා ච හොති, හන්තා ච, රක්ඛිතා ච, ඛන්තා ච, ගන්තා ච.

මහණෙනි, ඒ පරිද්දෙන් ම කරුණු පසෙකින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි. පාහුනෙය්‍ය වෙයි. දක්ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලිකරණීය වෙයි. ලොකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපාලම්බනයන් සහනුයේ වෙයි. ශබ්දාලම්බනයන් සහනුයේ වෙයි. ගන්ධාලම්බනයන් සහනුයේ වෙයි. රසාලම්බනයන් සහනුයේ වෙයි. ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයන් සහනුයේ වෙයි.

මහණෙනි, කෙසේ මහණ රූපයන් ඉවසනුයේ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ චක්ෂුසින් රූපාලම්බන දැක රජනීය රූපයෙහි නො ඇලෙයි. සිත සමාහිත කිරීමට සමත් වෙයි. මහණෙනි, මෙසෙයින් මහණ රූපයන් සහනුයේ වෙයි.

මහණෙනි, කෙසේ මහණ ශබ්දයන් ඉවසන්නේ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රොත්‍රයෙන් ශබ්දාලම්බන අසා රජනීය ශබ්දාලම්බනයෙහි නො ඇලෙයි. සිත සමාහිත කරණට හැකියේ වෙයි. මහණෙනි, මෙ සෙයින් මහණ ශබ්දයන් ඉවසනුයේ වෙයි.

මහණෙනි, කෙසේ මහණ ගන්ධයන් ඉවසනුයේ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ඝ්‍රාණයෙන් ගන්ධාලම්බන ආඝ්‍රාණ කොට රජනීය ගන්ධාලම්බනයෙහි නො ඇලෙයි. සිත සමාහිත කරණයට හැකියේ වෙයි. මහණෙනි, මෙසේ මහණ ගන්ධයන් ඉවසනුයේ වෙයි.

මහණෙනි, කෙසේ මහණ රසයන් ඉවසනුයේ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ජිහ්වායෙන් රසාලම්බන විඳ රජනීය රසාලම්බනයෙහි නො ඇලෙයි. චිත්තය සමාහිත කරණයට හැකි වෙයි. මහණෙනි, මහණ මෙසේ රසයන් ඉවසනුයේ වෙයි.

මහණෙනි, කෙසේ මහණ ස්ප්‍රෂ්ටව්‍යයන් ඉවසනුයේ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ කයින් ස්ප්‍රෂ්ටව්‍ය පැහැස රජනීය ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි නො ඇලෙයි. චිත්තය සමාහිත කරණට හැකි වෙයි. මහණෙනි, මෙසේ මහණ ස්ප්‍රෂ්ටව්‍යයන් ඉවසනුයේ වෙයි.

මහණෙනි, මේ කරුණු පසින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි. පාහුනෙය්‍ය වෙයි. දක්ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලිකරණීය වෙයි. ලොකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වේ ය යි.

## 5. 3. 4. 10.

### [සොතාර සූත්‍රය]

[සැවැත්නිදානයි]

**40**. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත රජකීය මහඇත් රාජාර්හ වෙයි, රාජභොග්‍ය වෙයි, 'රාජාඞ්ගයෙක' යන සඞ්ඛ්‍යාවට යෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ ලොව්හි රජුගේ මහඇත් අසන්නේ ද වෙයි, නසන්නේ ද වෙයි, රකින්නේ ද වෙයි, ඉවසන්නේ ද වෙයි, යන්නේ ද වෙයි.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො සොතා හොති? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො යමෙනං හත්ථිදම්මසාරථි කාරණං කාරෙති යදි වා කතපුබ්බං යදි වා අකතපුබ්බං, තං අට්ඨිකත්වා[1] මනසිකත්වා සබ්බචෙතසො[2] සමන්නාහරිත්වා ඔහිතසොතො සුණාති. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො සොතා හොති.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො හන්තා හොති? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො හත්ථිම්පි හනති,[3] හත්ථාරූහම්පි හනති. අස්සම්පි හනති, අස්සාරූහම්පි හනති. රථම්පි හනති, රථියම්පි[4] හනති. පත්තිකම්පි හනති. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො හන්තා හොති.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො රක්ඛිතා හොති? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො සඞ්ගාමගතො රක්ඛති පුරිමං කායං, රක්ඛති පච්ඡිමං කායං. රක්ඛති පුරිමෙ පාදෙ, රක්ඛති පච්ඡිමෙ පාදෙ. රක්ඛති සීසං, රක්ඛති කණ්ණෙ, රක්ඛති දන්තෙ, රක්ඛති සොණ්ඩං, රක්ඛති වාලධිං, රක්ඛති හත්ථාරූහං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො රක්ඛිතා හොති.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො ඛන්තා හොති? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො ඛමො හොති සත්තිප්පහාරානං, අසිප්පහාරානං, උසුප්පහාරානං, ඵරසුප්පහාරානං, භෙරිපණවසඞ්ඛතිණවනින්නාදසද්දානං. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො ඛන්තා හොති.

කථඤ්ච භික්ඛවෙ රඤ්ඤො නාගො ගන්තා හොති? ඉධ භික්ඛවෙ රඤ්ඤො නාගො යමෙනං හත්ථිදම්මසාරථි දිසං පෙසෙති යදිවා ගතපුබ්බං යදිවා අගතපුබ්බං, තං ඛිප්පං එව[5] ගන්තා හොති. එවං ඛො භික්ඛවෙ රඤ්ඤො නාගො ගන්තා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො නාගො රාජාරහො හොති රාජභොග්ගො. රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සොතා ච හොති, හන්තා ච, රක්ඛිතා ච, ඛන්තා ච, ගන්තා ච.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සොතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ දෙසියමානෙ අට්ඨිකත්වා[6] මනසිකත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතො ධම්මං සුණාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු සොතා හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු හන්තා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නං ව්‍යාපාදවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නං විහිංසාවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු හන්තා හොති.

---

1. අට්ඨිං කත්වා - මජසං 2. සබ්බං චෙතසා - සීමු, සබ්බචෙතසා - මජසං 3. හන්ති - මජසං ස්‍යා. 4. රථිකම්පි - මජසං, ස්‍යා. 5. ඛිප්පමෙව - මජසං. 6. අට්ඨිං කත්වා - මජසං

මහණෙනි, කෙසේ රජුගේ මහඇත් ශ්‍රොතෘ වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ මහඇත් ඇත්දම්සැරි තෙල ඇත්හු ලවා කළ විරූ වේවයි නොකළ විරූ වේවයි යම් ම කාරණයක් කරවා නම්, එය අර්පී කොට (ඕනෑකමින්) මෙනෙහි කොට මුළු සිතින් ආවර්ජනා කොට යොමු කළ කන් ඇතිව අසයි. මහණෙනි, මෙසේ රජුගේ මහඇත් ශ්‍රොතෘ වෙයි.

මහණෙනි, කෙසේ රජුගේ මහ ඇත් හන්තෘ වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ මහඇත් රණබිමට ගියේ ඇතු ද නසයි, ඇතැරු ද නසයි, අසු ද නසයි, අසරු ද නසයි, රථය ද නසයි, රථිකයා ද නසයි, පාබලසෙන් ද නසයි. මහණෙනි, මෙසේ රජුගේ ඇත්රජ හන්තෘ වෙයි.

මහණෙනි, කෙසේ රජුගේ මහඇත් රක්‍ෂිතෘ වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ මහඇත් රණබිමට ගියේ ඉදිරිකය රක්නේ ය, පශ්චිමකාය රක්නේ ය, ඉදිරි පා රක්නේ ය, පසු පා රක්නේ ය, හිස රක්නේ ය, දෙකන් රක්නේ ය, දෙදළ රක්නේ ය, සොඬ රක්නේ ය, වල්පත් රක්නේ ය, ඇතැරු රක්නේ ය. මහණෙනි, මෙසේ රජුගේ මහඇත් රක්‍ෂිතෘ වෙයි.

මහණෙනි, කෙසේ රජුගේ මහඇත් ක්‍ෂන්තෘ වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ මහඇත් සැත්පහර ඉවසනුයේ වෙයි, කඩුපහර ඉවසනුයේ වෙයි, හී පහර ඉවසනුයේ වෙයි, පොරෝ පහර ඉවසනුයේ වෙයි, බෙර පණාබෙර සක් ගැටබෙර තිණව-ඩිණ්ඩිම බෙර යන තූර්‍ය්‍යයන්ගේ-මහ හඬ ඉවසනුයේ වෙයි. මහණෙනි, මෙසේ රජුගේ මහඇත් ක්‍ෂන්තෘ වෙයි.

මහණෙනි, කෙසේ රජුගේ මහඇත් ගන්තෘ වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි රජුගේ මහඇත් ඇත්දම්සැරි තෙල ඇතු ගිය විරූ වේවයි නොගිය විරූ වේවයි යම් ම දිශාවකට මෙහෙයවා නම්, එ දිගට වහා යන්නේ වෙයි. මහණෙනි, මෙසේ රජුගේ මහඇත් ගන්තෘ වෙයි.

මහණෙනි, මේ කරුණු පසින් යුත් රජුගේ මහඇත් රාජාර්හ වෙයි. රාජභොග්‍ය වෙයි. 'රාජාඞ්ගයෙක' යන සඞ්ඛ්‍යාවට යෙයි.

මහණෙනි, එපරිද්දෙන් ම කරුණු පසෙකින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි, පාහුනෙය්‍ය වෙයි, දක්ඛිණෙය්‍ය වෙයි, අඤ්ජලිකරණීය වෙයි, ලොකයට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රොතෘ ද වෙයි, හන්තෘ ද වෙයි, රක්‍ෂිතෘ ද වෙයි, ක්‍ෂන්තෘ ද වෙයි, ගන්තෘ ද වෙයි.

මහණෙනි, කෙසේ මහණ ශ්‍රොතෘ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ තථාගතයන් වහන්සේ විසින් ප්‍රවිදිත ධර්මවිනය දෙසනු ලබත් ම අර්පී කොට (ආශාවෙන්), මෙනෙහි කොට, සමපූර්ණ සිතින් ආවර්ජනා කොට, නැඹුරු කළ කන් ඇතිව ධර්මය අසයි. මහණෙනි, මෙසේ මහණ ශ්‍රොතෘ වෙයි.

මහණෙනි, කෙසේ මහණ හන්තෘ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ උපන් කාමවිතර්කය සිත්හි නො රඳවයි, දුරු කෙරෙයි, හැරපියයි. විගතාන්ත (ප්‍රහීණ) කරයි, අභාවයට පමුණුවයි. උපන් ව්‍යාපාදවිතර්කය සිත්හි වාස නො කරවයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කරයි. අභාවයට පමුණුවයි. උපන් විහිංසාවිතර්කය සිත්හි වාස නො කරවයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අභාවයට පමුණුවයි. උපනුපන් ලමු අකුසල් දහම් වාස නො කරවයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි. අභාවයට පමුණුවයි. මහණෙනි, මෙසේ මහණ හන්තෘ වෙයි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු රක්ඛිතා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්‍වාධිකරණමෙතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්‍වාධිකරණමෙතං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවං ඛො භික්ඛවෙ භික්ඛු රක්ඛිතා හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඛන්තා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං, දුරුත්තානං දුරාගතානං වචනපථානං. උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඛන්තා හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ගන්තා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු යා සා දිසා අගතපුබ්බා ඉමිනා දීඝෙන අද්ධුනා යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, තං ඛිප්පඤ්ඤෙව ගන්තා හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ගන්තා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

**රාජවග්ගො චතුත්ථො.**

**තස්සුද්දානං:**

චක්කානුවත්තනා රාජා යස්සං දිසං වෙව පත්ථනා
අප්පං සුපති භත්තාද අක්ඛමො සොතාරො චාති.

මහණෙනි, කෙසේ මහණ රක්ෂිතෘ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ඇසින් රූප දැක නිමිති නො ගන්නා සුලුයේ අනුවියඳුන් (උපලකුණු) නො ගන්නා සුලුයේ වෙයි. යම් හෙයෙකින් ලාමක අකුශලධර්ම වූ අභිධ්‍යා දෞර්මනස්‍යයෝ චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට වාස කරණ තෙල පුද්ගලයා ලුහුබඳනාහු නම්, එ චක්ෂුරින්ද්‍රිය සංවර කිරීමට පිළිපදනේ ය. චක්ෂුරින්ද්‍රිය රකියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. ශ්‍රොත්‍රයෙන් ශබ්ද අසා ... ඝ්‍රාණයෙන් ගන්ධය ආඝ්‍රාණ කොට ... දිවින් රස විඳ ... කයින් ස්ප්‍රෂ්ටව්‍ය පැහැස ... මනසින් ධර්මය දැන නිමිති නො ගන්නා සුලුයේ අනුව්‍යඤ්ජන නො ගන්නා සුලුයේ වෙයි. යම් හෙයෙකින් ලාමක අකුශලධර්ම වූ අභිධ්‍යාදෞර්මනස්‍යයෝ මනින්ද්‍රිය අසංවෘත කොට වසන තෙල පුහුල්හු ලුහුබඳනාහු නම්, ඒ මනින්ද්‍රිය සංවරය පිණිස පිළිපදිනේ ය. මනින්ද්‍රිය රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. මහණෙනි, මෙසේ මහණ රක්ෂිතෘ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ක්ෂන්තෘ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ශීත හා උෂ්ණ හා සාපවස් හා මැසි මදුරු වා අවු සපුන් පහස් ඉවසන්නේ වෙයි. නපුරු කොට කියූ නපුරු කොට පැමිණි (අසන්නට ලැබුනු) වචන ඉවසන්නේ වෙයි. දුක් වූ තීව්‍ර වූ ක්‍රූර වූ කටුක වූ අශාත වූ අමනාප වූ පණ හරණා සුලු උපන් ශාරීරික වෙදනා ඉවසන සැහැවි ඇතියේ වෙයි. මහණෙනි, මෙසේ මහණ ක්ෂන්තෘ වෙයි.

මහණෙනි, මහණ කෙසේ ගන්තෘ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ මේ දීර්ඝකාලයෙහි සර්වසංස්කාරයන්ගේ ශමථය වන සර්වොපධීන්ගේ දුරලීම වන තෘෂ්ණාක්ෂය වන විරාගය වන නිරොධය වන නිර්වාණය වන යම් නොගියවිරූ දිශායෙක් වේ නම්, එ දිගට වහා යන සුලුයේ වෙයි. මහණෙනි, මෙසේ මහණ ගන්තෘ වෙයි.

මහණෙනි, මෙ පස් කරුණින් සමන්වාගත වූ මහණ ආහුනෙය්‍ය වෙයි, පාහුනෙය්‍ය වෙයි, දක්ඛිණෙය්‍ය වෙයි, අඤ්ජලිකරණීය වෙයි, ලොකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වේ යයි.

**රාජවර්ගය සතර වැනි යි.**

**එහි උද්දානය:**

චක්කානුවත්තන සූත්‍ර දෙකය, ධම්මරාජ සූත්‍රය, යස්සං දිසං සූත්‍රය, පත්ථනා සූත්‍ර දෙකය, අප්පං සුපති සූත්‍රය, භත්තාද සූත්‍රය, අක්ඛම සූත්‍රය, සොතාර සූත්‍රය සමඟ දශයෙකි.

## 5. තිකණ්ඩකීවග්ගො.

### 5. 3. 5. 1.

### [අවජානාතිසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**41.** පඤ්චිමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ පඤ්ච:

දත්වා අවජානාති, සංවාසෙන අවජානාති, ආදිය්‍යමුඛො[1] හොති, ලොලො හොති, මන්දො හොති මොමූහො.[2]

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො දත්වා අවජානාති? ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලස්ස දෙති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරං. තස්ස එවං හොති: 'අහං දෙමි, අයං පතිගණ්හාතී'ති.[3] තමෙනං දත්වා අවජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො දත්වා අවජානාති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සංවාසෙන අවජානාති? ඉධ භික්ඛවෙ පුග්ගලො පුග්ගලෙන සද්ධිං සංවසති ද්වෙ වා තීණි වා වස්සානි. තමෙනං සංවාසෙන අවජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සංවාසෙන අවජානාති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ආදිය්‍යමුඛො[1]* හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො පරස්ස වණ්ණෙ වා අවණ්ණෙ වා භාසියමානෙ තං ඛිප්පඤ්ඤෙව අධිමුච්චිතා[4] හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ආදිය්‍යමුඛො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො ලොලො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ඉත්තරසද්ධො හොති ඉත්තරභත්ති ඉත්තරපෙමො ඉත්තරප්පසාදො. එවං ඛො භික්ඛවෙ පුග්ගලො ලොලො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො මන්දො හොති මොමූහො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො කුසලාකුසලෙ ධම්මෙ න ජානාති, සාවජ්ජානවජ්ජෙ ධම්මෙ න ජානාති, හීනප්පණීතෙ ධම්මෙ න ජානාති, කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මෙ න ජානාති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො මන්දො හොති මොමූහො.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච පුග්ගලා සන්තො සංවිජ්ජමානාලොකස්මින්ති.

### 5. 3. 5. 2.

### [ආරභතිසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**42.** පඤ්චිමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ආරභති[1] ච විප්පටිසාරී ච හොති. තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

---

1. ආධෙය්‍යමුඛො - මජසං, ආදෙය්‍යමුඛො - සයා, ආදියමුඛො -
* 'ආධිය්‍යමුඛො'ති පොරාණපාඨො. අට්ඨකථායපි පාලියා අත්ථො නිද්දිට්ඨො.
2. මන්දො මොමූහො හොති - මජසං, සයා
3. පටිගණ්හාතී'ති - මජසං
4. අධිමුච්චිතො - සයා

# 5. තිකණ්ඩකීවග්ගය

## 5. 3. 5. 1.

## [අවජානාති සූත්‍රය]

[සැවැත්නිදානයි]

**41.** මහණෙනි, ලෝකයෙහි විද්‍යමාන වන මේ පුද්ගලයෝ පස් දෙනෙක් වෙත්. කවර පස්දෙනෙක යත්:

දී අවමන් කරන්නේ ය, එක්වැ විසීමෙන් අවමන් කරන්නේ ය, ග්‍රහණමුඛයෙක් වෙයි, ලොලයෙක් වෙයි, මන්‍ද මොමුහයෙක් වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල දී අවමන් කෙරේ ය යත්: මහණෙනි, මෙ ලොවැ පුද්ගල පුහුලක්හට සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසද් පිරිකර දෙයි. ඔහට මෙබඳු සිත් වෙයි: ‘මම දෙන්නෙම් වෙමි, මෙ තෙමේ පිළිගන්නේ වේ (මෙතෙම පිළිගන්නට නම් දනී) ය’යි. තෙල පුහුල්හට දී අවමන් කෙරෙයි. මහණෙනි, මෙසේ පුද්ගල දී අවමන් කරන්නේ ය.

මහණෙනි, කෙසේ පුද්ගල සංවාසයෙන් (එක්ව විසීමෙන්) අවමන් කෙරේ ය යත්: මහණෙනි, මෙ ලොවැ පුද්ගල පුද්ගලයකු හා සමග දෙවසක් වේවයි තෙවසක් වේවයි එක්ව වසයි. සංවාසයෙන් (මම තොපගේ හැටි දනිමි යි) එපුහුල්හට අවමන් කෙරෙයි. මහණෙනි, මෙසේ පුද්ගල සංවාසයෙන් අවමන් කෙරෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල ග්‍රහණමුඛ වේ ය යත්: මහණෙනි, මෙ ලොවැ ඇතැම් පුද්ගලයෙක් මෙරමාගේ ගුණය වේවයි අගුණය වේවයි කියත් ම එය වහා ම අදහන්නේ (පිළිගැණීමට හයාගත් මුව ඇත්තේ) වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ග්‍රහණමුඛ වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල ලොල වේ ය යත්: මහණෙනි, මෙ ලොවැ ඇතැම් පුද්ගලයෙක් ඉත්වර (සවල්ප) ශ්‍රද්ධා ඇතියේ ඉත්වරභක්ති ඇතියේ ඉත්වරප්‍රේමඇතියේ ඉත්වරප්‍රසාද ඇතියේ වෙයි. මහණෙනි, මෙසේ පුද්ගල ලොලයෙක් (වහා වෙනස්වන සුලු අස්ථිරයෙක්) වෙයි.

මහණෙනි, කෙසේ පුද්ගල මන්‍ද මොමුහ වේ ය යත්: මහණෙනි, මෙ ලොවැ ඇතැම් පුද්ගලයෙක් කුශල අකුශල ධර්මයන් නො දන්නේ ය. සාවද්‍ය අනවද්‍ය ධර්මයන් නො දන්නේ ය. හීනප්‍රණීත ධර්මයන් නො දන්නේ ය. කෘෂ්ණශුක්ල සප්‍රතිභාග (අකුශලවිරුද්ධ කුශල, කුශලවිරුද්ධ අකුශල) ධර්මයන් නො දන්නේ ය. මහණෙනි, මෙසේ පුද්ගල මන්‍ද මොමුහ වෙයි.

මහණෙනි ,මොහු ලොකයෙහි විද්‍යමාන පුද්ගලයෝ පස්දෙන යි.

## 5. 3. 5. 2.

## [ආරම්භති සූත්‍රය]

[සැවැත්නිදානයි]

**42.** මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයෝ පස්දෙනෙක් විද්‍යමාන වෙත්. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් ආපත්තිව්‍යතික්‍රම (ආරම්භ) ද කෙරෙයි. (එ හෙතුයෙන්) විපිළිසර ඇතියේ ද වෙයි. යම් තැනෙක්හි (යම් කරුණෙක්හි) ඔහුට උපන් එ ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂව නිරුද්ධ වෙත් නම්, ඒ (අර්හත්ඵලසමාධි) චෙතොවිමුක්තිය හා (අර්හත්ඵලඥාන) ප්‍රඥාවිමුක්තිය ඇති සැටියෙන් (අර්හත්වාධිගම නැති හෙයින්) නො දන්නේ ය,

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ආරම්භති, න විප්පටිසාරී හොති. තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්සු තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො නාරම්භති, විප්පටිසාරී හොති. තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්සු තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො නාරම්භති, න විප්පටිසාරී හොති. තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්සු තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො නාරම්භති, න විප්පටිසාරී හොති. තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්සු තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ආරම්භති ච, විප්පටිසාරී ච හොති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්සු තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති, සො එවමස්ස වචනීයො: 'ආයස්මතො ඛො ආරම්භජා ආසවා සංවිජ්ජන්ති. විප්පටිසාරජා ආසවා පවඩ්ඪන්ති. සාධු වතායස්මා ආරම්භජෙ ආසවෙ පහාය විප්පටිසාරජෙ ආසවෙ පටිවිනොදෙත්වා චිත්තං පඤ්ඤං ච භාවෙතු. එවමායස්මා අමුනා පඤ්චමෙන පුග්ගලෙන සමසමො භවිස්සතී'ති.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ආරම්භති, න විප්පටිසාරී හොති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්සු තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති, සො එවමස්ස වචනීයො: 'ආයස්මතො ඛො ආරම්භජා ආසවා සංවිජ්ජන්ති. විප්පටිසාරජා ආසවා නප්පවඩ්ඪන්ති. සාධු වතායස්මා ආරම්භජෙ ආසවෙ පහාය චිත්තං පඤ්ඤං ච භාවෙතු. එවමායස්මා අමුනා පඤ්චමෙන පුග්ගලෙන සමසමො භවිස්සතී'ති.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො නාරම්භති, විප්පටිසාරී හොති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්සු තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති, සො එවමස්ස වචනීයො: 'ආයස්මතො ඛො ආරම්භජා ආසවා න සංවිජ්ජන්ති. විප්පටිසාරජා ආසවා පවඩ්ඪන්ති. සාධු වතායස්මා විප්පටිසාරජෙ ආසවෙ පටිවිනොදෙත්වා චිත්තං පඤ්ඤං ච භාවෙතු. එවමායස්මා අමුනා පඤ්චමෙන පුග්ගලෙන සමසමො භවිස්සතී'ති.

---

1. ආරභති - සීමු, මජසං

මහණෙනි, මේ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් ඇවැත් වඩනේ ය, (ඇවැතින් නැඟිසිටි හෙයින්) විපිළිසර ඇතියේ නො වෙයි. යම් කරුණෙකින් ඔහට උපන් එ ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂ වූවාහු නිරුද්ධ වෙත් නම්, ඒ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා ඇති සැටියෙන් නො දන්නේ ය.

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් ආපත්තිව්‍යතික්‍රම නො කෙරෙයි. (ඇවැතින් නැඟී සිටියේ ද) විපිළිසර ඇතියේ වෙයි. යම් කරුණෙකින් ඔහට උපන් එ ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂ වූවාහු නිරුද්ධ වෙත් නම්, ඒ චෙතොවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඇතිසැටියෙන් නො දන්නේ ය.

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් ආපත්තිව්‍යතික්‍රම නො කෙරෙයි. විපිළිසර ඇතියේ ද නො වෙයි. යම් හෙයෙකින් ඔහට උපන් එ ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂ වූවාහු නිරුද්ධ වෙත් නම්, ඒ චෙතොවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඇතිසැටියෙන් නො දන්නේ ය.

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් ආපත්තිව්‍යතික්‍රම නො කෙරෙයි. විපිළිසර ඇතියේ නො වෙයි. යම් හෙයෙකින් ඔහට උපන් එ ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂ වූවාහු නිරුද්ධ වෙත් නම්, එ චෙතො-විමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඇති සැටියෙන් දන්නේය. (මේ රහත් පුහුල් ය)

මහණෙනි, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් ඇවැත් වඩිනේ හා විපිළිසර ඇතියේ හා වේ ද, යම් කරුණෙකින් ඔහට උපන් එ ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂ වූවාහු නිරුද්ධ වෙත් නම්, ඒ චෙතොවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඇතිසැටි නොදන්නේ ද, හේ මෙසේ කිවයුතු වන්නේ ය: 'ආයුෂ්මත්හට ආපත්තිව්‍යතික්‍රමයෙන් උපන් ආස්‍රවයෝ විද්‍යමාන වෙති. විප්‍රතිසාරයෙන් උපන් ආස්‍රවයෝ වැඩෙති. ආයුෂ්මත් ආරම්භප්‍රත්‍යයෙන් උපන් ආස්‍රවයන් ප්‍රහීණ කොට විප්‍රතිසාරයෙන් උපන් ආස්‍රවයන් දුරු කොට චිත්තය (සමාධි–ප්‍රඥ දෙක) වඩතේ මැනැව. එසේ වත් ම ආයුෂ්මත් මේ පස්වන (රහත්) පුහුල් හා සමසම වන්නේ ය'යි.

මහණෙනි, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් ආපත්තිව්‍යතික්‍රම කෙරේ ද, විපිළිසර ඇතියේ නො වේ ද, යම් කරුණෙකින් ඔහට උපන් එ ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂ ව නිරුද්ධ වෙත් නම්, ඒ චෙතොවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඇති සැටියෙන් නො දන්නේ ද, හේ මෙසෙයින් කිවයුතු වන්නේ ය: 'ආයුෂ්මත්හට වනාහි ආරම්භප්‍රත්‍යයෙන් උපන් ආස්‍රවයෝ විද්‍යමානයහ. විපිළිසරින් උපන් ආස්‍රවයෝ නො වැඩෙත්නාහ. ආයුෂ්මත් එකාන්තයෙන් ආරම්භප්‍රත්‍යයෙන් උපන් ආස්‍රවයන් ප්‍රහීණ කොට සමාධිය හා ප්‍රඥව හා වඩා නම් මැනැවැ. එසේවත් ම ආයුෂ්මත් තෙල පස්වන පුහුල් හා සමසම වන්නේ ය'යි.

මහණෙනි, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් ආපත්තිව්‍යතික්‍රමය නො කෙරේ ද, (එහෙත්) විපිළිසර ඇතියේ වේ ද, යම් කරුණෙකින් ඔහට උපන් එ ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂ වූවාහු නිරුද්ධ වෙත් නම්, ඒ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා ඇති සැටියෙන් නො දන්නේ ද, හේ මෙසේ කිවයුතු වන්නේ ය: 'ආයුෂ්මත්ට ආරම්භප්‍රත්‍යයෙන් උපන් ආස්‍රවයෝ විද්‍යමාන නො වෙති. විපිළිසරින් උපන් ආස්‍රවයෝ වැඩෙත්-නාහ. ආයුෂ්මත් එකාන්තයෙන් විපිළිසරින් උපන් ආස්‍රවයන් දුරු කොට චිත්තය හා ප්‍රඥව හා වඩා නම් මැනැවැ. එසේ වත් ම ආයුෂ්මත් තෙල පස්වන පුද්ගලයා හා සමසම වන්නේ ය'යි.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො නාරම්භති, න විප්පටිසාරී හොති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති, සො එවමස්ස වචනීයො: 'ආයස්මතො බො ආරම්භජා ආසවා න සංවිජ්ජන්ති. විප්පටිසාරජා ආසවා නප්පවඩ්ඪන්ති. සාධු වතායස්මා චිත්තං පඤ්ඤං ච භාවෙතු. එවමායස්මා අමුනා පඤ්චමෙන පුග්ගලෙන සමසමො භවිස්සතී'ති.

ඉති බො භික්ඛවෙ ඉමෙ චත්තාරො පුග්ගලා අමුනා පඤ්චමෙන පුග්ගලෙන එවං ඔවදියමානා එවං අනුසාසියමානා අනුපුබ්බෙන ආසවානං ඛයං පාපුණන්තී'ති.

## 5. 3. 5. 3.

## [සාරන්දදසුත්තං]

**43.** එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ **කූටාගාර-සාලායං**. අථ බො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි.

තෙන බො පන සමයෙන පඤ්චමත්තානං ලිච්ඡවීසතානං **සාරන්දදෙ චෙතියෙ** සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: 'පඤ්චන්නං රතනානං පාතුභාවො දුල්ලභො ලොකස්මිං. කතමෙසං පඤ්චන්නං: හත්ථිරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. අස්සරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. මණිරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. ඉත්ථිරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. ගහපතිරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. ඉමෙසං පඤ්චන්නං රතනානං පාතුභාවො දුල්ලභො ලොකස්මින්ති.'

අථ බො තෙ ලිච්ඡවී මග්ගෙ පුරිසං ඨපෙසුං, 'යදා ත්වං[1] අම්භො පුරිස පස්සෙය්‍යාසි භගවන්තං ආගච්ඡන්තං, අථ අම්හාකං ආරොචෙය්‍යාසී'ති. අද්දසා බො සො පුරිසො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන යෙන තෙ ලිච්ඡවී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ ලිච්ඡවී එතදවොච: 'අයං සො භොන්තො[2] භගවා ආගච්ඡති[3] අරහං සම්මාසම්බුද්ධො, යස්සදානි කාලං මඤ්ඤථා'ති.

අථ බො තෙ ලිච්ඡවී යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා බො තෙ ලිච්ඡවී භගවන්තං එතදවොචුං: 'සාධු භන්තෙ භගවා යෙන සාරන්දදං[4] චෙතියං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ බො භගවා යෙන සාරන්දදං චෙතියං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ බො භගවා තෙ ලිච්ඡවී එතදවොච:

1. යථා ත්වං - සීමු, PTS.
2. භන්තෙ - සීමු.
3. ගච්ඡති - මජ්ඣසං.
4. සාධු භන්තෙ යෙන සාරන්දදං - මජ්ඣසං.

මහණෙනි, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් ආපත්තිව්‍යතික්‍රමය නො කෙරේ ද, විපිළිසර ඇතියේ නො වේ ද, යම් කරුණෙක්හි ඔහට උපන් ඒ ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂ වූවාහු නිරුද්ධ වෙත් නම් ඒ චේතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා ඇතිසැටියෙන් නො දන්නේද, හේ මෙසේ කියයුතු වන්නේ ය: 'ආයුෂ්මත්හට ආරම්භප්‍රත්‍යයෙන් උපන් ආස්‍රවයෝ අවිද්‍යමානයහ. විපිළිසරින් උපන් ආස්‍රවයෝ නො වැඩෙන්නාහ. ආයුෂ්මත් චිත්තය හා ප්‍රඥාව වඩා නම් එකාන්තයෙන් මැනැවැ. එසේ වත් ම ආයුෂ්මත් තෙල පස්වන පුද්ගලයා හා සමසම වන්නේ ය'යි.

මහණෙනි, මෙසේ මෙ (මුලින් කී) සතර පුද්ගලයෝ මේ පස්වන (රහත්) පුඟුල්හු විසින් මෙලෙසින් ඔවා දෙනු ලබන්නාහු මෙසේ අනුසස්නා ලබන්නාහු අනුක්‍රමයෙන් ආස්‍රවක්ෂයට පැමිණෙන්නාහ යි.

## 5. 3. 5. 3.

## [සාරන්දද සූත්‍රය]

**43.** එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **වෙසාලී** නගර සමීපයෙහි වූ මහාවනයෙහි **කූටාගාරශාලාහි** වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ වෙසාලියට පිඬු පිණිස වැඩි සේක.

එසමයෙහි **සාරන්දද චෛත්‍යයෙහි** රැස්ව හුන් පන්සියක් පමණ ලිච්ඡවීන් අතුරෙහි මෙ අතුරු කථාව පහළ විය: 'ලොව්හි පඤ්චරත්න-යන්ගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වෙයි. කවර පඤ්චරත්නයන්ගේ ය යත්: ලොව්හි හස්තිරත්නයාගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වෙයි. ලොව්හි අශ්වරත්නයාගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වෙයි. ලොව්හි මණිරත්නයාගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වෙයි. ලොව්හි ස්ත්‍රීරත්නයාගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වෙයි. ලොව්හි ගෘහපතිරත්නයාගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වෙයි. ලොව්හි මෙ පඤ්චරත්නයන්ගේ පහළවීම දුර්ලභ වේ'ය යි.

ඉක්බිති එ ලිච්ඡවීහු 'එම්බා පුරුෂය, යම් විටෙක තෝ භාග්‍යවතුන් වහන්සේ වඩනවුන් දක්නෙහි ද, එකල්හි අපට දන්වාලව'යි මාර්ගයෙහි පුරුෂයකු රඳවාලූහ. එ පුරුෂයා භාග්‍යවතුන්වහන්සේ වඩනාවුන් දුරදීම දිට. දැක එ ලිච්ඡවීන් කරා ගියේ. ගොස් එ ලිච්ඡවීනට තෙල කී: 'භවත්නි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ වඩනාහ. එයට දැන් කල් දනුව'යි.

එකල්හි එ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව සිටියහ. එකත්පස් ව සිටි එ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැළකළෝ: "වහන්ස, අයැදුම්හ. භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා සඳහා **සාරන්දද චෛත්‍යය** කරා වඩනා සේක්ව"යි. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සාරන්දද චෛත්‍යය කරා වැඩි සේක. වැඩ පැන්වූ අස්නෙහි හුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ එ ලිච්ඡවීනට තෙල කරුණ වදාළෝ:

"කායනුත්ථ ලිච්ඡවී, එතරහි කථාය සන්නිසින්නා? කා ච පන වො අන්තරා කථා විප්පකතා"ති?

ඉධ භන්තෙ අම්හාකං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: පඤ්චන්නං රතනානං පාතුභාවො දුල්ලභො ලොකස්මිං. කතමෙසං පඤ්චන්නං: හත්ථිරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. අස්සරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. මණිරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. ඉත්ථිරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. ගහපතිරතනස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. ඉමෙසං පඤ්චන්නං රතනානං පාතුභාවො දුල්ලභො ලොකස්මින්ති.

කාමාධිමුත්තානං වත වො[1] ලිච්ඡවීනං කාමඤ්ඤෙව ආරබ්භ අන්තරා කථා උදපාදි.

පඤ්චන්නං ලිච්ඡවී, රතනානං පාතුභාවො දුල්ලභො ලොකස්මිං. කතමෙසං පඤ්චන්නං:

තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසෙතා පුග්ගලො දුල්ලභො ලොකස්මිං. තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසිතස්ස විඤ්ඤාතා පුග්ගලො දුල්ලභො ලොකස්මිං. තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසිතස්ස විඤ්ඤාතස්ස ධම්මානුධම්මපටිපන්නො පුග්ගලො දුල්ලභො ලොකස්මිං. කතඤ්ඤූ කතවෙදී පුග්ගලො දුල්ලභො ලොකස්මිං.

ඉමෙසං ඛො ලිච්ඡවී, පඤ්චන්නං රතනානං පාතුභාවො දුල්ලභො ලොකස්මින්ති.

## 5. 3. 5. 4.

## [තිකණ්ඩකීසුත්තං]

**44.** එකං සමයං භගවා **සාකෙතෙ** විහරති **තිකණ්ඩකීවනෙ**.[2] තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සාධු භික්ඛවෙ භික්ඛු කාලෙන කාලං අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී[3] විහරෙය්‍ය.

සාධු භික්ඛවෙ භික්ඛු කාලෙන කාලං පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍ය.

සාධු භික්ඛවෙ භික්ඛු කාලෙන කාලං අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍ය.

සාධු භික්ඛවෙ භික්ඛු කාලෙන කාලං පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍ය.

---

1. වත භො - මජසං, 2. තිකණ්ඩකීවනෙ - සීමු.
3. අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී - මජසං.

"ලිච්ඡවීනි, දැන් තෙපි කවර නම් කථායෙකින් යුක්තව රැස්ව හුන්නාහු? තොපගේ කවර නම් අතුරුකථායෙක් කොට අඩාල වී දැ?"යි.

වහන්ස, මෙහි රැස්ව හුන් අප අතර මේ නම් අතුරු කථායෙක් උපන: "ලෝකයෙහි පඤ්චරතන කෙනකුන්ගේ පහළවීම දුර්ලභ ය. කවර පඤ්චරතන කෙනකුන්ගේ ය යත්: ලෝකයෙහි හස්තිරත්නයාගේ පහළ වනු දුලබ ය. ලෝකයෙහි අශ්වරත්නයාගේ පහළ වනු දුලබ ය. ලෝකයෙහි මණිරත්නයාගේ පහළ වනු දුලබ ය. ලෝකයෙහි ස්ත්‍රීරත්නයාගේ පහළ වනු දුලබ ය. ලෝකයෙහි ගෘහපතිරත්නයාගේ පහළ වනු දුලබ ය. ලොව මේ පස් රුවනුන්ගේ පහළ වනු දුලබ ය"යි.

වස්තුකාමක්ලේශකාමයන්හි අධිමුක්ත (දැඩිසේ ඇලුන) ලිච්ඡවීන් වන තොප අතර කාමයන් අරභයා ම අතුරුකථා උපනේ ය.

ලිච්ඡවීනි, ලොවැ පඤ්චරතන කෙනකුන්ගේ ප්‍රාදුර්භාවය දුර්ලභ ය. කවර පඤ්චරතන කෙනකුන්ගේ ය යත්:

ලොවැ තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන්ගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වෙයි. ලොවැ තථාගතප්‍රවිදිත ධර්මවිනය දෙසන පුද්ගලයා දුර්ලභ වෙයි. ලොවැ තථාගතප්‍රවිදිත වූ දේශිත ධර්මවිනය දැනගන්නා පුද්ගලයා දුර්ලභ වෙයි. ලොවැ තථාගතප්‍රවිදිත වූ දේශිත ධර්මවිනය දන්නේ ම ධර්මානුධර්මය (ලෝකෝත්තර ධර්මප්‍රතිපදාව) අනුව පිළිපන් පුද්ගල දුර්ලභ වෙයි. ලොවැ කෘතඥ කෘතවේදී පුද්ගල දුර්ලභ වෙයි.

ලිච්ඡවීනි, ලොවැ මේ පඤ්චරතනයන්ගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වේ යයි වදාළසේක.

## 5. 3. 5. 4.

## [තිකණ්ඩකි සූත්‍රය]

**44.** එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සාකේත** නගරසමීපයෙහි **තිකණ්ඩකී වනයෙහි** වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි මහණුන් ඇමැතූ සේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය කරුණු වදාළ සේක:

මහණෙනි, මහණ කලින් කල අප්‍රතිකූල ආලම්බනයෙහි ප්‍රතිකූලසංඥ ඇතිව වාස කරන්නේ නම් මැනැවැ.

මහණෙනි, මහණ කලින් කල ප්‍රතිකූලාලම්බනයෙහි අප්‍රතිකූලසංඥ ඇතිව වෙසේ නම් මැනැවැ.

මහණෙනි, මහණ කලින් කල අප්‍රතිකූලාලම්බනයෙහිදු ප්‍රතිකූලාලම්බනයෙහි දු ප්‍රතිකූලසංඥ ඇතිව වසන්නේ නම් මැනැවැ.

මහණෙනි, මහණ කලින් කල ප්‍රතිකූලාලම්බනයෙහි දු අප්‍රතිකූලාලම්බනයෙහි දු අප්‍රතිකූලසංඥ ඇතිව වසන්නේ නම් මැනැවැ.

සාධු භික්ඛවෙ භික්ඛු කාලෙන කාලං අප්පටිකූලං ච පටිකූලං ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍ය සතො සම්පජානො.

කිඤ්ච භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරෙය්‍ය? "මා මෙ රජනීයෙසු ධම්මෙසු රාගො උදපාදී"ති. ඉදං ඛො භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරෙය්‍ය.

කිඤ්ච භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍ය? "මා මෙ දොසනීයෙසු ධම්මෙසු දොසො උදපාදී"ති. ඉදං ඛො භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍ය.

කිඤ්ච භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍ය? "මා මෙ රජනීයෙසු ධම්මෙසු රාගො උදපාදී"ති, "මා මෙ දොසනීයෙසු ධම්මෙසු දොසො උදපාදී"ති. ඉදං ඛො භික්ඛවෙ, භික්ඛු අත්ථවසං පටිච්ච අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍ය.

කිඤ්ච භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍ය? "මා මෙ දොසනීයෙසු ධම්මෙසු දොසො උදපාදි, මා මෙ රජනීයෙසු ධම්මෙසු රාගො උදපාදී"ති. ඉදං ඛො භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍ය.

කිඤ්ච භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච අප්පටිකූලං ච පටිකූලං ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍ය සතො සම්පජානො? "මා මෙ ක්වචිනි[1] කත්ථචි කිඤ්චන[2] රජනීයෙසු ධම්මෙසු රාගො උදපාදි, මා මෙ ක්වචිනි[1] කත්ථචි කිඤ්චන[2] දොසනීයෙසු ධම්මෙසු දොසො උදපාදි, මා මෙ ක්වචිනි[1] කත්ථචි කිඤ්චන[2] මොහනීයෙසු ධම්මෙසු මොහො උදපාදී"ති. ඉදං ඛො භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච අප්පටිකූලං ච පටිකූලං ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍ය සතො සම්පජානොති.

## 5. 3. 5. 5.

## [නිරයසුත්තං]

[සාවත්ථිනිදානං]

**45.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති.

1. ක්වචනි - මජසං, 2. කිඤ්චනං - මජසං.

මහණෙනි, මහණ කලින් කල අප්‍රතිකූලාලම්බනය හා ප්‍රතිකූලාලම්බනය හා එ දෙක ම දුරලා උපෙක්ෂක වැ සමෘතිසම්පන්න වූයේ සම්‍යක්ප්‍රඥ ඇති වැ වසන්නේ නම් මැනැවැ.

මහණෙනි, මහණ කිනම් අර්ථයක් පිණිස අප්‍රතිකූලාලම්බනයෙහි ප්‍රතිකූලසංඥ ඇති වැ විහරණ කෙරේ ය යත්: "ඇලුම් කටයුතු දහම්හි මට රාගය නහමක් උපදීවා"යි. මහණෙනි, මහණ මෙ අර්ථය පිණිස අප්‍රතිකූලාලම්බනයෙහි ප්‍රතිකූලසංඥ ඇති වැ විහරණ කරන්නේය.

මහණෙනි, මහණ කිනම් අර්ථයක් පිණිස ප්‍රතිකූලාලම්බනයෙහි අප්‍රතිකූලසංඥ ඇති වැ විහරණ කරන්නේ ය යත්: "ද්වෙෂයට තිසි (ආලම්බන) ධර්මයෙහි මට ද්වෙෂය නහමක් උපදීවා"යි. මහණෙනි, මහණ මේ අර්ථය පිණිස ප්‍රතිකූලාලම්බනයෙහි අප්‍රතිකූලසංඥ ඇති වැ විහරණ කරන්නේය.

මහණෙනි, මහණ කිනම් අර්ථයක් නිසා අප්‍රතිකූල වූ ද ප්‍රතිකූල වූ ද ආලම්බනයෙහි ප්‍රතිකූලසංඥ ඇති වැ විහරණය කරන්නේ ය යත්: "රජනීය ධර්මයෙහි මට රාගය නහමක් උපදීවා"යි, "ද්වෙෂයට තිසි ධර්මයෙහි මට ද්වෙෂය නහමක් උපදීවා"යි. මහණෙනි, මහණ මේ අර්ථය නිසා අප්‍රතිකූල වූ ද ප්‍රතිකූල වූ ද ආලම්බනයෙහි ප්‍රතිකූලසංඥ ඇති වැ විහරණ කරන්නේ ය.

මහිණෙනි, මහණ කිනම් අර්ථයක් නිසා ප්‍රතිකූලාලම්බනයෙහි ද අප්‍රතිකූලාලම්බනයෙහි ද අප්‍රතිකූලසංඥ ඇති වැ වසන්නේ ය යත්: "ද්වෙෂ්‍ය ධර්මයෙහි මට ද්වෙෂය නහමක් පාළ වේවා යි, රජනීය ධර්මයෙහි මට රාගය නහමක් පාළ වේවා"යි. මහණෙනි, මහණ මේ අර්ථය නිසා ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලසංඥ ඇති වැ විහරණය කරන්නේ ය.

මහණෙනි, මහණ කිනම් අර්ථයක් නිසා අප්‍රතිකූලය හා ප්‍රතිකූලය හා එ දෙක හැරපියා උපෙක්ෂක වැ සමෘතිසම්පන්න වැ නුවණැති වැ විහරණ-කරන්නේ ය යත්: මහණෙනි, "මට කිසිදු අරමුණෙක්හි කොතනක්හි ද රජනීයධර්මයෙහි සවල්පමාත්‍ර වූ ද රාගයෙක් නහමක් උපදීවා, මට කිසිදු අරමුණෙක්හි කොතැනෙක දී හෝ ද්වෙෂ්‍ය ධර්මයන්හි සවල්පමාත්‍ර වූ ද ද්වෙෂයෙක් නහමක් උපදීවා, මට කිසිදු අරමුණෙක්හි කොතැනෙක දී හෝ මොහනීයධර්මයෙහි සවල්පමාත්‍ර වූ ද මොහයෙක් නහමක් උපදීවා"යි. මේ අර්ථය නිසා මහණ අප්‍රතිකූලය ද ප්‍රතිකූලය ද යන එ දෙක ම හැරපියා සමෘතිසම්පන්න ව සම්‍යක්ප්‍රඥ ඇති ව උපෙක්ෂක ව විහරණ කරන්නේය'යි.

## 5. 3. 5. 5.

## [නිරය සූත්‍රය]

**[සැවැත්නිදානයි]**

**45.** මහණෙනි, ධර්ම පසෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තැබුවකු සෙයින් නිරයෙහි උපදනේ යැ. කවර පසෙකින යත්:

පණිවා කරන්නේ වෙයි. අයිනාදන් ගන්නේ වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසවා බණන සුලු වෙයි. මදපමා දෙකට කරුණු වූ රහමෙර බොන සුලු වෙයි.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.

### 5. 3. 5. 6.

### [භික්ඛුමිත්තසුත්තං]

[සාවත්ථිනිදානං]

**46.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛුමිත්තො න සෙවිතබ්බො. කතමෙහි පඤ්චහි:

කම්මන්තං කාරෙති, අධිකරණං ආදියති, පාමොක්ඛෙසු භික්ඛූසු පටිවිරුද්ධො හොති, දීඝචාරිකං අනවත්ථිතචාරිකං[1] අනුයුත්තො විහරති, න පටිබලො හොති කාලෙන කාලං ධම්මියා කථාය සන්දස්සෙතුං සමාදපෙතුං සමුත්තෙජෙතුං සම්පහංසෙතුං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛුමිත්තො න සෙවිතබ්බො.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛුමිත්තො සෙවිතබ්බො. කතමෙහි පඤ්චහි:

න කම්මන්තං කාරෙති, න අධිකරණං ආදියති, න පාමොක්ඛෙසු භික්ඛූසු පටිවිරුද්ධො හොති, න දීඝචාරිකං අනවත්ථිතචාරිකං අනුයුත්තො විහරති, පටිබලො හොති කාලෙන කාලං ධම්මියා කථාය සන්දස්සෙතුං සමාදපෙතුං සමුත්තෙජෙතුං සම්පහංසෙතුං.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛුමිත්තො සෙවිතබ්බොති.

### 5. 3. 5. 7.

### [අසප්පුරිසදානසුත්තං]

[සාවත්ථිනිදානං]

**47.** පඤ්චිමානි භික්ඛවෙ අසප්පුරිසදානානි. කතමානි පඤ්ච:

අසක්කච්චං දෙති, අචිත්තීකත්වා දෙති, අසහත්ථා දෙති, අපවිද්ධං දෙති, අනාගමනදිට්ඨිකො දෙති.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අසප්පුරිසදානානි.

---

1. අනවත්ථචාරිකං - මජසං., සයා.

මහණෙනි, මේ ධර්ම පසින් සමන්‍වාගත වූයේ ගෙණවුත් බහා තැබුවකු සෙයින් නිරයෙහි උපදනේ වෙයි.

මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් බහා තැබුවකු සෙයින් ස්වර්ගයෙහි උපදනේ ය. කවර පසෙකින යත්:

පණිවායෙන් වැළැකියේ වෙයි. අයිනාදන් ගැණුමින් වැළැකියේ වෙයි. කාමයෙහි මිසහසරින් වැළැකියේ වෙයි. මුසවායෙන් වැළැකියේ වෙයි. මදපමා දෙකට කරුණු වූ රහමෙරින් වැළැකියේ වෙයි.

මහණෙනි, මේ කරුණු පසින් සමන්‍වාගත වූයේ ගෙණවුත් බහා තැබුවකු සෙයින් ස්වර්ගයෙහි උපදනේ වෙයි.

## 5. 3. 5. 6.

## [භික්‍ඛුමිත්ත සූත්‍රය]

[සැවැත්නිදානයි]

**46.** මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත භික්‍ෂුමිත්‍ර නො සෙවිය යුත්තේ ය. කවර පසෙකින යත්:

කර්මාන්ත කරවන්නේ ය. අධිකරණ ගන්නේ ය. දිසාපාමොක් මහණුන් කෙරෙහි විරුද්ධ වන්නේ ය. දීඝචාරිකායෙහි, ව්‍යවස්ථා රහිත (යදෘච්ඡා) චාරිකායෙහි යෙදී වසන්නේ ය. කලින් කල ධාර්මික කථායෙන් කරුණු දක්වන්නට සමාදන් කරවන්නට සමුත්තෙජනය (උත්සාහවත්) කරවන්නට සම්ප්‍රහර්ෂණය කරවන්නට ප්‍රතිබල නො වේ.

මහණෙනි, මේ කරුණු පසින් සමන්‍වාගත භික්‍ෂුමිත්‍ර නො සෙවිය යුත්තේ ය.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත භික්‍ෂුමිත්‍ර සෙවිය යුත්තේ ය. කවර පසෙකින යත්:

කර්මාන්ත නොකරවන්නේ ය. අධිකරණ නොගන්නේ ය. දිසාපාමොක් මහණුන් කෙරෙහි ප්‍රතිවිරුද්ධ නොවන්නේ ය. දීඝචාරිකායෙහින් යදෘච්ඡාචාරිකායෙහින් නොයෙදී වසන්නේ ය. කලින් කල දැහැමි කථායෙන් සන්දර්ශනය කරවන්නට සමාදන් කරවන්නට සමුත්තෙජන කරවන්නට සම්ප්‍රහර්ෂණ කරවන්නට ප්‍රතිබල වෙයි.

මහණෙනි, මේ කරුණු පසින් සමන්‍වාගත භික්‍ෂුමිත්‍ර සෙවිය යුත්තේ යි.

## 5. 3. 5. 7.

## [අසප්පුරිසදාන සූත්‍රය]

[සැවැත්නිදානයි]

**47.** මහණෙනි, මේ අසත්පුරුෂදාන පසෙකි. කවර පසෙක යත්:

නො සකසා දෙයි. (ගෞරවයෙන්) සලකා නො දෙයි. සියතින් නො දෙයි. පටිවිද්ධයක් (ඉවත ලන්නක්) සෙයින් දෙයි හෝ නිතර නො දෙයි. අනාගමනදෘෂ්ටික (කර්මඵලවිපාක ඇදැහීම් නැති) ව දෙයි.

මහණෙනි, මේ පස අසත්පුරුෂදාන යි.

පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි. කතමානි පඤ්ච:

සක්කච්චං දෙති, චිත්තීකත්වා දෙති, සහත්ථා දෙති, අනපවිද්ධං දෙති, ආගමනදිට්ඨිකො දෙති.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සප්පුරිසදානානීති.

**5. 3. 5. 8.**

**[සප්පුරිසදාන සුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**48.** පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි. කතමානි පඤ්ච:

සද්ධාය දානං දෙති, සක්කච්චං දානං දෙති, කාලෙන දානං දෙති, අනග්ගහිතචිත්තො[1] දානං දෙති, අත්තානං ච පරං ච අනුපහච්ච දානං දෙති.

සද්ධාය ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. අභිරූපො ච හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො.

සක්කච්චං ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. යෙපිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා, තෙපි සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති.

කාලෙන ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. කාලාගතා චස්ස අත්ථා පචුරා හොන්ති.

අනග්ගහිතචිත්තො ඛො[1] පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. උළාරෙසු ච පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තං නමති.

අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. න චස්ස කුතොචි භොගානං උපඝාතො ආගච්ඡති අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියදායාදතො වා.[2]

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සප්පුරිසදානානීති.

**5. 3. 5. 9.**

**[පඨම සමයවිමුත්ත සුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**49.** පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා සමයවිමුත්තස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

කම්මාරාමතා, භස්සාරාමතා, නිද්දාරාමතා, සඞ්ගණිකාරාමතා, යථාවිමුත්තං චිත්තං න පච්චවෙක්ඛති.

---

1. අනග්ගහතචිත්තො - මජසං, සතා
2. අප්පියතො වා දායාදතො - මජසං, අප්පියතො වා දායාදතො වා - සතා,

මහණෙනි, මේ සත්පුරුෂදාන පසෙකි. කවර පසෙක යත්:

සකසා දෙයි. ගරු කොට දෙයි. සියතින් දෙයි. නිරතුරු කොට දෙයි. ආගමනදෘෂ්ටි ඇති ව දෙයි.

මහණෙනි, මේ සත්පුරුෂදාන පස යි.

**5. 3. 5. 8.**

**[සප්පුරිස දාන සූත්‍රය]**

**[සැවැත්නිදානයි]**

**48.** මහණෙනි, මෙ සත්පුරුෂදාන පසෙකි. කවර පසෙක යත්:

ශ්‍රද්ධායෙන් දන් දෙයි. සකසා දන් දෙයි. නිසි කල්හි දන් දෙයි. දෙන දායෙහි සිත් බැඳුම් නැතිව (මුත්තචාගීව) දන් දෙයි. තමා ද මෙරමා ද නො පෙළා (ගුණ නොමකා) දන් දෙයි.

මහණෙනි, සැදැහැයෙන් දන් දී යම් යම් ම තැනෙක එ දානයාගේ විපාක උපදතේ නම්, මහාධන ඇතියේ මහාභොග ඇතියේ ආඪ්‍ය ද වෙයි. උතුම් වර්ණසෞන්දර්‍ය්‍යයෙන් යුක්ත වූයේ දැකුම්කලු වූයේ පහන් එළවන සුලුයේ අභිරූප ද වෙයි.

මහණෙනි, සකසා දන් දී යම් යම් ම තැනෙක ඒ දානයාගේ විපාක උපදතේ නම්, මහද්ධන ඇතියේ මහාභොග ඇතියේ ආඪ්‍ය ද වෙයි. පුත්‍රයෝ වෙත්ව යි, අඹුහු වෙත්ව යි, දාසයෝ වෙත්ව යි, කම්කරුහු වෙත්ව යි, ඔහට යම් (පිරිවර) කෙනෙක් වෙත් නම්, ඔහු ද ශුශ්‍රූෂා කෙරෙති (කිකරු වෙති). කන් යොමු කෙරෙති. දැනුම් සඳහා සිත් එළවත්.

මහණෙනි, නිසි කල්හි දන් දී යම් යම් ම තැනෙක ඒ දානයාගේ විපාක උපදතේ නම්, මහද්ධන මහාභොග වූයේ ආඪ්‍ය ද වෙයි. නිසි කල්හි ලත් ඔහුගේ අර්ථයෝ ප්‍රචුර වෙත්.

මහණෙනි, දෙන දායෙහි නොබැඳිසිත් ඇති ව දන් දී යම් යම් ම තැනෙක ඒ දානයාගේ විපාක උපදතේ නම්, මහද්ධන මහාභොග වූයේ ආඪ්‍ය ද වෙයි. උදාර වූ පස්කම්ගුණ වළඳ කරණු සඳහා සිත් නැමෙයි.

මහණෙනි, තමා හා මෙරමා නො සටා දන් දී යම් යම් ම තැනෙක ඒ දානයාගේ විපාකය උපදතේ නම්, මහද්ධන මහාභොග ඇතියේ ආඪ්‍ය ද වෙයි. ගින්නෙන් වේවයි, දියෙන් වේවයි, රජුන්ගෙන් වේවයි, සොරුන්ගෙන් වේවයි, අප්‍රිය දායාදයන්ගෙන් (තමන්ට අප්‍රියවූවන්ගෙන්) වේවයි, කිසිවක්හුගෙන් ඔහට භොගයන්ගේ උපඝාතයෙක් නො එයි.

මහණෙනි, මේ සත්පුරුෂදාන පස යි.

**5. 3. 5. 9.**

**[පළමුවැනි සමයවිමුත්ත සූත්‍රය]**

**[සැවැත්නිදානයි]**

**49.** මහණෙනි, සමයවිමුක්ත (ඒ ඒ ක්‍ෂණයෙහි විෂ්කම්භනවශයෙන් ලෞකිකවිමුක්තියෙන් විමුක්ත සිත් ඇති) මහණහුගේ පරිහානිය සඳහා මෙ ධර්මයෝ පස්දෙනෙක් විද්‍යමාන වන්නාහ. කවර පස්දෙනෙක යත්:

කර්මාරාමතා ය, භාෂ්‍යාරාමතා ය, නිද්‍රාරාමතා ය, සඞ්ගණිකාරාමතා ය යථාවිමුක්තචිත්තය ප්‍රත්‍යවෙක්‍ෂා නොකරන්නේ ය.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා සමයවිමුත්තස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා සමයවිමුත්තස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

න කම්මාරාමතා, න භස්සාරාමතා, න නිද්දාරාමතා, න සඞ්ගණිකාරාමතා, යථාවිමුත්තං චිත්තං පච්චවෙක්ඛති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා සමයවිමුත්තස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති.

## 5. 3. 5. 10.

## [දුතියසමයවිමුත්ත සුත්තං]

[සාවත්ථිනිදානං]

**50.** පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා සමයවිමුත්තස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

කම්මාරාමතා, භස්සාරාමතා, නිද්දාරාමතා, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා, භොජනෙ අමත්තඤ්ඤුතා.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා සමයවිමුත්තස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා සමයවිමුත්තස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

න කම්මාරාමතා, න භස්සාරාමතා, න නිද්දාරාමතා, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා, භොජනෙ මත්තඤ්ඤුතා.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා සමයවිමුත්තස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති.

**තිකණ්ඩකීවග්ගො පඤ්චමො.**

**තස්සුද්දානං:**

දත්වා අවජානාති ආරභති ච සාරන්දද තිකණ්ඩකී නිරයෙන ච.
මිත්තො අසප්පුරිසසප්පුරිසෙන සමයවිමුත්තං අපරෙ ද්වෙති.

**තතියො පණ්ණාසකො සමත්තො.**

මහණෙනි, මෙ පඤ්ච ධර්මයෝ සමයවිමුක්ත මහණහුගේ පිරිහීම පිණිස පවතිත්.

මහණෙනි, මේ පඤ්චධර්මයෝ සමයවිමුක්ත මහණහුගේ අපරිහානිය පිණිස පවත්නාහ. කවර පස්දෙනෙක යත්:

නවකර්මාන්තයෙහි නො ඇලීම ය, කථායෙහි නො ඇලීම ය, නිද්‍රායෙහි නො ඇලීම ය, සමූහයන් කෙරෙහි නො ඇලීම ය, යථාවිමුක්තචිත්තය (ඒ ඒ කෙලෙස් යටපත් වීමෙන් සිත මිදුනු අයුරු) ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය.

මහණෙනි, මේ පඤ්චධර්මයෝ සමයවිමුක්ත මහණහුගේ අපරිහානිය පිණිස පවත්නාහ යි.

## 5. 3. 5. 10.

## [දෙවැනි සමයවිමුත්ත සූත්‍රය]

**[සැවැත් නිදානයි]**

**50**. මහණෙනි, මේ පඤ්චධර්ම කෙනෙක් සමයවිමුක්ත භික්ෂුහුගේ පරිහානිය සඳහා පවත්නාහ. කවර පසෙක යත්:

කම්මාරාමතා ය, භස්සාරාමතා ය, නිද්දාරාමතා ය, ඉන්ද්‍රියයන්හි අගුත්තද්වාරතා ය, භොජනයෙහි අමත්තඤ්ඤුතා යි.

මහණෙනි, මේ පඤ්චධර්මයෝ සමයවිමුක්ත මහණහුගේ පරිහානිය සඳහා වැටෙත්.

මහණෙනි, මේ ධර්මයෝ පස් දෙන සමයවිමුක්ත මහණහුගේ අපරිහානිය සඳහා පවත්නාහ. කවර පස්දෙනෙක යත්:

නවකර්මහි නො ඇල්ම ය, කථායෙහි නො ඇල්ම ය, නිද්‍රායෙහි නො ඇල්ම ය, ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතා ය (සංවරය), භොජනයෙහි මාත්‍රඥතා යි.

මහණෙනි, මෙ ධර්මයෝ පස්දෙන සමයවිමුක්ත මහණහුගේ අපරිහානිය සඳහා වැටෙත් ය යි.

**තිකණ්ඩකීවර්ගය පස්වැනි යි.**

**එහි උද්දානය:**

අවජානාති සූත්‍රය, ආරම්භති*සූත්‍රය, සාරන්දද සූත්‍රය, තිකණ්ඩකී සූත්‍රය, නිරය සූත්‍රය, මිත්ත සූත්‍රය, අසප්පුරිසදාන සූත්‍රය, සප්පුරිසදාන සූත්‍රය, පඨමසමයවිමුත්ත සූත්‍රය, දුතියසමයවිමුත්ත සූත්‍රය දැයි දශයෙකි.

**තෙවන පණ්ණාසකය සමාප්ත යි.**

---

* ආපත්තිවුට්ඨානි ක්‍රම - අව හෙයින් 'ආරම්භති' යනු ශුද්ධපාඨයි. 'ආරභති' යනු පාඨාන්තරයි.

# 1. සද්ධම්මවග්ගො.

## 5. 4. 1. 1.

### [පඨම සම්මත්තනියාමසුත්තං]

[සාවත්ථිනිදානං]

1. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි පඤ්චහි:

කථං පරිභොති. කථිකං පරිභොති. අත්තානං පරිභොති. වික්ඛිත්තචිත්තො ධම්මං සුණාති අනෙකග්ගචිත්තො. අයොනිසො ච මනසිකරොති

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සුණන්තො සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි පඤ්චහි:

න කථං පරිභොති. න කථිකං පරිභොති. න අත්තානං පරිභොති. අවික්ඛිත්තචිත්තො ධම්මං සුණාති එකග්ගචිත්තො. යොනිසො ච මනසිකරොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සුණන්තො සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තන්ති.

## 5. 4. 1. 2

### [දුතිය සම්මත්තනියාමසුත්තං]

[සාවත්ථිනිදානං]

2. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි පඤ්චහි:

කථං පරිභොති. කථිකං පරිභොති. අත්තානං පරිභොති. දුප්පඤ්ඤො හොති ජළො එළමූගො. අනඤ්ඤාතෙ අඤ්ඤාතමානී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො සුණන්තො සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි පඤ්චහි:

න කථං පරිභොති. න කථිකං පරිභොති. න අත්තානං පරිභොති. පඤ්ඤවා හොති අජළො අනෙළමූගො. න අනඤ්ඤාතෙ අඤ්ඤාතමානී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සුණන්තො සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තන්ති.

# 1. සද්ධම්මවර්ගය.

## 5. 4. 1. 1.

## [පළමුවැනි සම්මත්තනියාම සූත්‍රය]

**[සැවැත්නිදානයි]**

**1.** මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත වූයේ සද්ධර්මය අසනුයේ ද කුශලධර්මයෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට (ආර්‍ය්‍යමාර්ගයට) බැසගැණිමට අභව්‍ය වෙයි. **කවර පසෙකින යත්:**

කථාවට පරිභව කෙරෙයි. ධර්මකථිකයාට පරිභව කෙරයි. තමාට පරිභව කෙරෙයි. එකඟ නො වූ සිත් ඇති වැ වික්ෂිප්තචිත්තයෙන් යුක්ත වැ ධර්මය අසයි. නුනුවණින් මෙනෙහි කරණුයෙක් ද වේ.

මහණෙනි, මෙ ධර්මපසින් සමන්‍වාගත වූයේ සද්ධර්මය අසන්නේ නමුදු කුශලධර්මයෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට අභව්‍ය වේ.

මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත වැ සද්ධර්මය අසන්නේ සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට භව්‍ය වෙයි. කවර පසෙකින යත්:

කථාවට පරිභව නො කරයි. කථිකයාට පරිභව නො කරයි. තමාට පරිභව නො කරයි. එකඟසිත් ඇතියේ අවික්ෂිප්තචිත්තයෙන් යුක්ත වැ ධර්මය අසයි. නුවණින් මෙනෙහි කරණුයේ ද වේ.

මහණෙනි, මෙ ධර්ම පසින් සමන්‍වාගත වැ සද්ධර්මය අසනුයේ කුශලධර්ම-යෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාම(ආර්‍ය්‍යමාර්ග) යට බස්නට භව්‍ය වේ යයි.

## 5. 4. 1. 2.

## [දෙවැනි සම්මත්තනියාම සූත්‍රය]

**[සැවැත්නිදානයි]**

**2.** මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත වූයේ සද්ධර්මය අසන්නේ නමුදු කුශලධර්මය කෙරෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට අභව්‍ය වෙයි. කවර පසෙකින යත්:

කථාවට පරිභව කෙරෙයි. කථිකයාහට පරිභව කෙරෙයි. තමාට පරිභව කෙරෙයි. ජඩවූයේ කෙළතොලූ වූයේ දුෂ්ප්‍රාඥ වෙයි. නොදත් දෑයෙහි 'දත්මි' යන මාන ඇතියේ වේ.

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍වාගත වූයේ සද්ධර්මය අසන්නේ නමුදු කුශලධර්මයෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට අභව්‍ය වේ.

මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත වැ සදහම් අසන්නේ කුශල-ධර්මයෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට බැසගන්නට භව්‍ය වෙයි. කවර පසෙකින යත්:

කථාවට පරිභව නො කෙරෙයි. කථිකයාහට පරිභව නො කෙරෙයි. තමාහට පරිභව නො කෙරෙයි. ජඩ නො වූයේ කෙළතොලූ නො වූයේ ප්‍රඥවත් වෙයි. නොදත් දෑයෙහි 'දත්මි' යන මාන නැතියේ වේ.

මහණෙනි, මෙ පඤ්චධර්මයෙන් සමන්‍වාගත වූයේ කුශලධර්මයෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට (නියත මාර්ගයට) බස්නට භව්‍ය වේ යයි.

## 5. 4. 1. 3.

## [තතිය සම්මත්තනියාමසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**3.** පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි පඤ්චහි:

මක්ඛී ධම්මං සුණාති මක්ඛපරියුට්ඨිතො. උපාරම්භචිත්තො ධම්මං සුණාති රන්ධගවෙසී. ධම්මදෙසකෙ ආහතචිත්තො හොති ඛිලජාතො. දුප්පඤ්ඤො හොති ජළො එළමූගො. අනඤ්ඤාතෙ අඤ්ඤාතමානී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො සුණන්තො සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි පඤ්චහි:

අමක්ඛී ධම්මං සුණාති න මක්ඛපරියුට්ඨිතො. අනුපාරම්භචිත්තො ධම්මං සුණාති න රන්ධගවෙසී. ධම්මදෙසකෙ අනාහතචිත්තො හොති අඛිලජාතො. පඤ්ඤවා හොති අජළො අනෙළමූගො. න අනඤ්ඤාතෙ අඤ්ඤාතමානී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සුණන්තො සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තන්ති.

## 5. 4. 1. 4.

## [පඨම සද්ධම්මසම්මොසසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**4.** පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛූ න සක්කච්චං ධම්මං සුණන්ති. න සක්කච්චං ධම්මං පරියාපුණන්ති. න සක්කච්චං ධම්මං ධාරෙන්ති. න සක්කච්චං ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛන්ති. න සක්කච්චං අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජන්ති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති.

5 4 1. 3.

[තුන්වැනි සම්මත්තනියාම සූත්‍රය]

[සැවැත්නිදානයි]

3. මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත වූයේ සද්ධර්මය අසන්නේ නමුදු කුශලධර්මයෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට භව්‍ය නොවේ. කවර පසෙකින යත්:

ගුණමකු වූයේ ගුණමකුසිතින් මඩනා ලදුයේ ධර්මය අසයි. උපාරම්භ චිත්ත (වාද නගන සිත්) ඇතියේ සිදුරු සොයන සුලුයේ ධර්මය අසයි. තදබව් ඇතියේ ධර්ම දේශකයා කෙරෙහි ක්‍රොධයෙන් සැටුනු සිතැත්තේ වෙයි. ජඩ වූයේ කෙළතොලු වූයේ දුෂ්ප්‍රඥ වෙයි. නොදත් දෑයෙහි 'දත්මි' යන මාන ඇතියේ වෙයි.

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍වාගත වූයේ ධර්මය අසන්නේ නමුදු කුශලධර්මයෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට අභව්‍ය වෙයි.

මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත වූයේ දහම් අසන්නේ කුශලධර්මයෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට භව්‍ය වෙයි. කවර පසෙකින යත්:

ගුණමකු නො වූයේ ගුණමකු සිතින් නො මැඩුනේ දහම් අසයි. උපාරම්භචිත්තරහිත වූයේ රන්‍ධ්‍රගවෙෂී නො වූයේ දහම් අසයි. ධර්මදෙශකයා කෙරෙහි ක්‍රොධයෙන් නො සැටුනු සිතැතියේ තදබව් නැතියේ වෙයි. ජඩ නො වූයේ කෙළතොලු නො වූයේ ප්‍රඥවත් වෙයි. නො දත් දෑයෙහි 'දත්මි' යන මාන නැතියේ වෙයි.

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍වාගත ව දහම් අසනුයේ කුශලධර්මයෙහි සම්‍යක්ත්‍ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට භව්‍ය වේ යයි.

5. 4. 1. 4.

[පළමුවැනි සද්ධම්මසම්මොස සූත්‍රය]

[සැවැත්නිදානයි]

4. මහණෙනි, මෙ කාරණයෝ පස්දෙනෙක් සද්ධර්මයාගේ ප්‍රමොෂය (වනස) පිණිස අන්තර්ධානය පිණිස පවත්නාහ. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණහු සකස් කොට දහම් නො අසති. සකස් කොට දහම් නො පිරිවහති. සකස් කොට දහම් නො ධරති. සකස් කොට ධැරූ ධර්මයන්ගේ අර්ථය පරීක්‍ෂා නො කරති. සකස් කොට අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මය නො පිළිපදිත්.

මහණෙනි, මෙ කාරණයෝ පස්දෙන සද්ධර්මයාගේ ප්‍රමොෂය පිණිස අන්තර්ධානය පිණිස පවත්නාහයි.

පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තර-ධානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ, භික්ඛූ සක්කච්චං ධම්මං සුණන්ති. සක්කච්චං ධම්මං පරියාපුණන්ති. සක්කච්චං ධම්මං ධාරෙන්ති. සක්කච්චං ධතානං[1] ධම්මානං අත්ථං උපපරික්ඛන්ති. සක්කච්චං අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජන්ති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්තීති.

## 5. 4. 1. 5.

## [දුතිය සද්ධම්මසම්මොසසුත්තං]

### [සාවත්ථි නිදානං]

**5.** පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛූ ධම්මං න පරියාපුණන්ති සුත්තං ගෙය්‍යං වෙය්‍යා-කරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. අයං භික්ඛවෙ, පඨමො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛූ යථාසුතං යථාපරියත්තං ධම්මං න විත්ථාරෙන පරෙසං[2] දෙසෙන්ති. අයං භික්ඛවෙ, දුතියො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛූ යථාසුතං යථාපරියත්තං ධම්මං න විත්ථාරෙන පරෙසං වාචෙන්ති. අයං භික්ඛවෙ, තතියො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛූ යථාසුතං යථාපරියත්තං ධම්මං න විත්ථාරෙන සජ්ඣායං කරොන්ති. අයං භික්ඛවෙ චතුත්ථො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛූ යථාසුතං යථාපරියත්තං ධම්මං න චෙතසා අනුවිතක්කෙන්ති, අනුවිචාරෙන්ති, මනසානුපෙක්ඛන්ති. අයං භික්ඛවෙ, පඤ්චමො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති.

පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තර-ධානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ, භික්ඛූ ධම්මං පරියාපුණන්ති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. අයං භික්ඛවෙ, පඨමො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

---

1. ධාතානං - මජසං, 2 පරං - මජසං.

මහණෙනි, මෙ කාරණයෝ පස්දෙනෙක් සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අවිනාශය පිණිස අතුරුදහන් නොවීම පිණිස පවත්නාහ. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණහු සකස් කොට දහම් අසති. සකස් කොට දහම් පිරිවහති. සකස් කොට දහම් ධරති. සකස් කොට ධැරූ ධර්මයන්ගේ අර්ථය පිරික්සති. සකස් කොට අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මය පිළිපදනාහ.

මහණෙනි, මෙ කාරණයෝ පස්දෙන සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අවිනාශය පිණිස අතුරුදහන් නොවීම පිණිස පවත්නාහයි.

## 5. 4. 1. 5.

## [දෙවැනි සද්ධම්මසම්මෝස සූත්‍රය]

[සැවැත් නිදානයි]

**5.** මහණෙනි, මෙ කාරණයෝ පස්දෙනෙක් සද්ධර්මයාගේ විනාශය පිණිස අතුරුදහන පිණිස පවත්නාහ. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණහු සූත්‍රය, ගෙයය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අද්භූතධර්මය, වෙදල්ලය යන ධර්මය ප්‍රගුණ නො කරත්. මහණෙනි, මේ ප්‍රථම ධර්මය සද්ධර්මයාගේ පිමොෂය පිණිස අතුරුදහන්වීම පිණිස පවත්නේය.

තවද මහණෙනි, භික්ෂූහු යථාශ්‍රැත යථාපයර්‍යාප්ත ධර්මය විතර විසින් පරහට නො දෙසන්නාහ. මහණෙනි, මේ දෙවන කරුණ සද්ධර්මයාගේ ප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස පවත්නේය.

තවද මහණෙනි, මහණහු යථාශ්‍රැත යථාපයර්‍යාප්ත ධර්මය පරහට විස්තර විසින් වනපොත් නො කරවත්. මහණෙනි, මෙ තෙවන කරුණ සද්ධර්මයාගේ ප්‍රමොෂය පිණිස අතුරුදහන පිණිස පවත්නේය.

තවද මහණෙනි, භික්ෂූහු යථාශ්‍රැත යථාපයර්‍යාප්ත ධර්මය විස්තර විසින් හැදෑරීම නො කෙරෙත්. මහණෙනි, මෙ සතරවන කරුණ සද්ධර්මයාගේ ප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස වැටෙයි.

තවද මහණෙනි, මහණහු යථාශ්‍රැත යථාපයර්‍යාප්ත ධර්මය සිතින් අනුවිතර්කණ නො කරත්, අනුවිචාරණ නො කරත්. සිතින් අනුප්‍රෙක්ෂණ නො කරත්. මහණෙනි, මෙ පස්වන කරුණ සද්ධර්මයාගේ ප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස පවත්නේය.

මහණෙනි, මේ පඤ්ච ධර්මයෝ සද්ධර්මයාගේ ප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස පවත්නාහ යි.

මහණෙනි, මේ කාරණයෝ පස් දෙනෙක් සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අතුරුදහන් නොවනු පිණිස පවත්නාහ. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි භික්ෂූහු සූත්‍රය, ගෙයය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අද්භූතධර්මය, වෙදල්ලය යන ශාස්තෘධර්මය ප්‍රගුණ කරත්. මහණෙනි, මේ පළමුවන කරුණ සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අනන්තර්ධාන නො වනු පිණිස වැටෙයි.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛූ යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙන්ති. අයං භික්ඛවෙ, දුතියො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛූ යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං වාචෙන්ති. අයං භික්ඛවෙ, තතියො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ භික්ඛූ යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොන්ති. අයං භික්ඛවෙ, චතුත්ථො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛූ යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙන්ති අනුවිචාරෙන්ති මනසානුපෙක්ඛන්ති. අයං භික්ඛවෙ, පඤ්චමො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්තීති.

## 5. 4. 1. 6.

### [තතියසද්ධම්මසම්මොසසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**6**. පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ, භික්ඛූ දුග්ගහිතං සුත්තන්තං පරියාපුණන්ති දුන්නික්ඛිත්තෙහි පදබ්‍යඤ්ජනෙහි. දුන්නික්ඛිත්තස්ස භික්ඛවෙ පදබ්‍යඤ්ජනස්ස අත්ථොපි දුන්නයො හොති. අයං භික්ඛවෙ, පඨමො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛූ දුබ්බචා හොන්ති දොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතා, අක්ඛමා අප්පදක්ඛිණග්ගාහිනො අනුසාසනිං. අයං භික්ඛවෙ, දුතියො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, යෙ තෙ භික්ඛූ බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා, තෙ න සක්කච්චං සුත්තන්තං පරං වාචෙන්ති. තෙසං අච්චයෙන ඡින්නමූලකො සුත්තන්තො හොති අප්පටිසරණො. අයං භික්ඛවෙ, තතියො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

තවද මහණෙනි, මහණහු යථාශ්‍රැත යථාපය්‍යාප්ත [ධර්මය විතර විසින් පරහට දෙසති. මහණෙනි, මේ දෙවන කරුණ සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස පවත්නේය.

තවද මහණෙනි, මහණහු යථාශ්‍රැත යථාපය්‍යාප්ත ධර්මය විතර විසින් පරනට වනපොත් කරවත්. මහණෙනි, මෙ තෙවන කරුණ සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස වැටෙයි.

තවද මහණෙනි, මහණහු යථාශ්‍රැත යථාපය්‍යාප්ත ධර්මය විතර විසින් සජ්ඣායනා කෙරෙති. මහණෙනි, මේ සතරවන කරුණ සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස වැටෙයි.

තවද මහණෙනි, මහණහු යථාශ්‍රැත යථාපය්‍යාප්ත ධර්මය සිතින් අනුවිතර්කණ කරත්. අනුවිචාරණය කරත්. සිතින් අනුප්‍රෙක්‍ෂා කරත්. මහණෙනි, මේ පස්වන කරුණ සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස වැටෙයි.

මහණෙනි, මෙ පස්දෙන සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස පවත්නාහ යි.

## 5. 4. 1. 6

## [තුන්වැනි සද්ධම්මසම්මොස සූත්‍රය]

**[සැවැත්නිදානයි]**

**6.** මහණෙනි, මෙ කාරණයෝ පස්දෙනෙක් සද්ධර්මයාගේ ප්‍රමොෂයට අතුරුදන් වීමට වැටෙති. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි භික්‍ෂූහු උපිළිවෙළින් උගන්නා ලද සූත්‍රාන්තය උපිළිවෙළින් තබන ලද පදව්‍යඤ්ජනයෙන් යුක්ත කොට ප්‍රගුණ කරත්. මහණෙනි, උපිළිවෙළින් තබන ලද පදව්‍යඤ්ජන ඇති පාළිසූත්‍රයාගේ අර්ථය ද දුර්නය වෙයි. මහණෙනි, මෙ පළමු කරුණ සද්ධර්මයාගේ ප්‍රමොෂය පිණිස අන්තර්ධානය පිණිස වැටෙයි.

තවද මහණෙනි, භික්‍ෂූහු දුර්වචභාවකර ධර්මයන්ගෙන් සමන්‍විාගත වූවාහු දුර්වච වෙති. නො සහනු වූවාහු අනුසසුන් පැදකුණින් නොගන්නාහු වෙත්. මහණෙනි, මෙ දෙවන කරුණ සද්ධර්මයාගේ ප්‍රමොෂය පිණිස අන්තර්ධානය පිණිස පවත්නේ ය.

තවද මහණෙනි, යම් භික්‍ෂු කෙනෙක් බොහෝ ඇසූපිරූ තැන් ඇතියාහු ආගතාගම වූවාහු ධර්මධර විනයධර මාතෘකාධර වූවාහු වෙත් නම්, ඔහු සකස් කොට සූත්‍රාන්තය මෙරමාහට වනපොත් නො කරවත්. ඔවුන් ඇවෑමෙන් සූත්‍රාන්තය සුන්මුල් ඇති වෙයි. පිළිසරණ නැති වෙයි. මහණෙනි, මෙ තෙවන කරුණ සද්ධර්මයාගේ ප්‍රමොෂය පිණිස අන්තර්ධානය පිණිස පවත්නේ ය.

පුන ච පරං භික්ඛවෙ, ථෙරා භික්ඛූ බාහුලිකා හොන්ති සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා. න විරියං ආරභන්ති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. සාපි හොති බාහුලිකා සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. අයං භික්ඛවෙ, චතුත්ථො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, සඞ්ඝො භින්නො හොති. සඞ්ඝෙ ඛො පන භික්ඛවෙ, භින්නෙ අඤ්ඤමඤ්ඤං අක්කොසා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිභාසා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරික්ඛෙපා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිච්චජනා ච හොන්ති. තත්ථ අප්පසන්නා චෙව නප්පසීදන්ති, පසන්නානං ච එකච්චානං අඤ්ඤථත්තං හොති. අයං භික්ඛවෙ පඤ්චමො ධම්මො සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති.

පඤ්චිමෙ භික්ඛවෙ ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තර-ධානාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ, භික්ඛූ සුග්ගහිතං සුත්තන්තං පරියාපුණන්ති සුනික්ඛිත්තෙහි පදබ්‍යඤ්ජනෙහි. සුනික්ඛිත්තස්ස භික්ඛවෙ පදබ්‍යඤ්ජනස්ස අත්ථොපි සුනයො හොති. අයං භික්ඛවෙ පඨමො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛූ සුබ්බචා හොන්ති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතා. ඛමා පදක්ඛිණග්ගාහිනො අනුසාසනිං. අයං භික්ඛවෙ දුතියො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, යෙ තෙ භික්ඛූ බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා, තෙ සක්කච්චං පරං වාචෙන්ති. තෙසං අච්චයෙන න ඡින්නමූලකො සුත්තන්තො හොති සප්පටිසරණො. අයං භික්ඛවෙ, තතියො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

තවද මහණෙනි, තෙර මහණහු ප්‍රත්‍යය බහුල කොට ඇත්තාහු වෙත්. ශාසනය ලිහිල් කොට ගත්තාහු පඤ්චනීවරණ සඞ්ඛ්‍යාත අවක්‍රමණයෙහි පූර්වඞ්ගම වන්නාහු ප්‍රවිවේකයෙහි හැරපියූ වීර්‍ය්‍යධුර ඇත්තාහු අප්‍රාප්ත වූ විශේෂයාගේ ප්‍රාප්තිය සඳහා අනධිගත ධර්මයාගේ අධිගමය සඳහා අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කාරය සඳහා වැර නො වඩනාහ. ඔවුන්ගේ පශ්චිම ජනතාව ද දෘෂ්ටානුගතියට පැමිණෙයි. එ ජනතාව ද සිවුපස බහුල කොට ඇත්තී සස්න ලිහිල් කොට ගත්තී අවක්‍රමණයෙහි (පරිහානියෙහි) පෙරට ව යන්නී ප්‍රවිවේකයෙහි හැරපියූ වැර ඇත්තී වෙයි. අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය සඳහා අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය සඳහා වැර නො අරඹයි. මහණෙනි, මේ සතරවන ධර්මය සද්ධර්මයාගේ විනාශය පිණිස අතුරුධන්වීම පිණිස වැටෙයි.

තවද මහණෙනි, සඟහු බිඳුනාහු වෙත්. මහණෙනි, සඞ්ඝයා බිඳුන් කල්හි අන්‍යොන්‍යයනට ආක්‍රොෂයෝ ද වෙති. අන්‍යොන්‍යයනට පරිභවයෝ ද වෙති. උනුනට වටා බිඳුම් ද වෙති. අන්‍යොන්‍යයනට පරිවර්ජනයෝ ද වෙත්. එහි ලා නො පහන් වූවෝ ද නො පහදනාහ. පහන් වූ ද ඇතැමුන්ගේ අන්‍යථාත්වය (කළකිරීම) වෙයි. මේ පස්වන ධර්මය සද්ධර්මයාගේ ප්‍රමොෂය සඳහා අන්තර්ධානය සඳහා වැටෙයි.

මහණෙනි, මෙ පස් දහම්හු සද්ධර්මයාගේ ප්‍රමෝෂය පිණිස අතුරුධන් වීම පිණිස පවත්නාහ.

මහණෙනි, මෙ පඤ්චධර්ම කෙනෙක් සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අවිනාශය පිණිස අතුරුදහන් නො වීම පිණිස පවත්නාහ. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණහු මොනොවට උගත්නා ලද සූත්‍රාන්තය මොනොවට යොදන ලද පදව්‍යඤ්ජනයෙන් යුක්ත කොට පිරිවහත්. මහණෙනි, මැනැවින් තබන ලද පදව්‍යඤ්ජනයෙන් යුත් සූත්‍රාන්තයාගේ අර්ථය ද ප්‍රණීත වෙයි. මහණෙනි, මේ ප්‍රථමධර්මය සද්ධර්ම-යාගේ ස්ථිතිය සඳහා අප්‍රමොෂය සඳහා අතුරුධන් නො වීම සඳහා වැටෙයි.

තවද මහණෙනි, මහණහු සුවචභාවය කරණ ධර්මයන්ගෙන් සමන්වා-ගත වූවාහු සුවච වෙති. ඉවසන්නාහු පැදකුණෙන් අනුශාසනය පිළිගන්නාහු වෙත්. මහණෙනි, මෙ ද්විතිය ධර්මය සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අතුරුදහන් නොවීම පිණිස පවතී.

තවද මහණෙනි, බහුශ්‍රැත වූ ආගතාගම වූ ධර්මධර - විනයධර - මාතෘකාධර වූ යම් ප්‍රසිද්ධ භික්ෂූහු වෙත් නම්, ඔහු සකස් කොට මෙරමාහට දහම් කියවති. ඔවුන්ගේ ඇවෑමෙන් සූත්‍රාන්තය සුන් මුල් ඇතියේ නො වෙයි. පිළිසරණ සහිත වේ. මහණෙනි, මේ තෙවන ධර්මය සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අතුරුදහන් නොවීම පිණිස වැටෙයි.

පුන ච පරං භික්ඛවෙ, ථෙරා භික්ඛූ න බාහුලිකා හොන්ති න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා. විරියං ආරභන්ති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. සාපි හොති න බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා. විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. අයං භික්ඛවෙ, චතුත්ථො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, සඞ්ඝො සමග්ගො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසුං විහරති.[1] සඞ්ඝෙ ඛො පන භික්ඛවෙ, සමග්ගෙ න චෙව අඤ්ඤමඤ්ඤං අක්කොසා හොන්ති. න ච අඤ්ඤමඤ්ඤං පරිභාසා හොන්ති. න ච අඤ්ඤමඤ්ඤං පරික්ඛෙපා හොන්ති. න ච අඤ්ඤමඤ්ඤං පරිච්චජනා හොන්ති. තත්ථ අප්පසන්නා චෙව පසීදන්ති. පසන්නානං ච භිය්‍යොභාවො හොති. අයං භික්ඛවෙ, පඤ්චමො ධම්මො සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්තීති.

## 5. 4. 1. 7.

### [දුක්කථාසුත්තං]

[සාවත්ථිනිදානං]

**7**. පඤ්චන්නං භික්ඛවෙ, පුග්ගලානං කථා දුක්කථා පුග්ගලං පුග්ගලං[2] උපනිධාය. කතමෙසං පඤ්චන්නං:

අස්සද්ධස්ස භික්ඛවෙ, සද්ධාකථා දුක්කථා, දුස්සීලස්ස සීලකථා දුක්කථා, අප්පස්සුතස්ස බාහුසච්චකථා දුක්කථා, මච්ඡරියස්ස චාගකථා දුක්කථා, දුප්පඤ්ඤස්ස පඤ්ඤාකථා දුක්කථා.

කස්මා ච භික්ඛවෙ, අස්සද්ධස්ස සද්ධාකථා දුක්කථා? අස්සද්ධො භික්ඛවෙ, සද්ධාකථාය කච්ඡමානාය අභිසජ්ජති, කුප්පති, ව්‍යාපජ්ජති, පතිත්ථීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තං හි සො භික්ඛවෙ සද්ධාසම්පදං අත්තනි න සමපස්සති. න ච ලභති තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා අස්සද්ධස්ස සද්ධාකථා දුක්කථා.

කස්මා ච භික්ඛවෙ දුස්සීලස්ස සීලකථා දුක්කථා? දුස්සීලො භික්ඛවෙ, සීලකථාය කච්ඡමානාය අභිසජ්ජති, කුප්පති, ව්‍යාපජ්ජති, පතිත්ථීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තං හි සො භික්ඛවෙ, සීලසම්පදං අත්තනි න සමපස්සති[3], න ච ලභති තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා දුස්සීලස්ස සීලකථා දුක්කථා.

1. ඵාසු විහරති - සීමු. 2. පුග්ගලෙ පුග්ගලං - මජසං, 3. න සමනුපස්සති - මජසං.

තවද මහණෙනි, ස්ථවිර භික්ෂූහු බාහුලික නොවෙත්. සස්න ලිහිල් කොට නො ගත්තාහු අවක්‍රමණයෙහි හැරපියූ වැරධුර ඇතියාහු ප්‍රවිවේකයෙහි පූර්වඞ්ගම වූවාහු අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය සඳහා අනධිගතයාගේ අධිගමය සඳහා අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය සඳහා වැර අරඹත්. ඔවුන්ගේ පශ්චිම ජනතාව ද ඔවුන්ගේ දෘෂ්ටානුගතියට පැමිණෙයි. ඒ ජනතා ද බාහුලික නොවැ සාථලික නොවැ අවක්‍රමණයෙහි හැරපියූ වැර ඇති වැ ප්‍රවිවේකයෙහි පූර්වඞ්ගම වැ අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය සඳහා අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය සඳහා වැර අරඹයි. මහණෙනි, මෙ සතරවන ධර්මය සද්ධර්මයාගේ ස්ථිතිය සඳහා අප්‍රමොෂය සඳහා අතුරුදහන් නොවීම සඳහා වැටෙයි.

තවද මහණෙනි, සඟහු සමඟ වූවාහු සතුටු වන්නාහු විවාද නොකරන්නාහු එක් උදෙසීම් ඇත්තාහු පහසුවෙන් වාස කරත්. මහණෙනි, සඟුන් සමඟ වූ කල්හි අන්‍යොන්‍යයනට ආක්‍රොශයෝ නො ද වෙති. අන්‍යොන්‍යයනට පරිභවයෝ නො ද වෙති. උනුනට පිරිවටා බිණුම් නො ද වෙති. අන්‍යොන්‍යයනට පරිත්‍යජනයෝ නො ද වෙත්. එකරුණෙහි ලා අප්‍රසන්නයෝ ද පහන් වන්නාහ. ප්‍රසන්නයන්ගේ ද භූයොභාවය වෙයි. මහණෙනි, මේ පස්වන ධර්මය සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අතුරුදහන් නොවීම පිණිස වැටෙයි.

මහණෙනි, මේ පඤ්චධර්මයෝ සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමොෂය පිණිස අනන්තර්ධානය පිණිස වැටෙන්නාහ යි.

## 5. 4. 1. 7.

## [දුක්කථා සූත්‍රය]

[සැවැත්නිදානයි]

**7.** මහණෙනි, ඒ ඒ පුද්ගලයා සඳහා පුද්ගලයන් පස්දෙනකුන්ගේ කථා දුෂ්කථා වෙයි. කවර පස්දෙනකුන්ගේ ය යත්:

මහණෙනි, ශ්‍රද්ධාරහිතයාට ශ්‍රද්ධාකථා දුෂ්කථා ය. දුසිල්හට ශීලකථා දුෂ්කථා ය. අල්පශ්‍රැතයාහට බහුශ්‍රැතභාවය පිළිබඳ කථා දුෂ්කථා ය. මසුරුහට ත්‍යාගකථා දුෂ්කථා ය. දුෂ්ප්‍රාඥහට ප්‍රඥකථා දුෂ්කථා යි.

මහණෙනි, කවර හෙයින් අශ්‍රද්ධයාහට ශ්‍රද්ධාකථා දුෂ්කථා වේ ය යත්: මහණෙනි, ශ්‍රද්ධා නැතියේ ශ්‍රද්ධා පිළිබඳ කථාව කරණු ලබත් ම කොප විසින් ලැගෙයි, කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, විරුද්ධ ව නැඟසිටී, කොප හා ද්වෙෂ හා නො සතුට හා පාළ කරයි. එ කවර හෙයින යත්: මහණෙනි, හෙ වනාහි එ ශ්‍රද්ධාසම්පද් තමා කෙරෙහි නො මැ දක්නේ ය. එ කරුණු කොට ගෙන ප්‍රීතිප්‍රමොදය නො ද ලබන්නේ ය. එහෙයින් අශ්‍රද්ධයාහට ශ්‍රද්ධාකථාව දුෂ්කථා වෙයි.

මහණෙනි, කවර හෙයින් දුසිල්හට ශීලකථා දුෂ්කථා වේ ය යත්: මහණෙනි, දුශ්ශීලයා ශීලකථාව කරණු ලබත් ම කොපයෙන් ලැගෙයි, කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, විරුද්ධ ව නැඟී සිටුනේ ය, කොපය හා ද්වෙෂය හා අප්‍රත්‍යය හා පාළ කෙරෙයි. එ කවර හෙයින යත්: මහණෙනි, හෙ එ සීල සම්පදව තමා කෙරෙහි නො දක්නේ ය. එ හෙතුයෙන් ප්‍රීතිප්‍රමොදය නො ද ලබනේ ය. එහෙයින් දුශ්ශීලයාට ශීලකථාව දුෂ්කථා වෙයි.

කස්මා ච භික්ඛවෙ, අප්පස්සුතස්ස බාහුසච්චකථා දුක්කථා? අප්පස්සුතො භික්ඛවෙ, බාහුසච්චකථාය කච්ඡමානාය අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තං හි සො භික්ඛවෙ, සුතසම්පදං අත්තනි න සමපස්සති. න ච ලභති තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා අප්පස්සුතස්ස බාහුසච්චකථා දුක්කථා.

කස්මා ච භික්ඛවෙ, මච්ඡරියස්ස චාගකථා දුක්කථා? මච්ඡරී භික්ඛවෙ චාගකථාය කච්ඡමානාය අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති, කොපං ච දොසං ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තං හි සො භික්ඛවෙ චාගසම්පදං අත්තනි න සමපස්සති.[1] න ච ලභති තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා මච්ඡරියස්ස චාගකථා දුක්කථා.

කස්මා ච භික්ඛවෙ, දුප්පඤ්ඤස්ස පඤ්ඤාකථා දුක්කථා? දුප්පඤ්ඤො භික්ඛවෙ පඤ්ඤාකථාය කච්ඡමානාය අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති, කොපං ච දොසං ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තං හි සො භික්ඛවෙ, පඤ්ඤාසම්පදං අත්තනි න සමපස්සති.[1] න ච ලභති තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා දුප්පඤ්ඤස්ස පඤ්ඤාකථා දුක්කථා.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං පුග්ගලානං කථා දුක්කථා පුග්ගලං පුග්ගලං[2] උපනිධාය.

පඤ්චන්නං භික්ඛවෙ පුග්ගලානං කථා සුකථා පුග්ගලං පුග්ගලං[2] උපනිධාය. කතමෙසං පඤ්චන්නං?

සද්ධස්ස භික්ඛවෙ සද්ධාකථා සුකථා, සීලවතො සීලකථා සුකථා, බහුස්සුතස්ස බාහුසච්චකථා සුකථා, චාගවතො චාගකථා සුකථා, පඤ්ඤාවතො පඤ්ඤාකථා සුකථා.

කස්මා ච භික්ඛවෙ, සද්ධස්ස සද්ධාකථා සුකථා? සද්ධො භික්ඛවෙ, සද්ධාකථාය කච්ඡමානාය නාභිසජ්ජති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති, න කොපං ච දොසං ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තං හි සො භික්ඛවෙ, සද්ධාසම්පදං අත්තනි සමපස්සති. ලභති ච තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා සද්ධස්ස සද්ධාකථා සුකථා.

කස්මා ච භික්ඛවෙ සීලවතො සීලකථා සුකථා? සීලවා භික්ඛවෙ, සීලකථාය කච්ඡමානාය නාභිසජ්ජති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති, න කොපං ච දොසං ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තං හි සො භික්ඛවෙ, සීලසම්පදං අත්තනි සමපස්සති.[1] ලභති ච තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා සීලවතො සීලකථා සුකථා.

---

1. න සමනුපස්සති - මජසං.
2. පුග්ගලෙ පුග්ගලං - මජසං.

මහණෙනි, කවර හෙයින් අල්පශ්‍රැතයාහට බහුශ්‍රැතභාවය පිළිබඳ කථාව දුෂ්කථා වේය යත්: මහණෙනි, අල්පශ්‍රැතයා බහුශ්‍රැතභාවය පිළිබඳ කථාව කරණු ලබත් ම කොපයෙන් ලැහෙයි, කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, දළව නැඟිසිටී, කොපය හා ද්වෙෂය හා නො සතුට හා පාළ කෙරෙයි. එ කවර හෙයින යත්: මහණෙනි, හෙතෙමේ එ ශ්‍රැතසම්පද් තමා තුළ නො ම දක්නේ ය. එ නිදන කොට ප්‍රීතිප්‍රමොදය ද නො ලබන්නේ ය. එහෙයින් අල්පශ්‍රැතහට බාහුශ්‍රැත්‍ය කථාව දුෂ්කථායෙකි.

මහණෙනි, කවර හෙයින් මත්සරිහට ත්‍යාගකථාව දුෂ්කථා වේ ය යත්: මහණෙනි, මත්සරියා ත්‍යාගකථාව කරණු ලබත් ම ලැහෙයි, කිපෙයි, ව්‍යාපාදයට වැටෙයි, දළ ව නැඟිසිටී, කොප හා ද්වෙෂ හා අප්‍රත්‍යය හා පාළ කරයි. එ කවර හෙයින යත්: මහණෙනි, මත්සරි එ ත්‍යාගසම්පද් තමා කෙරෙහි නො ම දක්නේ ය. ඒ නිදන කොටගෙණ ප්‍රීතිප්‍රමොදය නො ද ලබන්නේ ය. එහෙයින් මත්සරිහට ත්‍යාගකථා දුෂ්කථා යි.

මහණෙනි, කවර හෙයින් දුෂ්ප්‍රාඥයාහට ප්‍රඥකථා දුෂ්කථා වේ ය යත්: මහණෙනි, දුෂ්ප්‍රාඥ තෙමේ ප්‍රඥකථා කරණු ලබත් ම ලැහෙයි, කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, දළ ව නැඟසිටී, කොප හා ද්වෙෂ හා අප්‍රත්‍යය හා පාළ කරයි. එ කවර හෙයින යත්: මහණෙනි, හෙතෙමේ එ ප්‍රඥ-සම්පද් තමා කෙරෙහි ලා නො ම දක්නේ ය. එ නිදන කොට ගෙණ ප්‍රීතිප්‍රමොදය නො ද ලබන්නේ ය. එහෙයින් දුෂ්ප්‍රාඥයාහට ප්‍රඥකථාව දුෂ්කථා වෙයි.

මහණෙනි, මෙ පස් පුඟුලනට ඒ ඒ පුඟුල්හු නිසා (වැටෙන) කථාව දුෂ්කථා වෙයි.

මහණෙනි, ඒ ඒ පුඟුල්හු නිසා පුඟුලන් පස්දෙනකුන්ගේ කථාව සුකථායෙක් වෙයි. කවර පස්දෙනකුනට ය යත්:

මහණෙනි, සැදැහැතියහුට ශ්‍රද්ධාකථාව සුකථායෙක. සිල්වත්හට ශීල කථාව සුකථායෙක. බහුශ්‍රැතයාහට බාහුශ්‍රැත්‍යකථාව සුකථායෙක. ත්‍යාගී-හට ත්‍යාගකථාව සුකථායෙක, ප්‍රඥවත්හට ප්‍රඥකථාව සුකථායෙකි.

මහණෙනි, කවරහෙයින් සැදැහැතියහුට ශ්‍රද්ධාකථාව සුකථා වේ ය යත්: මහණෙනි, සැදැහැතියේ ශ්‍රද්ධාකථාව කරණු ලබත් ම කොප විසින් නො ලැහෙයි, නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, දළව නැග නො සිටි. කොප හා ද්වෙෂ හා අප්‍රත්‍යය හා පාළ නො කෙරෙයි. එ කවර හෙයින යත්: මහණෙනි, හෙතෙම එ සිල්සපුව තමා තුළ ම දක්නේ ය. එ හෙතුකොට ගෙණ ප්‍රීතිප්‍රමොදය ද ලබන්නේ ය. එහෙයින් ශ්‍රද්ධාවත්හට ශ්‍රද්ධාකථාව සුකථායෙකි.

මහණෙනි, කවර හෙයින් සිල්වත්හට ශීලකථාව සුකථා වේ ය යත්: මහණෙනි, සිල්වත් තැනැත්තේ ශීලකථා කරණු ලබත් ම නො ලැහෙයි, නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, තද නො වෙයි, කොපය හා ද්වෙෂය හා අප්‍රත්‍යය හා පාළ නො කරයි. එ කවර හෙයින යත්: මහණෙනි, හෙතෙමේ එ ශීලසම්පද් තමා කෙරෙහි ලා දක්නේ ය. එ හෙතුයෙන් ප්‍රීතිප්‍රමොදය ද ලබන්නේ ය. එහෙයින් සිල්වත්හට ශීල-කථාව සුකථායෙකි.

කස්මා ච භික්ඛවෙ, බහුස්සුතස්ස බාහුසච්චකථා සුකථා? බහුස්සුතො භික්ඛවෙ, බාහුසච්චකථාය කච්ඡමානාය නාභිසජ්ජති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති, න කොපං ච දොසං ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තං හි සො භික්ඛවෙ, සුතසම්පදං අත්තනි සම්පස්සති. ලභති ච තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා බහුස්සුතස්ස බාහුසච්චකථා සුකථා.

කස්මා ච භික්ඛවෙ, චාගවතො චාගකථා සුකථා? චාගවා භික්ඛවෙ, චාගකථාය කච්ඡමානාය නාභිසජ්ජති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති, න කොපං ච දොසං ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තඤ්හි සො භික්ඛවෙ චාගසම්පදං අත්තනි සම්පස්සති. ලභති ච තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා චාගවතො චාගකථා සුකථා.

කස්මා ච භික්ඛවෙ පඤ්ඤවතො පඤ්ඤාකථා සුකථා? පඤ්ඤවා භික්ඛවෙ පඤ්ඤාකථාය කච්ඡමානාය නාභිසජ්ජති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති, න කොපං ච දොසං ච අප්පච්චයං ච පාතුකරොති. තං කිස්ස හෙතු? තඤ්හි සො භික්ඛවෙ පඤ්ඤාසම්පදං අත්තනි සම්පස්සති. ලභති ච තතො නිදානං පීතිපාමුජ්ජං. තස්මා පඤ්ඤවතො පඤ්ඤාකථා සුකථා.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං පුග්ගලානං කථා සුකථා පුග්ගලං පුග්ගලං උපනිධායාති.

## 5. 4. 1. 8.

## [සාරජ්ජ සුත්තං]

### [සාවත්ථිනිදානං]

8 පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු සාරජ්ජං ඔක්කන්තො හොති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අස්සද්ධො හොති, දුස්සීලො හොති, අප්පස්සුතො හොති, කුසීතො හොති, දුප්පඤ්ඤො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සාරජ්ජං ඔක්කන්තො හොති.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු විසාරදො හොති. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධො හොති, සීලවා හොති, බහුස්සුතො හොති, ආරද්ධවිරියො හොති, පඤ්ඤවා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු විසාරදො හොතීති.

මහණෙනි, කවර හෙයින් බහුශ්‍රුතයාහට බහුශ්‍රුතභාවය පිළිබඳ කථාව සුකථා වේ ය යත්: මහණෙනි, බහුශ්‍රුත තෙමේ බාහුශ්‍රුත්‍යකථාව කරණු ලබත් ම නො ලැගෙයි, නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, තද නො වෙයි, කොප හා ද්වේෂ හා අප්‍රත්‍යය හා පාළ නො කරයි. එ කවර හෙයින යත්: මහණෙනි, හෙ තෙමේ එ ශ්‍රුතසම්පද් තමා කෙරෙහි ලා දක්නේ ය. එ හෙතුයෙන් ප්‍රීතිප්‍රමොදය ද ලබන්නේ ය. එහෙයින් බහුශ්‍රුතයාට බාහුශ්‍රුත්‍යකථාව සුකථායෙකි.

මහණෙනි, කවර හෙයින් ත්‍යාගවත්හට ත්‍යාගකථාව සුකථා වේ ය යත්: මහණෙනි, ත්‍යාගවත් පුද්ගල ත්‍යාගකථාව කරණු ලබත් ම නො ලැගෙයි, නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, කොපයත් ද්වේෂයත් අප්‍රත්‍යයත් පාළ නො කෙරෙයි. එ කවර හෙයින යත්: මහණෙනි, හේ ඒ ත්‍යාගසම්පද් තමා කෙරෙහි ලා දක්නේ ය. එ හෙතුයෙන් ප්‍රීතිප්‍රමොදය ද ලබන්නේ ය. එහෙයින් ත්‍යාගවත්හට ත්‍යාගකථාව සුකථායෙකි.

මහණෙනි, කවර හෙයින් ප්‍රඥාවත්හට ප්‍රඥාකථාව සුකථා වේ ය යත්: මහණෙනි, ප්‍රඥාවත් තැනැත්තේ ප්‍රඥාකථාව කරණු ලබත් ම නො-ලැගෙයි, නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, තද නො වෙයි, කොපයත් ද්වේෂයත් අප්‍රත්‍යයත් පාළ නො කරයි. කවර හෙයින යත්: මහණෙනි, හේ ඒ ප්‍රඥාසම්පත් තමා කෙරෙහි ලා දක්නේ ය. එ හෙතුයෙන් ප්‍රීතිප්‍රමොදය ද ලබන්නේ ය. එහෙයින් ප්‍රඥාවත්හට ප්‍රඥාකථා සුකථායෙකි.

මහණෙනි, මෙ පස් පුඟුලනට ඒ ඒ පුඟුල්හු සඳහා කාරණ කථා සුකථා වේ යයි.

## 5. 4. 1. 8.

## [සාරජ්ජ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

8. මහණෙනි, ධර්‍ම පසෙකින් සමන්‍වාගත මහණ නිසෙතජසකභාවයට පැමිණියේ වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අශ්‍රද්ධ වෙයි, දුශ්ශීල වෙයි, අල්පශ්‍රුත වෙයි, කුසීත වෙයි, දුෂ්ප්‍රාඥ වෙයි.

මහණෙනි, මෙ ධර්‍ම පසින් සමන්‍වාගත මහණ (ශාරද්‍යයට) නිසෙතජසක-භාවයට පැමිණියේ වේ.

මහණෙනි, ධර්‍ම පසෙකින් සමන්‍වාගත මහණ විශාරද වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රද්ධා ඇතියේ වෙයි, සිල්වත් වෙයි, බහුශ්‍රුත වෙයි, ප්‍රාරබ්ධවීර්‍ය්‍ය වෙයි, ප්‍රඥා ඇතියේ වේ.

මහණෙනි, මෙ ධර්‍ම පසින් සමන්‍වාගත මහණ විශාරද වේ යයි.

## 5. 4. 1. 9.

### [උදායීසුත්තං]

**9.** එවං මෙ සුතං: එකං සමයං භගවා **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ**. තෙන ඛො පන සමයෙන ආයස්මා **උදායී** මහතියා ගිහිපරිසාය පරිවුතො ධම්මං දෙසෙන්තො නිසින්නො හොති. අද්දසා ඛො ආයස්මා **ආනන්දො** ආයස්මන්තං උදායිං මහතියා ගිහිපරිසාය පරිවුතං ධම්මං දෙසෙන්තං නිසින්නං. දිස්වාන[1] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ආයස්මා භන්තෙ උදායී මහතියා ගිහිපරිසාය පරිවුතො ධම්මං දෙසෙතීති.

න ඛො ආනන්ද සුකරං පරෙසං ධම්මං දෙසෙතුං. පරෙසං ආනන්ද ධම්මං දෙසෙන්තෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරෙසං ධම්මො දෙසෙතබ්බො. කතමෙ පඤ්ච:

ආනුපුබ්බීකථං[2] කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො. පරියායදස්සාවී කථං කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො. අනුද්දයතං පටිච්ච කථං කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො. න ආමිසන්තරො කථං කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො. අත්තානං ච පරං ච අනුපහච්ච කථං කථෙස්සාමීති පරෙසං ධම්මො දෙසෙතබ්බො.

න ඛො ආනන්ද සුකරං පරෙසං ධම්මං දෙසෙතුං. පරෙසං ආනන්ද ධම්මං දෙසෙන්තෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරෙසං ධම්මො දෙසෙතබ්බොති.

## 5. 4. 1. 10.

### [දුප්පටිවිනොදයසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**10.** පඤ්චිමෙ භික්ඛවෙ උප්පන්නා දුප්පටිවිනොදයා. කතමෙ පඤ්ච:

උප්පන්නො රාගො දුප්පටිවිනොදයො. උප්පන්නො දොසො දුප්පටිවිනොදයො. උප්පන්නො මොහො දුප්පටිවිනොදයො. උප්පන්නං පටිභාණං දුප්පටිවිනොදයං. උප්පන්නං ගමිකචිත්තං දුප්පටිවිනොදයං.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච උප්පන්නා දුප්පටිවිනොදයාති.

**සද්ධම්මවග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

තයො සද්ධම්ම නියාමා තයො සද්ධම්ම සම්මොසා
දුක්කථා සාරජ්ජං චෙව[3] උදායී දුබ්බිනොදයෙ.

---

1 දිස්වා - මජ්සං. 2. ආනුපුබ්බිං කථං - මජ්සං. 3. දුක්කථා චෙව සාරජ්ජං - මජ්සං.

5. 4 1 9.

[උදායී සූත්‍රය]

9. මා විසින් මෙසේයින් අසන ලද: එක් කලෙක්හි භාග්‍යවතුන්-වහන්සේ කොසඹෑනුවර සමීපයෙහි වූ ඝොසිතාරාමයෙහි වැඩ වසන සේක. එ සමයෙහි ආයුෂ්මත් උදායී තෙරණුවෝ මහ ගිහිපිරිසක් විසින් පිරිවරණ ලද්දහු ධර්ම දෙශනා කරමින් හුන්නාහු වෙත්. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මහත් ගිහිපිරිස් විසින් පිරිවරණ ලදු වැ දම් දෙසමින් හුන් ආයුෂ්මත් උදායී තෙරුන් දුටහ. දැක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පස් වැ හුන්හ. එකත් පස් වැ හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කාරණ සැලකළහ: "වහන්ස, ආයුෂ්මත් උදායී තෙරණුවෝ මහ ගිහි පිරිස් විසින් පිරිවරණ ලද්දාහු දම් දෙසත්හ"යි.

ආනන්දයෙනි, පරහට දම් දෙසනු සුකර නො වේ මැ යි. ආනන්දයෙනි, පරහට ධර්මදෙශනා කරණුවහු විසින් තමා තුළ ධර්ම පසක් එළවාගෙණ මෙරමාහට දම් දෙසිය යුතු. කවර පසෙක යත්:

'ආනුපූර්වී (පිළිවෙළ) කථාව කියන්නෙමි' යි පරහට ධර්මය දෙසිය යුතු. 'පර්‍යායය (කරුණු) දක්වන්නෙම් කථා කියන්නෙමි'යි පරහට දම් දෙසිය යුතු. 'අනුකම්පා පිණිස ධර්මකථා කියන්නෙමි'යි පරහට දම් දෙසිය යුතු. 'ලාභාපෙක්ෂා නැතියෙම් ධර්මකථා කියන්නෙමි'යි පරහට දම් දෙසිය යුතු. 'තමා හා මෙරමා හා නො සටා ධර්මකථා කියන්නෙමි'යි පරහට ධර්මය දෙසිය යුතු.

ආනන්දයෙනි, පරහට දම් දෙසනු සුකර නො වේ. ආනන්දයෙනි, පරහට ධර්මදෙශනා කරන්නහු විසින් මෙ ධර්ම පස තමා තුළ එළවා පරහට ධර්මය දෙසිය යුතු යි.

5. 4. 1. 10.

[දුප්පටිවිනොදය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

10. මහණෙනි, මෙ කරුණු පසෙක් උපන්නේ දුකසේ දුරලිය හෙන්නේ ය. කවර පසෙක යත්:

රාගය උපන්නේ දුකසේ දුරලිය හෙන්නේ ය. ද්වේෂය උපන්නේ දුකසේ දුරලිය හෙන්නේ ය. මෝහය උපන්නේ දුකසේ දුරලිය හෙන්නේ ය. උපන් ප්‍රතිභාණය දුකසේ දුරලිය හෙන්නේ ය. උපන් ගමික චිත්තය දුකසේ දුරලිය හෙන්නේ ය.

මහණෙනි, මෙ කරුණු පස උපන්නේ දුකසේ දුරලිය හෙන්නේ යයි.

සද්ධම්මවග්ගය පළමුවැනි යි.

එහි උද්දානය:

සද්ධම්මනියාම සූත්‍ර තුනෙක, සද්ධම්මසම්මෝස සූත්‍ර තුනෙක, දුක්කථා සූත්‍රය, සාරජ්ජ සූත්‍රය, උදායී සූත්‍රය, දුප්පටිවිනොදය සූත්‍රය දැයි දසයෙකි.

# 2. ආඝාතවග්ගො.

## 5. 4. 2. 1.

## [පඨම ආඝාතපටිවිනයසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**11.** පඤ්චිමෙ භික්ඛවෙ, ආඝාතපටිවිනයා යත්ථ භික්ඛුනො උප්පන්නො ආඝාතො සබ්බසො පටිවිනෙතබ්බො. කතමෙ පඤ්ච:

යස්මිං භික්ඛවෙ, පුග්ගලෙ ආඝාතො ජායෙථ, මෙත්තා තස්මිං පුග්ගලෙ භාවෙතබ්බා. එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

යස්මිං භික්ඛවෙ, පුග්ගලෙ ආඝාතො ජායෙථ, කරුණා තස්මිං පුග්ගලෙ භාවෙතබ්බා. එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

යස්මිං භික්ඛවෙ, පුග්ගලෙ ආඝාතො ජායෙථ, උපෙක්ඛා තස්මිං පුග්ගලෙ භාවෙතබ්බා. එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

යස්මිං භික්ඛවෙ, පුග්ගලෙ ආඝාතො ජායෙථ, අසති අමනසිකාරො තස්මිං පුග්ගලෙ ආපජ්ජිතබ්බො. එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

යස්මිං භික්ඛවෙ, පුග්ගලෙ ආඝාතො ජායෙථ, කම්මස්සකතා තස්මිං පුග්ගලෙ අධිට්ඨාතබ්බා: "කම්මස්සකො අයමායස්මා[1] කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො. යං කම්මං කරිස්සති කල්‍යාණං වා පාපකං වා, තස්ස දායාදො භවිස්සතී"ති. එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආඝාතපටිවිනයා යත්ථ භික්ඛුනො උප්පන්නො ආඝාතො සබ්බසො පටිවිනෙතබ්බොති.

## 5. 4. 2. 2.

## [දුතිය ආඝාතපටිවිනයසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**12.** තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි ආවුසො භික්ඛවොති.[2] ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

1. අයං ආයස්මා - සීමු. 2. භික්ඛවෙති - මජ්සං

# 2. ආඝාතවග්ගය.

## 5. 4. 2. 1.

## [පළමුවන ආඝාතපටිවිනය සූත්‍රය]

[සැවැත්නිදන සි]

**11**. මහණෙනි, යම් අරමුණෙක්හි මහණක්හට උපන් ආඝාතය (ද්වෙෂය) සම්ප්‍රකාරයෙන් දුරුකටයුතු වේ නම්, එබඳු වූ මේ ආඝාතපටිවිනය (උපාය) යෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි ආඝාතය උපදනේ වේ නම්, එ පුද්ගලයා කෙරෙහි මෛත්‍රිය (ත්‍රික-චතුෂ්කධ්‍යාන වශයෙන්) හැවියැ යුතු. මෙසෙයින් එ පුහුල් කෙරෙහි උපන් ආඝාතය දුරුලිය යුතු යි.

මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි ආඝාතය උපදනේ වේ නම්, එ පුහුල් කෙරෙහි කරුණා හැවියැ යුතු. මෙසෙයින් එ පුහුල් කෙරෙහි උපන් ආඝාතය දුරුලිය යුතු.

මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි ආඝාතය උපදනේ වේ නම්, එ පුහුල් කෙරෙහි උපෙක්‍ෂාව (චතුර්ථධ්‍යානවශයෙන්) වැඩිය යුතු. මෙසෙයින් එ පුහුල් කෙරෙහි · ආඝාතය දුරුලිය යුතු.

මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි ආඝාතය උපදනේ වේ නම්, අසති අමනසිකාරය (නොසිහි නො මෙනෙහි කිරීම) එ පුද්ගලයා කෙරෙහි එළැවියැ යුතුයි. මෙසේ එ පුහුල් කෙරෙහි ආඝාතය දුරුලිය යුතු යි.

මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි ආඝාතය උපදනේ වේ නම්, එ පුද්ගලයා කෙරෙහි කම්සවකතාව මෙනෙහි කළයුතු: "මෙ ආයුෂමත් කම්සවක (කර්මය සවකීය කොට ඇත්තේ) කම්දායාද (කර්මය විසින් දෙන ලද විපාක කොටස ගන්නේ) වෙයි. කම්යොනි (කර්මය ම හෙතු කොට ඇත්තේ) වෙයි. කම්බන්ධු වෙයි. කම්ප්‍රතිසරණ (කර්මය පිළිසරණ කොට ඇත්තේ) වෙයි. කලණ වේවයි ලමු වේවයි යම් ම කර්මයක් කෙරේ නම්, එයට දායාද (විපාක කොටස ගන්නෙක්) වන්නේ ය"යි. මෙසේ එ පුද්ගලයා කෙරෙහි ආඝාතය දුරුලිය යුතු යි.

මහණෙනි, යම් අරමුණෙක මහණහට උපන් ආඝාතය සම්ප්‍රකාරයෙන් දුරුලිය යුතු වේ නම්, මේ ඒ ආඝාතපටිවිනය පස යි.

## 5. 4. 2. 2

## [දෙවෙනි ආඝාතපටිවිනය සූත්‍රය]

[සැවැත්නිදන සි]

**12**. එ කල්හි ආයුෂමත් **ශාරීපුත්‍ර** තෙරණුවෝ 'ආයුෂමත් මහණෙනි' යි භික්‍ෂූන් ඇමැතූ සේක. 'ඇවැත්නි' යි එ මහණහු ආයුෂමත් ශාරීපුත්‍ර තෙරුන්හට පිළිවදන් ඇස්සූහ. ආයුෂමත් ශාරීපුත්‍ර තෙරණුවෝ මෙල කරුණ වදාළහ:

පඤ්චිමෙ ආවුසො, ආඝාතපටිවිනයා යත්ථ භික්ඛුනො උප්පන්නො ආඝාතො සබ්බසො පටිවිනෙතබ්බො. කතමෙ පඤ්ච:

ඉධාවුසො, එකච්චො පුග්ගලො අපරිසුද්ධකායසමාචාරො හොති පරිසුද්ධවචීසමාචාරො. එවරූපෙපි ආවුසො, පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

ඉධ පන ආවුසො, එකච්චො පුග්ගලො අපරිසුද්ධවචීසමාචාරො හොති පරිසුද්ධකායසමාචාරො. එවරූපෙපි ආවුසො, පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

ඉධ පන ආවුසො, එකච්චො පුග්ගලො අපරිසුද්ධකායසමාචාරො හොති අපරිසුද්ධවචීසමාචාරො, ලභති ච කාලෙන කාලං චෙතසො විවරං, චෙතසො පසාදං. එවරූපෙපි ආවුසො, පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

ඉධ පන ආවුසො, එකච්චො පුග්ගලො අපරිසුද්ධකායසමාචාරො හොති අපරිසුද්ධවචීසමාචාරො, න ච ලභති කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං. එවරූපෙපි ආවුසො පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

ඉධ පන ආවුසො, එකච්චො පුග්ගලො පරිසුද්ධකායසමාචාරො හොති පරිසුද්ධවචීසමාචාරො, ලභති ච කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං. එවරූපෙපි ආවුසො, පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

තත්‍රාවුසො, ය්වායං පුග්ගලො අපරිසුද්ධකායසමාචාරො පරිසුද්ධවචීසමාචාරො, කථං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො?

සෙය්‍යථාපි ආවුසො, භික්ඛු පංසුකූලිකො රථියාය නන්තකං දිස්වා වාමෙන පාදෙන නිග්ගහෙත්වා[1] දක්ඛිණෙන පාදෙන විත්ථාරෙත්වා[2] යො තත්ථ සාරො තං පරිපාටෙත්වා[3] ආදාය පක්කමෙය්‍ය; එවමෙව ඛො ආවුසො,[4] ය්වායං පුග්ගලො අපරිසුද්ධකායසමාචාරො පරිසුද්ධවචීසමාචාරො, යාස්ස අපරිසුද්ධකායසමාචාරතා, න සාස්ස තස්මිං සමයෙ මනසිකාතබ්බා. යා ච ඛ්වාස්ස පරිසුද්ධවචීසමාචාරතා, සාස්ස තස්මිං සමයෙ මනසිකාතබ්බා. එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

තත්‍රාවුසො, ය්වායං පුග්ගලො අපරිසුද්ධවචීසමාචාරො පරිසුද්ධකායසමාචාරො, කථං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො?

සෙය්‍යථාපි ආවුසො පොක්ඛරණී සෙවාලපණකපරියොනද්ධා, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො. සො තං පොක්ඛරණිං ඔගාහෙත්වා උභොහි හත්ථෙහි ඉතිචීතිච සෙවාලපණකං අපබ්බූහිත්වා[5] අඤ්ජලිනා පිවිත්වා පක්කමෙය්‍ය, එවමෙව ඛො ආවුසො ය්වායං පුග්ගලො අපරිසුද්ධවචීසමාචාරො පරිසුද්ධකායසමාචාරො, යාස්ස අපරිසුද්ධවචීසමාචාරතා, න සාස්ස තස්මිං සමයෙ මනසිකාතබ්බා. යා ච ඛ්වාස්ස පරිසුද්ධකායසමාචාරතා, සාස්ස තස්මිං සමයෙ මනසිකාතබ්බා. එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

---

1. නිග්ගණ්හිත්වා - මජ්ඣං. 2. පත්ථරිත්වා - මජ්ඣං, ස්‍යා. 3. පරිපාතෙත්වා - මජ්ඣං, ස්‍යා.
4. ඛ්වාවුසො - මජ්ඣං. 5. අපවියූහිත්වා - මජ්ඣං, ස්‍යා. අපබ්බුය්හිත්වාතිපි පාඨො.

ඇවැත්නි, යම් අරමුණෙක භික්ෂුහට උපන් ආඝාතය සර්වප්‍රකාරයෙන් දුරලිය යුතු වේ නම්, එ බඳු ආඝාතපටිවිනය පසෙකි. කවර පසෙක යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් නො පිරිසිදු කායසමාචාර ඇතියේ පිරිසිදු වාක්සමාචාර ඇතියේ වෙයි. ඇවැත්නි, මෙ බඳු පුහුල් කෙරෙහිදු ආඝාතය දුරලිය යුතු.

ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් නො පිරිසිදු වාක්සමාචාර ඇතියේ පිරිසිදු කායසමාචාර ඇති වෙයි. ඇවැත්නි, මෙ බඳු පුද්ගලයා කෙරෙහිදු ආඝාතය දුරලිය යුතු.

ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් නො පිරිසිදු කායසමාචාර ඇතියේ, නො පිරිසිදු වාක්සමාචාර ඇතියේ වෙයි. කලින් කල ශමථවිදර්ශනා-චිත්තයාගේ (ඉපදීමට අවකාශ යයි කියන ලද) විවරය හා පහන්බව හා ලබන්නේ ය. ඇවැත්නි, මෙ බඳු පුද්ගලයා කෙරෙහිදු ආඝාතය දුරලිය යුතු.

ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් නො පිරිසිදු කායසමා-චාර ඇතියේත් නො පිරිසිදු වාක්සමාචාර ඇතියේත් වෙයි. කලින් කල චිත්තයාගේ ශමථවිදර්ශනාවකාශය හා චිත්තයාගේ ප්‍රසන්නභාවය නො ලබන්නේ ය. ඇවැත්නි, මෙ බඳු පුද්ගලයා කෙරෙහිදු ආඝාතය දුරලිය යුතු.

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් පිරිසිදු කායසමාචාර ඇතියේ ද පිරිසිදු වාක්සමාචාර ඇතියේ ද වෙයි. කලින් කල චිත්තයාගේ ශමථවිදර්ශනාවකාශ හා චිත්තයාගේ ප්‍රසන්නභාවය හා ලබන්නේ ය. ඇවැත්නි, මෙ බඳු පුද්ගලයා කෙරෙහිදු ආඝාතය දුරලිය යුතු.

ඇවැත්නි, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් නො පිරිසිදු කායසමාචාර ඇතියේ, පිරිසිදු වාක්සමාචාර ඇතියේ වේ නම්, කෙසේ එ පුහුල් කෙරෙහි ආඝාතය දුරලිය යුතු ය යත්:

ඇවැත්නි, යම්සේ පාංශුකූලික මහණෙක් වීථියෙහි මහලු පිළීකඩක් දැක වම්පයින් ඇක්ම දකුණුපයින් විදහා එහි යම් සාරයෙක් වේ නම්, එය ඉරාගෙණ යන්නේ වේ ද; ඇවැත්නි, එ පරිද්දෙන් ම යම් පුද්ගලයෙක් නො පිරිසිදු කායසමාචාර ඇතියේ පිරිසිදු වාක්සමාචාර ඇතියේ වේ නම්, එ කල්හි ඔහුගේ යම් නො පිරිසිදු කායසමාචාරතායෙක් වේ ද, එ මෙනෙහි නො කටයුතු. ඔහුගේ යම් පිරිසිදු වාක්සමාචාරතායෙක් වේ නම්, එ කල්හි එ මෙනෙහි කටයුතු. මෙසෙයින් එ පුද්ගලයා කෙරෙහි ආඝාතය දුරලිය යුතු.

ඇවැත්නි, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් නො පිරිසිදු වාක්සමාචාර ඇතියේ, පිරිසිදු කායසමාචාර ඇතියේ නම්, එ පුද්ගලයා කෙරෙහි කෙසේ ආඝාතය දුරලිය යුතු ය යත්:

ඇවැත්නි, යම්සේ සෙවෙල් හා පණකසෙවෙලින් වැසුණු පොකුණෙක් වේ නම්, එකල්හි ගිම්න් තැවුනු ගිමින් මැඩුනු මග විඩාපත් වූ පවස් ඇති දියබොනු කැමැති පුරුෂයෙක් එන්නේ වේ ද, හේ එ පොකුණට බැස දැතින් සෙවෙල් හා පණක (නිල්වන් පත් - දිය පරඬල්) සෙවෙල් ඔබමොබ පිහිරාපියා ඇඳිලියෙන් (දෙහොතින්) පැන් බී නික්මයන්නේ වේ ද, ඇවැත්නි, එ පරිද්දෙන් ම යම් පුද්ගලයෙක් නොපිරිසිදු වාක්සමාචාර ඇතියේ, පිරිසිදු කායසමාචාර ඇතියේ වේ ද, ඔහුගේ යම් නොපිරිසිදු වාක්සමා-චාරතායෙක් වේ නම්, එ කල්හි ඔහුගේ එ වාක්සමාචාරය මෙනෙහි නොකට යුතු ය. ඔහුගේ යම් පිරිසිදු කායසමාචාරභාවයෙක් වේ නම්, එ සමයෙහි ඔහුගේ එ කායසමාචාරය මෙනෙහි කටයුතු. මෙසෙයින් එ පුද්ගලයා කෙරෙහි ආඝාතය දුරලිය යුතු.

තත්‍රාවුසො, ය්වායං පුග්ගලො අපරිසුද්ධකායසමාචාරො අපරිසුද්ධ-වචීසමාචාරො, ලභති ච කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං, කථං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො?

සෙය්‍යථාපි ආවුසො පරිත්තං ගොපදකෙ[1] උදකං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො. තස්ස එවමස්ස: ‘‘ඉදං ඛො පරිත්තං ගොපදකෙ උදකං, සචාහං අඤ්ජලිනා වා පිවිස්සාමි භාජනෙන වා, ඛොභෙස්සාමිපි තං, ලොළෙස්සාමිපි තං, අපෙය්‍යම්පි තං කරිස්සාමි. යන්නූනාහං චතුගුණ්ඩිකො[2] නිපතිත්වා ගොපීතකං පිවිත්වා පක්කමෙය්‍යන්ති. සො චතුගුණ්ඩිකො නිපතිත්වා ගොපීතකං පිවිත්වා පක්කමෙය්‍ය. එවමෙව ඛො ආවුසො, ය්වායං පුග්ගලො අපරිසුද්ධකායසමාචාරො, අපරිසුද්ධවචීසමාචාරො, ලභති ච කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං, යාස්ස අපරිසුද්ධකායසමාචාරතා, න සාස්ස තස්මිං සමයෙ මනසිකාතබ්බා. යාපිස්ස අපරිසුද්ධවචීසමාචාරතා, න සාපිස්ස තස්මිං සමයෙ මනසිකාතබ්බා. යං ච ඛො සො ලභති කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං, තදෙවස්ස[3] තස්මිං සමයෙ මනසිකාතබ්බං. එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

තත්‍රාවුසො, ය්වායං පුග්ගලො අපරිසුද්ධකායසමාචාරො අපරිසුද්ධවචී-සමාචාරො, න ච ලභති කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං, කථං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො?

සෙය්‍යථාපි ආවුසො, පුරිසො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො අද්ධානමග්ගපටිපන්නො, තස්ස පුරතො පිස්ස දූරෙ ගාමො, පච්ඡතො පිස්ස දූරෙ ගාමො, සො න ලභෙය්‍ය සප්පායානි භොජනානි, න ලභෙය්‍ය සප්පායානි භෙසජ්ජානි, න ලභෙය්‍ය පතිරූපං උපට්ඨාකං, න ලභෙය්‍ය ගාමන්තනායකං. තමෙනං අඤ්ඤතරො පුරිසො පස්සෙය්‍ය අද්ධානමග්ගපටි-පන්නො. සො තස්මිං පුරිසෙ කාරුඤ්ඤං යෙව උපට්ඨාපෙය්‍ය, අනුද්දයං යෙව උපට්ඨාපෙය්‍ය, අනුකම්පංයෙව උපට්ඨාපෙය්‍ය: ‘‘අහොවතායං පුරිසො ලභෙය්‍ය සප්පායානි භොජනානි, ලභෙය්‍ය සප්පායානි භෙසජ්ජානි, ලභෙය්‍ය පතිරූපං උපට්ඨාකං, ලභෙය්‍ය ගාමන්තනායකං. තං කිස්ස හෙතු? මායං පුරිසො ඉධෙව අනයව්‍යසනං ආපජ්ජති.[4] එවමෙව ඛො ආවුසො, ය්වායං පුග්ගලො අපරිසුද්ධකායසමාචාරො අපරිසුද්ධවචීසමාචාරො, න ච ලභති කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං, එවරූපෙපි ආවුසො, පුග්ගලෙ කාරුඤ්ඤං එව උපට්ඨාපෙතබ්බං, අනුද්දයායෙව උපට්ඨාපෙතබ්බා, අනුකම්පායෙව උපට්ඨාපෙතබ්බා: ‘‘අහොවතායං ආයස්මා[5] කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙය්‍ය, වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙය්‍ය, මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙය්‍ය, තං කිස්ස හෙතු? මායං ආයස්මා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජී’’ති.[6] එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො.

---

1. ගොපදෙ - මජසං, 2. චතුක්කුණ්ඩිකො - මජසං, චතුකුණ්ඩිකො - ස්‍යා. චතුකුණ්ඩකො - PTS. 3. තමෙවස්ස - මජසං, 4. ආපජ්ජතීති - සීමු
5 අහොවත අයමායස්මා - මජසං, 6. උපපජ්ජතීති - සීමු.

ඇවැත්නි, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් නො පිරිසිදු කායසමාචාර ඇතියේ නො පිරිසිදු වාක්සමාචාර ඇතියේ කලින් කල චිත්තයාගේ ශමථවිදර්ශනාවකාශය ද චිත්තප්‍රසාදය ද ලබා නම්, කිසෙයින් එ පුද්ගලයා කෙරෙහි ආඝාත දුරලිය යුතු ය යත්:

ඇවැත්නි, යම් සෙයෙකින් කුඩා ගොකුරෙක (හරක්කුර වළක) දියත්-තෙක් වේ නම්, එකල්හි ගිම්න් තැවුනු ගිම්න් මැඩුනු මඟ විඩාපත් වූ හටගත් පවස් ඇති දියබොනු කැමැති පුරුෂයෙක් එන්නේ නම්, ඔහුට මෙ බඳු සිතෙක් වන්නේ ය: “කුඩා ගොපදවළයෙහි මේ මඳ දියත්තෙක, ඉදින් මම එය ඇඳිලියෙන් හෝ බඳුනෙකින් හෝ ගෙණ බොන්නෙම් නම්, එය කලඹනු යෙම් ද අලලනුයෙම් ද නොපියහෙනු කරනුයෙම් ද වෙමි. මම චතුගුණ්ඩික ව හෙවැ (දෙදනිහුදු දෙ අතිහුදු බිම හෙවැ) ගවයකු සෙයින් මුවින් හැද බී නික්මයෙම් නම් මැනැවැ”යි. හේ චතුගුණ්ඩික ව හෙවැ ගවයකු සෙයින් මුවින් හැද දිය බී නික්ම යන්නේ ද, ඇවැත්නි, එ පරිදි ම යම් පුද්ගලයෙක් නො පිරිසිදු කායසමාචාර ඇතියේ නො පිරිසිදු වාක්සමාචාර ඇතියේ කලින් කල චිත්තයාගේ අවකාශ හා චිත්තයාගේ ප්‍රසාද හා ලබන්නේ ද, ඔහුගේ යම් නො පිරිසිදු කායසමාචාරභාවයෙක් වේ නම්, එකල්හි ඔහුගේ එ කායසමාචාරය මෙනෙහි නොකට යුතු ය. එ කල්හි ඔහුගේ යම් නො පිරිසිදු වාක්සමාචාරභාවයෙක් වේ නම්, එ ද මෙනෙහි නොකටයුතු ය. හේ කලින් කල යම් චිත්තයාගේ ශමථවිදර්ශනාවකාශයක් හා චිත්තප්‍රසාදයක් හා ලබා නම්, එකල්හි ඔහුගේ එය ම මෙනෙහි කටයුතු. ඇවැත්නි, මෙසෙයින් එ පුහුල් කෙරෙහි ආඝාතය දුරලිය යුතු ය.

ඇවැත්නි, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් නො පිරිසිදු කායසමාචාර ඇතියේ නො පිරිසිදු වාක්සමාචාර ඇතියේ, කලින් කල චිත්තවිවරයක් හා චිත්තප්‍රසාදයක් හා නො ලබා නම්, එ පුද්ගලයා කෙරෙහි කෙසේ ආඝාතය දුරලිය යුතු ය යත්:

ඇවැත්නි, යම්සේ විෂභාගාබාධ ඇති දුකට පත් දැඩි ගිලන්බව් ඇති පුරුෂයෙක් දීර්ඝමාර්ගයට පිළිපන්නේ වේ ද, ඔහුට ඉදිරියෙහිදු ග්‍රාමය දුර වෙයි. ඔහුට පසුපස්හිදු ග්‍රාමය දුර වෙයි. හේ සත්‍ප්‍රායභොජන නො ලබන්-නේ ය. සත්‍ප්‍රාය බෙහෙසද් ද නො ලබන්නේ ය. අනුරූප උපස්ථායකයකු ද නො ලබන්නේ ය. ග්‍රාමාන්තයට පමුණුවන්නකු ද නො ලබන්නේ ය. අද්ධාන මාර්ගයට පිළිපන් අන්‍යතර පුරුෂයෙක් ඔහු දක්නේ ය. හේ එ පුරු-ෂයා කෙරෙහි කාරුණ්‍යය ම එළවන්නේ ය, අනුදයාව ම එළවන්නේ ය, අනුකම්පාව ම එළවන්නේ ය: “මෙ පුරිස් සත්‍ප්‍රාය හොජනය ලබන්නේ වේ නම්, සත්‍ප්‍රාය භෛෂජ්‍ය ලබන්නේ වේ නම්, අනුරූප උපස්ථායකයකු ලබන්නේ වේ නම්, ගමට පමුණුවන්නකු ලබන්නේ වේ නම්, මැනැව. එ කවර හෙයින යත්: මෙ පුරිස් මෙ තන්හි මැ අනයව්‍යසනයට (විපතට) නහමක් පැමිණේවා”යි. ඇවැත්නි, එසෙයින් ම යම් පුද්ගලයෙක් නො පිරිසිදු කායසමාචාර ඇතියේ නො පිරිසිදු වාක්සමාචාර ඇතියේ, කලින් කල චිත්ත-යාගේ විවරයක් හා චිත්තයාගේ ප්‍රසාදයක් හා නො ද ලබන්නේ වේ නම්, ඇවැත්නි, මෙ බඳු පුද්ගලයා කෙරෙහි දු කරුණාව ම ඉපදවිය යුතු, අනුදයාව ම එළැවිය යුතු, අනුකම්පාව ම එළැවිය යුතු: “මේ ආයුෂමත් කායදුශ්චරිතය හැරපියා කායසුචරිතය වඩන්නේ වේ නම්, වාග්දුශ්චරිතය හැරපියා වාක්සුචරිතය වඩන්නේ වේ නම්, මනොදුශ්චරිතය හැරපියා මනස්සුචරිතය වඩන්නේ වේ නම්, මැනැව. එ කවර හෙයින යත්: මේ ආයුෂමත් කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට නො වදනේ වේ නම්, ඉතා මැනැවැ”යි. ඇවැත්නි, මෙසේ එ පුද්ගලයා කෙරෙහි ආඝාතය දුරලිය යුතු.

තත්‍රාවුසො, ය්වායං පුග්ගලො පරිසුද්ධකායසමාචාරො පරිසුද්ධවචීසමාචාරො, ලභති ච කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං, කථං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො?

සෙය්‍යථාපි ආවුසො, පොක්ඛරණී අච්ඡොදිකා සාතොදිකා සීතොදිකා සෙතකා සුපතිත්ථා රමණීයා නානාරුක්ඛෙහි සඤ්ඡන්නා, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො සො තං පොක්ඛරණිං ඔගාහෙත්වා නහාත්වා ච පිවිත්වා ච පච්චුත්තරිත්වා තත්ථෙව රුක්ඛච්ඡායාය නිසීදෙය්‍ය වා නිපජ්ජෙය්‍ය වා, එවමෙව ඛො ආවුසො, ය්වායං පුග්ගලො පරිසුද්ධකායසමාචාරො පරිසුද්ධවචීසමාචාරො, ලභති ච කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං, යාපිස්ස පරිසුද්ධකායසමාචාරතා, සාපිස්ස තස්මිං සමයෙ මනසිකාතබ්බා. යාපිස්ස පරිසුද්ධවචීසමාචාරතා සාපිස්ස තස්මිං සමයෙ මනසිකාතබ්බා. යම්පි සො ලභති කාලෙන කාලං චෙතසො විවරං චෙතසො පසාදං, තම්පිස්ස තස්මිං සමයෙ මනසිකාතබ්බං. එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො. සමන්තපාසාදිකං ආවුසො පුග්ගලං ආගම්ම චිත්තං පසීදති.

ඉමෙ ඛො ආවුසො පඤ්ච ආඝාතපටිවිනයා යත්ථ භික්ඛුනො උප්පන්නො ආඝාතො සබ්බසො **පටිවිනෙතබ්බොති**

## 5. 4. 2. 3.

## [සාකච්ඡංසුත්තං]

[**සාවත්ථිනිදානං**]

**13**. තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි: 'ආවුසො භික්ඛවො'ති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

පඤ්චහාවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලංසාකච්ඡො සබ්‍රහ්මචාරීනං. කතමෙහි පඤ්චහි:

ඉධාවුසො, භික්ඛු අත්තනා ච සීලසම්පන්නො හොති, සීලසම්පදාකථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච සමාධිසම්පන්නො හොති, සමාධිසම්පදාකථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති, පඤ්ඤාසම්පදාකථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච විමුත්තිසම්පන්නො හොති, විමුත්තිසම්පදාකථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති, විමුත්තිඤාණදස්සනසම්පදාකථාය ච ආගතං පඤ්හං ව්‍යාකත්තා හොති.

ඉමෙහි ඛො ආවුසො, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලංසාකච්ඡො සබ්‍රහ්මචාරීනන්ති.

ඇවැත්නි, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් පිරිසිදු කායසමාචාර ඇතියේ පිරිසිදු වාක්සමාචාර ඇතියේ, කලින් කල චිත්තයාගේ විවර හා චිත්තයාගේ ප්‍රසාද හා ලබන්නේ වේ නම්, එ පුද්ගලයා කෙරෙහි කෙසේ ආඝාතය දුරලිය යුතු ය යත්:

ඇවැත්නි, යම්සේ පහන්දිය ඇති මියුරු දිය ඇති සිහිල් දිය ඇති සුදු වැලිතලා ඇති මනා තොට ඇති සිත්කලු වූ නන්රුකින් ගැවසීගත් පොකුණෙක් වේ නම්, එකල්හි ගිම්න් තැවුනු ගිම්න් මැඩුනු මං වෙහෙස ඇති පවස් ඇති දිය බොනු කැමැති පුරුෂයෙක් එන්නේ ය. හේ එ පොකුණට බැස සනාන ද කොට ජලපානය ද කොට පෙරලා ගොඩ අවුත් එ ම රුක්සෙවණෙහි හිඳිනේ හෝ හොනේ හෝ වෙයි. එසෙයින් ම ඇවැත්නි, යම් පුද්ගලයෙක් පිරිසිදු කායසමාචාර ඇත්තේ පිරිසිදු වාක්සමාචාර ඇත්තේ කලින් කල චිත්තයාගේ විවර හා චිත්තයාගේ ප්‍රසාද හා ලබන්නේ වේ ද, ඔහුගේ යම් බඳු පරිශුද්ධකායසමාචාරතායෙක් වේ නම්, එ සමයෙහි ඔහුගේ එ පිරිසිදු කායසමාචාරය ම මෙනෙහි කටයුතු ය. ඔහුගේ යම්බඳු පිරිසිදු වාක්සමාචාරතායෙක් වේ නම්, ඔහුගේ එ ද එ සමයෙහි මෙනෙහි කටයුතු ය. කලින් කල හේ චිත්තයාගේ යම් විවරයකුත් චිත්තයාගේ යම් ප්‍රසාදයකුත් ලබා නම්, එ කල්හි ඔහුගේ එ ද මෙනෙහි කටයුතු ය. මෙසේ ඒ පුද්ගලයා කෙරෙහි ආඝාතය දුරලිය යුතු වන්නේ ය. ඇවැත්නි, සමන්තපාසාදික පුගුල් කරා එළඹ සිත පහදනේ ය.

ඇවැත්නි, යම් අරමුණෙක්හි භික්ෂුහට උපන් ආඝාතය සර්‍වප්‍රකාරයෙන් දුරලිය යුතු වේ නම්, මේ එ බඳු ආඝාතපටිවිනය පස යි.

## 5. 4. 2. 3.

## [සාකච්ඡා සූත්‍රය]

### [සැරියුත්නිදාන යි]

13. එ කල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ 'ඇවත් මහණෙනි'යි භික්ෂූන් ඇමැතූහ. 'ඇවැත්නි'යි එ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට පිළිවදන් ඇස්සූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙතෙල කරුණ වදාළහ:

ඇවැත්නි, කරුණු පසෙකින් සමන්‍වාගත මහණ සබ්‍රම්සරුන්ගේ සාකච්ඡාවට නිසි වෙයි. කවර පසෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ, තෙමේත් සිල්සපන් වෙයි, ශීලසමපද් කථා පිළිබඳ පැමිණි ප්‍රශ්න විසඳන්නේත් වෙයි. තෙමේත් සමාධිසම්පන්න වෙයි, සමාධිසමපද් කථා පිළිබඳ පැමිණි ප්‍රශ්න විසඳන්නේත් වෙයි. තෙමේත් ප්‍රඥාසම්පන්න වෙයි, ප්‍රඥා සමපද් කථා පිළිබඳ පැමිණි ප්‍රශ්න විසඳන්නේත් වෙයි. තෙමේත් විමුක්තිසම්පන්න වෙයි, විමුක්තිසමපද් කථා පිළිබඳ පැමිණි ප්‍රශ්න විසඳන්නේත් වෙයි. තෙමේත් විමුක්තිඥානදර්‍ශනසම්පන්න වෙයි, විමුක්තිඥානදර්‍ශනසමපද් කථා පිළිබඳ පැමිණි ප්‍රශ්න විසඳන්නේත් වෙයි.

ඇවැත්නි, මේ කරුණු පසින් සමන්‍වාගත මහණ සබ්‍රම්සරුන්ගේ සාකච්ඡාවට නිසි වේ ය යි.

## 5. 4. 2. 4.

## [සාජීවසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**14.** තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි -පෙ-

පඤ්චහි ආවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලංසාජීවො සබ්‍රහ්මචාරීනං. කතමෙහි පඤ්චහි:

ඉධාවුසො, භික්ඛු අත්තනා ච සීලසම්පන්නො හොති, සීලසම්පදාකථාය ච කතං පඤ්හං[1] ව්‍යාකත්තා හොති. අත්තනා ච සමාධිසම්පන්නො හොති, සමාධිසම්පදාකථාය ච කතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති. පඤ්ඤාසම්පදාකථාය ච කතං පඤ්හං ව්‍යාකත්තා හොති. අත්තනා ච විමුත්තිසම්පන්නො හොති, විමුත්තිසම්පදාකථාය ච කතං පඤ්හං[1] ව්‍යාකත්තා හොති. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති. විමුත්තිඤාණදස්සනසම්පදාකථාය ච කතං පඤ්හං ව්‍යාකත්තා හොති.

ඉමෙහි ඛො ආවුසො, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලංසාජීවො සබ්‍රහ්මචාරීනන්ති.

## 5. 4. 2. 5.

## [පඤ්හපුච්ඡාසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**15.** තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි -පෙ-

යො හි කොචි ආවුසො, පරං පඤ්හං පුච්ඡති, සබ්බො සො පඤ්චහි ඨානෙහි, එතෙසං වා අඤ්ඤතරෙන. කතමෙහි පඤ්චහි:

මන්දත්තා මොමූහත්තා පරං පඤ්හං පුච්ඡති. පාපිච්ඡො ඉච්ඡාපකතො පරං පඤ්හං පුච්ඡති. පරිභවං පරං පඤ්හං පුච්ඡති. අඤ්ඤාතුකාමො[2] පරං පඤ්හං පුච්ඡති. අථවා පනෙවංචිත්තො[3] පරං පඤ්හං පුච්ඡති: "සචෙ මෙ පඤ්හං පුට්ඨො සම්මදෙව ව්‍යාකරිස්සති, ඉච්චෙතං කුසලං; නො චෙ[4] මෙ පඤ්හං පුට්ඨො සම්මදෙව ව්‍යාකරිස්සති, අහමස්ස සම්මදෙව ව්‍යාකරිස්සාමී"ති.

යො හි කොචි ආවුසො, පරං පඤ්හං පුච්ඡති, සබ්බො සො ඉමෙහි පඤ්චහි ඨානෙහි, එතෙසං වා අඤ්ඤතරෙන.

අහං ඛො පනාවුසො, එවං චිත්තො පරං පඤ්හං පුච්ඡාමි: "සචෙ මෙ පඤ්හං පුට්ඨො සම්මදෙව ව්‍යාකරිස්සති, ඉච්චෙතං කුසලං. නො චෙ මෙ පඤ්හං පුට්ඨො සම්මදෙව ව්‍යාකරිස්සති, අහමස්ස සම්මදෙව ව්‍යාකරිස්සාමී"ති.

---

1. ආගතං පඤ්හං - මජ්සං. 2. ඤාතුකාමො - සයා, 3. අථවා පකුප්පන්තො - සීමු. PTS. 4. නො ච - සයා.

5. 4. 2. 4.

[සාජීව සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**14**. එකල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ භික්ෂූන් ඇමැතූහ ...

ඇවැත්නි, කරුණු පසෙකින් සමන්‍වාගත මහණ සබ්‍රම්සරුන්ට අලංසාජීව (සාජීවයට - සමග වාසයට නිසි) වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙමේ ද ශීලසම්පන්න වෙයි, ශීල-සම්පත්කථාව පිළිබඳ කළ (පුළුවුත්) ප්‍රශ්න විසඳනුයේ ද වෙයි. තෙමේත් සමාධිසම්පන්න වෙයි, සමාධිසම්පත්කථා පිළිබඳ කළ ප්‍රශ්න විසඳනුයේ ද වෙයි. තෙමේත් ප්‍රඥාසම්පන්න වෙයි, ප්‍රඥාසම්පත්කථා පිළිබඳ කළ ප්‍රශ්න විසඳනුයේ ද වෙයි. තෙමේත් විමුක්තිසම්පන්න වෙයි, විමුක්තිසම්පත්කථා පිළිබඳ කළ ප්‍රශ්න විසඳනුයේ ද වෙයි. තෙමේත් විමුක්තිඥානදර්ශනසම්පන්න වෙයි, විමුක්තිඥානදර්ශනසම්පත්කථා පිළිබඳ කළ ප්‍රශ්න විසඳනුයේ ද වෙයි.

ඇවැත්නි, මෙ කරුණු පසින් සමන්‍වාගත මහණ සබ්‍රම්සරුනට අලංසාජීව (ප්‍රඥප්තශික්ෂාපදයෙහි සභාගවෘත්තික) වේ යයි.

5. 4. 2. 5.

[පඤ්හපුච්ඡා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**15**. එකල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ භික්ෂූන් ඇමැතූහ ...

ඇවැත්නි, යම් කිසිවෙක් මෙරමා පැන පුළුවුස්නේ වේ නම්, එ හැම කරුණු පසෙකින් හෝ ඔවුනතුරෙන් අන්‍යතරයෙකින් හෝ වෙයි. කවර පසෙකින යත්:

මන්‍දභාවයෙන් මූඪභාවයෙන් මෙරමා පැන පුළුවුස්නේ ය. ලමු ඉච්ඡා ඇතියේ ඉච්ඡායෙන් මඩනා ලදුයේ මෙරමා පැන පුළුවුස්නේ ය. පරිභව කරණුයේ මෙරමා පැන පුළුවුස්නේ ය. දැනගණු කැමැත්තේ මෙරමා පැන පුළුවුස්නේ ය. නොහොත් "ඉදින් මා විසින් ප්‍රශ්න පුළුවුස්නා ලදුයේ මැනැවින් විසඳූ නම්, මෙසේ තෙල කරුණ මැනැව. ඉදින් මා විසින් ප්‍රශ්න පුළුවුස්නා ලදුයේ මනා කොට නො විසඳූ නම්, මම ඔහට මනා කොට (පැන) විසඳමි"යි මෙ බඳු සිත් ඇතියේ මෙරමා පැන පුළුවුස්නේ ය.

ඇවැත්නි, යම් කිසිවෙක් මෙරමා ප්‍රශ්න පුළුවුස්නේ වේ නම්, එ හැම මෙ පස් කරුණින් හෝ තුලුන් කෙරෙහි අන්‍යතරයෙකින් හෝ පුළුවුස්නේ වෙයි.

ඇවැත්නි, මම වනාහි මෙ බඳු සිතැතියෙම් මෙරමා ප්‍රශ්න පුළුවුස්මි: "ඉදින් මා විසින් පැන පුළුවුස්නා ලදුයේ මැනැවින් විසඳූ නම්, මෙසේ තෙල කරුණ මැනැවි. ඉදින් මා විසින් පැන පුළුවුස්නා ලදුයේ මනා කොට නො විසඳූ නම්, මම ඔහට මනා කොට විසඳමි"යි.

## 5. 4. 2. 6.

## [නිරොධසුත්තං]

[සාවත්ථිනිදානං]

**16.** තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි -පෙ-

ඉධාවුසො, භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යා'පි වුට්ඨහෙය්‍ය'පි අත්ථෙතං ඨානං. නො චෙ දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, අතික්කම්මෙව කබලිඞ්කාරාහාරභක්ඛානං[1] දෙවානං සහව්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍ය'පි වුට්ඨහෙය්‍ය'පි අත්ථෙතං ඨානන්ති.

එවං වුත්තෙ ආයස්මා උදායී ආයස්මන්තං **සාරිපුත්තං** එතදවොච: "අට්ඨානං ඛො එතං ආවුසො, සාරිපුත්ත, අනවකාසො යං සො භික්ඛු අතික්කම්මෙව කබලිඞ්කාරාහාරභක්ඛානං දෙවානං සහව්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි[2] නත්ථෙතං ඨානන්ති."

දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි: "ඉධාවුසො, භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි අත්ථෙතං ඨානං. නො චෙ දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, අතික්කම්මෙව කබලිඞ්කාරාහාරභක්ඛානං දෙවානං සහව්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි අත්ථෙතං ඨානන්ති".

[දුතියම්පි ඛො-පෙ-] තතියම්පි ඛො ආයස්මා උදායී ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "අට්ඨානං ඛො එතං ආවුසො, සාරිපුත්ත, අනවකාසො යං සො භික්ඛු අතික්කම්මෙව කබලිඞ්කාරාහාරභක්ඛානං දෙවානං සහව්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි නත්ථෙතං ඨානන්ති".

අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතදහොසි: යාව තතියම්පි ඛො මෙ ආයස්මා උදායී පටික්කොසති, න ච මෙ කොචි භික්ඛු අනුමොදති. යන්නූනාහං යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි:

---

1. කබලීකාරාහාරභක්ඛානං - මජසං.
2. සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි - මජසං

## 5. 4. 2. 6.

## [නිරොධ සූත්‍රය]

[**සැවැත්නිදාන යි**]

**16.** එ කල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ ...

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ ශීලසම්පන්න වූයේ සමාධිසම්පන්න වූයේ ප්‍රඥාසම්පන්න වූයේ සංඥාවෙදයිතනිරොධයට සමවදනේත්, එයින් නැගී සිටුනේත් වෙයි යන තෙල කරුණ ඇත. ඉදින් ඉහාත්මයෙහි ම අර්හත්ත්වය නො ලබන්නේ වේ නම්, කවලීකාරාහාරය වළඳනා දෙවියන්ගේ සහභාවය ඉක්මවා අන්‍යතර මනොමය (ශුද්ධාවාස) කායකට පිළිසඳ විසින් පැමිණියේ සංඥාවේදයිතනිරොධයට සමවදනේත් එයින් නැගීසිටුනේත් වෙයි යන තෙල කරුණ ඇතැ යි.

මෙසෙයින් වදාරත් ම ආයුෂ්මත් **උදායී** තෙරණුවෝ ආයුෂ්මත් **සැරියුත්** තෙරුනට තෙල කරුණ කීහ: "ආයුෂ්මත් ශාරීපුත්‍රයෙනි, තෙල හෙතු රහිතය, වන්නට අවකාශ නැත. යම් කරුණෙකින් එ මහණ කවලීකාරාහාරය වළඳනා (කාමාවචර) දෙවියන්ගේ සහභාවය ඉක්මවා අන්‍යතර මනොමය (ශුද්ධාවාස) දෙවනිකායකට පැමිණියේ සංඥා-වෙදයිතනිරොධයට සමවදනේත්, එයින් නැගීසිටුනේත් වෙයි යන තෙල කරුණ නැතැ"යි.

දෙවන වට දු ... තෙවන වට දු ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ: ඇවැත්නි, මෙ සස්නෙහි මහණ ශීලසම්පන්න වූයේ සමාධිසම්පන්න වූයේ ප්‍රඥාසම්පන්න වූයේ සංඥාවෙදයිතනිරොධයට සමවදනේත්, එයින් නැගීසිටුනේත් වෙයි යන තෙල කරුණ වෙයි. ඉදින් හේ ඉහාත්මයෙහි ම අර්හත්ත්වය සාක්ෂාත් නො කෙරේ නම්, කවලීකාරාහාරය වළඳනා දෙවියන්ගේ සහභාවය ඉක්මවා ම අන්‍යතර මනොමයදෙවනිකායකට පැමිණියේ සංඥාවෙදයිතනිරොධයට සමවදනේත් එයින් නැගී සිටුනේත් වෙයි යන තෙල කරුණ වේ යි.

[දෙවන වට දු ...] තෙවන වට දු ආයුෂ්මත් උදායී තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත්තෙරුනට තෙල සැලකළහ: "ආයුෂ්මත් ශාරීපුත්‍රයෙනි, තෙල හෙතු රහිතය, අවකාශ රහිත ය. යම් කරුණෙකින් එ මහණ කවලීකාරාහාර වළඳනා දෙවියන්ගේ සහභාවය ඉක්මවා ම අන්‍යතර මනොමයදෙවනිකාය-කට පැමිණියේ සංඥාවෙදයිතනිරොධයට සමවදනේත් එයින් නැගීසිටුනේත් වෙයි යන තෙල කරුණ නොවේ"යි.

එ කල ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරනුහට තෙල සිත විය: "තෙවන වට දක්වාත් ආයුෂ්මත් උදායී තෙරණුවෝ මාගේ බස බැහැර කරත්. කිසිදු මහණෙක් මාගේ භාෂිතය අනුමෙව්නි නො කරයි. මම භාග්‍යවතුන් වහන්සේ කරා යෙම් නම්, මැනැවැ" යි. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන්-වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භික්ෂූන් ඇමැතූහ:

“ඉධාවුසො, භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි[1] අත්ථෙතං ඨානං. නො චෙ දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, අතික්කම්මෙව කබළිඞ්කාරාහාරභක්ඛානං[2] දෙවානං සහබ්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි[1] අත්ථෙතං ඨානන්ති”

එවං වුත්තෙ ආයස්මා උදායී ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: “අට්ඨානං ඛො එතං ආවුසො සාරිපුත්ත, අනවකාසො යං සො භික්ඛු අතික්කම්මෙව කබළිඞ්කාරාහාරභක්ඛානං දෙවානං සහබ්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි නත්ථෙතං ඨානන්ති.”

දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි: “ඉධාවුසො, භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො සඤ්ඤාවෙදයිත නිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි අත්ථෙතං ඨානං. නො චෙ දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, අතික්කම්මෙව කබළිඞ්කාරාහාරභක්ඛානං දෙවානං සහබ්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි අත්ථෙතං ඨානන්ති.”

[දුතියම්පි ඛො -පෙ-] තතියම්පි ඛො ආයස්මා උදායී ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: “අට්ඨානං ඛො එතං ආවුසො, සාරිපුත්ත, අනවකාසො යං සො භික්ඛු අතික්කම්මෙව කබළිඞ්කාරාහාරභක්ඛානං දෙවානං සහබ්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි නත්ථෙතං ඨානන්ති.”

අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතදහොසි: භගවතොපි ඛො මෙ සම්මුඛා ආයස්මා උදායී යාවතතියකං පටික්කොසති, න ච මෙ කොචි භික්ඛු අනුමොදති, යන්නූනාහං තුණ්හී අස්සන්ති. අථ ඛො ආයස්මා සාරිපුත්තො තුණ්හී අහොසි.

අථ ඛො භගවා ආයස්මන්තං උදායිං ආමන්තෙසි: කං පන ත්වං උදායී, මනොමයං කායං පච්චෙසී?ති. යෙ තෙ භන්තෙ දෙවා අරූපිනො සඤ්ඤාමයාති. කින්නු ඛො තුය්හං උදායී, බාලස්ස අබ්‍යත්තස්ස භණිතෙන? ත්වං පි නාම භණිතබ්බං මඤ්ඤසී?ති.

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: අත්ථි නාම ආනන්ද, ථෙරං භික්ඛුං විහෙසියමානං අජ්ඣුපෙක්ඛිස්සථ. න හි නාම ආනන්ද, කාරුඤ්ඤම්පි භවිස්සති ථෙරම්හි[3] භික්ඛුම්හි විහෙසියමානම්හී?ති.

1. සමාපජ්ජෙය්‍යාපි වුට්ඨහෙය්‍යාපි - මජ්සං, 2. කබළීකාරාහාරභක්ඛානං - මජ්සං
3. බ්‍යත්තම්හි - ස්‍යා

"ඇවැත්නි, මෙ සස්නෙහි මහණ ශීලසම්පන්න වූයේ සමාධිසම්පන්න වූයේ ප්‍රඥාසම්පන්න වූයේ සංඥාවේදයිතනිරෝධයට සමවදනේත්, එයින් නැඟීසිටුනේත් වෙයි යන තෙල කාරණ ඇත. ඉදින් ඉහාත්මයෙහි ම අර්හත්වය සාක්ෂාත් නො කෙරේ නම්, කවලීකාරාහාරය වළඳන දෙවියන්ගේ සහභාවය ඉක්මවා ම අන්‍යතර මනෝමය දෙවනිකායකට පැමිණියේ සංඥාවේදයිතනිරෝධයට සමවදනේත් එයින් නැඟීසිටුනේත් වෙයි යන තෙල කාරණ ඇතැ"යි.

මෙසේ දෙසත් ම ආයුෂ්මත් උදායී තෙරණුවෝ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන්ට තෙල කීහ: "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, තෙල හෙතු රහිත ය, අවකාශ රහිත ය. යම් හෙයෙකින් එ මහණ කවලීකාරාහාරභක්ෂක දෙවියන්ගේ සහභාවය ඉක්මවා ම අන්‍යතර මනෝමය දෙවනිකායකට පැමිණියේ සංඥා වේදයිත නිරෝධයට සමවදනේත්, එයින් නැඟිසිටුනේත් වෙයි යන තෙල කාරණ නැතැ"යි.

දෙවන වට දු ... තෙවන වට දු ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ: "ඇවැත්නි, මෙ සස්නෙහි මහණ ශීලසම්පන්න වූයේ සමාධිසම්පන්න වූයේ ප්‍රඥාසම්පන්න වූයේ සංඥාවේදයිතනිරෝධයට සමවදනේත් එයින් නැඟීසිටුනේත් වෙයි යන තෙල කාරණ ඇත. ඉදින් ඉහාත්මයෙහි ම අර්හත්වය සාක්ෂාත් නො කෙරේ නම්, කවලීකාරාහාරභක්ෂක දෙවියන්ගේ සහභාවය ඉක්මවා ම අන්‍යතර මනෝමය දෙවනිකායකට පැමිණියේ සංඥාවේදයිතනිරෝධයට සමවදනේත් එයින් නැඟීසිටුනේත් වෙයි යන තෙල කාරණ ඇතැ"යි.

[දෙවන වට දු ...] තෙවන වට දු ආයුෂ්මත් උදායී තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත්තෙරුන්ට තෙල කාරණ කීහ: "ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, තෙල හෙතුරහිත ය, ප්‍රත්‍යය රහිත ය. යම් හෙයෙකින් එ මහණ කවලීකාරාහාර-භක්ෂක දෙවියන්ගේ සහවාසය ඉක්මවා ම අන්‍යතර මනෝමය දෙව නිකායකට පැමිණියේ සංඥාවේදයිතනිරෝධයට සමවදනේත් එයින් නැඟීසිටුනේත් වෙයි යන තෙල කාරණ නැතැ"යි.

ඉක්බිති ආයුෂ්මයුත් සැරියුත් තෙරුන්හට තෙල සිත් විය: "ආයුෂ්මත් උදායී භාග්‍යවතුන් වහන්සේ හමියෙහිදු තෙවන වට දක්වා මාගේ බසට ප්‍රතික්‍රොශ කෙරෙයි. කිසි ද මහණෙක් මා බස අනුමෙවෙති නො කෙරෙයි. මම තුෂ්ණීම්භූත වෙම් නම් මැනැවැ" යි. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තුෂ්ණීම්භූත වූහ.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ උදායී තෙරුන් ඇමතූසේක: උදායිනි, තෝ මනෝමය කාය කිමැයි හඟනාව? යි. වහන්ස, යම් අරූපී සංඥාමය දෙවි කෙනෙක් වෙත් නම්, උහු ය යි. උදායිනි, බාල වූ අව්‍යක්ත වූ තාගේ කථායෙන් කවර වැඩෙක? තො ද බිණිය යුතු කොට හඟිහි දැ? යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් **ආනන්ද** තෙරුන් ඇමැතූසේක: ආනන්දය, ගණීවෙක් මැ නු! ස්ථවිර මහණකු වෙහෙසනු ලබනු (දැක නොසලකා) බලා සිදුනාව!! ආනන්දය, වෙහෙසනු ලබන ස්ථවිර මහණ කෙරෙහි කාරුණායෙකුදු නො වී!!!

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ඉධ භික්ඛවෙ, භික්ඛු සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යපි වුට්ඨහෙය්‍යපි අත්ථෙතං ඨානං. නො චෙ දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය, අතික්කම්මෙව කබලිඞ්කාරාහාරභක්ඛානං දෙවානං සහව්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජෙය්‍යපි වුට්ඨහෙය්‍යපි අත්ථෙතං ඨානන්ති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

අථ ඛො ආයස්මා ආනන්දො අචිරපක්කන්තස්ස භගවතො යෙනායස්මා **උපවාණො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උපවාණං එතදවොච: "ඉධාවුසො උපවාණ, අඤ්ඤෙ ථෙරෙ භික්ඛූ විහෙසෙන්ති. මයං තෙ න පුච්ඡාම.* අනච්ඡරියං ඛො පනෙතං ආවුසො උපවාණ යං භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො එතදෙව ආරබ්භ උදාහරෙය්‍ය. යථා ආයස්මන්තං යෙවෙත්ථ උපවාණං පටිභාසෙය්‍ය. ඉදානෙව අම්හාකං සාරජ්ජං ඔක්කන්තන්ති."

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන උපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං උපවාණං එතදවොච:

කතීහි නු ඛො උපවාණ, ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චා? ති.

පඤ්චහි භන්තෙ, ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි:

ඉධ භන්තෙ, ථෙරො භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා. කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය[1] අත්ථස්ස විඤ්ඤාපනියා. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භන්තෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චාති.

සාධු! සාධු!! උපවාණ, ඉමෙහි ඛො උපවාණ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. ඉමෙ චෙ උපවාණ, පඤ්ච ධම්මා ථෙරස්ස භික්ඛුනො න සංවිජ්ජෙය්‍යුං, කෙන නං සබ්‍රහ්මචාරී සක්කරෙය්‍යුං ගරු කරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං[2] - ඛණ්ඩිච්චෙන පාලිච්චෙන වලිත්තචතාය?[3] යස්මා ච ඛො උපවාණ, ඉමෙ පඤ්ච ධම්මා ථෙරස්ස භික්ඛුනො සංවිජ්ජන්ති, තස්මා නං සබ්‍රහ්මචාරී සක්කරොන්ති ගරුකරොන්ති[4] මානෙන්ති පූජෙන්තීති.

---

* තෙන න පුච්ඡාම - මජ්සං

1 අනෙළගළාය - සයා. අනෙලගලාය - සීමු මජ්සං.

2. නං සබ්‍රහ්මචාරී න සක්කරෙය්‍යුං න ගරුංකරෙය්‍යුං න මානෙය්‍යුං න පූජෙය්‍යුං - මජ්සං,

3. වලිත්තචතාය - සයා.

4. ගරුංකරොන්ති - මජ්සං,

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, මෙ සස්නෙහි මහණ ශීලසම්පන්න වූයේ සමාධි සම්පන්න වූයේ ප්‍රඥාසම්පන්න වූයේ සංඥාවේදයිතනිරෝධයට සමවදනේත් එයින් නැගීසිටුනේත් වෙයි යන තෙල කරුණ ඇත. ඉදින් ඉහාත්මයෙහි ම අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ නො කෙරේ නම්, කවලීකාරාහාරභක්ෂක දෙවියන්ගේ සහවාසය ඉක්මවා ම අන්‍යතර මනෝමය දෙවකායකට පැමිණියේ සංඥාවේදයිතනිරෝධයට සමවදනේත්, එයින් නැගීසිටුනේත් වෙයි යන තෙල කරුණ විද්‍යමාන වේ ය යි. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළසේක. මෙය වදරා සුගතයන් වහන්සේ හුනස්නෙන් නැගී වෙහෙරට වැඩිසේක.

ඉක්බිති ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝකල් වත් ම ආයුෂ්මත් **උපවාන** තෙරුන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් උපවාන තෙරුන්ට තෙල කීහ: "ඇවැත්නි, උපවානයෙනි, මෙහි අන්‍ය භික්ෂූහු ස්ථවිර මහණුන් වෙහෙසති. අපි ඔවුන් නො පුළුවුස්මහ. ඇවැත්නි, උපවානයෙනි, යම් කරුණෙකින් භාග්‍යවතුන් වහන්සේ සවස් වරුයෙහි පිළිසලනින් නැගීසිටිසේක් තෙල කරුණ ම අරබයා වදරණ සේක් නම් තෙල අසිරියෙක් නො වේ. මෙ කරුණෙහි ලා ආයුෂ්මත් උපවානයන්හට ම ප්‍රතිවචනයෙක් වැටහේ නම්, මැනැවි. අපට දෙම්නස බැස සිටියේ ය"යි.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වරුයෙහි පිළිසලනින් නැගීසිටි සේක් උපස්ථාන ශාලාව කරා වැඩිසේක. වැඩ පැන්වූ අස්නෙහි වැඩ හුන්සේක. වැඩහිඳ ආයුෂ්මත් උපවානයන්ට තෙල කරුණ වදාළහ:

**උපවානයෙනි,** කෙතෙක් කරුණින් සමන්වාගත තෙර මහණ සබ්‍රම්සරුන්ට ප්‍රියයෙක් හා මන වඩනුයෙක් හා ගුරු වූයෙක් හා සම්භාවනාර්හයෙක් වේ ද? යි.

වහන්ස, කරුණු පසෙකින් සමන්වාගත තෙර මහණ සබ්‍රම්සරුන්ට ප්‍රියයෙක් හා මනාපයෙක් හා ගුරු වූයෙක් හා භාවනීයයෙක් හා වේ. කවර පසෙකින යත්:

වහන්ස, මෙ සස්නෙහි තෙර මහණ සිල්වත් වෙයි ... සමාදන් කොට ගෙණ සිකපදයෙහි හික්මෙයි. බහුශ්‍රැත වෙයි ... ප්‍රඥායෙන් පිළිවිදියේ වෙයි. කළණ තෙපුල් ඇතියේ කල්‍යාණකථා කරන්නේ පරිපූර්ණ වූ නිදෙස් කෙලතොලු නො වූ ගම්භීරාර්ථයන් ප්‍රකාශ කරණ වචනයෙන් සමන්වාගත වෙයි. අධිචිත්තයෙහි උපන් ඉහාත්මයෙහි සුඛවිහාර වන සතර ධ්‍යානයන් කැමැතිසේ ලබන සුලුයේ සුවසේ ලබන සුලුයේ විපුල කොට ලබන සුලුයේ වෙයි. ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් ... සාක්ෂාත් කොට අර්හත්වයට පැමිණ වාසය කරයි.

වහන්ස, මෙ කරුණුපසින් සමන්වාගත තෙර මහණ සබ්‍රම්සරුන්ට ප්‍රියයෙක් හා මනාපයෙක් හා ගුරු වූයෙක් හා භාවනීයයෙක් හා වේ ය යි.

"සාධු! සාධු!! උපවානය, උපවානය, මේ කරුණු පසින් සමන්වාගත තෙර මහණ සබ්‍රම්සරුන්ට ප්‍රියයෙක් හා මනාපයෙක් හා ගුරු හා භාවනීය හා වෙයි. උපවානය, මෙ දහම් පස තෙර මහණහට විද්‍යමාන නො වේ නම්, කවර කරුණෙකින් සබ්‍රම්සරහු ඔහට-කඩදත්බැවින් හෝ පුලුකෙහෙබැවින් හෝ ඇඟරලී නැගුනු බැවින් හෝ සත්කාර කෙරෙත් ද? ගුරුකාර කෙරෙත් ද? සම්මාන කෙරෙත් ද? පුදත් ද? උපවානයෙනි, යම් හෙයෙකින් තෙර මහණහට මෙ පඤ්චධර්මයෝ විද්‍යමාන වෙත් ද, එ හෙයින් සබ්‍රම්සරහු ඔහට සත්කාර කරන්නාහ, ගුරුකාර කරන්නාහ, සම්මාන කරන්නාහ, පූජා කරන්නා හ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

## 5. 4. 2. 7.

## [චොදනාසුත්තං]

[සාවත්ථිනිදානං]

**17**. තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි -පෙ-

චොදකෙන ආවුසො, භික්ඛුනා පරං චොදෙතුකාමෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරො චොදෙතබ්බො. කතමෙ පඤ්ච:

කාලෙන වක්ඛාමි නො අකාලෙන, භූතෙන වක්ඛාමි නො අභූතෙන, සණ්හෙන වක්ඛාමි නො ඵරුසෙන, අත්ථසංහිතෙන වක්ඛාමි නො අනත්ථසංහිතෙන, මෙත්තචිත්තෙන වක්ඛාමි නො දොසන්තරෙන.[1]

චොදකෙන ආවුසො, භික්ඛුනා පරං චොදෙතුකාමෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරො චොදෙතබ්බො.

ඉධාහං ආවුසො, එකච්චං පුග්ගලං පස්සාමි අකාලෙන චොදියමානං නො කාලෙන කුපිතං, අභූතෙන චොදියමානං නො භූතෙන කුපිතං, ඵරුසෙන චොදියමානං නො සණ්හෙන කුපිතං, අනත්ථසංහිතෙන චොදියමානං නො අත්ථසංහිතෙන කුපිතං, දොසන්තරෙන චොදියමානං නො මෙත්තචිත්තෙන කුපිතං.

අධම්මචුදිතස්ස ආවුසො, භික්ඛුනො පඤ්චහාකාරෙහි අවිප්පටිසාරො උපදහිතබ්බො:[2]

අකාලෙනායස්මා චුදිතො නො කාලෙන, අලං තෙ අවිප්පටිසාරාය. අභූතෙනායස්මා චුදිතො නො භූතෙන, අලං තෙ අවිප්පටිසාරාය. ඵරුසෙනායස්මා චුදිතො නො සණ්හෙන, අලං තෙ අවිප්පටිසාරාය. අනත්ථසංහිතෙනායස්මා චුදිතො නො අත්ථසංහිතෙන, අලං තෙ අවිප්පටිසාරාය. දොසන්තරෙනායස්මා චුදිතො නො මෙත්තචිත්තෙන, අලං තෙ අවිප්පටිසාරායාති.

අධම්මචුදිතස්ස ආවුසො, භික්ඛුනො ඉමෙහි පඤ්චහාකාරෙහි අවිප්පටිසාරො උපදහිතබ්බො.[2]

අධම්මචොදකස්ස ආවුසො, භික්ඛුනො පඤ්චහාකාරෙහි විප්පටිසාරො උපදහිතබ්බො:

අකාලෙන තෙ ආවුසො, චුදිතො නො කාලෙන, අලං තෙ විප්පටිසාරාය. අභූතෙන තෙ ආවුසො, චුදිතො නො භූතෙන, අලං තෙ විප්පටිසාරාය. ඵරුසෙන තෙ ආවුසො, චුදිතො නො සණ්හෙන, අලං තෙ විප්පටිසාරාය. අනත්ථසංහිතෙන තෙ ආවුසො, චුදිතො නො අත්ථසංහිතෙන, අලං තෙ විප්පටිසාරාය. දොසන්තරෙන තෙ ආවුසො, චුදිතො නො මෙත්තචිත්තෙන, අලං තෙ විප්පටිසාරායාති.

අධම්මචොදකස්ස ආවුසො, භික්ඛුනො ඉමෙහි පඤ්චහාකාරෙහි විප්පටිසාරො උපදහිතබ්බො. තං කිස්ස හෙතු? යථා න අඤ්ඤොපි භික්ඛු අභූතෙන චොදෙතබ්බං මඤ්ඤෙය්‍යාති.

1. මෙත්තචිත්තො වක්ඛාමි නො දොසන්තරො - මජසං.
2 උපදහාතබ්බො - මජසං.

5. 4. 2. 7.

[චොදනා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**17.** ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ මහණුන් ඇමතූ සේක ...

ඇවැත්නි, පරහට චොදනා කරණු කැමැති චොදක මහණහු විසින් ධර්ම පසක් තමා කෙරෙහි එළවා මෙරමා චොදනා කළ යුත්තේ ය. කවර පසෙක යත්:

අකාලයෙහි නො ව නිසි කාලයෙහි කියනෙමි, අසත්‍යයෙන් නො ව සත්‍යයෙන් කියනෙමි, පරොස්බසින් නො ව මොලොකින් කියනෙමි, අනර්‍ථසංහිතයෙන් නො ව අර්‍ථසංහිතයෙන් කියනෙමි, ද්වෙෂසහිත සිතින් නො ව මෙත්සහගිය සිතින් කියනෙමි.

ඇවැත්නි, පරහට චොදනා කරණු කැමැති චොදක මහණහු විසින් මෙ කරුණු පස තමා කෙරෙහි එළවා අන්‍යයා චොදනා කළ යුත්තේ ය.

ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුගුලකු නිසි කල්හි නො ව අකාලයෙහි චොදනා කරණු ලබන කිපියහු දක්මි. භූතයෙන් නො ව අභූතයෙන් චොදනා කරණු ලබන කිපියහු, මොලොකින් නො ව පරොස්බසින් චොදනා කරණු ලබන කිපියහු, අර්‍ථසංහිතයෙන් නො ව අනර්‍ථසංහිතයෙන් චොදනා කරණු ලබන කිපියහු, මෛත්‍රීසහගතචිත්තයෙන් නො ව ද්වෙෂසහගතචිත්තයෙන් චොදනා කරණු ලබන කිපියහු දක්මි.

ඇවැත්නි, අධර්මයෙන් චොදනා ලද මහණහට පස් අයුරෙකින් අවිප්‍රතිසාරය ඉපැදවිය යුත්තේ ය:

ආයුෂ්මත් කාලයෙන් නො ව අකාලයෙන් චූදිතයෙහි. එ තොපගේ අවිප්‍රතිසාරයට නිසි වෙයි. ආයුෂ්මත් භූතයෙන් නො ව අභූතයෙන් චූදිතයෙහි. එ තොපගේ අවිප්‍රතිසාරයට නිසි වෙයි. ආයුෂ්මත් මොලොකින් නොව පරොස් බසින් චූදිතයෙහි. එ තොපගේ අවිප්‍රතිසාරයට නිසි වෙයි. ආයුෂ්මත් අර්‍ථසංහිතයෙන් නො ව අනර්‍ථසංහිතයෙන් චූදිතයෙහි. එ තොපගේ අවිප්‍රතිසාරයට නිසි වෙයි. ආයුෂ්මත් මෙත්සිතින් නො ව ද්වෙෂසහගත චිත්තයෙන් චූදිතයෙහි. එ තොපගේ අවිප්‍රතිසාරයට නිසි වෙයි.

ඇවැත්නි, අධර්මයෙන් චොදනා ලද භික්‍ෂුහට මෙ කරුණු පසින් අවිප්‍රතිසාරය ඉපැදවිය යුතු යි.

ඇවැත්නි, අධර්මයෙන් චොදනා කරණ මහණහට කරුණු පසෙකින් විප්‍රතිසාරය දැනැවිය යුතු.

ඇවැත්නි, තොප විසින් නිසි කල්හි නො ව අකාලයෙහි (හෝ) චූදිත වෙයි. එ තොපගේ විප්‍රතිසාරයට නිසි වෙයි. ඇවැත්නි, තොප විසින් භූතයෙන් නො ව අභූතයෙන් (හෝ) චූදිත වෙයි, එ තොපගේ විප්‍රතිසාරයට නිසි වෙයි. ඇවැත්නි, තොප විසින් මොලොකින් නො ව පරොසින් චූදිත වෙයි, තොපගේ විප්‍රතිසාරයට එ නිසි වෙයි. ඇවැත්නි, තොප විසින් අර්‍ථසංහිතයෙන් නො ව අනර්‍ථසංහිතයෙන් චූදිත වෙයි, තොපගේ විප්‍රතිසාරයට එ නිසි වෙයි. ඇවැත්නි, තොප විසින් මෙත්සිතින් නො ව ද්වෙෂචිත්තයෙන් චූදිත වෙයි, එ තොපගේ විප්‍රතිසාරයට නිසි වෙයි.

ඇවැත්නි අධර්මයෙන් චොදනා කරණ මහණහට මෙ පස්කරුණින් විප්‍රතිසාරය දැනැවිය යුතු. එ කවර හෙයින යත්: අන් මහණෙක් ද (තව මහණකු) අභූතයෙන් චොදනා කටයුතු කොට නො සිතනු පිණිසයි.

ඉධ පනාහං ආවුසො, එකච්චං පුග්ගලං පස්සාමි කාලෙන චොදියමානං නො අකාලෙන කුපිතං, භූතෙන චොදියමානං නො අභූතෙන කුපිතං, සණ්හෙන චොදියමානං නො ඵරුසෙන කුපිතං, අත්ථසංහිතෙන චොදියමානං නො අනත්ථසංහිතෙන කුපිතං, මෙත්තචිත්තෙන චොදියමානං නො දොසන්තරෙන කුපිතං.

ධම්මචුදිතස්ස ආවුසො, භික්ඛුනො පඤ්චහාකාරෙහි විප්පටිසාරො උපදහිතබ්බො:

කාලෙනායස්මා චුදිතො නො අකාලෙන, අලං තෙ විප්පටිසාරාය. භූතෙනායස්මා චුදිතො නො අභූතෙන, අලං තෙ විප්පටිසාරාය. සණ්හෙනායස්මා චුදිතො නො ඵරුසෙන, අලං තෙ විප්පටිසාරාය. අත්ථසංහිතෙනායස්මා චුදිතො, නො අනත්ථසංහිතෙන, අලං තෙ විප්පටිසාරාය. මෙත්තචිත්තෙනායස්මා චුදිතො නො දොසන්තරෙන, අලං තෙ විප්පටිසාරායාති.

ධම්මචුදිතස්ස ආවුසො, භික්ඛුනො ඉමෙහි පඤ්චහාකාරෙහි විප්පටිසාරො උපදහිතබ්බො.

ධම්මචොදකස්ස ආවුසො, භික්ඛුනො පඤ්චහාකාරෙහි අවිප්පටිසාරො උපදහිතබ්බො:

කාලෙන තෙ ආවුසො, චුදිතො[1] නො අකාලෙන, අලං තෙ අවිප්පටිසාරාය. භූතෙන තෙ ආවුසො, චුදිතො නො අභූතෙන, අලං තෙ අවිප්පටිසාරාය, සණ්හෙන තෙ ආවුසො, චුදිතො නො ඵරුසෙන, අලං තෙ අවිප්පටිසාරාය, අත්ථසංහිතෙන තෙ ආවුසො, චුදිතො නො අනත්ථසංහිතෙන, අලං තෙ අවිප්පටිසාරාය. මෙත්තචිත්තෙන තෙ ආවුසො, චුදිතො නො දොසන්තරෙන, අලං තෙ අවිප්පටිසාරායාති.

ධම්මචොදකස්ස ආවුසො, භික්ඛුනො ඉමෙහි පඤ්චහාකාරෙහි අවිප්පටිසාරො උපදහිතබ්බො. තං කිස්ස හෙතු? යථා අඤ්ඤෙපි භික්ඛු භූතෙන චොදෙතබ්බං මඤ්ඤෙය්‍යාති.

චුදිතෙන ආවුසො, පුග්ගලෙන ද්වීසු ධම්මෙසු පතිට්ඨාතබ්බං සච්චෙ ච අකුප්පෙ ච. මං චෙපි ආවුසො, පරෙ චොදෙය්‍යුං කාලෙන වා අකාලෙන වා, භූතෙන වා අභූතෙන වා, සණ්හෙන වා ඵරුසෙන වා, අත්ථසංහිතෙන වා අනත්ථසංහිතෙන වා, මෙත්තචිත්තෙන වා දොසන්තරෙන වා, අහම්පි ද්වීසු යෙව ධම්මෙසු පතිට්ඨහෙය්‍යං සච්චෙ ච අකුප්පෙ ච.

සචෙ ජානෙය්‍යං අත්ථෙසො මයි ධම්මොති, අත්ථීති නං වදෙය්‍යං සංවිජ්ජතෙසො මයි ධම්මොති. සචෙ ජානෙය්‍යං නත්ථෙසො මයි ධම්මොති, නත්ථීති නං වදෙය්‍යං නෙසො ධම්මො මයි සංවිජ්ජතීති.

එවම්පි ඛො තෙ සාරිපුත්ත, වුච්චමානා අථ ච පන ඉධෙකච්චෙ මොඝපුරිසා න පදක්ඛිණං ගණ්හන්තීති.

---

1 චොදිතො - මජ්ඣං.

ඇවැත්නි, මම මෙ සස්නෙහි ඇතැම් පුඟුලකු අකාලයෙහි නො ව කාලයෙහි චෝදනා කරණු ලබන කිපියහු දක්මි. අභූතයෙන් නො ව භූතයෙන් චෝදනා කරණු ලබන කිපියහු, පරොස් බසින් නො ව මොළොකින් චෝදනා කරණු ලබන කිපියහු, අනර්ථසංහිතයෙන් නො ව අර්ථසංහිතයෙන් චෝදනා කරණු ලබන කිපියහු, ද්වෙෂචිත්තයෙන් නො ව මෛත්‍රීචිත්තයෙන් චෝදනා කරණු ලබන කිපියහු දක්මි.

ඇවැත්නි, ධර්මයෙන් චෝදිත භික්‍ෂුහට පස් අයුරෙකින් විප්‍රතිසාරය දනැවිය යුතු:

ආයුෂමත් අකාලයෙහි නො ව කාලයෙහි චෝදිතයෙහි, තොපගේ විපිළිසරට එ නිසි වෙයි. ආයුෂමත් අභූතයෙන් නො ව භූතයෙන් චෝදිතයෙහි, තොපගේ විපිළිසරට එ නිසි වෙයි. ආයුෂමත් පරොසින් නො ව මොළොකින් චෝදිතයෙහි, තොපගේ විපිළිසරට එ නිස්ස. ආයුෂමත් අනර්ථසංහිතයෙන් නො ව අර්ථසංහිතයෙන් චෝදිතයෙහි, තොපගේ විපිළිසරට එ නිස්ස. ආයුෂමත් ද්වෙෂචිත්තයෙන් නො ව මෙත්සිතින් චෝදිතයෙහි, තොපගේ විප්‍රතිසාරට එ නිස්සැයි.

ඇවැත්නි, ධර්මයෙන් චෝදිත භික්‍ෂුහට මෙ කරුණු පසින් විපිළිසර දනැවිය යුතු.

ඇවැත්නි, ධර්මයෙන් චෝදනා කරණ මහණහට කරුණු පසෙකින් අවිප්‍රතිසාරය දනැවිය යුතු යි:

ඇවැත්නි, තොප විසින් (හේ) අකාලයෙහි නො ව. කාලයෙහි චෝදිත වෙයි, තොපගේ අවිප්‍රතිසාරයට එ නිසි වෙයි. ඇවැත්නි, තොප විසින් අභූතයෙන් නො ව භූතයෙන් චෝදිත වෙයි, තොපගේ අවිප්‍රතිසාරයට එ නිසි වෙයි. ඇවැත්නි, තොප විසින් පරොසින් නො ව මොළොකින් චෝදිත වෙයි, තොපගේ අවිප්‍රතිසාරයට එ නිසි වෙයි. ඇවැත්නි, තොප විසින් අනර්ථසංහිතයෙන් නො ව අර්ථසංහිතයෙන් චෝදිත ය, තොපගේ අවිප්‍රතිසාරයට එ නිස්ස. ඇවැත්නි, තොප විසින් ද්වෙෂචිත්තයෙන් නො ව මෙත්සිතින් චෝදිත ය, තොපගේ අවිප්‍රතිසාරයට එ නිස්සැයි.

ඇවැත්නි, ධර්මයෙන් චෝදනා කරණ මහණහට මෙ කරුණු පසින් අවිප්‍රතිසාරය දනැවිය යුතු ය. එ කවර හෙයින යත්: යම් හෙයෙකින් අන් මහණෙක් ද (තව මහණකු) භූතයෙන් චෝදනා කටයුතු කොට හඟනේ වේ නම්, එහෙයිනි.

ඇවැත්නි, චෝදනා ලත් පුඟුල්හු විසින් සත්‍යයෙහි ද අකොප්‍යයෙහි ද යන ධර්ම දෙකෙහි පිහිටිය යුතු ය. ඇවැත්නි, අන්‍යයෝ ඉදින් මට ද කාලයෙහි චේව යි, අකාලයෙහි චේව යි, භූතයෙන් චේව යි, අභූතයෙන් චේව යි, මොළොකින් චේව යි, පරොසින් චේව යි, අර්ථසංහිතයෙන් චේව යි, අනර්ථසංහිතයෙන් චේව යි, මෛත්‍රීචිත්තයෙන් චේව යි, ද්වෙෂචිත්තයෙන් චේව යි චෝදනා කරත් නම්, මම ද සත්‍යයෙහි ද අකොප්‍යයෙහි ද යන ධර්ම දෙක්හි පිහිටන්නෙමි:

“ඉදින් තෙල ධර්මය මා කෙරෙහි ඇතැයි දන්නෙම් නම්, ‘තෙල ධර්මය මා කෙරෙහි ඇතැ’යි එය ඇතිසෙ කියමි. ඉදින් තෙල ධර්මය මා කෙරෙහි නැතැයි දනිම් නම්, ‘තෙල ධර්මය මා කෙරෙහි විද්‍යමාන නො වේ’ යයි එය නැතිසෙ කියමි.”

එතෙකුදු වුව ශාරිපුත්‍රය, තොප විසින් මෙසේ කියනු ලබන්නාහු මෙහි ඇතැම් තුච්ඡපුරුෂ කෙනෙක් එය පැදකුණු කොට (ඇදුරු කොට) නො ගන්නාහ යි.

යෙ තෙ භන්තෙ, පුග්ගලා අස්සද්ධා ජීවිකත්ථා න සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, සඨා මායාවිනො කෙටුභිනො[1] උද්ධතා උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරා භොජනෙ අමත්තඤ්ඤුනො ජාගරියං අනනුයුත්තා සාමඤ්ඤෙ අනපෙක්ඛවන්තො සික්ඛාය න තිබ්බගාරවා, බාහුලිකා සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා කුසීතා හීනවිරියා මුට්ඨස්සතිනො අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා දුප්පඤ්ඤා එළමූගා, තෙ මයා එවං වුච්චමානා න පදක්ඛිණං ගණ්හන්ති.

යෙ පන තෙ භන්තෙ, කුලපුත්තා සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, අසඨා අමායාවිනො අකෙටුභිනො[2] අනුද්ධතා අනුන්නළා අචපලා අමුඛරා අවිකිණ්ණවාචා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා භොජනෙ මත්තඤ්ඤුනො ජාගරියං අනුයුත්තා සාමඤ්ඤෙ අපෙක්ඛවන්තො සික්ඛාය තිබ්බගාරවා, න බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා ආරද්ධවිරියා පහිතත්තා උපට්ඨිතස්සතිනො සම්පජානා සමාහිතා එකග්ග-චිත්තා පඤ්ඤවන්තො අනෙළමූගා, තෙ මයා එවං වුච්චමානා පදක්ඛිණං ගණ්හන්තීති.

යෙ තෙ සාරිපුත්ත, පුග්ගලා අස්සද්ධා ජීවිකත්ථා න සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, සඨා මායාවිනො කෙටුභිනො උද්ධතා උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරා භොජනෙ අමත්තඤ්ඤුනො ජාගරියං අනනුයුත්තා සාමඤ්ඤෙ අනපෙක්ඛවන්තො සික්ඛාය න තිබ්බගාරවා, බාහුලිකා සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා කුසීතා හීනවිරියා මුට්ඨස්සතිනො අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා දුප්පඤ්ඤා එළමූගා, තිට්ඨන්තු තෙ.

යෙ පන තෙ සාරිපුත්ත, කුලපුත්තා සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, අසඨා අමායාවිනො අකෙටුභිනො අනුද්ධතා අනුන්නළා අචපලා අමුඛරා අවිකිණ්ණවාචා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා භොජනෙ මත්තඤ්ඤුනො ජාගරියං අනුයුත්තා සාමඤ්ඤෙ අපෙක්ඛවන්තො සික්ඛාය තිබ්බගාරවා, න බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා ආරද්ධවිරියා පහිතත්තා උපට්ඨිතස්සතිනො සම්පජානා සමාහිතා එකග්ගචිත්තා පඤ්ඤවන්තො අනෙළමූගා, තෙ ත්වං සාරිපුත්ත, වදෙය්‍යාසි. ඔවද සාරිපුත්ත, සබ්‍රහ්මචාරී, අනුසාස සාරිපුත්ත, සබ්‍රහ්මචාරී, "අසද්ධම්මා වුට්ඨාපෙත්වා සද්ධම්මෙ පතිට්ඨාපෙස්සාමි සබ්‍රහ්මචාරී"ති. එවඤ්හි තෙ සාරිත්ත, සික්ඛිතබ්බන්ති.

1. කෙතබිනො - මජසං, 2. අකෙතබිනො - මජසං.

වහන්ස, යම් පුද්ගල කෙනෙක් ශ්‍රද්ධා නැත්තාහු දිවිවැටුම් හෙතු කොට ගත්තාහු ශ්‍රද්ධා නැති වැ මැ අගාරයෙන් නික්මැ ශාසනයට පැමිණියාහු පැවිදි වූවාහු, කෛරාටික වූවාහු වඤ්චක වූවාහු මායා ඇත්තාහු උද්ධත වූවාහු උද්ගත මානනළ ඇතියාහු චපල වූවාහු දෙඩමලු වූවාහු අසංයත වචන ඇත්තාහු ඉඳුරන්හි නොපියූ දොර ඇතියාහු භොජනයෙහි මාත්‍රඥ නො වූවාහු ජාගර්‍ය්‍යායෙහි නො යෙදුනාහු ශ්‍රමණභාවයෙහි අපෙක්‍ෂා නැතියාහු ශික්‍ෂාහි තීව්‍ර ගෞරව නැත්තාහු ප්‍රත්‍යයබාහුල්‍යය ඇත්තාහු සස්න ලිහිල් කොට ගත්තාහු (පඤ්චනීවරණ සඞ්ඛ්‍යාත) අවක්‍රමණයෙහි පූර්වඞ්ගම වූවාහු ප්‍රවිවෙකයෙහි හළ වැර ඇත්තාහු අලස වූවාහු හීනවීර්‍ය්‍ය ඇත්තාහු නටසිහි ඇතියාහු සම්‍යක් ප්‍රඥා නැත්තාහු, සමාහිත නොවූවාහු විභ්‍රාන්ත වූ සිත් ඇත්තාහු ප්‍රඥා නැත්තාහු කෙළතොලු වූවාහු වෙත් නම්, ඔහු මා විසින් මෙසේ කියනු (ඔවා දෙනු) ලබන්නාහු එය පැදකුණු කොට (ඇදුරු කොට) නො ගණිත්.

වහන්ස, යම් සැදැහැති කුලපුත්‍ර කෙනෙක් ගිහිගෙන් නික්මැ ශාසනයෙහි පැවිදිවූවාහු, කෛරාටික නොවූවාහු වංචක නොවූවාහු මායා රහිත වූවාහු උද්ධත නො වූවාහු උද්ගත මානනළ නැත්තාහු චපල නො වූවාහු දෙඩමලු නො වූවාහු සංයත වචන ඇත්තාහු ඉඳුරන්හි පියූ දොර ඇතියාහු භොජනයෙහි මාත්‍රඥ වූවාහු නිදිවැරීමෙහි යෙදුනාහු ශ්‍රමණභාවයෙහි අපෙක්‍ෂා ඇත්තාහු ශික්‍ෂායෙහි තීව්‍ර ගෞරව ඇත්තාහු, ප්‍රත්‍යය බාහුලික නො වූවාහු සස්න ලිහිල් කොට නො ගන්නාහු අවක්‍රමණයෙහි හළ වැර ඇතියාහු ප්‍රවිවෙකයෙහි පූර්වඞ්ගම වූවාහු රැකුළු වැර ඇතියාහු නිවන් කෙරෙහි මෙහෙයූ සිත් ඇත්තාහු එළඹසිටි සිහි ඇත්තාහු සම්‍යක්ප්‍රඥා ඇත්තාහු සමාහිත වූවාහු එකඟසිත් ඇත්තාහු ප්‍රඥාවත් වූවාහු කෙළතොලු නොවූවාහු වෙත් නම්, ඔහු මා විසින් මෙසේ කියනු ලබන්නාහු පැදකුණු කොට මතෙපුල් ගණිත් ය යි සැරියුත් තෙරණුවෝ කීහ.

ශාරීපුත්‍රයෙනි, යම් පුද්ගල කෙනෙක් අශ්‍රද්ධාවත් වූවාහු ජීවිකාව ම අර්ථ කොට ගත්තාහු ශ්‍රද්ධා නැතියාහු ගිහිගෙන් නික්මැ ශාසනයට පැමිණියාහු සළබව් ඇතියාහු මායා ඇත්තාහු වඤ්චා ඇත්තාහු උද්ධත වූවාහු උස්ව නැගි මානනළ ඇත්තාහු චපල වූවාහු දෙඩමලු වූවාහු සංකීර්ණවචන ඇත්තාහු ඉඳුරන්හි නො පියූ දොර ඇතියාහු භොජනයෙහි මාත්‍රඥ නො වූවාහු ජාගර්‍ය්‍යායෙහි නො යෙදුනාහු ශ්‍රමණභාවයෙහි අපෙක්‍ෂා නැත්තාහු ශික්‍ෂාහි තීව්‍ර ගෞරව නැත්තාහු, ප්‍රත්‍යයබාහුල්‍යයෙන් යුක්ත වූවාහු ශාසනය ලඝු කොට ගත්තාහු (පඤ්චනීවරණ සඞ්ඛ්‍යාත) අවක්‍රමණයෙහි පෙරටුව යන්නාහු ප්‍රකර්ෂ විවෙකයෙහි හැරපී වීර්‍ය්‍යධුර ඇත්තාහු කුසීත වූවාහු හීනවීර්‍ය්‍ය ඇත්තාහු නට සිහි ඇත්තාහු සම්ප්‍රඥනයෙන් තොර වූවාහු අසමාහිත වූවාහු විභ්‍රාන්ත සිත් ඇත්තාහු දුෂ්ප්‍රාඥ වූවාහු කෙළතොලු වූවාහු නම්, ඔහු සිටිත්වා.

ශාරීපුත්‍රයෙනි, යම් ශ්‍රද්ධාවත් කුලපුත්‍ර කෙනෙක් ගිහිගෙන් නික්ම ශාසනයට පැමිණියාහු, සළබව් නැත්තාහු මායා නැත්තාහු වඤ්චනික නො වූවාහු උද්ධත නො වූවාහු මානනළ නැත්තාහු චපල නො වූවාහු දෙඩමලු නො වූවාහු නො විසුළ තෙපුල් ඇතියාහු ඉඳුරන්හි පියූ දොර ඇත්තාහු භොජනයෙහි මාත්‍රඥ වූවාහු නිදිවැරීමෙහි යෙදුනාහු ශ්‍රමණභාවයෙහි අපෙක්‍ෂා ඇත්තාහු ශික්‍ෂායෙහි තීව්‍ර ගෞරව ඇත්තාහු, බාහුලික නො වූවාහු සස්න ලිහිල් කොට නො ගත්තාහු අවක්‍රමණයෙහි හැරපියූ වීර්‍ය්‍ය ධුර ඇත්තාහු ප්‍රවිවෙකයෙහි පූර්වඞ්ගම වූවාහු රැකුළු වැර ඇතියාහු නිවන් කෙරෙහි මෙහෙයුනු සිත් ඇත්තාහු එළඹ සිටි සිහි ඇත්තාහු සම්‍යක්ප්‍රඥා ඇත්තාහු සමාහිත වූවාහු එකාග සිත් ඇත්තාහු ප්‍රඥාවත් වූවාහු කෙළතොලු නො වූවාහු වෙත් නම්, ශාරීපුත්‍රයෙනි, තෙපි ඔවුනට කියව. ශාරිපුත්‍රයෙනි, සබ්‍රම්සරුන්ට ඔවා දෙව. ශාරීපුත්‍රයෙනි "සබ්‍රම්සරුන් අසද්ධර්මයෙන් නගා සිටුවා සද්ධර්මයෙහි පිහිටුවන්නෙමි"යි. සබ්‍රම්සරුන්ට අනුශාසනා කරව. ශාරීපුත්‍රයෙනි, තොප විසින් මෙසෙයින් ම හික්මිය යුතු ය යි භගවත්හු වදාළහ.

## 5. 4. 2. 8.

## [සීලසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**18.** තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි: -පෙ- දුස්සීලස්ස ආවුසො, සීලවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ අසති නිබ්බිදාවිරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි ආවුසො, රුක්ඛො සාඛාපලාසවිපන්නො, තස්ස පපටිකාපි න පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි න පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො ආවුසො, දුස්සීලස්ස සීලවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සන විපන්නස්ස හතූපනිසො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ අසති නිබ්බිදාවිරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

සීලවතො ආවුසො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ සති නිබ්බිදාවිරාගසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි ආවුසො, රුක්ඛො සාඛාපලාසසම්පන්නො, තස්ස පපටිකාපි පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො ආවුසො, සීලවතො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ සති නිබ්බිදාවිරාගසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනන්ති.

## 5. 4. 2. 9.

## [ඛිප්පනිසන්තිසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**19.** අථ ඛො ආයස්මා **ආනන්දො** යෙනායස්මා **සාරිපුත්තො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

## 5. 4. 2 8

## [සීල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**18**. එ කල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ මහණුන් ඇමතූහ ...

ඇවැත්නි, ශීලවිපත්තියට පැමිණි දුශ්ශීලයාගේ සම්‍යක්සමාධිය නට උපනිඃශ්‍රය ඇති වෙයි. සම්‍යක්සමාධිය නැතිවත් ම සම්‍යක්සමාධි විපන්න-(වියුක්ත) යාගේ යථාභූතඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි. යථාභූත-ඥානදර්ශනය නැතිවත් ම යථාභූතඥානදර්ශනවිපන්නයාගේ නිබ්බිදාවිරාගය නට උපනිඃශ්‍රය ඇති වෙයි. නිබ්බිදාවිරාගය නැතිවත් ම නට නිබ්බිදාවිරාග ඇතියහුගේ විමුක්තිඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි.

ඇවැත්නි, යම්සේ නට අතුකොළ ඇති රුකෙක් වේ නම්, එහි පිට පොතු ද වැඩුමට නො යේ. සිව්දු වැඩුමට නො යේ. බොරුදු වැඩුමට නොයේ. සාරයත් වැඩුමට නො යේ. ඇවැත්නි, එසෙයින් ම ශීලවිපත්තියට පත් දුශ්ශීලයාගේ සම්‍යක්සමාධිය නට උපනිඃශ්‍රය ඇති වෙයි. සම්‍යක්සමාධිය නැතිවත් ම සම්‍යක්සමාධිවිපන්නයාගේ යථාභූතඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි. යථාභූතඥානදර්ශනය නැතිවත් ම යථාභූතඥානදර්ශනවිපන්නයාගේ නිබ්බිදාවිරාගය නට උපනිඃශ්‍රය ඇති වෙයි. නිබ්බිදාවිරාගය නැතිවත් ම නිබ්බිදාවිරාගවිපන්නයාගේ විමුක්තිඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි

ඇවැත්නි, සිල්සපත් සිල්වත්හුගේ සම්‍යක්සමාධිය උපනිඃශ්‍රය-සම්පන්න වෙයි. සම්‍යක්සමාධිය ඇති වත් ම සම්‍යක්සමාධිසම්පන්නයාගේ යථාභූතඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. යථාභූතඥානදර්ශනය ඇති වත්ම යථාභූතඥානදර්ශන සම්පන්නයාගේ නිබ්බිදාවිරාගය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිබ්බිදාවිරාගය ඇති වත් ම නිබ්බිදාවිරාගසම්පන්නයාගේ විමුක්තිඥාන-දර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි.

ඇවැත්නි, යම්සේ අතුපතරින් ගැවසීගත් රුකෙක් වේ නම්, එහි පිට-පොතුත් වැඩුමට යේ. සිව්දු වැඩුමට යේ. බොරුදු වැඩුමට යේ. සාරයදු වැඩුමට යේ. ඇවැත්නි, එසෙයින් ම සිල්සපත් සිල්වත්හුගේ සම්‍යක්සමා-ධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සම්‍යක්සමාධිය ඇති වත් ම සම්‍යක්සමාධි-සම්පන්නයාගේ යථාභූතඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. යථාභූත-ඥානදර්ශනය ඇති වත් ම යථාභූතඥානදර්ශනසම්පන්නයාගේ නිබ්බිදාවිරාගය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිබ්බිදාවිරාගය ඇති වත් ම නිබ්බිදාවිරාගසම්පන්න-යාගේ විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වේ ය යි.

## 5. 4 2. 9.

## [භික්ඛුනිසන්ති සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**19**. එ කල්හි ආයුෂ්මත් **ආනද** තෙරණුවෝ **සැරියුත්** තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා, එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරුණුවන්ට තෙල සැළකළහ:

කිත්තාවතා නු ඛො ආවුසො සාරිපුත්ත, භික්ඛු ඛිප්පනිසන්තී ච හොති කුසලෙසු ධම්මෙසු, සුග්ගහිතගාහී ච, බහුං ච ගණ්හාති, ගහිතං චස්ස නප්පමුස්සතී?ති.

ආයස්මා ඛො ආනන්දො බහුස්සුතො, පටිභාතු ආයස්මන්තඤ්ඤෙව ආනන්දන්ති. තෙනහාවුසො සාරිපුත්ත, සුණාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති.

එවමාවුසොති ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි. ආයස්මා ආනන්දො එතදවොච:

ඉධාවුසො, සාරිපුත්ත, භික්ඛු අත්ථකුසලො ච හොති ධම්මකුසලො ච නිරුත්තිකුසලො ච ව්‍යඤ්ජනකුසලො ච පුබ්බාපරකුසලො ච.

එත්තාවතා ඛො ආවුසො, සාරිපුත්ත, භික්ඛු ඛිප්පනිසන්තී ච හොති කුසලෙසු ධම්මෙසු, සුග්ගහිතගාහී ච, බහුං ච ගණ්හාති, ගහිතං චස්ස නප්පමුස්සතීති.

අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යාව සුභාසිතං චිදං ආයස්මතා ආනන්දෙන. ඉමෙහි ච මයං පඤ්චහි ධම්මෙහි සමන්නාගතං ආයස්මන්තං ආනන්දං ධාරෙම: 'ආයස්මා ආනන්දො අත්ථකුසලො ධම්මකුසලො නිරුත්ති-කුසලො ව්‍යඤ්ජනකුසලො පුබ්බාපරකුසලො'ති.

### 5. 4 2. 10.

### [භද්දජීසුත්තං]

**20**. එකං සමයං ආයස්මා **ආනන්දො, කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ**. අථ ඛො ආයස්මා **භද්දජී** යෙනායස්මා ආනන්දො තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං භද්දජිං ආයස්මා ආනන්දො එතදවොච:

කින්නු ඛො ආවුසො භද්දජි, දස්සනානං අග්ගං? කිං සවණානං අග්ගං? කිං සුඛානං අග්ගං? කිං සඤ්ඤානං අග්ගං? කිං භවානං අග්ගන්ති?

අත්ථාවුසො, බ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්තී, යො තං බ්‍රහ්මානං පස්සති, ඉදං දස්සනානං අග්ගං.

අත්ථාවුසො ආභස්සරා නාම දෙවා සුඛෙන අභිසන්නා පරිසන්නා. තෙ කදාචි කරහචි උදානං උදානෙන්ති: "අහො සුඛං, අහො සුඛන්ති." යො තං සද්දං සුණාති, ඉදං සවණානං අග්ගං.

ආයුෂ්මත් ශාරීපුත්‍රයෙනි, මහණ කෙතෙක් කරුණින් කුශලධර්මයෙහි වහා රැකුළුකත් ඇති වේ ද, සුගෘහීත කොට ගන්නා සුලුයේත් වේ ද, බොහෝ කොට ගන්නේත් වේ ද? ඔහු විසින් ගන්නා ලද දැය විසමෘතත් නො වේ දැ? යි.

"ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ බහුශ්‍රැතයහ. ආයුෂ්මත් ආනන්ද තෙරුනට ම තෙල වැටහේවා" යි. එසේ වී නම් ආයුෂ්මත් ශාරීපුත්‍රයෙනි, අසනු මැනැවි, මනා කොට මෙනෙහි කළ මැනැවි, කියමි යි.

'ඇවැත්නි, එසේ ය'යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරණුවනට පිළිවදත් ඇස්සුහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ තෙල කීහ:

ආයුෂ්මත් ශාරීපුත්‍රයෙනි, මෙ සස්නෙහි මහණ අර්ථයෙහි ද කුශල වෙයි. පාළි ධර්මයෙහි ද කුශල වෙයි. නිරුක්ති වචනයෙහි ද කුශල වෙයි. ව්‍යඤ්ජන (පදභෙද) යෙහි ද කුශල වෙයි. පූර්වාපරසන්ධානයෙහි (මුල අග ගැළපීමෙහි) ද කුශල වෙයි.

ආයුෂ්මත් ශාරීපුත්‍රයෙනි, මෙ පමණෙකින් ම මහණ කුශලධර්මයෙහි වහා අසන්නේ (දරන්නේ) වෙයි. මොනවට උගන්නේ ද වෙයි. බොහෝ කොට ද ගන්නේ ය. ඔහු විසින් ගන්නා ලද දැය නො නස්නේ ය යි.

ආශ්චර්ය්‍ය ඇවැත්නි, අද්භූත ය ඇවැත්නි, ආයුෂ්මත් ආනන්ද තෙරුණුවන් විසින් මෙය සුභාෂිත මැ යැ. අපි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් මේ දහම් පසින් සමන්වාගත කොට "ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ අර්ථකුශලයහ, ධර්මකුශලයහ, නිරුක්තිකුශලයහ, ව්‍යඤ්ජන-කුශලයහ, පූර්වාපරසන්ධානකුශලයහ" යි ධරම්හ.

## 5. 4. 2. 10.

### [භද්දජීසූත්‍රය]

**20**. එක් කලෙක ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ **කොසම්බෑ නුවර** සමීපයෙහි **ඝොෂිතාරාමයෙහි** වසන්නාහ. එ කල්හි ආයුෂ්මත් **භද්‍රජිත්** තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරුණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරුණුවන් හා සමඟ සතුටුවූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් භද්‍රජිත් තෙරණුවන්ට ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ තෙල කීහ:

ආයුෂ්මත් භද්‍රජිත් තෙරණුවනි, දර්ශනයන් කෙරෙහි කුමක් අග්‍ර වේ ද? ශ්‍රවණයන් කෙරෙහි කුමක් අග්‍ර වේ ද? සුඛයන් කෙරෙහි කුමක් අග්‍ර වේ ද? සංඥාවන් කෙරෙහි කුමක් අග්‍ර වේ ද? භවයන් කෙරෙහි කුමක් අග්‍ර වේ දැයි?

ඇවැත්නි, මෙරමා අභිභවා සිටි අනෙකක්හු විසින් අනභිභූත වූ එකාන්ත යෙන් සියල්ල දක්නාවූ හැම දෙන සියවසයෙහි පවත්වන සුලු බ්‍රහමයෙක් ඇත. යමෙක් එ බ්‍රහමයා දක්නේ වේ නම්, මෙය දර්ශනයන් කෙරෙහි අග්‍රය.

ඇවැත්නි, ආභාස්වර නම් වූ සුඛයෙන් පිරී පැතිර සිටුනා දෙවිකෙනෙක් ඇත. ඔහු ඇතැම් කලෙක "අහෝ සුඛ ය, අහෝ සුඛය ය"යි උදන් අනත්. යමෙක් එ හඬ අසා නම්, මෙය ශ්‍රවණයන් කෙරෙහි අග්‍ර ය.

අත්ථාවුසො, සුභකිණ්හකා නාම දෙවා. තෙ සන්තංයෙව තුසිතා සුඛං පටිසංවෙදෙන්ති. ඉදං සුඛානං අග්ගං.

අත්ථාවුසො, ආකිඤ්චඤ්ඤායතනූපගා දෙවා. ඉදං සඤ්ඤානං අග්ගං.

අත්ථාවුසො, නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගා දෙවා. ඉදං භවානං අග්ගන්ති.

සමෙති ඛො ඉදං ආයස්මතො භද්දජිස්ස යදිදං බහුජනෙනාති.[1]

ආයස්මා ඛො ආනන්දො බහුස්සුතො. පටිභාතු ආයස්මන්තංයෙව ආනන්දන්ති.

තෙන හි ආවුසො, භද්දජි, සුණාහි සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති. එවමාවුසොති ඛො ආයස්මා භද්දජි ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි. ආයස්මා ආනන්දො එතදවොච:

යථා පස්සතො ඛො ආවුසො, අනන්තරා ආසවානං ඛයො හොති, ඉදං දස්සනානං අග්ගං. යථා සුණතො අනන්තරා ආසවානං ඛයො හොති, ඉදං සවණානං අග්ගං. යථා සුඛිතස්ස අනන්තරා ආසවානං ඛයො හොති, ඉදං සුඛානං අග්ගං. යථා සඤ්ඤිස්ස අනන්තරා ආසවානං ඛයො හොති, ඉදං සඤ්ඤාන අග්ගං. යථාභූතස්ස අනන්තරා ආසවානං ඛයො හොති, ඉදං භවානං අග්ගන්ති.

**ආඝාතවග්ගො දුතියො.**

**තස්සුද්දානං:**

ද්වෙ ආඝාතවිනයා සාකච්ඡා සාජීවතො පඤ්හං
පුච්ඡා නිරොධො චොදනා සීලං නිසන්ති භද්දජීති.

---

1 බහුතා ජනෙනාති - මජ්ඣං

ඇවැත්නි, ශුභකෘත්‍සන නම් දෙවි කෙනෙක් ඇත. සුඛිත වූ ඔහු විද්‍යමාන වූ ම සුව විඳුනාහ. මෙ සුඛයන් කෙරෙහි අග්‍ර ය.

ඇවැත්නි, ආකිඤ්චන්‍යායතනොපග දෙවි කෙනෙක් ඇත. මේ සංඥවන් කෙරෙහි අග්‍ර ය.

ඇවැත්නි, නෛවසංඥනාසංඥයතනොපග දෙවි කෙනෙක් ඇත මෙ භවයන් කෙරෙහි අග්‍ර යයි.

ආයුෂ්මත් භද්‍රජිත් තෙරුන්ගේ මෙ බස බහු ජනයාගේ (බොහෝ දෙනාගේ) බස් හා සැසැඳේ ය යි.

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ බහුශ්‍රැතයහ, ආයුෂ්මත් ආනන්ද තෙරුණුවන්ට ම (තෙල කරුණ) වැටහේව යි.

ආයුෂ්මත් භද්‍රජිත්තෙරණුවනි, එසේවී නම්, මනා කොට අසව, මැනැවින් මෙනෙහි කරව, කියම් යි. 'ඇවැත්නි, එසේ ය' යි ආයුෂ්මත් භද්‍රජිත් තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ තෙල කරුණ කීහ:

ඇවැත්නි, යම් පරිද්දෙකින් (ඉටු අනිටු කවර හෝ අරමුණක්) දක්නහුට එයට අනතුරුව ම ආස්‍රවයන්ගේ ක්‍ෂය වේ නම්, මෙ දර්‍ශනයන් කෙරෙහි අග්‍ර වෙයි. යම් පරිද්දෙකින් අසන්නහුට එයට අනතුරුව ම ආස්‍රවක්‍ෂය වේ නම්, මෙ ශ්‍රවණයන් කෙරෙහි අග්‍ර වෙයි. යම් මාර්‍ගසුඛයෙකින් සුඛිත වූවහුට අනතුරුව ම අර්‍හත්ත්‍ව ය උපදී නම්, මේ මාර්‍ගසුඛය සුඛයන් කෙරෙහි අග්‍ර ය. යම් මාර්‍ගසංඥවක් ඇතියහුට (මාර්‍ගසංඥවට) අනතුරුව ම ආස්‍රවක්‍ෂය වේ නම්, මේ සංඥවන් කෙරෙහි අග්‍රය. යම් අත්බැවෙක සිටියහුට අනන්තරව ම (මාර්‍ගයට අනතුරුව ම) ආස්‍රවක්‍ෂය (ඵලය) වේ නම්, මේ පශ්චිමභවය භවයන් කෙරෙහි අග්‍ර වේ යයි

**ආඝාතවර්‍ගය දෙවැනි යි.**

## එහි උද්දානය:

ආඝාතවිනය සූත්‍ර දෙක ය, සාකච්ඡා සූත්‍රය, සාජීව සූත්‍රය, පඤ්හපුච්ඡා සූත්‍රය, නිරොධ සූත්‍රය, චොදනා සූත්‍රය, සීල සූත්‍රය, නිසන්ති සූත්‍රය, භද්දජිසූත්‍ර ය දැ යි දසයෙකි.

# 3. උපාසකවග්ගො.

## 5. 4. 3. 1.

### [සාරජ්ජසුත්තං]

**21.** එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථ-පිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො සාරජ්ජං ඔක්කන්තො හොති. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති.

ඉමෙහි බො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො සාරජ්ජං ඔක්කන්තො හොති.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො විසාරදො හොති. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති.

ඉමෙහි බො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො විසාරදො හොතීති.

## 5. 4. 3. 2.

### [විසාරදසුත්තං

[සාවත්ථිනිදානං]

**22.** පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො අවිසාරදො අගාරං අජ්ඣාවසති. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතී හොති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති.

ඉමෙහි බො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො අවිසාරදො අගාරං අජ්ඣාවසති.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො විසාරදො අගාරං අජ්ඣාවසති. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති.

ඉමෙහි බො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො විසාරදො අගාරං අජ්ඣාවසතීති.

# 3. උපාසකවග්ගය

## 5. 4. 3. 1.

## [සාරජ්ජ සූත්‍රය]

**21**. **එක්** කාලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ අනේපිඬුසිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්‍ෂූන් ඇමතූ සේක. 'වහන්ස' යි එ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය කරුණ වදාළසේක:

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත උපාසක ශාරද්‍යයට (බියට) බටුයේ වෙයි. කවර පසෙකින යත්:

පණිවා කරණුයේ වෙයි. අයිනාදන් ගත්තේ වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසාවා කියනුයේ වෙයි. මද පමා දෙකට කරුණු වන රහමෙර බොනුයේ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත උපාසක ශාරද්‍යයට බටුයේ වේ.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත උපාසක විශාරද වෙයි. කවර පසෙකින යත්:

පණිවායෙන් වැළැකියේ වෙයි. අයිනාදනින් වැළැකියේ වෙයි. කාමයෙහි මිසහරින් වැළැකියේ වෙයි. මුසවායෙන් වැළැකියේ වෙයි. මද පමා දෙකට කරුණු වන රහමෙරින් වැළැකියේ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත උපාසක විශාරද වේ ය යි.

## 5. 4. 3. 2.

## [විසාරද සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**22**. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත උපාසක අවිශාරද වූයේ ගිහි ගෙයි වාස කරයි. කවර පසෙකින යත්:

පණිවා කරන්නේ වෙයි ... මද පමා දෙකට කරුණු රහමෙර පානය කරන්නේ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත උපාසක අවිශාරද වූයේ ගිහිගෙහි වසයි.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත උපාසක විශාරද ව ගිහිගෙයි වසයි. කවර පසෙකින යත්:

පණිවායෙන් වැළැකියේ වෙයි ... මද පමා දෙකට කරුණු රහමෙරින් වැළැකියේ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත උපාසක විශාරද වූයේ ගිහිගෙයි වෙසේ ය යි.

5. 4. 3. 3.

[නිරයසුත්තං]

[සාවත්‍ථිනිදානං]

**23**. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතී හොති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො උපාසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

5. 4. 3. 4.

[වෙරසුත්තං]

[සාවත්‍ථිනිදානං]

**24**. අථ ඛො **අනාථපිණ්ඩිකො ගහපති** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්‍වා භගවන්තං අභිවාදෙත්‍වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

පඤ්ච ගහපති, භයානි වෙරානි අප්පහාය දුස්සීලො ඉති වුච්චති. නිරයං ච උපපජ්ජති. කතමානි පඤ්ච:

පාණාතිපාතං, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරං, මුසාවාදං, සුරාමෙරයමජ්ජපමාදට්ඨානං.

ඉමානි ඛො ගහපති, පඤ්ච භයානි වෙරානි අප්පහාය දුස්සීලො ඉති වුච්චති. නිරයං ච උපපජ්ජති.

පඤ්ච ගහපති, භයානි වෙරානි පහාය සීලවා ඉති වුච්චති, සුගතිං ච උපපජ්ජති. කතමානි පඤ්ච:

පාණාතිපාතං, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරං, මුසාවාදං, සුරාමෙරයමජ්ජපමාදට්ඨානං.

ඉමානි ඛො ගහපති, පඤ්ච භයානි වෙරානි පහාය සීලවා ඉති වුච්චති. **සුගතිං ච උපපජ්ජතීති.**

5. 4. 3. 3.

[නිරය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**23**. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත උවසු ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි උපදනේ වෙයි. කවර පසෙකින යත්:

පණිවා කරන්නේ වෙයි, ... මදපමා දෙකට කරුණු වූ රහමෙර පානය කරන්නේ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත උවසු ගෙණවුත් බහා තබන ලද්දක් යම්සේ නම්, එසේ නිරයෙහි උපදනේ වේ.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත උවසු ගෙණවුත් බහා තැබුවක් යම්සේ නම්, එසෙයින් සවර්ගයෙහි වෙයි. කවර පසෙකින යත්:

පණිවායෙන් වැළැකියේ වෙයි ... මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වැළැකියේ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත උවසු ගෙණවුත් බහා තබන ලද්දක් යම් සේ නම්, එසෙයින් සවර්ගයෙහි උපදනේ වේ ය යි.

5. 4. 3. 4.

[වෙරසූත්‍රය]

[සැවැත්නිදාන යි]

**24**. එ කල්හි **අනාථපිණ්ඩික ගෘහපති** භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හිඳි. එකත්පස් ව හුන් අනාථපිණ්ඩික ගෘහපතිහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළෝ:

ගැහැවිය, භය පසක් හා වෛර පසක් හා ප්‍රහීණ නො කිරීමෙන් දුශ්ශීලයෙකැයි කියනු ලැබේ. නිරයට ද පැමිණේ. කවර පසෙක යත්:

පණිවා ය, අයිනාදන් ය, කාමයෙහි මිසහසර ය, මුසවා ය, මද පමා දෙකට කරුණුවූ රහමෙර යැ යි.

ගැහැවිය, මෙ භය පස හා වෛර පස හා ප්‍රහීණ නො කිරීමෙන් දුශ්ශීලයෙකැයි කියනු ලැබේ නිරයට ද පැමිණේ.

ගැහැවිය, භය පසක් හා වෛර පසක් හා ප්‍රහීණ කිරීමෙන් සිල්වත් ය යි කියනු ලැබේ. සුගතියට ද එළඹේ. කවර පසෙක යත්:

පණිවා ය, අයිනාදන් ය, කාමයෙහි මිසහසර ය, මුසවා ය, මද පමා දෙකට කරුණු වූ රහමෙර යි.

ගැහැවිය, මෙ භය පස හා වෛර පස හා ප්‍රහීණ කොට සිල්වත් යයි කියනු ලැබේ. සුගතියට ද එළඹේ ය යි.

යං ගහපති, පාණාතිපාතී පාණාතිපාතපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පාණාතිපාතා පටිවිරතො නෙව දිට්ඨධම්මිකං භයං වෙරං පසවති, න සම්පරායිකං භයං වෙරං පසවති, න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පාණාතිපාතා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති. යං ගහපති, අදින්නාදායී -පෙ- යං ගහපති, කාමෙසු මිච්ඡාචාරී -පෙ- යං ගහපති මුසාවාදී -පෙ- යං ගහපති සුරාමෙරය-මජ්ජපමාදට්ඨායී සුරාමෙරයමජ්ජපමාදට්ඨානපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො නෙව දිට්ඨධම්මිකං භයං වෙරං පසවති, න සම්පරායිකං භයං වෙරං පසවති, න චෙතසිකං දුක්ඛංදොමනස්සං පටිසංවෙදෙති. සුරාමෙරයමජ්ජපමා-දට්ඨානා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොතීති.

80. යො පාණමතිපාතෙති[1] මුසාවාදඤ්ච භාසති,
ලොකෙ අදින්නං ආදියති පරදාරඤ්ච ගච්ඡති,
සුරාමෙරයපානං ච යො නරො අනුයුඤ්ජති;

81. අප්පහාය පඤ්ච වෙරානි දුස්සීලො ඉති වුච්චති,
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සොපපජ්ජති.

82. යො පාණං නාතිපාතෙති මුසාවාදං න භාසති,
ලොකෙ අදින්නං නාදියති පරදාරං න ගච්ඡති,
සුරාමෙරය පානං ච යො නරො නානුයුඤ්ජති;

83. පහාය පඤ්ච වෙරානි සීලවා ඉති වුච්චති,
කායස්ස භෙදා සප්පඤ්ඤො සුගතිං සොපපජ්ජතීති.

## 5. 4. 3. 5.

## [උපාසකචණ්ඩාලසුත්තං]

### [සාවත්ථිනිදානං]

**25.** පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසක-චණ්ඩාලො ච හොති උපාසකමලඤ්ච උපාසකපතිකිට්ඨො ච. කතමෙහි පඤ්චහි?

අස්සද්ධො හොති, දුස්සීලො හොති, කොතුහලමඞ්ගලිකො හොති, මඞ්ගලං පච්චෙති නො කම්මං. ඉතො ච බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති. තත්ථ ච පුබ්බකාරං කරොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකචණ්ඩාලො ච හොති උපාසකමලඤ්ච උපාසකපතිකිට්ඨො ච.[2]

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසක-රතනඤ්ච හොති උපාසකපදුමඤ්ච උපාසකපුණ්ඩරීකඤ්ච. කතමෙහි පඤ්චහි:

---

1 පාණං අතිපාතෙති - සීමු. 2 පතිකුට්ඨො ච - මජ්ඣං

ගැහැවිය, පණිවා කරණ්නුයේ ප්‍රාණඝාතප්‍රත්‍යයෙන් යම් ම දෘෂ්ටධාර්මික භය හා වෛර හා ප්‍රසව කෙරේ නම්, සාම්පරායික භය හා වෛර හා ප්‍රසව කෙරේ නම්, මානසික දුක්දෙම්නස් විඳුනේ නම්, පණිවායෙන් දුරුවූයේ දෘෂ්ටධාර්මික භය හා වෛර හා නො ම ප්‍රසව කෙරෙයි, සාම්පරායික භය හා වෛර හා නො ම ප්‍රසව කෙරෙයි, මානසික දුක්දෙම්නස් නො ම විඳුනේ ය. පණිවායෙන් දුරුවූවහුට මෙසේ එ භය හා වෛර හා සන්හුන් වෙයි. ගැහැවිය, අසිනාදන් ගන්නා සුලුයේ ... ගැහැවිය, කාමයෙහි මිසහසර ඇතියේ ... ගැහැවිය, මුසාබස් කියනුයේ ... ගැහැවිය, මද පමා දෙකට කරුණු වූ රහමෙර බොනුයේ මදපමා දෙකට කරුණු වූ රහමෙර බීම් හෙතුයෙන් යම් දෘෂ්ටධාර්මික භය හා වෛර හා ප්‍රසව කෙරේ නම්, සාම්පරායික භය හා වෛර හා ප්‍රසව කෙරේ නම්, මානසික දුක්දෙම්නස් විඳුනේ නම්, මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ එ දෘෂ්ටධාර්මික භය හා වෛර හා ප්‍රසව නො කෙරෙයි සාම්පරායික භය හා වෛර හා ප්‍රසව නො කෙරෙයි. මානසික දුක්දෙම්නස් නො ම විඳුනේ ය මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූවහුට මෙ ලෙසින් එ භය හා වෛර හා සන්හිඳුනේ වේ යයි.

80. යමෙක් පණිවා කෙරේ නම්, මුසවාත් බෙණේ නම්, ලොව්හි නුදුන් දෑ ගන්නේ නම්, පරඹුන් කරා ද යේ නම්, යම් පුඟුලෙක් රහමෙර පානයත් කෙරේ නම්,

81. හේ පඤ්ච වෛරයන් ප්‍රහීණ නො කොට දුශ්ශීලයෙකැයි කියනු ලැබේ. ඒ දුෂ්ප්‍රාඥ කාබුන් මරණින් මතු නිරයට එළඹෙයි.

82. යමෙක් පණිවා නො කෙරේ ද, මුසවා නො බෙණේ ද, ලොව්හි අසිනාදන් නොගන්නේ ද, පරඹුන් කරා නො යේ ද, යම් නරයෙක් රහමෙර පානයෙහිත් නො යෙදේ ද,

83. හේ පඤ්ච වෛරයන් දුරු කොට සිල්වත් ය යි කියනු ලැබේ. කාබුන් මරණින් මතු ඒ සප්‍රාඥ තෙමේ සුගතියට පැමිණේ ය යි.

## 5. 4. 3. 5.

## [උපාසකචණ්ඩාල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

25. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍ගාගත උපාසක, උපාසක-චණ්ඩාල ද උපාසකමල ද උපාසකප්‍රතිකෘෂ්ට (උපාසක පිළිකුල) ද වෙයි. කවර පසෙකින යත්:

ශ්‍රද්ධා නැත්තේ වෙයි. දුශ්ශීල වෙයි. කොතුහලමඞ්ගලික (සුබනිමිති-බලනු) යෙක් වෙයි. කර්‍මය නො ව මඞ්ගලය අදහයි. මෙ සස්නෙන් බැහැර දක්ෂිණාර්හයකු සොයයි. එහිදු පූර්‍වකාර කෙරෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍ගාගත උපායක, උපාසකචණ්ඩාල හා උපාසකමල හා උපාසක ප්‍රතිකෘෂ්ට හා වෙයි.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍ගාගත උපාසක, උපාසකරත්න හා උපාසකපද්ම හා උපාසකපුණ්ඩරීක හා වෙයි. කවර පසෙකින යත්:

සද්ධො හොති, සීලවා හොති, අකොතුහලමඞ්ගලිකො හොති, කම්මං පච්චෙති නො මඞ්ගලං, න ඉතො බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති, ඉධ ච පුබ්බකාරං කරොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකරතනඤ්ච හොති උපාසකපදුමඤ්ච උපාසකපුණ්ඩරීකඤ්චාති.[1]

## 5. 4. 3 6.

## [පීතිසුත්තං]

### [සාවත්ථිනිදානං]

**26.** අථ ඛො **අනාථපිණ්ඩිකො ගහපති** පඤ්චමත්තෙහි උපාසකසතෙහි පරිවුතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

තුම්හෙහි ඛො ගහපති, භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතා චීවරපිණ්ඩපාත-සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. න ඛො ගහපති, තාවතකෙනෙව තුට්ඨි කරණීයා: 'මයං භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතා චීවරපිණ්ඩපාත-සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙනා'ති.

තස්මාතිහ ගහපති, එවං සික්ඛිතබ්බං: "කින්ති මයං කාලෙන කාලං පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරෙය්‍යාමා"ති. එවං හි වො ගහපති සික්ඛිතබ්බන්ති.

එවං වුත්තෙ ආයස්මා **සාරිපුත්තො** භගවන්තං එතදවොච: අච්ඡරියං භන්තෙ! අබ්භුතං භන්තෙ!! යාව සුභාසිතඤ්චිදං භන්තෙ, භගවතා:-

"තුම්හෙහි ඛො ගහපති, භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතා චීවරපිණ්ඩපාතසෙනා-සනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, න ඛො ගහපති, තාවතකෙනෙව තුට්ඨි කරණීයා: 'මයං භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතා චීවරපිණ්ඩපාතසෙනා-සනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙනා'ති. තස්මාතිහ ගහපති, එවං සික්ඛිතබ්බං: "කින්ති මයං කාලෙන කාලං පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරෙය්‍යාමා'ති. එවං හි වො ගහපති, සික්ඛිතබ්බන්ති."

යස්මිං භන්තෙ, සමයෙ අරියසාවකො පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරති, පඤ්චස්ස ඨානානි තස්මිං සමයෙ න හොන්ති:

යම්පිස්ස කාමූපසංහිතං දුක්ඛං දොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස කාමූපසංහිතං සුඛං සොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස අකුසලූපසංහිතං දුක්ඛං දොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස අකුසලූපසංහිතං සුඛං සොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස කුසලූපසංහිතං දුක්ඛං දොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති.

යස්මිං භන්තෙ, සමයෙ අරියසාවකො පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරති, ඉමානිස්ස[2] පඤ්ච ඨානානි තස්මිං සමයෙ න හොන්තීති.

---

1. උපාසකපුණ්ඩරීකො ච - PTS. 2. ඉමානි පඤ්චස්ස ඨානානි - සත්‍යා.

ශ්‍රද්ධා ඇතියේ වෙයි. සිල්වත් වෙයි. කොතුහලමඞ්ගලික නො වෙයි. මඞ්ගලය නො ව කර්මය නහමයි. මෙ සස්නෙන් බැහැර දක්ෂිණාර්හයකු නො සොයයි. මෙහිදු පූර්වකාර කරන්නේ ය.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්විත උපාසක, උපාසකරතන ද උපාසකපද්ම ද උපාසකපුණ්ඩරීක ද වේ ය යි.

## 5. 4. 3. 6.

## [පීති සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**26.** එ කල්හි **අනාථපිණ්ඩික ගෘහපති** පන්සියක් පමණ උපාසකයන් විසින් පිරිවරණ ලදුයේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් අනාථපිණ්ඩික ගෘහපතිහට භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළහ:

ගෘහපතිය, තෙපිදු සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත්-පිරිකරින් බික්සඟුන් වටනහු ය. ගෘහපතිය, එ පමණෙකින් ම තුෂ්ටිය කළමනා නො වේ: ‘අපි බික්සඟුන් සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස-බෙහෙසත්පිරිකරින් වටම්හ’ යි.

එහෙයින් ගෘහපතිය, මෙ කරුණෙහි ලා මෙසේ හික්මියයුතු යි: “කිනම් උපායෙකින් අපි කලින් කල (ප්‍රථම-ද්විතීයධ්‍යානික) ප්‍රීතිය ලබා වසමෝ දැ?”යි. ගෘහපතිය, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළකළහ:

“වහන්ස, ආශ්චර්ය්‍ය ය! වහන්ස, අද්භූත ය!! වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය සුභාෂිත ම ය: ගෘහපතිය, තෙපිදු බික්සඟුන් සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරින් වටනහු ය. ගෘහපතිය, ‘අපි චීවරපිණ්ඩපාතශයනාසනගලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයෙන් බික්සඟුන් වටම්හ’ යන එපමණෙකින් ම තුෂ්ටිය නො කළමනා ය. ගෘහපතිය, එ හෙයින් මෙ කරුණෙහි ලා මෙසෙයින් හික්මිය යුතු යි: කවර උපායෙකින් අපි කලින් කල ප්‍රවිවෙකප්‍රීතිය ලබා වාසය කරමෝ දැ? යි. ගෘහපතිය, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ”යි.

වහන්ස, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක ප්‍රවිවෙක (ප්‍රථම-ද්විතීයධ්‍යානික) ප්‍රීතිය ලබා වෙසේ නම්, එ සමයෙහි ඔහට කරුණු පසෙක් නැත:

කාමයන් ඇරැබැ උපදනා යම් දුක්දෞර්මනසෙක් වේ නම්, ඒ සමයෙහි ඔහට එ ද නැත. කාමොපසංහිත වූ යම් සුවසෞමනසෙක් වේ නම්, එ සමයෙහි ඔහට එ ද නැත. අකුශලොපසංහිත වූ යම් දුක් දෞර්මනසෙක් වේ නම්, එසමයෙහි ඔහට එ ද නැත. අකුශලොපසංහිත වූ යම් සුවසෞමනසෙක් වේ නම්, ඒ සමයෙහි ඔහට එ ද නැත. කුශලොප-සංහිත යම් දුක්දෞර්මනසෙක් වේ නම්, එ ද ඔහට එ සමයෙහි නැත.

වහන්ස, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක ප්‍රවිවෙක ප්‍රීතිය ලබා වාසය කෙරේ නම්, මෙ පස් දහම්හු එ සමයෙහි ඔහට නො වෙත් යයි.

සාධු! සාධු!! **සාරිපුත්ත**. යස්මිං සමයෙ සාරිපුත්ත, අරියසාවකො පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරති, පඤ්චස්ස ඨානානි තස්මිං සමයෙ න හොන්ති:

යම්පිස්ස කාමූපසංහිතං දුක්ඛං දොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස කාමූපසංහිතං සුඛං සොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස අකුසලූපසංහිතං දුක්ඛං දොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස අකුසලූපසංහිතං සුඛං සොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති. යම්පිස්ස කුසලූපසංහිතං දුක්ඛං දොමනස්සං, තම්පිස්ස තස්මිං සමයෙ න හොති.

යස්මිං සමයෙ සාරිපුත්ත, අරියසාවකො පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරති, ඉමානිස්ස පඤ්ච ඨානානි[1] තස්මිං සමයෙ න හොන්තීති.

## 5. 4. 3. 7.

## [වණිජ්ජාසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**27**. පඤ්චිමා භික්ඛවෙ, වණිජ්ජා උපාසකෙන අකරණීයා. කතමා පඤ්ච:

සත්ථවණිජ්ජා, සත්තවණිජ්ජා, මංසවණිජ්ජා, මජ්ජවණිජ්ජා, විසවණිජ්ජා.

ඉමා ඛො භික්ඛවෙ, පඤ්ච වණිජ්ජා උපාසකෙන අකරණීයාති.

## 5. 4. 3. 8.

## [රාජසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**28**. තං කිං මඤ්ඤථ භික්ඛවෙ? අපි නු තුම්හෙහි, දිට්ඨං වා සුතං වා: "අයං පුරිසො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොතීති,[2] තමෙනං රාජානො ගහෙත්වා පාණාතිපාතා වෙරමණීහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්ති?"ති නො හෙතං භන්තෙ. සාධු භික්ඛවෙ, මයාපි ඛො එතං භික්ඛවෙ, නෙව දිට්ඨං න සුතං: 'අයං පුරිසො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොතී'ති,[2] තමෙනං රාජානො ගහෙත්වා පාණාතිපාතා වෙරමණීහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්ති"ති.

අපි ච ඛ්වාස්ස තථෙව[3] පාපකං කම්මං පවෙදයන්ති:[4] "අයං පුරිසො ඉත්ථිං වා පුරිසං වා ජීවිතා වොරොපෙසී"ති.[5] තමෙනං රාජානො ගහෙත්වා පාණාතිපාතහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්ති. අපි නු තුම්හෙහි එවරූපං දිට්ඨං වා සුතං වාති? දිට්ඨංච නො භන්තෙ සුතඤ්ච සුයිස්සති චාති.[6]

---

1 ඉමානෙතස්ස පඤ්ච ඨානානි - සීමු, ඉමානි පඤ්චස්ස ඨානානි -සයා 2 පටිවිරතොති- මජසං; පටිවිරතො හොති - සයා; P. T. S. 3. තමෙව - මජසං, තදෙව - සයා,
4. පාපකම්මං පවෙදෙන්ති - මජසං, පාපකම්මං පවෙදෙති - සයා
5. වොරොපෙතීති - සයා, 6. සුයිස්සති චාති - මජසං.

ශාරිපුත්‍රයෙනි, මැනැවැ! මැනැවැ!! ශාරිපුත්‍රයෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක ප්‍රවිවෙකප්‍රීතිය ලබා වෙසේ නම්, ඔහට එ සමයෙහි පස් දහම් කෙනෙක් නො වෙති:

කාමොපසංහිත වූ යම් දුක්දොම්නසෙක් වේ නම්, එ සමයෙහි ඔහට එ ද නො වෙයි. කාමොපසංහිත වූ යම් සුවසොම්නසෙක් වේ නම්, ඔහට එ සමයෙහි එ ද නො වෙයි. අකුශලොපසංහිත වූ යම් දුක්දොම්නසෙක් වේ නම්, එ ද ඔහට එ සමයෙහි නො වෙයි. අකුශලොපසංහිත වූ යම් සුවසොම්නසෙක් වේ නම්, එ ද එ සමයෙහි ඔහට නො වෙයි. කුශලොප-සංහිත වූ යම් දුක්දොම්නසෙක් මේ නම්, එ සමයෙහි ඔහට එ ද නො වෙයි.

ශාරිපුත්‍රයෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක ප්‍රවිවෙක ප්‍රීතිය ලබා වෙසේ නම්, ඔහට එ සමයෙහි මේ පඤ්චකාරණයෝ නො වෙත් ය යි.

### 5. 4. 3. 7.

### [වණිජ්ජා සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**27**. මහණෙනි, උවසුහු විසින් අකරණීය (නොකටයුතු) මෙ වෙළෙ-දම් පසෙකි. කවර පසෙක යත්:

ශස්ත්‍රවාණිජ්‍ය (සත්ත්ව හිංසා පිණිස වූ අවි වෙළෙඳම) ය, සත්ත්වවාණිජ්‍ය (වහල් වෙළෙඳම) ය, මාංසවාණිජ්‍ය (මස් පිණිස සතුන් වෙළෙඳම) ය, මද්‍යවාණිජ්‍ය (මත්පැන් හා මාදක ද්‍රව්‍ය වෙළෙඳම) ය, විෂවාණිජ්‍ය (වස වෙළෙඳම) යි.

මහණෙනි, උවසුහු විසින් නො කටයුතු මේ වෙළෙඳම් පස යි.

### 5. 4. 3. 8.

### [රාජ සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**28**. මහණෙනි, එ කිමැයි හගිවු ද? "මෙ පුරිස් පණිවා හැරපියා පණිවායෙන් දුරු වූයේ වේ යයි රජහු තෙල පුහුල් ගෙණ පණිවා විරමණහෙතුයෙන් නසති හෝ බඳිති හෝ රටින් නෙරති හෝ යම් මැ රිසි දැයක් කෙරෙති හෝ යි තොප විසින් දක්නා ලද හෝ අසන ලද හෝ ඇත් දැ"? යි. වහන්ස, තෙල කරුණ නැත් මැ ය. මහණෙනි, මැනැවි, මා විසිනුදු මහණෙනි, "මේ පුරිස් පණිවා හැරපියා පණිවායෙන් වැළැකියේ වේ ය"යි රජහු තෙල පුහුල් ගෙණ පණිවායෙන් වැළැකීම් හෙතුයෙන් නසති හෝ (දඬුගෙහිලා) බඳිති හෝ රටින් නෙරති හෝ යම් මැ කැමැති දැයක් කෙරෙති හෝ" යි තෙල කරුණ නොම දක්නා ලද, නො මැ අසන ලද.

තවද ඔහු විසින් කළ ඒ පාපකර්මය "මෙ පුරුෂ තෙම ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ දිවියෙන් තොර කළැ"යි එසේ ම දන්වති. රජවරු එ පුහුල්හු අල්වාගෙණ ප්‍රාණඝාතහෙතුයෙන් නසන්නාහු හෝ බඳනාහු හෝ රටින් නෙරනාහු හෝ යම් මැ රිසි වූ දැයක් කරන්නාහු හෝ වෙති. මෙ වැන්නක් තොප විසින් දක්නා ලද විරූ හෝ අසන ලද විරූ හෝ ඇත් දැ? යි. වහන්ස, අප විසින් දක්නා ලද්දේත් අසන ලද්දේත් වෙයි, ඇසෙන්නේත් වේ ය යි.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ? අපි නු තුම්හෙහි දිට්ඨං වා සුතං වා: "අයං පුරිසො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො[1] හොතී'ති, තමෙනං රාජානො ගහෙත්වා අදින්නාදානා වෙරමණිහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්තී?"ති. නො හෙතං භන්තෙ. සාධු භික්ඛවෙ, මයාපි ඛො එතං භික්ඛවෙ, නෙව දිට්ඨං න සුතං: "අයං පුරිසො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොතී'ති තමෙනං රාජානො ගහෙත්වා අදින්නාදානා වෙරමණිහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්තී"ති.

අපි ච ඛ්වාස්ස තථෙව[2] පාපකං කම්මං පවෙදයන්ති:[3] "අයං පුරිසො ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී"ති තමෙනං රාජානො ගහෙත්වා අදින්නාදානහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්ති. අපි නු තුම්හෙහි එවරූපං දිට්ඨං වා සුතං වා?ති. දිට්ඨං ච නො භන්තෙ, සුතං ච සුයිස්සති චාති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපිනු තුම්හෙහි දිට්ඨං වා සුතං වා: "අයං පුරිසො කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොතී'ති තමෙනං රාජානො ගහෙත්වා කාමෙසු මිච්ඡාචාරා වෙරමණිහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්ති?"ති නො හෙතං භන්තෙ. සාධු භික්ඛවෙ, මයාපි ඛො එතං භික්ඛවෙ, නෙව දිට්ඨං න සුතං: "අයං පුරිසො කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොතී'ති තමෙනං රාජානො ගහෙත්වා කාමෙසු මිච්ඡාචාරා වෙරමණි හෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්තී"ති.

අපි ච ඛ්වාස්ස තථෙව පාපකං කම්මං පවෙදයන්ති:[3] "අයං පුරිසො පරිත්ථීසු පරකුමාරීසු චාරිත්තං ආපජ්ජී'ති[4]. තමෙනං රාජානො ගහෙත්වා කාමෙසු මිච්ඡාචාරහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්ති. අපි නු තුම්හෙහි එවරූපං දිට්ඨං වා සුතං වා?"ති දිට්ඨං ච නො භන්තෙ, සුතං ච සුයිස්සති චාති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු තුම්හෙහි දිට්ඨං වා සුතං වා: "අයං පුරිසො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොතී'ති තමෙනං රාජානො ගහෙත්වා මුසාවාදා වෙරමණි හෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්තී?"ති. නො හෙතං භන්තෙ. සාධු භික්ඛවෙ, මයාපි ඛො තං භික්ඛවෙ, නෙව දිට්ඨං න සුතං: "අයං පුරිසො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොතී'ති තමෙනං රාජානො ගහෙත්වා මුසාවාදා වෙරමණිහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරෙන්තී"ති.

1. පටිවිරතො - මජසං, පටිවිරතො හොති - සභා, P. T. S. 2. තමෙව - මජසං, තදෙව - සභා 3. පවෙදෙන්ති-මජසං. 4. ආපජ්ජති - සභා, ආපජ්ජතීති - සීමු.

මහණෙනි, එ කිමැයි හඟිවු ද? "මේ පුරුෂ අයිනාදන් හැරපියා අයිනාදනින් වැළැකියේ වේ ය යි තෙල පුහුල් රජහු අල්වාගෙණ අයිනාදනින් වැළකීම් හෙතුයෙන් නසා ලති හෝ බඳිති හෝ රටින් නෙරනි හෝ රිසි පරිදි හෝ යමක් මැ කෙරෙත්" ය යි තොප විසින් දක්නා ලද හෝ අසන ලද හෝ ඇත් දැ? යි. වහන්ස, තෙල නැත් ම ය. මැනැව මහණෙනි, "මේ පුරුෂයා අයිනාදන් හැරපියා අයිනාදනින් වැළැකියේ වේ ය යි රජහු තෙල පුහුල්හු අල්වාගෙණ අයිනාදනින් විරමණහෙතුයෙන් නසති හෝ බඳිති හෝ රටින් නෙරති හෝ යම් මැ කැමැති දැයක් හෝ කෙරෙතැයි" තෙල මා විසිනුදු නො ම දක්නා ලද, නො අසන ලදූ යි.

වැලිත් "මෙ පුරුෂයා ගමින් වේ ව යි වලින් වේ ව යි සොය්‍ය සඞ්ඛ්‍යාත අයින් (නුදුන් දැය) ගත්තේ ය"යි ඔහු විසින් කළ එ පාපකර්මය එ ලෙසින් ම දන්වති. රජහු ඔහු අල්වාගෙණ අයිනාදන් හෙතුයෙන් නසන්නාහ යි ද බඳනාහ යි ද රටින් නෙරනාහ යි ද යථාප්‍රත්‍යයක් කරන්නාහ යි ද යන මෙ බඳු දැයෙක් තොප විසින් දක්නා ලද හෝ අසන ලද හෝ ඇත් දැ? යි. වහන්ස, අප විසින් දක්නා ලදුයේත් අසන ලදුයේත් ඇසෙන්නේත් වේ ය යි.

මහණෙනි, එ කිමැයි හඟිවු ද? "මෙ පුරුෂයා කාමයෙහි මිසහසර හැරපියා කාමයෙහි මිසහසරින් වැළැකියේ වේ ය" යි රජහු එ පුහුල් රැගෙණ කාමයෙහි මිථ්‍යාචාරවිරමණප්‍රත්‍යයෙන් නසති හෝ බඳිති හෝ රටින් නෙරති හෝ යම් මැ කැමැති දැයක් හෝ කෙරෙති" යි යන තෙල කාරුණ තොප විසින් දක්නා ලද හෝ අසන ලද හෝ ඇත් දැ? යි. වහන්ස, තෙල නැත් ම ය. මහණෙනි, මැනැවි. මහණෙනි, "මෙ පුරුෂයා කාමයෙහි මිථ්‍යාචාරය හැරපියා කාමමිථ්‍යාචාරයෙන් වැළැකියේ වේ ය" යි. රජහු තෙල පුහුල් අල්වාගෙණ කාමමිථ්‍යාචාරවිරමණප්‍රත්‍යයෙන් නසති යි ද බඳිති යි ද රටින් නෙරති යි ද යථාප්‍රත්‍යයක් කරති" යි ද යන තෙල කාරුණ මා විසිනුදු නො ම දක්නා ලද, නො ම අසන ලද.

වැලිදු "මෙ පුරුෂයා පරඹුන් කෙරෙහි පර කුමාරීන් කෙරෙහි මිථ්‍යාචාරයට පැමිණියේ යයි එ පරිද්දෙන් ම ඔහුගේ ඒ පාපකර්මය දන්වත්. රජවරු ඔහු ගෙණ කාමයෙහි මිථ්‍යාචාරහෙතුයෙන් නසති යි හෝ කාරාගෘහයෙහි බඳනාහ යි හෝ රටින් නෙරණාහ යි හෝ කැමැති පරිදි කරන්නාහ" යි යන තෙල කරුණ තොප විසින් දක්නා ලද හෝ අසන ලද හෝ ඇත් දැ?යි. වහන්ස, අප විසින් දක්නා ලදුයේත් අසන ලදුයේත් ඇසෙන්නේත් ඇතැයි.

මහණෙනි, එ කිමැයි හඟිවු ද? "මෙ පුරුෂ මුසවා හැරපියා මුසවායෙන් වැළැකියේ වේ ය යි රජහු තෙල පුහුල් ගෙණ මුසවායෙන් විරමණප්‍රත්‍යයෙන් නසති යි හෝ බඳිති යි හෝ රටින් නෙරති යි හෝ කැමැති දැයක් හෝ කෙරෙති" යි දක්නා ලද හෝ අසන ලද හෝ ඇත් දැ?යි. වහන්ස, තෙල නැත් ම ය. මහණෙනි, මැනැවැ. මහණෙනි, තොප විසින් 'මෙ පුරුෂ මුසවාහැරපියා මුසවායෙන් වැළැකියේ වේ යයි රජහු ඔහු අල්වාගෙණ මුසවායෙන් විරමණප්‍රත්‍යයෙන් නසති යි හෝ බඳිති යි හෝ රටින් නෙරති යි හෝ කැමැති පරිදි හෝ කෙරෙත්" ය යි මා විසිනුදු නො ම දක්නා ලද, නො අසන ලදූයි.

අපි ච ඛ්වාස්ස තථෙව[1] පාපකං කම්මං පවෙදයන්ති:[2] “අයං පුරිසො ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා මුසාවාදෙන අත්ථං භඤ්ජී”ති.[3] තමෙනං රාජානො ගහෙත්වා මුසාවාදහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්ති. අපි නු තුම්හෙහි එවරූපං දිට්ඨං වා සුතං වා?ති. දිට්ඨං ච නො භන්තෙ, සුතං ච සුයිස්සති චා’ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු තුම්හෙහි දිට්ඨං වා සුතං වා: “අයං පුරිසො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොතී’ති තමෙනං රාජානො ගහෙත්වා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණීහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්තී”ති. නො හෙතං භන්තෙ. සාධු භික්ඛවෙ, මයාපි ඛො එතං භික්ඛවෙ, නෙව දිට්ඨං න සුතං: “අයං පුරිසො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොතී’ති තමෙනං රාජානො ගහෙත්වා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණීහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්තී”ති.

අපි ච ඛ්වාස්ස තථෙව[1] පාපකං කම්මං පවෙදයන්ති:[2] “අයං පුරිසො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං අනුයුත්තො ඉත්ථිං වා පුරිසං වා ජීවිතා වොරොපෙසි. අයං පුරිසො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං අනුයුත්තො ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී.[4] අයං පුරිසො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං අනුයුත්තො පරිත්ථීසු පරකුමාරීසු චාරිත්තං ආපජ්ජි.[5] අයං පුරිසො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං අනුයුත්තො ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා මුසාවාදෙන අත්ථං භඤ්ජී”ති.[3] තමෙනං රාජානො ගහෙත්වා සුරාමෙරයමජ්ජපමාදට්ඨානහෙතු හනන්ති වා බන්ධන්ති වා පබ්බාජෙන්ති වා යථාපච්චයං වා කරොන්ති. අපි නු තුම්හෙහි එවරූපං දිට්ඨං වා සුතං වා?ති. දිට්ඨං ච නො භන්තෙ, සුතං ච සුයිස්සති චා’ති.

## 5. 4. 3. 9.

## [ගිහිසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**29.** අථ ඛො **අනාථපිණ්ඩිකො ගහපති** පඤ්චමත්තෙහි උපාසකසතෙහි පරිවුතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. අථ ඛො භගවා ආයස්මන්තං **සාරිපුත්තං** ආමන්තෙසි:

1. තමෙව-මජසං, තදෙව-ස්‍යා 2. පවෙදෙන්ති - මජසං, 3. භඤ්ජතීති - සීමු, උභඤ්ජීති - මජසං, T.P.S. 4. ආදියි - මජසං, 5. ආපජ්ජති - සීමු.

වැලිදු "මෙ පුරුෂ ගෘහපතියකුගේ වේව යි ගෘහපතිපුත්‍රයකුගේ වේව යි මුසාවායෙන් අර්ථය නසන ලද්"යි ඔහුගේ එ පාපකර්මය එසේ ම දන්වත්. රජහු තෙල පුහුල් ගෙණ මුසාවාහෙතුයෙන් නසති හෝ බඳිති හෝ නෙරවති හෝ යථාප්‍රත්‍යයයක් හෝ කරති යි මෙබඳු දෑය තොප විසින් දක්නා ලද ද? අසන ලද දෑ? යි. වහන්ස, අප විසින් දක්නා ලද්දේ ද වෙයි. අසන ලද්දේ ද වෙයි. ඇසෙන්නේ ද වේ ය යි.

මහණෙනි, එ කිමැයි හඟිවු ද? "මෙ පුරුෂ මද පමා දෙකට කරුණු වූ රහමෙරපානය හැරපියා මද පමා දෙකට කරුණු වූ රහමෙරපානයෙන් වැළැකියේ යැ යි මද පමා දෙකට කරුණුවූ රහමෙරින් වැළැකීම් හෙතුයෙන් රජහු තෙල පුහුල් ගෙණ නසත් ය යි ද බඳිත් ය යි ද රටින් නෙරනාහ යි ද යථාප්‍රත්‍යයක් කරත්" ය යි ද යන තෙල කරුණ තොප විසින් දක්නා ලද ද? අසන ලද දෑ? යි. වහන්ස, තෙල කරුණ නැති මැ ය. මැනැව, මහණෙනි, "මෙ පුරුෂ මද පමා දෙකට කරුණු වූ රහමෙර හැරපියා මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වැළැකියේ වේ ය යි රජහු ඔහු ගෙණ මද පමා දෙකට කරුණු වූ රහමෙරින් විරමණය හෙතු කොට ගෙණ නසති හෝ බඳිති හෝ රටින් නෙරති හෝ යථාප්‍රත්‍යයයක් හෝ කරති" යි මහණෙනි, මා විසිනුදු තෙල නො ම දක්නා ලද. නො ම අසන ලද.

වැලිත් මෙ පුරුෂ "මද පමා දෙකට කරුණු වූ රහමෙර පිමෙහි යෙදුනේ ස්ත්‍රියක වේව යි, පුරුෂයකු වේව යි, දිවියෙන් ගැළැවී ය. මෙ පුරුෂයා මදප්‍රමාදයට කාරණ වූ රහමෙර පිමෙහි යෙදුනේ ගමින් වේව යි, වලින් වේව යි සොතය සඞ්ඛ්‍යාත වූ අයින් ගත්තේ වන. මෙ පුරුෂ මදප්‍රමාදකාරණ වූ සුරාමෙරයපානයෙහි යෙදුනේ පරඹුන් කෙරෙහි පරකුමාරීන් කෙරෙහි මිසහසරට පැමිණියේ වන. මෙ පුරුෂ මදප්‍රමාද-කාරණ වූ රහමෙර පානයෙහි නියැලියේ ගෘහපතියකුගේ වේව යි, ගෘහපතිපුත්‍රයකු වේ ව යි, මුසාවායෙන් අර්ථය බිඳී ය" යි ඔහුගේ පාපකර්ම එ ලෙසින් ම දන්වත්. මදප්‍රමාදස්ථාන සුරාමෙරය හෙතු කොට ගෙණ රජහු ඔහු අල්වාගෙණ නසත් නම් හෝ බඳිත් නම් හෝ රටින් නෙරත් නම් හෝ යථාප්‍රත්‍යයයක් කරත් නම් හෝ තොප විසින් මෙමබඳු කරුණෙක් දක්නා ලද ද? අසන ලද දෑ? යි. වහන්ස, අප විසින් දක්නා ලද්දේත් අසන ලද්දේත් ඇසෙන්නේත් වේ යැ යි.

## 5. 4. 3. 9.

## [ගිහි සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**29.** එ කල්හි **අනේපිඬු ගැහැවි** පන්සියක් පමණ උවසුවන් විසින් පිරිවරණ ලදුවැ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හිඳ. එක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් **සැරියුත් තෙරණුවන්** ඇමැතූ සේක:

යං කිඤ්චි[1] සාරිපුත්ත, ජානෙය්‍යාථ ගිහිං ඔදාතවසනං පඤ්චසු සික්ඛාපදෙසු සංවුතකම්මන්තං, චතුන්නඤ්ච[2] ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභිං අකිච්ඡලාභිං අකසිරලාභිං, සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: "ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො[3] ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො"ති.

කතමෙසු පඤ්චසු සික්ඛාපදෙසු සංවුතකම්මන්තො හොති?

ඉධ සාරිපුත්ත, අරියසාවකො පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදානා පටිවිරතො හොති. කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. මුසාවාදා පටිවිරතො හොති. සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති.

ඉමෙසු පඤ්චසු සික්ඛාපදෙසු සංවුතකම්මන්තො හොති.

කතමෙසං චතුන්නං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී?

ඉධ සාරිපුත්ත, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. අයමස්ස පඨමො ආභිචෙතසිකො දිට්ඨධම්මසුඛවිහාරො අධිගතො හොති අවිසුද්ධස්ස චිත්තස්ස විසුද්ධියා අපරියොදාතස්ස චිත්තස්ස පරියොදපනාය.

පුන ච පරං සාරිපුත්ත, අරියසාවකො ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. අයමස්ස දුතියො ආභිචෙතසිකො දිට්ඨධම්මසුඛවිහාරො අධිගතො හොති අවිසුද්ධස්ස චිත්තස්ස විසුද්ධියා අපරියොදාතස්ස චිත්තස්ස පරියොදපනාය.

පුන චපරං සාරිපුත්ත, අරියසාවකො සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. අයමස්ස තතියො ආභිචෙතසිකො දිට්ඨධම්මසුඛවිහාරො අධිගතො හොති අවිසුද්ධස්ස චිත්තස්ස විසුද්ධියා අපරියොදාතස්ස චිත්තස්ස පරියොදපනාය.

---

1 යං කඤ්චි - මජසං, ස්‍යා  2. චතුන්නං - මජසං  3. ඛීණතිරච්ඡානයොනි - මජසං.

ශාරිපුත්‍රයෙනි, සුදුවත් හඳනා (පඤ්චශික්ෂාපදයෙහි) සංවෘතක්‍රියා ඇති යම් කිසි ගිහියකු ඉහාත්මයෙහි සුඛවිහරණ ඇති විශුද්ධචිත්තය ඇසුරු කළ සතර ධර්මයන් කැමැතිසේ ලබනුවහු නිදුකින් ලබනුවහු විපුල කොට ලබනුවහු දනිවූ ද? හෙතෙම කැමැති වනුයේ "ක්ෂයකළ නිරය (නිරයගාමිකර්ම) ඇතියෙම් වෙමි. ක්ෂය කළ තිරිසන් යොන් ඇතියෙම් වෙමි. ක්ෂය කළ ප්‍රෙතවිෂය ඇතියෙම් වෙමි. ක්ෂීණ වූ අපාය දුර්ගති විනිපාත ඇතියෙම් වෙමි. අපායට නොවැටෙන සැහැවි ඇතියෙම් මාර්ගනියාමයෙන් නියතයෙම්, සම්බෝධිය (අර්හත්ත්වය) පරායණ කොට ඇතියෙම්, සෝවන් වෙමි" යි තෙමේ ම තමා පාළ කරන්නේ ය.

කවර (පඤ්චශික්ෂාපදයෙක්හි) සංවෘත ක්‍රියා ඇතියේ වේ ය යත්:

ශාරිපුත්‍රයෙනි, මෙ සස්නෙහි ආර්යශ්‍රාවක ප්‍රාණිවධයෙන් වැළැකියේ වෙයි. අයිනාදනින් වැළැකියේ වෙයි. කාමයෙහි මිසහසරින් වැළැකියේ වෙයි. මුසවායෙන් වැළැකියේ වෙයි. මදයට ප්‍රමාදයට කරුණු වූ රහමෙරින් වැළැකියේ වෙයි

මෙ පඤ්චශික්ෂාපදයෙහි සංවෘතකර්ම ඇතියේ වෙයි.

ආභිචෛතසික වූ ඉහාත්මයෙහි සුඛවිහරණ ඇති කවර දහම් කැමැති සෙයින් ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල කොට ලබනුයේ වේ ය යත්:

ශාරිපුත්‍රයෙනි, මෙ සස්නෙහි ආර්යශ්‍රාවක "මෙ මෙ කරුණිනුදු ඒ භාග්‍යවත්හු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිද්හ, අනුත්තර පුරුෂදම්‍යසාරථියහ, දෙව්මිනිස්නට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ"යි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් විශුද්ධ නො වූ චිත්තයාගේ ශුද්ධිය සඳහා පර්‍ය්‍යවදාත නො වූ චිත්තයාගේ පර්‍ය්‍යවදානය සඳහා මෙ ප්‍රථම උත්තමචිත්තය ඇසුරුකළ දෘෂ්ටධර්මසුඛවිහාරය අධිගත වෙයි.

තවද ශාරිපුත්‍රයෙනි, ආර්යශ්‍රාවක "භාග්‍යවතුන් වහන්සේ විසින් සපර්‍ය්‍යාප්තික නවලොකොත්තරධර්මය ස්වාඛ්‍යාතය, ලොකොත්තරධර්මය සාංදෘෂ්ටිකය, අකාලිකය, එහිපස්සිකය, උපනයනාර්හය, විඥයන් විසින් තමන් කෙරෙහි ලා වෙදිතව්‍යය"යි ධර්මයෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් අවිශුද්ධ චිත්තයාගේ ශුද්ධිය සඳහා අපර්‍ය්‍යවදාත චිත්තයාගේ පර්‍ය්‍යවදානය සඳහා මෙ දෙ වන ආභිචෛතසික දෘෂ්ටධර්මසුඛවිහාරය අධිගත වෙයි.

තවද ශාරිපුත්‍රයෙනි, අරිසවු "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා සුපිළිපන් ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා සෘජුමාර්ගයට පිළිපන්නේ ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා න්‍යාය (අර්හත්වය පිණිස) ප්‍රතිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා අනුරූප ප්‍රතිපත්තියට පිළිපන්නේ ය. ඔහු කවරහ යත්: පුරුෂයුගම (මාර්ගස්ථ ඵලස්ථ විසින්) සතරක් වන අෂ්ට පුරුෂපුද්ගලයෝ ය. භාග්‍යවතුන් වහන්සේගේ තෙල ශ්‍රාවකසඞ්ඝයා ආහුනෙය්‍ය වෙයි, පාහුනෙය්‍ය වෙයි, දක්ඛිණෙය්‍ය වෙයි, අඤ්ජලිකරණීය වෙයි, ලොකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වේ"යයි අෂ්ටාර්යපුද්ගල සඞ්ඝයා කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් අවිශුද්ධ චිත්තයාගේ විශුද්ධිය සඳහා අපර්‍ය්‍යවදාත චිත්තයාගේ පර්‍ය්‍යවදානය සඳහා මේ තුන් වන ආභිචෛතසික දෘෂ්ටධර්මසුඛවිහාරය අධිගත වෙයි.

පුන ච පරං සාරිපුත්ත, අරියසාවකො අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි. අයමස්ස චතුත්ථො ආභිචෙතසිකො දිට්ඨධම්මසුඛවිහාරො අධිගතො හොති අවිසුද්ධස්ස චිත්තස්ස විසුද්ධියා අපරියොදාතස්ස චිත්තස්ස පරියොදපනාය.

ඉමෙසං චතුන්නං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී.

යං කිඤ්චි[1] සාරිපුත්ත, ජානෙය්‍යාථ ගිහිං ඔදාතවසනං ඉමෙසු පඤ්චසු සික්ඛාපදෙසු සංවුතකම්මන්තං, ඉමෙසඤ්ච චතුන්නං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභිං අකිච්ඡලාභිං අකසිරලාභිං, සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය: ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො[2] ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

84. නිරයෙසු භයං දිස්වා පාපානි පරිවජ්ජයෙ,
අරියධම්මං සමාදාය පණ්ඩිතො පරිවජ්ජයෙ.

85. න හිංසෙ පාණභූතානි විජ්ජමානෙ පරක්කමෙ,
මුසා ච න භණෙ ජානං අදින්නං න පරාමසෙ.

86. සෙහි දාරෙහි සන්තුට්ඨො පරදාරං ච නාරමෙ[3]
මෙරයං වාරුණිං ජන්තු න පිවෙ චිත්තමොහනිං.

87. අනුස්සරෙය්‍ය සම්බුද්ධං ධම්මං චානුවිතක්කයෙ,
අව්‍යාපජ්ඣං හිතං චිත්තං දෙවලොකාය භාවයෙ.

88. උපට්ඨිතෙ දෙය්‍යධම්මෙ පුඤ්ඤත්ථස්ස ජිගිංසතො,[4]
සන්තෙසු පඨමං දින්නා විපුලා හොති දක්ඛිණා.

89. සන්තො හවෙ පවක්ඛාමි, සාරිපුත්ත, සුණොහි මෙ,
ඉති කණ්හාසු සෙතාසු රොහිණීසු හරීසු වා.

90. කම්මාසාසු සරූපාසු ගොසු පාරෙවතාසු වා.
යාසු කාසු ච එතාසු දන්තො ජායති පුඞ්ගවො.

91. ධොරය්හො බලසම්පන්නො කල්‍යාණජවනික්කමො,
තමෙව භාරෙ යුඤ්ජන්ති නාස්සවණ්ණං පරික්ඛරෙ.

---

1. යං කඤ්චි - මජසං, 2. ඛීණතිරච්ඡානයොනි - මජසං, 3. ආරමෙ - මජසං,
4. ජිගීසතො - මජසං.

තවද ශාරිපුත්‍රයෙනි, අරිසවූ ආර්‍යකාන්ත වූ අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අශබල වූ අකල්මාෂ වූ තෘෂ්ණාදාසව්‍යයෙන් මිදුනු විඥයන් විසින් පසස්නා ලද තෘෂ්ණාමානදෘෂ්ටියෙන් පරාමෘෂ්ට නො වූ චිත්තසමාධිය උපදවන ශීලයෙන් සමන්විතගත වෙයි. ඔහු විසින් අවිශුද්ධ චිත්තයාගේ විශුද්ධිය සඳහා අපර්‍යවදාත චිත්තයාගේ පර්‍යවදානය සඳහා මෙ සතර වන ආභිචෙතසික වූ දෘෂ්ටධර්මසුඛවිහාරය අධිගත වෙයි.

මෙසේ ආර්‍යශ්‍රාවක තෙම මේ ආභිචෙතසික දෘෂ්ටධර්මසුඛවිහාර සතර කැමැති සෙයින් ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල සෙයින් ලබනුයේ වෙයි.

ශාරිපුත්‍රයෙනි, මේ පඤ්චශික්ෂාපදයෙහි සංවෘතකර්මාන්ත ඇති, මෙ ආභිචෙතසික දෘෂ්ටධර්මසුඛවිහාරයන් සතර කැමැති සෙයින් ලබන නිදුකින් ලබන විපුල කොට ලබන ගෙළපිලී හදනා යම් මැ ගිහියකු දනිවූ ද? හේ කැමැති වන්නේ නම්, ක්ෂීණනිරය ඇතියෙම් වෙමි, ක්ෂීණ තිරශ්චීනයොනි ඇතියෙම් වෙමි, ක්ෂීණ ප්‍රෙතවිෂය ඇතියෙම් වෙමි, ක්ෂීණාපායදුර්ගති-විනිපාත ඇතියෙම් වෙමි, සොවන් වෙමි, විනිපාත ධර්ම නැතියෙම් නියතයෙම් සම්බොධිපරායන වෙමි”යි තෙමේ ම තමා පාළ කරන්නේ යි.

84. නුවණැතියේ නිරයෙහි භය දක පව් හැරලන්නේය. ආර්‍යධර්මය (පඤ්චශීලය) සමාදන් කොට ගෙණ පව් දුරු ලන්නේ ය.

85. වීර්‍ය ඇති කල්හි (දන දන) ප්‍රාණීන් නො පෙළන්නේ ය. දනැ දනැ මුසවාත් නො කියන්නේ ය. නුදුන් දෑ ද නො පහස්නේ ය.

86. සිය අඹුන් හා සමග තුටු වන්නේ පරඹුන් කෙරෙහි නො ඇලෙන්නේ ය. පුරුෂ තෙමේ සිත මුළා කරණ රහමෙර නො ම බොන්නේ ය.

87. සම්බුදුන් සිහිකරන්නේ ය. නවලොකොත්තරධර්මය ද අනුස්මෘති වශයෙන් අනුවිතර්කණය කරන්නේ ය. දෙව්ලොවැ (-බඹලොව) උපත් සඳහා නිදුක් වූ හිත වූ (බ්‍රහමවිහාර) සිත වඩන්නේ ය.

88. පුණ්‍යාර්ථී වූ පුණ්‍යගවෙෂකයාහට දෙයධර්මය ඇති කල්හි පළමු කොට බුදුපසේබුදුමහරහතුන් කෙරෙහි දෙන ලද, දක්ෂිණා තොමෝ විපුල (ඵල ඇත්තී) වෙයි.

89-91. ශාරිපුත්‍රයෙනි, සත්පුරුෂයන් නියම කොට පවසමි. මාගේ භාෂිතය අසව. කළුපැහැ ඇති වේව යි, සුදු වේවයි, රතු වේව යි, රන්වන් වේව යි, කල්මාෂ (ලප) සහිත වේව යි, සමානරූප ඇති වේව යි, පරෙවි-පැහැති වේව යි, මෙසේ තෙල යම් කිසි ගවයන් කෙරෙහි ධුරවහනයට සමත් බලසම්පන්න දැමුනු කල්‍යාණ ජව හා වීර්‍ය ඇති පුඞ්ගවයෙක් උපදනේ වේ නම්, ඔහු ම ධුරයෙහි යොදත්. ඔහුගේ වර්ණය නො පිරික්සත් (නො සලකත්.)

92. එවමෙව මනුස්සෙසු යස්මිං කස්මිඤ්චි[1] ජාතියෙ,
ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ සුද්දෙ චණ්ඩාලපුක්කුසෙ.

93. යාසු කාසු ච[2] එතාසු දන්තො ජායති සුබ්බතො,
ධම්මට්ඨො සීලසම්පන්නො සච්චවාදී හිරීමනො.

94. පහීනජාතිමරණො බ්‍රහ්මචරියස්ස කෙවලී,
පන්නභාරො විසංයුත්තො කතකිච්චො අනාසවො.

95. පාරගූ සබ්බධම්මානං අනුපාදාය නිබ්බුතො,
තස්මිං ච විරජෙ ඛෙත්තෙ විපුලා හොති දක්ඛිණා.

96. බාලා ච[3] අවිජානන්තා දුම්මෙධා අස්සුතාවිනො,
බහිද්ධා දෙන්ති[4] දානානි න හි සන්තෙ උපාසරෙ.

97. යෙ ච සන්තෙ උපාසෙන්ති[5] සප්පඤ්ඤෙ ධීරසම්මතෙ,
සද්ධා ච නෙසං සුගතෙ මූලජාතා පතිට්ඨිතා.

98. දෙවලොකං ච තෙ යන්ති කුලෙ වා ඉධ ජායරෙ,
අනුපුබ්බෙන නිබ්බානං අධිගච්ඡන්ති පණ්ඩිතාති.

## 5. 4. 3 10.

### [ගවෙසීසුත්තං]

**30.** එකං සමයං භගවා **කොසලෙසු** චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. අද්දසා ඛො භගවා අද්ධානමග්ගපටිපන්නො අඤ්ඤතරස්මිං පදෙසෙ මහන්තං සාලවනං. දිස්වා මග්ගා ඔක්කම්ම යෙන තං සාලවනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං සාලවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං පදෙසෙ සිතං පාත්වාකාසි.

අථ ඛො ආයස්මතො **ආනන්දස්ස** එතදහොසි: "කො නු ඛො හෙතු කො පච්චයො භගවතො සිතස්ස පාතුකම්මාය? න අකාරණෙන තථාගතා සිතං පාතුකරොන්ති"ති.

අථ ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො භගවතො සිතස්ස පාතුකම්මාය? න අකාරණෙන තථාගතා සිතං පාතුකරොන්ති"ති.

භූතපුබ්බං ආනන්ද, ඉමස්මිං පදෙසෙ නගරං අහොසි ඉද්ධඤ්චෙව ඵීතඤ්ච බහුජනං ආකිණ්ණමනුස්සං. තං ඛො පන ආනන්ද, නගරං **කස්සපො** භගවා අරහං සම්මාසම්බුද්ධො උපනිස්සාය විහාසි.

කස්සපස්ස ඛො පන ආනන්ද, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස **ගවෙසී** නාම උපාසකො අහොසි සීලෙසු අපරිපූරකාරී. ගවෙසිනා ඛො ආනන්ද, උපාසකෙන පඤ්චමත්තානි උපාසකසතානි පටිදෙසිතානි සමාදපිතානි අහෙසුං සීලෙසු අපරිපූරකාරිනො.

---
1. කිස්මිඤ්චි - මජසං, 2. යාසු කාසුචි - මජසං 3 බාලා ච - මජසං.
4. දදන්ති - මජසං. උපාසන්ති - මජසං.

92 – 95 එ පරිද්දෙන් ම මනුෂ්‍යයන් කෙරෙහි ක්‍ෂත්‍රියකුලයෙහි වේව යි, බ්‍රාහමණකුලයෙහි වේව යි, වෛශ්‍යකුලයෙහි වේවයි, ශුද්‍රකුලයෙහි වේව යි, සැඩොල් පුප්කුසකුලෙහි වේව යි, මෙබඳු යම් කිසි තෙල කුලන් අතුරෙහි වූ කිසි යම් ජාතියෙක්හි උපන් දැමුනාවූ මනා ව්‍රත ඇති ධර්මිෂ්ඨ වූ සත්‍යවාදී වූ ලජ්ජායෙන් යුත් සිත් ඇති ප්‍රහීණ වූ පුනර් ජාතිමරණ ඇති බ්‍රහමචර්‍ය්‍යය පිළිබඳ සකලගුණයෙන් යුත් දුරු කළ කෙලෙස්බර ඇති සංයොගරහිත වූ සිවුමඟින් කළ කිස ඇති ආස්‍රව රහිත වූ සර්‍වධර්‍මයන්ගේ පරතෙර පත් උපාදන විසින් නො ගෙණ කෙලෙස් පිරිනිවනින් පිරිනිවි-යෙක් වේ ද, කෙලෙස්රජස් නැති ඒ (ක්‍ෂීණාස්‍රව පුද්ගල සඞ්ඛ්‍යාත) පුණ්‍යක්‍ෂෙත්‍රයෙහි දෙන ලද දක්‍ෂිණා තොමෝ (ඵලයෙන්) විපුල වෙයි.

96. කාරණාකාරණ නො දන්නා තත්වැසි නුවණ නැති අශ්‍රැතවත් බාලයෝ ම බුදුසස්නෙන් පිටත්හි (විපුල ඵල ඇතැයි) දන් දෙත්. සත්පුරුෂයන් නො ම ඇසුරු කෙරෙත්.

97. යම් කෙනෙක් සප්‍රාඥ වූ ධීර ය යි සම්මත වූ සත්පුරුෂයන් උපාසනය (ආශ්‍රය) කෙරෙත් ද, ඔවුන්ගේ ශ්‍රද්ධාව ද සුගතයන් වහන්සේ කෙරෙහි හටගත් මුල් ඇතිව පිහිටියා වෙයි ද,

98. ඔහු දෙව්ලොව ද යෙති. මෙ මිනිසත්හි උතුම් කුලයෙක හෝ උපදනාහ. එ පණ්ඩිතයෝ අනුපිළිවෙළින් නිවන අවබොධ කෙරෙත් ය යි.

## 5. 4. 3. 10.

## [ගවෙසී සූත්‍රය]

**30.** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහ බික්සඟන හා සමඟ **කොසොල්දනව්යෙහි** සැරිසරණසේක. දීඝීමාර්ගයට පිළිපන් භාග්‍යවතුන් වහන්සේ අන්‍යතර ප්‍රදෙශයෙක්හි මහසල්වනයක් දුටු සේක. දැක මාර්ගයෙන් ඉවත්ව එ සල්වන කරා වැඩි සේක. වැඩ එ සල්වනයට පිවිස එක් පියසෙක වැඩසිට සිනා පාළ කළ සේක.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවනට තෙල සිත් විය: 'භාග්‍යවතුන් වහන්සේගේ සිනා පාළ කිරීමට හෙතු කවර! ප්‍රත්‍යය කවර'! තථාගතයෝ නො කරුණෙන් සිනා පාළ නො කෙරෙත් ය' යි.

එක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ: 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ සිනා පාළ කිරීමට හෙතු කවරේ ය? ප්‍රත්‍යය කවර්රේ යැ? තථාගතයෝ නො කරුණෙහි සිනා පාළ නො කෙරෙති' යි.

ආනන්දයෙනි, පෙර මෙ පියෙස්හි සමෘද්ධ වූ සැපත් පිරුණු බොහෝ දනන් ඇති ගැවසීගත් මිනිසුන් ඇති නුවරෙක් විය. ආනන්දයෙනි, අතීත් සම්‍යක්සම්බුද්ධ වූ **කාශ්‍යප** භාග්‍යවතුන් වහන්සේ එ නුවර නිසා විසූහ.

ආනන්දයෙනි, අතීත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන්-වහන්සේට, ශීලයෙහි අපරිපූරකාරී වූ **ගවෙසී** නම් උපසකයෙක් විය. අනන්දයෙනි, ගවෙසී උවසුවහු විසින් පන්සියයක් පමණ උවසුවෝ (උපාසකත්වයට) පිළිණ කරවන ලද්දුහු සමාදන් කරවන ලද්දුහු ශීලයෙහි අපරිපූරකාරී වූහ.

අථ ඛො ආනන්ද ගවෙසිස්ස උපාසකස්ස එතදහොසි: "අහං ඛො ඉමෙසං පඤ්චන්නං උපාසකසතානං බහුකාරො[1] පුබ්බඞ්ගමො සමාදපෙතා. අහඤ්චම්හි සීලෙසු අපරිපූරකාරී. ඉමානි ච පඤ්ච උපාසකසතානි සීලෙසු අපරිපූරකාරිනො. ඉච්චෙතං සමසමං, නත්ථි කිඤ්චි අතිරෙකං. හන්දාහං අතිරෙකායා"ති.

අථ ඛො ආනන්ද, ගවෙසී උපාසකො යෙන තානි පඤ්චඋපාසකසතානි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තානි පඤ්චඋපාසකසතානි එතදවොච: "අජ්ජතග්ගෙ මං ආයස්මන්තො සීලෙසු පරිපූරකාරිං ධාරෙථා"ති. (1)

අථ ඛො ආනන්ද, තෙසං පඤ්චන්නං උපාසකසතානං එතදහොසි: "අය්යො ඛො ගවෙසී අම්හාකං බහුකාරො පුබ්බඞ්ගමො සමාදපෙතා, අය්යො හි නාම ගවෙසී සීලෙසු පරිපූරකාරී භවිස්සති. කිමඞ්ග[2] පන න මයං"ති.

අථ ඛො ආනන්ද, තානි පඤ්චඋපාසකසතානි යෙන ගවෙසී උපාසකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ගවෙසිං උපාසකං එතදවොචුං: "අජ්ජතග්ගෙ අය්යො ගවෙසී, ඉමානි[3] පඤ්චඋපාසකසතානි සීලෙසු පරිපූරකාරිනො ධාරෙතූ"ති.

අථ ඛො ආනන්ද, ගවෙසිස්ස උපාසකස්ස එතදහොසි: "අහං ඛො ඉමෙසං පඤ්චන්නං උපාසකසතානං බහුකාරො පුබ්බඞ්ගමො සමාදපෙතා. අහඤ්චම්හි සීලෙසු පරිපූරකාරී. ඉමානි ච[3] පඤ්චඋපාසකසතානි සීලෙසු පරිපූරකාරිනො. ඉච්චෙතං සමසමං, නත්ථි කිඤ්චි අතිරෙකං. හන්දාහං අතිරෙකායා"ති.

අථ ඛො ආනන්ද, ගවෙසී උපාසකො යෙන තානි පඤ්චඋපාසකසතානි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තානි පඤ්චඋපාසකසතානි එතදවොච: "අජ්ජතග්ගෙ මං ආයස්මන්තො බ්‍රහ්මචාරිං ධාරෙථ ආරාචාරිං[4] විරතං මෙථුනා ගාමධම්මා"ති. (2)

අථ ඛො ආනන්ද, තෙසං පඤ්චන්නං උපාසකසතානං එතදහොසි: "අය්යො ඛො ගවෙසී අම්හාකං බහුකාරො පුබ්බඞ්ගමො සමාදපෙතා. අය්යො හි නාම ගවෙසී බ්‍රහ්මචාරී භවිස්සති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. කිමඞ්ග[2] පන න මයන්ති."

අථ ඛො ආනන්ද, තානි පඤ්චඋපාසකසතානි යෙන ගවෙසී උපාසකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ගවෙසිං උපාසකං එතදවොචුං: "අජ්ජතග්ගෙ අය්යො ගවෙසී ඉමානි පඤ්ච උපාසකසතානි බ්‍රහ්මචාරිනො ධාරෙතු ආරාචාරිනො විරතා මෙථුනා ගාමධම්මා"ති.

අථ ඛො ආනන්ද, ගවෙසිස්ස උපාසකස්ස එතදහොසි: "අහං ඛො ඉමෙසං පඤ්චන්නං උපාසකසතානං බහුකාරො පුබ්බඞ්ගමො සමාදපෙතා. අහඤ්චම්හි සීලෙසු පරිපූරකාරී. ඉමානිච පඤ්චඋපාසකසතානි සීලෙසු පරිපූරකාරිනො. අහඤ්චම්හි බ්‍රහ්මචාරී ආරාචාරී විරතො මෙථුනා ගාම ධම්මා. ඉමානි ච පඤ්ච උපාසකසතානි බ්‍රහ්මචාරිනො ආරාචාරිනො විරතා මෙථුනා ගාමධම්මා. ඉච්චෙතං සමසමං, නත්ථි කිඤ්චි අතිරෙකං. හන්දාහං අතිරෙකායා'ති.

---

1. බහූපකාරො - මජසං, 2. කිමඞ්ගං - මජසං, 3. ඉමානිපි - මජසං,
4. අනාචාරී - PTS.

ආනන්දයෙනි, එක්බිති, ගවෙසී උපාසකයාහට තෙල සිත් විය: "මම් වනාහි මේ පන්සියක් උවසුවනට බහුකාරයෙමි, පූර්වඞ්ගමයෙමි, සමාදන් කරවන්නෙම් වෙමි. මම ද ශීලයෙහි අපරිපූරකාරීයෙමි. මේ පන්සියක් උවසුවෝ ද ශීලයෙහි අපරිපූරකාරි වෙති. මෙසෙයින් තෙල කරුණ සමසම වෙයි. කිසිදු අතිරෙකයෙක් නැත. මම් අතිරේකයක් සඳහා යතන කොරෙම් නම්, මැනැවැ"යි.

ආනන්දයෙනි, ඉක්බිති ගවෙසී උපාසක එ පන්සියක් උවසුවන් කරා එළැඹියේ ය. එළඹ එ පන්සියක් උවසුවනට තෙල කීය: "ආයුෂමත්නි, අදින් මතු මා ශීලයෙහි පරිපුරකාරියකු කොට ධරවු"යි.

ඉක්බිති ආනන්දයෙනි, එ පන්සියක් උවසුවනට තෙල සිත් විය: ආයසී ගවෙසී අපට බහුකාර ය, පූර්වඞ්ගමය, සමාදන් කරවන්නේ ය. ආයසී ගවෙසී වනාහි ශීලයෙහි පරිපුරකාරි වන්නේ ය. කවර කරුණෙන් අපි එසේ නො වමෝ දෑ?"යි.

ඉක්බිති ආනන්දයෙනි, එ පන්සියක් උවසුවෝ ගවෙසී උපාසකයා කරා එළඹියහ. එළඹ ගවෙසී උවසුහට තෙල කීහ: "අද පටන් කොට ආයසී ගවෙසී තෙමේ මෙ පන්සියක් උවසුවන් ශීලයෙහි පරිපූරකාරීන් කොට ධරාඞා"යි.

ආනන්දයෙනි, එ කල්හි ගවෙසී උපාසකයාහට තෙල සිත් විය: 'මම වනාහි මෙ පන්සියක් උවසුවනට බහුකාරයෙමි, පූර්වඞ්ගමයෙමි, සමාදන් කරවන්නෙමි. මම ද ශීලයෙහි පරිපූරකාරී වෙමි. මෙ පන්සික් උවසුවෝ ද ශීලයෙහි පරිපූරකාරී වෙති. මෙසේ තෙල කරුණ සමසම වෙයි. කිසි අතිරෙකයෙක් නැත. මම අතිරේකයක් සඳහා යතන කොරෙම් නම්, මැනැවැ'යි.

ආනන්දයෙනි, ඉක්බිති ගවෙසී උවසු එ පන්සියක් උවසුවන් කරා එළැඹියේ ය. එළඹ එ පන්සියක් උවසුවනට තෙල කී ය: "ආයුෂමත්හු මා අද පටන් කොට ගැමිදහම් වූ මෛථුනයෙන් වෙන්ව හැසිරෙන අබ්‍රම්සරින් දුරු වූ බඹසර ඇතියකු කොට ධරව"යි.

එක්බිති ආනන්දයෙනි, ඒ පන්සියක් උවසුවනට තෙල අදහස විය: "ආයසී ගවෙසී වනාහි අපට බහුකාර වෙයි, පූර්වඞ්ගම වෙයි, සමාදන් කරවන්නේ වෙයි. ආයසී ගවෙසී ග්‍රාමධර්ම වූ මෛථුනයෙන් වැළැකියේ අබ්‍රම්සරින් දුරු වූයේ බඹසරවස් ඇති වෙයි. අපි දු කවර හෙයින් එසේ නො වමෝ දෑ? යි.

ආනන්දයෙනි, එක්බිති ඒ පන්සියක් උවසුවෝ ගවෙසී උපාසක කරා එළඹියහ. එළැඹ ගවෙසී උවසුහට තෙල සැලකළහ: "අද පටන් කොට ආයසී ගවෙසී මෙ පන්සියක් උවසුවන් ග්‍රාමධර්ම සඞ්ඛ්‍යාත මෛථුනයෙන් විරත වූ අබ්‍රම්සරින් දුරු වූ බ්‍රහමචාරීන් කොට ධරාවා"යි.

ආනන්දයෙනි, ඉක්බිති ගවෙසී උවසුහට තෙල සිත් විය: "මම වනාහි මෙ පන්සියක් උපාසකයනට බහුකාරයෙමි, පූර්වඞ්ගමයෙමි, සමාදන් කරවන්නෙම් වෙමි. මම ද ශීලයෙහි පරිපූරකාරීයෙමි. මෙ පන්සියක් උපාකයෝ ද ශීලයෙහි පරිපූරකාරී වෙත්. මමත් ග්‍රාමධර්ම සඞ්ඛ්‍යාත මෛථුන්දම්න් වෙන් වූයෙම් අබ්‍රම්සරින් දුරු වූයෙම් බ්‍රහමචාරී වෙමි. මෙ පන්සියක් උවසුවෝ ද ග්‍රාමධර්ම නම් වූ මෛථුනයෙන් වෙන් වූවාහු අබ්‍රම්සරින් දුරු වූවාහු බ්‍රහමචාරී වෙත්. මෙ සෙයින් තෙල කරුණ සමසම වෙයි. කිසි අතිරෙකයෙක් නැත. මම අතිරෙක ගුණයක් සඳහා වෙහෙසෙම් නම්, මැනැවැ" යි.

අථ ඛො ආනන්ද, ගවෙසී උපාසකො යෙන තානි පඤ්ච උපාසකසතානි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තානි පඤ්ච උපාසකසතානි එතදවොච: ‘‘අජ්ජතග්ගෙ මං ආයස්මන්තො එකභත්තිකං ධාරෙථ රත්තූපරතං විරතං විකාලභොජනා’ති. (3)

අථ ඛො ආනන්ද, තෙසං පඤ්චන්නං උපාසකසතානං එතදහොසි: ‘‘අයං ඛො ගවෙසී අම්හාකං බහුකාරො පුබ්බඞ්ගමො සමාදපෙතා. අයං හි නාම ගවෙසී එකභත්තිකො භවිස්සති රත්තූපරතො විරතො විකාලභොජනා. කිමඞ්ග[2] පන න මයං’’ති.

අථ ඛො ආනන්ද, තානි පඤ්ච උපාසකසතානි යෙන ගවෙසී උපාසකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ගවෙසිං උපාසකං එතදවොචුං: ‘‘අජ්ජතග්ගෙ අයං ගවෙසී ඉමානි පඤ්චඋපාසකසතානි එකභත්තිකෙ ධාරෙතු රත්තූපරතෙ විරතෙ විකලභොජනා’’ති.

අථ ඛො ආනන්ද, ගවෙසිස්ස උපාසකස්ස එතදහොසි. ‘‘අහං ඛො ඉමෙසං පඤ්චන්නං උපාසකසතානං බහුකාරො[1] පුබ්බඞ්ගමො සමාදපෙතා. අහඤ්චම්හි සීලෙසු පරිපූරකාරී. ඉමානි ච පඤ්ච උපාසකසතානි සීලෙසු පරිපූරකාරිනො. අහඤ්චම්හි බ්‍රහ්මචාරී ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. ඉමානි ච පඤ්ච උපාසකසතානි බ්‍රහ්මචාරිනො ආරාචාරිනො විරතා මෙථුනා ගාමධම්මා. අහඤ්චම්හි එකභත්තිකො රත්තූපරතො විරතො විකාලභොජනා. ඉමානි ච පඤ්චඋපාසකසතානි එකභත්තිකා රත්තූපරතා විරතා විකාල-භොජනා. (3) ඉච්චෙතං සමසමං, නත්ථි කිඤ්චි අතිරෙකං. හන්දහං අතිරෙකායා’’ති.

අථ ඛො ආනන්ද, ගවෙසී උපාසකො යෙන කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: ‘‘ලභෙය්‍යාහං භන්තෙ, භගවතො, සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යං උපසම්පදං’’ති.

අලත්ථ ඛො ආනන්ද, ගවෙසී උපාසකො කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ පබ්බජ්ජං (4) අලත්ථ උපසම්පදං. (5)

අචිරූපසම්පන්නො ඛො පන ආනන්ද, ගවෙසී භික්ඛු එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ‘‘ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා’’ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පන ආනන්ද, ගවෙසී භික්ඛු අරහතං අහොසි.

---

1 බහුපකාරො - මජ්ඣං, 2. කිමඞ්ගං - මජ්ඣං.

ආනන්දයෙනි, එක්බිති ගවෙසී උපාසක එ පන්සියක් උපාසකයන් කරා එළැඹියේ ය. එළැඹ එ පන්සියක් උපාසකයනට මෙල කාරුණ කී ය: "ආයුෂ්මත්හු, අදින් මතු රාත්‍රිභොජනයෙන් වැළැකි, විකාල-භොජනයෙන් විරත වූ එකභත්තිකයකු කොට මා ධරන්වා"යි.

ආනන්දයෙනි, එක්බිති ඒ පන්සියක් උපාසකයනට මෙල සිත් විය: "ආර්‍ය්‍ය ගවෙසී අපට බහුකාර වෙයි, පූර්‍වඞ්ගම වෙයි, සමාදන් කරවන්නේ වෙයි. ආර්‍ය්‍ය ගවෙසී රාත්‍රිභොජනයෙන් වැළැකියේ විකාලභොජනයෙන් විරත වූයේ එකභත්තික වෙයි. කවර හෙයින් අපි (එබඳු) නො වමෝ-දැ" යි.

ආනන්දයෙනි, එක්බිති එ පන්සියක් උපාසකයෝ ගවෙසී උපාසකයන් කරා එළැඹියහ. එළැඹ ගවෙසී උවසුහට මෙල කාරුණ සැලකළහ: "ආර්‍ය්‍ය ගවෙසීනි, අද පටන් කොට මෙ පන්සියක් උවසුවන් රාත්‍රි භොජනයෙන් වැළැකියවුන්, විකාලභොජනයෙන් විරත වූවන් කොට ධරුවා"යි.

ආනන්දයෙනි, එක්බිති ගවෙසී උපාසකයාහට මෙල සිත් වීය: "මම වනාහි මෙ පන්සියක් උවසුවනට බහුකාරයෙමි, පූර්‍වඞ්ගමයෙමි, සමාදන්-කරවන්නෙම් වෙමි. මම ද ශීලයෙහි පරිපූරකාරී වෙමි. මෙ පන්සියක් උපාසකයෝ ද ශීලයෙහි පරිපූරකාරී වෙති. මම ද ග්‍රාමධර්‍ම වූ මෛථුනයෙන් වෙන් වූයෙම් දුරු වූයෙම් බ්‍රහ්මචාරී වෙමි. මෙ පන්සියක් උපාසකයෝ ද ග්‍රාමධර්‍ම වූ මෛථුනයෙන් වෙන් වූවාහු දුරු වූවාහු බ්‍රහ්මචාරී වෙති. මම ද රාත්‍රිභොජනයෙන් වැළැකියෙම්, විකාලභොජනයෙන් වෙන් වූයෙම් එකභත්තික වෙමි. මෙ පන්සියක් උපාසකයෝ ද රාත්‍රිභොජනයෙන වැළකියාහු, විකාල භොජනයෙන් වෙන් වූවාහු එකභත්තික වෙති. මෙසේ මෙල කාරුණ සමසම වෙයි. කිසිදු අතිරෙකයෙක් (විශෙෂයෙක්) නැත. එ හෙයින් මම අතිරෙකයක් සඳහා යතන කෙරෙම් නම්, මැනැවැ"යි.

ආනන්දයෙනි, එක්බිති ගවෙසී උපාසක අතීත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ අතීත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට මෙල කාරුණ සැලකෙළේ ය: "වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැවිදිබව ලබම්වා"යි, උපසම්පදාව ලබම්වා"යි.

ආනන්දයෙනි, ගවෙසී උපාසක අතීත් සම්‍යක්සම්බුද්ධ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිද්ද ලැබී ය. උපසම්පත් ලැබී ය.

ආනන්දයෙනි, උපසම්පදාව ලත් නොබෝකල් ඇති ගවෙසී භික්ෂු එකලා වූයේ ගණයා කෙරෙන් වෙන් වූයේ අප්‍රමත්ත වූයේ කෙලෙස් තවන වැර ඇතියේ නිවන් අරමුණෙහි මෙහෙයූ සිත් ඇති ව වසනුයේ, කුල-පුත්‍රයෝ යම් අර්‍ථයක් සඳහා මැනැවින් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙත් නම්, ඉහාත්මයෙහි ම ඒ මාර්‍ගබ්‍රහ්මචර්‍ය්‍යය අවසාන කොට ඇති අනුත්තර අර්‍ථය තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට උපයා ගෙන විසී ය. '(මාගේ) ජාති (පුනර්භව) ය ක්ෂීණ වීය. මාර්‍ගබ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවන ලද. සිවුමගින් කළ යුතු කිස නිමවන ලද. මෙ (රහත්) බව පිණිස කළ යුතු අනෙකක් නැතැ' යි මොනොවට දැනගත්තේ ය. ආනන්දයෙනි, ගවෙසී මහණ රහතුන් අතුරෙහි අන්‍යතරයෙක් (ප්‍රසිද්ධයෙක්) විය.

අථ ඛො ආනන්ද, තෙසං පඤ්චන්නං උපාසකසතානං එතදහොසි: "අය්‍යො ඛො ගවෙසී අම්හාකං බහුකාරො පුබ්බඞ්ගමො සමාදපෙතා. අය්‍යො හි නාම ගවෙසී කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සති. කිමඞ්ග පන[1] න මය"න්ති.

අථ ඛො ආනන්ද, තානි පඤ්ච උපාසකසතානි යෙන කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොචුං: "ලභෙය්‍යාම මයං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යාම උපසම්පද"න්ති. අලභිංසු ඛො ආනන්ද, තානි පඤ්ච උපාසකසතානි කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ පබ්බජ්ජං, අලභිංසු උපසම්පදං.

අථ ඛො ආනන්ද, **ගවෙසිස්ස භික්ඛුනො** එතදහොසි: "අහං ඛො ඉමස්ස අනුත්තරස්ස විමුත්තිසුඛස්ස නිකාමලාභී[2] අකිච්ඡලාභී අකසිරලාභී. අහො වතිමානිපි පඤ්ච භික්ඛුසතානි ඉමස්ස අනුත්තරස්ස විමුත්තිසුඛස්ස නිකාමලාභිනො අස්සු අකිච්ඡලාභිනො අකසිරලාභිනො"ති.

අථ ඛො ආනන්ද, තානි පඤ්ච භික්ඛුසතානි වූපකට්ඨා අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරන්තා නචිරස්සෙව, යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරිය-පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිංසු. "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා"ති අබ්භඤ්ඤංසු.

ඉති ඛො ආනන්ද, තානි පඤ්ච භික්ඛුසතානි ගවෙසිපමුඛානි උත්තරුත්තරිං[3] පණීතපණීතං වායමමානා අනුත්තරං විමුත්තිසුඛං-සච්ඡාකංසු.

තස්මාතිහ ආනන්ද, එවං සික්ඛිතබ්බං: 'උත්තරුත්තරිං පණීතපණීතං වායමමානා අනුත්තරං විමුත්තිසුඛං[4] සච්ඡිකරිස්සාමා'ති. එවං හි වො ආනන්ද, සික්ඛිතබ්බන්ති.

**උපාසකවග්ගො තතියො.**

**තස්සුද්දානං:**

සාරජ්ජං විසාරදො නිරයං වෙරං චණ්ඩාලපඤ්චමං,
පීතිවණිජ්ජා රාජානො ගිහී චෙව ගවෙසිනාති.

1. කිමඞ්ග - මජසං 2. නිකාමලාභී හොමි - මජසං.
3 උත්තරුත්තරි - මජසං, 4. විමුත්තිං - මජසං

ආනන්දයෙනි, එක්බිති එ පන්සියක් උපාසකයනට මෙල සිත් විය: "ආයුෂ්මත් ගවෙසී අපට බහුකාර ය, පූර්වංගම ය, සමාදන් කරවන්නේ ය. ආශ්චර්ය්‍යයෙකි! ආයුෂ්මත් ගවෙසී කෙස්මස් බහා කසාවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ යැ. කවර හෙයින් අපි පැවිදි නො වමෝ දැ?"යි.

ආනන්දයෙනි, එක්බිති එ පන්සියක් උවසුවෝ අතීත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළඹ අතීත් සම්‍යක්-සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකළහ: "වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි ලබම්හ, උපසම්පදාව ලබම්හ"යි. ආනන්දයෙනි, ඒ පන්සියක් උපාසකයෝ අතීත් සම්‍යක්සම්බුද්ධ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි ලැබූහ, උපසම්පදා ලැබූහ.

ආනන්දයෙනි, එක්බිති ගවෙසී භික්ෂුහට මෙල සිත් විය: "මම වනාහි මේ අනුත්තර වූ විමුක්තිසුඛය කැමැති සෙයින් ලබනුයෙම් නිදුකින් ලබනුයෙම් විපුල සෙයින් ලබනුයෙම් වෙමි. එකැතියෙන් මෙ පන්සියක් භික්ෂුහු ද මේ අනුත්තර වූ විමුක්තිසුඛය කැමැති සෙයින් ලබන්නාහු නිදුකින් ලබන්නාහු විපුල කොට ලබන්නාහු වෙත් නම්, මනා මැ නු"යි.

ආනන්දයෙනි, එක්බිති එ පන්සියක් මහණහු වෙන් වූවාහු අප්‍රමත්ත වූවාහු ආතාප (කෙලස් තවන වීර්‍ය්‍ය) ඇතියාහු ප්‍රහිතාත්ම (කායජීවිතයෙහි අපේක්ෂා රහිත සිත් ඇති) ව වසන්නාහු, යමක් සඳහා කුලපුත්‍රයෝ මනා කොට ගිහිගෙන් නික්ම සැදැහැයෙන් පැවිද්දට වදිත් නම්, බ්‍රහ්මචර්‍ය්‍යපර්‍ය්‍යවසානය වූ ඒ අර්හත්වය ඉහාත්මයෙහි ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට උපයා විසූහ. '(අපගේ) ජාතිය ක්ෂීණ විය. බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවන ලද. කරණී කරණ ලද. මෙ රහත් බව පිණිස අන්කිසෙක් නැතැ'යි මැනැවින් (ප්‍රත්‍යවෙක්ෂාවෙන්) දත්හ.

ආනන්දයෙනි, මෙසෙයින් ගවෙසී ප්‍රමුඛ ඒ පන්සියක් භික්ෂුහු මතු මතුයෙහි ප්‍රණීත ප්‍රණීත (බැව්) පිණිස වෑයම් කරන්නාහු අනුත්තර විමුක්තිසුඛය සාක්ෂාත් කළහ.

ආනන්දයෙනි, එ හෙයින් මෙහි ලා මෙසේ හික්මිය යුතු: "මතු මතුයෙහි ප්‍රණීත ප්‍රණීතයට ව්‍යායාම කරමින් අනුත්තර විමුක්තිසුඛය සාක්ෂාත් කරන්නෙමි"යි. ආනන්දයෙනි, තොප විසින් මෙසේ ම හික්මෙන්නේ යැයි.

**උපාසකවග්ගය තුන්වැනි යි.**

**එහි උද්දානය:**

සාරජ්ජ සූත්‍රය, විසාරද සූත්‍රය, නිරය සූත්‍රය, වෙර සූත්‍රය, චණ්ඩාල සූත්‍රය, පීති සූත්‍රය, වණිජ්ජා සූත්‍රය, රාජ සූත්‍රය, ගිහී සූත්‍රය, ගවෙසී සූත්‍රය දැයි දසයෙකි.

## 4. ආරඤ්ඤකවග්ගො.

### 5. 4. 4. 1.

### [ආරඤ්ඤක සුත්තං]

31. පඤ්චිමෙ භික්ඛවෙ ආරඤ්ඤකා. කතමෙ පඤ්ච:

මන්දත්තා මොමූහත්තා ආරඤ්ඤකො හොති. පාපිච්ඡො ඉච්ඡාපකතො ආරඤ්ඤකො[1] හොති. උම්මාදා චිත්තක්ඛෙපා ආරඤ්ඤකො හොති. වණ්ණිතං බුද්ධෙහි බුද්ධසාවකෙහීති අරඤ්ඤකො හොති. අප්පිච්ඡතං යෙව නිස්සාය, සන්තුට්ඨිං යෙව නිස්සාය, සල්ලෙඛං යෙව නිස්සාය, පවිවෙකං යෙව නිස්සාය, ඉදමට්ඨිතං යෙව[2] නිස්සාය ආරඤ්ඤකො හොති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආරඤ්ඤකා.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං ආරඤ්ඤකානං ය්වායං ආරඤ්ඤකො අප්පිච්ඡතං යෙව නිස්සාය, සන්තුට්ඨිං යෙව නිස්සාය, සල්ලෙඛං යෙව නිස්සාය, පවිවෙකං යෙව නිස්සාය, ඉදමට්ඨිතං යෙව නිස්සාය, ආරඤ්ඤකො හොති, අයං ඉමෙසං පඤ්චන්නං, ආරඤ්ඤකානං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච.

සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නවනීතං, නවනීතම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩො තත්ථ අග්ගමක්ඛායති; එවමෙව ඛො භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං ආරඤ්ඤකානං ය්වායං ආරඤ්ඤකො අප්පිච්ඡතං යෙව නිස්සාය, සන්තුට්ඨිං යෙව නිස්සාය, සල්ලෙඛං යෙව නිස්සාය, පවිවෙකං යෙව නිස්සාය, ඉදමට්ඨිතං යෙව නිස්සාය ආරඤ්ඤකො හොති, අයං ඉමෙසං පඤ්චන්නං ආරඤ්ඤකානං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො චාති.

### 5. 4. 4. 2.

### [පංසුකූලික සුත්තං]

[සාවත්ථිනිදානං]

32. පඤ්චිමෙ භික්ඛවෙ පංසුකූලිකා -පෙ-

### 5. 4. 4. 3.

### [පිණ්ඩපාතික සුත්තං]

[සාවත්ථිනිදානං]

33. පඤ්චිමෙ භික්ඛවෙ පිණ්ඩපාතිකා -පෙ-

### 5. 4. 4. 4.

### [රුක්ඛමූලික සුත්තං]

[සාවත්ථිනිදානං]

34. පඤ්චිමෙ භික්ඛවෙ රුක්ඛමූලිකා -පෙ-

1. ආරඤ්ඤිකා - මජසං. 2. ඉදමත්ථිතංඑව - මජසං.

# 4. ආරඤ්ඤකවර්ගය.

## 5. 4. 4. 1.

### [ආරඤ්ඤක සූත්‍රය]

[සැවැත් නිදන සි]

**31**. මහණෙනි, මේ ආරණ්‍යකයෝ (වනවාසීහු) පස් දෙනෙක් වෙති. කවර පස් දෙනෙක යත්:

බාල බැවින් මුළා බැවින් ආරණ්‍යක වෙයි. පාපෙච්ඡ වූයේ ලාමක ඉච්ඡායෙන් මඩනා ලදුයේ ආරණ්‍යක වෙයි. උන්මාදය හෙතු කොට චිත්තක්ෂෙපය හෙතු කොට ආරණ්‍යක වෙයි. 'බුදුන් විසින්' බුදු සව්වන් විසින් (මේ ආරණ්‍යකාඞ්ගය) පසස්නා ලද'යි ආරණ්‍යක වෙයි. අල්පෙච්ඡ බව ම නිසා සන්තුෂ්ටිය ම නිසා කෙලෂස ලිඛනය (කෙලෙසුන් ලියාලීම) ම නිසා උත්තම විවේකය ම නිසා මේ කල්‍යාණ ප්‍රතිපදුව ම අර්ථී කොට ඇති බව නිසා (ධුතාඞ්ග වශයෙන්) ආරණ්‍යක වෙයි. මහණෙනි, මේ පඤ්ච ආරණ්‍යකයෝ ය.

මහණෙනි, මේ පස් වැදෑරුම් ආරණ්‍යකයන් අතුරෙහි යම් ආරණ්‍යකයෙක් අල්පෙච්ඡතාව ම නිසා සන්තුට්ඨිය ම නිසා කෙලෂස ලිඛනය ම නිසා මේ කල්‍යාණප්‍රතිපදුව ම අර්ථී කොට ඇති බව නිසා ආරණ්‍යක වේ ද, මේ තෙමේ මේ පඤ්චආරණ්‍යකයන් කෙරෙහි අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද මුඛ්‍ය ද උත්තම ද ප්‍රවර ද වෙයි.

මහණෙනි, යම්සේ දෙනගෙන් කිරි ය, කිරෙන් දීහි ය, දීහියෙන් වෙඩරු ය, වෙඩරුයෙන් ගිතෙල් ය, ගිතෙලින් පහන්ගිතෙල එහි අග්‍ර යයි කියනු ලැබේ ද; එසෙයින් ම මහණෙනි, මේ පඤ්චආරණ්‍යකයන් කෙරෙහි යම් ආරණ්‍යකයෙක් අල්පෙච්ඡ බව ම නිසා සන්තුෂ්ටිය ම නිසා සල්ලෙඛය ම නිසා ප්‍රවිවෙකය ම නිසා ඉදමත්ථි භාවය ම නිසා ආරණ්‍යක වේ ද, මේතෙම මේ පඤ්ච ආරණ්‍යකයන් කෙරෙහි අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද මුඛ්‍ය ද උත්තම ද ප්‍රවර ද වේ ය යි.

## 5. 4. 4. 2.

### [පංසුකූලික සූත්‍රය]

[සැවැත්නිදන සි]

**32**. මහණෙනි, මේ පංසුකූලිකයෝ (පහුල් සිවුරු දරණ පියවි ඇත්තෝ) පස් දෙනෙකි ...

## 5. 4. 4. 3.

### [පිණ්ඩපාතික සූත්‍රය]

[සැවැත්නිදන සි]

**33**. මහණෙනි, මේ පිණ්ඩපාතිකයෝ (පිණ්ඩපාතයෙන් ම යැපෙනුවෝ) පස් දෙනෙකි ...

## 5. 4. 4. 4.

### [රුක්ඛමූලික සූත්‍රය]

[සැවැත් නිදන සි]

**34**. මහණෙනි, මේ රුක්ඛමූලිකයෝ (රුක්මුල්හි ම වසනුවෝ) පස් දෙනෙකි ...

**5. 4. 4. 5.**

**[සොසානික සුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**35.** පඤ්චිමෙ භික්ඛවෙ සොසානිකා -පෙ-

**5. 4. 4. 6.**

**[අබ්භොකාසික සුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**36.** පඤ්චිමෙ භික්ඛවෙ අබ්භොකාසිකා -පෙ-

**5. 4. 4 7.**

**[නෙසජ්ජික සුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**37.** පඤ්චිමෙ භික්ඛවෙ නෙසජ්ජිකා -පෙ-

**5. 4. 4. 8.**

**[යථාසන්ථතික සුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**38.** පඤ්චිමෙ භික්ඛවෙ යථාසන්ථතිකා -පෙ-

**5. 4. 4. 9.**

**[එකාසනික සුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**39.** පඤ්චිමෙ භික්ඛවෙ එකාසනිකා -පෙ-

**5. 4. 4. 10.**

**[ඛලුපච්ඡාභත්තික සුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**40.** පඤ්චිමෙ භික්ඛවෙ ඛලුපච්ඡාභත්තිකා -පෙ-

5. 4. 4. 5.

**[සොසානික සූත්‍රය]**

**[සැවැත්නිදනයි]**

**35**. මහණෙනි, මේ සොසානිකයෝ (සොහොන්හි ම වසනුවෝ) පස් දෙනෙකි ...

5. 4. 4. 6.

**[අබ්භොකාසික සූත්‍රය]**

**[සැවැත්නිදනයි]**

**36**. මහණෙනි, මේ අබ්භොකාසිකයෝ (එළිමහන්හි ම වසනුවෝ) පස් දෙනෙකි ...

5. 4. 4. 7.

**[නෙසජ්ජික සූත්‍රය]**

**[සැවැත්නිදනයි]**

**37**. මහණෙනි, මේ නෙසජ්ජිකයෝ (හිඳින ඉරියව්වෙහි ම වසනුවෝ) පස් දෙනෙකි ...

5. 4. 4. 8.

**[යථාසන්ථතික සූත්‍රය]**

**[සැවැත්නිදනයි]**

**38**. මහණෙනි, මේ යථාසන්ථතිකයෝ (පළමු ලද අසුන්හි ම වසනුවෝ) පස් දෙනෙකි ...

5. 4. 4. 9.

**[එකාසනික සූත්‍රය]**

**[සැවැත්නිදනයි]**

**39**. මහණෙනි, මේ එකාසනිකයෝ (එකම නිඳ්ඤුවෙහි බොජුන් වළඳනුවෝ) පස් දෙනෙකි ...

5. 4. 4. 10.

**[ඛලුපච්ඡාභත්තික සූත්‍රය]**

**[සැවැත්නිදනයි]**

**40**. මහණෙනි, මේ ඛලුපච්ඡාභත්තිකයෝ (වළඳා අවසන් වූ පසු ලද බොජුන් නො පිළිගන්නෝ) පස් දෙනෙකි ...

## 5. 4. 4. 11.

## [පත්තපිණ්ඩික සුත්තං]

[සාවත්ථිනිදානං]

**41.** පඤ්චිමෙ භික්ඛවෙ පත්තපිණ්ඩිකා. කතමෙ පඤ්ච:

මන්දත්තා මොමූහත්තා පත්තපිණ්ඩිකො හොති. පාපිච්ඡො ඉච්ඡාපකතො පත්තපිණ්ඩිකො හොති. උම්මාදා චිත්තක්ඛෙපා පත්තපිණ්ඩිකො හොති. වණ්ණිතං බුද්ධෙහි බුද්ධසාවකෙහීති පත්තපිණ්ඩිකො හොති. අප්පිච්ඡතං යෙව නිස්සාය, සන්තුට්ඨිං යෙව නිස්සාය, සල්ලෙඛං යෙව නිස්සාය, පවිවෙකං යෙව නිස්සාය, ඉදමට්ඨිතං යෙව[1] නිස්සාය පත්තපිණ්ඩිකො හොති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච පත්තපිණ්ඩිකා.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං පත්තපිණ්ඩිකානං ය්වායං පත්තපිණ්ඩිකො අප්පිච්ඡතං යෙව නිස්සාය, සන්තුට්ඨිං යෙව නිස්සාය, සල්ලෙඛං යෙව නිස්සාය, පවිවෙකං යෙව නිස්සාය, ඉදමට්ඨිතං යෙව නිස්සාය, පත්තපිණ්ඩිකො හොති. අයං ඉමෙසං පඤ්චන්නං පත්තපිණ්ඩිකානං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච.

සෙය්‍යථාපි භික්ඛවෙ ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නවනීතං, නවනීතම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩො තත්ථ අග්ගමක්ඛායති; එවමෙව ඛො භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං පත්තපිණ්ඩිකානං ය්වායං පත්තපිණ්ඩිකො අප්පිච්ඡතං යෙව නිස්සාය, සන්තුට්ඨිං යෙව නිස්සාය, සල්ලෙඛං යෙව නිස්සාය, පවිවෙකං යෙව නිස්සාය, ඉදමට්ඨිතං යෙව නිස්සාය පත්තපිණ්ඩිකො හොති, අයං ඉමෙසං පඤ්චන්නං පත්තපිණ්ඩිකානං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො චාති.

ආරඤ්ඤකවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

ආරඤ්ඤං පංසුපිණ්ඩං ච රුක්ඛසුසානෙන අබ්භොකාසිකං
නෙසජ්ජං සන්ථතං එකාසනිකං ඛලුපච්ඡාපිණ්ඩිකෙන චාති.[2]

---

1. ඉදමත්ථිතං යෙව - මජසං.
2. අරඤ්ඤං චිවරං රුක්ඛ සුසානං අබ්භොකාසිකං නෙසජ්ජං සන්ථතං එකාසනිකං ඛලුපච්ඡාපිණ්ඩිකෙන චාති - මජසං.

5. 4. 4. 11.

[පත්තපිණ්ඩික සූත්‍රය]

[සැවැත්නිදානයි]

41. මහණෙනි, මේ පත්තපිණ්ඩිකයෝ (පාත්‍රසංඥ ඇතිව පිඬු පිළිගන්නෝ) පස් දෙනෙකි. කවර පස් දෙනෙක යත්:

මන්දභාවයෙන් මොමුහතායෙන් පත්තපිණ්ඩික වෙයි. ලාමකොවණා ඇතියේ ඉච්ඡායෙන් මඩනා ලද්දයේ පත්තපිණ්ඩික වෙයි. උමතුයෙන් චිත්තක්ෂෙපයෙන් පත්තපිණ්ඩික වෙයි. 'බුදුන් විසින්' බුදු සව්වන් විසින් පසස්නා ලද්'යි පත්තපිණ්ඩික වෙයි. අල්පෙච්ඡතාව ම නිසා සන්තුෂ්ටිය ම නිසා සල්ලේඛය ම නිසා ප්‍රවිවේකය ම නිසා ඉදමට්ඨිතාව ම නිසා (ධුතාඞ්ග වශයෙන්) පත්තපිණ්ඩික වෙයි. මහණෙනි, මෙ පඤ්ච පත්තපිණ්ඩිකයෝ ය.

මහණෙනි, මේ පත්තපිණ්ඩිකයන් පස්දෙන අතුරෙහි යම් පත්තපිණ්ඩිකයෙක් අල්පෙච්ඡතාව ම නිසා සන්තුෂ්ටිය ම නිසා සල්ලේඛය ම නිසා පවිවේකය ම නිසා ඉදමට්ඨිතාව ම නිසා පත්තපිණ්ඩික වේ නම්, මෙ තෙම මෙ පත්තපිණ්ඩිකයන් පස්දෙන අතුරෙන් අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වෙයි.

මහණෙනි, යම්සේ දෙනගෙන් කිරි ය, කිරියෙන් දිහි ය, දිහියෙන් වෙඬරු ය, වෙඬරුයෙන් ගිතෙල් ය, ගිතෙලින් පහන්ගිතෙල එහි අග්‍ර යයි කියනු ලැබේ නම්, මහණෙනි, එපරිද්දෙන් මේ පත්තපිණ්ඩිකයන් පස්දෙන අතුරෙන් යම් පත්තපිණ්ඩිකයෙක් අල්පෙච්ඡතාව ම නිසා සන්තුෂ්ටිය ම නිසා සල්ලේඛය ම නිසා පවිවේකය ම නිසා ඉදමට්ඨිතාව ම නිසා පත්තපිණ්ඩික වේ නම්, මෙ තෙමේ මෙ පත්තපිණ්ඩිකයන් පස්දෙන අතුරෙහි අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේ යයි.

**ආරඤ්ඤකවර්ගය සතරවැනි යි**

**එහි උද්දානය:**

ආරඤ්ඤක සූත්‍රය, පංසුකූලික සූත්‍රය, පිණ්ඩපාතික සූත්‍රය, රුක්ඛමූල සූත්‍රය, සොසානික සූත්‍රය, අබ්භොකාසික සූත්‍රය, නෙසජ්ජික සූත්‍රය, යථාසන්ථතික සූත්‍රය, එකාසනික සූත්‍රය, ඛලුපච්ඡාභත්තික සූත්‍රය, පත්තපිණ්ඩික සූත්‍රය දැ යි එකොළොසෙකි.

# 5. සොණවග්ගො.

## 5. 4. 5. 1.

## [සොණ සුත්තං]

[සාවත්‍ථිනිදානං]

42. පඤ්චිමෙ භික්ඛවෙ පොරාණා බ්‍රාහ්මණධම්මා එතරහි සුනඛෙසු සන්දිස්සන්ති නො බ්‍රාහ්මණෙසු. කතමෙ පඤ්ච:

පුබ්බෙ සුදං භික්ඛවෙ බ්‍රාහ්මණා බ්‍රාහ්මණිං යෙව ගච්ඡන්ති,[1] නො අබ්‍රාහ්මණිං. එතරහි භික්ඛවෙ බ්‍රාහ්මණා බ්‍රාහ්මණිම්පි ගච්ඡන්ති. අබ්‍රාහ්මණිම්පි ගච්ඡන්ති. එතරහි භික්ඛවෙ සුනඛා සුනඛිං යෙව ගච්ඡන්ති, නො අසුනඛිං. අයං භික්ඛවෙ පඨමො පොරාණො බ්‍රාහ්මණධම්මො එතරහි සුනඛෙසු සන්දිස්සති, නො බ්‍රාහ්මණෙසු.

පුබ්බෙ සුදං භික්ඛවෙ බ්‍රාහ්මණා බ්‍රාහ්මණිං උතුනිං යෙව ගච්ඡන්ති, නො අනුතුනිං. එතරහි භික්ඛවෙ බ්‍රාහ්මණා බ්‍රාහ්මණිං උතුනිම්පි ගච්ඡන්ති, අනුතුනිම්පි ගච්ඡන්ති. එතරහි භික්ඛවෙ සුනඛා සුනඛිං උතුනිං යෙව ගච්ඡන්ති, නො අනුතුනිං. අයං භික්ඛවෙ දුතියො පොරාණො බ්‍රාහ්මණධම්මො එතරහි සුනඛෙසු සන්දිස්සති, නො බ්‍රාහ්මණෙසු.

පුබ්බෙ සුදං භික්ඛවෙ බ්‍රාහ්මණා බ්‍රාහ්මණිං නෙව කිණන්ති,[2] නො වික්කිණන්ති[3]. සම්පියෙනෙව සංවාසං සංසග්ගත්‍ථාය[4] සම්පවත්තෙන්ති. එතරහි භික්ඛවෙ බ්‍රාහ්මණා බ්‍රාහ්මණිං කිණන්තිපි, වික්කිණන්තිපි. සම්පියෙනපි සංවාසං සංසග්ගත්‍ථාය සම්පවත්තෙන්ති. අසම්පියෙනපි සංවාසං සංසග්ගත්‍ථාය සම්පවත්තෙන්ති. එතරහි භික්ඛවෙ සුනඛා සුනඛිං නෙව කිණන්ති, නො වික්කිණන්ති. සම්පියෙනෙව සංවාසං සංසග්ගත්‍ථාය සම්පවත්තෙන්ති. අයං භික්ඛවෙ තතියො පොරාණො බ්‍රාහ්මණධම්මො එතරහි සුනඛෙසු සන්දිස්සති, නො බ්‍රාහ්මණෙසු

පුබ්බෙ සුදං භික්ඛවෙ බ්‍රාහ්මණා සන්නිධිං න කරොන්ති ධනස්සපි ධඤ්ඤස්සපි රජතස්සපි ජාතරූපස්සපි. එතරහි භික්ඛවෙ බ්‍රාහ්මණා සන්නිධිං කරොන්ති ධනස්සපි ධඤ්ඤස්සපි රජතස්සපි ජාතරූපස්සපි. එතරහි භික්ඛවෙ සුනඛා සන්නිධිං න කරොන්ති ධනස්සපි ධඤ්ඤස්සපි රජතස්සපි ජාතරූපස්සපි. අයං භික්ඛවෙ චතුත්‍ථො පොරාණො බ්‍රාහ්මණධම්මො එතරහි සුනඛෙසු සන්දිස්සති, නො බ්‍රාහ්මණෙසු.

පුබ්බෙ සුදං භික්ඛවෙ බ්‍රාහ්මණා සායං සායමාසාය, පාතො පාතරාසාය භික්ඛං පරියෙසන්ති. එතරහි භික්ඛවෙ බ්‍රාහ්මණා යාවදත්‍ථං උදරාවදෙහකං[5] භුඤ්ජිත්වා අවසෙසං ආදාය පක්කමන්ති. එතරහි භික්ඛවෙ සුනඛා සායං සායමාසාය, පාතො පාතරාසාය භික්ඛං පරියෙසන්ති. අයං භික්ඛවෙ පඤ්චමො පොරාණො බ්‍රාහ්මණධම්මො එතරහි සුනඛෙසු සන්දිස්සන්ති, නො බ්‍රාහ්මණෙසු.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච පොරාණා බ්‍රාහ්මණධම්මා එතරහි සුනඛෙසු සන්දිස්සන්ති, නො බ්‍රාහ්මණෙසූති.

---

1 බ්‍රාහ්මණිං ගච්ඡන්ති - සයා 2 කීණන්ති - සයා 3 වික්කීණන්ති - සයා.
4. සංබන්ධාය - ඉජසං, සයා 5 උදරාවදෙහකං - මජසං

# 5. සෝණවග්ගය.

## 5. 4. 5. 1.

## [සොණ සූත්‍රය]

[සැවැත්නිදානයි]

**42.** මහණෙනි, මේ පැරණි බ්‍රාහමණධර්ම (බමුණු සිරිත්) පසෙක් මෙ කල්හි ශුනකයන් කෙරෙහි දක්නා ලැබෙයි. බ්‍රාහමණයන් කෙරෙහි නො දක්නා ලැබෙයි. කවර පසෙක යත්:

මහණෙනි, පෙර බ්‍රාහමණයෝ බ්‍රාහමණියක කරා ම යෙත්. අබ්‍රාහමණියක කරා නොයෙත්. මහණෙනි, මෙකල්හි බ්‍රාහමණයෝ බැමිණිය කරා ද යෙත්. නොබැමිණිය කරා ද යෙත්. මහණෙනි, මෙ කල්හි ශුනකයෝ ශුනකිය වෙත ම යෙති. අශුනකිය වෙත නො යෙත්. මහණෙනි, මේ පළමුවැනි පැරණි වූ බ්‍රාහමණ ධර්මය දැන් ශුනකයන් කෙරෙහි පැණෙයි. බ්‍රාහමණයන් කෙරෙහි නො පැණේ.

මහණෙනි, පෙර බමුණෝ ඔසප්වූ බැමිණිය වෙත ම යෙනි, ඔසප් නො වූ බැමිණිය වෙත නොයත්. මහණෙනි, මෙ කල්හි බ්‍රාහමණයෝ ඔසප් වූ බැමිණිය වෙත ද යෙති. ඔසප් නො වූ බැමිණිය වෙත ද යෙත්. මහණෙනි, මෙ චක්හි ශුනකයෝ ඔසප් වූ ම ශුනකිය වෙත යෙති. ඔසප් නොවූ ශුනකිය වෙත නො යෙත්. මහණෙනි, මේ පෞරාණ බ්‍රාහමණ ධර්මය මෙ චක්හි ශුනකයන් කෙරෙහි පැණෙයි. බ්‍රාහමණයන් කොරෙහි නො පැණේ.

මහණෙනි, පූර්වයෙහි බ්‍රාහමණයෝ බ්‍රාහමණියක ගන්නෝ මිලදී නො ගනිති. දෙන්නෝ නො ම විකුණති. අන්‍යොන්‍ය සත් (විද්‍යමාන) ප්‍රේමයෙන් ම කුල පරම්පරාව සටනු පිණිස සංවාසය පවත්වති. මහණෙනි, මෙ කල්හි බ්‍රාහමණයෝ බ්‍රාහමණියක මිලදී ද ගනිති, විකුණන්නාහු ද වෙති. අන්‍යොන්‍ය සත්ප්‍රේම යෙනුදු කුලපරපුර ගළපනු සඳහා සංවාස පවත්වති. අසත්ප්‍රේමයෙනුදු කුලපරපුර ගළපනු සඳහා සංවාස පවත්වති. මහණෙනි, මෙ කල්හි ශුනකයෝ ශුනකියක මිළදී නො ම ගනිති. නොම විකුණති. අන්‍යොන්‍ය ප්‍රේමයෙන් ම කුලපරපුර ගළපනු සඳහා සංවාස පවත්වති. මහණෙනි, මේ තෙවන පෞරාණ බ්‍රාහමණ ධර්මය මෙ කල්හි ශුනකයන් කෙරෙහි පැණෙයි. බ්‍රාහමණයන් කෙරෙහි නො පැණෙයි.

මහණෙනි, පෙර බමුණෝ ධනය ද ධාන්‍යය ද රිදී ද රන් ද සන්නිධි (රැස්කොට තැබීම) නො කරත්. මහණෙනි, මෙ චක්හි බ්‍රාහමණයෝ ධනය ද ධාන්‍යය ද රිදී ද රන් ද සන්නිධි කරත්. මහණෙනි, මෙ කල්හි ශුනකයෝ ධනය ද ධාන්‍ය ද රජත ද ජාතරූප ද සන්නිධි නො කරත්. මහණෙනි, මේ පැරණි බ්‍රාහමණධර්මය මෙ චක්හි බ්‍රාහමණයන් කෙරෙහි නොව ශුනකයන් කෙරෙහි මැ දෘශ්‍යමාන වෙයි.

මහණෙනි, පෙර බ්‍රාහමණයෝ සායමාශ (සවස කෑම) සඳහා සවස්හි දු ප්‍රාතරාශය (උදය කෑම) සඳහා උදෑසන්හි දු භික්ෂා සොයා ඇවිදුනාහ. මහණෙනි, මෙ කල්හි බ්‍රාහමණයෝ කැමැති තාක් කුස් පුරා අහර වළඳා අවශෙෂය රැගෙණ යෙති. මහණෙනි, මෙකල්හි ශුනකයෝ සායාහ්නයෙහි සායමාශය සඳහා ද උදෑසන්හි ප්‍රාතරාශය සඳහා ද සොයා ඇවිදුනාහ. මහණෙනි, මේ පස්වන පැරණි බ්‍රාහමණධර්මය මෙ චක්හි ශුනකයන් කෙරෙහි දෘශ්‍යමාන වෙයි. බ්‍රාහමණයන් කෙරෙහි දෘශ්‍යමාන නො වෙයි.

මහණෙනි, මේ පැරණි බමුණුදහම් පස මෙ කල්හි ශුනකයන් කෙරෙහි දෘශ්‍යමාන වෙයි. බ්‍රාහමණයන් කෙරෙහි දෘශ්‍යමාන නොවේ යයි.

5. 4. 5. 2.

[දොණ සුත්තං]

[සාවත්ථිනිදානං]

**43.** අථ ඛො **දොණො** බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො දොණො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

සුතං මෙතං භො ගොතම: "න සමණො ගොතමො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුද්ධෙ මහල්ලකෙ අද්ධගතෙ වයො අනුප්පත්තෙ අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙතී"ති. තයිදං භො ගොතම තථෙව, න හි භවං ගොතමො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුද්ධෙ මහල්ලකෙ අද්ධගතෙ වයො අනුප්පත්තෙ අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙතීති. තයිදං භො ගොතම න සම්පන්නමෙවාති.

[භගවා:]

"ත්වම්පි නො දොණ, බ්‍රාහ්මණො[1] පටිජානාසී?"ති.

යං හි තං භො ගොතම සම්මා වදමානො වදෙය්‍ය: "බ්‍රාහ්මණො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, අජ්ඣායකො මන්තධරො, තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං, පදකො වෙය්‍යාකරණො, ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො"ති මමෙව තං භො ගොතම සම්මා වදමානො වදෙය්‍ය.

අහං හි භො ගොතම බ්‍රාහ්මණො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අජ්ඣායකො මන්තධරො, තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං, පදකො වෙය්‍යාකරණො, ලොකායත මහාපුරිසලක්ඛණෙසු අනවයොති.

---

1. බ්‍රාහ්මණො'ති-සිමු

## 5. 4. 5. 2.

## [දොණ සූත්‍රය]

[සැවැත්නිදානයි]

43. එකල්හි ද්‍රෝණ බ්‍රාහමණ භාග්‍යවතුන් කරා එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සමෝදනාගී වූ සමරණාගී වූ කථාව කොට නිමවා එකත්පස්ව හින. එකත්පසෙක හුන් ද්‍රෝණ බ්‍රහමණ භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළකෙළේ ය:

භවත් ගෞතමයන් වහන්ස, "ශ්‍රමණගෞතමයෝ ජරාජීර්ණ වූ වෘද්ධ වූ මහලු වූ තුන්වයස් කල් ඉක්ම වූ අන්තිම වියට පැමිණි බ්‍රාහමණයන්ට අභිවාදන හෝ නො කෙරෙති. දැක හුනස්නෙන් හෝ නැගී නො සිටිති. අසුනෙන් හෝ නිමන්ත්‍රණ නො කෙරෙති" යන තෙල කරුණ මා විසින් අසන ලදී. භවත් ගෞතමයෝ ජීර්ණ වූ වෘද්ධ වූ මහලු වූ අධ්වගත වූ අන්තිම වයසට පැමිණි බ්‍රාහමණයන්ට අභිවාදන හෝ නොකරති, දැක හුනස්නෙන් හෝ නැගී නොසිටිති, ආසනයෙන් හෝ නිමන්ත්‍රණ නො කරති යන මෙ කරුණ එසේ මැය. භවත් ගෞතමයන් වහන්ස, මෙ කරුණ නො නිසි මැයි.

[භගවත්:]

"ද්‍රෝණයෙනි, තො ද 'බ්‍රාහමණයෙක්මි'යි පිළිණ කෙරෙහි දැ?"යි.

භවත් ගෞතමයන් වහන්ස, මොනොවට කරුණු කියනුයෙක් - යම් ම පුද්ගලයකු ගෙණ "මවුපිය දෙපසින් මොනොවට උපන්, සත්වන පිතාමහ- යුගය තෙක් පිරිසිදු මවකුස ඇති, ජාතිවාදයෙන් අක්ෂිප්ත වූ අනුපක්‍රෂ්ට වූ, අධ්‍යායක වූ වෙදමන්ත්‍රධර වූ, නිඝණ්ඩු හා ක්‍රියා කල්ප විකල්ප සහිත (ශික්ෂා නිරුක්ති සඞ්ඛ්‍යාත) අක්ෂර ප්‍රභෙද සහිත වූ (අථර්වෙදය සිවුවැනි කොට) ඉතිහාසය පස්වනු කොට ඇති ඍග් යජුර් සාම යන තුන් වෙදයෙහි පරතෙරපත්, පද හදාරණ ව්‍යාකරණ හදාරණ, ලොකායත ශාස්ත්‍රයෙහි හා මහාපුරුෂලක්ෂණයන්හි අනූන (සමර්ථ) වූයේ බ්‍රාහමණ" යි කියා නම්, භවත් ගෞතමයන් වහන්ස, මනා කොට කියනුයේ එ මා ම ගෙණ කියනේ ය

භවත් ගෞතමයෙනි, 'මම් වූකලී මව්පසින් ද පියපසින් ද යන දෙපසින් සුජාත වූ, සත්වන මුත්තා යුගය තෙක් සුපිරිසිදු මව්කුස් ඇති, ජාතිවාදයෙන් ප්‍රතික්ෂෙප නොකළ, ආක්‍රොශ නොකළ, වේදමන්ත්‍ර හදාරණ මන්ත්‍රධර වූ, නිඝණ්ඩුකෙටුභ සහිත වූ අක්ෂරප්‍රභෙද සහිත වූ ඉතිහාසය පස්වනු කොට ඇති තුන් වෙදයන්ගේ පරතෙරට ගිය, පද හා ශෙෂව්‍යාකරණ හදාරණ විතණ්ඩවාදශාස්ත්‍රයෙහි හා මහාපුරුෂලක්ෂණයෙහි අනූන (සම්පූර්ණ) බමුණෙකිම් වෙමි'යි.

යෙ ඛො තෙ දොණ, බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො – මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසඤ්චිදං එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති, තදනුභාසන්ති, භාසිතමනුභාසන්ති, සජ්ඣායිතමනුසජ්ඣායන්ති,* වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථීදං: අට්ටකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු. ත්‍යාස්සුමෙ පඤ්ච බ්‍රාහ්මණෙ පඤ්ඤපෙන්ති: **බ්‍රහ්මසමං, දෙවසමං, මරියාදං, සම්භින්නමරියාදං, බ්‍රාහ්මණචණ්ඩාලං** යෙව පඤ්චමං තෙසං ත්වං දොණ කතමො?ති.

න ඛො මයං භො ගොතම, ඉමෙ පඤ්ච බ්‍රාහ්මණෙ ජානාම. අථ ඛො මයං බ්‍රාහ්මණාත්වෙව ජානාම. සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථා අහං ඉමෙ පඤ්ච බ්‍රාහ්මණෙ ජානෙය්‍යන්ති.

තෙන හි බ්‍රාහ්මණ සුණොහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති. එවං භොති ඛො දොණො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

**කථඤ්ච දොණ, බ්‍රාහ්මණො බ්‍රහ්මසමො හොති?**

ඉධ දොණ බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. සො අට්ඨචත්තාලීස වස්සානි කොමාරබ්‍රහ්මචරියං චරති මන්තෙ අධීයමානො. අට්ඨචත්තාලීස වස්සානි කොමාරබ්‍රහ්මචරියං චරිත්වා මන්තෙ අධීයිත්වා ආචරියස්ස ආචරියධනං පරියෙසති ධම්මෙනෙව, නො අධම්මෙන. තත්ථ ච දොණ කො ධම්මො? නෙව කසියා, න වණිජ්ජාය, න ගොරක්ඛෙන, න ඉස්සත්ථෙන, න රාජපොරිසෙන, න සිප්පඤ්ඤතරෙන, කෙවලං භික්ඛාචරියාය කපාලං අනතිමඤ්ඤමානො. සො ආචරියස්ස ආචරියධනං නිය්‍යාදෙත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං – තථා තතියං – තථා චතුත්ථිං – ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[1] සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. කරුණා –පෙ– මුදිතා –පෙ– උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං – තථා තතියං – තථා චතුත්ථිං – ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[1] සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො ඉමෙ චත්තාරො බ්‍රහ්මවිහාරෙ භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං බ්‍රහ්මලොකං උපපජ්ජති.

එවං ඛො දොණ බ්‍රාහ්මණො බ්‍රහ්මසමො හොති.

---

1 සබ්බත්ථතාය – සීමු

* 'සජ්ඣායිතමනුසජ්ඣායන්ති'' අයං පාඨො දීඝනිකායෙ න දිස්සති.

ද්‍රොණය, බමුණන්ගේ මන්ත්‍රකර්තෘ වූ මන්ත්‍රප්‍රවර්තක වූ යම් පූර්ව ඍෂි කෙනෙක් වෙද්ද, යම් ඍෂි කෙනකුන් සතු වූ (ඔවුන් විසින් ස්වරසම්පත්ති-යෙන්) ගයන ලද, (අන්‍යයන්ට) කියන ලද, රැස් කොට තබන ලද මේ පැරැණි වෙදසඞ්ඛ්‍යාත මන්ත්‍රය මෙකල බමුණෝ ඒ පූර්ව ඍෂින්ට අනුව ගයත් ද, ඔවුනට අනුව (ඔවුන් විසින් කියන ලද්ද අනුව) කියත් ද. හදාරණ ලද්ද අනුව හදාරත් ද, කියවන ලද්ද අනුව කියවත් ද, ඔහු කවරහ: අට්ටක ය, වාමක ය, වාමදෙව ය, වෙස්සාමිත්ත ය, යමතග්ගි ය, අඞ්ගීරස ය, භාරද්වාජ ය, වාසෙට්ඨ ය, කස්සප ය, භගු ය යන මොහු (දස දෙන) යි. ඔවුහු මේ පස් බමුණු කෙනකුන් පණවති: **බ්‍රහ්මසම ය, දෙවසම ය, මරියාද ය, සම්භින්නමරියාද ය, බ්‍රාහ්මණචණ්ඩාල යෑම පස්වනු ය.** ද්‍රොණය, ඔවුනතුරෙන් තෙපි කවරෑ යි?

භවත් ගෞතමයෙනි, ඇපි මේ පස්බමුණන් නො දනුම්හ. එතෙකුදුවත් ඇපි බ්‍රාහ්මණ යයි ම දනුම්හ. යම්සේ මම් මේ පස්බමුණන් දැනගනිම් ද, භවත් ගෞතමයන් වහන්සේ මට එපරිද්දෙන් දහම් දෙසන සේක්වා! එ පිණිස අයදිමියි.

එසේ නම් බමුණ, අස. මැනැවින් මෙනෙහි කර. කියන්නෙමියි. 'එසේ ය භවත්නි'යි ද්‍රොණ බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී. බුදුහු මෙල කාරුණ වදාළහ:

කිසෙයින් ද්‍රොණය, බ්‍රාහ්මණ බ්‍රහ්මසම වෙයි යත්:

ද්‍රොණයෙනි, මෙ ලොව්හි බමුණු මවුපසින් ද පියපසින් ද යන උභය-පාර්ශ්වයෙන් සුජාත වෙයි. සත්වන පිතාමහයුගය තෙක් සුපිරිසිදු මවුකුස ඇතියේ ජාතිවාදයෙන් අක්ෂිප්ත වූයේ අනුපක්‍රෂ්ට වෙයි. හේ අටසාලිස් වසක් වෙදමන්ත්‍ර හදාරමින් කුමරබඹසර වෙසෙයි. අටසාලිස් වසක් කුමරබඹසර වැස මන්ත්‍ර හදාරා ඇදුරුහට ආචාර්‍ය්‍යධනය අධර්මයෙන් නොව ධර්මයෙන් ම සොයයි. ද්‍රොණය, එහි (ආචාර්‍ය්‍යධනපර්‍ය්‍යෙෂණයෙහි) දූ ධර්මය කවරේය යත්: කෘෂිකර්මයෙනුදු නො ම වෙයි. වණික් කර්මයෙනුදු නො ම වෙයි. ගෙරි රැක්-මෙනුදු නො ම වෙයි. දුනුවාකමිනුදු නො ම වෙයි රාජපුරුෂත්වයෙනුදු නො ම වෙයි. අන්‍යතර ශිල්පයෙකිනුදු නො ම වෙයි. හුදු භික්ෂාචර්‍ය්‍යායෙන් කබලට (අමත්‍රයට) අවමන් නො කරමින් වෙයි. හේ ඇදුරුහට ආචාර්‍ය්‍යධනය පවරා දී කෙස්මස් බහා කසාවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වෙයි. හේ මෙසෙයින් පැවිදි වූයේ ම විපුල වූ මෛත් සහ-ගිය සිතින් එක් දිශාවක් අරමුණු කොට වාසය කරයි එ සෙයින් දෙවන දිශාව ද ... එ සෙයින් තෙවන දිශාව ද ... එ සෙයින් සතරවන දිශාව ද ... මෙසේ උඩ යට සරස හැම තන්හි සර්වාත්මසමතායෙන් සියලු සත්ත්වයන් ඇති ලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ මෛත් සහගිය සිතින් අරමුණු කොට වෙසෙයි. කරුණා සහගිය සිතින් ... මුදිතා සහගිය සිතින් .. උපෙක්ෂා සහගිය සිතින් එක් දිගක් අරමුණු කොට වාසය කරයි. එ සෙයින් දෙවන දිග ... එසෙයින් තෙවන දිග ... එසෙයින් සතර වන දිග ... මෙ සෙයින් උඩ යට සරස හැම තන්හි සර්වාත්මසමතායෙන් සියලු සත්ත්වයන් ඇති ලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාපාදයෙන් යුත් උපෙක්ෂා සහගත සිතින් අරමුණු කොට වාසය කරයි. හේ මෙ සතර බඹවෙහෙර වඩා කාබුන් මරණින් මත්තෙහි සුගති සඞ්ඛ්‍යාත බ්‍රහ්මලොකයට එළඹෙයි.

ද්‍රොණය, මෙසෙයින් ම බ්‍රාහ්මණ (බ්‍රහ්මවිහාරධ්‍යානයුක්ත හෙයින්) බ්‍රහ්මසම වෙයි.

කථඤ්ච දොණ බ්‍රාහ්මණො දෙවසමො හොති?

ඉධ දොණ බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. සො අට්ඨචත්තාළීස වස්සානි කොමාරං බ්‍රහ්මචරියං චරති මන්තෙ අධියමානො. අට්ඨචත්තාළීස වස්සානි කොමාරබ්‍රහ්මචරියං චරිත්වා මන්තෙ අධියිත්වා ආචරියස්ස ආචරියධනං පරියෙසති ධම්මෙනෙව නො අධම්මෙන. තත්‍ථ ච දොණ කො ධම්මො? නෙව කසියා, න වණිජ්ජාය, න ගොරක්ඛෙන, න ඉස්සත්ථෙන, න රාජපොරිසෙන, න සිප්පඤ්ඤතරෙන, කෙවලං භික්ඛාචරියාය කපාලං අනතිමඤ්ඤමානො. සො ආචරියස්ස ආචරියධනං නීයාදෙත්වා දාරං පරියෙසති ධම්මෙනෙව නො අධම්මෙන. තත්‍ථ ච දොණ කො ධම්මො? නෙව කයෙන, න වික්කයෙන, බ්‍රාහ්මණිං යෙව උදකූපස්සට්ඨං. සො බ්‍රාහ්මණිං යෙව ගච්ඡති. න ඛත්තියිං, න වෙස්සිං, න සුද්දිං, න චණ්ඩාලිං, න නෙසාදිං, න වෙණිං, න රථකාරිං, න පුක්කුසිං ගච්ඡති. න ගබ්භිනිං ගච්ඡති, න පායමානං ගච්ඡති, න අනුතුනිං ගච්ඡති. කස්මා ච දොණ බ්‍රාහ්මණො න ගබ්භිනිං ගච්ඡති: සචෙ දොණ බ්‍රාහ්මණො ගබ්භිනිං ගච්ඡති, අතිමීළ්හජො නාම සො හොති මාණවකො වා මාණවිකා වා. තස්මා දොණ බ්‍රාහ්මණො න ගබ්භිනිං ගච්ඡති. කස්මා ච දොණ බ්‍රාහ්මණො න පායමානං ගච්ඡති: සචෙ දොණ බ්‍රාහ්මණො පායමානං ගච්ඡති, අසුචි පටිපීතො නාම සො හොති මාණවකො වා මාණවිකා වා. තස්මා දොණ බ්‍රාහ්මණො න පායමානං ගච්ඡති. කස්මා ච දොණ බ්‍රාහ්මණො න අනුතුනිං ගච්ඡති: සචෙ දොණ බ්‍රාහ්මණො අනුතුනිං ගච්ඡති තස්ස සා හොති බ්‍රාහ්මණී නෙව කාමත්‍ථා න දවත්‍ථා න රතත්‍ථා, පජත්‍ථාව බ්‍රාහ්මණස්ස බ්‍රාහ්මණී හොති. සො මිථුනං[1] උප්පාදෙත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්‍ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්‍ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමෙ චත්තාරො ඣානෙ භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

එවං ඛො දොණ බ්‍රාහ්මණො දෙවසමො හොති.

---

1. මෙථුනං - මජසං

කිසෙයින් ද්‍රොණය, බ්‍රාහමණ දෙවසම වෙයි යත්:

ද්‍රොණය, මෙ ලොව්හි බ්‍රාහමණ මවුපසින් ද පියපසින් ද යන දෙපසින් සුජාත වෙයි.සත්වන පිතාමහයුගය තෙක් පිරිසිදු මවුකුස් ඇතියේ ජාතිවාද-යෙන් බැහැර නො කරණ ලදුයේ උපක්‍රොෂ නො කරණ ලදුයේ වෙයි. හේ අටසාළිස්වසක් වෙදමන්ත්‍ර හදාරමින් කුමරබඹසර වෙසෙයි. අටසාළිස්වසක් කුමරබඹසර වැස වෙදමන්ත්‍ර හදාරා ඇදුරුහට ආචාර්‍ය්‍යධනය නො දැහැමින් නො ව දැහැමින් ම සොයයි. ද්‍රොණය, එහි ලා දහම් කවර: කෘෂිකර්මයෙන් නො වෙයි. වණික්කර්මයෙන් නො වෙයි. ගෙරිරක්මෙන් නො වෙයි. දුනුවාකමින් ද නො වෙයි. රාජපුරුෂත්වයෙන් නො වෙයි. අන්‍යතර ශිල්පයෙකින් නො වෙයි. හුදෙක් භික්‍ෂාචර්‍ය්‍යායෙන් කබලූ නො අවමන් කරමින් වෙයි. හෙ ඇදුරුහට ආචාර්‍ය්‍යධනය පවරා දී නොදැහැමින් නො ව දැහැමින් ම අඹුවක සොයයි. ද්‍රොණය, එහිදු කවර ධර්මයෙක යත්: මිල දී ගැණීමෙන් නො වෙයි. විකිණුගැණීමෙන් නො වෙයි. අතැ පැන් හෙව දුන් බැමිණියක ම සොයයි. හෙ බැමිණියක කරා ම එළඹෙයි. කැත්දුවක කරා නො යෙයි. වෛශ්‍ය ස්ත්‍රියක කරා ද නො යෙයි. ශූද්‍රස්ත්‍රියක කරා ද නො යෙයි. සැඬලියක කරා ද නො යෙයි. වැදි අඟනෙක කරා ද නො යෙයි. කුළුපොතු අඟනක කරා ද නො යෙයි. සොම්මරු අඟනක කරා ද නොයෙයි. පුප්සඬු අඟනක කරා ද නො යෙයි. ගැබිනියක කරා ද නො යෙයි. දරුවන් කිරිපොවන්නියක කරා ද නො යෙයි. ඔසප් නොවූ මාගමක කරා ද නො යෙයි. ද්‍රොණය, බ්‍රාහමණ කවර හෙයින් ගැබිනියක කරා නො යෙයි යත්: ද්‍රොණය, ඉදින් බමුණු ගැබින කරා යේ නම්, උපදනා ඒ මණෙවු හෝ මෙණෙවි හෝ මහා මීළහ (ගුථරාශි) යෙහි උපන්නේ නම් වෙයි. ද්‍රොණය, එහෙයින් බ්‍රාහමණ ගැබිනියක වෙත නො යෙයි. ද්‍රොණය, කවර හෙයින් බ්‍රාහමණ දරුවන් කිරිපොවන්නියක කරා නොයේද යත්: ද්‍රොණයෙනි, ඉදින් බ්‍රාහමණ දරුවන් කිරිපොවන්නියක කරා යේ නම්, එ මණෙවු හෝ මෙණෙවිය හෝ අශුචි පානය කෙළේ වන්නේ ය. ද්‍රොණය, එහෙයින් බමුණු දරුවන් කිරිපොවන්නියක කරා නො යෙයි. ද්‍රොණය, බමුණු කවර හෙයින් ඔසප් නො වූ බැමිණිය කරා නො යෙයි යත්: ද්‍රොණය, ඉදින් බමුණු ඔසප් නො වූ බැමිණියක කරා යේ නම් යුතු නො වෙයි. ඔහට එ බැමිණි කාමය සඳහා නො වෙයි. දවය සඳහා නො වෙයි. රතිය පිණිස නො වෙයි. බමුණුහට බැමිණි ප්‍රජාසන්තා-නය පිණිස ම වෙයි. හෙ පුතකු හා දුවක හා උපදවා කෙස්මස් බහා කසාවත් හැඳපෙරෙව ගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වෙයි. හෙ මෙසේ පැවිදි වූයේ ම කාමයන් කෙරෙන් වෙන්ව ම ... චතුර්ථධ්‍යානය උපදවා වාසය කරයි. හෙ මෙ සතර දැහැන් වඩා කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ග (බ්‍රහම) ලොකයෙහි උපදනේ ය.

ද්‍රොණය, මෙසේ බ්‍රාහමණ (ධ්‍යාන වැඩීමෙන් බ්‍රහම) දෙවසම වෙයි.

කථඤ්ච දොණ, බ්‍රාහ්මණො මරියාදො හොති?

ඉධ දොණ බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. සො අට්ඨචත්තාලීසවස්සානි කොමාරං බ්‍රහ්මචරියං චරති මන්තෙ අධියමානො. අට්ඨචත්තාලීස වස්සානි කොමාරං බ්‍රහ්මචරියං චරිත්වා මන්තෙ අධීයිත්වා ආචරියස්ස ආචරියධනං පරියෙසති ධම්මෙනෙව නො අධම්මෙන. තත්ථ ච දොණ කො ධම්මො? නෙව කසියා, න වණිජ්ජාය, න ගොරක්ඛෙන, න ඉස්සත්ථෙන, න රාජපොරිසෙන, න සිප්පඤ්ඤතරෙන, කෙවලං භික්ඛාචරියාය කපාලං අනතිමඤ්ඤමානො. සො ආචරියස්ස ආචරියධනං නීයාදෙත්වා දාරං පරියෙසති ධම්මෙනෙව නො අධම්මෙන. තත්ථ ච දොණ කො ධම්මො? නෙව කයෙන, න වික්කයෙන, බ්‍රාහ්මණිං යෙව උදකූපස්සට්ඨං. සො බ්‍රාහ්මණිං යෙව ගච්ඡති, න ඛත්තියිං, න වෙස්සිං, න සුද්දිං, න චණ්ඩාලිං, න නෙසාදිං, න වෙණිං, න රථකාරිං, න පුක්කුසිං ගච්ඡති. න ගබ්භිනිං ගච්ඡති. න පායමානං ගච්ඡති. න අනුතුනිං ගච්ඡති. කස්මා ච දොණ බ්‍රාහ්මණො න ගබ්භිනිං ගච්ඡති? සචෙ දොණ බ්‍රාහ්මණො ගබ්භිනිං ගච්ඡති -පෙ- පජත්ථා ච බ්‍රාහ්මණස්ස බ්‍රාහ්මණී හොති. සො මිථුනං උප්පාදෙත්වා තමෙව පුත්තස්සාදං නිකාමයමානො කුටුම්බං අජ්ඣාවසති, න අගාරස්මා අනගාරියං පබ්බජති. යාව පොරාණානං බ්‍රාහ්මණානං මරියාදා, තත්ථ තිට්ඨති, තං න වීතික්කමති 'යාව පොරාණානං බ්‍රාහ්මණානං මරියාදො තත්ථ බ්‍රාහ්මණො ඨිතො තං න වීතික්කමතී'ති ඛො දොණ තස්මා "බ්‍රාහ්මණො මරියාදො"ති වුච්චති.

එවං ඛො දොණ බ්‍රාහ්මණො මරියාදො හොති.

කථඤ්ච දොණ, බ්‍රාහ්මණො සම්භින්නමරියාදො හොති?

ඉධ දොණ බ්‍රාහ්මණො උභතො සුජාතො හොති -පෙ- අනුපක්කුට්ඨො ජාතිවාදෙන. සො අට්ඨචත්තාලීස වස්සානි කොමාරං බ්‍රහ්මචරියං චරති මන්තෙ අධියමානො. අට්ඨචත්තාලීස වස්සානි කොමාරං බ්‍රහ්මචරියං චරිත්වා මන්තෙ අධීයිත්වා ආචරියස්ස ආචරියධනං පරියෙසති, ධම්මෙනෙව නො අධම්මෙන. තත්ථ ච දොණ කො ධම්මො? නෙව කසියා න වණිජ්ජාය න ගොරක්ඛෙන න ඉස්සත්ථෙන, න රාජපොරිසෙන, න සිප්පඤ්ඤතරෙන, කෙවලං භික්ඛාචරියාය කපාලං අනතිමඤ්ඤමානො. සො ආචරියස්ස ආචරියධනං නීයාදෙත්වා දාරං පරියෙසති ධම්මෙන'පි අධම්මෙන'පි. කයෙන'පි වික්කයෙන'පි, බ්‍රාහ්මණිම්පි උදකූපස්සට්ඨං. සො බ්‍රාහ්මණිම්පි ගච්ඡති, ඛත්තියිම්පි ගච්ඡති, වෙස්සිම්පි ගච්ඡති, සුද්දිම්පි ගච්ඡති, චණ්ඩාලිම්පි ගච්ඡති, නෙසාදිම්පි ගච්ඡති, වෙණිම්පි ගච්ඡති, රථකාරිම්පි ගච්ඡති, පුක්කුසිම්පි ගච්ඡති, ගබ්භිනිම්පි ගච්ඡති, පායමානම්පි ගච්ඡති, උතුනිම්පි ගච්ඡති, අනුතුනිම්පි ගච්ඡති. තස්ස සා හොති බ්‍රාහ්මණී කාමත්ථාපි දවත්ථාපි රතත්ථාපි. න පජත්ථාව[1] බ්‍රාහ්මණස්ස බ්‍රාහ්මණී හොති. යාව පොරාණානං බ්‍රාහ්මණානං[2] මරියාදා,[3] තත්ථ න තිට්ඨති, තං වීතික්කමති. 'යාව පොරාණානං බ්‍රාහ්මණානං මරියාදා[3] තත්ථ බ්‍රාහ්මණො න ඨිතො, තං වීතික්කමතී'ති ඛො දොණ තස්මා "බ්‍රාහ්මණො සම්භින්නමරියාදො"ති වුච්චති

එවං ඛො දොණ බ්‍රාහ්මණො සම්භින්නමරියාදො හොති.

1 පජත්ථාපි - සීමු, මජසං, ස්‍යා. 2. එත්ථ බ්‍රාහ්මණිම්පි'ති පදං මජසං - සීමු, පොත්ථකෙසු අධිකං, 3. මරියාදො - මජසං, ස්‍යා

කිසෙයින් ද්‍රෝණයෙනි, බ්‍රාහමණ මර්‍යාදා ඇති වෙයි යත්:

ද්‍රෝණය, මෙලොව්හි බ්‍රාහමණ මවුපසින් ද පියපසින් ද යන දෙපසින් සුජාත වූයේ සත්වන පිතෘමහයුගය තෙක් සුපිරිසිදු මව්කුස් ඇතියේ ජාතිවාදයෙන් අක්ෂිප්ත වූ යේ අනුපක්‍රෘෂ්ට වූ යේ වෙයි. හෙ අටසාළිස් වසක් මන්ත්‍ර හදාරමින් කුමරබඹසර වෙසෙයි. අටසාළිස් වසක් කුමරබඹසර වැස මන්ත්‍ර හදාරා ආචාර්‍යයහට අධර්මයෙන් නොව ධර්මයෙන් ම ආචාර්‍යධන සොයයි. ද්‍රෝණය, එහි ධර්මය කවර යත්: කෘෂිකර්මයෙන් ද නො ම වෙයි. වණික්කර්මයෙන් ද නො ම වෙයි. ගොරක්ෂායෙන් ද නො ම වෙයි. දුනුවාකමින් ද නො ම වෙයි. රාජපුරුෂභාවයෙන් ද නො ම වෙයි. අන්‍යතර ශිල්පයෙකින් ද නො ම වෙයි. භික්ෂාචර්‍යායෙන් ම කබලු (භික්ෂා භාජන) නො අවමන් කරණුයේ හුදෙක් ධන සොයයි. හෙ ඇදුරුහට ආචාර්‍යධනය පවරා දී අධර්මයෙන් නොව ධර්මයෙන් ම දාරපර්‍යෙෂණා කෙරෙයි. බමුණ එහිදු ධර්මය කවර යත්: ක්‍රයයෙනුදු නොවෙයි. වික්‍රයයෙනුදු නො වෙයි. අතැ පැන් හෙළ දුන් බැමිණියක ම සොයයි. හෙ බැමිණිය කරා ම යෙයි. කැත්කුමරියක කරා නො යෙයි. වෛශ්‍ය ස්ත්‍රියක කරා නො යෙයි. ශුද්‍රස්ත්‍රියක කරා නො යෙයි. සැඩලියක කරා නො යෙයි. වැදි අඟනක කරා නො යෙයි. කුළුපොතු අඟනක කරා නො යෙයි. සොම්මරු අඟනක කරා නො යෙයි. පුප්සඹුවක කරා නො යෙයි. ගැබිනක කරා නො යෙයි. දරුවන් කිරි පොවන්නියක කරා නො යෙයි. ඍතුමත් නො වූවක කරා නො යෙයි ද්‍රෝණයෙනි, කවර හෙයින් බ්‍රාහමණ ගැබින කරා නොම යෙයි යත්: ද්‍රෝණය, ඉදින් බ්‍රාහමණ ගැබින කරා යේ නම් ... ප්‍රජාව පිණිස ම බමුණුහට බැබිණි වෙයි. හෙ මිථුනය උපදවා එ දරුගේ ම ආස්වාදය කැමැති වනුයේ ගිහිගෙයි වෙසෙයි. ගෙන් නික්ම ශාසනයෙහි පැවිදි නො වෙයි. පැරණි බමුණන්ගේ මර්‍යාදාය යම්තාක් වේ නම්, එහි සිටුනේ ය. එය නො මඩනේ ය. පැරණි බමුණන්ගේ මර්‍යාදාව යම් තාක් නම් බ්‍රාහමණ එහි සිටියේ එය ව්‍යතික්‍රම නො කෙරේය යන එකරුණින් ම ද්‍රෝණය ''බ්‍රාහමණ මර්‍යාදා ඇතියෙකැ''යි කියනු ලැබේ.

ද්‍රෝණයෙනි, මෙසේ බ්‍රාහමණ මර්‍යාදා ඇති වෙයි.

ද්‍රෝණය, කිසෙයින්, බ්‍රාහමණ සම්භින්නමරියාද වෙයි යත්:

ද්‍රෝණය, මෙ ලෙව්හි බ්‍රාහමණ මව්පිය දෙපසින් සුජාත වූයේ වෙයි ... ජාතිවාදයෙන් අනුපක්‍රෘෂ්ට වෙයි. හේ අටසාළිස් වසක් මන්ත්‍ර හදාරමින් කුමරබඹසර වෙසෙයි. අටසාළිස් වසක් කුමරබඹසර වැස මන්ත්‍ර හදාරා දැහැමින් ම ආචාර්‍යයහට ආචාර්‍යධනය අදහමින් නො ව දහමින් සොයයි. ද්‍රෝණය, එහිදු දහම් කවර යත්: කෘෂිකර්මයෙන් නො ම වෙයි, වණික් කර්මයෙන් නො වෙයි, ගවරක්ෂායෙන් නො ම වෙයි, දුනුවාකමින් නො ම වෙයි. රාජපුරුෂභාවයෙන් නො ම වෙයි, අන්‍යතර ශිල්පයෙකින් නො ම වෙයි, භික්ෂාභාජනය (භිඟනපාත්‍රය) නො ඉක්මවා සිතනුයේ (නො ගරහනුයේ) හුදු භික්ෂාචර්‍යායෙන් සොයයි. හේ ආචාර්‍යයහට ආචාර්‍යධනය පවරා දී ධර්මයෙනුදු අධර්මයෙනුදු ක්‍රයයෙනුදු වික්‍රයෙනුදු දිය එව පාවාදුන් භාර්‍යාවක හෝ බැමිණියක සොයයි. හේ බැමිණියක වෙත ද යෙයි, කැත්දුවක වෙත ද යෙයි, වෛශ්‍යස්ත්‍රියක වෙත ද යෙයි, ශුද්‍රියක වෙත ද යෙයි, සැඩලියක වෙත ද යෙයි. වැදිඅඟනක වෙත ද යෙයි, කුලුපොතු අඟනක වෙත ද යෙයි, සොම්මරු අඟනක වෙත ද යෙයි. පුප්සඹු අඟනක වෙත ද යෙයි. ගැබිනිය වෙත ද යෙයි, දරුවන් කිරි පොවන්නිය වෙත ද යෙයි. ඔසප් අඟන වෙත ද යෙයි. ඔසප් නො වූ අඟන වෙත ද යෙයි. ඔහට තෙල බැමිණි කාම පිණිස ද වෙයි, කෙළි පිණිස ද වෙයි, කාමරති පිණිස ද වෙයි. එ බමුණුහට බැමිණිය පුත්‍රප්‍රජාව පිණිස ම නො වෙයි. පුරාණ බමුණන්ගේ යම් ආචාරමර්‍යාදාවෙක් වේ නම්, එහි නො සිටියි, එය ඉක්මවාලයි. ද්‍රෝණය, පුරාණ බ්‍රාහමණයන්ගේ යම් මර්‍යාදායෙක් වේ ද, බමුණු එහි නො සිටියේ එය ඉක්මවාලයි. එහෙයින් ''බ්‍රාහමණ සම්භින්න මරියාදා ඇත්තේ'' ය යි කියනු ලැබේ.

ද්‍රෝණය, මෙසේ බමුණු සම්භින්න මරියාද වේ.

කථඤ්ච දොණ බ්‍රාහ්මණො බ්‍රාහ්මණ චණ්ඩාලො හොති?

ඉධ දොණ බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. සො අට්ඨචත්තාළීස වස්සානි කොමාරං බ්‍රහ්මචරියං චරති මන්තෙ අධීයමානො. අට්ඨචත්තාළීස වස්සානි කොමාරං බ්‍රහ්මචරියං චරිත්වා මන්තෙ අධීයිත්වා ආචරියස්ස ආචරියධනං පරියෙසති ධම්මෙන'පි අධම්මෙන'පි කසියා'පි වණිජ්ජාය'පි ගොරක්ඛෙන'පි ඉස්සත්ථෙන'පි රාජපොරිසෙන'පි සිප්පඤ්ඤතරෙන'පි කෙවලම්පි භික්ඛාචරියාය කපාලං අනතිමඤ්ඤමානො. සො ආචරියස්ස ආචරියධනං නීයාදෙත්වා දාරං පරියෙසති ධම්මෙන'පි අධම්මෙන'පි කයෙන'පි වික්කයෙන'පි[1] උදකූපස්සට්ඨං. සො බ්‍රාහ්මණිම්පි ගච්ඡති, ඛත්තියිම්පි ගච්ඡති, වෙස්සිම්පි ගච්ඡති, සුද්දිම්පි ගච්ඡති, චණ්ඩාලිම්පි ගච්ඡති, නෙසාදිම්පි ගච්ඡති, වෙණිම්පි ගච්ඡති රථකාරිම්පි ගච්ඡති, පුක්කුසිම්පි ගච්ඡති, ගබ්භිනිම්පි ගච්ඡති, පායමානම්පි ගච්ඡති, උතුනිම්පි ගච්ඡති, අනුතුනිම්පි ගච්ඡති. තස්ස සා හොති බ්‍රාහ්මණී කාමත්ථාපි දවත්ථාපි රතත්ථාපි, න පජත්ථාය[2] බ්‍රාහ්මණස්ස බ්‍රාහ්මණී හොති. සො සබ්බකම්මෙහි ජීවිකං කප්පෙති. තමෙනං බ්‍රාහ්මණා එවමාහංසු: "කස්මා භවං බ්‍රාහ්මණො පටිජානමානො සබ්බකම්මෙහි ජීවිකං කප්පෙතී?"ති. සො එවමාහ: "සෙය්‍යථාපි භො අග්ගි සුචිම්පි දහති, අසුචිම්පි දහති, න ච තෙන අග්ගි උපලිප්පති, එවමෙව ඛො භො සබ්බකම්මෙහි චෙපි බ්‍රාහ්මණො ජීවිකං කප්පෙති, න ච තෙන බ්‍රාහ්මණො උපලිප්පතී". සබ්බකම්මෙහි ජීවිකං-කප්පෙතීති ඛො දොණ තස්මා බ්‍රාහ්මණො "බ්‍රාහ්මණ චණ්ඩාලො"ති වුච්චති.

එවං ඛො දොණ බ්‍රාහ්මණො බ්‍රාහ්මණචණ්ඩාලො හොති.

යෙ ඛො දොණ බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො – මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති, තදනුභාසන්ති, භාසිතමනුභාසන්ති, සජ්ඣායිතමනුසජ්ඣායන්ති, වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථිදං: අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු. ත්‍යාස්සුමෙ පඤ්ච බ්‍රාහ්මණෙ පඤ්ඤපෙන්ති: බ්‍රහ්මසමං, දෙවසමං, මරියාදං, සම්භින්නමරියාදං, බ්‍රාහ්මණචණ්ඩාලංයෙව පඤ්චමං. තෙසං ත්වං ද්‍රොණ කතමො?ති. එවං සන්තෙ මයං භො ගොතම බ්‍රාහ්මණචණ්ඩාලම්පි න පූරෙම.

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

---
1 එත්ථ "බ්‍රාහ්මණිම්පි" ති පදං මජසං අධිකං 2. පජත්ථාපි - සීමු, මජසං, සහා.

ද්‍රොණය, බ්‍රාහමණ කෙසේ නම් බ්‍රාහමණචණ්ඩාල වේද යත්:

ද්‍රොණය, මෙ ලෙව්හි බ්‍රාහමණ මවුපසින් හා පියපසින් හා උභයපාශ්වී-යෙන් සුජාත වූයේ සත්වන පිතාමහයුගය තෙක් සුපිරිසිදු මවුකුස් ඇතියේ වෙයි. ජාතිවාදයෙන් අක්ෂිප්තවූයේ අනුපක්‍රෂ්ට වෙයි. හෙ අටසාළිස් වසක් මන්ත්‍ර හදුරමින් කුමරබඹසර සෙරෙයි. හේ මන්ත්‍ර හදුරා අටසාළිස් වසක් කුමරබඹසර සැරු ඇදුරුහට දැහැමිනුදු නොදැහැමිනුදු කෘෂිකර්මයෙනුදු වණික්කර්මයෙනුදු ගොරක්ෂායෙනුදු දුනුවාකමිනුදු රාජපුරුෂත්වයෙනුදු අන්‍යතර ශිල්පයෙනුදු කබලු හෙළා නො දක්වමින් හුදෙක් භික්ෂාචයර්‍යයෙනුදු ආචාර්‍ය ධනය සොයන්නේය. හේ ආචාර්‍යහට ආචාර්‍යධනය පවරා දී දැහැමිනුදු නොදැහැමිනුදු ක්‍රයයෙනුදු වික්‍රයයෙනුදු දිය අතැ හෙව දුන් භාර්‍යාවක සොයයි. හේ බ්‍රාහමණිය වෙත ද යෙයි. ක්ෂත්‍රියාව වෙත ද යෙයි. වෛශ්‍යස්ත්‍රිය කරා ද යෙයි. ශුද්‍රස්ත්‍රිය කරා ද යෙයි. සැඩොලිය වෙත ද යෙයි. වැදි අඟන වෙත ද යෙයි. කුළුපොතු අඟනක කරා ද යෙයි. සොම්මරු අඟන වෙත ද යෙයි. පුප්සඹු අඟන වෙත ද යෙයි. ගැබිණිය කරා ද යෙයි. කිරිපොවන්නිය කරා ද යෙයි. ඔසප් වූවක කරා ද යෙයි, ඔසප් නොවූවක කරා ද යෙයි. ඔහට ඒ බැමිණිය කාම පිණිස ද, දව පිණිස ද, කාමරති පිණිස ද වෙයි. පුත්‍රප්‍රජාව සඳහා ම බමුණුහට බැමිණිය නො වෙයි. හේ හැම කර්මයෙන් දිවි රක්නේය. එතල පුහුල්හට බ්‍රාහමණයෝ මෙසේ කියන්නාහ: "කවර හෙයින් භවත් 'බ්‍රාහමණයෙමි'යි පිළින කෙරෙමින් හැම කර්මයෙන් ජීවිකා කෙරේදැ"යි. හේ මෙසේ කියයි: "භවත්නි, සම්සෙ අග්නිය පවිත්‍රයත් දවා ද, අපවිත්‍රයත් දවා ද, එය හා අග්නිය නො තැවරේ ද, භවත්නි, එසෙයින් ම බ්‍රාහමණ හැම කර්මාන්තයෙන් ජීවිකා කෙරේ නම්, බ්‍රාහමණ එය හා නො තැවරේ." ද්‍රොණය, බ්‍රාහමණයා සර්වකර්මාන්තයෙන් ජීවිකා කරන්නේ ය යන එකරුණෙන් බ්‍රාහමණයා "බ්‍රාහමණචණ්ඩාල" යයි කියනු ලැබේ.

ද්‍රොණය, මෙසෙයින් බ්‍රාහමණචණ්ඩාල වෙයි.

ද්‍රොණය, බමුණන්ගේ මන්ත්‍රකර්තෘ වූ මන්ත්‍රප්‍රවර්තක වූ යම් පූර්ව ඍෂි කෙනෙක් වෙත් ද, යම් ඍෂි කෙනකුන් විසින් ගයන ලද පවත්වන ලද සඬග්‍රහ කරණ ලද මේ පුරාණ මන්ත්‍රපදයක් වේ ද, මෙකල්හි බ්‍රාහමණයෝ ඒ ගීතය අනුගායනා කෙරෙත් ද, එය අනුව කියත් ද, (ඔවුන් විසින්) හදුරණ ලද්ද අනුව හදුරත් ද, (අන්‍යයනට) කියවන ලද්ද අනුව කියවත් ද, ඔහු කවරහ: අට්ඨක ය, වාමක ය, වාමදෙව ය, වෙස්සාමිත්ත ය, යමතග්ගී ය, අඞ්ගීරස ය, භාරද්වාජ ය, වාසෙට්ඨ ය, කස්සප ය, භගු ය යන මොහු යි. ඔහු මේ පස් බමුණන් පණවති: බ්‍රහමසමය, දෙවසම ය, මරියාදය, සම්භින්න-මරියාද ය, බ්‍රාහමණචණ්ඩාල ම පස්වනු ය. ද්‍රොණය, තෝ ඔවුනතුරෙහි කතමයෙහි දැ?යි. භවත් ගෞතමයන් වහන්ස, මෙසේ ඇති කල්හි අපි බ්‍රාහමණචණ්ඩාලයා පවා නො පුරම්හ. (බ්‍රාහමණ චණ්ඩාල තරම්වත් නොවම්හ )

භවත් ගෞතමයන්වහන්ස, ඉතා කාන්ත ය ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් කොට දිවි ඇතිතෙක් සරණ ගිය උපාසකයකු කොට ධරණ සේක් වායි.

### 5. 4. 5. 3.

### [සඞ්ගාරවසුත්තං]

#### [සාවත්ථිනිදානං]

**44.** අථ ඛො **සඞ්ගාරවො** බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

කො නු ඛො භො ගොතම හෙතු? කො පච්චයො? යෙනෙකදා[1] දීඝරත්තං සජ්ඣායකතා'පි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. කො පන භො ගොතම හෙතු? කො පච්චයො? යෙනෙකදා දීඝරත්තං අසජ්ඣායකතා'පි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා'ති.

යස්මිං බ්‍රාහ්මණ, සමයෙ කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතා'පි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ. උදපත්තො සංසට්ඨො ලාඛාය වා හලිද්දියා වා නීලියා වා මඤ්ජිට්ඨාය වා, තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං නප්පජානෙය්‍ය න පස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතා'පි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ ව්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති ව්‍යාපාදපරෙතෙන, උප්පන්නස්ස ච ව්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතා'පි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො අග්ගිනා සන්තත්තො උක්කට්ඨිතො[2] උස්සදකජාතො,[3] තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං නප්පජානෙය්‍ය, නපස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ ව්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති ව්‍යාපාදපරෙතෙන, උප්පන්නස්ස ච ව්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතා'පි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා.

---

1. යෙන කදාචි-මජසං. 2. උක්කාථිතො-සීමු, උක්කුථිතො-මජසං, උක්කුට්ඨිතො-සසා
3 උසූටකජාතො - මජසං.

## 5. 4. 5. 3.

## [සඞ්ගාරව සූත්‍රය]

### [සැවැත්නිදාන යි]

**44.** එකල්හි **සඞ්ගාරව** බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු විය. සමමොදනයට නිසි සමරණිය කථාව කොට නිමවා එකත්පසෙක හින. එකත්පසෙක හුන් සඞ්ගාරව බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැළ කෙළේ ය.

භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයෙකින් ඇතැම් කලෙක දිගුකලක් හදාළ වෙදමන්ත්‍රයෝ ද නොවැටහෙත් නම්, නොහදාළ මන්ත්‍රයෝ පළමුව ම නොවැටහෙත් නම්, එයට කවර හෙතු ය? කවර ප්‍රත්‍යය යැයි? භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයෙකින් ඇතැම් කලෙක බොහෝ කලක් නො හදාළ මන්ත්‍රයෝත් වැටහෙත් නම්, හදාළ මන්ත්‍රයෝ පළමුව ම වැටහෙත් නම්, එයට කවර හෙතු ය? කවර ප්‍රත්‍යය යැයි?

බ්‍රාහමණය, යම් සමයෙක්හි කාමරාගයෙන් ඇවිසැගත් කාමරාගයෙන් මැඩුනු සිතින් වාසය කෙරේ නම්, උපන්නා වූ ද කාමරාගයාගේ යථාභූත නිඃසරණය නොදන්නේ නම්, එ සමයෙහි ආත්මාර්ථය ද යථාභූත කොට නොදන්නේ ය, නොදක්නේ ය. එ සමයෙහි පරාර්ථය ද යථාභූත කොට නොදන්නේ ය, නොදක්නේ ය. එ සමයෙහි උභයාර්ථය ද යථාභූත කොට නොදන්නේ ය, නොදක්නේ ය. දීර්ඝරාත්‍රයෙහි හදාළ වෙදමන්ත්‍රයෝ නො වැටහෙත්, නොහදාළ වෙදමන්ත්‍රයෝ පළමුව මැයි. බ්‍රාහමණය, යම්සේ ලතු–පැහැයෙන් වේවයි, කහපැහැයෙන් වේවයි, නිල්පැහැයෙන් වේවයි, මදටිය පැහැයෙන් වේවයි මුසු වූ දියබඳුනෙක් වේ නම්,එහි ඇස් ඇති පුරුෂයෙක් සිය මුව සටහන් පිරික්සනුයේ යථාවයෙන් නොදන්නේ ය, නොදක්නේ ය. බ්‍රාහමණය, එපරිද්දෙන් ම යම් සමයෙක්හි කාමරාගයෙන් ඇවිසැගත් කාමරාගයෙන් මැඩුනු සිතින් වෙසේ නම්, උපන් කාමරාගයාගේ යථාභූත නිඃසරණය නොදන්නේ නම්, ආත්මාර්ථය ද ... පරාර්ථය ද ... උභයාර්ථය ද ... එ සමයෙහි යථාවයෙන් නොදන්නේ ය, නොදක්නේ ය. දීර්ඝරාත්‍රයෙහි සජ්ඣායනා කළ මන්ත්‍රයෝ ද නොවැටහෙත්, සජ්ඣායනා නො කළ මන්ත්‍රයෝ පළමුව මැයි.

තවද බ්‍රාහමණය, යම් කලෙක ව්‍යාපාදයෙන් ඇවිසැගත් ව්‍යාපාදයෙන් මැඩුනු සිතින් වෙසේ නම්, උපන් ව්‍යාපාදයාගේ නිස්සරණය ද තත්වූ පරිදි නොදන්නේ නම්, ආත්මාර්ථය ද ... පරාර්ථය ද ... උභයාර්ථය ද එසමයෙහි තත්වූ පරිදි නොදන්නේ ය, නොදක්නේ ය. දීර්ඝරාත්‍රයෙහි සවාධ්‍යායී කෘත මන්ත්‍රයෝ ද නො වැටහෙත්. අසවාධ්‍යායීකෘතමන්ත්‍රයෝ පළමුව මැයි. බ්‍රාහමණය, යම්සේ ගින්නෙන් තැවුනු කකාළ උණුසුම් වූ දියබඳනෙක් වේ නම්, එහි චක්ෂුර්මත් පුරුෂයෙක් සවකීය මුඛ නිමිත්ත පිරික්සන්නේ තත්වූ පරිදි නොදන්නේ ය, නොදක්නේ ය. බ්‍රාහමණය, එපරිද්දෙන් ම යම් කලෙක්හි ව්‍යාපාදයෙන් ඇවිසැගත් ව්‍යාපාදයෙන් මැඩුනු සිතින් වෙසේ නම්, උපන් ව්‍යාපාදයාගේ නිඃසරණයත් තත්වූ පරිදි කොට නොදන්නේ නම්, ආත්මාර්ථය ද ... පරාර්ථය ද ... උභයාර්ථය ද එසමයෙහි තත්වූ පරිදි නො දන්නේ ය. නොදක්නේ ය. දීර්ඝරාත්‍රයෙහි අධ්‍යයන කළ වෙදමන්ත්‍රයෝ ද නො වැටහෙත්, අධ්‍යයන නො කළ මන්ත්‍රයෝ පළමුව මැයි.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති ථීනමිද්ධපරෙතෙන, උප්පන්නස්ස ච ථීනමිද්ධස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතා'පි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථා'පි බ්‍රාහ්මණ, උදපත්තො සෙවාලපණකපරියොනද්ධො, තත්‍ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං නප්පජානෙය්‍ය, නපස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති ථීනමිද්ධපරෙතෙන, උප්පන්නස්ස ච ථීනමිද්ධස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතා'පි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති උද්ධච්චකුක්කුච්චපරෙතෙන, උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතා'පි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො වාතෙරිතො චලිතො භන්තො ඌමිජාතො, තත්‍ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං නප්පජානෙය්‍ය, න පස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති උද්ධච්චකුක්කුච්චපරෙතෙන, උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති විචිකිච්ඡාපරෙතෙන, උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං නප්පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො ආවිලො ලුළිතො කලලීභූතො අන්ධකාරෙ නික්ඛිත්තො, තත්‍ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං නප්පජානෙය්‍ය, නපස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති විචිකිච්ඡාපරෙතෙන, උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං නප්පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නප්පජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා.

තවද බ්‍රාහ්මණය, යම් කලෙක්හි ථිනමිද්ධයෙන් වැතිරගත් ථිනමිද්ධයෙන් මැඩුනු සිතින් වෙසේ නම්, උපන් ථිනමිද්ධයාගේ යථාභූත නිඃසරණයත් නොදන්නේ ය. ආත්මාර්ථය ද ... පරාර්ථය ද ... උභයාර්ථය ද එසමයෙහි යථාභූතයෙන් නොදන්නේ ය, නොදක්නේය. දීර්ඝරාත්‍රයෙහි අධ්‍යයන කළ මන්ත්‍රයෝ නො වැටහෙත්. අධ්‍යයන නො කළ මන්ත්‍රයෝ කැල මැයි. බ්‍රාහ්මණය, යම්සේ සෙවෙලින් හා පෙළින් හා වැතිරගත් දියබඳුනෙක් වේ නම්, එහි චක්ෂුර්මත් පුරුෂයෙක් සවකීය මුඛනිමිත්ත පිරික්සන්නේ තත්වූ පරිදි නොදන්නේ ය, නොදක්නේ ය. බ්‍රාහ්මණය, එපරිද්දෙන් ම යම් කලෙක්හි ථිනමිද්ධයෙන් ඇවිසැගත් ථිනමිද්ධයෙන් මැඩුනු සිතින් වෙසේ නම්, උපන් ථිනමිද්ධයාගේ නිඃසරණයත් තත්වූ පරිදි නො දන්නේ ය. ආත්මාර්ථය ද ... පරාර්ථය ද ... උභයාර්ථය ද එසමයෙහි තත්වූ පරිදි නො දන්නේ ය, නොදක්නේ ය. දීර්ඝරාත්‍රයෙහි හදාළ මන්ත්‍රයෝ ද නොවැටහෙත්, නොහදාළ මන්ත්‍රයෝ කැල මැයි.

තවද බ්‍රාහ්මණය, යම් කලෙක්හි උද්ධච්චකුක්කුච්චයෙන් වැළඳගත් උද්ධච්චකුක්කුච්චයෙන් මැඩුනු සිතින් වාසය කෙරේ නම්, උපන් උද්ධච්ච-කුක්කුච්චයාගේ නිඃසරණයත් තත්වූ පරිදි නොදන්නේ ය ආත්මාර්ථය ද ... පරාර්ථය ද උභයාර්ථය ද එසමයෙහි තත්වූ පරිදි නොදන්නේ ය, නො දක්නේ ය. දීර්ඝකාලයක් හදාළ මන්ත්‍රයෝ ද නොවැටහෙත්. නො හදාළ මන්ත්‍රයෝ නොවැටහෙති යනු කියනු කිම? බ්‍රාහ්මණය, වාතයෙන් කම්පිත වූ සැලුනු භ්‍රාන්ත වූ හටගත් රළ ඇති දියබඳුනෙක් යම්සේ නම්, එහි චක්ෂුර්මත් පුරුෂයෙක් සවකීය මුඛනිමිත්ත පිරික්සා බලනුයේ යථාභූතයෙන් නො දන්නේ ය, නොදක්නේ ය. බ්‍රාහ්මණය, එපරිද්දෙන් ම යම් කලෙක්හි උද්ධච්චකුක්කුච්චයෙන් වැතිරගත් උද්ධච්චකුක්කුච්චයෙන් මැඩුනු සිතින් වෙසේ නම්, උපන් උද්ධච්චකුක්කුච්චයාගේ නිඃසරණයත් තත්වූ පරිදි නොදන්නේ ය ... ආත්මාර්ථයත් ... පරාර්ථයත් ... උභයාර්ථයත් එසමයෙහි තත්වූ පරිදි නොදන්නේ ය, නොදක්නේ ය. දීර්ඝකාලයක් හදාළ මන්ත්‍රයෝ ද නොවැටහෙත්. නොහදාළ මන්ත්‍රයෝ නොවැටහෙති යනු කියනු කිම?

තවද බ්‍රාහ්මණය, යම් කලෙක විචිකිච්ඡායෙන් වැතිරගත්, විචිකිච්ඡායෙන් මැඩුනු සිතින් වෙසේ නම්, උපන් විචිකිච්ඡාවගේ නිඃසරණයත් තත්වූ පරිදි නොදන්නේ ය. ආත්මාර්ථයත් ... පරාර්ථයත් ... උභයාර්ථයත් එසමයෙහි තත්වූ පරිදි නොදන්නේ ය, නොදක්නේ ය. දිගුකලක් හදාළ වේදමන්ත්‍රයෝ ද නොවැටහෙත්. නොහදාළ මන්ත්‍රයෝ නොවැටහෙති යනු කියනු කවරේද? බ්‍රාහ්මණය, යම්සේ නොපහන්වූ කැළැඹුනු බොරවූ දියබඳුනෙක් අඳුරෙහි තබන ලදුයේ නම්, එහි ඇස් ඇති පුරුෂයෙක් සවකීය මුඛනිමිත්ත පරීක්‍ෂා කරණුයේ තත්වූ පරිදි නොදන්නේ ය, නොදක්නේ ය. බ්‍රාහ්මණය, එපරිද්-දෙන් ම යම් කලෙක විචිකිච්ඡායෙන් වැතිරගත් විචිකිච්ඡායෙන් මැඩුනු සිතින් වෙසේ නම්, උපන් විචිකිච්ඡාවගේ නිඃසරණයත් තත්වූ පරිදි නොදන්නේ ය. ආත්මාර්ථය ද ... පරාර්ථය ද ... උභයාර්ථය ද එසමයෙහි තත්වූ පරිදි නොදන්නේ ය, නොදක්නේ ය. දිගුකලක් හදාළ මන්ත්‍රයෝ ද නොවැටහෙත්. නොහදාළ මන්ත්‍රයෝ නොවැටහෙති යනු කියනු කිම?

යස්මිඤ්ච ඛො බ්‍රාහ්මණ, සමයෙ න කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති න කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ උදපත්තො අසංසට්ඨො ලාඛාය වා හලිද්දියා වා නීලියා වා මඤ්ජිට්ඨාය වා, තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං පජානෙය්‍ය පස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණ යස්මිං සමයෙ න කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති න කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ න ව්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති න ව්‍යාපාදපරෙතෙන, උප්පන්නස්ස ච ව්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො අග්ගිනා අසන්තත්තො අනුක්කට්ඨිතො[1] අනුස්සදකජාතො,[2] තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං පජානෙය්‍ය පස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ න ව්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති න ව්‍යාපාදපරෙතෙන, උප්පන්නස්ස ච ව්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති. පගෙව සජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ න ථිනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති න ථිනමිද්ධපරෙතෙන, උප්පන්නස්ස ච ථිනමිද්ධස්ස නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති. පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ උදපත්තො න සෙවාලපණකපරියොනද්ධො, තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං පජානෙය්‍ය, පස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ න ථිනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති න ථිනමිද්ධපරෙතෙන, උප්පන්නස්ස ච ථිනමිද්ධස්ස නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා.

1. අනුක්කුථිතො - මජසං, අනුක්කඨිතො සීමු 2. අනුසුමකජාතො - මජසං.

බ්‍රාහ්මණය, යම් කලෙක කාමරාගයෙන් නො වැහිරුගත් කාමරාගයෙන් නොමැඩුනු සිතින් වෙසේ නම්, උපන් කාමරාගයාගේ නිඃසරණයත් තත්වූ පරිදි දන්නේ නම්, ආත්මාර්ථය ද එසමයෙහි තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. පරාර්ථය ද එසමයෙහි තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. උභයාර්ථය ද එසමයෙහි තත්වූ පරිදි දන්නේය. දක්නේය. දීර්ඝරාත්‍රයෙහි නො හදාළ මන්ත්‍රයෝ ද වැටහෙත්, හදාළ මන්ත්‍රයෝ පළමුකොට මැයි. බ්‍රාහ්මණය, යම්සේ ලතුපැහැයෙන් වේවයි කසාපැහැයෙන් වේවයි නිල්පැහැයෙන් වේවයි මදටිය පැහැයෙන් වේවයි නොමුසු වූ දියබඳුනෙක් වේ නම්, එහි ඇස් ඇති පුරුෂයෙක් ස්වකීය මුඛනිමිත්ත පිරික්සා බලන්නේ තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. බ්‍රාහ්මණය, එසෙයින් ම යම් කලෙක්හි කාමරාගයෙන් නො ඇවිසැගත් කාමරාගයෙන් නොමැඩුනු සිතින් වෙසේ නම්, උපන් කාමරාග-යාගේ නිඃසරණයත් තත්වූ පරිදි දන්නේ නම්, ආත්මාර්ථයත් ... පරාර්ථයත් ... උභයාර්ථයත් එසමයෙහි තත්වූ පරිදි දන්නේය, දක්නේ ය. දිගුකලක් නොහදාළ මන්ත්‍රයෝ ද වැටහෙත්, හදාළ මන්ත්‍රයෝ පළමුකොට මැයි.

තවද බ්‍රාහ්මණය, යම් කලෙක ව්‍යාපාදයෙන් නොඇවිසැගත් ව්‍යාපාද යෙන් නොමැඩුනු සිතින් වෙසේ නම්, උපන් ව්‍යාපාදයාගේ නිඃසරණයත් තත්වූ පරිදි දන්නේ නම්, ආත්මාර්ථයත් ... පරාර්ථයත් ... උභයාර්ථයත් එසමයෙහි තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. දීර්ඝරාත්‍රයෙහි නොහදාළ මන්ත්‍රයෝ ද වැටහෙත්, හදාළ මන්ත්‍රයෝ පළමු කොට මැයි බ්‍රාහ්මණය, යම් සේ ගින්නෙන් නො තැවුනු නො පැසුනු උණුසුම් නොකළ දියබඳු-නෙක් වේ නම්, එහි ඇස් ඇති පුරුෂයෙක් ස්වකීය මුඛනිමිත්ත පිරික්සා බලනුයේ තත්වූ පරිදි දන්නේ ය. දක්නේ ය. බ්‍රාහ්මණය, එපරිද්දෙන් ම යම් කලෙක්හි ව්‍යාපාදයෙන් නො ඇසැවිගත් ව්‍යාපාදයෙන් නො මැඩුනු සිතින් වෙසේ නම්, උපන් ව්‍යාපාදයාගේ නිඃසරණයත් තත්වූ පරිදි දන්නේ නම්, ආත්මාර්ථයත් ... පරාර්ථයත් ... උභයාර්ථයත් එසමයෙහි තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. දිගුකලක් නොහදාළ මන්ත්‍රයෝ ද වැටහෙත්, හදාළ මන්ත්‍රයෝ පළමු මැයි.

තවද බ්‍රාහ්මණය, යම් කලෙක්හි ථිනමිද්ධයෙන් නො වැහිරුගත් ථිනමිද්ධයෙන් නො මැඩුනු සිතින් වෙසේ ද, උපන් ථිනමිද්ධයාගේ නිඃසරණ-යත් තත්වූ පරිදි දන්නේ ද, එසමයෙහි ආත්මාර්ථයත් ... පරාර්ථයත් ... උභයාර්ථයත් තත්වූ පරදි දන්නේ ය, දක්නේ ය. දීර්ඝරාත්‍රයෙහි නොහදාළ මන්ත්‍රයෝ ද වැටහෙත්, හදාළ මන්ත්‍රයෝ පළමු මැයි. බ්‍රාහ්මණය, යම් සේ සෙවෙලින් හා පෙඳින් නො වැතුරුණු දියබඳුනෙක් වේ නම්, එහි චක්ඛුර්මත් පුරුෂයෙක් ස්වකීය මුඛනිමිත්ත පිරික්සා බලන්නේ තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. බ්‍රාහ්මණය, එපරිද්දෙන් ම යම් කලෙක්හි ථිනමිද්ධයෙන් නො වැතුරුණු ථිනමිද්ධයෙන් නො මැඩුනු සිතින් වෙසේ නම්, උපන් ථිනමිද්ධ-යාගේ නිඃසරණයත් තත්වූ පරිදි දන්නේ නම්, එසමයෙහි ආත්මාර්ථයත් ... පරාර්ථයත් ... උභයාර්ථයත් තත්වූ පරිදි දන්නේ ය. දක්නේ ය. දිගුකලක් නොහදාළ මන්ත්‍රයෝද වැටහෙත්, හදාළ මන්ත්‍රයෝ පළමු මැයි.

පුන ච පරං බ්‍රාහමණ, යස්මිං සමයෙ න උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන, චෙතසා විහරති න උද්ධච්චකුක්කුච්චපරෙතෙන, උප්පන්නස්ස ච උද්ධච්ච-කුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහමණ, උදපත්තො න වාතෙරිතො න චලිතො න භන්තො න ඌමිජාතො, තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං පජානෙය්‍ය පස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහමණ, යස්මිං සමයෙ න උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති න උද්ධච්චකුක්කුච්ච පරෙතෙන, උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චකුච්චස්ස නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි -පෙ- පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහමණ, යස්මිං සමයෙ න විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති න විචිකිච්ඡාපරෙතෙන, උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහමණ උදපත්තො අච්ඡො විප්පසන්නො අනාවිලො ආලොකෙ නික්ඛිත්තො, තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං පජානෙය්‍ය පස්සෙය්‍ය. එවමෙව ඛො බ්‍රාහමණ, යස්මිං සමයෙ න විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති න විචිකිච්ඡා පරෙතෙන, උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං පජානාති, අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා

අයං ඛො බ්‍රාහමණ හෙතු, අයං පච්චයො, යෙනෙකදා දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. අයං පන බ්‍රාහමණ හෙතු, අයං පච්චයො, යෙනෙකදා[1] දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතාති.

අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

---
1 යෙන කදාචි - මජසං

තවද බ්‍රාහමණය, යම් කලෙක උද්ධච්චකුක්කුච්චයෙන් නොවැතිරුගත් උද්ධච්චකුක්කුච්චයෙන් නොමැඩුනු සිතින් වෙසේ නම්, උපන් උද්ධච්ච-කුක්කුච්චයාගේ නිඃසරණයත් තත්වූ පරිදි දන්නේ නම්, එසමයෙහි ආත්මාර්ථයත් ... පරාර්ථයත් ... උභයාර්ථයත් තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. දිගුකලක් හදාළ මන්ත්‍රයෝ ද වැටහෙත්, නො හදාළ මන්ත්‍රයෝ පළමු කොට මැයි. බ්‍රාහමණය, යම්සේ වාතයෙන් කම්පිත නොවූ නො සසල නො බැමුනු හටගත් රළ නැති දියබඳුනෙක් වේ නම්, එහි චක්ෂුර්මත් පුරුෂයෙක් සවකීය මුඛනිමිත්ත පිරික්සාබලනුයේ තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. බ්‍රාහමණය, එපරිද්දෙන් ම යම් කලෙක්හි උද්ධච්ච කුක්කුච්චයෙන් නො වැතිරුගත් උද්ධච්චකුක්කුච්චයෙන් නො මැඩුනු සිතින් වෙසේ නම්, උපන් උද්ධච්චකුක්කුච්චයාගේ නිඃසරණයත් තත්වූ පරිදි දන්නේ නම්, එසමයෙහි ආත්මාර්ථයත් ... පරාර්ථයත් ... උභයාර්ථයත් තත්වූ පරිදි දන්නේය, දක්නේය. දිගුකලක් නොහදාළ මන්ත්‍රයෝ ද වැටහෙත්, හදාළ මන්ත්‍රයෝ පළමු කොට මැයි.

තවද බ්‍රාහමණය, යම් කලෙක විචිකිච්ඡායෙන් නො වැතිරුගත් විචිකිච්ඡායෙන් නො මැඩුනු සිතින් වෙසේ නම්, උපන් විචිකිච්ඡාවගේ නිඃසරණයත් තත්වූ පරිදි දන්නේ නම්, එසමයෙහි ආත්මාර්ථයත් තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. එසමයෙහි පරාර්ථයත් තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. එසමයෙහි උභයාර්ථයත් තත්වූ පරිදි දන්නේ ය. දක්නේ ය. දීඝීරාත්‍රයෙහි නො හදාළ මන්ත්‍රයෝ ද වැටහෙත්, හදාළ මන්ත්‍රයෝ පළමු කොට මැයි බ්‍රාහමණය, යම් සේ පවිත්‍ර විප්‍රසන්න වූ අනාවිල වූ දියබඳුනෙක් ආලොකයෙහි නික්ෂිප්ත වූයේ නම්, එහි ඇස් ඇති පුරුෂයෙක් සවකීය මුඛනිමිත්ත පිරික්සාබලන්නේ තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. බ්‍රාහමණය, එපරිද්දෙන් ම යම් කලෙක විචිකිච්ඡායෙන් නො වැතිරුගත් විචිකිච්ඡායෙන් නො මැඩුනු සිතින් වෙසේ නම්, උපන් විචිකිච්ඡාවගේ නිඃසරණයත් තත්වූ පරිදි දන්නේ නම්, එසමයෙහි ආත්මාර්ථයත් තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. එසමයෙහි පරාර්ථයත් තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. එසමයෙහි උභයාර්ථයත් තත්වූ පරිදි දන්නේ ය, දක්නේ ය. දීඝීරාත්‍රයෙහි නොහදාළ මන්ත්‍රයෝ ද වැටහෙත්, හදාළ මන්ත්‍රයෝ පළමු-කොට මැයි.

බ්‍රාහමණය, යම් හෙයෙකින් ඇතැම් කලෙක දීඝරාත්‍රයෙහි හදාළ වූ ද මන්ත්‍රයෝ නො වැටහෙත් නම්, නොහදාළ මන්ත්‍රයෝ පළමුකොටම නො වැටහෙත් නම්, මෙ හෙතුය මෙ ප්‍රත්‍යය යි. බ්‍රාහමණය, යම් හෙයෙකින් දීඝීරාත්‍රයෙහි නොහදාළ මන්ත්‍රයෝත් ඇතැම් කලෙක වැටහෙත් නම්, හදාළ මන්ත්‍රයෝ පළමු කොට ම වැටහෙත් නම්, මෙ හෙතුය, මෙ ප්‍රත්‍යයයි.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත ය, භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත ය ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් කොට දිවිහිම්ව සරණගිය උවසු කොට මා ධරණ සේක්වායි.

## 5. 4. 5. 4.

## [කාරණපාලි සුත්තං]

**45.** එකං සමයං භගවා වෙසාලියං විහරති, **මහාවනෙ කූටාගාරසාලායං.** තෙන ඛො පන සමයෙන. **කාරණපාලී** බ්‍රාහ්මණො ලිච්ඡවීනං කම්මන්තං කාරෙති.

අද්දසා ඛො කාරණපාලී බ්‍රාහ්මණො **පිඞ්ගියානිං** බ්‍රාහ්මණං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන[1] පිඞ්ගියානිං බ්‍රාහ්මණං එතදවොච:

හන්ද කුතො නු භවං පිඞ්ගියානී ආගච්ඡති දිවාදිවස්සාති.

ඉතොහං භො ආගච්ඡාමි, සමණස්ස ගොතමස්ස සන්තිකාති.

තං කිං මඤ්ඤති භවං පිඞ්ගියානී සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං, පණ්ඩිතො මඤ්ඤෙති?

කො චා හං භො, කො ච සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානිස්සාමි. සොපි නූනස්ස තාදිසොව යො සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානෙය්‍යාති.

උළාරාය ඛලු භවං පිඞ්ගියානී සමණං ගොතමං පසංසාය පසංසතීති.

කො චාහං භො, කො ච සමණං ගොතමං පසංසිස්සාමි, පසත්ථපසත්ථොව[2] සො භවං ගොතමො සෙට්ඨො දෙවමනුස්සානන්ති.

කිං පන භවං පිඞ්ගියානී අත්ථවසං සම්පස්සමානො සමණෙ ගොතමෙ එවං අභිප්පසන්නො?ති.

සෙය්‍යථාපි භො පුරිසො අග්ගරසපරිතිත්තො න අඤ්ඤෙසං හීනානං රසානං පිහෙති, එවමෙව ඛො භො, යතො යතො තස්ස භොතො ගොතමස්ස ධම්මං සුණාති: යදි සුත්තසො යදි ගෙය්‍යසො යදි වෙය්‍යාකරණසො යදි අබ්භුතධම්මසො, තතො තතො න අඤ්ඤෙසං පුථුසමණබ්‍රාහ්මණප්පවාදානං පිහෙති. (1)

සෙය්‍යථාපි භො පුරිසො ජිඝච්ඡාදුබ්බල්‍යපරෙතො මධුපිණ්ඩිකං අධිගච්ඡෙය්‍ය, සො යතො යතො සායෙථ, ලභතෙව සාදුරසං අසෙචනකං, එවමෙව ඛො භො, යතො යතො තස්ස භොතො ගොතමස්ස ධම්මං සුණාති: යදි සුත්තසො යදි ගෙය්‍යසො යදි වෙය්‍යාකරණසො යදි අබ්භුතධම්මසො, තතො තතො ලභතෙව අත්තමනතං, ලභති චෙතසො පසාදං. (2)

සෙය්‍යථාපි භො පුරිසො චන්දනඝටිකං අධිගච්ඡෙය්‍ය හරිචන්දනස්ස වා ලොහිතචන්දනස්ස වා, සො යතො යතො ඝායෙථ, යදි මූලතො යදි මජ්ඣතො යදි අග්ගතො, අධිගච්ඡතෙව සුරභිගන්ධං අසෙචනකං, එවමෙව ඛො භො, යතො යතො තස්ස භොතො ගොතමස්ස ධම්මං සුණාති: යදි සුත්තසො යදි ගෙය්‍යසො යදි වෙය්‍යාකරණසො යදි අබ්භුතධම්මසො, තතො තතො අධිගච්ඡති පාමොජ්ජං, අධිගච්ඡති සොමනස්සං. (3)

සෙය්‍යථාපි භො පුරිසො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, තස්ස කුසලො භිසක්කො ඨානසො ආබාධං නීහරෙය්‍ය, එවමෙව ඛො භො, යතො යතො තස්ස භොතො ගොතමස්ස ධම්මං සුණාති: යදි සුත්තසො යදි ගෙය්‍යසො යදි වෙය්‍යාකරණසො යදි අබ්භුතධම්මසො, තතො තතො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා අබ්භත්ථං ගච්ඡන්ති. (4)

---

1. දිස්වා - මජ්ඣං  2. පසත්ථප්පසත්ථොව - මජ්ඣං

## 5. 4. 5. 4.

## [කාරණපාලි සූත්‍රය]

45. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර** අසල **මහාවන කූටාගාරශාලායෙහි** වැඩ වසන සේක. එසමයෙහි **කාරණපාලි** බ්‍රාහමණ ලිච්ඡවීන්ගේ නවකර්මාන්ත කරවයි.

කාරණපාලි බ්‍රාහමණ දුරදී මැ එන **පිඞ්ගියානී** බ්‍රාහමණයා දුටුයේ ය. දැක පිඞ්ගියානී බ්‍රාහමණහට මෙල කීය:

භවත් පිඞ්ගියානී ඉතා දවල් කොහි සිට එන්නේදැ යි?

භවත්නි, මම මේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ වෙතින් එමි යි.

භවත් පිඞ්ගියානී තෙමේ එ භවත් ගෞතමයන් වහන්සේගේ ප්‍රඥ-වෛයක්ත්‍යය කිමැ යි හඟනේ ද? හේ පණ්ඩිතයැ යි හඟනේ දැ? යි.

භවත්නි, මම කවරෙකිම්, කිසෙයින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ප්‍රඥ හා වියත්කම් දනිම් දැ? යි. යමෙක් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ප්‍රඥවෛයක්ත්‍යය දන්නේ නම්, හේ එකැතින් එබඳු ම වේ යයි.

භවත් පිඞ්ගියානී උදර ප්‍රශංසායෙන් මහණගොයුම්හු පසස්නේ ය යි.

භවත්නි, මම කවරෙකිම්, කිසෙයින් මහණගොයුම්හු පසස්නෙම් ද? දෙවමනුෂ්‍යයනට ශ්‍රෙෂ්ඨ වූ ඒ භවත් ගෞතමයන් වහන්සේ ප්‍රශස්ත ගුණයන් විසින් ම ප්‍රශස්තයහ.

භවත් පිඞ්ගියානී කවර කරුණක් දක්නේ මහණගොයුම්හු කෙරෙහි මෙ සෙයින් අභිප්‍රසන්න වේ දැ?'' යි.

භවත්නි, යම් පරිද්දෙකින් අග්‍රරසයන්හි පරිතෘප්ත පුරුෂයෙක් අන්‍ය හීනරසයනට කැමති නො වේ ද, භවත්නි, එ පරිද්දෙන් ම ඒ භවත් ගෞතමයන් වහන්සේගේ ධර්මය සූත්‍ර විසින් හෝ ගෙය විසින් හෝ වෛයාකරණ විසින් හෝ අද්භූතධර්ම විසින් හෝ සූත්‍රාදි යම් යම් ම කරුණෙකින් අසා නම්, එ එ කරුණෙන් අන්‍ය වූ නානා ශ්‍රමණ බ්‍රාහමණයන්ගේ (ලබ්ධිසඞ්ඛ්‍යාත) ප්‍රවාදයන් නො පතාමැයි. (1)

භවත්නි, යම් සේ පුරුෂයෙක් ජිඝත්සායෙන් හා දුර්වලභාවයෙන් මැඩුනේ මීවදයක් ලබානම්, හේ එය යම් මැ තැනෙකින් එහි රස විඳුනේ නම් අතෘප්තිකර මියුරු රස ලබන්නේ ම ය. භවත්නි, එසෙයින් ම සූත්‍ර විසින් වේව යි ගෙය විසින් වේව යි වෛයාකරණ විසින් වේව යි අද්භූත ධර්ම විසින් වේවයි යම් ම කරුණෙකින් එ භවත් ගෞතමයන් වහන්සේගේ ධර්මය අසා නම්, එ එ කරුණින් සොම්නස ලබා මැයි. චිත්තප්‍රසාදය ලබා මැයි. (2)

පින්වත, යම් සේ පුරුෂයෙක් සුදුසඳුන් වේවයි, රත්සඳුන් වේවයි, සඳුන්ගැටක් ලබා නම්, හේ එය මුලින් වේවයි මැදින් වේවයි අගින් වේවයි යම් ම තැනෙකින් ආඝ්‍රාණය කෙරේ නම්, අතෘප්තිකර සුගන්ධය ලබාම ය. පින්වත, එසෙයින් ම සූත්‍ර විසින් වේවයි ගෙය විසින් වේවයි වෛයාකරණ විසින් වේවයි අද්භූතධර්ම විසින් වේවයි යම් ම අයුරෙකින් එ භවත් ගෞතම-යන් වහන්සේගේ ධර්මය අසා නම්, එ එ අයුරින් ප්‍රාමොද්‍යය ලබාම ය. සොම්නස ලබයි. (3)

පින්වත, යම් සේ රොගී වූ දුකට පත් වූ දැඩි ගිලන්බව් ඇති පුරුෂයෙක් වේ ද, දක්ෂ වෛද්‍යයෙක් ඔහුගේ රොගය කෙණෙකින් බැහැරලන්නේ නම්, පින්වත එ පරිද්දෙන් ම සූත්‍ර විසින් හෝ ගෙය විසින් හෝ වෛයාකරණ විසින් හෝ අද්භූතධර්ම විසින් හෝ යම් ම කරුණෙකින් එ භවත් ගෞතම-යන් වහන්සේගේ ධර්මය අසා නම්, එ එ කරුණෙන් ම ශොක පරිදෙව දුඃඛදෞර්මනස්‍ය උපායාසයෝ මොනොවට අස්තයට යන්නාහ. (4)

සෙය්‍යථාපි භො පොක්ඛරණී අච්ඡොදකා සාතොදකා සීතොදකා සෙතකා සුපතිත්ථා රමණීයා, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො, සො තං පොක්ඛරණිං ඔගාහෙත්වා නහාත්වා ච[1] පීත්වා ච[2] සබ්බදරථකිලමථපරිළාහං පටිප්පස්සම්භෙය්‍ය. එවමෙව ඛො භො, යතො යතො තස්ස භොතො ගොතමස්ස ධම්මං සුණාති යදි සුත්තසො යදි ගෙය්‍යසො යදි වෙය්‍යාකරණසො යදි අබ්භුතධම්මසො, තතො තතො සබ්බදරථකිලමථපරිළාහා පටිප්පස්සම්භන්තී'ති. (5)

එවං වුත්තෙ **කාරණපාලි** බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණජාණුමණ්ඩලං පථවියං නිහන්ත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං උදානං උදානෙසි: "නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්සා"ති.

අභික්කන්තං භො පිඞ්ගියානී, අභික්කන්තං භො පිඞ්ගියානී. සෙය්‍යථාපි භො පිඞ්ගියානී, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති, එවමෙවං භොතා පිඞ්ගියානිනා අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භො පිඞ්ගියානී තං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මං ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං පිඞ්ගියානී ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 5. 4. 5. 5.

## [පිඞ්ගියානී සුත්තං]

**46**. එකං සමයං භගවා **වෙසාලියං** විහරති, **මහාවනෙ කූටාගාරසාලායං**. තෙන ඛො පන සමයෙන **පඤ්චමත්තානි ලිච්ඡවිසතානි** භගවන්තං පයිරුපාසන්ති. අප්පෙකච්චෙ ලිච්ඡවී නීලා හොන්ති නීලවණ්ණා නීලවත්ථා නීලාලඞ්කාරා. අප්පෙකච්චෙ ලිච්ඡවී පීතා හොන්ති පීතවණ්ණා පීතවත්ථා පීතාලඞ්කාරා. අප්පෙකච්චෙ ලිච්ඡවී ලොහිතකා හොන්ති ලොහිතකවණ්ණා ලොහිතකවත්ථා ලොහිතකාලඞ්කාරා. අප්පෙකච්චෙ ලිච්ඡවී ඔදාතා හොන්ති ඔදාතවණ්ණා ඔදාතවත්ථා ඔදාතාලඞ්කාරා. ත්‍යාස්සුදං භගවා අතිරොචති වණ්ණෙන චෙව යසසා ච.

අථ ඛො **පිඞ්ගියානී** බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: පටිභාති මං භගවා, පටිභාති මං සුගතාති.

පටිභාතු තං පිඞ්ගියානීති භගවා අවොච.

---

1. නහාත්වාච - මජසං 2. පිවිත්වාච - මජසං

පින්වත, යම් සේ පහන් දියැති මියුරු දියැති සිහිල් දියැති සුදු වැලිතලා ඇති මනා තොටු ඇති සිත්කලු පොකුණෙක් වේ නම්, වැලින් ගිමින් තැවුනු ගිමින් මැඩුනු කලාන්ත වූ තෘෂිත වූ පැන්බොනු කැමති පුරුෂයෙක් එයි, හෙ එ පොකුණට බැස පැන් සනහා පැන් බී හැම දරථකලමථුපරිදාහය සන්සිඳුවන්නේ ය, පින්වත, එසෙයින් ම සූත්‍ර විසින් වේවයි ගෙය විසින් වේවයි වෛයාකරණ විසින් වේවයි අද්භූතධර්ම විසින් වේවයි යම් ම කරුණෙකින් එ භවත් ගෞතමයන් වහන්සේගේ ධර්මය අසා නම්, එ එ කරුණෙන් සර්දරථකලමථුපරිදාහයෝ සන්හිඳෙන්නාහයි. (5)

මෙසේ කී කල්හි **කාරණපාලි** බ්‍රාහමණ හුනස්නෙන් නැඟී උතුරුසළුව එකස් කොටලා දකුණුදණමඩල පොළොව්හි පිහිටුවා භාග්‍යවතුන් වහන්සේ දසට ප්‍රණාම කොට තෙවරක් උදන් ඇනී ය: "එ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා''යි.

භවත් පිඞ්ගියානියෙනි, ඉතා කාන්ත වෙයි. භවත් පිඞ්ගියානියෙනි, ඉතා කාන්ත වෙයි. භවත් පිඞ්ගියානියෙනි, යම් සේ යටිහුරු කොට තබනලද්දක් උඩුහුරු කොට තබන්නේ හෝ වේ ද, පිළිසන් වූවක් විවෘත කරන්නේ හෝ වේ ද, මංමුළාවූවකුහට මඟ කියන්නේ හෝ වේ ද, 'චක්ෂුර්මත්හු රූ දක්නාහ'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දල්වන්නේ ද, එලෙසින් ම භවත් පිඞ්ගියානිහු විසින් නන් අයුරින් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේ ය. භවත් පිඞ්ගියානියෙනි, තෙල මම ඒ භවත් ගෞතමයන් වහන්සේ හා ධර්මය හා භික්ෂුසඞ්ඝයා හා සරණකොට යෙමි. භවත් පිඞ්ගියානී තෙමේ අද පටන් කොට මා දිවිහිම්ව (තුනුරුවන්) සරණගිය උපාසක කොට ධරාවායි.

## 5. 4. 5 5.

## [පිඞ්ගියානී සූත්‍රය]

**46**. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **වෛශාලී** නගරාසන්නයෙහි වූ **මහාවනයෙහි කූටාගාරසාලායෙහි** වැඩවසන සේක. එසමයෙහි පන්සියක් පමණ **ලිච්ඡවීහු** භාග්‍යවතුන් වහන්සේ පයුර්පාසනා කරත්. ඇතැම් ලිච්ඡවීහු නීලවූවාහු නිල්පැහැ ඇත්තාහු නිල්වත් ඇත්තාහු නිල් අබරණ ඇතියාහු වෙත්. ඇතැම් ලිච්ඡවීහු පීත (කහ) වූවාහු පීතවර්ණ ඇත්තාහු පීතවස්ත්‍ර හැඳියාහු පීතාලඞ්කාර ඇතියාහු වෙති. ඇතැම් ලිච්ඡවීහු ලොහිත (ලේ පැහැ) වූවාහු ලොහිත වර්ණ ඇත්තාහු ලොහිතවස්ත්‍ර ඇත්තාහු ලොහිතාලඞ්කාර ඇතියාහු වෙත්. ඇතැම් ලිච්ඡවීහු අවදාත (සුදු) වූවාහු අවදාතවර්ණ ඇත්තාහු අවදාතවස්ත්‍ර ඇත්තාහු අවදාතාලඞ්කාර ඇත්තාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේ වර්ණයෙනුදු යශසිනුදු ඔවුන් හැම ඉක්මවා බබලන සේක.

ඉක්බිති **පිඞ්ගියානී** බ්‍රාහමණ හුනස්නෙන් නැඟී උතුරු සළුව එකස් කොටලා භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ වැඳ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළෙය: "භාග්‍යවතුන් වහන්ස, මට වැටහෙයි, සුගතයන් වහන්ස, මට වැටහේ'' යයි.

පිඞ්ගියානිය, තට වැටහේවායි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

අථ ඛො පිඞ්ගියානී බ්‍රාහ්මණො භගවතො සම්මුඛා සාරුප්පාය ගාථාය අභිත්ථවි:

99. පදුමං[1] යථා කොකනදං[2] සුගන්ධං
පාතො සියා ඵුල්ලමවීතගන්ධං,
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්තමාදිච්චමිවන්තලික්ඛෙති.

අථ ඛො තෙ ලිච්ඡවී පඤ්චහි උත්තරසඞ්ගසතෙහි පිඞ්ගියානිං බ්‍රාහ්මණං අච්ඡාදෙසුං. අථ ඛො පිඞ්ගියානී බ්‍රාහ්මණො තෙහි පඤ්චහි උත්තරාසඞ්ගසතෙහි භගවන්තං අච්ඡාදෙසි.

අථ ඛො භගවා තෙ ලිච්ඡවී එතදවොච:

පඤ්චන්නං ලිච්ඡවී, රතනානං පාතුභාවො දුල්ලභො ලොකස්මිං. කතමෙසං පඤ්චන්නං:

තථාගතස්ස අරහතො සම්මා සම්බුද්ධස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසෙතා පුග්ගලො දුල්ලභො ලොකස්මිං. තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසිතස්ස විඤ්ඤාතා පුග්ගලො දුල්ලභො ලොකස්මිං. තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසිතස්ස විඤ්ඤාතා ධම්මානුධම්මපටිපන්නො පුග්ගලො දුල්ලභො ලොකස්මිං. කතඤ්ඤූ කතවෙදී පුග්ගලො දුල්ලභො ලොකස්මිං.

ඉමෙසං ඛො ලිච්ඡවී පඤ්චන්නං රතනානං පාතුභාවො දුල්ලභො ලොකස්මින්ති

## 5. 4. 5. 6.

## [මහාසුපින සුත්තං]

**[සංවණ්ණිනිදානං]**

**46**. තථාගතස්ස භික්ඛවෙ, අරහතො සම්මා සම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො පඤ්ච මහාසුපිනා පාතුරහෙසුං. කතමෙ පඤ්ච.

තථාගතස්ස භික්ඛවෙ, අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො අයං මහාපථවි මහාසයනං අහොසි. හිමවා පබ්බතරාජා බිම්බොහනං[3] අහොසි. පුරත්ථිමෙ සමුද්දෙ වාමො හත්ථො ඔහිතො අහොසි. පච්ඡිමෙ සමුද්දෙ දක්ඛිණො හත්ථො ඔහිතො අහොසි. දක්ඛිණෙ සමුද්දෙ උභො පාදා ඔහිතා අහෙසුං. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො අයං පඨමො මහාසුපිනො පාතුරහොසි.

පුන ච පරං භික්ඛවෙ තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො තිරියා නාම තිණජාති නාභියා උග්ගන්ත්වා නභං ආහච්ච ඨිතා අහොසි. තථාගතස්ස භික්ඛවෙ, අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො අයං දුතියො මහාසුපිනො පාතුරහොසි.

පුන චපරං භික්ඛවෙ, තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො සෙතා කිමී කණ්හසීසා පාදෙහි උස්සක්කිත්වා යාව ජාණුමණ්ඩලං පටිච්ඡාදෙසුං. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො අයං තතියො මහාසුපිනො පාතුරහොසි.

---

1. පදමං - සයා. 2. කොකනුදං - සයා 3. බිබ්බොහනං - මජසං.

ඉක්බිති පිඞ්ගියානී බ්‍රාහමණ භාග්‍යවතුන් හමුවෙහි සාරූප්‍ය ගාථායෙන් ස්තොත්‍ර කෙළේය:

99. "උදෑසන්හි පිපි නොහැළ සුවඳැති කොකනද සඞ්ඛ්‍යාත සුවඳවත් රත්පියුමෙක් යම්සේ වේ නම්, එසේ වූ අහස්හි තෙවූනා හිරුමෙන් වොරදනා අඞ්ගීරස (සිරුරු රස් විහිදෙන) බුදුන් බලව"යි.

එකල්හි එ ලිච්ඡවීහු පන්සියක් උතුරුසළුයෙන් පිඞ්ගියානී බමුණු පිදූහ. එකල්හි පිඞ්ගියානී බ්‍රාහමණ එ උතුරු සළු පන්සියෙන් භාග්‍යවතුන් වහන්සේ පිදී.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එ ලිච්ඡවීනට තෙල වදාළසේක:

ලිච්ඡවීනි, ලොව්හි රතනපස්දෙනකුන්ගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වෙයි. කවර පස්දෙනකුන්ගේය යත්:

තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන්ගේ ලොව්හි ප්‍රාදුර්භාවය දුර්ලභ වෙයි. තථාගත ප්‍රවිදිත වූ ධර්මවිනය දෙසන පුද්ගල ලොව්හි දුර්ලභ වෙයි. දෙසන ලද තථාගත ප්‍රවිදිත ධර්මවිනය දැනගන්නා පුද්ගල ලොව්හි දුර්ලභ වෙයි. දෙසන ලද තථාගත ප්‍රවිදිත ධර්මවිනය දැනගත් ධර්මානුධර්මයෙහි පිළිපන් පුද්ගල ලොව්හි දුර්ලභ වෙයි. කෘතඥවූ කෘතවේදී පුද්ගල ලොකයෙහි දුර්ලභ වෙයි.

ලිච්ඡවීනි, ලොකයෙහි මේ පඤ්චරතනයන්ගේ ප්‍රාදුර්භාවය දුර්ලභ වේ යයි.

**5. 4. 5. 6.**

**[මහාසුපින සූත්‍රය]**

**[සැවැත්නිදාන යි]**

**46**. මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන්ට සම්බොධියෙන් පූර්වයෙහි ම චතුස්සත්‍යාවබොධය නො කළ බොධිසත්ත්ව වූවන්ට ම පඤ්චමහාස්වප්න කෙනෙක් පහළවූහ. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන්ට සම්බොධියෙන් පූර්වයෙහි ම අභිසම්බුද්ධ නො වූ බොධිසත්ත්ව වූවන්ට ම මෙ මහපොළොව මහ යහන් විය, හිමවුපවුරද කන්වයින් විය. පැදුම් සමුදුරෙහි වම්අත තබන ලදුයේ (පැදුම් සක්වළමත පිහිටියේ) විය. පැළදිග සමුදුරෙහි දකුණත තබන ලදුයේ (පැළදිගැ සක්වළ මත පිහිටියේ) විය. දකුණු මුහුදෙහි උභයපාදයෝ තබන ලදහු දකුණු සක්වළමත පිහිටියහ. මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට සම්බොධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බොධිසත්ත්ව වූවන්ට ම මෙ ප්‍රථම මහාස්වප්නය පහළ විය.

තවද මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට සම්බොධියෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බොධිසත්ත්ව වූවනට ම **තිරිය** නම් තෘණජාතියෙක් (බබුස් තණ) නැබින් පැනනැඟී අහසැ පැතිරැ සිටියේ විය. මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට සම්බොධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බොධිසත්ත්ව වූවනට මැ මේ ද්විතීය මහාස්වප්නය පහළ විය.

තවද මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට සම්බොධියෙන් පූර්වයෙහි ම අභිසම්බුද්ධ නො වූ බොධිසත්ත්ව වූවනට ම කළුහිස් ඇති ශ්වෙත කෘමීහු (පණුවෝ) දෙපසින් නැඟී දණමඬුලු තෙක් වසා සිටගත්හ. මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට සම්බොධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බොධිසත්ත්ව වූවනට ම මෙ තෘතීය මහාස්වප්නය පහළ විය.

පුන ච පරං භික්ඛවෙ, තථාගතස්ස අරහතො සම්මා සම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො චත්තාරො සකුණා නානාවණ්ණා චතූහි දිසාහි ආගන්ත්වා පාදමූලෙ නිපතිත්වා සබ්බසෙතා සම්පජ්ජිංසු. තථාගතස්ස භික්ඛවෙ, අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො අයං චතුත්ථො මහාසුපිනො පාතුරහොසි.

පුනචපරං භික්ඛවෙ, තථාගතො අරහං සම්මා සම්බුද්ධො පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධො බොධිසත්තොව සමානො මහතො මීළ්හපබ්බතස්ස උපරූපරි චඞ්කමති අලිප්පමානො[1] මීළ්හෙන. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො අයං පඤ්චමො මහාසුපිනො පාතුරහොසි.

යම්පි භික්ඛවෙ, තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො අයං මහාපථවී මහාසයනං අහොසි, හිමවා පබ්බතරාජා බිම්බොහනං අහොසි, පුරත්ථිමෙ සමුද්දෙ වාමො හත්ථො ඔහිතො අහොසි, පච්ඡිමෙ සමුද්දෙ දක්ඛිණො හත්ථො ඔහිතො අහොසි, දක්ඛිණෙ සමුද්දෙ උභො පාදා ඔහිතා අහෙසුං, තථාගතෙන භික්ඛවෙ, අරහතා සම්මාසම්බුද්ධෙන අනුත්තරා සම්මාසම්බොධි අභිසම්බුද්ධා, තස්සා අභිසම්බොධාය අයං පඨමො මහාසුපිනො පාතුරහොසි.

යම්පි භික්ඛවෙ, තථාගතස්ස අරහතො සම්මා සම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො තිරියා නාම තිණජාති නාභියා උග්ගන්ත්වා නභං ආහච්ච ඨිතා අහොසි, තථාගතෙන භික්ඛවෙ, අරහතා සම්මාසම්බුද්ධෙන අරියො අට්ඨඞ්ගිකො මග්ගො අභිසම්බුජ්ඣිත්වා යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතො, තස්ස අභිසම්බොධාය අයං දුතියො මහාසුපිනො පාතුරහොසි.

යම්පි භික්ඛවෙ, තථාගතස්ස අරහතො සම්මා සම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො සෙතා කිමී කණ්හසීසා පාදෙහි උස්සක්කිත්වා යාව ජාණුමණ්ඩලා පටිච්ඡාදෙසුං, බහූ භික්ඛවෙ, ගිහී ඔදාතවසනා තථාගතං පාණුපෙතං සරණං ගතා, තස්ස අභිසම්බොධාය අයං තතියො මහාසුපිනො පාතුරහොසි.

යම්පි භික්ඛවෙ තථාගතස්ස අරහතො, සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො චත්තාරො සකුණා නානාවණ්ණා චතූහි දිසාහි ආගන්ත්වා පාදමූලෙ නිපතිත්වා සබ්බසෙතා සම්පජ්ජිංසු, චත්තාරො මෙ භික්ඛවෙ, වණ්ණා: ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා, තෙ තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අනුත්තරං විමුත්තිං සච්ඡිකරොන්ති, තස්ස අභිසම්බොධාය අයං චතුත්ථො මහාසුපිනො පාතුරහොසි.

---

1. අලිම්පමානො - සබ්බත්ථ.

තවද මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට සම්බෝධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවනට ම නීලාදි නන් පැහැ ඇති සතර ලිහිණි කෙනෙක් සිව්දිගින් අවුදු පාමුල හෙවැ සර්ශෙවතව ගියහ. මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට සම්බෝධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවනට ම මෙ සතරවන මහාසවපනය පහළ විය.

තවද මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයෝ සම්බෝධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවාහු ම මහාමීඝ (තියොදුන් වර්-වස්) පර්වතමස්තකයෙක්හි මීඝයෙන් නො තැවරෙමින් සක්මන් කරන්නාහ. මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට සම්බෝධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවනට ම මේ පස්වන මහා සවපනය පහළ විය.

මහණෙනි, යම්හෙයෙකින් තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට සම්බෝධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවනට ම මේ මහපොළොව මහ යහන් වී ද, හිමවත්පර්වතය කන්වයින් වී ද, පෙරදිග මහසයුරෙහි වම්අත තබන ලද වී ද, පැළදිග සයුරෙහි දකුණත තබන ලද වී ද, දකුණුමුහුදෙහි දෙපා තබන ලද වී ද, මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධතථාගතයන් වහන්සේ විසින් අනුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කරණලද නම් ඒ අභිසම්බෝධයට (සර්වඥතා ඥාන, අනාවරණ ඥාන ආදියට) (පූර්වනිමිත්ත වූ) මේ ප්‍රථම මහාසවපනය පහළ වීය.

මහණෙනි, යම්හෙයෙකින් අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයනට සම්බෝධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවනට නැබින් තිරිය නම් තෘණජාතියෙක් පැනනැගී අහස්හි පැතිරැ සිටියේ වී ද, මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගතයන් විසින් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය අවබෝධ කොට යම්තාක් (නුවණැති) දෙවිමිනිසුන් කෙරෙහි මොනොවට ප්‍රකාශ කරණ ලද නම්, ඒ ප්‍රකාශයාගේ අභිසම්බෝධයට (පෙරනිමිති වූ) මෙ දෙවන මහා සවපනය පහළ වීය.

තවද මහණෙනි, යම් හෙයෙකින් අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගතයන්ට සම්බෝධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවනට ම කළුහිස් ඇති සුදු කෘමිහු දෙපසින් නැගී දණමඩල තෙක් වසාසිටගත්හු නම්, මහණෙනි, සුදුවත් හඳනා බොහෝ ගිහියෝ තථාගතයන් දිවිහිම් කොට සරණ ගියාහු නම්, ඒ සරණගමනයාගේ අභිසම්බෝධයට මේ තෙවන මහාසවපනය පහළ විය.

තවද මහණෙනි, යම්හෙයෙකින් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ තථාගතයනට සම්බෝධියෙන් පූර්වයෙහි ම සිවුදිගින් නන්පැහැ ඇති ලිහිණියෝ සතරදෙ-නෙක් අවුත් අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්වයන්ගේ පාමුල්හි හෙව සර්ශෙවත වූවාහු නම්, මහණෙනි, ක්‍ෂත්‍රියයහ, බ්‍රාහ්මණයහ, වෛශ්‍යයහ, ශුද්‍රයහ යන මේ සතර වර්ණයෝ වෙත් නම් ඔහු ගිහිගෙන් නික්ම තථාගතප්‍රවිදිත වූ ධර්මවිනය සඞ්ඛ්‍යාත ශාසනයෙහි පැවිදිව අනුත්තර වූ විමුක්තිය සාක්‍ෂාත් කරත්නාහු නම්, ඒ අභිසම්බෝධයට මේ සතරවන මහාසවපනය පහළ විය.

යම්පි භික්ඛවෙ, තථාගතො අරහං සම්මාසම්බුද්ධො පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධො බොධිසත්තොව සමානො මහතො මීළ්හපබ්බතස්ස උපරූපරි චඞ්කමති අලිප්පමානො මීළ්හෙන, ලාභී භික්ඛවෙ, තථාගතො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, තඤ්ච තථාගතො අගථිතො[1] අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තස්ස අභිසම්බොධාය අයං පඤ්චමො මහා සුපිනො පාතුරහොසි.

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො ඉමෙ පඤ්ච මහා සුපිනා පාතුරහෙසුන්ති.

## 5. 4. 5. 7.

## [වස්සන්තරායසුත්තං]

[සාවත්ථිනිදානං]

**47.** පඤ්චිමෙ භික්ඛවෙ, වස්සස්ස අන්තරායා, යං නෙමිත්තා න ජානන්ති, යත්ථ නෙමිත්තානං චක්ඛුං න කමති.[2] කතමෙ පඤ්ච:

උපරි භික්ඛවෙ, ආකාසෙ තෙජොධාතු පකුප්පති, තෙන උප්පන්නා මෙඝා පටිවිගච්ඡන්ති. අයං භික්ඛවෙ, පඨමො වස්සස්ස අන්තරායො යං නෙමිත්තා න ජානන්ති, යත්ථ නෙමිත්තානං චක්ඛුං න කමති.

පුන ච පරං භික්ඛවෙ, උපරි ආකාසෙ වායොධාතු පකුප්පති, තෙන උප්පන්නා මෙඝා පටිවිගච්ඡන්ති. අයං භික්ඛවෙ, දුතියො වස්සස්ස අන්තරායො, යං නෙමිත්තා න ජානන්ති, යත්ථ නෙමිත්තානං චක්ඛුං න කමති.

පුන ච පරං භික්ඛවෙ, රාහු අසුරින්දො පාණිනා උදකං සම්පටිච්ඡිත්වා[3] මහාසමුද්දෙ ඡඩ්ඩෙති. අයං භික්ඛවෙ, තතියො වස්සස්ස අන්තරායො යං නෙමිත්තා න ජානන්ති, යත්ථ නෙමිත්තානං චක්ඛුං න කමති.

පුන ච පරං භික්ඛවෙ, වස්සවලාහකා දෙවා පමත්තා හොන්ති. අයං භික්ඛවෙ, චතුත්ථො වස්සස්ස අන්තරායො, යං නෙමිත්තා න ජානන්ති, යත්ථ නෙමිත්තානං චක්ඛුං න කමති.

පුන ච පරං භික්ඛවෙ, මනුස්සා අධම්මිකා හොන්ති. අයං භික්ඛවෙ, පඤ්චමො වස්සස්ස අන්තරායො, යං නෙමිත්තා න ජානන්ති, යත්ථ නෙමිත්තානං චක්ඛුං න කමති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච වස්සස්ස අන්තරායා, යං නෙමිත්තා න ජානන්ති, යත්ථ නෙමිත්තානං චක්ඛුං න කමතීති.

---

1 අගධිතො - සයා, PTS 2 චක්ඛු නක්ඛමති - සීමු, චක්ඛු න කමති - මජසං, චක්ඛුං නක්කමති - සයා, 3. පටිච්ඡිත්වා - සීමු.

තවද මහණෙනි, යම්හෙයෙකින් අතීත් සම්‍යක්සම්බුද්ධ වූ තථාගතයෝ සම්බෝධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බෝසත් වූවාහු ම මහාමීඪ පර්තමස්තකයෙක්හි මීඪයෙන් නො තැවැරෙමින් සක්මන් කෙරෙත් ද, මහණෙනි, තථාගතයෝ චීවරපිණ්ඩපාත ශයනාසන ගලානප්‍රත්‍යයභෛෂජ්‍ය පරිෂ්කාර ලාභී වෙත් නම්, එහිදු තථාගතයෝ නො ගැටුනාහු මූසපත් නො වූවාහු නො මැඩුනාහු ආදීනව දක්නාසුලු වූවාහු නිඃසරණප්‍රඥ ඇත්තාහු වළඳනාහු නම්, ඒ නිඃසරණ පරිභොගයාගේ අභිසම්බොධයට මේ පස්වන මහාස්වප්නය පහළ විය.

මහණෙනි, අතීත් සම්‍යක්සම්බුද්ධ තථාගතයනව සම්බෝධියෙන් පූර්වයෙහි ම අනභිසම්බුද්ධ වූ බොධිසත්ත්ව වූවනට ම මේ පඤ්චමහාස්වප්නයෝ පහළ වූහයි.

## 5. 4. 5. 7.

## [වස්සනන්තරායසූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**47.** මහණෙනි, යම් වැසි අන්තරායක් නිමිත්තපාඨකයෝ නො දන්නාහු නම්, යමෙක්හි නිමිත්තපාඨකයන්ගේ චක්‍ෂුස නොවදනේ නම්, මේ ඒ වැසි අන්තරාය පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, උස් අහස්හි තෙජොධාතුව කිපෙයි. එයින් උපන් මෙඝයෝ (වලා) දැවී පහව යෙත්. මහණෙනි, යමක් නිමිත්තපාඨකයෝ නො දනිත් නම්, යමෙක්හි නිමිත්තපාඨකයන්ගේ ඇස නො වදනේ නම්, වැසි පිළිබඳ මේ ඒ පළමුවන අන්තරාය වෙයි,

තවද මහණෙනි, උස් අහස්හි වායොධාතුව කිපෙයි. එයින් උපන් මෙඝයෝ (විසිරී) පහව යෙති. මහණෙනි, යමක් නෛමිත්තකයෝ නො දනිත් නම්, යමෙක්හි නෛමිත්තකයන්ගේ චක්‍ෂුස නො වදනේ නම්, මේ ඒ දෙවන වැසි අන්තරාය යි.

තවද මහණෙනි, රාහු අසුරේන්ද්‍ර අත්ලෙන් දියගෙණ (ඍතුසමුට්ඨාන ජලය දෙහොතින් ගෙණ) මහමුහුදෙහි හෙළන්නේය. මහණෙනි, නිමිත්තපාඨකයෝ යමක් නො දනිත් නම්, යමෙක්හි නෛමිත්තකයන්ගේ ඇස නො වැදගන්නේ නම්, මේ ඒ තෙවන වැසි අන්තරාය යි.

තවද මහණෙනි, වැසිවලාදෙවියෝ (කෙළිදෙලින්) ප්‍රමත්ත වෙති. මහණෙනි, යමක් නෛමිත්තකයෝ නො දනිත් නම්, යමෙක නෛමිත්තකයන්ගේ ඇස නො වැදගන්නේ නම්, මේ ඒ සතරවන වැසි අන්තරාය යි.

තවද මහණෙනි, මනුෂ්‍යයෝ අධාර්මික වෙති. මහණෙනි, යමක් නිමිත්තපාඨකයෝ නො දනිත් නම්, යමෙක නිමිත්තපාඨකයන්ගේ ඇස නො වදනේ නම්, මේ ඒ පස්වන වැසි අන්තරාය යි.

මහණෙනි, යමක් නිමිත්තපාඨකයෝ නො දනිත් නම්, යමෙක නිමිත්තපාඨකයන්ගේ ඇස නො වදනේ නම්, මෙ ඒ වැසි අන්තරාය පසයි.

5. 4. 5. 8.

[සුභාසිතවාචාසුත්තං]

[සාවත්ථිනිදානං]

48. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි, සමන්නාගතා වාචා සුභාසිතා හොති, නො දුබ්භාසිතා, අනවජ්ජා ච අනනුවජ්ජා ච විඤ්ඤූනං. කතමෙහි පඤ්චහි:

කාලෙන ච භාසිතා හොති, සච්චා ච භාසිතා හොති, සණ්හා ච භාසිතා හොති, අත්ථසංහිතා ච භාසිතා හොති, මෙත්තචිත්තෙන ච භාසිතා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති නො දුබ්භාසිතා, අනවජ්ජා ච අනනුවජ්ජා ච විඤ්ඤූනන්ති.

5. 4. 5. 9.

[කුලසුත්තං]

[සාවත්ථිනිදානං]

49. යස්මිං භික්ඛවෙ, සමයෙ සීලවන්තො පබ්බජිතා කුලං[1] උපසඞ්කමන්ති, තත්ථ මනුස්සා පඤ්චහි ඨානෙහි බහුං පුඤ්ඤං පසවන්ති. කතමෙහි පඤ්චහි:

යස්මිං භික්ඛවෙ, සමයෙ සීලවන්තෙ පබ්බජිතෙ කුලං උපසඞ්කමන්තෙ මනුස්සා දිස්වා චිත්තානි පසාදෙන්ති,[2] සග්ගසංවත්තනිකං භික්ඛවෙ, තං කුලං තස්මිං සමයෙ පටිපදං පටිපන්නං හොති.

යස්මිං භික්ඛවෙ, සමයෙ සීලවන්තෙ පබ්බජිතෙ කුලං උපසඞ්කමන්තෙ මනුස්සා පච්චුට්ඨෙන්ති, අභිවාදෙන්ති, ආසනං දෙන්ති, උච්චාකුලීන-සංවත්තනිකං භික්ඛවෙ, තං කුලං තස්මිං සමයෙ පටිපදං පටිපන්නං හොති.

යස්මිං භික්ඛවෙ, සමයෙ සීලන්තෙ පබ්බජිතෙ කුලං උපසඞ්කමන්තෙ මනුස්සා මච්ඡෙරමලං පටිවිනොදෙන්ති,[3] මහෙසක්ඛසංවත්තනිකං භික්ඛවෙ තං කුලං තස්මිං සමයෙ පටිපදං පටිපන්නං හොති.

යස්මිං භික්ඛවෙ සමයෙ සීලවන්තෙ පබ්බජිතෙ කුලං උපසඞ්කන්තෙ මනුස්සා යථාසත්ති යථාබලං සංවිභජන්ති, මහාභොගසංවත්තනිකං භික්ඛවෙ තං කුලං තස්මිං සමයෙ පටිපදං පටිපන්නං හොති.

යස්මිං භික්ඛවෙ, සමයෙ, සීලවන්තෙ පබ්බජිතෙ කුලං උපසඞ්ක-මන්තෙ මනුස්සා පරිපුච්ඡන්ති, පරිපඤ්හන්ති, ධම්මං සුණන්ති, මහා පඤ්ඤසංවත්තනිකං භික්ඛවෙ, තං කුලං තස්මිං සමයෙ පටිපදං පටිපන්නං හොති.

යස්මිං භික්ඛවෙ, සමයෙ සීලවන්තො පබ්බජිතා කුලං[1] උපසඞ්කමන්ති, තත්ථ මනුස්සා ඉමෙහි පඤ්චහි ඨානෙහි බහුං පුඤ්ඤං පසවන්තීති.

---

1. සීලවන්තෙ කුලං - මජ්සං   2. පසීදන්ති - සහා
3. පටිවිනෙන්ති - මජ්සං

5. 4. 5. 8.

[සුභාසිතවාචා සූත්‍රය.]

[සැවැත්නිදාන යි]

48. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත වචනය සුභාෂිත වෙයි, දුර්භාෂිත නො වෙයි, අනවද්‍ය ද වෙයි, නුවණැතියන් විසින් නො ගැරැහිය යුතු ද වෙයි. කවර පසෙකින යත්:

කාලභාෂිතද (නිසි කල්හි කියනලදුයේ) වෙයි. සත්‍යභාෂිත ද වෙයි. ශලක්ෂණභාෂිත ද (සිළුටු වචන) වෙයි. අර්‍ථසංහිත භාෂිත ද වෙයි. මෙත් සිතින් (කියන) භාෂිත ද වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත වචනය සුභාෂිත වෙයි, දුර්භාෂිත නො වෙයි, නිරවද්‍ය ද වෙයි. විඥයන් විසින් නො ගැරැහිය යුතු ද වේ යයි.

5. 4. 5. 9.

[කුල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

49. මහණෙනි, යම් කලෙක සිල්වත් පැවිද්දෝ කුලයකට එළඹෙත් නම්, එහි මිනිස්සු කරුණු පසෙකින් බොහෝ පින් ප්‍රසව කෙරෙත්. කවර පසෙකින යත්:

මහණෙනි, යම් කලෙක මිනිස්සු කුලයට එළඹෙන සිල්වත් පැවිද්දන් දැක සිත් පහදවත් නම්, මහණෙනි, එ කුලය එ සමයෙහි ස්‍වර්‍ගීය පිණිස පවත්නා පිළිවෙතට පිළිපන්නේ වෙයි.

මහණෙනි, යම් කලෙක කුලයට එළඹෙන සිල්වත් පැවිද්දන් දැක මනුෂ්‍යයෝ ප්‍රත්‍යුත්ථාන කෙරෙත් ද, (හුනස්නෙන් නැගිටිත් ද, අභිවාදනා කෙරෙත් ද, අසුන් දෙත් ද, මහණෙනි, එ සමයෙහි එ කුලය උසස් කුලවත් බව සඳහා පවත්නා පිළිවෙතට පිළිපන්නේ වෙයි.

මහණෙනි, යම් කලෙක කුලයට එළඹෙන සිල්වත් පැවිද්දනට මනුෂ්‍යයෝ මසුරුමල දුරු කෙරෙත් නම්, මහණෙනි, එ සමයෙහි එ කුලය මහායශස්ක (මහයස පිරිවර ඇතිවන) බව සඳහා පවත්නා පිළිවෙතට පිළිපන්නේ වෙයි.

මහණෙනි, යම් කලෙක කුලයට එළඹෙන සිල්වත් පැවිද්දනට මිනිස්සු ශක්ති වූ පරිදි බල වූ පරිදි දන සංවිභාග කෙරෙත් නම්, මහණෙනි, එ සමයෙහි එ කුලය මහා භොග පිණිස පවත්නා පිළිවෙතට පිළිපන්නේ වෙයි.

මහණෙනි, යම් සමයෙක්හි මිනිස්සු කුලයට එළඹෙන සිල්වත් පැවිද්දන් පරිපෘච්ඡා කෙරෙත් ද, පරිප්‍රශ්න කෙරෙත් ද, (ඔවුන්ගෙන්) ධර්‍මය අසත් ද, මහණෙනි; එ සමයෙහි එ කුලය මහා ප්‍රඥ පිණිස පවත්නා පිළිවෙතට පිළිපන්නේ වෙයි.

මහණෙනි, යම් කලෙක සිල්වත් පැවිද්දෝ කුලයට එළඹෙත් නම්, එහි මිනිස්හු මෙ කරුණු පසින් බොහෝ පින් ප්‍රසව (රැස්) කරන්නාහයි

## 5. 4. 5. 10.

## නිස්සාරණීය සුත්තං]

[සාවත්ථිනිදානං]

**50.** පඤ්චිමා භික්ඛවෙ, නිස්සාරණීයා[1] ධාතුයො. කතමා පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛුනො කාමෙ මනසිකරොතො කාමෙසු චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සංතිට්ඨති, න විමුච්චති. නෙක්ඛම්මං ඛො පනස්ස මනසිකරොතො නෙක්ඛම්මෙ චිත්තං පක්ඛන්දති, පසීදති, සන්තිට්ඨති, විමුච්චති. තස්ස තං චිත්තං සුගතං[2] සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං සුවිසංයුත්තං කාමෙහි. යෙ ච කාමපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතපරිළාහා, මුත්තො සො තෙහි. න සො තං වෙදනං වෙදියති. ඉද-මක්ඛාතං කාමානං නිස්සරණං.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛුනො ව්‍යාපාදං මනසිකරොතො ව්‍යාපාදෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති. අව්‍යාපාදං ඛො පනස්ස මනසිකරොතො අව්‍යාපාදෙ චිත්තං පක්ඛන්දති, පසීදති, සන්තිට්ඨති, විමුච්චති. තස්ස තං චිත්තං සුගතං[2] සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං සුවිසංයුත්තං ව්‍යාපාදෙන. යෙ ච ව්‍යාපාදපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතපරිළාහා, මුත්තො සො තෙහි. න සො තං වෙදනං වෙදියති. ඉදමක්ඛාතං ව්‍යාපාදස්ස නිස්සරණං.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛුනො විහෙසං මනසිකරොතො විහෙසාය චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති. අවිහෙසං ඛො පනස්ස මනසිකරොතො අවිහෙසාය චිත්තං පක්ඛන්දති, පසීදති, සන්තිට්ඨති, විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං සුවිසංයුත්තං විහෙසාය. යෙ ච විහෙසාපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතපරිළාහා, මුත්තො සො තෙහි. න සො තං වෙදනං වෙදියති. ඉදමක්ඛාතං විහෙසාය නිස්සරණං.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛුනො රූපං මනසිකරොතො රූපෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති. අරූපං ඛො පනස්ස මනසිකරොතො අරූපෙ චිත්තං පක්ඛන්දති, පසීදති, සන්තිට්ඨති, විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං සුවිසං-යුත්තං රූපෙහි. යෙ ච රූපපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතපරිළාහා, මුත්තො සො තෙහි. න සො තං වෙදනං වෙදියති. ඉදමක්ඛාතං රූපානං නිස්සරණං.

---

1. නිස්සරණීයා - PTS. 2. සුඛතං - PTS

## 5. 4. 5. 10.

## [නිස්සාරණීය සූත්‍රය]

[සැවැත්නිදානයි]

**50**. මහණෙනි, මේ නිස්සාරණීය ධාතුහු (නික්මීමෙහි - වෙන්වීමෙහි ධර්‍ම) පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි කාමයන් මෙනෙහි කරණ මහණහුගේ සිත කාමයන්හි නො බැසගන්නේ ය. නො පහදනේ ය. නො සිටුනේ ය. අධිමුක්ත (මිදුනේ) නො වන්නේ ය. (අශුභයෙහි ප්‍රථමධ්‍යාන සඞ්ඛ්‍යාත) නෛෂ්ක්‍රම්‍යය මෙනෙහි කරණ ඔහුගේ සිත එහි බැසගන්නේ ය. පහදනේ ය. සිටුනේ ය. අධිමුක්ත වන්නේ ය. ඔහුගේ එ සිත මොනොවට අශුභභාවනා-වට ගියේ සුභාවිත වූයේ කාමයන්ගෙන් මොනොවට නැගීසිටියේ කාමයන්-ගෙන් මොනොවට මිදුනේ කාමයන් කෙරෙන් මොනොවට විසංයුක්ත වූයේ වෙයි. කාමයන් හෙතුකොට දුක් වූ පරිදහ ඇති යම් ආශ්‍රව කෙනෙක් උපදනාහු නම්, හේ ඔවුන්ගෙන් මුක්ත වෙයි. හෙ එ කාමවෙදනා නො විඳුනේ ය. මෙ (අශුභධ්‍යානය) කාමයන්ගේ නිඃසරණය යි කියන ලද.

තවද මහණෙනි, ව්‍යාපාදය මෙනෙහි කරණ භික්ෂුහුගේ සිත ව්‍යාපාද යෙහි නො හෙයි. නො පහදනේ ය. නො සිටුනේ ය. අධිමුක්ත නො වන්නේ ය. අව්‍යාපාදය මෙනෙහි කරණ ඔහුගේ සිත (මෛත්‍රීධ්‍යාන සඞ්ඛ්‍යාත) අව්‍යාපාදයෙහි පහදනේ ය. සිටුනේ ය. අධිමුක්ත වන්නේ ය. ඔහුගේ ඒ මෛත්‍රීධ්‍යාන චිත්තය මොනොවට මෛත්‍රීධ්‍යානයට ගියේ සුභාවිත වූයේ මොනොවට ව්‍යාපාදයෙන් නැඟී සිටියේ මොනොවට අධිමුක්ත වූයේ ව්‍යාපාදයෙන් මොනොවට විසංයුක්ත වෙයි. ව්‍යාපාදප්‍රත්‍යයයෙන් යම් දුඃඛ-පරිදහකර ආශ්‍රව කෙනෙක් උපදනාහු නම්, හෙ එයින් මුක්ත වෙයි. හෙ ඒ ව්‍යාපාදවෙදනාව නො විඳුනේ ය. මෙ මෛත්‍රීධ්‍යානය ව්‍යාපාදනිඃසරණය යි කියන ලද.

තවද මහණෙනි, විහිංසාව මෙනෙහි කරණ භික්ෂුහුගේ සිත විහිංසායෙහි නො බස්නේ ය. එහි නො පහදනේ ය. නො සිටුනේ ය. අධිමුක්ත නො වන්නේ ය. (කරුණාධ්‍යාන සඞ්ඛ්‍යාත) අවිහිංසාව මෙනෙහි කරණ ඔහුගේ සිත කරුණාධ්‍යාන සඞ්ඛ්‍යාත අවිහිංසායෙහි බස්නේ ය. පහදනේ ය. සිටු නේ ය. අධිමුක්ත වන්නේ ය. මොනොවට කරුණාවට ගිය ඔහුගේ එ සිත සුභාවිත ය. මොනොවට නැඟී සිටියේ ය. සුවිමුක්ත ය. විහිංසායෙන් මොනොවට විසංයුක්ත ය. විහිංසාප්‍රත්‍යයයෙන් දුඃඛපරිදහකර යම් ආශ්‍රව කෙනෙක් උපදනාහු නම්, හෙ ඔවුන්ගෙන් මුක්ත වෙයි. හෙ එ විහිංසා වෙදනාව නො විඳුනේ ය. මේ කරුණාධ්‍යානය විහිංසාවගේ නිඃසරණය යි. කියන ලද.

තවද මහණෙනි, රූපය මෙනෙහි කරණ භික්ෂුහුගේ චිත්තය රූපයෙහි නො බස්නේ ය. නො පහදනේ ය. නො සිටුනේ ය. අධිමුක්ත නො වන්නේ ය. අරූපාරම්මණය මෙනෙහි කරණ ඔහුගේ සිත අරූපධ්‍යාන-යෙහි බස්නේ ය. පහදනේ ය. සිටුනේ ය. අධිමුක්ත වන්නේ ය. ඔහුගේ එ සිත මොනොවට අරූපධ්‍යානයට ගියේ සුභාවිත වූයේ මොනොවට නැඟී සිටියේ සුවිමුක්ත වූයේ රූපයන්ගෙන් මොනොවට විසංයුක්ත වෙයි. රූප ප්‍රත්‍යය කොට දුඃඛපරිදහකර යම් ආශ්‍රව කෙනෙක් උපදනාහු නම්, හෙ ඔවුන්ගෙන් මුක්ත වෙයි. හෙතෙම එ වෙදනා නො විඳුනේ ය. මෙ අරූප ධ්‍යානය රූපයන්ගේ නිස්සරණය යි කියන ලද.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛුනො සක්කායං මනසිකරොතො සක්කායෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති. සක්කායනිරොධං ඛො පනස්ස මනසිකරොතො සක්කායනිරොධෙ චිත්තං පක්ඛන්දති, පසීදති, සන්තිට්ඨති, විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං සුවිසංයුත්තං සක්කායෙන. යෙ ච සක්කායපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතපරිළාහා, මුත්තො සො තෙහි. න සො තං වෙදනං වෙදියති. ඉදමක්ඛාතං සක්කායස්ස නිස්සරණං

තස්ස කාමනන්දිපි නානුසෙති, ව්‍යාපාදනන්දිපි නානුසෙති, විහෙසා-නන්දිපි නානුසෙති, රූපනන්දිපි නානුසෙති, සක්කායනන්දිපි නානුසෙති. සො කාමනන්දියාපි අනනුසයා, ව්‍යාපාදනන්දියාපි අනනුසයා විහෙසානන්දියාපි අනනුසයා, රූපනන්දියාපි අනනුසයා, සක්කායනන්දියාපි අනනුසයා. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු නිරනුසයො අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි[1] සංයොජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්ස.

ඉමා ඛො භික්ඛවෙ, පඤ්ච නිස්සාරණීයා ධාතුයොති.

## සොණවග්ගො පඤ්චමො

**තස්සුද්දානං:**

සොණො දොණො සඞ්ගාරවො කාරණපාලී ච පිඞ්ගියානී.
සුපිනා ච වස්සා වාචා කුලං නිස්සාරණීයෙන වාති.

චතුත්ථො පණ්ණාසකො සමත්තො.

1. විවත්තයි-මජසං, විවට්ටයි - ස්‍යා,

තවද මහණෙනි, සත්කාය (පඤ්චොපාදානස්කන්ධය) මෙනෙහි කරණ භික්ෂුහුගේ සිත සත්කායයෙහි නො බස්නේ ය. නො පහදනේ ය. නො සිටුනේ ය. අධිමුක්ත නො වන්නේ ය. සත්කායනිරොධය මෙනෙහි කරණ ඔහුගේ සිත සත්කායනිරොධයෙහි බස්නේ ය. පහදනේ ය. සිටුනේ ය. අධිමුක්ත වන්නේ ය. ඔහුගේ එ සිත මොනොවට සත්කායනිරොධයට ගියේ සුභාවිත වූයේ මොනොවට නැඟීසිටියේ සුවිමුක්ත වූයේ සත්කායයෙන් මොනොවට විසංයුක්ත වෙයි. සත්කායප්‍රත්‍යයෙන් දුඃඛපරිදාහකර යම් ආස්‍රව කෙනෙක් උපදනාහු නම්, හෙතෙම ඔවුන් කෙරෙන් මිදුනේ වෙයි. හෙ එ වේදනාව නො විඳුනේ ය. මෙය (අර්හත් ඵලසමාපත් සිත) සත්කායයාගේ නිඃසරණය යි කියන ලද.

ඔහුගේ කාමනන්දිය ද අනුශය (ඉපදීම) නො කෙරෙයි. ව්‍යාපාදනන්දිය ද අනුශය නො කෙරෙයි. විහිංසානන්දිය ද අනුශය නො කෙරෙයි. රූපනන්දිය ද අනුශය නො කෙරෙයි. සත්කායනන්දිය ද අනුශය නො කෙරෙයි. කාමනන්දිද අනුශය නො කිරීමෙන් ව්‍යාපාදනන්දි ද අනුශය නො කිරීමෙන් විහිංසානන්දි ද අනුශය නො කිරීමෙන් රූපනන්දි ද අනුශය නො කිරීමෙන් සත්කාය නන්දිය ද අනුශය නො කිරීමෙන් මෙ මහණ අනුශය නැතියේ තෘෂ්ණාව මුලුසුන් කළේ යයි ද සංයොජන මුලින්නුදුරා ලූයේ යයි ද මැනැවින් මානයාගේ ප්‍රහාණාභිසමයෙන් දුක් කෙළවර කෙළේයයි දකියතු ලැබේ.

මහණෙනි, මේ පඤ්චනිස්සාරණීය ධාතුහු යි.

**සොණවග්ගය පස්වැනි යි.**

**එහි උද්දානය:**

සොණ සූත්‍රය, ද්‍රොණ සූත්‍රය, සඞ්ගාරව සූත්‍රය, කාරණපාලි සූත්‍රය, පිඞ්ගියානී සූත්‍රය, මහා සුපින සූත්‍රය, වස්සන්තරාය සූත්‍රය, සුභාසිතවාචා සූත්‍රය, කුලසූත්‍රය, නිස්සාරණීය සූත්‍රය දැයි දසයෙකි.

**සතරවන පණ්ණාසකය සමාප්තයි.**

# පඤ්චමපණ්ණාසකං.

## 1. කිමිබිලවග්ගො.

### 5. 5. 1. 1.

### [කිමිබිලසුත්තං]

**[සාවත්ථිනිදානං]**

1. එකං සමයං භගවා **කිමිබිලායං**[1] විහරති, **නිචෙළුවනෙ.**[2] අථ ඛො ආයස්මා **කිමිබිලො**[3] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා කිමිබිලො[3] භගවන්තං එතදවොච:

'කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො, යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොතීති'.

ඉධ කිමිබිල,[4] තථාගතෙ පරිනිබ්බුතෙ භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො සත්ථරි අගාරවා විහරන්ති අප්පතිස්සා, ධම්මෙ අගාරවා විහරන්ති අප්පතිස්සා, සඞ්ඝෙ අගාරවා විහරන්ති අප්පතිස්සා, සික්ඛාය අගාරවා විහරන්ති අප්පතිස්සා, අඤ්ඤමඤ්ඤං අගාරවා විහරන්ති අප්පතිස්සා. අයං ඛො කිමිබිල, හෙතු අයං පච්චයො, යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොතීති.

කො පන භන්තෙ, හෙතු කො පච්චයො, යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතීති.

ඉධ කිමිබිල, තථාගතෙ පරිනිබ්බුතෙ භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො සත්ථරි සගාරවා විහරන්ති සප්පතිස්සා, ධම්මෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, සඞ්ඝෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, සික්ඛාය සගාරවා විහරන්ති සප්පතිස්සා, අඤ්ඤමඤ්ඤං සගාරවා විහරන්ති සප්පතිස්සා. අයං ඛො කිමිබිල, හෙතු අයං පච්චයො, යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතී'ති.

### 5. 5. 1. 2.

### [ධම්මසවණසුත්තං]

**[සාවත්ථිනිදානං]**

2. පඤ්චිමෙ භික්ඛවෙ, ආනිසංසා ධම්මසවණෙ. කතමෙ පඤ්ච:

අස්සුතං සුණාති, සුතං පරියොදපෙති, කඞ්ඛං විතරති, දිට්ඨිං උජුං කරොති, චිත්තමස්ස පසීදති. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආනිසංසා ධම්මසවණෙති.

---

1. කිම්ලායං - මජසං සයා, 2. වෙළුවනෙ - මජසං, සයා, 3 කිම්ලො - මජසං.
4. කිම්ල - මජසං.

# පස්වැනි පණ්ණාසකය.

## 1. කිම්බිල වග්ගය.

### 5. 5. 1. 1.

### [කිම්බිල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

1. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කිම්බිලා නගර සමීපයෙහි වූ මිදෙල්වෙණෙහි වසන සේක. එකල්හි ආයුෂ්මත් කිම්බිල (කෘමිලා) තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ:

වහන්ස, යම් හෙයෙකින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථායී නො වේ නම්, එයට හෙතු කවරැ? ප්‍රත්‍යය කවරැ?යි.

කිම්බිලයෙනි, තථාගතයන් පිරිනිවි කල්හි මෙ සස්නෙහි භික්ෂුහු භික්ෂුණීහු උපාසකයෝ උපාසිකාවෝ ශාස්තෘන් කෙරෙහි ගෞරව නැතියාහු ප්‍රතිශ්‍රය (ආශ්‍රය) නැතියාහු වෙසෙත්. ධර්මය කෙරෙහි ගෞරව නැතියාහු ප්‍රතිශ්‍රය නැතියාහු වෙසෙත්. සඞ්ඝයා කෙරෙහි ගෞරව නැතියාහු ප්‍රතිශ්‍රය නැතියාහු වෙසෙත් ශික්ෂා කෙරෙහි ගෞරව නැතියාහු ප්‍රතිශ්‍රය නැතියාහු වෙසෙත්. ඔවුනොවුන් කෙරෙහි ගෞරව නැතියාහු ප්‍රතිශ්‍රය නැතියාහු වෙසෙත්. කිම්බිලයෙනි, යම් කරුණෙකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථායී නො වේ නම්, මේ (එයට) හෙතු ය, මේ (එයට) ප්‍රත්‍යයයි.

වහන්ස, යම් කරුණෙකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථායී වේ නම්, එයට හේතු කවරැ? එයට ප්‍රත්‍යය කවරැ?යි.

කිම්බිලයෙනි, තථාගතයන් පිරිනිවි කල්හි මෙ සස්නෙහි මහණහු මෙහෙණහු උවසුහු උවැසියෝ ශාස්තෘන් කෙරෙහි ගෞරව ඇතියාහු ප්‍රතිශ්‍රය ඇතියාහු වෙසෙත්. ධර්මය කෙරෙහි ගෞරව ඇතියාහු ප්‍රතිශ්‍රය ඇතියාහු වෙසෙත්. සඞ්ඝයා කෙරෙහි ගෞරව ඇතියාහු ප්‍රතිශ්‍රය ඇතියාහු වෙසෙත්. ශික්ෂායෙහි ගෞරව ඇතියාහු ප්‍රතිශ්‍රය ඇතියාහු වෙසෙත්. උනුනට ගෞරව ඇතියාහු ප්‍රතිශ්‍රය ඇතියාහු වෙසෙත්. කිම්බිලයෙනි, යම් හෙයෙකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථායී වේ නම්, මෙ එයට හෙතු යි, මෙ එයට ප්‍රත්‍යය යි.

### 5. 5. 1. 2.

### [ධම්මසවණ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

2. මහණෙනි, ධර්මශ්‍රවණයෙහි මෙ අනුසස් පසෙක. කවර පසෙක යත්:

අශ්‍රැතය (නො ඇසූ විරූ දෙය) අසන්නේ ය. ශ්‍රැතය (ඇසූ විරූ දෙය) පිරිසිදු කරන්නේ ය. සැක දුරුකරන්නේ ය. දෘෂ්ටිය සෘජු කරන්නේ ය. ඔහුගේ සිත පහදනේ ය. මහණෙනි, ධර්මශ්‍රවණයෙහි මෙ අනුසස් පස යි.

5. 5. 1. 3.

[ආජානීයසුත්තං]

[සාවත්ථිනිදානං]

3. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති, රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව්ව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි:

අජ්ජවෙන, ජවෙන, මද්දවෙන, ඛන්තියා, සොරච්චෙන. ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති, රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව්ව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි පඤ්චහි:

අජ්ජවෙන, ජවෙන,. මද්දවෙන, ඛන්තියා, සොරච්චෙන. ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

5. 5. 1. 4.

[බලසුත්තං]

[සාවත්ථිනිදානං]

4. පඤ්චිමානි භික්ඛවෙ, බලානි. කතමානි පඤ්ච:

සද්ධාබලං, හිරිබලං, ඔත්තප්පබලං, විරියබලං, පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්ච බලානීති.

5. 5. 1. 5.

[චෙතොඛිලසුත්තං]

[සාවත්ථිනිදානං]

5. පඤ්චිමෙ භික්ඛවෙ, චෙතොඛිලා. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ, භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති. යො සො භික්ඛවෙ, භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඨමො චෙතොඛිලො.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු ධම්මෙ කඞ්ඛති -පෙ- [තස්ස චිත්තං න නමති -පෙ- අයං දුතියො චෙතොඛිලො.] සඞ්ඝෙ කඞ්ඛති -පෙ- [තස්ස චිත්තං න නමති -පෙ- අයං තතියො චෙතො ඛිලො.] සික්ඛාය කඞ්ඛති -පෙ- [තස්ස චිත්තං න නමති -පෙ- අයං චතුත්ථො චෙතො ඛිලො.] සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො. යො සො භික්ඛවෙ, භික්ඛු සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඤ්චමො චෙතොඛිලො.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච චෙතොඛිලාති.

5. 5. 1. 3.

[ආජානීය සූත්‍රය]

[සැවැත් නිදාන යි]

3. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත රජුගේ භද්‍ර අශ්වාජානීයයා රාජාර්හ වෙයි. රාජභෝග්‍ය වෙයි. රජුගේ රාජාඞ්ග සඞ්ඛ්‍යාවට ම යෙයි. කවර පසෙකින යත්:

ඍජුභාවයෙන (අවඞ්කගමන), ජවයෙන (පදජවය), මෘදුභාවයෙන (සිරුරුමෘදුබව), ක්‍ෂාන්තියෙන (ඉවසීම), සුරතභාවයෙන. මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත රජුගේ භද්‍රාශ්වාජානීය රාජාර්හ වෙයි. රාජභොග්‍ය වෙයි. රාජාඞ්ග සඞ්ඛ්‍යාවට ම යෙයි.

මහණෙනි, එ සෙයින් ම කරුණු පසෙකින් සමන්‍වාගත මහණ ආහුනෙය්‍ය වෙයි. පාහුනෙය්‍ය වෙයි. දක්‍ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලිකරණීය වෙයි. ලොවට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වෙයි. කවර පසෙකින යත්:

ඍජුභාවය (ඥනයාගේ ඍජු ගමන), ජවය (සූර ඥනවත්භාවය) මෘදුභාවය (මෘදුසිල් ඇතිබව), ක්‍ෂාන්තිය (අධිවාසන ක්‍ෂාන්තිය), සුරතභාවය යන මෙයිනි. මහණෙනි, මෙ පඤ්චධර්මයෙන් සමන්‍වාගත මහණ ආහුනෙය්‍ය වෙයි. පාහුනෙය්‍ය වෙයි. දක්‍ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලිකරණීය වෙයි. ලොවට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වේ යයි.

5. 5. 1. 4.

[බලසූත්‍රය]

[සැවැත්නිදාන යි.]

4. මහණෙනි, මෙ බල පසෙකි. කවර පසෙක යත්:

ශ්‍රද්ධාබලය, හ්‍රීබලය, ඔත්තප්පබලය, වීර්‍ය්‍යබලය, ප්‍රඥබල යි. මහණෙනි, මේ බල පස යි.

5. 5. 1. 5.

[චෙතොඛිල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

5. මහණෙනි, මේ චෙතොඛිල (සිත්හි තදබැව්) පසෙක. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සථරුන් කෙරෙහි සැක කෙරෙයි. විචිකිච්ඡා කෙරෙයි. අධිමොක්‍ෂ නො කෙරෙයි. ප්‍රසාද නො කෙරෙයි. මහණෙනි, යම් මහණෙක් සථරුන් කෙරෙහි සැක කෙරේ ද, විචිකිච්ඡා කෙරේ ද, අධිමොක්‍ෂ නො කෙරේ ද, සම්ප්‍රසාදය නො කෙරේ ද, ඔහුගේ සිත ආතාපන පිණිස අනුයොගය පිණිස සතතක්‍රියාව පිණිස ප්‍රධන්වීර්‍ය්‍යය පිණිස නො නැමෙයි. යමකුගේ සිත ආතාපය පිණිස අනුයොගය පිණිස සාතත්‍යය පිණිස ප්‍රධන්වීර්‍ය්‍යය පිණිස නො නැමේ නම්, මේ ප්‍රථම චෙතොඛිල යි.

තවද මහණෙනි, මහණ ධර්මයෙහි සැක කරයි ... [ඔහුගේ සිත... නො නැමෙයි... මේ දෙවන චෙතොඛිලයි] සඟුන් කෙරෙහි සැක කරයි ... [ඔහුගේ සිත ... නොනැමෙයි ... මේ තුන්වන චෙතොඛිලයි] ශික්‍ෂායෙහි සැක කරයි .. [ඔහු ගේ සිත ... නො නැමෙයි. මේ සතරවන චෙතොඛිලයි.] සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නො සතුටු සිත් ඇතියේ ගැටුනු සිත් ඇතියේ හටගත් (ක්‍රොධ) හුල් ඇතියේවෙයි. මහණෙනි, යම් මහණෙක් සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ ගැටුනුසිත් ඇතියේ හටගත් හුල් ඇතියේ වේ ද, ඔහුගේ සිත ආතාපය පිණිස අනුයොගය පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන්වීර්‍ය්‍ය පිණිස නො නැමෙයි. යමකුගේ සිත ආතාපය පිණිස අනුයොගය පිණිස සතතභාවය පිණිස ප්‍රධන්වීර්‍ය්‍යය පිණිස නො නැමේ ද, මෙ පස්වන චෙතොඛිල යි.

මහණෙනි, මෙ චෙතොඛිල පස යි.

## 5. 5. 1. 6.

### [චිනිබන්ධසුත්තං]

[සාවත්ථිනිදානං]

6. පඤ්චිමෙ භික්ඛවෙ, චෙතසො විනිබන්ධා. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ, භික්ඛු කාමෙසු[1] අවිගතරාගො[2] හොති, අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. යො සො භික්ඛවෙ, භික්ඛු කාමෙසු අවිගතරාගො හොති, අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. අයං පඨමො චෙතසො විනිබන්ධො.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු කායෙ අවිගතරාගො[2] හොති, -පෙ- [අයං දුතියො චෙතසො විනිබන්ධො] -පෙ- රූපෙ අවිගතරාගො හොති -පෙ- [අයං තතියො චෙතසො විනිබන්ධො] -පෙ- යාවදත්ථං උදරාවදෙහකං[3] භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං[4] මිද්ධසුඛං අනුයුත්තො විහරති -පෙ- [අයං චතුත්ථො චෙතසො විනිබන්ධො] -පෙ- අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති: 'ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා'ති. යො සො භික්ඛවෙ, භික්ඛු අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති: 'ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා'ති. තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඤ්චමො චෙතසො විනිබන්ධො.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච චෙතසො විනිබන්ධාති.

## 5. 5. 1. 7.

### [යාගුසුත්තං]

[සාවත්ථිනිදානං]

7. පඤ්චිමෙ භික්ඛවෙ, ආනිසංසා යාගුයා. කතමෙ පඤ්ච:

ඛුද්දං පටිහනති[5], පිපාසං පටිවිනෙති, වාතං අනුලොමෙති, වත්ථිං සොධෙති, ආමාවසෙසං පාචෙති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආනිසංසා යාගුයාති.

## 5. 5. 1. 8

### [දන්තකට්ඨසුත්තං]

[සාවත්ථිනිදානං]

8 පඤ්චිමෙ භික්ඛවෙ, ආදීනවා දන්තකට්ඨස්ස අඛාදනෙ. කතමෙ පඤ්ච:

අචක්ඛුස්සං, මුඛං දුග්ගන්ධං හොති, රසහරණියො න විසුජ්ඣන්ති, පිත්තං සෙම්හං භත්තං පරියොනන්ධන්ති, භත්තමස්ස නච්ඡාදෙති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආදීනවා දන්තකට්ඨස්ස අඛාදනෙ.

---

1 කායෙම - සයා 2 අවීතරාගො - මජ්ඣං, සයා, කාමෙ අවීතරාගො - සයා.
3 උදරාවදෙහං සී මු. 4 ඵස්සසුඛං - සීමු 5 ඛුද්දංපටිහනති - මජ්ඣං, සයා

5. 5. 1. 6.

[විනිබන්ධ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

6. මහණෙනි, මේ චිත්තයාගේ විනිබන්ධයෝ (සිත වෙළා බැඳලන ධර්මයෝ) පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයෙහි නො පහවූ රාග ඇතියේ නො පහවූ ඡන්ද ඇතියේ නො පහවූ ප්‍රෙම ඇතියේ නො පහවූ පිපාසා ඇතියේ නො පහවූ පරිදාහ ඇතියේ නො පහවූ තෘෂ්ණා ඇතියේ වෙයි. මහණෙනි, යම් ම මහණෙක් කාමයන්හි අවිගත රාග ඇතියේ අවිගත ඡන්ද ඇතියේ අවිගත ප්‍රෙම ඇතියේ අවිගත පිපාසා ඇතියේ අවිගත පරිදාහ ඇතියේ අවිගත තෘෂ්ණා ඇතියේ වේ ද, ඔහුගේ සිත ආතාපය පිණිස අනුයොගය පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන්වියවී පිණිස නො නැමෙයි. මෙ චිත්තයාගේ ප්‍රථම විනිබන්ධ වෙයි.

තවද මහණෙනි, ස්වකීය කායයෙහි අවිගත රාග ඇතියේ වෙයි ... [චිත්තයාගේ මේ දෙවන විනිබන්ධය වේ] ... බාහිර රූපයෙහි අවිගත රාග ඇතියේ වෙයි ... [චිත්තයාගේ මේ තෙවන විනිබන්ධය වේ.] ... කැමැති තාක් කුස්පුරා අහර වළඳා ශය්‍යාසුඛයෙහි හා පාර්ශ්වසුඛයෙහි හා නිද්‍රාසුඛයෙහි හා යෙදුනේ වාසය කරයි. ... [චිත්තයාගේ මේ සිව්වන විනිබන්ධය වේ.] ... අන්‍යතර දෙවනිකායක් පතා 'මම මේ ශීලයෙන් වේවයි ව්‍රතයෙන් වේවයි තවසින් වේවයි බ්‍රම්සරින් වේවයි මහායශසක දෙවියෙක් හෝ (අල්පයශසක දෙවියන් අතර) අප්‍රකට දෙවියෙක් හෝ වන්නෙමි'යි බ්‍රහ්මචර්‍ය්‍යය රක්නේය. මහණෙනි, යම් මහණෙක් මම් මේ සිවුපිරිසිදු සිලින් වේවයි ව්‍රතසමාදානයෙන් වේවයි තපචරණයෙන් වේවයි දෙවයෙක් හෝ අන්‍යතර දෙවයෙක් හෝ වන්නෙමි'යි එක්තරා දෙවනිකායක් පතා බ්‍රහ්මචර්‍ය්‍යය රක්නේ නම්, ඔහුගේ සිත ආතාපය පිණිස අනුයොගය පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන්වියවීය පිණිස නො නැමෙයි. යමකුගේ සිත ආතාපය පිණිස අනුයොගය පිණිස සතතක්‍රියා පිණිස ප්‍රධන්වියවීය පිණිස නො නැමේ නම්, චිත්තයාගේ මේ පස්වන විනිබන්ධ යි.

මහණෙනි, මොහු පස්දෙන චිත්තයාගේ විනිබන්ධයෝ යි.

5. 5. 1. 7.

[යාගු සූත්‍රය]

[සැවැත්නිදාන යි]

7. මහණෙනි, හුළුකැන්හි (කැඳෙහි) මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

සාගිනි නසයි, පවස දුරුකෙරෙයි, වාතය අනුලොම් (කොට බැහැර) කෙරෙයි, වස්තිය (ධමනීන්) ශුද්ධ කෙරෙයි, ආමාවශෙෂය (නො පැසී ඉතිරි ආහාරය) පැසව යි.

මහණෙනි, හුළුකැන්හි මේ අනුසස් පසයි.

5. 5. 1. 8.

[දන්තකාෂ්ඨසූත්‍රය]

[සැවැත්නිදාන යි]

8. මහණෙනි, දැහැටි නො වැළඳීමෙහි මේ දෙස් පසෙක. කවර පසෙක යත්:

ඇසට අහිතකර ය, මුව දුගඳ වෙයි, රස නහර පිරිසිදු නො වෙයි, පිත් සෙම් බත අවුරාලයි, ඔහට බත නොරිසියෙයි.

මහණෙනි, දැහැටි නො කැමෙහි මේ දෙස් පස යි.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා දන්තකට්ඨස්ස ඛාදනෙ. කතමෙ පඤ්ච:

චක්ඛුස්සං, මුඛං න දුග්ගන්ධං හොති, රසහරණියො විසුජ්ඣන්ති, පිත්තං සෙම්හං භත්තං න පරියොනන්ධන්ති, භත්තමස්ස ඡාදෙති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා දන්තකට්ඨස්ස ඛාදනෙති.

5. 5. 1. 9.

[ගීතස්සරසුත්තං]

[සාවත්ථිනිදානං]

9. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා ආයතකෙන ගීතස්සරෙන ධම්මං භණන්තස්ස. කතමෙ පඤ්ච:

අත්තනාපි තස්මිං සරෙ සාරජ්ජති, පරෙපි තස්මිං සරෙ සාරජ්ජන්ති, ගහපතිකාපි උජ්ඣායන්ති: 'යථෙව මයං ගායාම, එවමෙව ඉමෙ සමණා සක්‍යපුත්තියා ගායන්තී'ති, සරකුත්තිම්පි නිකාමයමානස්ස සමාධිස්ස භඞ්ගො හොති, පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා ආයතකෙන ගීතස්සරෙන ධම්මං භණන්තස්සාති.

5. 5. 1. 10.

[මුට්ඨස්සති සුත්තං]

[සාවත්ථිනිදානං]

10. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස නිද්දං ඔක්කමතො. කතමෙ පඤ්ච:

දුක්ඛං සුපති, දුක්ඛං පටිබුජ්ඣති, පාපකං සුපිනං පස්සති, දෙවතා න රක්ඛන්ති, අසුචි මුච්චති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස නිද්දං ඔක්කමතො.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා උපට්ඨිතසතිස්ස[1] සම්පජානස්ස නිද්දං ඔක්කමතො. කතමෙ පඤ්ච.

සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, දෙවතා රක්ඛන්ති, අසුචි න මුච්චති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා උපට්ඨිතසතිස්ස[1] සම්පජානස්ස නිද්දං ඔක්කමතොති.

කිමිබිලවග්ගො පඨමො.

තස්සුද්දානං

කිමිබිලො[2] ධම්මසවණං[3] ආජානීයො[4] බලං බිලං
විනිබන්ධං යාගු කට්ඨං ගීතං මුට්ඨස්සතිනා චාති.

1. උපට්ඨිතස්සතිස්ස - මජසං, 2. කිම්ලො,
3. ධම්මස්සවණං - මජසං 4. ආජානීච - මජසං, සිමු

මහණෙනි, දැහැටි වැළඳීමෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

ඇසට හිත වෙයි, මුව දුගඳ නො වෙයි, රසනහර පිරිසිදු වෙත්, පිත්-සෙම් බත නො අවුරාලයි, ඔහට බත රිසියෙයි. මහණෙනි, මේ දැහැටි වැළඳීමෙහි අනුසස් පස යි.

**5. 5. 1. 9.**

**[ගීතස්සර සූත්‍රය]**

**[සැවැත්නිදන යි]**

**9**. මහණෙනි, දීඝී ගීතසවරයෙන් (ගාථා වෘත්තය වනසා) දහම් බණනුවහට මේ දෙස් පසෙකි. කවර පසෙක යත්:

තෙමේත් ඒ සවරයෙහි ඇලෙයි. අන්‍යයෝ ද ඒ සවරයෙහි ඇලෙති. 'අපි යම් සේ ගයමෝ නම්, මෙ ශාක්‍යපුත්‍රිය ශ්‍රමණයෝ ද එසෙයින් ම ගයති'යි ගෙහෙවියෝ ද අවඥ කෙරෙත්. සවරාකෘතිය පතන්නහුගේ සමාධිභෙදය ද වෙයි. පශ්චිම ජනතාව (එය ආදශීයට ගෙණ) දෘෂටානුගතියට පැමිණෙයි.

මහණෙනි, දීඝී ගීතසවරයෙන් දහම් බණනුවහට මේ දෙස්පස වේ යයි.

**5. 5. 1. 10.**

**[මුට්ඨස්සති සූත්‍රය]**

**[සැවැත්නිදන යි]**

**10**. මහණෙනි, මුසපත් සිහි ඇතිව, මනා (ප්‍රත්‍යවෙක්‍ෂා) නුවණ නැතිව නින්දට වැටෙනුවහට මෙ දෙස් පසෙකි. කවර පසෙක යත්:

දුකසේ නිදයි. දුකසේ පිබිදෙයි. පව්සිහින දක්නේ ය. දෙවියෝ නොරක්නාහ. අශුචි (ශුක්‍ර) මිදෙයි.

මහණෙනි, නට සිහි ඇතිව මනා නුවණ නැතිව නින්දට වැටෙනුවහට මේ දෙස් පස වෙයි.

මහණෙනි, එළඹ සිටි සිහි ඇතිව මනා නුවණැතිව නින්දට වැටෙනුවහට මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

සුවසේ හොවියි. සුවසේ පිබිදෙයි. ලමු සිහින නොදක්නේය. දෙවියෝ රක්නාහ. අශුචි නො මිදෙයි.

මහණෙනි, එළඹ සිටි සිහි ඇතිව මනා නුවණ ඇතිව නින්දට වැටෙනුවහට මේ අනුසස් පසයි.

**කිම්බිලවග්ගය පළමුවැනි යි.**

**එහි උද්දානය:**

කිම්බිල සූත්‍රය, ධම්මසවණ සූත්‍රය, ආජානීය සූත්‍රය, බල සූත්‍රය, චෙතොඛිල සූත්‍රය, චෙතොවිනිබන්ධ සූත්‍රය, යාගු සූත්‍රය, දන්තකට්ඨ සූත්‍රය, ගීතස්සර සූත්‍රය, මුට්ඨස්සති සූත්‍රය දැයි දශයෙකි.

## 2. අක්කොසක වග්ගො

### 5. 5. 2. 1.

### [අක්කොසක සුත්තං]

[සාවත්ථිනිදානං]

**11.** යො සො භික්ඛවෙ භික්ඛු අක්කොසකපරිභාසකො අරියූපවාදී සබ්‍රහ්මචාරීනං, තස්ස පඤ්ච ආදීනවා පාටිකඞ්ඛා. කතමෙ පඤ්ච:

පාරාජිකො වා හොති ඡින්නපරිපන්ථො, අඤ්ඤතරං වා සඞ්කිලිට්ඨං ආපත්තිං ආපජ්ජති, බාළ්හං වා රොගාතඞ්කං ඵුසති, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

යො සො භික්ඛවෙ භික්ඛු අක්කොසකපරිභාසකො අරියූපවාදී සබ්‍රහ්මචාරීනං, තස්ස ඉමෙ පඤ්ච ආදීනවා පාටිකඞ්ඛාති.

### 5. 5. 2. 2.

### [භණ්ඩනකාරක සුත්තං]

[සාවත්ථිනිදානං]

**12.** යො සො භික්ඛවෙ භික්ඛු භණ්ඩනකාරකො කලහකාරකො විවාදකාරකො භස්සකාරකො සඞ්ඝෙ අධිකරණකාරකො, තස්ස පඤ්ච ආදීනවා පාටිකඞ්ඛා. කතමෙ පඤ්ච:

අනධිගතං නාධිගච්ඡති, අධිගතං[1] පරිහායති, පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

යො සො භික්ඛවෙ භික්ඛු භණ්ඩනකාරකො කලහකාරකො විවාදකාරකො භස්සකාරකො සඞ්ඝෙ අධිකරණකාරකො, තස්ස ඉමෙ පඤ්ච ආදීනවා පාටිකඞ්ඛාති.

### 5. 2. 3.

### [සීලසුත්තං]

[සාවත්ථිනිදානං]

**13.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ දුස්සීලො සීලවිපන්නො පමාදාධිකරණං මහතිං භොගජානිං නිගච්ඡති, අයං භික්ඛවෙ පඨමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුන ච පරං භික්ඛවෙ දුස්සීලස්ස සීලවිපන්නස්ස පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං භික්ඛවෙ දුතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

---

1. අධිගතා - මජසං

## 2. අක්කොසක වර්ගය

### 5. 5. 2. 1.

### [අක්කොසක සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**11**. මහණෙනි, යම් මහණෙක් සබ්‍රම්සරුන්ට ආක්‍රොශ පරිභව කරන්නේ ආර්‍ය්‍යයනට උපවාද කරන සුලු වේ නම්, ඔහු විසින් ආදීනව පසෙක් කැමැති විය යුතු ය. කවර පසෙක යත්:

සුත් ලොව්තුරු දහම් ඇතියේ පරිජී අවන්නේ හෝ වෙයි. අභ්‍යන්තර කිලිටි සහිත ඇවතකට හෝ අවදනේ ය. දැඩි රොගොපද්‍රවයෙක් හෝ පහස්නේ ය. සම්මූඪ ව කාලක්‍රියා කරන්නේ ය. කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගීති නම් වූ විනිපාත නම් වූ නිරයට එළඹෙන්නේ ය.

මහණෙනි, යම් මහණෙක් සබ්‍රම්සරුන්හට ආක්‍රොශ පරිභව කරන්නේ ආර්‍ය්‍යෝපවාදී වේ නම්, ඔහු විසින් මේ ආදීනව පස කැමැති වියයුතු යයි.

### 5. 5 2. 2.

### [භණ්ඩනකාරක සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**12**. මහණෙනි, යම් මහණෙක් ඩබරකරන්නේ කලහ කරන්නේ විවාද කරන්නේ වාක්කලහ කරන්නේ සඞ්ඝයා කෙරෙහි අධිකරණ කරන්නේ නම්, ඔහු විසින් ආදීනව පසෙක් කැමැති වියයුතු යි. කවර පසෙක යත්:

අනධිගත ගුණවිශෙෂය නො ලබන්නේ ය. අධිගත ගුණවිශෙෂය පිරිහෙයි. පාපක කීර්තිශබ්දය නැඟෙයි. සම්මූඪ වූයේ කලුරිය කරයි. කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගීති නම් වූ විනිපාත නම් වූ නිරයට එළඹෙයි.

මහණෙනි, යම් මහණෙක් ඩබර කරන්නේ කලහ කරන්නේ විවාද කරන්නේ වාක්කලහ කරන්නේ සඟුන් කෙරෙහි අධිකරණ කරන්නේ නම්, ඔහු විසින් මේ ආදීනව පස කැමැති වියයුතු යි.

### 5. 5. 2. 3.

### [සීල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**13**. මහණෙනි, දුශශීලයාට ශීලවිපත්තියෙහි (=සිල්බිඳීමෙහි) මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, මෙහි ශීලවිපන්න (=ශීලවිපත්තියට පත්) ගිහි දුශශීලයා ප්‍රමාදය නිසා මහත් භොග හානියට, (පැවිදි දුශශීලයා සජ්ඣායඞ්ඣනහානියට) පැමිණෙයි. මහණෙනි, දුශ්ශීලයාගේ ශීල විපත්තියෙහි මේ පළමුවන ආදීනවය යි.

තවද මහණෙනි, ශීලවිපන්න දුශශීලයාගේ පවිටු කීර්ති ඝොෂය නැගේ. මහණෙනි, දුශශීලයාගේ ශීලවිපත්තියෙහි මේ දෙවන ආදීනවය යි

පුන ච පරං භික්ඛවෙ දුස්සීලො සීලවිපන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති: යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං, අවිසාරදෙ උපසඞ්කමති, මඞ්කුභූතො. අයං භික්ඛවෙ තතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුන ච පරං භික්ඛවෙ දුස්සීලො සීලවිපන්නො සම්මූළ්හො කාලං කරොති. අයං භික්ඛවෙ චතුත්ථො ආදීනවො දුස්සීලස්ස සීල විපත්තියා.

පුන ච පරං භික්ඛවෙ දුස්සීලො සීලවිපන්නො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. අයං භික්ඛවෙ පඤ්චමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා සීලවතො සීලසම්පදාය. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ සීලවා සීලසම්පන්නො අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති. අයං භික්ඛවෙ පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන ච පරං භික්ඛවෙ සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං භික්ඛවෙ දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන ච පරං භික්ඛවෙ සීලවා සීලසම්පන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති: යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං, විසාරදෙ උපසඞ්කමති, අමඞ්කුභූතො. අයං භික්ඛවෙ තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන ච පරං භික්ඛවෙ සීලවා සීලසම්පන්නො අසම්මූළ්හො කාලං කරොති. අයං භික්ඛවෙ චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන ච පරං භික්ඛවෙ සීලවා සීලසම්පන්නො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. අයං භික්ඛවෙ පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා සීලවතො සීලසම්පදායාති.

### 5. 5. 2. 4.

### [බහුභාණි සුත්තං]

[සාවත්ථිනිදානං]

**14**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා බහුභාණිස්මිං පුග්ගලෙ. කතමෙ පඤ්ච.

මුසා භණති, පිසුනං භණති, ඵරුසං භණති, සම්ඵප්පලාපං භණති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා බහුභාණිස්මිං පුග්ගලෙ.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා මන්තභාණිස්මිං පුග්ගලෙ. කතමෙ පඤ්ච:

තවද මහණෙනි, ශීලවිපන්න දුශශීලයා ක්‍ෂත්‍රිය පිරිසකට වේවයි බ්‍රාහ්මණ පිරිසකට වේවයි ගෘහපති පිරිසකට වේවයි ශ්‍රමණ පිරිසකට වේවයි යම් යම් පිරිසකට එළඹේ නම්, අවිශාරද (බියසහිත) වූයේ සැක සහිත වූයේ එළඹෙයි. මහණෙනි, දුශශීලයාගේ ශීලවිපත්තියෙහි මේ තුන්වන ආදීනවය යි.

තවද මහණෙනි, ශීලවිපන්න දුශශීලයා මූළ්‍රා වූයේ කලුරිය කෙරෙයි. මහණෙනි, දුශශීලයාගේ ශීලවිපත්තියෙහි මේ සිව් වන ආදීනවය යි

තවද මහණෙනි, ශීලවිපන්න දුශශීලයා කය බිඳීමෙන් මරණින් මතු අපාය වූ දුගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි. මහණෙනි, දුශශීලයාට ශීලවිපත්තියෙහි මේ පස්වන ආදීනවය යි.

මහණෙනි, දුශශීලයාගේ ශීලවිපත්තියෙහි මේ ආදීනව පස යි.

මහණෙනි, සිල්වතාගේ ශීලසම්පත්තියෙහි (=සිල් පිරීමෙහි) මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, මෙහි සීලසම්පන්න සිල්වත් (ගිහියා) අප්‍රමාදය නිසා මහත් භොග රාශිය (පැවිද්ද ආයශී ධනය) ලබයි. මහණෙනි, සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි මේ පළමුවන අනුසස යි.

තවද මහණෙනි, ශීලසම්පන්න සිල්වත්හට යහපත් කීර්ති ඝොෂයෙක් නැගේ. මහණෙනි, සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි මේ දෙවන අනුසස යි.

තවද මහණෙනි, ශීලසම්පන්න සිල්වත් යම් යම් පිරිසකට ක්‍ෂත්‍රිය පිරිසකට වේවයි බ්‍රාහ්මණ පිරිසකට වේවයි ගෘහපති පිරිසකට වේවයි ශ්‍රමණ පිරිසකට වේවයි එළඹේ නම්, විශාරද (නිර්භීත) වූයේ නිසැක වූයේ එළඹෙයි. මහණෙනි, සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි මේ තුන්වන අනුසස යි.

තවද මහණෙනි, ශීලසම්පන්න සිල්වත් නොමුළා වූයේ කලුරිය කෙරෙයි. මහණෙනි, සිල්වත්හට සිලසම්පත්තියෙහි මේ සිව්වන අනුසස යි.

තවද මහණෙනි, ශීලසම්පන්න සිල්වත් කය බිඳීමෙන් මරණින් මතු සුගති වූ ස්වර්ගලොකයට පැමිණෙයි. මහණෙනි, සිල්වත්හට ශීලසම්පත්ති යෙහි මේ පස්වන අනුසස යි.

මහණෙනි, මේ සිල්වත්හට ශීලසම්පදාවෙහි අනුසස් පස යි.

(මේ සූත්‍රය ගිහි පැවිදි දෙපසට ම සුදුසුසේ යෙදේ.)

## 5. 5. 2. 4.

## [බහුභාණී සූත්‍රය]

### [සැවැත්නිදාන යි]

**14.** මහණෙනි, බහුභාණී (ප්‍රඥාවෙන් නො පිරිසිඳ බොහෝ කථාකරණ) පුද්ගලයා කෙරෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

බොරු කියයි. පිසුනු කියයි. රළුබස් කියයි. හිස්බස් කියයි. කය බිඳීමෙන් මරණින් මතු අපාය වූ දුගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි. මහණෙනි, මේ බහුභාණී පුද්ගලයා කෙරෙහි ආදීනව පස යි.

මහණෙනි, මන්තභාණී (=නුවණින් දැන කථාකරණ) පුද්ගලයා කෙරෙහි. මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

න මුසා භණති, න පිසුනං භණති, න ඵරුසං භණති, න සම්ඵප්පලාපං භණති. කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා මනතභාණිස්මිං පුග්ගලෙති.

5. 5. 2. 5.

[පඨම අක්ඛන්තිසුත්තං]

[සාවත්ථිනිදානං]

**15.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා අක්ඛන්තියා. කතමෙ පඤ්ච:

බහුනො ජනස්ස අප්පියො හොති අමනාපො, වෙරබහුලො ච හොති, වජ්ජබහුලො ච, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා අක්ඛන්තියා.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා ඛන්තියා. කතමෙ පඤ්ච:

බහුනො ජනස්ස පියො හොති මනාපො, න වෙරබහුලො හොති, න වජ්ජබහුලො, අසම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා ඛන්තියාති.

5. 5. 2. 6.

[දුතිය අක්ඛන්තිසුත්තං]

[සාවත්ථිනිදානං]

**16.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා අක්ඛන්තියා. කතමෙ පඤ්ච:

බහුනො ජනස්ස අප්පියො හොති අමනාපො, ලුද්දො ච හොති, විප්පටිසාරී ච, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා අක්ඛන්තියා.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා ඛන්තියා. කතමෙ පඤ්ච.

බහුනො ජනස්ස පියො හොති මනාපො, අලුද්දො ච හොති, අවිප්පටිසාරී ච, අසම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා ඛන්තියාති.

බොරු නො කියයි. පිසුනු නො කියයි. රළුබස් නො කියයි. හිස්බස් නො කිය යි. කය බිඳීමෙන් මරණින් මතු සුගති වූ ස්වර්ගලොකයට පැමිණෙයි. මහණෙනි, මේ මන්තභාණී පුද්ගලයා කෙරෙහි අනුසස් පස යි.

## 5. 5. 2. 5.

## [ප්‍රථම අක්ඛන්ති සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**15**. මහණෙනි, අක්ෂාන්තියෙහි (මෙරමා වරද නො ඉවසීමෙහි) මේ ආදීනව පසෙකි· කවර පසෙක යත්:

බොහෝ දෙනාට අප්‍රිය අමනාප වෙයි. වෛර බහුල ද වෙයි. වද්‍ය බහුල ද වෙයි. සම්මූඪ ව කලුරිය කෙරෙයි. කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි.

මහණෙනි, අක්ෂාන්තියෙහි මේ ආදීනව පස යි.

මහණෙනි, ක්ෂාන්තියෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

බොහෝ දෙනාට ප්‍රිය මනාප වෙයි. වෛර බහුල නො වේ. වද්‍ය බහුල නො වේ. අසම්මූඪ ව කලුරිය කෙරෙයි. කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ග ලොකයට පැමිණෙයි.

මහණෙනි, ක්ෂාන්තියෙහි මේ අනුසස් පස යි.

## 5. 5. 2. 6.

## [ද්විතීය අක්ඛන්ති සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**16.** මහණෙනි, අක්ෂාන්තියෙහි මේ දෙෂ් පසෙකි. කවර පසෙක යත්:

බොහෝ දෙනාට අප්‍රිය අමනාප වෙයි. රෞද්‍ර ද වෙයි. විපිළිසර ඇති යේ ද වෙයි. මූළ්හ වූ සිහි ඇතියේ කලුරිය කරයි. කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි.

මහණෙනි, අක්ෂාන්තියෙහි මේ දෙස් පස යි.

මහණෙනි, ක්ෂාන්තියෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

බොහෝ දෙනාට ප්‍රිය මනාප වෙයි. රෞද්‍ර ද නො වෙයි. විපිළිසර ඇතියේ ද නො වෙයි. මූළ්හ නො වූ සිහි ඇතියේ කලුරිය කරයි. කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ග ලොකයෙහි උපදනේ ය.

මහණෙනි, ක්ෂාන්තියෙහි මේ අනුසස් පස යි.

## 5. 5. 2. 7.

### [පඨමඅපාසාදික සුත්තං]

[සාවත්ථිනිදානං]

17. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා අපාසාදිකෙ. කතමෙ පඤ්ච:

අත්තාපි අත්තානං උපවදති, අනුවිච්ච විඤ්ඤූ ගරහන්ති, පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා අපාසාදිකෙ.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා පාසාදිකෙ කතමෙ පඤ්ච:

අත්තාපි අත්තානං න උපවදති, අනුවිච්ච විඤ්ඤූ පසංසන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, අසම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා පාසාදිකෙති.

## 5. 5. 2. 8.

### [දුතියඅපාසාදිකසුත්තං]

[සාවත්ථිනිදානං]

18. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා අපාසාදිකෙ. කතමෙ පඤ්ච:

අප්පසන්නා නප්පසීදන්ති, පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තං හොති, සත්ථුසාසනං අකතං හොති, පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති, චිත්තමස්ස නප්පසීදති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා අපාසාදිකෙ.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා පාසාදිකෙ. කතමෙ පඤ්ච:

අප්පසන්නා පසීදන්ති, පසන්නානඤ්ච භීය්‍යො භාවො හොති, සත්ථු සාසනං කතං හොති, පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති, චිත්තමස්ස පසීදති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා පාසාදිකෙති.

5. 5. 2. 7.

[ප්‍රථම අපාසාදික සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**17**. මහණෙනි, අප්‍රාසාදිකයා කෙරෙහි මේ දෙස් පසෙකි. කවර පසෙක යත්:

තෙමේත් තමහට උපවාද කෙරෙයි. විඥයෝ දැනැ ගර්හා කරත්. ලාමක කීර්තිශබ්දයෙක් නැඟෙයි. සම්මූඪ ව කලුරිය කරයි. කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි.

මහණෙනි, අප්‍රාසාදිකයා කෙරෙහි මේ දෙස් පස යි.

මහණෙනි, ප්‍රාසාදික පුද්ගලයා කෙරෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

තෙමේත් තමහට උපවාද නො කරයි. විඥයෝ දැන පසස්නාහ. කලණකිත්හඬ නැඟෙයි. අසම්මූඪ වූයේ කලුරිය කරයි. කාබුන් මරණින් මතු සුගති සවර්ගලොකයට පැමිණෙයි.

මහණෙනි, ප්‍රාසාදික පුද්ගලයා කෙරෙහි මේ අනුසස් පස යි.

5. 5. 2. 8.

[ද්විතීය අපාසාදික සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**18**. මහණෙනි, අප්‍රාසාදික පුද්ගලයා කෙරෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

නො පහන්හු නො පහදනාහ. පහන් වූ ද ඇතැමුන්ගේ අන්‍යථාභාවය (කලකිරීම) වෙයි. ශාස්තෲ ශාසනය නො කරණ ලද වෙයි. පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණෙයි. ඔහුගේ සිත නො පහදී.

මහණෙනි, අප්‍රාසාදික පුද්ගලයා කෙරෙහි මේ දෙස් පස යි.

මහණෙනි, ප්‍රාසාදිකයා කෙරෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

අප්‍රසන්නයෝ පහදනාහ. ප්‍රසන්නයන්ගේ ද භූයොභාවය වෙයි. ශාස්තෲශාසනය කරණ ලද වෙයි. පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණෙයි. ඔහුගේ සිත පැහැදෙයි.

මහණෙනි, ප්‍රාසාදිකයා කෙරෙහි මේ අනුසස් පස යි.

5. 5. 2. 9.

[අග්ගිසුත්තං]

[සාවත්ථිනිදානං]

**19**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා අග්ගිස්මිං. කතමෙ පඤ්ච:

අචක්ඛුස්සො, දුබ්බණ්ණකරණො, දුබ්බලකරණො, සඞ්ගණිකාපවඩ්ඪනො, තිරච්ඡානකථාපවත්තනිකො.[1]

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා අග්ගිස්මින්ති.

5. 5. 2. 10.

[මධුරාසුත්තං]

[සාවත්ථිනිදානං]

**20**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා මධුරායං. කතමෙ පඤ්ච:

විසමා, බහුරජා, චණ්ඩසුනඛා, වාළයක්ඛා, දුල්ලභපිණ්ඩා.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා මධුරායන්ති.

**අක්කොසකවග්ගො දුතියො.**

**තස්සුද්දානං:**

අක්කොසභණ්ඩනසීලං බහුභාණී ද්වෙ අක්ඛන්තියො
අපාසාදිකා ද්වෙ වුත්තා අග්ගිස්මිං මධුරාය[2] වා'ති.

1. තිරච්ඡානකථං පත්තිකො හොති - මජසං
2. මධුරෙය-සීමු.

## 5. 5. 2. 9.

## [අගති සූත්‍රය]

[සැවැත්නිදානයි]

**19.** මහණෙනි, ගිත්තෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

ඇසට අහිත වෙයි. දුර්‍ගන්ධ කරනුයේ වෙයි. දුර්වල කරනුයේ වෙයි. ගණසඞ්ගණිකා වඩනුයේ වෙයි. තිරශ්චීනකථා පිණිස පවත්තේ වේ.

මහණෙනි, අගතියෙහි මේ පස් ආදීනව යි.

## 5. 5. 2. 10.

## [මධුරා සූත්‍රය]

[සැවත්නිදාන යි]

**20.** මහණෙනි, මධුරානගරයෙහි මේ ආදීනව පසෙක. කවර පසෙක යත්:

විෂම වූයේ ය. බෝහෝ රජස් ඇතියේ ය. සැඩ ශුනකයන් ඇතියේ ය. ව්‍යාලයක්‍ෂයන් ඇතියේ ය. දුර්ලභ පිණ්ඩපාත ඇතියේ ය.

මහණෙනි, මධුරායෙහි මේ පස් ආදීනව යි.

අක්කොසකවග්ගය දෙවැනි යි.

**එහි උද්දානය:**

අක්කොසක සූත්‍ර ය, භණ්ඩන සූත්‍රය, සීලසූත්‍රය, බහුභාණී සූත්‍ර ය, අක්ඛන්ති සූත්‍රදෙක ය, අපාසාදික සූත්‍ර දෙක ය, අග්ගි සූත්‍ර ය, මධුරා සූත්‍රය දැ යි සූත්‍ර දශයෙකි.

## 3. දීඝචාරික වග්ගො.

### 5. 5. 3. 1.

### [පඨමදීඝචාරික සුත්තං]

[සාවත්ථිනිදානං]

**21.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දීඝචාරිකං අනවත්ථ චාරිකං[1] අනුයුත්තස්ස විහරතො. කතමෙ පඤ්ච:

අස්සුතං න සුණාති, සුතං න පරියොදපෙති, සුතෙනෙකච්චෙන අවිසාරදො හොති, ගාළ්හං රොගාතඞ්කං ඵුසති, න ච මිත්තවා හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා දීඝචාරිකං අනවත්ථ චාරිකං[1] අනුයුත්තස්ස විහරතො.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා සමවත්ථචාරෙ. කතමෙ පඤ්ච:

අස්සුතං සුණාති, සුතං පරියොදපෙති, සුතෙනෙකච්චෙන විසාරදො හොති, න ගාළ්හං[2] රොගාතඞ්කං ඵුසති, මිත්තවා ච හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා සමවත්ථචාරෙති.

### 5. 5. 3. 2.

### [දුතියදීඝචාරික සුත්තං]

[සාවත්ථිනිදානං]

**22.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දීඝචාරිකං අනවත්ථ චාරිකං[1] අනුයුත්තස්ස විහරතො. කතමෙ පඤ්ච:

අනධිගතං නාධිගච්ඡති, අධිගතං පරිහායති, අධිගතෙනෙකච්චෙන අවිසාරදො හොති, ගාළ්හං[2] රොගාතඞ්කං ඵුසති, න ච මිත්තවා හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා දීඝචාරිකං අනවත්ථ චාරිකං[1] අනුයුත්තස්ස විහරතො.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා සමවත්ථචාරෙ. කතමෙ පඤ්ච:

අනධිගතං අධිගච්ඡති, අධිගතං න පරිහායති, අධිගතෙනෙකච්චෙන විසාරදො හොති, න ගාළ්හං[2] රොගාතඞ්කං ඵුසති, මිත්තවා ච හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා සමවත්ථචාරෙති.

---

1. අනවත්ථිත චාරිකං - සීමු, මජසං, අනවට්ඨිත චාරිකං - සතා
2. ගාළ්හං - සීමු, මජසං .PTS

## 3. දීඝචාරික වර්ගය.

### 5. 5. 3. 1.

### [ප්‍රථම දීඝචාරික සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**21.** මහණෙනි, දීඝචාරිකායෙහි අවසථිත (අනියම්) චාරිකායෙහි යෙදී වසන්නහුට මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

අශ්‍රැත ධර්මය නො අස යි. ශ්‍රැතය පිරිසිදු නො කෙරෙයි. මඳ මඳ ව ඇසූ ධර්මයෙන් අවිසාරද (සොම්නසට නො පැමිණියේ) වෙයි. දැඩි රොගොපද්‍රව පහස්නේ වෙයි. මිත්‍රයන් ඇතියේ නො වෙයි.

මහණෙනි, දීඝචාරිකාවෙහි අනියම් චාරිකාවෙහි යෙදී වසන්නහුට මේ ආදීනව පස යි.

මහණෙනි, සමවසථිත (අවස්ථානුරූප) චාරිකායෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

අශ්‍රැත ධර්මය අසයි. ශ්‍රැතය පිරිසිදු කෙරෙයි. අසන ලද ඇතැම් ශ්‍රැත යෙන් විසාරද වෙයි. දැඩි රොගොපද්‍රව නො පහස්නේ වෙයි. මිතුරන් ඇතියේ ද වෙයි.

මහණෙනි, මේ සමවසථිත චාරිකායෙහි අනුසස් පස යි.

### 5. 5. 3. 2.

### [ද්විතීය දීඝචාරික සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**22**. මහණෙනි, දීඝචාරිකාවෙහි අවසථිත චාරිකාවෙහි යෙදී වසන්නහුට මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

අනධිගත විශෙෂයට නො පැමිණෙයි. අධිගත විශෙෂය පිරිහෙයි. අධිගත ඇතැම් දෙයින් අවිශාරද වෙයි. දැඩි රොගොපද්‍රව පහස්නේ වෙයි. මිත්‍රයන් ඇතියේ නො වෙයි.

මහණෙනි, දීඝචාරිකායෙහි අවසථිත චාරිකායෙහි යෙදී වසනුවහට මේ ආදීනව පස යි.

මහණෙනි, සමවසථිත චාරයෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

අනධිගත විශෙෂයට පැමිණෙයි. අධිගතය නො පිරිහෙයි. අධිගත ඇතැම් දෙයින් විශාරද වෙයි. දැඩි රොගොපද්‍රවය නො පහස්නේ ය. මිතුරන් ඇතියේ වෙයි.

මහණෙනි, සමවසථිත චාරිකායෙහි මේ අනුසස් පස යි.

## 5. 5. 3. 3.

## [පඨමඅතිනිවාස සුත්තං]

[සාවත්ථිනිදානං]

23. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා අතිනිවාසෙ[1]. කතමෙ පඤ්ච:

බහුභණ්ඩො හොති බහුභණ්ඩසන්නිචයො, බහුභෙසජ්ජො හොති බහුභෙසජ්ජසන්නිචයො, බහුකිච්චො හොති බහුකරණීයො ව්‍යත්තො කිඞ්කරණීයෙසු, සංසට්ඨො විහරති ගහට්ඨපබ්බජිතෙහි අනනුලොමිකෙන ගිහිසංසග්ගෙන, තම්හා ච ආවාසා පක්කමන්තො සාපෙක්ඛො පක්කමති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආදීනවා අතිනිවාසෙ.

පඤ්චිමෙ භික්ඛවෙ, ආනිසංසා සමවත්ථවාසෙ. කතමෙ පඤ්ච:

න බහුභණ්ඩො හොති න බහුභණ්ඩසන්නිචයො, න බහුභෙසජ්ජො හොති න බහුභෙසජ්ජසන්නිචයො, න බහුකිච්චො හොති න බහු-කරණීයො න ව්‍යත්තො කිඞ්කරණීයෙසු, අසංසට්ඨො විහරති ගහට්ඨ-පබ්බජිතෙහි අනනුලොමිකෙන ගිහිසංසග්ගෙන, තම්හා ච ආවාසා පක්කමන්තො අනපෙක්ඛො පක්කමති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආනිසංසා සමවත්ථවාසෙති.

## 5. 5. 3. 4.

## [දුතිය අතිනිවාස සුත්තං]

[සාවත්ථිනිදානං]

24. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා අතිනිවාසෙ[1]. කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරී හොති, කුලමච්ඡරී හොති, ලාභමච්ඡරී හොති, වණ්ණ-මච්ඡරී හොති, ධම්මමච්ඡරී හොති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආදීනවා අතිනිවාසෙ.

පඤ්චිමෙ භික්ඛවෙ, ආනිසංසා සමවත්ථවාසෙ. කතමෙ පඤ්ච:

න ආවාසමච්ඡරී හොති, න කුලමච්ඡරී හොති, න ලාභමච්ඡරී හොති. න වණ්ණමච්ඡරී හොති, න ධම්මමච්ඡරී හොති.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආනිසංසා සමවත්ථවාසෙති.

---

1. අතිනිවාසෙ - සයා

## 5. 5. 3. 3.

## [ප්‍රථම අතිනිවාස සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**23.** මහණෙනි, අතිනිවාසයෙහි (පමණට වැඩිකල් එක්තැන්හි විසීමෙහි) මේ දෙස් පසෙකි. කවර පසෙක යත්:

බොහෝ භාණ්ඩ රැස්කරණුයේ බහු භාණ්ඩික වෙයි. බොහෝ බෙහෙසද් රැස්කරණුයේ බහුභෙසජ්ජ වෙයි. බහුකෘත්‍ය ඇතියේ බොහෝ කරණී ඇතියේ කිංකර්තව්‍යයන්හි ව්‍යක්ත (කළයුතු කිමැයි සෙවීමෙහි ඇලුණේ) වෙයි. ගෘහස්ථප්‍රව්‍රජිතයන් හා එක්වී අනනුලෝම වූ (නුසුදුසු) ගිහිසංසග්ගයෙන් හැනී වෙසෙයි. එ අවසින් නික්මයන්නේ නමුදු සාපෙක්‍ෂ වූයේ නික්ම යෙයි.

මහණෙනි, අතිවාසයෙහි මෙ දෙස් පස යි.

මහණෙනි, සමවසථිත වාසයෙහි (සුදුසුකල් විසීමෙහි) මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

බොහෝ භාණ්ඩ රැස් නො කරණුයේ බහුභාණ්ඩික නොවෙයි. බොහෝ බෙහෙසද් රැස් නො කරණුයේ බහුභෙසජ්ජ නො වෙයි. බහුකෘත්‍ය නැතියේ බොහෝ කරණී නැතියේ කිංකර්තව්‍යයන්හි ඇලුණේ නො වෙයි. ගිහි පැවිද්දන් හා එක්නොවී අනුලෝම් නො වූ ගිහි සසගින් නො හැනී වෙසෙයි. එ අවසින් නික්ම යනුයේ ද අපෙක්‍ෂා නැතිව නික්ම යෙයි.

මහණෙනි, සමවසථිත වාසයෙහි මේ අනුසස් පසයි.

## 5. 5. 3. 4.

## [ද්විතීය අතිනිවාස සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**24.** මහණෙනි, අතිනිවාසයෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

ආවාසයෙහි මසුරු වෙයි. කුලයෙහි මසුරු වෙයි. ලාභයෙහි මසුරු වෙයි. ගුණයෙහි මසුරු වෙයි. ධර්මයෙහි මසුරු වෙයි.

මහණෙනි, මේ අතිනිවාසයෙහි ආදීනව පස යි.

මහණෙනි, සමවසථිත නිවාසයෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

ආවාසයෙහි මසුරු නොවෙයි. කුලයෙහි මසුරු නොවෙයි. ලාභයෙහි මසුරු නො වෙයි. වර්ණයෙහි මසුරු නො වෙයි. ධර්මයෙහි මසුරු නොවේ.

මහණෙනි, සමවසථිත නිවාසයෙහි මේ ආනිසංස පසයි.

### 5. 5. 3. 5.

### [පඨමකුලූපග සුත්තං]

[සාවත්ථිනිදානං]

**25**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා කුලූපගෙ. කතමෙ පඤ්ච:

අනාමන්තචාරෙ ආපජ්ජති, රහො නිසජ්ජාය ආපජ්ජති, පටිච්ඡන්නෙ ආසනෙ ආපජ්ජති, මාතුගාමස්ස උත්තරිඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙන්තො ආපජ්ජති, කාමසඞ්කප්පබහුලො විහරති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා කුලූපගෙ'ති.

### 5. 5. 3. 6.

### [දුතියකුලූපග සුත්තං]

[සාවත්ථිනිදානං]

**26**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා කුලූපගස්ස භික්ඛුනො අතිවෙලං කුලෙසු සංසට්ඨස්ස විහරතො. කතමෙ පඤ්ච:

මාතුගාමස්ස අභිණ්හදස්සනං, දස්සනෙ සති සංසග්ගො, සංසග්ගෙ සති විස්සාසො, විස්සාසෙ සති ඔතාරො, ඔතිණ්ණචිත්තස්සෙතං පාටිකඞ්ඛං: අනභිරතො වා බ්‍රහ්මචරියං චරිස්සති, අඤ්ඤතරං වා සඞ්කිලිට්ඨං ආපත්තිං ආපජ්ජිස්සති, සික්ඛං වා පච්චක්ඛාය හීනායාවත්තිස්සති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා කුලූපගස්ස භික්ඛුනො අතිවෙලං කුලෙසු සංසට්ඨස්ස විහරතොති.

### 5. 5. 3. 7.

### [භොගසුත්තං]

[සාවත්ථිනිදානං]

**27**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා භොගෙසු. කතමෙ පඤ්ච:

අග්ගිසාධාරණා භොගා, උදකසාධාරණා භොගා, රාජසාධාරණා භොගා, චොරසාධාරණා භොගා, අප්පියෙහි දායාදෙහි සාධාරණා භොගා.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා භොගෙසු.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා භොගෙසු. කතමෙ පඤ්ච:

භොගෙ නිස්සාය අත්තානං සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති, මාතාපිතරො සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති, පුත්තදාරදාසකම්මකරපොරිසෙ සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති, මිත්තාමච්චෙ සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති, සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා භොගෙසූ'ති.

### 5. 5. 3. 5.

### [ප්‍රථම කුලූපග සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**25**. මහණෙනි, කුලොපග (කුලයන්හි හැසිරෙන) මහණහු කෙරෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

නො පිළිවිසැ ගම්වැදීමෙහි ඇවැතට අවදනේ ය. රහස්ගතව (මාගමක හා) හිඳීමෙහි ඇවතට පැමිණෙයි. පිළිසන් අස්නෙහි (මාගමක හා) හිඳීමෙහි ඇවතට පැමිණෙයි. මාගමකට සපස්වදනෙකින් මතුයෙහි දහම් දෙසන්නේ ඇවැත් අවදනේ ය. කාමසඞ්කල්ප බහුල ව වෙසෙයි.

මහණෙනි, කුලොපගයා කෙරෙහි මේ ආදීනව පස යි.

### 5. 5. 3. 6.

### [ද්විතිය කුලූපග සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**26**. මහණෙනි, කල්ගෙවා කුලෙහි හැනී වසන කුලොපග මහණහට මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

නිරතුරු මාගමකගේ දර්ශනය වෙයි. දර්ශනය වත්ම සසඟ වෙයි. සංසර්ගය වත් ම විශ්වාසය වෙයි. විශ්වාසය ඇතිවත් ම රාගයාගේ බැස ගැණීම වෙයි. රාගයෙන් බැසගත්නා ලද සිත් ඇතියහු විසින් "අභිරති (කැමැත්තක්) නැතිවැ බඹසර රක්නේ හෝ වෙයි, අන්‍යතර කිලිට්සහිත අවැතකට අවදනේ හෝ වෙයි, සිකපද ප්‍රත්‍යාඛ්‍යාන (හැරලීම) කොට හීන (ගිහි) භාවයට හෝ යන්නේ ය" යන තෙල කරුණ කැමැති විය යුතු යි.

මහණෙනි, කල් ඉක්මවා කුලයෙහි හැනී වෙසෙන කුලොපග මහණහට මේ ආදීනව පස යි.

### 5. 5. 3. 7.

### [භොග සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**27**. මහණෙනි, භොගයන්හි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

භොගයෝ අග්නිසාධාරණ වෙති. භොගයෝ උදකසාධාරණ වෙති. භොගයෝ රාජසාධාරණ වෙති. භොගයෝ සොරුනට සාධාරණ වෙති. භොගයෝ අප්‍රිය දායාදයන් (තමහට ප්‍රියනොවූ නෑදෑ ආදීන්) හා සාධාරණ වෙත්.

මහණෙනි, මේ භොගයන්හි ආදීනව පස යි.

මහණෙනි, භොගයන්හි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

භොගයන් නිසා තමා සුවපත් කෙරෙයි, පිණවයි, මොනොවට සුවසේ පරිහරණ කරයි. මවුපියන් සුවපත් කරයි, පිණවයි, මනා කොට සුවසේ පරිහරණ කරයි. පුත්‍රදාරදාසකම්කාරපුරුෂයන් සුවපත් කරයි, පිණවයි, මොනොවට සුවසේ පරිහරණ කරයි. මිත්‍රාමාත්‍යයන් (මිතුරු සහකරුවන්) සුවපත් කරයි, පිණවයි, මනාකොට සුවසේ පරිහරණ කරයි. ශ්‍රමණබ්‍රාහමණයන් කෙරෙහි මතු මතු භූමියෙහි සුවදෙන සුඅග රූපාදී සම්පත් දෙන සුඛවිපාක ඇති සග පිණිස වැටෙන දක්ෂිණා පිහිටුවයි.

මහණෙනි, භොගයන්හි මේ අනුසස් පස යි.

## 5. 5. 3. 8.

## [උස්සූරභත්තසුත්තං]

[සාවත්ථිනිදානං]

**28.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා උස්සූරභත්තෙ කුලෙ. කතමෙ පඤ්ච:

යෙ තෙ අතිථී පාහුනා තෙ න කාලෙන පටිපූජෙන්ති, යා තා බලිපටිග්ගාහිකා[1] දෙවතා තා න කාලෙන පටිපූජෙන්ති, යෙ තෙ සමණබ්‍රාහ්මණා එකභත්තිකා රත්තූපරතා විරතා විකාලභොජනා තෙ න කාලෙන පටිපූජෙන්ති, දාසකම්මකරපොරිසා විමුඛා කම්මං කරොන්ති, තාවතකංයෙව අසමයෙන භුත්තං අනොජවන්තං හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා උස්සූරභත්තෙ කුලෙ.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා සමයභත්තෙ කුලෙ. කතමෙ පඤ්ච:

යෙ තෙ අතිථී පාහුනා තෙ කාලෙන පටිපූජෙන්ති, යා තා බලිපටිග්ගාහිකා[1] දෙවතා තා කාලෙන පටිපූජෙන්ති, යෙ තෙ සමණබ්‍රාහ්මණා එකභත්තිකා රත්තූපරතා විරතා විකාලභොජනා තෙ කාලෙන පටිපූජෙන්ති, දාසකම්මකරපොරිසා අවිමුඛා කම්මං කරොන්ති, තාවතකංයෙව සමයෙන භුත්තං ඔජවන්තං හොති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා සමයභත්තෙ කුලෙති.

## 5. 5. 3. 9.

## [පඨමකණ්හසප්පසුත්තං]

[සාවත්ථිනිදානං]

**29.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා කණ්හසප්පෙ. කතමෙ පඤ්ච:

අසුචි, දුග්ගන්ධො, සභීරු, සප්පටිභයො, මිත්තදුභී[2] ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා කණ්හසප්පෙ.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චිමෙ ආදීනවා මාතුගාමෙ. කතමෙ පඤ්ච:

අසුචි, දුග්ගන්ධො, සභීරු, සප්පටිභයො, මිත්තදුභී.[3] ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා මාතුගාමෙති.

---

1. බලිපටිග්ගාහකා - සීමු.
2. මිත්තදුබ්භී - මජසං.

5. 5. 3. 8.

[උස්සූරභත්ත සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**28.** මහණෙනි, හිරු නැගී බොහෝ දහවල් අහර පිසින කුලෙහි මේ දෙස් පසෙකි. කවර පසෙක යත්:

සත්කාරාහී යම් අතිථිහු (ආගන්තුකයෝ) වෙත් නම්, ඔවුන් නිසි කල්හි නො පුදනාහ පුද පිළිගන්නා යම් දෙවතා කෙනෙක් වෙත් නම්, ඔවුන් නිසි කල්හි නො පුදනාහ. එකභත්තික වූ රාත්‍රිභොජනයෙන් වැළකි විකාලභොජනයෙන් විරත වූ යම් මහණබමුණු කෙනෙක් වෙත් නම්, නිසි කල්හි ඔවුන් නො පුදනාහ. දස්කම්කරුපුරුෂයෝ විමුඛව කම් කරත් (වැඩ හැර හිඳිත්). අසමයෙහි වැළැඳූ භොජනය එකෙණෙහි ඕජෝරහිත වෙයි.

මහණෙනි, බොහෝ දහවල් කොට අහර පිසින කුලයෙහි මේ ආදීනව පස යි.

මහණෙනි, නිසි කල්හි අහර පිසින කුලෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

යම් සත්කාරාහී අතිථිහු වෙත් නම්, ඔවුන් නිසි කල්හි පුදනාහ. පුද පිළිගන්නා යම් දෙවතා කෙනෙක් වෙත් නම්, ඔවුන් නිසි කල්හි පුදනාහ. එකභත්තික වූ රාත්‍රිභොජනයෙන් වැළැකි විකාලභොජනයෙන් විරත වූ යම් මහණබමුණෝ වෙත් නම්, ඔවුන් සුදුසු කල්හි පුදනාහ. දස්කම්කරු පුරුෂයෝ අවිමුඛ (උත්සුක) වූවාහු කම් කරන්නාහ. සුදුසු කාලයෙහි වැළැඳූ අහර එකෙණෙහි ඕජස් ඇතියේ වෙයි.

මහණෙනි, සමයභත්තකුලයෙහි මේ අනුසස් පස යි.

5. 5 3. 9.

[ප්‍රථම කණ්හසප්ප සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**29.** මහණෙනි, කෘෂ්ණසර්පයා (කළුනයා) කෙරේ මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

අපවිත්‍රය, දුර්ගන්ධය, සභිරුකය, ප්‍රතිභය සහිත ය (එහෙයින් ඉවත් කළ යුතුය), මිත්‍රද්‍රොහී ය. මහණෙනි, කෘෂ්ණසර්පයා කෙරෙහි මේ ආදීනව පස යි.

මහණෙනි, එ පරිද්දෙන් ම මාගම කෙරෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

අපවිත්‍ර ය, දුර්ගන්ධ ය, සභීරුකය, ප්‍රතිභය සහිතය, මිත්‍රද්‍රොහී ය. මහණෙනි, මාගම කෙරෙහි මේ ආදීනව පස යි.

## 5. 5. 3. 10.

### [දුතියකණ්හසප්පසුත්තං]

[සාවත්ථිනිදානං]

30. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා කණ්හසප්පෙ. කතමෙ පඤ්ච:

කොධනො, උපනාහී, ඝොරවිසො, දුජ්ජිව්හො, මිත්තදුභී[1].

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා කණ්හසප්පෙ.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා මාතුගාමෙ. කතමෙ පඤ්ච:

කොධනො, උපනාහී, ඝොරවිසො, දුජ්ජිව්හො, මිත්තදුභී.

තත්‍රිදං[2] භික්ඛවෙ මාතුගාමස්ස ඝොරවිසතා:[3] යෙභුය්‍යෙන භික්ඛවෙ මාතුගාමො තිබ්බරාගො. තත්‍රිදං භික්ඛවෙ මාතුගාමස්ස දුජ්ජිව්හතා: යෙභුය්‍යෙන භික්ඛවෙ මාතුගාමො පිසුනාවාචො. තත්‍රිදං භික්ඛවෙ මාතුගාමස්ස මිත්තදුභිතා: යෙභුය්‍යෙන භික්ඛවෙ මාතුගාමො අතිචාරිනී.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා මාතුගාමෙති.

**දීඝචාරිකවග්ගො තතියො.**

**තස්සුද්දානං.**

දීඝචාරිකා ද්වෙ වුත්තා අතිනිවාසමච්ඡරෙ,
ද්වෙ ච කුලූපගා භොගා භත්තං සප්පාපරෙ දුවෙති.

---

1. මිත්තදුබ්භී-මජ්සං.
2. තත්‍රිදං - මජ්සං.
3. ඝොරවිසං - සිමු.

## 5. .5 3. 10.

## [ද්විතීය කණ්හසප්ප සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**30.** මහණෙනි, කළුසප්හු කෙරෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

කිපෙන සුලු ය, වෛර බඳනා සුලු ය, ඝොරවිෂ ඇතියේ ය, දෙදිව් ඇතියේ ය, මිත්‍රද්‍රොහී ය.

මහණෙනි, කළුසප් කෙරෙහි මේ ආදීනව පස යි.

මහණෙනි, එ පරිද්දෙන් ම මාගම කෙරෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

කිපෙන සුලු ය, වෛර බඳිනා සුලු ය, ඝොරවිෂ ඇත්තී ය, දෙදිව් ඇත්තී ය, මිත්‍රද්‍රොහී ය.

මහණෙනි, එ කරුණෙහි ලා මාගමගේ මේ ඝොරවිෂ බව වෙයි: මහණෙනි, බොහෝ සෙයින් මාගම තීව්‍රරාග ඇත්තී ය. මහණෙනි, එ කරුණෙහි ලා මාගමගේ මේ දෙදිව් ඇති බව යි: මහණෙනි, මාගම බොහෝ සෙයින් පිසුණු බස් ඇත්තී ය. මහණෙනි, එ කරුණෙහි ලා මාගමගේ මේ මිත්‍රද්‍රොහීභාවය යි: මහණෙනි, මාගම බොහෝ සෙයින් අතිචාරිනී වෙයි.

මහණෙනි, මාගම කෙරෙහි මේ ආදීනව පස යි.

**දීඝචාරිකාවග්ගය තුන් වැනි යි.**

**එහි උද්දානය:**

දීඝචාරික සූත්‍ර දෙකක් කියනලද, අතිනිවාසසූත්‍ර ය, ද්‍රුතිය අතිනිවාස මච්ඡරීසූත්‍ර ය, කුලූපගසූත්‍ර දෙක ය, භොගසූත්‍ර ය, උස්සූරභත්තසූත්‍ර ය, කණ්හසප්පසූත්‍ර දෙක ය යි සූත්‍ර දසයෙකි.

# 4. ආවාසිකවග්ගො.

## 5. 5. 4. 1.

## [අභාවනීයසුත්තං]

**31.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු අභාවනීයො හොති. කතමෙහි පඤ්චහි:

න ආකප්පසම්පන්නො හොති න වත්තසම්පන්නො, න බහුස්සුතො හොති න සුතධරො, න පටිසල්ලෙඛිතා හොති න පටිසල්ලාණාරාමො,* න කල්‍යාණවාචො හොති න කල්‍යාණවාක්කරණො, දුප්පඤ්ඤො හොති ජළො එළමූගො.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු අභාවනීයො හොති.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු භාවනීයො හොති. කතමෙහි පඤ්චහි:

ආකප්පසම්පන්නො හොති වත්තසම්පන්නො, බහුස්සුතො හොති සුතධරො, පටිසල්ලෙඛිතා හොති පටිසල්ලාණාරාමො, කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො, පඤ්ඤවා හොති අජළො අනෙළමූගො.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු භාවනීයො හොතීති.

## 5. 5. 4. 2.

## [පියසුත්තං]

[සාවත්ථිනිදානං]

**32.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි පඤ්චහි:

සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා[1] කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති, ධතා[2] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙළගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චාති.

---

* න කල්‍යාණාරාමො, සෑම පොත්වල අධිකං.

1. සාත්ථං සව්‍යඤ්ජනං - මජසං - සයා, 2 ධාතා - මජසං

# 4. ආවාසික වර්ගය.

## 5. 5. 4. 1.

### [අභාවනීය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**31.** මහණෙනි, ධර්ම පසෙකින් සමන්‍වාගත ආවාසික මහණ අභාවනීය (බුහුමන් නො ලබන්නේ-නොවැඩෙන්නේ) වෙයි. කවර පසෙකින යත්:

ආකල්පසම්පන්න නො වූයේ (මනා ගතිපැවතුම් නැත්තේ) වත්සපන් නො වෙයි. බහුශ්‍රුත නො වූයේ ශ්‍රුතධර නො වෙයි. කෙලෙස් ලියා නො හරණේ පිළිසලනෙහි ඇලුම් ඇතියේ නො වෙයි. කලණ බස් නැතියේ කල්‍යාණවාක්කරණ ඇතියේ නො වෙයි. මූඪ වූයේ කෙලතොලු වූයේ දුෂ්ප්‍රාඥ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත ආවාසික මහණ භාවනීය නො වෙයි.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත ආවාසික මහණ භාවනීය වෙයි. කවර පසෙකින යත්:

ආකල්පසම්පන්න වූයේ වත්සපන් වෙයි. බහුශ්‍රුත වූයේ ශ්‍රුතධර වෙයි. කෙලෙස් ලියා හරණේ පිළිසලනෙහි ඇලුම් ඇතියේ වෙයි. කලණ බස් ඇතියේ කල්‍යාණවාක්කරණ ඇතියේ වෙයි. ජඩ නො වූයේ කෙලතොලු නො වූයේ ප්‍රාඥ වෙයි.

මහණෙනි, මේ කරුණු පසින් සමන්‍වාගත ආවාසික මහණ භාවනීය වෙයි.

## 5. 5. 4. 2.

### [ප්‍රිය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**32.** මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත ආවාසික මහණ සබ්‍රම්සරුනට ප්‍රිය හා මනාප හා ගරු හා භාවනීය හා වෙයි. කවර පසෙකින යත්:

සිල්වත් වූයේ ප්‍රාතිමොක්‍ෂසංවරයෙන් සංවෘත ව වසනේ ආචාරගොචරසම්පන්න වූයේ අණුමාත්‍ර වරදෙහි භය දක්නා සුලු වූයේ සමාදන් කොට ගෙණ ශික්‍ෂාපදයෙහි හික්මෙයි. ශ්‍රුතධර වූයේ රැස් කොට ගත් ශ්‍රුත ඇතියේ බහුශ්‍රුත වෙයි. ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණවූ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ සාර්ථ වූ සව්‍යඤ්ජන වූ යම් ධර්මකෙනෙක් කෙවලපරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යය පවසත් නම්, එබඳු ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසනලද්දාහු දරණ ලද්දාහු වචනයෙන් ප්‍රගුණ කරණ ලද්දාහු සිතින් අනුප්‍රෙක්ෂිත වූවාහු නුවණින් මොනොවට පිළිවිදියාහු වෙති. පරිබුද්ධ වූ නිදෙස් වූ අරුත් පවසන පිරිපුන් වදනින් සමන්‍වාගත කලණ වදන් හඬ ඇතියේ කලණ වදන් ඇතියේ ද වෙයි. විසුද්ධචිත්තයෙහි ජාත වූ ඉහාත්මයෙහි සුඛවිහරණ ඇති සිව්දැහැන් රිසිසේ ලබන්නේ ද නිදුකින් ලබන්නේ ද විපුලව ලබන්නේ ද වෙයි. ආස්‍රවක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ අර්හත් ඵල සමාධි සඞ්ඛ්‍යාත චිත්තවිමුක්තිය ද අර්හත්ඵලප්‍රඥ සඞ්ඛ්‍යාත ප්‍රඥවිමුක්තිය ද තෙමේ ඉහාත්මයෙහි ම විශිෂ්ටඥනයෙන් සාක්‍ෂාත් කොට එයට පැමිණ වෙසෙයි.

මහණෙනි, මේ පස්දහමින් සමන්‍වාගත ආවාසික මහණ සබ්‍රම්සරුන්ට ප්‍රිය හා මනාප හා ගරු හා භාවනීය හා වේ යයි.

## 5. 5. 4. 3.

### [සොභනසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**33**. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු ආවාසං සොභෙති. කතමෙහි පඤ්චහි:

සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා. කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. පටිබලො හොති උපසඞ්කමන්තෙ ධම්මියා කථාය සන්දස්සෙතුං සමාදපෙතුං සමුත්තෙජෙතුං සම්පහංසෙතුං. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු ආවාසං සොභෙතීති.

## 5. 5. 4. 4.

### [බහූපකාරසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**34** පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු ආවාසස්ස බහූපකාරො හොති. කතමෙහි පඤ්චහි:

සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා. ඛණ්ඩඵුල්ලං පටිසඞ්ඛරොති. මහා ඛො පන භික්ඛුසඞ්ඝා අභික්කන්තා, නානාවෙරජ්ජකා භික්ඛූ, ගිහීනං උපසඞ්කමිත්වා ආරොචෙති: "මහා ඛො ආවුසො, භික්ඛුසඞ්ඝා අභික්කන්තා, නානාවෙරජ්ජකා භික්ඛූ, කරොථ පුඤ්ඤානි, සමයො පුඤ්ඤානි කාතුන්ති". චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු ආවාසස්ස බහූපකාරො හොතී'ති.

## 5. 5. 4. 5

### [අනුකම්පකසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**35**. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු ගිහීනං අනුකම්පති. කතමෙහි පඤ්චහි:

අධිසීලෙ සමාදපෙති, ධම්මදස්සනෙ නිවෙසෙති, ගිලානකෙ උපසඞ්කමිත්වා සතිං උප්පාදෙති: 'අරහග්ගතං ආයස්මන්තො සතිං උපට්ඨාපෙථා'ති. මහා ඛො පන භික්ඛුසඞ්ඝා අභික්කන්තා නානාවෙරජ්ජකා භික්ඛූ, ගිහීනං උපසඞ්කමිත්වා ආරොචෙති: "මහා ඛො ආවුසො, භික්ඛුසඞ්ඝා අභික්කන්තා, නානාවෙරජ්ජකා භික්ඛූ, කරොථ පුඤ්ඤානි, සමයො පුඤ්ඤානි කාතුන්ති." යං ඛො පනස්ස භොජනං දෙන්ති ලූඛං වා පණීතං වා තං අත්තනා පරිභුඤ්ජති, සද්ධාදෙය්‍යං න විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යිහීනං අනුකම්පතීති.

## 5. 5. 4. 3.

### [සොභන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**33** මහණෙනි, පස්දහමෙකින් සමන්වාගත ආවාසික මහණ ආවාසය හොබවන්නේ වෙයි. කවර පසෙකින යත්:

සිල්වත් වූයේ ... සමාදන් ව ගෙණ ශික්ෂාපදයෙහි හික්මෙයි. ... බහුශ්‍රැත වූයේ .. නුවණින් මොනොවට පිළිවිදියාහු වෙති. අපරිබුද්ධ වූ (නොපැටලෙන) නිදෙස් වූ අරුත් පවසන පිරිපුන් වදනින් සමන්වාගත සොඳුරු වදන් හඬ ඇතියේ සොඳුරු වදන් ඇතියේ ද වෙයි. වෙත එළඹෙන්නවුන් දැහැමි කථායෙන් කරුණු දක්වාලන්නට සමාදන් කරවන්නට තෙද ගන්වන්නට (උද්යොගී කරවන්නට) පහදවන්නට ප්‍රතිබල වෙයි. විශුද්ධචිත්තයෙහි ජාත වූ ඉහාත්මයෙහි සුඛවිහරණ ඇති සිවුදැහැන් රිසිසේ ලබන්නේ ද නිදුකින් ලබන්නේ ද විපුල ව ලබන්නේ ද වෙයි.

මහණෙනි, මේ පස්දහමින් සමන්වාගත ආවාසික මහණ ආවාසය හොබවන්නේ වෙයි.

## 5. 5. 4. 4.

### [බහූපකාර සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**34** මහණෙනි, පස්දහමෙකින් සමන්වාගත ආවාසික මහණ ආවාසයට බොහෝ උපකාර ඇත්තේ වෙයි. කවර පසෙකින යත්:

සිල්වත් වූයේ ... සමාදන්ව ගෙණ ශික්ෂාපදයෙහි හික්මෙයි. බහුශ්‍රැත වූයේ ... නුවණින් මොනොවට පිළිවිදියාහු වෙති. කැඩුම් බිඳුම් පිළිසකර කෙරෙයි. "මහබික්සඟහු පැමිණියහ. (ඔහු) නා නා රාජ්‍යයනට අයත් භික්‍ෂූහු වෙති. (එ ආවාසික මහණ) ගිහියන් වෙත එළඹ ආරොචනා කෙරෙයි: 'ඇවැත්නි, මහබික්සඟහු එළඹිය හ. (ඔහු) නානා රාජ්‍යයනට අයත් භික්‍ෂූහු වෙති. දැන් පින් කරණට කලැ'"යි (කියායි.) දිටුදැමියෙහි සුඛවිහරණ වූ අධිචිත්තයෙහි උපදනා වූ සිවුදැහැන් කැමැති සේ ලබන සුලු වූයේ නිදුකින් ලබන සුලු වූයේ විපුල සේ ලබන සුලු වූයේ වෙයි.

මහණෙනි, මෙකරුණු පසින් සමන්වාගත ආවාසික මහණ ආවාසයට බොහෝ උපකාර ඇතියේ වේ යයි.

## 5. 5. 4. 5.

### [අනුකම්පක සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**35**. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත ආවාසික මහණ ගිහියනට අනුකම්පා කෙරෙයි. කවර පසෙකින යත්:

අධිසීලයෙහි සමාදන් කරවයි. චතුස්සත්‍යධර්මදර්ශනයෙහි යොදවයි. ගිලනුන් වෙත එළඹ "ඇවැත්නි, හැම සත්කාරයට නිසි තුණුරුවන් විසාහි ගිය සමෘතිය එළවා ගණුම"යි සිහි උපදවයි. මහබික්සඟහු එළඹියාහු වෙති. (ඔහු) නොයෙක් රාජ්‍යයනට අයත් භික්‍ෂූහු වෙති. එ ආවාසික මහණ ගිහියන් වෙත ගොස් (මෙසේ) දන්වාලයි: "ඇවැත්නි, මහබික්සඟහු එළඹියහ. (ඔහු) නා නා රාජ්‍යයනට අයත් භික්‍ෂූහු වෙති. දැන් පින් කරණට කලැ"යි. (කියායි.) ඔහට රූක්‍ෂ වේවයි ප්‍රණීත වේවයි යම් ම භෝජනයක් දෙත් නම්, එය තෙමේ වළඳයි, ශ්‍රද්ධාදෙයය විනිපාත නො කෙරෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්වාගත ආවාසික මහණ ගිහිනට අනුකම්පා කෙරේ යයි.

## 5. 5. 4. 6.

### [පඨමඅවණ්ණාරහසුත්තං]

[සාවත්ථිනිදානං]

**36.** පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති, අනනුවිච්ච අපරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති, අනනුවිච්ච අපරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසෙති, සද්ධාදෙය්‍යං විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති, අනුවිච්ච පරියොගා-හෙත්වා අප්පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසෙති, අනුවිච්ච පරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති, සද්ධාදෙය්‍යං න විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 5. 5. 4. 7.

### [දුතියඅවණ්ණාරහසුත්තං]

[සාවත්ථිනිදානං]

**37.** පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති, අනනු-විච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති. ආවාසමච්ඡරී හොති ආවාසපලිගෙධී, කුලමච්ඡරී හොති කුලපලිගෙධී, සද්ධාදෙය්‍යං විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

## 5. 5. 4. 6.

## [ප්‍රථම අවණ්ණාරහ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

36. මහණෙනි, දහම් පසෙකින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දක් සෙයින් නිරැති වෙයි කවර පසෙකින යත්:

නො විමසා නො පිවිස (නොදැන) නුගුණ කියයුත්තාට ගුණ කියයි. නො විමසා නො පිවිස ගුණ කිය යුත්තාහට නුගුණ කියයි. නො පිරික්සා නො පිවිස නො පැහැදියයුතු තැන්හි ප්‍රසාදය උපදවයි. නො පිරික්සා නො පිවිස පැහැදියයුතු තැන්හි අප්‍රසාදය උපදවයි. සද්ධාදෙය්‍යය විනිපාතන කෙරෙයි.

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තැබුයේ යම්සේ වේ ද, එසේ නිරයෙහි සිටුනේයි.

මහණෙනි, දහම් පසෙකින් සමන්‍විාගත ආවාසික මහණ (කිසින්) ගෙණවුත් තබන ලද්දකු සෙයින් සවර්ගයෙහි සිටුනේ වෙයි. කවර පසෙකින යත්:

විමසා පිවිස නුගුණ කියයුත්තාහට නුගුණ කියයි. විමසා පිවිස ගුණ කියයුත්තාහට ගුණ කියයි. විමසා පිවිස නො පැහැදියයුතු තැන්හි අප්‍ර-සාදය උපදවයි. විමසා පිවිස පැහැදියයුතු තැන්හි ප්‍රසාදය උපදවයි. සද්ධාදෙය්‍යය විනිපාතන නො කෙරෙයි.

මහණෙනි, මෙ පස් දහමින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තැබුයේ යම්සේ වේ ද, එසේ සවර්ගයෙහි සිටුනේ වෙයි.

## 5. 5. 4. 7.

## [ද්විතීය අවණ්ණාරහ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

37. මහණෙනි, දහම් පසෙකින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දක් සෙයින් නිරයෙහි සිටුනේ වෙයි. කවර පසෙකින යත්.

නො විමසා නො පිවිස නුගුණ කියයුත්තාහට ගුණ කියයි. නො විමසා නො පිවිස ගුණ කියයුත්තාහට නුගුණ කියයි. ආවාසමච්ඡරිය ඇත්තේ ආවාසගෙධය (ගිජුබව) ඇත්තේ වෙයි. කුලමච්ඡරිය ඇත්තේ කුලගෙධය ඇත්තේ වෙයි. ශ්‍රද්ධාදෙයයය විනිපාතන කරන්නේ වෙයි.

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි සිටුනේ වෙයි.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති, න ආවාසමච්ඡරී හොති න ආවාසපලිගෙධී, න කුලමච්ඡරී හොති න කුලපලිගෙධී, සද්ධාදෙය්‍යං න විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 5. 5. 4. 8.

## [තතිය අවණ්ණාරහසුත්තං]

[සාවත්ථිනිදානං]

**38**. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති, අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති, ආවාසමච්ඡරී හොති, කුලමච්ඡරී හොති, ලාභමච්ඡරී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති, න ආවාසමච්ඡරී හොති, න කුලමච්ඡරී හොති, න ලාභමච්ඡරී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 5. 5. 4. 9.

## [පඨමමච්ඡරිය සුත්තං]

[සාවත්ථිනිදානං]

**39.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

ආවාසමච්ඡරී හොති, කුලමච්ඡරී හොති, ලාභමච්ඡරී හොති, වණ්ණමච්ඡරී හොති, සද්ධාදෙය්‍යං විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

මහණෙනි, දහම් පසෙකින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් සවර්‍ගීයෙහි සිටුනේ වෙයි. කවර පසෙකින යත්:

විමසා පිරිස (දැන) අගුණ කියයුත්තහුගේ අගුණ කිය යි, විමසා පිරිස ගුණ කියයුත්තහුගේ ගුණ කියයි, ආවාසමච්ඡරිය ආවාසගෙධය ඇත්තේ නො වේ, කුලමච්ඡරිය කුලගෙධය ඇත්තේ නො වේ, ශ්‍රද්ධාදෙයය විනිපාතනය නො කෙරේ.

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් සවර්‍ගීයෙහි සිටුනේ වේ යයි.

## 5. 5. 4. 8.

## [තෘතීය අවණ්ණාරහ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**38**. මහණෙනි, දහම් පසෙකින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි සිටුනේ වෙයි. කවර පසෙකින යත්:

නො විමසා නො පිරිස අගුණ කියයුත්තහුගේ ගුණ කියා ද, නො විමසා නො පිරිස ගුණ කියයුත්තහුගේ අගුණ කියා ද, ආවාසමච්ඡරිය ඇත්තේ වේ ද, කුලමච්ඡරිය ඇත්තේ වේ ද, ලාභමච්ඡරිය ඇත්තේ වේ ද,

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි සිටුනේ වෙයි.

මහණෙනි, දහම් පසෙකින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් සවර්‍ගීයෙහි සිටුනේ වෙයි. කවර පසෙකින යත්:

විමසා පිරිස අගුණ කියයුත්තහුගේ අගුණ කියාද, විමසා, පිරිස ගුණ කියයුත්තහුගේ ගුණ කියා ද, ආවාසමච්ඡරිය ඇත්තේ නො වේ ද, කුලමච්ඡරිය ඇත්තේ නො වේ ද, ලාභමච්ඡරිය ඇත්තේ නො වේ ද,

මහණෙනි, මේ දහම් පසින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් සවර්‍ගීයෙහි සිටුනේ වේ යයි.

## 5. 5. 4. 9.

## [ප්‍රථම මච්ඡරිය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**39**. මහණෙනි; මෙ දහම් පසෙකින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි සිටුනේ වෙයි. කවර පසෙකින යත්:

ආවාසමච්ඡරිය ඇත්තේ වෙයි, කුලමච්ඡරිය ඇත්තේ වෙයි, ලාභමච්ඡරිය ඇත්තේ වෙයි, වණ්ණමච්ඡරිය ඇත්තේ වෙයි. ශ්‍රද්ධාදෙයය නසන්නේ වේ.

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍විාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි සිටුනේ වේ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

න ආවාසමච්ඡරී හොති, න කුලමච්ඡරී හොති, න ලාභමච්ඡරී හොති, න වණ්ණමච්ඡරී හොති, සද්ධාදෙය්‍යං න විනිපාතෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 5. 5. 4. 10.

## [දුතිය මච්ඡරියසුත්තං]

[සාවත්ථිනිදානං]

**40**. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

ආවාසමච්ඡරී හොති, කුලමච්ඡරී හොති, ලාභමච්ඡරී හොති, වණ්ණමච්ඡරී හොති, ධම්මමච්ඡරී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

න ආවාසමච්ඡරී හොති, න කුලමච්ඡමරී හොති, න ලාභමච්ඡරී හොති; න වණ්ණමච්ඡරී හොති, න ධම්මමච්ඡරී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

**ආවාසිකවග්ගො චතුත්ථො**

**තස්සුද්දානං:**

අභාවනීයො පියසොභනා ච[1] බහූපකාරො අනුකම්පකො ච
යථාභතං චාදි තයො අවණ්ණාරහා දුවෙ මච්ඡරියා ච වුත්තා[2]

1. ආවාසිකො අප්පිය සොභනා ච - සීමු.
2. යථාභතං චාපි අවණ්ණගෙධා, චතුක්කම්මච්ඡෙර පඤ්චමෙන චාපි-සීමු
ආවාසිකො පියො ච සොභමානො - මජසං

මහණෙනි, දහම් පසෙකින් සමන්‍වාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් ස්‍වර්‍ගයෙහි සිටුනේ වෙයි. කවර පසෙකින යත්:

ආවාසමච්ඡරිය නැත්තේ වෙයි, කුලමච්ඡරිය නැත්තේ වෙයි, ලාභ-මච්ඡරිය නැත්තේ වෙයි, වණ්ණමච්ඡරිය නැත්තේ වෙයි, ශ්‍රද්ධාදෙයය නො නසන්නේ වෙයි.

මහණෙනි, මෙ දහම්පසින් සමන්‍වාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් ස්‍වර්‍ගයෙහි සිටුනේ වේ ය යි.

### 5. 5. 4. 10

### [ද්විතීය මච්ඡරිය සූත්‍රය]

[සැවැත්නිදානයි]

**40**. මහණෙනි, මෙ දහම් පසෙකින් සමන්‍වාගත ආවාසික මහණ ගෙණ වුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි සිටුනේ වෙයි. කවර පසෙකින යත්:

ආවාසමච්ඡරිය ඇත්තේ වෙයි, කුලමච්ඡරිය ඇත්තේ වෙයි, ලාභ-මච්ඡරිය ඇත්තේ වෙයි, වණ්ණමච්ඡරිය ඇත්තේ වෙයි, ධම්මමච්ඡරිය ඇත්තේ වෙයි.

මහණෙනි, මෙ පස්දහමින් සමන්‍වාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි සිටුනේ වේ.

මහණෙනි, මෙ දහම් පසෙකින් සමන්‍වාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් ස්‍වර්‍ගයෙහි සිටුනේ වෙයි. කවර පසෙකින යත්:

ආවාසමච්ඡරිය නැත්තේ වෙයි. කුලමච්ඡරිය නැත්තේ වෙයි, ලාභමච්ඡරිය නැත්තේ වෙයි, වණ්ණමච්ඡරිය නැත්තේ වෙයි, ධම්මමච්ඡරිය නැත්තේ වේ.

මහණෙනි, මෙ දහම් පසින් සමන්‍වාගත ආවාසික මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් ස්‍වර්‍ගයෙහි සිටුනේ වේ යයි.

**ආවාසික වර්‍ගය සතර වැනි යි.**

**එහි උද්දානය:**

අභාවනීය සූත්‍ර ය, පිය සූත්‍ර ය, සොභන සූත්‍ර ය, බහූපකාර සූත්‍ර ය, අනුකම්පක සූත්‍ර ය, යථාභතං ආදි කොට ඇති අවණ්ණාරහ සූත්‍ර තුන ය, මච්ඡරිය සූත්‍ර දෙක යයි සූත්‍ර දසයෙකි.

# 5. දුච්චරිතවග්ගො.

## 5. 5. 5. 1.

### [දුච්චරිතසුත්තං]

[සාවත්ථිනිදානං]

**41**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දුච්චරිතෙ කතමෙ පඤ්ච.

අත්තාපි අත්තානං උපවදති, අනුවිච්ච විඤ්ඤූ ගරහන්ති, පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා දුච්චරිතෙ.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා සුචරිතෙ. කතමෙ පඤ්ච:

අත්තාපි අත්තානං න උපවදති, අනුවිච්ච විඤ්ඤූ පසංසන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, අසම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා සුචරිතෙ'ති.

## 5. 5. 5. 2.

### [කායදුච්චරිතසුත්තං]

[සාවත්ථිනිදානං]

**42**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා කායදුච්චරිතෙ -පෙ- [අත්තාපි අත්තානං උපවදති -පෙ-]

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා කායසුචරිතෙ -පෙ- [අත්තාපි අත්තානං න උපවදති -පෙ-]

## 5. 5. 5. 3.

### [වචීදුච්චරිතසුත්තං]

[සාවත්ථිනිදානං]

**43**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා වචීදුච්චරිතෙ -පෙ- [අත්තාපි අත්තානං උපවදති -පෙ-]

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා වචීසුචරිතෙ -පෙ- [අත්තාපි අත්තානං න උපවදති -පෙ-]

## 5. 5. 5. 4.

### [මනොදුච්චරිතසුත්තං]

[සාවත්ථිනිදානං]

**44**. පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා මනොදුච්චරිතෙ -පෙ- අත්තාපි අත්තානං උපවදති -පෙ-]

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා මනොසුචරිතෙ. කතමෙ පඤ්ච:

අත්තාපි අත්තානං න උපවදති, අනුවිච්ච විඤ්ඤූ පසංසන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, අසම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා මනොසුචරිතෙ'ති.

## 5. දුච්චරිතවග්ගය.

### 5. 5. 5. 1.

### [දුච්චරිත සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**41**. මහණෙනි, දුශ්චරිතයෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

තෙමේත් තමාට උපවාද කෙරෙයි, විඥයෝ දැන ගරහති, ලාමක කීර්තිශබ්දය උස්ව නැගෙයි, මුළා වූයේ කළුරිය කෙරෙයි, කාබුන් මරණින් මතු අපාය වූ දුගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි.

මහණෙනි; දුශ්චරිතයෙහි මේ ආදීනව පසයි.

මහණෙනි, සුචරිතයෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

තෙමේත් තමහට උපවාද නො කෙරෙයි. විඥයෝ දැන පසසති. කල්‍යාණ කීර්තිශබ්දය උස්ව නැගෙයි. නුමුළා වූයේ කළුරිය කෙරෙයි. කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලෝකයට පැමිණෙයි.

මහණෙනි, සුචරිතයෙහි මේ අනුසස් පසයි.

### 5. 5. 5. 2.

### [කාය දුච්චරිත සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**42**. මහණෙනි, කායදුශ්චරිතයෙහි මේ ආදීනව පසෙකි ... [තෙමේත් තමහට උපවාද කෙරෙයි ... ]

මහණෙනි, කායසුචරිතයෙහි මෙ අනුසස් පසෙකි ... [තෙමේත් තමහට උපවාද නො කෙරෙයි ... ]

### 5. 5. 5. 3.

### [වචීදුච්චරිත සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**43**. මහණෙනි, වාග්දුශ්චරිතයෙහි මේ ආදීනව පසෙකි ... [තෙමේත් තමහට උපවාද කෙරෙයි ... ]

මහණෙනි, වාක්සුචරිතයෙහි මෙ අනුසස් පසෙකි ... [තෙමේත් තමහට උපවාද නො කෙරෙයි ... ]

### 5. 4. 5. 3.

### [මනොදුච්චරිත සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**44**. මහණෙනි, මනොදුශ්චරිතයෙහි මේ ආදීනව පසෙකි ... [තෙමේත් තමහට උපවාද කෙරෙයි ... ]

මහණෙනි, මනසුචරිතයෙහි මෙ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

තෙමේත් තමහට උපවාද නො කෙරෙයි, නුවණැත්තෝ දැන පසසති. කල්‍යාණ කීර්තිශබ්දය උස්ව නැගෙයි. නො මුළාව කළුරිය කෙරෙයි. කාබුන්. මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලෝකයට පැමිණෙයි.

මහණෙනි, මනසුචරිතයෙහි මේ අනුසස් පසයි.

5. 5. 5. 5.

**[අපරදුච්චරිතසුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**45.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දුච්චරිතෙ. කතමෙ පඤ්ච:

අත්තාපි අත්තානං උපවදති, අනුවිච්ච විඤ්ඤූ ගරහන්ති, පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, සද්ධම්මා වුට්ඨාති, අසද්ධම්මෙ පතිට්ඨාති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා දුච්චරිතෙ.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා සුචරිතෙ. කතමෙ පඤ්ච:

අත්තාපි අත්තානං න උපවදති, අනුවිච්ච විඤ්ඤූ පසංසන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, අසද්ධම්මා වුට්ඨාති, සද්ධම්මෙ පතිට්ඨාති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා සුචරිතෙ'ති.

5. 5. 5. 6.

**[අපරකායදුච්චරිතසුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**46.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා කායදුච්චරිතෙ -පෙ- [අත්තාපි අත්තානං උපවදති -පෙ-]

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා කායසුචරිතෙ, -පෙ- [අත්තාපි අත්තානං න උපවදති -පෙ-]

5. 5. 5. 7.

**[අපරවචීදුච්චරිත සුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**47.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා වචීදුච්චරිතෙ -පෙ- [අත්තාපි අත්තානං උපවදති -පෙ-]

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා වචීසුචරිතෙ -පෙ- [අත්තාපි අත්තානං න උපවදති -පෙ-]

5. 5. 5. 8.

**[අපරමනොදුච්චරිතසුත්තං]**

**[සාවත්ථිනිදානං]**

**48.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා මනොදුච්චරිතෙ -පෙ- [අත්තාපි අත්තානං උපවදති -පෙ-]

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා මනොසුචරිතෙ. කතමෙ පඤ්ච:

අත්තාපි අත්තානං න උපවදති, අනුවිච්ච විඤ්ඤූ පසංසන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, අසද්ධම්මා වුට්ඨාති, සද්ධම්මෙ පතිට්ඨාති.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා මනොසුචරිතෙ'ති.

5. 5. 5. 5.

[ අපර දුච්චරිත සූත්‍රය ]

**[සැවැත්නිදන යි]**

**45.** මහණෙනි, දුශ්චරිතයෙහි ආදීනව පසෙකි. කවර පසෙක යත්:

තෙමේත් තමහට උපවාද කෙරෙයි. නුවණැත්තෝ දැන ගරහති. ලාමක කීර්තිශබ්දය උස්ව නැඟෙයි. (දශකුශලකම්පථ සඞ්ඛ්‍යාත) සද්ධර්මයෙන් විගතව සිටියි. (දශඅකුශලකම්පථ සඞ්ඛ්‍යාත) අසද්ධර්මයෙහි පිහිටයි.

මහණෙනි, දුශ්චරිතයෙහි මේ ආදීනව පසයි.

මහණෙනි, සුචරිතයෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

තෙමේත් තමහට උපවාද නො කෙරෙයි. විඥයෝ දැන පසසති. කල්‍යාණ කීර්තිශබ්දය නැඟේ. අසද්ධර්මයෙන් විගතව සිටියි. සද්ධර්මයෙහි පිහිටයි.

මහණෙනි, සුචරිතයෙහි මේ අනුසස් පස යි.

5. 5. 5. 6.

[ අපරකායදුච්චරිත සූත්‍රය ]

**[සැවැත්නිදන යි]**

**46.** මහණෙනි, කායදුශ්චරිතයෙහි මේ ආදීනව පසෙකි ... [තෙමේත් තමහට උපවාද කෙරෙයි ... ]

මහණෙනි, කායසුචරිතයෙහි මෙ ආනිසංස පසෙකි ... [තෙමේත් තමහට උපවාද නො කෙරෙයි ...]

5. 5. 5. 7.

[ අපරවචීදුච්චරිත සූත්‍රය ]

**[සැවැත්නිදන යි]**

**47.** මහණෙනි, වාග්දුශ්චරිතයෙහි මේ ආදීනව පසෙකි ... [තෙමේත් තමහට උපවාද කෙරෙයි ...]

මහණෙනි, වාක්සුචරිතයෙහි මෙ ආනිසංස පසෙකි ... [තෙමේත් තමහට උපවාද නො කෙරෙයි ... ]

5. 5. 5. 8.

[ අපරමනොදුච්චරිත සූත්‍රය ]

**සැවැත්නිදනයි]**

**48.** මහණෙනි, මනොදුශ්චරිතයෙහි මේ ආදීනව පසෙකි ... [තෙමේත් තමහට උපවාද කෙරෙයි ... ]

මහණෙනි, මනඃසුචරිතයෙහි මෙ ආනිසංස පසෙකි. කවර පසෙක යත්:

තෙමේත් තමහට උපවාද නො කෙරෙයි, විඥයෝ දැන පසසත්' කලණ කිත් ගොස නැගේ, අසද්ධර්මයෙන් නැඟෙයි, සද්ධර්මයෙහි පිහිටයි.

මහණෙනි, මනසුචරිතයෙහි මේ අනුසස් පසයි.

5. 5. 5. 9.

[සීවථිකාසුත්තං]

[සාවත්ථිනිදානං]

**49.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා සීවථිකාය. කතමෙ පඤ්ච:

අසුචි, දුග්ගන්ධා, සප්පටිභයා, වාළානං අමනුස්සානං ආවාසො, බහුනො ජනස්ස ආරොදනා.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා සීවථිකාය.

එවමෙව ඛො භික්ඛවෙ පඤ්චිමෙ ආදීනවා සීවථිකූපමෙ පුග්ගලෙ. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අසුචිනා කායකම්මෙන සමන්නාගතො හොති, අසුචිනා වචීකම්මෙන සමන්නාගතො හොති, අසුචිනා මනොකම්මෙන සමන්නාගතො හොති, ඉදමස්ස අසුචිතාය වදාමි. සෙය්‍යථාපි සා භික්ඛවෙ සීවථිකා අසුචි, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

තස්ස අසුචිනා කායකම්මෙන සමන්නාගතස්ස අසුචිනා වචීකම්මෙන සමන්නාගතස්ස අසුචිනා මනොකම්මෙන සමන්නාගතස්ස පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, ඉදමස්ස දුග්ගන්ධතාය වදාමි. සෙය්‍යථාපි සා භික්ඛවෙ සීවථිකා දුග්ගන්ධා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

තමෙනං අසුචිනා කායකම්මෙන සමන්නාගතං අසුචිනා වචීකම්මෙන සමන්නාගතං අසුචිනා මනොකම්මෙන සමන්නාගතං පෙසලා සබ්‍රහ්මචාරී ආරකා පරිවජ්ජෙන්ති,[1] ඉදමස්ස සප්පටිභයස්මිං වදාමි. සෙය්‍යථාපි සා භික්ඛවෙ සීවථිකා සප්පටිභයා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

සො අසුචිනා කායකම්මෙන සමන්නාගතො අසුචිනා වචීකම්මෙන සමන්නාගතො අසුචිනා මනොකම්මෙන සමන්නාගතො සභාගෙහි පුග්ගලෙහි සද්ධිං සංවසති. ඉදමස්ස වාළාවාසස්මිං වදාමි. සෙය්‍යථාපි සා භික්ඛවෙ සීවථිකා වාළානං අමනුස්සානං ආවාසො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

තමෙනං අසුචිනා කායකම්මෙන සමන්නාගතං අසුචිනා වචීකම්මෙන සමන්නාගතං අසුචිනා මනොකම්මෙන සමන්නාගතං පෙසලා සබ්‍රහ්මචාරී දිස්වා ඛීයනධම්මං[2] ආපජ්ජන්ති: 'අහො වත නො දුක්ඛං, යෙ මයං එවරූපෙහි පුග්ගලෙහි සද්ධිං සංවසාමා'ති, ඉදමස්ස ආරොදනාය වදාමි. සෙය්‍යථාපි සා භික්ඛවෙ සීවථිකා බහුනො ජනස්ස ආරොදනා, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා සීවථිකූපමෙ පුග්ගලෙ'ති.

---

1. පරිවජ්ජන්ති-ම.ඡ.සං 2. ඛීයධම්මං-මජසං

## 5. 5. 5. 9.

## [සිවථිකා සූත්‍රය]

### [සැවැත්නිදාන යි]

49. මහණෙනි, සිවථිකායෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

අපවිත්‍ර ය, දුගඳ ය, බිය සහිත ය, ව්‍යාඩ අමනුෂ්‍යයනට ආවාසය, බොහෝ දෙනාගේ ආරොදනා (වැලපීම්) ඇත.

මහණෙනි, සිවථිකායෙහි මේ ආදීනව පස යි.

මහණෙනි, එ පරිද්දෙන් ම සිවථිකූපම පුද්ගලයා කෙරෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් අපවිත්‍ර කායකර්මයෙන් සමන්‍ව‍ාගත වෙයි, අපවිත්‍ර වාක්කර්මයෙන් සමන්‍වාගත වෙයි, අපවිත්‍ර මනඃකර්මයෙන් සමන්‍වාගත වෙයි. මෙය ඔහුගේ අපවිත්‍රතා යී කියමි. මහණෙනි, යම්සේ ඒ සිවථිකාව අපවිත්‍ර වූ ද, මහණෙනි, මම මේ පුහුල් එබඳු කොට කියමි.

අපවිත්‍ර කායකර්මයෙන් සමන්‍වාගත වූ අපවිත්‍ර වාක්කර්මයෙන් සමන්‍වාගත වූ අපවිත්‍ර මනඃකර්මයෙන් සමන්‍වාගත වූ ඔහුගේ ලාමක කීර්තිශබ්දය නැගෙයි. මෙය ඔහුගේ දුගඳ බවයි කියමි. මහණෙනි, යම්සේ ඒ සිවථිකාව දුගඳ වූ ද, මහණෙනි, මෙ පුහුල් එබඳු කොට මම කියමි.

මහණෙනි, අපවිත්‍ර කායකර්මයෙන් සමන්‍වාගත වූ අපවිත්‍ර වාක්කර්මයෙන් සමන්‍වාගත වූ අපවිත්‍ර මනඃකර්මයෙන් සමන්‍වාගත වූ තෙල පුහුල් ප්‍රියශීල සබ්‍රහ්මචාරීහු දුරින් බැහැර ලති. මේ ඔහුගේ සප්‍රතිභය යි කියමි. මහණෙනි, සප්‍රතිභය වූ ඒ සිවථිකාව යම්බඳු වේ නම්, මහණෙනි, මෙ පුහුල් මම එබඳු කොට කියමි.

අපවිත්‍ර කායකර්මයෙන් සමන්‍වාගත වූ අපවිත්‍ර වාක්කර්මයෙන් සමන්‍වාගත වූ අපවිත්‍ර මනඃකර්මයෙන් සමන්‍වාගත වූ හෙතෙම සභාග (තමහට සමාන) පුද්ගලයන් හා සමග වෙසෙයි. මෙ ඔහුගේ ව්‍යාඩ වාසයයි කියමි. මහණෙනි, ඒ සිවථිකාව යම්සේ ව්‍යාඩ අමනුෂ්‍යයනට ආවාස වේ නම්, මහණෙනි, මම මෙ පුහුල් එබඳු කොට කියමි.

මහණෙනි, ප්‍රියශීල සබ්‍රහ්මචාරීහු අපවිත්‍ර වූ කායකර්මයෙන් සමන්‍වාගත වූ අපවිත්‍ර වූ වාක්කර්මයෙන් සමන්‍වාගත වූ අපවිත්‍ර වූ මනඃකර්මයෙන් සමන්‍වාගත වූ තෙල පුහුල්හු දැක "අපි මෙබඳු පුද්ගලයන් හා සමග වසමෝ නම්, අහෝ! එකාන්තයෙන් දුකෙකැ"යි වැලපිය යුතු බවට පැමිණෙත්. මෙ ඔහුගේ ආරොදනායයි කියමි. මහණෙනි, ඒ සිවථිකාව යම්සේ බොහෝදෙනාට ආරොදනයට (හඬා වැලපීමට) ස්ථාන වේ නම්, මහණෙනි, මම මෙ පුහුල් එබඳු කොට කියමි.

මහණෙනි, සිවථිකූපම පුද්ගලයා කෙරෙහි මේ ආදීනව පසයි.

## 5. 5. 5. 10.

### [පුග්ගලප්පසාදසුත්තං]

[සාවත්ථිනිදානං]

**50.** පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා පුග්ගලප්පසාදෙ. කතමෙ පඤ්ච:

යස්මිං භික්ඛවෙ පුග්ගලෙ පුග්ගලො අභිප්පසන්නො හොති, සො තථාරූපං ආපත්තිං ආපන්නො හොති, යථාරූපාය ආපත්තියා සඞ්ඝො උක්ඛිපති. තස්ස එවං හොති: "යො ඛො ම්‍යායං පුග්ගලො පියො මනාපො, සො සඞ්ඝෙන උක්ඛිත්තො"ති භික්ඛුසු අප්පසාදබහුලො හොති. භික්ඛුසු අප්පසාදබහුලො සමානො අඤ්ඤෙ භික්ඛූ න භජති, අඤ්ඤෙ භික්ඛූ න භජන්තො සද්ධම්මං න සුණාති, සද්ධම්මං අසුණන්තො සද්ධම්මා පරිහායති. අයං භික්ඛවෙ පඨමො ආදීනවො පුග්ගලප්පසාදෙ.

පුන ච පරං භික්ඛවෙ යස්මිං පුග්ගලෙ පුග්ගලො අභිප්පසන්නො හොති, සො තථාරූපං ආපත්තිං ආපන්නො හොති, යථාරූපාය ආපත්තියා සඞ්ඝො අන්තෙ නිසීදාපෙති. තස්ස එවං හොති: 'යො ඛො ම්‍යායං පුග්ගලො පියො මනාපො, සො සඞ්ඝෙන අන්තෙ නිසීදාපිතො'ති භික්ඛුසු අප්පසාද බහුලො හොති. භික්ඛුසු අප්පසාදබහුලො සමානො අඤ්ඤෙ භික්ඛූ න භජති, අඤ්ඤෙ භික්ඛූ න භජන්තො[1] සද්ධම්මං න සුණාති, සද්ධම්මං අසුණන්තො සද්ධම්මා පරිහායති. අයං භික්ඛවෙ දුතියො ආදීනවො පුග්ගලප්පසාදෙ.

පුන ච පරං භික්ඛවෙ යස්මිං පුග්ගලෙ පුග්ගලො අභිප්පසන්නො හොති: සො දිසා පක්කන්තො හොති, තස්ස එවං හොති: යො ඛො ම්‍යායං පුග්ගලො පියො මනාපො, සො දිසා පක්කන්තො'ති -පෙ- අඤ්ඤෙ භික්ඛූ න භජති -පෙ- අයං භික්ඛවෙ තතියො ආදීනවො පුග්ගලප්පසාදෙ.

පුන ච පරං භික්ඛවෙ -පෙ- සො විබ්භන්තො හොති. තස්ස එවං හොති -පෙ- සො විබ්භන්තො'ති -පෙ- අඤ්ඤෙ භික්ඛූ න භජති -පෙ- අයං භික්ඛවෙ චතුත්ථො ආදීනවො පුග්ගලප්පසාදෙ.

පුන ච පරං භික්ඛවෙ, -පෙ- සො කාලංකතො හොති. තස්ස එවං හොති: 'යො ඛො ම්‍යායං පුග්ගලො පියො මනාපො, සො කාලකතො'ති, -පෙ- අඤ්ඤෙ භික්ඛූ න භජති. අඤ්ඤෙ භික්ඛූ න භජන්තො සද්ධම්මං න සුණාති, සද්ධම්මං අසුණන්තො සද්ධම්මා පරිහායති. අයං භික්ඛවෙ පඤ්චමො ආදීනවො පුග්ගලප්පසාදෙ.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා පුග්ගලප්පසාදෙ'ති.

**දුච්චරිතවග්ගො පඤ්චමො**

**තස්සුද්දානං:**

දුච්චරිතං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං
චතුහි පරෙ ද්වෙ සිවථිකා පුග්ගලප්පසාදෙන චාති

**පඤ්චමං පණ්ණාසකං.**

1 අභජන්තො - මජසං.

## 5. 5. 5. 10

## [පුග්ගලප්පසාද සූත්‍රය]

**[සැවැත්නිදන යි]**

**50**. මහණෙනි, පුද්ගලයකු කෙරෙහි උපන් ප්‍රසාදයෙහි මේ ආදීනව පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි පුද්ගලයෙක් අතිශයින් පහන් වූයේ නම්, හේ (ප්‍රසාදවිෂය වූ පුද්ගල තෙමේ) සඞ්ඝයා යම් බඳු ආපත්තියෙකින් උක්ෂෙපනීය කර්ම කෙරේ නම් එබඳු ආපත්තියකට පැමිණියේ වෙයි. ඔහට (පහන්වූ පුහුල්හට) මෙබඳු සිතෙක් වෙයි: "මට මේ පුද්ගල ප්‍රිය මනාප වෙයි, හේ සඟහු විසින් උත්ක්ෂිප්තය"යි. භික්ෂූන් කෙරෙහි අප්‍රසාදය බහුල කොට ඇතියේ වෙයි. භික්ෂූන් කෙරෙහි අප්‍රසාද බහුල කොට ඇතියේ ම සෙසු මහණුන් භජනය නොකරයි. අන්‍ය භික්ෂූන් ඇසුරු නො කරනුයේ සද්ධර්මය නො අසයි. සද්ධර්මය නො අසනුයේ සද්ධර්මයෙන් පිරිහෙයි. මහණෙනි, පුද්ගලප්‍රසාදයෙහි මේ ප්‍රථම ආදීනවයි.

තවද මහණෙනි, යම් පුහුලකු කෙරෙහි පුද්ගලයෙක් අතිශයින් පහන් වේ ද, යම් ඇවතෙකින් සඟහු (යමෙකු) ආසනාන්තයෙහි හිඳුවත් නම්, හේ එබඳු ඇවැතකට පැමිණියේ වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: "මේ පුද්ගල මට ප්‍රිය මනාප වෙයි. හෙතෙම සඟහු විසින් අන්තයෙහි හිඳුවන ලද" යි භික්ෂූන් කෙරෙහි අප්‍රසාද බහුල වෙයි. භික්ෂූන් කෙරෙහි අප්‍රසාද බහුල වූයේ ම අන්‍ය භික්ෂූන් භජනය නො කෙරෙයි. අන්‍ය භික්ෂූන් භජනය නොකරන්නේ සද්ධර්මය නො අසයි. සද්ධර්මය නො අසනුයේ සද්ධර්මයෙන් පිරිහෙයි. මහණෙනි, පුද්ගලප්‍රසාදයෙහි මේ ද්විතීය ආදීනවයි.

තවද මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි පුද්ගලයෙක් අතිප්‍රසන්න වේ නම්, හේ අන්‍ය දිශාවකට ගියේ වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: 'මේ පුද්ගල මට ප්‍රිය මනාප වෙයි. හේ අන්‍ය දිශාවකට ගියේ වෙයි'... අන්‍ය භික්ෂූන් භජනය නො කරයි ... මහණෙනි, පුද්ගල ප්‍රසාදයෙහි මේ තෘතීය ආදීනවයි.

තවද **මහණෙනි** .. හේ ගිහිබවට පැමිණියේ වෙයි ... ඔහට මෙබඳු සිතෙක් වෙයි: 'මේ පුද්ගල මට ප්‍රියමනාප වෙයි. හේ ගිහි බවට පැමිණියේ වෙයි' .. අන්‍ය භික්ෂූන් භජනය නො කෙරෙයි ... මහණෙනි, පුද්ගල ප්‍රසාද-යෙහි මේ චතුර්ථ ආදීනවයි.

තවද මහණෙනි .. හේ කළුරිය කෙළේ වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: "මෙ පුද්ගල මට ප්‍රිය මනාප වෙයි. හේ කළුරිය කෙළේය" යි ... අන්‍ය භික්ෂූන් නො ඇසුරු කෙරෙයි. අන්‍ය භික්ෂූන් භජනය නො කරන්නේ සදහම් නො අසයි. සදහම් නො අසන්නේ සද්ධර්මයෙන් පිරිහෙයි. මහණෙනි, පුද්ගලප්‍රසාදයෙහි මේ පඤ්චම ආදීනවයි.

මහණෙනි, පුද්ගලප්‍රසාදයෙහි මේ ආදීනව පසයි.

**දුච්චරිතවග්ගය පස්වැනියි.**

**එහි උද්දානය :**

දුච්චරිත සූත්‍රය, කායදුච්චරිත සූත්‍රය, වචීදුච්චරිත සූත්‍රය, මනොදුච්චරිත සූත්‍රය, අනෙකුදු දුච්චරිතසූත්‍ර සතරෙක, සිවථිකාසූත්‍රය, පුග්ගලප්පසාද සූත්‍රය දැයි දසයෙකි.

**පස්වන පණ්ණාසකය නිමි.**

# ඡට්ඨපණ්ණාසකං.

## 1. උපසම්පදාවග්ගො

### 5. 6. 1. 1.

[උපසම්පාදෙතබ්බසුත්තං]

[සාවත්ථිනිදානං]

1. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බන්ති.

### 5. 6. 1. 2.

[නිස්සයසුත්තං]

[සාවත්ථිනිදානං]

2. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා නිස්සයො දාතබ්බො. කතමෙහි පඤ්චහි.

ඉධ භික්ඛවෙ භික්ඛු අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන මුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා නිස්සයො දාතබ්බොති.

### 5. 6. 1. 3.

[සාමණෙරසුත්තං]

[සාවත්ථිනිදානං]

3. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සාමණෙරො උපට්ඨාපෙතබ්බො. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා සාමණෙරො උපට්ඨාපෙතබ්බොති.

# සවන පණ්ණාසකය.

## 1. උපසම්පදාවර්ගය

### 5. 6. 1. 1.

### [උපසම්පාදෙතබ්බ සූත්‍රය]*

**[සැවැත්නිදාන යි]**

**1**. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත මහණ විසින් (උපාධ්‍යාය ව) උපසම්පදා කළ යුතු යි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අශෛක්‍ෂ (අතීත්) ශීලස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ සමාධිස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ ප්‍රඥාස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ විමුක්තිස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ විමුක්තිඥානදර්ශනස්කන්ධයෙන් සමන්වාගත වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්වාගත මහණහු විසින් උපසපත් කටයුතු යි.

### 5. 6. 1. 2.

### [නිස්සය සූත්‍රය]*

**[සැවැත්නිදාන යි]**

**2**. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත මහණහු විසින් (ඇදුරු ව සිට) නිස දිය යුතු යි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අශෛක්‍ෂ ශීලස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ සමාධිස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ ප්‍රඥාස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ වූ විමුක්තිස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ වූ විමුක්තිඥානදර්ශනස්කන්ධයෙන් සමන්වාගත වේ.

මහණෙනි, මේ කරුණු පසින් සමන්වාගත මහණහු විසින් නිස දිය යුතු යි.

### 5. 6. 1. 3.

### [සාමණේර සූත්‍රය]*

**[සැවැත්නිදානයි]**

**3**. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත මහණහු විසින් (වත්තෙර ව සිට) සාමණේරයෙක් එළවා (උපයා) ගතයුත්තේ ය. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අශෛක්‍ෂ ශීලස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ සමාධිස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ ප්‍රඥාස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ විමුක්තිස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්‍ෂ විමුක්තිඥානදර්ශනස්කන්ධයෙන් සමන්වාගත වේ.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්වාගත මහණහු විසින් සාමණේරයෙක් එළවා ගතයුත්තේ ය යි.

---

* මේ සූත්‍ර තුන සික්ෂාපද පැනවීමට පෙර ප්‍රථම බෝධියෙහිදී ක්ෂීණාශ්‍රවයන් සඳහා වදාළහ.

### 5. 6. 1. 4.

### [මච්ඡරියසුත්තං]

[සාවත්ථිනිදානං]

4. පඤ්චිමානි භික්ඛවෙ මච්ඡරියානි. කතමානි පඤ්ච:

ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මච්ඡරියානි.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං මච්ඡරියානං එතං පතිකිට්ඨං[1] යදිදං ධම්මමච්ඡරියන්ති.

### 5. 6. 1. 5.

### [මච්ඡරියපහානසුත්තං]

[සාවත්ථිනිදානං]

5. පඤ්චන්නං භික්ඛවෙ මච්ඡරියානං පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති. කතමෙසං පඤ්චන්නං:

ආවාසමච්ඡරියස්ස පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති. කුලමච්ඡරියස්ස -පෙ- ලාභමච්ඡරියස්ස -පෙ- වණ්ණමච්ඡරියස්ස -පෙ- ධම්මමච්ඡරියස්ස පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං මච්ඡරියානං පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සතීති.

### 5. 6. 1. 6.

### [පඨමජ්ඣානසුත්තං]

[සාවත්ථිනිදානං]

6. පඤ්චිමෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං. කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මෙ අප්පහාය අභබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං.

පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මෙ පහාය භබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං. කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මෙ පහාය භබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුන්ති.

---

1 පටිකුට්ඨං - මජසං, පතිසංකිට්ඨං - සසා

5. 6 1. 4.

[මච්ඡරිය සූත්‍රය]

[සැවැත්නිදාන සි]

4. මහණෙනි, මේ මාත්සර්‍ය්‍ය පසෙකි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍ය්‍ය ය, කුලමාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, ධර්‍මමාත්සර්‍ය්‍ය යි.

මහණෙනි, මේ මාත්සර්‍ය්‍ය පසයි. මහණෙනි, මෙ මාත්සර්‍ය්‍යයන් අතුරෙන් ධර්‍මමාත්සර්‍ය්‍ය ය යන යමෙක් වේ නම්, තෙල අතිශයින් ලමු වේ යයි.

5. 6. 1. 5.

[මච්ඡරියපහාන සූත්‍රය]

[සැවැත්නිදානයි]

5. මහණෙනි, පඤ්චමාත්සර්‍ය්‍යයන්ගේ ප්‍රහාණය සඳහා සමුච්ඡේදය සඳහා බඹසර වෙසෙයි. කවර පඤ්ච මාත්සර්‍ය්‍යකෙනකුගේය යත්:

ආවාසමාත්සර්‍ය්‍යයාගේ ප්‍රහාණය සමුච්ඡේදය පිණිස බඹසර වෙසෙයි. කුලමාත්සර්‍ය්‍යයාගේ ... ලාභමාත්සර්‍ය්‍යයාගේ ... වර්ණමාත්සර්‍ය්‍යයාගේ ... ධර්‍මමාත්සර්‍ය්‍යයාගේ ප්‍රහාණය සමුච්ඡේදය පිණිස බ්‍රහමචර්‍ය්‍යය වෙසෙයි.

මහණෙනි, මේ පඤ්චමාත්සර්‍ය්‍යයන්ගේ ප්‍රහාණය සමුච්ඡේදය සඳහා බඹසර වෙසේ යයි.

5. 6. 1. 6.

[පඨමජ්ඣාන සූත්‍රය]

[සැවැත්නිදානයි]

6. මහණෙනි, මෙ දහම් පස ප්‍රහීණ නො කොට ප්‍රථම ධ්‍යානය උපයා ගෙණ වසන්නට අභව්‍ය වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍ය්‍ය ය, කුලමාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, ධර්‍මමාත්සර්‍ය්‍ය යි.

මහණෙනි, මේ පඤ්ච මාත්සර්‍ය්‍යයන් ප්‍රහීණ නො කොට ප්‍රථමධ්‍යානය උපයා ගෙණ වසන්නට නො තිසි (නොහැකි) වේ යයි.

මහණෙනි, මෙ දහම් පස ප්‍රහීණ කොට ප්‍රථම ධ්‍යානය උපයා ගෙණ වසන්නට භව්‍ය වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍ය්‍ය ය, කුලමාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, ධර්‍මමාත්සර්‍ය්‍ය යි.

මහණෙනි, මේ දහම් පස ප්‍රහීණ කොට ප්‍රථම ධ්‍යානය උපයා ගෙණ වසන්නට භව්‍ය වේ යයි.

## 5. 6. 1. 7-10

## [දුතියජ්ඣානාදිසුත්තානි]*

**[සාවත්ථිනිදානානි]**

**7-9.** පඤ්චිමෙ[1] භික්ඛවෙ, ධම්මෙ අප්පහාය අභබ්බො දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරිතුං. කතමෙ පඤ්ච.

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං,

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මෙ අප්පහාය අභබ්බො දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරිතුං.

පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මෙ පහාය භබ්බො දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරිතුං. කතමෙ පඤ්ච.

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මෙ පහාය භබ්බො දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරිතුං.

## 5. 6. 1. 10

## [අපරපඨමජ්ඣානසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**10.** පඤ්චිමෙ[1] භික්ඛවෙ, ධම්මෙ අප්පහාය අභබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං. කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, අකතඤ්ඤුතං අකතවෙදිතං.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මෙ අප්පහාය අභබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං.

පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මෙ පහාය භබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං. කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, කතඤ්ඤුතං කතවෙදිතං.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මෙ පහාය භබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුන්ති.

---

1. පඤ්ච - සයා

*. එත්ථ දුතියං ඣානන්ති පදතො පට්ඨාය යාව අනාගාමිඵලන්ති පදන්ති-'මජසං' පොත්ථකෙ දුන්නික්ඛිත්තානි පුබ්බපෙය්‍යාලෙනෙව සඞ්ගහිතත්තා.

## 5. 6. 1. 7-9.

## [දුතියජ්ඣානාදි සූත්‍ර]

[සැවැත්නිදාන යි]

**7-9**. මහණෙනි, මේ කරුණු පස ප්‍රහීණ නො කොට ද්විතීයධ්‍යානය ... තෘතීයධ්‍යානය ... චතුර්ථධ්‍යානය ... උපයා වාසය කරන්නට අභව්‍ය වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍ය්‍ය ය, කුලමාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, ධර්මමාත්සර්‍ය්‍ය යි.

මහණෙනි, මේ කරුණු පස ප්‍රහීණ නො කොට ද්විතීයධ්‍යානය .. තෘතීය ධ්‍යානය ... චතුර්ථධ්‍යානය උපයා වාසය කරන්නට අභව්‍ය වේ.

මහණෙනි, මේ කරුණු පස ප්‍රහීණ කොට ද්විතීයධ්‍යානය ... තෘතීය ධ්‍යානය ... චතුර්ථධ්‍යානය උපයා වාසය කරන්නට භව්‍ය වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍ය්‍ය ය, කුලමාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, ධර්මමාත්සර්‍ය්‍ය යයි.

මහණෙනි, මේ කරුණු පස ප්‍රහීණ කොට ද්විතීයධ්‍යානය ... තෘතීය ධ්‍යානය .. චතුර්ථධ්‍යානය උපයා වාසය කරන්නට භව්‍ය වේ යයි.

## 5. 6. 1. 10.

## [අපර පඨමජ්ඣාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**10**. මහණෙනි, මේ කරුණු පස ප්‍රහීණ නො කොට ප්‍රථමධ්‍යානය උපයා වසන්නට අභව්‍ය වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍ය්‍ය ය, කුලමාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, අකෘතඥතා අකෘතවේදිතා යි.

මහණෙනි, මේ කරුණු පස ප්‍රහීණ නො කොට ප්‍රථමධ්‍යානය උපයා වසන්නට අභව්‍ය වෙයි.

මහණෙනි, මේ කරුණු පස ප්‍රහීණ කොට ප්‍රථමධ්‍යානය උපයා වසන්නට නිසි වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍ය්‍ය ය, කුලමාත්සර්‍ය්‍ය ය, ලාභමාත්සර්‍ය්‍ය ය, වර්ණමාත්සර්‍ය්‍ය ය, අකෘතඥතා අකෘතවේදිතා යි.

මහණෙනි, මේ කරුණු පස ප්‍රහීණ කොට ප්‍රථමධ්‍යානය උපයා වසන්නට නිසි වේ යයි.

## 5. 6. 1. 11-13

### [අපරදුතියජ්ඣානාදිසුත්තානි]

[සාවත්ථිනිදානං]

**11-13** පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මෙ අප්පහාය අභබ්බො දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං [උපසම්පජ්ජ විහරිතුං.] කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, අකතඤ්ඤුතං අකතවෙදිතං.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මෙ අප්පහාය අභබ්බො [දුතියං ඣානං] -පෙ- [තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං] උපසම්පජ්ජ විහරිතුං.

පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මෙ පහාය භබ්බො [දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං] උපසම්පජ්ජ විහරිතුං. කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, අකතඤ්ඤුතං අකතවෙදිතං.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මෙ පහාය භබ්බො [දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං] උපසම්පජ්ජ විහරිතුන්ති.

## 5. 6. 1. 14-17

### [සොතාපත්තිඵලාදිසච්ඡිකිරියා සුත්තානි]*

[සාවත්ථිනිදානං]

**14-17**. පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මෙ අප්පහාය අභබ්බො සොතාපත්ති-ඵලං සච්ඡිකාතුං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්ත-ඵලං සච්ඡිකාතුං. කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මෙ අප්පහාය අභබ්බො සොතාපත්තිඵලං සච්ඡිකාතුං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තඵලං සච්ඡිකාතුං.

පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මෙ පහාය භබ්බො සොතාපත්තිඵලං සච්ඡිකාතුං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තඵලං සච්ඡිකාතුං. කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මෙ පහාය භබ්බො සොතාපත්තිඵලං සච්ඡිකාතුං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තඵලං සච්ඡිකාතුන්ති.

---

* පොත්ථකෙසු පන ඉමානි සොතාපත්තිඵලාදීනි සුත්තානි ඣාන සුත්තෙහි සද්ධිං පෙය්‍යාලමුඛෙන සපිතානි දුතනික්ඛිත්තානි දිස්සන්ති.

## 5. 6. 1. 11-13.

### [අපර දුතියජ්ඣානාදි සුත්‍ර]

**[සැවැත්නිදාන යි]**

**11-13**. මහණෙනි, මේ ධර්ම පස ප්‍රහීණ නො කොට ද්විතීය ධ්‍යානය ... තෘතීයධ්‍යානය ... චතුර්ථධ්‍යානය උපයා වාසය කරන්නට නිසි නො වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍යය ය, කුලමාත්සර්‍යය ය, ලාභමාත්සර්‍යය ය, වර්ණමාත්සර්‍යය ය, අකෘතඥතා අකෘතවේදිතා යි.

මහණෙනි, මේ ධර්මපස ප්‍රහීණ නො කොට ද්විතීයධ්‍යානය ... තෘතීය-ධ්‍යානය ... චතුර්ථධ්‍යානග උපයා වාසය කරන්නට නො නිසි වෙයි.

මහණෙනි, මේ ධර්ම පස ප්‍රහීණ කොට [ද්විතීයධ්‍යානය ... තෘතීය-ධ්‍යානය ... චතුර්ථධ්‍යානය උපයා වාසය කරන්නට නිසි වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍යය ය, කුලමාත්සර්‍යය ය, ලාභමාත්සර්‍යය ය, වර්ණමාත්සර්‍යය ය, අකෘතඥතා අකෘතවේදිතා යි.

මහණෙනි, මේ ධර්ම පස ප්‍රහීණ කොට [ද්විතීයධ්‍යානය ... තෘතීය ධ්‍යානය ... චතුර්ථධ්‍යානය] උපයා වාසය කරන්නට නිසි වෙයි.

## 5. 6. 1. 14-17

### [සොතාපත්ති ඵලාදිසච්ඡිකිරියා සුත්‍ර]

**[සැවැත්නිදාන යි]**

**14-17**. මහණෙනි, මේ ධර්මපස ප්‍රහීණ නො කොට සෝවත් ඵලය සාක්ෂාත් කරන්නට .. සෙදගැමිඵලය ... අනගැමිඵලය ... අර්හත්ඵලය සාක්ෂාත් කරන්නට නො නිසි වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍යය, කුලමාත්සර්‍යය, ලාභමාත්සර්‍යය, වර්ණමාත්සර්‍යය, ධර්මමාත්සර්‍යය යි.

මහණෙනි, මේ ධර්මපස ප්‍රහීණ නො කොට සෝවත්ඵලය සාක්ෂාත් කරන්නට . . සෙදගැමිඵලය ... අනගැමිඵලය ... රහත්ඵලය සාක්ෂාත් කරන්නට නො නිසි වෙයි.

මහණෙනි, මේ ධර්මපස ප්‍රහීණ කොට සෝවත් ඵලය සාක්ෂාත්කරන්-නට ... සෙදගැමි ඵලය ... අනගැමිඵලය .. රහත්ඵලය සාක්ෂාත් කරන්නට නිසි වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍යය, කුලමාත්සර්‍යය, ලාභමාත්සර්‍යය, වර්ණමාත්සර්‍යය, ධර්මමාත්සර්‍යය යි.

මහණෙනි, මේ ධර්මපස ප්‍රහීණකොට ශ්‍රොතාපත්තිඵලය ... සකෘදගාමි-ඵලය ... අනාගාමිඵලය ... අර්හත්ත්වඵලය සාක්ෂාත් කරන්නට භව්‍ය වෙයි.

## 5. 6. 1. 18-21

### [අපරසොතාපත්තිඵලාදි සච්ඡිකිරියා සුත්තානි]

[සාවත්ථිනිදානං]

**18-21.** පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මෙ අප්පහාය අභබ්බො සොතාපත්ති-ඵලං සච්ඡිකාතුං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තඵලං සච්ඡිකාතුං. කතමෙ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, අකතඤ්ඤුතං අකතවෙදිතං.

ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මෙ අප්පහාය අභබ්බො සොතාපත්තිඵලං සච්ඡිකාතුං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තඵලං සච්ඡිකාතුං

පඤ්චිමෙ භික්ඛවෙ, ධම්මෙ පහාය භබ්බො සොතාපත්තිඵලං සච්ඡිකාතුං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තඵලං සච්ඡිකාතුං. කතමේ පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, අකතඤ්ඤුතං අකතවෙදිතං.

ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මෙ පහාය භබ්බො සොතාපත්තිඵලං සච්ඡිකාතුං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තඵලං සච්ඡිකාතුන්ති.

උපසම්පදාවග්ගො පඨමො

## 5. 6. 1. 18-21

### [අපරසොතාපත්තිඵලාදි සච්ඡිකිරියා සූත්‍ර]

[සැවැත්නිදාන යි]

**18-21**. මහණෙනි, මේ ධර්මපස ප්‍රහීණ නො කොට සෝවන් ඵලය සාක්ෂාත් කරන්නට ... සෙදගැමි ඵලය ... අනගැමිඵලය ... රහත්ඵලය සාක්ෂාත් කරන්නට නිසි නො වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍ය්‍යය, කුලමාත්සර්‍ය්‍යය, ලාභමාත්සර්‍ය්‍යය, වර්ණමාත්සර්‍ය්‍යය, අකෘතඥතා අකෘතවෙදිතා යි.

මහණෙනි, මේ ධර්මපස ප්‍රහීණ නො කොට සෝවන් ඵලය ... සෙදගැමි ඵලය ... අනගැමිඵලය .. රහත්ඵලය සාක්ෂාත් කරන්නට නො නිසි වෙයි

මහණෙනි, මේ ධර්මපස ප්‍රහීණ කොට සෝවන්ඵලය සාක්ෂාත් කරන්නට .... සෙදගැමිඵලය ... අනගැමිඵලය ... රහත්ඵලය සාක්ෂාත් කරන්නට නිසි වෙයි. කවර පසෙක යත්:

ආවාසමාත්සර්‍ය්‍යය, කුලමාත්සර්‍ය්‍යය, ලාභමාත්සර්‍ය්‍යය, වර්ණමාත්සර්‍ය්‍යය, අකෘතඥතා අකෘතවෙදිතා යි.

මහණෙනි, මේ ධර්මපස ප්‍රහීණ කොට සෝවන්ඵලය සාක්ෂාත් කරන්නට ... සෙදගැමිඵලය ... අනගැමිඵලය ... රහත්ඵලය සාක්ෂාත් කරන්නට නිසි වෙයි.

**උපසම්පදාවර්ගය පළමුවැනි යි**

# වග්ගාතිරෙක සුත්තානි

## [භත්තුද්දෙසකසුත්තං]

### [සාවත්ථිනිදානං]

**1.** පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො න සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි:

ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, උද්දිට්ඨානුද්දිට්ඨං න ජානාති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො න සම්මන්නිතබ්බො.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි:

න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, උද්දිට්ඨානුද්දිට්ඨං ජානාති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො සම්මන්නිතබ්බො'ති.

## [දුතියභත්තුද්දෙසකාදිසුත්තානි]

### [සාවත්ථිනිදානං]

**2-5** පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො න සම්මන්නිතබ්බො, සම්මතොපි[1] න පෙසෙතබ්බො. [කතමෙහි පඤ්චහි ඡන්දාගතිං ගච්ඡති] -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] භත්තුද්දෙසකො සම්මන්නිතබ්බො, සම්මතොපි පෙසෙතබ්බො. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති] -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො] බාලො වෙදිතබ්බො. [කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති] -පෙ-

[පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො [භත්තුද්දෙසකො] පණ්ඩිතො වෙදිතබ්බො. [කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති] -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො] ඛතං උපහතං අත්තානං පරිහරති -පෙ- [ඡන්දාගතිං ගච්ඡති -පෙ-]

[පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො] අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති -පෙ- [න ඡන්දාගතිං ගච්ඡති -පෙ-]

---

1 භත්තුද්දෙසකො සම්මතො - මජසං

## වග්ගාතිරේක සූත්‍ර

### [භත්තුද්දෙසක සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**1**. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත භත්තුද්දේශක මහණ සම්මත නො කටයුත්තේ ය. කවර පසෙකින යත්:

ඡන්දයෙන් අගතියට යෙයි. ද්වේෂයෙන් අගතියට යෙයි. මොහයෙන් අගතියට යෙයි. භයෙන් අගතියට යෙයි. උදෙසන ලද නො උදෙසන ලද බව නො දනී.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්වාගත භත්තුද්දේශක මහණ සම්මත නො කටයුත්තේ ය.

මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත භත්තුද්දේශක මහණ සම්මත කටයුත්තේ ය. කවර පසෙකින යත්:

ඡන්දයෙන් අගතියට නො යෙයි ද්වේෂයෙන් අගතියට නො යෙයි. මොහයෙන් අගතියට නො යෙයි. භයෙන් අගතියට නො යෙයි. උදෙසන ලද නො උදෙසන ලද බව දනියි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්වාගත භත්තුද්දේශක මහණ සම්මත කටයුත්තේ යයි.

### [දුතියභත්තුද්දෙසකාදි සූත්‍ර]

**[සැවැත්නිදාන යි]**

**2-5**. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත බත් උදෙසන මහණ සම්මත නො කටයුතු. සම්මත වූයේ නමුදු [බත් උදෙසනු සඳහා] නො යැවිය යුතු ... [කවර පසෙකින යත්: ඡන්දාගතියට යෙයි .. ]

මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත බත් උදෙසන මහණ සම්මත කටයුතු, සම්මත වූයේ [බත් උදෙසනු සඳහා] යැවිය යුතු ... [කවර පසෙකින යත්: ඡන්දයෙන් අගතියට නො යෙයි .. ]

[මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත බත් උදෙසන මහණ] බාලයෙකැ යි දතයුතු. කවර පසෙකින යත්: ඡන්දයෙන් අගතියට යෙයි ...

[මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත බත් උදෙසන මහණ] පණ්ඩිතයෙකැ යි දතයුතු. [කවර පසෙකින යත්: ඡන්දයෙන් අගතියට නො යෙයි .. ]

[මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත භත්තුද්දෙසක] සාරා දමන ලද ගුණ ඇති නසන ලද ගුණ ඇති ආත්මය පරිහරණ කෙරෙයි. [කවර පසෙකින යත්: ... ඡන්දයෙන් අගතියට යෙයි ... ]

[මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත භත්තුද්දෙසක නො සාරා දැමූ ගුණ ඇති නො නසන ලද ගුණ ඇති ආත්මය පරිහරණ කෙරෙයි. [කවර පසෙකින යත්: ඡන්දයෙන් අගතියට නො යෙයි .. ]

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො] යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ -පෙ- [ඡන්දාගතිං ගච්ඡති -පෙ-]

[පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො] යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

න ඡන්දාගතිං ගච්ඡති, න දෙසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, උද්දිට්ඨානුද්දිට්ඨං ජානාති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ'ති.

### [සෙනාසන පඤ්ඤාපකාදි සුත්තානි]

### [සාවත්ථිනිදානං]

6. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සෙනාසනපඤ්ඤාපකො න සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි:

ඡන්දාගතිං ගච්ඡති, දෙසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, පඤ්ඤත්තාපඤ්ඤත්තං න ජානාති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සෙනාසන-පඤ්ඤාපකො න සම්මන්නිතබ්බො.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො සෙනාසනපඤ්ඤාපකො සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි:

න ඡන්දාගතිං ගච්ඡති, න දෙසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, පඤ්ඤත්තාපඤ්ඤත්තං ජානාති

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සෙනාසන-පඤ්ඤාපකො සම්මන්නිතබ්බො'ති.

7. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සෙනාසනගාහාපකො න සම්මන්නිතබ්බො -පෙ- [ඡන්දාගතිං ගච්ඡති -පෙ-] ගහිතාගහිතං[1] න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] සෙනාසනගාහාපකො සම්මන්නිතබ්බො -පෙ- [න ඡන්දාගතිං ගච්ඡති -පෙ-] ගහිතාගහිතං ජානාති -පෙ-

8. [පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො] භණ්ඩාගාරිකො න සම්මන්නිතබ්බො -පෙ- [ඡන්දාගතිං ගච්ඡති -පෙ-] ගුත්තාගුත්තං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] භණ්ඩාගාරිකො සම්මන්නි-තබ්බො -පෙ- [න ඡන්දාගතිං ගච්ඡති -පෙ- ] ගුත්තාගුත්තං ජානාති -පෙ-

9. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] චීවරපටිග්ගාහකො න සම්මන්නිතබ්බො -පෙ- [ඡන්දාගතිං ගච්ඡති -පෙ-] ගහිතාගහිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] චීවරපටිග්ගාහකො සම්මන්නිතබ්බො -පෙ- ගහිතාගහිතං ජානාති -පෙ-

1 පඤ්ඤත්තාපඤ්ඤත්තං - සීමු, සතා

[මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත හත්‍තුද්දෙසක] ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි උපදනේ ය ... [ඡන්‍දයෙන් අගතියට යයි...]

[මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත හත්‍තුද්දෙසක] ගෙණවුත් තබන ලද්දකු සෙයින් සවර්ගයෙහි උපදනේ ය. කවර පසෙකින යත්:]

ඡන්‍දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, හයෙන් අගතියට නො යෙයි, උද්දෙසන ලද නො උද්දෙසන ලද බව දනී.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත බත් උද්දෙසන මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් සවර්ගයෙහි උපදනේ යි.

## [සෙනාසනපඤ්ඤාපකාදි සූත්‍ර]

### [සැවැත්නිදාන යි]

6. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත සෙනාසන පඤ්ඤාපක මහණ සම්මත නො කටයුතු. කවර පසෙකින යත්:

ඡන්‍දයෙන් අගතියට යෙයි, ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, හයෙන් අගතියට යෙයි, පනවන ලද නො පනවන ලද සෙනසුන් නො දනියි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත සෙනසුන් පනවන මහණ සම්මත නො කටයුතු.

මහණෙනි, පස් කරුණෙකින් සමන්‍වාගත සෙනසුන් පනවන මහණ සම්මත කළ යුතු. කවර පසෙකින යත්:

ඡන්‍දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, හයෙන් අගතියට නො යෙයි, පනවන ලද නො පනවන ලද සෙනසුන් දනියි.

මහණෙනි, මෙ පස් කරුණෙන් සමන්‍වාගත සෙනසුන් පනවන මහණ සම්මත කටයුත්තේ යි.

7. මහණෙනි, පස් කරුණෙකින් සමන්‍වාගත සෙනසුන් ගන්වන මහණ සම්මත නො කටයුතු. ... ගත් නො ගත් සෙනසුන් නො දනියි. ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාතග] සෙනසුන් ගන්වන මහණ සම්මතකටයුතු ... ගත් නො ගත්සෙනසුන් දනියි ...

8. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] භාණ්ඩාගාරික මහණ සම්මත නො කටයුතු ... [ඡන්‍දයෙන් අගතියට යෙයි ...] ගොපනය කළ නො කළ භාණ්ඩය නො දනියි ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත භාණ්ඩාගාරික මහණ සම්මත කටයුතු ... [ඡන්‍දයෙන් අගතියට නො යෙයි .. ] ගොපනය කළ නො කළ භාණ්ඩය දනී ...

9. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] සිවුරු පිළිගන්නා මහණ සම්මත නො කටයුතු ... [ඡන්‍දයෙන් අගතියට යෙයි ...] ගත් නො ගත් සිවුරු නො දනියි ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] සිවුරු පිළිගන්නා මහණ සම්මත කටයුතු ... ගත් නො ගත් සිවුරු දනියි.

**10**. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] චීවරභාජකො න සම්මන්නිතබ්බො -පෙ- ඡන්දාගතිං ගච්ඡති -පෙ- භාජිතාභාජිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො] චීවරභාජකො සම්මන්නිතබ්බො-පෙ- භාජිතාභාජිතං ජානාති -පෙ-

**11**. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යාගුභාජකො න සම්මන්නිතබ්බො -පෙ-] භාජිතාභාජිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො] යාගුභාජකො සම්මන්නිතබ්බො -පෙ- භාජිතාභාජිතං ජානාති -පෙ-

**12**. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] ඵලභාජකො න සම්මන්නිතබ්බො -පෙ- භාජිතාභාජිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] ඵලභාජකො සම්මන්නිතබ්බො -පෙ- භාජිතාභාජිතං ජානාති -පෙ-

**13.** [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] ඛජ්ජකභාජකො න සම්මන්නිතබ්බො -පෙ- භාජිතාභාජිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] ඛජ්ජකභාජකො සම්මන්නිතබ්බො -පෙ-භාජිතාභාජිතං ජානාති -පෙ-

**14**. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] අප්පමත්තකවිස්සජ්ජකො න සම්මන්නිතබ්බො -පෙ- විස්සජ්ජිතාවිස්සජ්ජිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] අප්පමත්තකවිස්සජ්ජකො සම්මන්නිතබ්බො -පෙ- විස්සජ්ජිතාවිස්සජ්ජිතං ජානාති -පෙ-

**15**. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] සාටියගාහාපකො න සම්මන්නිතබ්බො -පෙ- ගහිතාගහිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] සාටියගාහාපකො සම්මන්නිතබ්බො පෙ- ගහිතාගහිතං ජානාති -පෙ-

**16**. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] පත්තගාහාපකො න සම්මන්නිතබ්බො -පෙ- ගහිතාගහිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙධම්මෙහි සමන්නාගතො] පත්තගාහාපකො සම්මන්නිතබ්බො -පෙ- ගහිතාගහිතං ජානාති -පෙ-

**17**. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] ආරාමිකපෙසකො න සම්මන්නිතබ්බො -පෙ- පෙසිතාපෙසිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙධම්මෙහි සමන්නාගතො] ආරාමිකපෙසකො සම්මන්නිතබ්බො -පෙ- පෙසිතාපෙසිතං ජානාති -පෙ-

**18**. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] සාමණෙරපෙසකො න සම්මන්නිතබ්බො -පෙ- පෙසිතාපෙසිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] සාමණෙරපෙසකො සම්මන්නිතබ්බො -පෙ- පෙසිතාපෙසිතං ජානාති -පෙ-

**10**. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] සිවුරු බෙදන මහණ සම්මත නො කටයුතු ... බෙදූ නො බෙදූ සිවුරු නො දනී ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] සිවුරු බෙදන මහණ සම්මත කටයුතු ... බෙදූ නො බෙදූ සිවුරු දනියි ...

**11** [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] හුළුකැන් බෙදන මහණ සම්මත නො කටයුතු ... බෙදූ නො බෙදූ හුළුකැන් නො දනියි ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] හුළුකැන් බෙදන මහණ සම්මත කටයුතු ... බෙදූ නො බෙදූ හුළුකැන් දනියි ...

**12**. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] ඵල බෙදන මහණ සම්මත නො කටයුතු ... බෙදූ නො බෙදූ ඵල නො දනියි ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] ඵල බෙදන මහණ සම්මත කටයුතු ... බෙදූ නො බෙදූ ඵල දනී ...

**13**. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] ඛාද්‍ය බෙදන මහණ සම්මත නො කටයුතු ... බෙදූ නො බෙදූ ඛාද්‍යය නො දනියි ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] ඛාද්‍ය බෙදන මහණ සම්මත කටයුතු ... බෙදූ නො බෙදූ ඛාද්‍යය දනී ...

**14**. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] මඳ පිරිකර බෙදන මහණ සම්මත නො කටයුතු ... බෙදූ නො බෙදූ පිරිකර නො දනියි ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] මඳ පිරිකර බෙදන මහණ සම්මත කටයුතු ... බෙදූ නො බෙදූ පිරිකර දනියි ...

**15**. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] වැසිසළු ගනවන මහණ සම්මත නො කටයුතු .. ගත් නො ගත් වැසිසළු නො දනියි ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] වැසිසළු ගන්වන මහණ සම්මත කටයුතු ... ගත් නො ගත් වැසිසළු දනියි ...

**16**. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] පාත්‍රය ගන්වන මහණ සම්මත නො කටයුතු ... ගත් නො ගත් පාත්‍රය නො දනියි ..

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] පාත්‍රය ගන්වන මහණ සම්මත කටයුතු ... ගත් නො ගත් පාත්‍රය දනියි ...

**17**. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] ආරාමිකයන් මෙහෙයන මහණ සම්මත නො කටයුතු ... මෙහෙයූ නො මෙහෙයූ ආරාමිකයා නො දනියි ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] ආරාමිකයන් මෙහෙයන මහණ සම්මත කටයුතු ... මෙහෙයූ නො මෙහෙයූ ආරාමිකයා දනී ...

**18**. [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] හෙරණුන් මෙහෙයන මහණ සම්මත නො කටයුතු .. මෙහෙයූ නො මෙහෙයූ හෙරණහු නොදනී...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] හෙරණුන් මෙහෙයන මහණ සම්මත කටයුතු .. මෙහෙයූ නො මෙහෙයූ හෙරණහු දනියි ...

19. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] සාමණේරපෙසකො න සම්මන්නිතබ්බො, සම්මතො'පි න පෙසෙතබ්බො -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො] සාමණේරපෙසකො සම්මන්නිතබ්බො, සම්මතො පෙසෙතබ්බො -පෙ-

20. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො. සාමණේර පෙසකො] බාලො වෙදිතබ්බො. [-පෙ- ඡන්දාගතිං ගච්ඡති -පෙ ]

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සාමණේරපෙසකො] පණ්ඩිතො වෙදිතබ්බො -පෙ- [න ඡන්දාගතිං ගච්ඡති -පෙ- පෙසිතාපෙසිතං ජානාති] -පෙ-

21. [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සාමණේර පෙසකො] ඛතං උපහතං අත්තානං පරිහරති -පෙ- ඡන්දාගති ගච්ඡති -පෙ- පෙසිතා-පෙසිතං න ජානාති [-පෙ-]

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සාමණේර පෙසකො] අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති -පෙ- න ඡන්දාගතිං ගච්ඡති -පෙ- පෙසිතාපෙසිතං ජානාති -පෙ-

22 [පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සාමණේර පෙසකො] යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ -පෙ- පෙසිතාපෙසිතං න ජානාති -පෙ-

[පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සාමණේර පෙසකො] යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

න ඡන්දාගතිං ගච්ඡති, න දෙසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, පෙසිතාපෙසිතං ජානාති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො සාමණේර-පෙසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ'ති.

## [භික්ඛුසුත්තං]

### [සාවත්ථිනිදානං]

1. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, අබ්‍රහ්මචාරී හොති, මුසාවාදී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

---

[ ] අයං පෙය්‍යාලො පොත්ථකෙසු න දිස්සතෙ.

**19.** [මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] සාමණේරපෙසක මහණ සම්මත නො කටයුතු. සම්මත වූයේ ද නො මෙහෙයන්නේය ...

[මහණෙනි, පස්කරුණෙකින් සමන්‍වාගත] සාමණේරපෙසක මහණ සම්මත කටයුතු. සම්මත වූයේ මෙහෙයන්නේය ...

**20.** [මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත සාමණේර පෙසක බාල මහණ] දතයුතු .. [ඡන්‍දාගතියට යේ ... මෙහෙයූ නො මෙහෙයූ හෙරණුන් නො දනී ...]

[මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත සාමණේර පෙසක පණ්ඩිත මහණ] දතයුතු ... [ඡන්‍දාගතියට නො යේ ... මෙහෙයූ නො මෙහෙයූ හෙරණුන් දනී ... ]

**21.** [මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත සාමණේර පෙසක මහණ] සාරා දූමු ගුණ ඇති නැසූ ගුණ ඇති ආත්මය පරිහරණ කෙරෙයි ... [ඡන්‍දාගතියට යේ ... මෙහෙයූ නො මෙහෙයූ හෙරණුන් නො දනී ...]

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත සාමණේර පෙසක මහණ නො සාරාලූ ගුණ ඇති නො නැසූ ගුණ ඇති ආත්මය පරිහරණ කෙරෙයි ... [ඡන්‍දාගතියට නො යේ ... මෙහෙයූ නො මෙහෙයූ හෙරණුන් දනී ... ]

**22.** [මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත සාමණේර පෙසක මහණ] ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි උපදනේ ය ... මෙහෙයූ නො මෙහෙයූ හෙරණහු නො දනියි ...

[මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත සාමණේර පෙසක මහණ] ගෙණවුත් තබන ලද්දකු සෙයින් සවර්ගයෙහි උපදනේ ය. කවර පසෙකින යත්:

ඡන්‍දයෙන් අගතියට නො යෙයි, ද්වේෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, භයෙන් අගතියට නො යෙයි, මෙහෙයූ නො මෙහෙයූ හෙරණහු දනී.

මහණෙනි, මෙ පස් කරුණෙන් සමන්‍වාගත හෙරණුන් මෙහෙයන මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් සවර්ගයෙහි උපදනේ යයි.

### [භික්ඛුසූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**1.** මහණෙනි, පස් කරුණෙකින් සමන්‍වාගත මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි උපදනේ ය. කවර පසෙකින යත්:

ප්‍රාණවධ කරනුයේ වෙයි. අයිනාදන් ගන්නේ වෙයි. අබ්‍රම්සැරි වෙයි මුසවා කියනුයේ වෙයි. මදප්‍රමාදයට කරුණු වූ රහමෙර පානය කරනුයේ වේ.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත මහණ ගෙණ වුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි උපදනේ වෙයි.

පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, අබ්‍රහ්මචරියා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ'ති.

## [භික්ඛුනී සුත්තාදීනි]

### [සාවත්ථිනිදානානි]

**2-7.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා භික්ඛුනී පෙ- සික්ඛමානා -පෙ- සාමණෙරො -පෙ- සාමණෙරී -පෙ- උපාසකො -පෙ- උපාසිකා යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතිනී හොති, අදින්නාදායිනී හොති, කාමෙසු මිච්ඡාචාරිණී හොති, මුසාවාදිනී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානට්ඨායිනී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතා උපාසිකා යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා උපාසිකා යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතා පටිවිරතා හොති, අදින්නාදානා පටිවිරතා හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා හොති, මුසාවාදා පටිවිරතා හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතා උපාසිකා යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙ'ති.

## [ආජීවකසුත්තං]

### [සාවත්ථිනිදානානි]

8. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො ආජීවකො[1] යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි.

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, අබ්‍රහ්මචාරී හොති, මුසාවාදී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො ආජීවකො.[1] යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ'ති.

---

1. ආජීවිකො - සීමු.

මහණෙනි, පස් කරුණෙකින් සමන්‍විාගත මහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් දෙව්ලොව උපදනේ ය. කවර පසෙකින යත්:

ප්‍රාණවධයෙන් වැළකුනේ වෙයි, අයිනාදන් ගැනීමෙන් වැළකුනේ වෙයි, අබ්‍රම්සරින් වැළකුනේ වෙයි, මුසාවාදයෙන් වැළකුනේ වෙයි, මදප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් වැළකුනේ වේ.

මහණෙනි, මෙ පස් දහමින් සමන්‍විාගත මහණ ගෙණ වුත් තබන ලද්දකු සෙයින් දෙව්ලොව උපදනේ වේ ය යි.

## [භික්‍ඛුනි සූත්‍රාදිය]

**[සැවැත්නිදන යි]**

**2-7**. මහණෙනි, පස් කරුණෙකින් සමන්‍විාගත මෙහෙණ .. සික්මන් ... හෙරණ ... හෙරණී ... උවසු ... උවැසි ගෙණවුත් තබන ලද්දක සෙයින් නිරයෙහි උපදින්නී වෙයි. කවර පසෙකින යත්:

ප්‍රාණවධ කරන්නී වෙයි, අයිනාදන් ගන්නී වෙයි, කාමයෙහි මිසහසර ඇත්තී වෙයි, මුසවා කියන්නී වෙයි, මදයට හා පමාවට කරුණු වූ රහමෙර පානය කරන්නී වේ.

මහණෙනි, මෙ පස් කරුණින් සමන්‍විාගත උවැසි ගෙණවුත් තබන ලද්දක සෙයින් නිරයෙහි උපදින්නී වේ.

මහණෙනි, පස් කරුණෙකින් සමන්‍විාගත උවැසි ගෙණවුත් තබන ලද්දක සෙයින් ස්‍වර්‍ගයෙහි උපදින්නී වෙයි. කවර පසෙකින යත්:

ප්‍රාණවධයෙන් වැළකුනී වෙයි, අයිනාදනින් වැළකුනී වෙයි, කාමයෙහි මිසහසරින් වැළකුනී වෙයි, මුසවායෙන් වැළකුනී වෙයි, මදප්‍රමාදකාරණ වූ රහමෙරින් වැළකුනී වේ.

මහණෙනි, මෙ පස් දහමින් සමන්‍විාගත උවැසි ගෙණ වුත් තබන ලද්දක සෙයින් ස්‍වර්‍ගයෙහි උපදින්නී වේ යයි.

## [ආජීවක සූත්‍රය]

**[සැවැත්නිදන යි]**

**8**. මහණෙනි, පස් කරුණෙකින් සමන්‍විාගත ආජීවක (අජේලුමහණ) ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි උපදනේ ය. කවර පසෙකින යත්:

ප්‍රාණවධ කරනුයේ වෙයි, අයිනාදන් ගන්නේ වෙයි, අබ්‍රම්සැරි වෙයි, මුසවා බණනුයේ වෙයි, මදප්‍රමාදයට කරුණු වූ රහමෙර පානය කරනුයේ වේ.

මහණෙනි, මෙ පස් කරුණෙන් සමන්‍විාගත අජේලුමහණ ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි උපදනේ යයි.

## [නිගණ්ඨසුත්තාදීනි]

### [සාවජ්ජනිද්දානානි]

**9-17**. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො නිගණ්ඨො -පෙ- මුණ්ඩසාවකො.[1] -පෙ- ජටිලකො -පෙ- පරිබ්බාජකො -පෙ- මාගන්දිකො[2] -පෙ- තෙදණ්ඩිකො -පෙ- ආරුද්ධකො -පෙ- ගොතමකො -පෙ- දෙවධම්මිකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, අබ්‍රහ්මචාරී හොති, මුසාවාදී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානට්ඨායී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො දෙවධම්මිකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ'ති.

1. බුද්ධසාවකො - මජසං, සීමු.
2 මාගණ්ඩිකො - මජසං, සයා.

[නිගණ්ඨ සූත්‍රාදිය]

[සැවැත්නිදාන යි]

**9-17**. මහණෙනි, පස් කරුණෙකින් සමන්‍වාගත නුවට .. නුවටසවු ... දුළුලු ... පිරිවැජි .. මාගන්‍දික තීර්ථක ... තෙදණ්ඩික තීර්ථක ... ආරුද්‍ධක තීර්ථක .. ගොතමක තීර්ථක ... දෙවධම්මික තීර්ථක ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි උපදනේ ය. කවර පසෙකින යත්:

ප්‍රාණවධ කරනුයේ වෙයි, අයිනාදන් ගන්නේ වෙයි, අබ්‍රම්සැරි වෙයි, මුසවා බණනුයේ වෙයි, මදප්‍රමාදකාරණ වූ රහමෙර පානය කරනුයේ වේ.

මහණෙනි, මෙ පස් කරුණෙන් සමන්‍වාගත දෙවධම්මික ගෙණවුත් තබන ලද්දකු සෙයින් නිරයෙහි උපදනේ ය යි.

(ආජීවකාදීන්ගේ සිල්පිරීමක් නැති බැවින් සවග්ගපක්‍ෂය නො වදූරන ලද.)

# රාගාදිපෙය්‍යාලං

## [රාගාදිපෙය්‍යාලසුත්තානි]

[සාවත්ථිනිදානානි]

1. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය පඤ්ච ධම්මා භාවෙතබ්බා. කතමෙ පඤ්ච:

අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආදීනවසඤ්ඤා, ආහාරෙ පටිකූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා'ති.

2. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය පඤ්ච ධම්මා භාවෙතබ්බා. කතමෙ පඤ්ච:

අනිච්චසඤ්ඤා, අනත්තසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙ පටිකූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා'ති.

3 රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය පඤ්ච ධම්මා භාවෙතබ්බා. කතමෙ පඤ්ච:

අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා'ති.

4 රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය පඤ්ච ධම්මා භාවෙතබ්බා. කතමෙ පඤ්ච:

සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා'ති.

5. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය පඤ්ච ධම්මා භාවෙතබ්බා. කතමෙ පඤ්ච:

සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා'ති.

# රාගාදිපෙය්‍යාලය

## [රාගාදිපෙය්‍යාලය සූත්‍ර]

### [සැවැත්නිදාන යි]

**1.** මහණෙනි, රාගය (ස්වලක්‍ෂණ විසින්) දැනීම පිණිස පස් දහම් කෙනෙක් වැඩිය යුත්තාහ කවර පස් දහම් කෙනෙක යත්:

අශුභසංඥා යැ, මරණසංඥා යැ, ආදීනවසංඥා යැ, ආහාරයෙහි ප්‍රතිකූල සංඥා යැ, සියලු ත්‍රෛධාතුකලොකයෙහි අනභිරත (නො ඇලීම්) සංඥා යි.

මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස මේ පස් දහම්හු වැඩිය යුත්තාහ යි.

**2.** මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස පස් දහම් කෙනෙක් වැඩිය යුත්තාහ. කවර පස් දහම් කෙණෙකා යත්:

අනිත්‍යසංඥා යැ, අනාත්මසංඥා යැ. මරණසංඥා යැ, ආහාරයෙහි ප්‍රතිකූල සංඥා යැ, සියලු ත්‍රෛධාතුකලොකයෙහි අනභිරත සංඥා යි.

මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස මෙ පස් දහම්හු වැඩිය යුත්තාහ යි.

**3** මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස පස් දහම් කෙනෙක් වැඩිය යුත්තාහ. කවර පස් දහම් කෙනෙක යත්:

අනිත්‍යසංඥා යැ, අනිත්‍යයෙහි දුඃඛසංඥා යැ, දුඃඛයෙහි අනාත්මසංඥා යැ, ප්‍රහාණසංඥා යැ, විරාගසංඥා යි

මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස මෙ පස් දහම්හු වැඩිය යුත්තාහ යි

**4.** මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස පස් දහම් කෙනෙක් වැඩිය යුත්තාහ. කවර පස් දහම් කෙනෙක යත්:

ශ්‍රද්ධෙන්ද්‍රිය යැ, වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ, සමෘතීන්ද්‍රිය යැ, සමාධීන්ද්‍රිය යැ, ප්‍රඥෙන්ද්‍රිය යි

මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස මෙ පස් දහම්හු වැඩිය යුත්තාහ යි.

**5.** මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස පස් දහම් කෙනෙක් වැඩිය යුත්තාහ. කවර පස් දහම් කෙනෙක යත්:

ශ්‍රද්ධාබල යැ, වීර්‍ය්‍යබල යැ, සමෘතිබල යැ, සමාධිබල යැ, ප්‍රඥාබල යි.

මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස මෙ පස් දහම්හු වැඩිය යුත්තාහ යි.

## [රාගාදිපෙය්‍යාලං]

### [සාවත්ථිනිදානානි]

**6-850.** රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය පඤ්ච ධම්මා භාවෙතබ්බා කතමෙ පඤ්ච:

අසුභසඤ්ඤා -පෙ- ඉමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා'ති.

දොසස්ස -පෙ- මොහස්ස -පෙ- කොධස්ස -පෙ- උපනාහස්ස -පෙ- මක්ඛස්ස පෙ- පළාසස්ස -පෙ- ඉස්සාය -පෙ- මච්ඡරියස්ස -පෙ- මායාය -පෙ- සාඨෙය්‍යස්ස -පෙ- ථම්භස්ස -පෙ- සාරම්භස්ස -පෙ- මානස්ස -පෙ- අතිමානස්ස -පෙ- මදස්ස -පෙ- [අභිඤ්ඤාය -පෙ-]

පමාදස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය පඤ්ච ධම්මා භාවෙතබ්බා කතමෙ පඤ්ච:

සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං.

පමාදස්ස භික්ඛවෙ පටිනිස්සග්ගාය ඉමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා'ති.

**රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං.**

**තස්සුද්දානං:**

අභිඤ්ඤාය පරිඤ්ඤාය පරික්ඛයාය
පහානාය ඛයාය වයෙන ච
විරාගනිරොධා චාගඤ්ච
පටිනිස්සග්ගො ඉමෙ දසා'ති.*

**තත්‍රිදං වග්ගුද්දානං:**

සෙඛබලං බලඤ්චෙව පඤ්චඞ්ගිකඤ්ච සුමනං,
මුණ්ඩනීවරණසඤ්ඤා ච යොධාජීවඤ්ච අට්ඨමං

ථෙරං කකුධඵාසුඤ්ච අන්ධකවින්දෙන ද්වාදස
ගිලානරාජතිකණ්ඩං සද්ධම්මාඝාතුපාසකං

අරඤ්ඤං බ්‍රාහ්මණඤ්චෙව කිම්බිලක්කොසකං තථා
දීඝචාරාවාසිකඤ්ච දුච්චරිතූපසම්පදන්ති.

## පඤ්චකනිපාතො සමත්තො.

---

*ඉධ රාගාදිපෙය්‍යාලෙ රාගපදතො පට්ඨාය පමාදපදපරියන්තෙසු සත්තරස පෙය්‍යාලෙසු එකමෙකං අභිඤ්ඤාදි දසඅත්ථපදෙහි යොජෙත්වා "පඤ්චධම්මා භාවෙතබ්බා"ති නිද්දිට්ඨා පඤ්චධම්මපඤ්ඤත්තිකෙහ සට්ඨානි සුත්තානි පණ්ණාසාධිකානි අට්ඨසතානි භවන්ති.

### [රාගාදිපෙය්‍යාලය]

**[සැවැත්නිදාන යි]**

**6-850** මහණෙනි, රාගය (සාමාන්‍ය ලක්‍ෂණ විසින්) දන්නා පිණිස ... පරික්‍ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්‍ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරෝධය පිණිස ... ත්‍යාගය පිණිස ... දුරුලීම පිණිස පස් දහම් කෙනෙක් වැඩිය යුත්තාහ. කවර පස් දහම් කෙනෙක යත්:

අශුභසංඥ යැ ... මේ පස් දහම්හු වැඩිය යුත්තාහයි.

ද්වෙෂයාගේ ... මොහයාගේ ... ක්‍රොධයාගේ ... බද්ධවෛරයාගේ ... මක්ඛයාගේ .. යුගග්‍රාහයාගේ .. ඊර්ෂ්‍යාවගේ ... මාත්සර්යයාගේ ... මායාවගේ ... ශාඨ්‍යයාගේ .. ස්තම්භයාගේ ... සාරම්භයාගේ ... මානයාගේ ... අතිමානයාගේ ... මදයාගේ [අභිජානනය පිණිස] ...

මහණෙනි, ප්‍රමාදයාගේ අභිජානනය පිණිස ... පරිජානනය පිණිස ... පරික්‍ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්‍ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරොධය පිණිස ... ත්‍යාගය පිණිස ... දුරුලීම පිණිස පඤ්චධර්ම කෙනෙක් වැඩිය යුත්තාහ. කවර පඤ්චධර්මයෝ ද යත්.

ශ්‍රද්ධාබල යැ, වීර්යබල යැ, ස්මෘතිබල යැ, සමාධිබල යැ, ප්‍රඥබල යි.

මහණෙනි, ප්‍රමාදයාගේ දුරුලීම පිණිස මේ පඤ්චධර්මයෝ වැඩිය යුත්තාහ'යි.

**රාගාදිපෙය්‍යාලය නිමි.**

**එහි උද්දානය:**

අභිඤ්ඤ, පරිඤ්ඤ, පරික්ඛය, පහාන, ඛය, වය, විරාග, නිරොධ, චාග, පටිනිස්සග්ග යන මේ දසය අර්ථපද යි.*

**පඤ්චකනිපාතයෙහි වර්ගයන්ගේ මේ අනුපිළිවෙළ යි:**

සෙඛබල වර්ගය, බල වර්ගය, පඤ්චඞ්ගික වර්ගය, සුමනා වර්ගය, මුණ්ඩරාජ වර්ගය, නීවරණ වර්ගය, සඤ්ඤා වර්ගය, අට වැනි යොධාජීව වර්ගය ද,

ථෙර වර්ගය, කකුධ වර්ගය, ඵාසුවිහාර වර්ගය, අන්ධකවින්ද දෙළොස්වන වර්ගය, ගිලාන වර්ගය, රාජ වර්ගය, තිකණ්ඩ වර්ගය, සද්ධම්ම වර්ගය, ආඝාත වර්ගය, උපාසක වර්ගය ද,

අරඤ්ඤ වර්ගය, බ්‍රාහ්මණ (සොණ) වර්ගය, කිම්බිල වර්ගය, අක්කොසක වර්ගය, දීඝචාරික වර්ගය, ආවාසික වර්ගය, දුච්චරිත වර්ගය, උපසම්පදා වර්ගය යන මොහු යි.

## පඤ්චකනිපාතය සමාප්ත යි.

*මෙහි රාගාදිපෙය්‍යාලයෙහි-රාගපදය පටන් කොට අප්පමාදපදය අවසන් කොට ඇති සතළොස් පෙය්‍යාලයන් 'අභිඤ්ඤා' ආදි දස අර්ථපදයන් හා වෙන වෙන සම්බන්ධ කොට "පඤ්චධර්මකෙනෙක් වැඩිය යුත්තාහ"යි කී තැයින් පඤ්චධර්ම පඤ්චකය හා වෙන වෙන යොදගත් කල ලැබෙන සූත්‍ර සංඛ්‍යාව 850 කි.

# ගාථාදිපාදානුක්කමණිකා


අ පිට්ඨඞ්කානි

අග්ගතො වෙ පසන්නානං 56
අග්ගස්මිං දානං දදතං 56
අග්ගස්ස දාතා මෙධාවී 56
අග්ගෙ ධම්මෙ පසන්නානං 56
අථො'පි දුන්නිවත්ථෙන 108
අනුස්සරෙය්‍ය සම්බුද්ධං 346
අප්පමාදං පසංසන්ති 76
අප්පහාය පඤ්චවෙරානි 334
අහඤ්චතං ජිගුච්ඡෙය්‍යං 118

ආ

ආයුං දත්වා බලං වණ්ණං 64
ආයුං වණ්ණං යසං කිත්තිං 76
ආයුදො බලදො ධීරො 64
ආයුනා යසසා චෙව 52

ඉ

ඉධ ධම්මං චරිත්වාන 68

උ

උට්ඨාහිකා අනලසා 58
උපට්ඨිතෙ දෙය්‍යධම්මෙ 346
උභින්නංයෙව අත්ථාය 124

එ

එතං අනුස්සරං මච්චො 72
එවං දස්සනසම්පන්නො 52
එවං නරං අන්නදපානවත්ථදං 82
එවමෙව මනුස්සෙසු 348

ඔ

ඔවාදකාරී භතපොසී 66

ක

කතාවකාසා කතකුසලා
තතො චුතා 62
කම්මාසාසු සරූපාසු 346

කා

කාලෙ දදන්ති සප්පඤ්ඤා 64

කු

කුලවංසො චිරං ඨස්සති 66

ච පිට්ඨඞ්කානි

චත්තඤ්ච මුත්තඤ්ච අනග්ගහීතං 78

ජ

ජප්පෙන මන්තෙන සුභා-
සිතෙන 88, 96

ඨා

ඨානානෙතානි සම්පස්සං 66

ත

තථෙව සීලසම්පන්නං 68
තථෙව සීලසම්පන්නො 52, 66
තස්මා දදෙ ච අප්පටිවානචිත්තො 64
තස්මා සද්ධං ච සීලං ච 84
තස්මා හි දානානි දදන්ති පණ්ඩිතා 62
තස්ස සීලවතො සීලං 68

තෙ

තෙ තස්ස ධම්මං දෙසෙන්ති 62, 66
තෙසං කාමොඝවූළ්හානං 108

ද

දදං පියො හොති භජන්ති නං
බහුං 62
දදමානො පියො හොති 62

දි

දිට්ඨෙව ධම්මෙ යො අත්ථො 76

දෙ

දෙවලොකං ච තෙ යන්ති 348

ධ

ධම්මට්ඨං සීලසම්පන්නං 72

ධො

ධොරය්හො බලසම්පන්නො 346

න

න චා'පි සො'ත්ථි භත්තාරං 58
න සොචනාය න පරිදෙවනාය 88,96
නත්වෙව එකො එකාය 108
න හිංසෙ පාණභූතානි 346

| නා | පිට්ඨඞ්කානි |
|---|---|
| නාහං හබ්බො එතරහි | 118 |
| **නි** | |
| නිරයෙසු භයං දිස්වා | 346 |
| **ප** | |
| පඤ්චකාමගුණා එතෙ | 108 |
| පඤ්ච ඨානානි සම්පස්සං | 66 |
| පදුමං යථා කොකනදං සුගන්ධං | 386 |
| පහාය පඤ්ච වෙරානි | 334 |
| පහීනජාතිමරණො | 348 |
| **පා** | |
| පාරගූ සබ්බධම්මානං | 348 |
| **බා** | |
| බාලාව අවිජානන්තා | 348 |
| **භ** | |
| භරන්ති මාතාපිතරො | 66 |
| **භු** | |
| භුත්තා භොගා භතා භච්චා | 72 |
| **ම** | |
| මනාපදායී ලභතෙ මනාපං | 78, 80 |
| මනොරමෙ ආයතනෙ | 66 |
| මහොදධිං අපරිමිතං මහාසරං | 82 |
| **මා** | |
| මාතාපිතු කිච්චකරො | 124 |
| **ය** | |
| යතො ච ඛො පණ්ඩිතො ආපදාසු | 88, 96 |
| යථා ච පබ්බතො සෙලො | 68 |
| යථා'පි චන්දො විමලො | 52 |
| යථා'පි මෙඝො ථනයං | 52 |
| යදත්ථං භොගං ඉච්ඡෙය්‍ය | 72 |
| යස්ස සද්ධා තථාගතෙ | 84 |

| යා | පිට්ඨඞ්කානි |
|---|---|
| යා එවං වත්තති නාරී | 58 |
| යාසු කාසු ච එතාසු | 348 |
| **යෙ** | |
| යෙ ච කාමෙ පරිඤ්ඤාය | 108 |
| යෙ ච සන්තෙන උපාසෙනති | 348 |
| යෙ තත්ථ අනුමොදන්ති | 64 |
| **යො** | |
| යො අග්ගදායී වරදායී | 80 |
| යො නං භරති සබ්බදා | 58 |
| යො පාණං නාතිපාතෙති | 334 |
| යො පාණමතිපාතෙති | 334 |
| **ව්‍යා** | |
| ව්‍යාධිධම්මා ජරාධම්මා | 118 |
| **වී** | |
| වීතරාගා වීතදොසා | 66 |
| **ස** | |
| සඞ්ඝෙ පසාදො යස්සත්ථි | 84 |
| සචෙ පජානෙය්‍ය අලබ්භනෙය්‍යො | 88, 96 |
| සද්ධාය සීලෙන ච යාධ වඩ්ඪති | 128 |
| සද්ධාය සීලෙන ච යොධ වඩ්ඪති | 126 |
| සන්තො හවෙ පච්චක්කාමි | 346 |
| සබ්බෙ මදෙ අභිභොස්මි | 118 |
| සමණානං බ්‍රාහ්මණානං | 124 |
| සල්ලපෙ අසි හත්ථෙන | 108 |
| **සා** | |
| සාබාපත්තඵලූපෙතො | 66 |
| **සෙ** | |
| සෙහි දාරෙහි සන්තුට්ඨො | 346 |
| **සො** | |
| සො කරිත්වාන කල්‍යාණං | 124 |
| සො'හං එවං විහරෙය්‍යං | 118 |
| **හි** | |
| හිතො බහුන්නං පටිපජ්ජ භොගෙ | 72 |

# සඤ්ඤානාමානුක්කමණිකා


**අ** — පිට්ඨඞ්කානි

අඞ්ගීරස 366
අට්ඨක 366
අන්ධකවින්ද 222
අනාථපිණ්ඩික 70, 74, 332, 336, 342

**ආ**

ආනන්ද 212, 222, 300, 314, 324, 326, 348

**ඉ**

ඉච්ඡානඞ්ගල 44

**උ**

උග්ගගහපති 76, 78
උග්ගදෙවපුත්ත 80
උග්ගහ 56
උදායී 300, 312
උපවාන 316

**ක**

කකුධ කොලියපුත්ත 196
කලන්දකනිවාප 54
කස්සප 348, 352, 366

**කා**

කාරණපාලී 382

**කි**

කිම්බිල 398
කිම්බිලා 398

**කු**

කුක්කුටාරාම 90

**කූ**

කූටාගාරසාලා 60, 76, 120, 332, 382, 384

**කො**

කොසම්බී 196, 212, 300, 326
කොසල 44, 348

**ග**

ගවෙසී 348

**ගො** — පිට්ඨඞ්කානි

ගොතම 382

**ඝො**

ඝොසිතාරාම 196, 212, 300, 326

**චු**

චුන්දරාජකුමාර 54
චුන්දී රාජකුමාරී 54, 56

**ජා**

ජාතිවන 56

**දෙ**

දෙවදත්ත 196

**දො**

දොණ 364

**නා**

නාගිත 46, 48
නාරද 90, 92

**නි**

නිචෙළු වන 398

**ප**

පසෙනදි කොසල 88

**පා**

පාටලිපුත්ත 90

**පි**

පිඞ්ගියානී 382, 384
පියක 90, 92, 98

**භ**

භද්දජී 326
භද්දාදෙවී 90, 92, 98
භද්දිය 56

**භා**

භාරද්වාජ 366

| ම | පිට්ඨඞ්කානි |
|---|---|
| මධුරා | 414 |
| මහානාම | 120 |
| මහාමොග්ගල්ලාන | 196 |
| මහාවන | 60, 382, 384 |
| **මු** | |
| මුණ්ඩ (රාජ) | 90, 92, 96, 98 |
| **මෙ** | |
| මෙණ්ඩක | 56 |
| **ය** | |
| යමතග්ගි | 366 |
| **රා** | |
| රාජගහ | 54 |
| රාහු අසුරින්ද | 390 |
| **ලි** | |
| ලිච්ඡවි | 384 |

| වා | පිට්ඨඞ්කානි |
|---|---|
| වාමක | 366 |
| වාමදෙව | 366 |
| වාසෙට්ඨ | 366 |
| **වෙ** | |
| වෙස්සාමිත්ත | 366 |
| වෙසාලි | 60, 76, 120, 232, 382, 384 |
| **ස** | |
| සඞ්ගාරව | 374 |
| **සා** | |
| සාරිපුත්ත | 244, 302, 308, 310, 312, 318, 324, 336, 338, 342, 344 |
| **සී** | |
| සීහසෙනාපති | 60 |
| **සු** | |
| සුමනා රාජකුමාරී | 50, 52 |
| **හි** | |
| හිමවන්තු | 68 |

# විසෙසපදානුක්කමණිකා


| අ | පිට්ඨඞ්කානි |
|---|---|
| අක්ඛන්ති | 410 |
| අක්ඛම | 222, 258, 260 |
| අකුප්ප | 192, 194 |
| අකුප්පධම්ම | 202 |
| අග්ගි | 414 |
| අගාරව | 12, 14, 26 |
| අඤ්ඤ | 232 |
| අත්තගුත්ත | 10 |
| අත්තහිතායපටිපන්න | 20, 22, 24 |
| අත්ථකාම | 58 |
| අත්ථපටිසංවෙදී | 32, 34 |
| අත්ථවස | 114, 116 |
| අතිනිවාස | 418 |
| අද්ධගත | 364 |
| අද්ධානක්ඛම | 44 |
| අධම්මික | 390 |
| අනගාරිය | 8, 50, 322 |
| අනවත්ථචාරිකා | 418 |
| අනාගතභය | 162, 164, 170, 172 |
| අනාගාමිඵල | 450, 452 |
| අනායුස්ස | 236 |
| අනොත්තප්පී | 4, 6, 10 |
| අප්පතිස්ස | 12, 14, 26 |
| අප්පමත්තකවිස්සජ්ජක | 458 |
| අපාසාදික | 412 |
| අබ්භොකාසික | 358 |
| අභිඤ්ඤාවොසානපාරමිප්පත්ත | 16 |
| අභිඤ්ඤාසච්ඡිකරණීය | 28, 40, 42 |
| අභිධම්මකථා | 170 |
| අරහත්තඵල | 450, 452 |
| අරියසාවක | 74, 76, 86, 336, 344 |
| අරියූපවාදී | 406 |
| අලංපඤ්ඤ | 10 |
| අලංසාකච්ඡ | 128, 308 |
| අලංසාජීව | 128, 310 |
| අලබ්භනීයඨාන (පඤ්ච) | 84, 96 |
| අවිසාරද | 330 |
| අස්සද්ධ | 4, 6, 10, 64 |
| අස්සදම්මසාරථි | 42 |
| අස්සාජානීය | 400 |
| අස්සුතවන්තු | 84, 86, 94 |

| අ | පිට්ඨඞ්කානි |
|---|---|
| අස්සුමුඛ | 8 |
| අසන්තුට්ඨ | 238 |
| අසිතව්‍යාභඞ්ගී | 8 |
| අහිරික | 4, 6 |
| **ආ** | |
| ආඝාත | 302, 304 |
| ආඝාතපටිවිනය | 302, 304 |
| ආජඤ්ඤරථ | 42 |
| ආජීවක | 462 |
| ආතාපී | 32 |
| ආනුපුබ්බීකථා | 300 |
| ආපායික | 240 |
| ආබාධික | 306, 382 |
| ආභස්සර | 326 |
| ආභිසමාචාරික | 26 |
| ආයමුඛ | 38 |
| ආයුස්ස | 236 |
| ආරද්ධවිරිය | 12, 218 |
| ආරඤ්ඤක | 214, 262 |
| ආරාමිකපෙසක | 458 |
| ආරුද්ධක | 464 |
| ආවාසික | 426, 428, 430, 432, 434 |
| ආහුනෙය්‍ය | 214, 262 |
| **ඉ** | |
| ඉද්ධිපාද | 130 |
| ඉද්ධිවිධ | 28, 130 |
| ඉදමට්ඨිත | 356 |
| ඉන්ද්‍රිය (පඤ්ච) | 466 |
| ඉන්ද්‍රිය සංවර | 222 |
| **උ** | |
| උත්තානසෙය්‍යක | 10 |
| උද්ධග්ගික | 70 |
| උද්ධච්චකුක්කුච්ච | 28 |
| උදකමණික | 40 |
| උදකරහද | 38 |
| උප්පලිනී | 40 |
| උපක්කිලෙස | 28 |
| උපජ්ඣාය | 110 |
| උපට්ඨාක | 46, 96 |

උ — පිට්ඨඞ්කානි

උපට්ඨිතසති 404
උපාසක 330, 332, 334, 462
උපාසිකා 462
උස්සූරභත්ත 422

එ

එකාසනික 358

ඔ

ඔත්තප්ප 8
ඔත්තප්පබල 2, 4, 16
ඔපරජ්ජ 252

ක

කණ්හසප්ප 422, 424

කා

කාකපෙය්‍ය 40, 42
කාම 8
කාමච්ඡන්ද 28
කාලඤ්ඤු 62
කාසිකවත්ථ 78

කු

කුලමච්ඡරිය 418
කුලූපග 220, 420
කුසීත 4, 6
කුහක 178

කූ

කූටාගාර 18, 20
කූටාගාරසාලා 76

කෙ

කෙවට්ට 46

කො

කොමාරබ්‍රහ්මචරිය 336

ඛ

ඛජ්ජකභාජක 458
ඛත්තිය 246
ඛන්ති 410
ඛලුපච්ඡාභත්තික 358

ග

ගරුට්ඨානීය 32, 34

ගි — පිට්ඨඞ්කානි

ගිලාන 234
ගිලානසාලා 232
ගිලානුපට්ඨාක 234, 236

ගී

ගීතස්සර 404

ගො

ගොතමක 464
ගොපදක 306

ච

චක්කවත්ති 242, 244
චඞ්කම 44
චතුරස්සා 42
චන්දනඝටිකා 382

චා

චාතුද්දිස 216
චාතුම්මහාපථ 42, 64

චී

චීවරපටිග්ගාහක 456
චීවරභාජක 458

චු

චුදිත 318, 320

චෙ

චෙතොඛිල (පඤ්ච) 400
චෙතොවිමුත්ත 134
චෙතොවිමුත්ති 208

චො

චොදක 318

ජ

ජටිලක 464

ජා

ජාතරූප 28

ඣා

ඣාන 446, 448, 450

ත

තථාගත 194, 246, 386, 388
තථාගතබල 16

**තෙ** පිට්ඨඞ්කානි

තෙදණ්ඩික 464

**ථි**

ථිනමිද්ධ 28, 110

**ථෙ**

ථෙරභික්ඛු 176, 178, 180, 182

**ද**

දක්ඛිණෙය්‍ය 214
දහර 8
දළ්හපරක්කම 18

**දි**

දිබ්බසොත 28

**දී**

දීඝචාරිකා 416

**දු**

දුක්කත 294, 296
දුච්චරිත 436, 438
දුප්පඤ්ඤ 4, 6, 8
දුප්පටිවිනොදය 300
දුස්සීල 30, 332, 406

**දෙ**

දෙවධම්මික 464

**ධ**

ධන (පඤ්ච) 82
ධම්ම 138, 140, 290
ධම්මපටිසංවෙදී 32, 34
ධම්මවිනය 14
ධම්මවිහාරී 138, 14
ධම්මසවණ 398

**ධා**

ධාති 10

**න**

නඞ්ගලමුඛ 100
නහාපක 38

**නා**

නාළියසාක 78

**නි**

නිගණ්ඨ 464
නිපක 36

**නි** පිට්ඨඞ්කානි

නිබ්බිදාවිරාග 30
නිස්සය 444
නිස්සාරණීය 394

**නී**

නීවරණ (පඤ්ච) 100, 102, 148

**නෙ**

නෙක්ඛම්මසුඛ 46
නෙසජ්ජික 358

**ප**

පච්චවෙක්ඛණානිමිත්ත 40
පච්ඡාසමණ 220
පඤ්ඤාබල 2, 4, 16, 18, 20
පඤ්ඤාවිමුත්ත 134
පඤ්ඤාවිමුත්ති 208
පටිභාග 64
පටිසම්භිදා 180
පත්තගාහාපක 458
පත්තපිණ්ඩික 360
පතිකූල 58
පතිස්සත 36
පදක 364
පදුමිනී 40
පධාන 104, 106
පධානියඞ්ග (පඤ්ච) 104
පබ්බජෙය්‍ය 100, 102
පරහිතායපටිපන්න 22, 24
පරිනායක 246
පරිබ්බාජක 464
පස්සද්ධකාය 32
පහිතත්ත 32
පංසුකූලික 356
පංසුකූලිකත්ත 172

**පා**

පාපභික්ඛු 206
පාමොජ්ජ 32
පාසංස 6
පාසාදික 412
පාහුනෙය්‍ය 214, 262

**පි**

පිණ්ඩපාතික 356
පිතාමහයුග 366

| පු | පිට්ඨඞ්කානි |
|---|---|
| පුග්ගලප්පසාද | 442 |
| පුඤ්ඤාභිසන්ද | 80 |
| පුණ්ඩරීකිනී | 40 |
| පුත්තස්සාද | 370 |
| පුත්තදාර | 72 |
| පුබ්බෙනිවාස | 30 |
| **ඵ** | |
| ඵලභාජක | 458 |
| **ඵා** | |
| ඵාසුවිහාර | 190, 210 |
| **බ** | |
| බල (පඤ්ච) | 466, 468 |
| බලි | 70 |
| බහිද්වාරකොට්ඨක | 44, 46 |
| බහුභාණී | 408 |
| බහුස්සුත | 182, 216, 218, 290, 298, 428 |
| **බා** | |
| බාහුලික | 292, 294 |
| **බු** | |
| බුඩ්ඪපබ්බජිත | 124 |
| **බො** | |
| බොධිසත්ත | 130 |
| **බ්‍ය** | |
| බ්‍යසන (පඤ්ච) | 240 |
| **බ්‍ර** | |
| බ්‍රහ්මචක්ක | 16 |
| බ්‍රහ්මචරිය | 44 |
| බ්‍රහ්මවිහාර | 366 |
| බ්‍රහ්ම | 326 |
| **බ්‍රා** | |
| බ්‍රාහ්මණ (පඤ්ච) | 336 |
| බ්‍රාහ්මණධම්ම | 362 |
| **භ** | |
| භණ්ඩාගාරික | 456 |
| භත්තු | 58 |
| භත්තුද්දෙසක | 454, 456 |

| භි | පිට්ඨඞ්කානි |
|---|---|
| භික්ඛුනී | 224, 226, 228, 462 |
| **භො** | |
| භොග | 420 |
| **ම** | |
| මච්ඡරිය | 446 |
| මනාපදායී | 76 |
| මනොමයකාය | 78 |
| මන්තපද | 366 |
| මන්තභාණී | 408 |
| මන්ද | 10 |
| මහානාම (ලිච්ඡවි) | 120 |
| මහාසාල | 68 |
| මහාචොර | 204 |
| මහාසුපින (පඤ්ච) | 386 |
| **මා** | |
| මාගන්ධික | 464 |
| මාතාපිතු | 66, 70 |
| මාතුගාම | 422, 424 |
| **මි** | |
| මිත්තාමච්ච | 72 |
| මිථුන | 368 |
| **මු** | |
| මුට්ඨස්සති | 404 |
| මුණ්ඩසාවක | 464 |
| **මෙ** | |
| මෙත්තා | 302, 366 |
| **මො** | |
| මොඝපුරිස | 196 |
| **ය** | |
| යථාභූතඤාණදස්සන | 30 |
| යථාසන්ථතික | 358 |
| **යා** | |
| යාගු | 402 |
| යාගුභාජක | 458 |
| **යො** | |
| යොධාජීව | 142, 150, 152, 856, 158 |
| යොධාජීවූපම | 144, 146, 148, 152 |
| යොබ්බන | 8 |

| ර | පිට්ඨඞ්කානි |
|---|---|
| රතනත්තය | 182, 184 |
| රතන (පඤ්ච) | 386 |
| රු | |
| රුක්ඛමූලික | 356 |
| ලි | |
| ලිච්ඡවිකුමාර | 120 |
| ව | |
| වණිජ්ජා (පඤ්ච) | 338 |
| වස්සන්තරාය | 390 |
| වස්සවලාහක | 390 |
| වි | |
| විචිකිච්ඡා | 28 |
| විනයසඞ්ගහ | 170 |
| විනිබන්ධ | 402 |
| විමුත්තායතන | 32, 34, 36 |
| විරියබල | 2, 4, 16, 18, 20 |
| විසාරද | 298, 330 |
| වෙ | |
| වෙදයිත | 208 |
| වෙය්‍යාකරණ | 364 |
| ව්‍යා | |
| ව්‍යාපාද | 28 |
| ස | |
| සක්කාය | 396 |
| සක්කිභබ්බතා | 28, 30, 42 |
| සගාරව | 12, 14 |
| සජ්ඣායක | 374 |
| සඤ්ඤා (පඤ්ච) | 124, 126 |
| සඤ්ඤාවෙදයිතනිරොධ | 312, 316 |
| සත්තු (පඤ්ච) | 198 |
| සතිනෙපක්ක | 18 |
| සතිබල | 2, 4, 16, 18, 20 |
| සද්ධම්ම | 10, 12, 290, 292 |
| සද්ධාබල | 2, 4, 16, 18, 20 |
| සන්තරබාහිර | 38 |
| සන්තුට්ඨ | 238 |
| සන්දිට්ඨිකදානඵල | 60 |
| සප්පඤ්ඤ | 12 |
| සප්පතිස්ස | 12, 14 |
| සප්පුරිස | 64, 72 |
| සබ්බාවන්තු | 40 |
| සබ්‍රහ්මචාරී | 26, 34, 154, 156, 158, 176, 210, 316, 322, 406 |
| සභාගවුත්තික | 26 |
| සම්පදා (පඤ්ච) | 190, 240 |
| සම්පන්නසූකරමංස | 76 |
| | පිට්ඨඞ්කානි |
| සම්මාදිට්ඨි | 32 |
| සමණදුක්ඛ | 238 |
| සමණසුඛ | 238 |
| සමණසුඛුමාල | 208 |
| සමයහන්ත | 422 |
| සමයවිමුත්ත | 282 |
| සමවත්ථචාර | 416 |
| සමවත්ථවාස | 418 |
| සරකුත්ති | 404 |
| සා | |
| සාටිකගාහාපක | 458 |
| සාමණෙර | 444, 462 |
| සාමණෙර පෙසක | 458, 460 |
| සාමණෙරී | 462 |
| සායමාස | 362 |
| සාරජ්ජ | 298 |
| සාළුවන | 348 |
| සී | |
| සීලපඤ්ඤාණ | 46 |
| සීලවන්තු | 222, 332, 392, 426, 428 |
| සීලවිපත්ති | 406, 408 |
| සීලවිපන්න | 406, 408 |
| සීලසම්පන්න | 324, 408 |
| සීවථිකා | 440 |
| සීහනාද | 16 |
| සීහමිගරාජ | 194 |
| සු | |
| සුකථා | 296, 298 |
| සුචරිත | 336, 438 |
| සුත්තන්ත | 172, 290 |
| සුභකිණ්හ | 328 |
| සුභාසිත | 392 |
| සෙ | |
| සෙඛ | 184, 186, 188 |
| සෙඛබල | 2, 4, 16, 18, 20 |
| සෙඛවෙසාරජ්ජකරණ | 202 |
| සෙනාසනපඤ්ඤාපක | 456 |
| සො | |
| සොතාපත්තිඵල | 450, 452 |
| සොසානික | 358 |
| හ | |
| හත්ථපතිස | 30 |
| හි | |
| හිතෙසී | 58 |
| හිරිබල | 2, 4, 16, 18, 20 |

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාළි - ථෙරීගාථා පාළි

32 ඛුද්දක නිකාය - ජාතක පාළි I

33 ඛුද්දක නිකාය - ජාතක පාළි II

34 ඛුද්දක නිකාය - ජාතක පාළි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාළි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාළි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමග්ගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමග්ගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාළි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාළි - චරියා පිටක පාළි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධම්මසංගණිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුග්ගලපඤ්ඤත්තිප්පකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයත් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම විදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රඳැවුන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

# NAME OF SPONSOR
## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES, Volume 15～Volume 28**

**書名：斯里蘭卡巴利文大藏經，第十五冊～第二十八冊**
**Book Serial No., 書號：SR215～SR228**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,206,373：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,527,473；Print 1,000 sets**
**以上合計，新台幣 1,527,473 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

南無阿彌陀佛

《斯里蘭卡巴利文大藏經 第二十四冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

1,000 copies; June 2013

SR224 - 11252